ගුරුළු ගෝමීන් විසින් කරන ලද

# අමාවතුර

"පුරිසදම්මසාරථී" පද වර්ණනාව

**පණ්ඩිත**

**කෝදගොඩ ඤාණාලෝක**

**ස්ථවිරයන් වහන්සේ විසින්**

**සංශෝධිතයි**

# පටන් බස

අමාවතුර හෙළ ගත්වැළෙහි උසස් මැ තැනැ දිලියෙහි. මෙය අසෝ වසැ ගෙතිණැයි නියම කොටැ මැ කියනුවට ඉසව්වක් නැතුදු දොළොස්වන සියවසැ අග කොටසට අයත් එකෙකැයි පිළිගන්නට කරුණු පැනෙයි.

මෙ ගත් සැපැයුවෝ **ගුරුළුගොමී** නම් වියතාණ කෙනෙකි. මෙය මතු නො වැ **ධර්මප්‍රදීපිකාව** ද ඔවුන් විසින් සැපැයුණෙකි. “ඔහු කෙබඳුවහ!” යනු මෙ දෙ ගතින් හෙළි වෙයි. සකු මගද ඈ බස් දතුවෝ එ දා මහපඬිහු යැ. ඔහු මහමිහිඳු පරපුරින් ගෙනැ ආ බණ පෙළබසින් හා හෙළබසින් හා රැක්කහ. අන් බොදුනකාහි බණ හා බැහැරි සිප් සතර හා සකුබසින් හදාලහ. **ගුරුළුගොමීහු** එ හැම දහම් සතරෙහි නිපුණයෝ යැ. **ධර්මප්‍රදීපිකායෙහි** ඒ ඒ තැන පෙළ අටුවා දෙකින් මතු නො වැ **ජාතකමාලා බොධිචර්යාවතාර** ආදියෙන් ද ඇරැ පැ ප්‍රමාණපාඨ රාශියෙන් ඔහු සිය සමය සේ මැ බැහැරි සමය ද දතුවන් බව්, එසේ මැ වියරණ සයුරු තිණු මහවියරණැජර කෙනකුන් බව් හෙළි කෙරෙති. ලක්දිවැ කිසි ඇදුර කෙනෙක් සකුපද වැඩි කොටැ යොදා සිය නිබැඳුම් තෙද ගැන්වූහ. කෙනෙක් හුදු හෙළ වහරින් මැ සිය යෙදුම් ඔද ගැන්වූහ. බෙහෙවින් මේ දෙකින් එකෙකැ සමතා අනෙකැ නොසමත් යැ. එසේ ද වත් **ගුරුළුගොමීහු** මේ සිනා දෙකෙහි මැ තමා එක් සේ සමත් බව **ධර්මප්‍රදීපිකායෙන්** පැහ. එහි බොහෝ තැනැ හර බර සකුපද බහුල වැකි යෙදූහ. ‘සුළු කලිඟු වත්” ඈ ඇතැම් තැනැ විසිතුරු වැනුමින් සැපැයුණු රසවත් ඔදවත් නොමුසු හෙළබසින් මැ පිරුණු වැකි යෙදූහ. මෙයින් ඔහු භාෂායෙන් හා ධර්මයෙන් හා ශාස්ත්‍රයෙන් හා සෙසු පඬුවන් ඔබා සිටුත් තමන් සමත් බව් දක්වති. ඔහු **ධර්මප්‍රදීපිකාවට** පසු පොදු හුදී ජනයා සඳහා ගතක් කරනුවෝ ‘පුරිසධම්මසාරථී’ යනුවෙන් දැක්වුණු බුදුගුණය මැය කොට ගෙනැ බුදුරජුන් පෙරැ බෝසත් සෙමෙහි දු, බුදු වීමෙන් පසු දු සෙස්සන් කෙරෙහි කොදැමෙන රළු පරොස් පුගුලන් හික්මවනුයෙහි සමත් නිසා දක්වනුවෝ, ලිහිල් බසින් මේ **අමාවතුර** සැපැයූහ.

මැනවින් විමසන්නහුට මෙහි වෙසෙසි ලකුණු කිහිපයෙක් මතු වෙයි. මෙහි සකුපද අඩු යැ. කියවන්නහුට වෙහෙස කරන වැඩි වැනුමෙක් හෝ පුන පුනා එක් බඳු දැ ඇරැ පැමෙක් හෝ නැත. පෙළ අටුවාහි ආ දැ හෙළබසට නැඟීමෙහි දී පදරුතට වඩා හව් අරුතට මුල් තැන දින. අදහස ඉඳුරා හෙළි කරන, වියරණ වැට නො උලැඟැ යෙදූ. සිලිටි වූ මුහුකළ පැහැදිලි බස්වහරින් කරුණු දැක්විණ. පටනැ සිට අවසාන තෙක් ම පැතිරැ පැවැති, කියවන්නහු සිත අදනා පණ ඇති රසවත් ඔදවත් නිබැඳුමෙන් සැරැසුණේ යැ.

මනා බස්වහරෙහි නිපුණ වන්නට උසත මනා හොඳ පොත් කිහිපයක් ඇත ද. ‘අමාවතුර’ ඒ හැමට මුදුන් වැ සිටී.

අද ලක්දිවැ වැජඹෙන මහපඬිරුවනක් වූ **කෝදගොඩැ ඤාණාලෝක** තෙරණුවන් අතින් විසුදු වැ හෙළි දක්නා මේ සැකැසුම ලොවට වැඩ පිණිස වේවායි පතම්හ.

**බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහානායකස්ථවිර.**

බු:ව: 2502
ක්‍රි:ව: 1958.4.30 දිනැ
බළන්ගොඩැ දහම්ගිරි අසපුයෙහි දී යැ.

## පිරියෙස්ලි

# අමාවතුර හා ගුරුළුගොමීහු

සව්සත කෙළ පැමිණි ගුරුළුගොමි වියත් සිළුමිණිහු අමාවතුරු නම් ‘බුද්ධචරිත’ය කරනුවෝ ග්‍රන්ථාරම්භයෙහි ලා “නවගුණ හැම කියත්, නොපිළිවතින් ‘පුරිසදම්මසාරථී’ යන පදය ගෙනැ අප බුදුන් පැරුම් පුරා බුදු වැ දෙව්රම්වෙහෙර පිළිගෙනැ එහි වෙසෙමින් තුන් ලොව්හි සැරිසරැ විෂමපුරුෂයන් දමා අමාමහනිවන් පැමිණවූ සෙ නොවියත් හුදී ජනන් සඳහා සියබසින් මා විසින් සැකෙවින් දක්වනු ලැබේ” යනු කියති. මෙයින් මුළු ගත්හි පිණ්ඩාර්ථය දක්වත්. තමන් කරන ‘බුද්ධචරිත’ය නම් ‘පුරිසදම්මසාරථී’ යන පදයෙහි සංවර්ණනාමාත්‍රයක් වත් මුත් අනෙකක් නොවනසෙ ද කියත්.

අටළොස් පරිච්ඡේදයෙකින් පිරිසුන් මෙ ගත්හි දුර්දාන්තදමන යැ, ස්වසන්තානදමන යැ, පරසන්තාන දමන යැ යන පරිච්ඡෙද තුන වනාහි “අප බුදුන් පැරුම් පුරා බුදු වැ දෙව්රම්වෙහෙර පිළිගෙනැ” යනුවෙන් පළමු වන වට මුලැ මැ අළ වස්තුනිර්දේශයෙහි ලා කියූ කරුණු විස්තර කරන්නට වෙන් කරති. ගෘහපතිදමනයැ පටන් ගෙනැ බ්‍රහ්මදමනය තෙක් ඇති පසළොස්පරිච්ඡේද ‘පුරිසදම්මසාරථී’ යන පදය විස්තර කරන්නට වෙන් කරති. එහෙයින් මැ ‘මෙසෙ බුදුහු දෙව්රම්වෙහෙරැ දහම් අමාවහරෙ වස්වමින් වැඩැ වසනුවො තුන්ලොව්හි සැරි සැරැ උපාලිගහපති ඈ සිටනුදු ........ බක ඈ බඹනුදු දමා අමාමහනිවන් පැමිණිවූහු” යි දෙ වන වට පටන් ගනිමින් සතර වන පරිච්ඡේදයෙහි මුලැ දී ඒ ඒ දුර්දාන්තපුරුෂයන් වෙන මැ නිර්දේශ කරත්.

විද්‍යාචක්‍රවර්තීන් කළ බුද්ධචරිතයෙහි වාක්‍යච්ඡේදයක් පාසා “බුත්සරණ යා යුතු” යනු ඇත. එනිමිත්තෙන් ඒ බුද්ධ චරිතයට **බුත්සරණ** යන නම රූඪ වි යැ. එසෙයින් මැ මෙ ගත්හි දු ‘අමාමහනිවන් පැමිණිවූහු’ යි පරිච්ඡේදාන්තයෙහි බෙහෙවින් සිටුනා ‘අමා’ යන ශබ්දය මිසැ **අමාවතුර** යන නම පිණිසැ අන් හෙතුයෙක් නො පෙනේ.

මෙහි දෙ තැනෙකැ ගුරුළුගොමිහු ‘ධර්මප්‍රදීපිකාව’ සඳහන් කරති. “මෙ කර්මයන් ගෙ විභාග ‘ධර්මප්‍රදීපිකා’ නම් ‘මහබොධිවංශපරිකථා’ යෙන් දන්නෙ යැ. හෙ බුද්ධධර්ම යැ. මේ බුද්ධචරිත යැ” යනු එක් තැනෙකි (142 පි:). ගුරුළුගොමීහු මැ ‘අමාවතුර’ බුද්ධචරිත වත් මුත් බුද්ධධර්ම නොවනසෙ මෙයින් කියති. බුද්ධධර්මය නම් අමෘතගාමීමාර්ග වන හෙයින් අමාවතුරක් විය හෙත් මැසැ බුද්ධචරිතය අමාවතුරෙක් නොවිය හෙයි. එසේ ද වුව, මෙ ග්‍රන්ථප්‍රබන්ධයට අමාවතුර යන නම තබති. මෙහි අමෘතගාමීමාර්ගය නොවනතුදු ග්‍රන්ථාරම්භය පටන් කොටැ පරිච්ඡේදාන්ත ද පවා නො හැරැ ගොස් ග්‍රන්ථාවසානයෙහි දු වැදැ සුනා ‘අමා’ ශබ්දය නිසා ශබ්දනිමිත්තක වැ නෛමිත්තිකනාම වශයෙන් **අමාවතුර** යනු සටිත වෙයි.

සියබසෙහි එන ‘වතුරු’ ශබ්දය ‘වතුරු’ ධාතුයෙන් මැ නිපන් ශබ්දයෙකි. පාළියෙහි එන ‘අවත්ථර’ යනු ඒ ධාතුයෙහි මූලය වෙයි. ‘වැතිරෙමින්’ යනාදි පද එයින් සිද්ධසෙ පෙනේ. ගලන ඔසය ද වතුරන සැහැවි ඇත් නුයි ‘වතුර’ නම් වෙයි. හසු වන දැය මුහුද කරා වේ වයි, යම් මැ තැනකට වේ වයි, පමුණුවනු වතුරෙහි දහම වේ. මෙ

ගත්හි වස්තුනිර්දේශය කළ තැන 'අමාමහ නිවන් පැමිණවූ සෙ' යනුවෙන් කී දැ එ සැටියෙන් මැ වි යැ. 'පැමිණැවීම්' නැමැති ඔසධර්මය මෙහි ඇත් නුයි 'වතුරු' ශබ්දය ද අත්‍යර්ථයෙන් මැ මෙහි ලා උචිත වෙයි. එයින් මැ නම ද සාර්ථක වේ.

ගුරුළුගොමීහු 'බොධිවංශපරිකථා'වට 'ධර්මප්‍රදීපිකා' යන නම තබති. සකුබසින් එහි නම් කොට මෙහි 'අමාවතුර' යි සියබසින් නම් තබත්. පොත් දෙක එකකර්තෘක වුව ද, දෙපොත්හි බස් ආර වෙනස් වෙයි. 'බොධිවංශපරිකථා' වට සංස්කෘතභාෂායෙන් නම් තබනු නිසි වුව ද, මෙ 'බුද්ධචරිත'යට සියබසින් මැ නම් තබනු මිසැ සකුවෙන් නම් තබනු නිසි නොවේ. එහි නිසිනොනිසිකම් දෙ පොත්හි බස් ආරින් මැ හෙළි වෙයි.

සිරිදම්රම් මාහිමිහු 'අමාවතුර' ලියූ ගුරුළුගොමි පඬිවරයා විසූ කාලය පරීක්ෂා කරමින් මෙසේ කියති:

"මේ මහා පඬිවර තෙම අසවල් කාලයෙහි වද්‍යාධර්මවභාසයෙන් ශ්‍රී ලංකාද්වීපය උද්දීප්ත කෙළේ ය යි වර්ෂ වශයෙන් කාල නියමයක් දක්වන්නට ඉතිහාසාරූඪ වාර්තාවක් නැතත්, අනුමෙය බුද්ධීන් සලකන කලැ ජම්බුද්‍රොණිපුරය රාජධානි කොට ගෙන ලංකාරාජ්‍යශ්‍රීපදප්‍රාප්ත වැ විසූ මහාවංශාදියෙහි සුප්‍රසිද්ධ ගුණමහිමාන්විත 'කලිකාල සාහිත්‍ය සර්වඥ' යන උපාධිධාරී වූ ද්විතීය පරාක්‍රමබාහු මහ රජාණන් ගේ කාලයට පූර්ව වැ තත්සමීපකාලයෙක්හි වාසය කළ සිංහල මහා පඬිවරයෙකැයි සැලැකිය යුතු වේ. අර්ථකථාචාර්ය බුද්ධඝොෂ මහා ස්වාමීන් වහන්සේ ගේ ද, ටීකාචාර්ය ශාරිපුත්‍ර මහාස්වාමීන් වහන්සේගේ ද ශාසනාභිවෘද්ධිකාලද්වයට අතර හා තත්සමීප කාලයෙහි ලෝසසුන් වැඩ වැඩූ ග්‍රන්ථකාර මහාපඬිවරයන් දක්වන තැන ද්විතීය ධර්මකීර්ති මහාස්වාමීන් ගේ ශාසනවංශකථායෙහි ගුරපාද ය. ධර්මකීර්තිපාද ය, ධරනාගපාල ය, රාජමුරාරි ය, කවිරාජශෙඛර ය, ගුරුළුගොමි ය, ආගමචක්‍රවර්ති ය, පරාක්‍රමපණ්ඩිත ය, අග්‍රපණ්ඩිත ය යනාදී වූ ශාස්ත්‍රාගමධාරී ගෘහස්ථ පණ්ඩිතජනයන් විසින් ද පශ්චිමජනතාවට අනුකම්පා පිණිස ධර්මානුගත ශ්ලෝක ප්‍රබන්ධ හා විචිත්‍රාර්ථ ප්‍රකාශක වූ සන්න ගැටපද හා නොයෙක් ව්‍යාඛ්‍යාන උපදවා ලෝ සසුන් වර්ධනය කරන ලද බැව් කියන ලද්දේය. මෙ කී මහපඬිවරයන් කෙරෙහි ඇතුළත් වූ ආචාර්ය ගුරුළුගොමීන් විසින් මේ ධර්මප්‍රබන්ධය මීට අවුරුදු සත්සියගණනෙකින් අතීතයෙහි ශ්‍රී බුද්ධවර්ෂයෙන් සතළොස් (17) වන ශතවර්ෂය ගත වූ ළඟ කලෙක්හි රචනා කරන ලදැ යි සැලැකියැ යුතු වේ. කරුණු කිම යත්? මේ ආචාර්යෝත්තමයන් විසින් ස්වකීය කෘතියට ගරු කොට ගන්නා ලදැ යි සිතිය යුතු ප්‍රකරණයන් අතුරෙන් "ජිනාලංකාරවර්ණනා" නම් මාගධග්‍රන්ථය ද එකෙකි. එය ශ්‍රී බුද්ධවර්ෂ 1700 ය පමණේ දී ලංකාරාජ්‍යාභිෂේකයට පැමිණ පන්තිස් වර්ෂයක් රාජ්‍යානුශාසනා කළා වූ කලිකාලසාහිත්‍යසර්වඥපණ්ඩිත පරාක්‍රමබාහු මහරජතුමන් කල්හි කරන ලද සිංහලශබ්දලක්ෂණයෙහි (සිදත්සඟරායෙහි) "ගුරුළුගොමි සඳගොමි රතැසිපා" යනු දැක්වූ හෙයින් සිද්ධාන්ත සංග්‍රහ රචනාකාලයෙන් ගුරුළුගොමීන් ගේ පූර්වතත්ත්වය ද සුප්‍රකාශ ය. මෙ නයින් සලකන කලැ ගුරුළුගොමීන්ගේ කාලය 17 වෙනි 18 වෙනි ශතවර්ෂ දෙකෙන් සම්බන්ධ වූ අතර කාලයක් බව හැඟේ."

ශ්‍රී ධර්මාරාම මාහිමියන් 'ධර්මප්‍රදීපිකා'ව පිණිසැ ලියූ විඥාපනයෙහි දී කළ තෙල විනිශ්චය නොබිඳැලියැ හෙනසෙ පෙනේ. 'ජිනාලංකාරවර්ණනා'ව බුදුන් පිරිනිවි එක්වාදහස් සත්සියෙහි කළ බව එහි අවසන්හි පැවැසිණ. ගුරුළුගොමීන් එයින් යම්

යම් දැය ගත් බව පෙනෙනුයෙන් ඔවුන් විසූ කාලය ඉන් මෙ පිට විය යුතු යැ. එසේ වුව ද, කිසි ඇදුරු කෙනෙක් ජිනාලංකාරවර්ණනාසාධකය තහවුරු කොට නො කියති. 'ජිනාලංකාරවර්ණනා'ව නන් ගතින් කරුණු නඟා ගෙනැ ලියන ලද හෙයිනුදු ගුරුළුගොමිනුදු ජිනාලංකාරවර්ණනාකාරයන් නෙත් ලූ ඒ ඒ ගතින් මැ කරුණු ගත්සෙ සිතියැ හෙන හෙයිනුදු ජිනාලංකාරවර්ණනායෙන් ගුරුළුගොමීන් විසූ කාලය විනිශ්චයට නොයනසෙ ඔහු සිතත්, ගුරුළුගොමීන් ගේ 'ධර්මප්‍රදීපිකා'යෙහි:

"තමසීති අනුබ්‍යඤ්ජන -
සමනුබ්‍යඤ්ජිත විචිත්තලක්ඛණවිභවං[1],
පජ්ජලිතකෙතුමාලා -
ජාල[2] සමුජ්ජලිතරූපසොභං වන්දෙ"

යන ආර්යාගීතිය ඇත. ජිනාලංකාරයෙහි විජාතමංගලවර්ණනායෙන් උපුටා ගත් ගීයෙකි. 'ජිනාලංකාරවර්ණනා'ව හා 'අමාවතුර' හා සසඳා නඟා ලියැ හෙන සාධක මෙහි නොදැක්වුව ද, මෙ ගීතිය ප්‍රමාණ කොට ගත හැකි වේ නම් ජිනාලංකාරය කළ භදන්ත බුද්ධරක්ෂිතාචාර්යයන් කෙරෙන් මොබ ගුරුළුගොමීන් විසූසෙ තහවුරු කොටැ කියැ හෙන්නේ යැ. ශ්‍රී ධර්මාරාම මාහිමියන් කියන කරුණු අනු වැ බු: ව: 18 වැනි ශතවර්ෂයෙහි දු මුල් අවධිය වන, පොළොන්නරු පුර මහ පැරකුම්බා මහරජාණන් සමයෙහි මෙ පඬිවරයා විසුවනැයි ද එ මහ රජාණන් සතු සුප්‍රසිද්ධ ධර්මාගාරයෙහි නියුතු පඩිමිණිවැළෙහි රජමිණි සෙයින් වැජඹුණහ යි ද සලකම්හ.

අග්බෝ මහරජාණන් දවසැ දොළොස් මහකිවියන් කෙරෙහි පළට වැ සිටි 'දැමි' හු නම් 'ගුරුළුදැමි' හු යැ යි සිතන කියන අය ද ඇත. නාමමාත්‍ර ගෙනැ වරදවා ගත් දැයක් මිසැ සහේතුක දැයෙක් නොවේ. රත්නාවලිය කළ ශ්‍රීහර්ෂදෙවයෝ ක්‍රි:ව: 606 සිට 647 තෙක් භාරතයෙහි රජය කළ නරදෙව කෙනෙක් වෙති. රත්නාවලියෙහි එනः

"ද්වීපාදන්‍යස්මාදපි -
මධ්‍යාදපි ජලනිධෙර්දිශො 'ප්‍යන්තාත්,
ආනිය ඣටිති ඝටයති -
විධිරභිමතමභිමුඛීභූතඃ"

යන ආර්යාව ගුරුළුගොමිහු 'ධර්මප්‍රදීපිකා'යෙහි ලා දක්වති. අග්‍ර බෝධීහු යැ. හර්ෂදෙවයෝ යැ යන දෙ රජුන් සමකාලයෙහි ලා කියැහෙතුදු හර්ෂදෙවයන් පසු වැ වුසූ හෙයින් ඔවුන් ගේ රත්නාවලිය අග්බෝ දවසැ වුසූ කිවිහු නො දක්කැ හෙති. එයින් ගුරුළුගොමින් අග්බෝ දවසැ වුසුසෙ සිතනු කියනු අකාරණ මැ වෙයි.

බුත්සරණ කළ විද්‍යාචක්‍රවර්තීන් වුසූ අවධිය අවිනිශ්චිත වුව ද, පොළොන්නරු අවධියෙහි ඔවුන් වුසුසෙ සලකන්නට කරුණු ඇත. ඔවුන් ගේ බුත්සරණට පසු වැ 'අමාවතුර' කළසෙ සිතන පඬිවරු ඇත. අමාවතුරෙහි වස්තුනිර්දේශය කරන තැනැ "බුදුගුණ අනන්ත වන බැවින් නවගුණ හැම කියත්, නොපිළිවනින්" යනුදු ඒ පඬිවරු සාධක කොටැ ගනිති. ගුරුළුගොමීන් ග්‍රන්ථාරම්භයෙහි මෙ බඳු බසක් කියන්නට හෙතු

[1] සිරිවිභවං, මු: නි:

[2] ජාලං, ම: නි:

නම් යම් මැ කෙනකුන් නව ගුණ හැම කියන්නට බැසැ නොපිළිවත් වුසෙ දක්නට ලැබීම යැ යි ද "එසේ නොපිළිවන් වූවෝ විද්‍යාචක්‍රවර්තීහුනු"යි උන්ගේ 'බුත්සරණ' පිණිසැ කියූ දැයෙකැයි ද ඔහු සිතත්. අප ගේ කලණමිත් වන, සියබසෙහි කළ අත් ඇති, ලබුගම ලංකානන්ද පඬිහිමිහු තෙල කී දැය සාධක විසින් තර කොට ගෙනැ "බුත්සරණට පසු වැ අමාවතුර කළහ" යි නිශ්චයට බසිති.

අමාවතුරෙහි කී ඒ බස් දැකැ එය නිගන්නට ගොස් "නවගුණ හැම කියන්නට පිළිවන්සෙ දක්වම්හ"යි හටගත් දර්ප ඇති වැ "බුත්සරණ" කලහ යි ද එයින් 'අමාවතුර'ට පසු වැ 'බුද්සරණ' ගෙතිණැයි ද විරුද්ධ වාද විසින් කියැ හෙතුදු ඇපි දූ ලංකානන්ද හිමියන් ගත් මතය පිළි ගනුම්හ.

අමාවතුර ගොතන ගුරුළුගොමීහු උද්දේශ නිර්දේශ ප්‍රතිනිර්දේශ නිගමන විසින් සිය ගත්හි විභාග දක්වා මැනැවින් පරිච්ඡේද බිඳැ නිරවුල් කොට වියත් බසින් ලියූහ. සියබසින් ලියූ ධර්මප්‍රබන්ධයන් කෙරෙහි 'අමාවතුර' සෙයින් ක්‍රමානුකූල කොට ලියූ අන් ග්‍රන්ථයෙක් නැත. විද්‍යාචක්‍රවර්තීන් අමාවතුර බලා පසු වැ 'බුත්සරණ' ලියූසෙ සැබෑ වේ නම් එහි සංවිධානය අමාවතුරට වඩා මනා වන්නේ ය. එක් මැ හිත්තියක් ඇසිරි කොට ලියන පොත් අතර පළමු පොතට වඩා දෙ වන පොත සංවිධානයෙන් ප්‍රෞඪ වෙයි. සංවිධානයෙන් 'අමාවතුර' මඩනට 'බුත්සරණ' නොපොහොසත් වේ. 'බුත්සරණ' මඩනට 'අමාවතුර හා සසඳා බලත් මැ, දෙ පොත්හි නම් ගොතා-ලූ සැටියෙනුදු සංවිධානය සකස් කැරැ-ලූ සැටියෙනුදු බස සකස් කැරැ යෙදූ සැටියෙනුදු 'අමාවතුර' පසු වැ කළසෙ පිළිගැනේ. ගුරුළුගොමි ඇදුරිඳු 'බුත්සරණ' දැකැ නවගුණ හැම කියත්, නොපිළිවතින් එක් ගුණයක් ගෙනැ නමිනුත් සංවිධානයෙනුත් බසිනුත් 'බුත්සරණ'ට වඩා උසස් කොට සිය ගත නිමහම් කළසෙ පිළිගත මනා මැ අවධියෙහි වුසූ බව ද සැලැකියැ හෙයි.

ගුරුළුගොමි ඇදුරිඳු කලිඟුරටින් මෙහි පැමිණ මෙහි දී හෙළබස ඉගෙනැ පොත් ලියූ පඬිවරයෙකු සේ පිළිගන්නා උගත්තු ඇත. පුරාතනයන් 'කාලිංග හෙළු'ව යන නම 'අමාවතුර' පිණිසැ කී බව හා ගුරුළුගොමි වහරෙහි ඇති වෙනස හා සාධක වශයෙන් කියති. මුඛපරම්පරායෙහි වැටෙන කාලිංග හෙළු'ව යන කථාමාත්‍රයෙන් වේ වයි, අනන්‍යසාධාරණ රචනාපද්ධතිය නිසා වේ වයි, උදාර සිංහලයකු වන ගුරුළුගොමි ඇදුරු විදේශියකු කොට නොසැලකිය හේ මැ යැ. කාලිංග වංශය විජයමහරජාණන් කෙරෙහි වැටෙතුදු ඒ මහරජාණන් හෙළ දැයින් වෙන් කොට නො සිතත්. එසේත් තිබියැ දී ගුරුළුගොමීන් හෙළ දැයින් වෙන් කොට ලන්නට තර්ක නැඟීම මහත් වරදක් සේ පෙනේ.

ගුරුළුගොමීහු ධර්මප්‍රදීපිකාව පළමු කොට ලියූහ. එහි 'සුළුකලිඟු කථා'ව ලියනුවෝ කාව්‍යරස බහා ගැදිකවක් සෙයින් බෙහෙවින් හුදුහෙළුයෙන් මැ ලියූහ. 'ධර්මප්‍රදීපිකා'යෙහි ලා ධර්මව්‍යාඛ්‍යාන කරන්නට මිශ්‍රභාෂාව යෙදූව ද, 'කලිඟුසිරිත' හුදුහෙළුයෙන් ලියා වෙනසක් කෙළෙන් 'කලිඟුහෙළු'ව යන ව්‍යවහාරය ඇති වි යැ. එහි අර්ථය නම්: "කාලිංගකථාව ලියූ හෙලුව" යනුයි. 'අමාවතුරෙහි' බස ද බෙහෙවින් 'කලිඟුසිරිත' ලියූ බස හා සම නුයි "අමාවතුර නම්, කාලිංග හෙළු යැ"යි කියන්නට වන්හ. එහි අර්ථය: ධර්මප්‍රදීපිකායෙහි එන කලිඟුහෙළුයෙන් 'අමාවතුර' ලියූ බව වෙයි. ග්‍රන්ථකරයා කාලිංගයකු බව එයින් නොකියත්. ගුරුළුගොමීහු 'අමාවතුර' පටන්

ගනිමින් “සියබසින් මා විසින් සැබෙවින් දක්වනු ලැබෙ” යනු කියති. අමාවතුරෙහි වැටෙන බස “සිය බස-තමන් ගේ නිරුක්ති යැ” යනු පිටරැටියකු විසින් නොකිය හැකි යැ. මෙහි ‘සියබස’ යන්නෙන් ද්වීපභාෂාව දක්වත්. එ වනාහි හෙළබසයි. ද්විවාසීන් හෙලු බැවින් නොකියැ හෙත් මැ යැ. කාලිංගාදි දේශභාෂාවට නෑ සබඳකම් ඇති වචන ද පවා ගුරුළුගොමීහු නො ලියති. **රතනාවලි-පූජාවලි** ආදී හැම දෙමළවදන් හෝ දෙමළුයෙන් ආ වදන් හෝ ඇත ද, ගුරුළුගොමීන් ගේ පොත්හි එ බඳු බසෙකුදු නැත. තමන් ලියූ බසිනුදු හෙළධජ දක්වා තිබියැ දීත් ගුරුළුගොමීන් විදේශීය කාලිංගයකු කොට කෙසේ කියමෝ ද?”

“ගුරුළුගොමි-ගුරුළුදැමි” යන දෙ නැමින් මැ මේ පඬිවරයා දන්නා ලැබේ. ‘ගුරුළු’ යන මෙ කලැ කිසි කෙනකුන් ‘ගරුඩ’ යැයි සකුවට නඟා ලියතුදු ‘ගරුඩගොමි’යැ යි පැරැණි උගතුන් ලියූ තැනෙක් දක්නට නො ලැබිණ. අරුත් නො දැනැ නො සලකා හෙළවදන් පෙළ සකුවහරට නගත් මැ මූලාර්ථය නෂ්ට වනසෙ පෙනේ. “ජයමහලාන” යනු ‘ජයමාල’ යැ යි **වෘත්තරත්නාකරපංචිකායෙහි** දී සකුවට නඟා ලූහ. “විල්ගම්මූළ” යනු ල-ළභෙදයෙන් කියන අර්ථභේදය නො දැනැ, නො සලකා කෙනෙක් ‘සරසිගාමමූල’ යැ යි පෙළබසට නඟා ලියූහ. සියබසෙහි දී දෙන අර්ථය ඒ සකුවදනෙහි හෝ ඒ පෙළවදනෙහි හෝ නො ලැබේ. එ සෙයින් මැ ‘ගුරුළු’ යනු ‘ගරුඩ’ යැ යි සකුවට ගනුත් මැ, මූලාර්ථ නැති වැ යනසෙ සිතම්හ. ‘ගුරුළු’ යනු පැරැණි වහර දක්නට ඇති හෙයිනැ. එසේ නොවත් හොත්, පැරණි පෙළපත් නමෙක් හෝ විය හෙයි. “සවුළු විජෙබා” යන නමෙහි ‘සවුළු’ යන්න සෙයින් ‘ගුරුළු’ යනු දූ මේ පඬිවරයා ගේ ගමෙහි හෝ පෙළපතෙහි හෝ නම වෙති යි අපි සිතම්හ. පොළොන්නරු අවධියෙහි බොහෝ පඬිවරු සියගත්හි ලා පෙළපත්නම හෝ උපාධිනාමය හෝ යෙදූහ. **කවිසිළුමිණෙහි** කර්තෘවරයා ‘පඬුඉඳු’ බව එහි සක්බැඳුම්හි එයි. ඒ ඔහු ගේ පෙළපත්නමයි. “කලිකාලසරස්වතී” නම් පඬිවරයා ගේ ආරාධනයෙන් “කලිකාලසර්වඥ” නරෙන්ද්‍රයන් එ කව කළසෙ කව්හි ඇත. ඒ නම් දෙක උපාධි දෙකෙකි. එහි ‘සරස්වතී’ යනු දෙවියකු ගේ නමෙකි යි සිතනුවන් ඇත ද පඬිවරයකු ගේ උපාධිනාම බව විශද වැ පෙනේ. විද්‍යාචක්‍රවර්තීන් ‘බුත්සරණ’ කළ බව පළට දැයෙකි. ‘විද්‍යාචක්‍රවර්ති’ යනු උපාධිනාම යි. මෙ සෙයින් පෙළපත් නමිනුදු උපාධිනාමයෙනුදු ග්‍රන්ථකාරයන් දක්වන සිරිත ඇත. ‘සවුළු’ පෙළපත් නැඟී ගියාක් සෙයින් ‘ගුරුළු’ යනුත් පැරැණි ගමක් මුල් කොට නැඟි පෙළපත්නමෙකැ යි සිතියැ හෙයි.

“දැමි” යනු ඉපැරණි තනතුරෙකි. “බණ් වජාරන දමිනට ඉසා ඇදුර දමීනට ඉසා දමින් සජනක් හට ඉසා”යි මිහින්තලා ලිපියෙහි අමීහු සඳහන් වෙති. ඔහු ධර්මදේශකයෝ යැ ආචාර්යවරයෝ යැ යි දෙ පරිදි වෙත්. මේ ඇත්තනට රජුන් තනතුරු දුන් බව පැරැණි ලිපියෙන් පෙනේ. මේ පඬිවරුන් දහම් දෙසීමෙනුදු දහම් උගන්වා ලීමෙනුදු දුසිරිත් බිඳැ හැරැ රටහි දුර්දාන්තයන් දමනය කෙරෙමින් රජුට සේවා කළහයි සිතම්හ. එයින් මැ රජුන් අතින් ‘දැමිතනතුරු’ ලැබැ සාධුසම්මතයහ.

ගුරුළුගොමීහු දූ දැමි කෙනෙකි. පොළොන්නරුයෙහි **මහලු පැරැකුම්බා** මහරජාණන් ගේ ‘ධර්මාගාර’ යෙහි නියුක්ත වැ ‘දැමි තනතුරු’ ලැබැ-ගෙනැ දහම් ඉගැන්වීමෙන් ආචාර්ය වැ රට සෙමෙහි තබා ගෙනැ විසුසෙ පෙනේ. දහම් උගන්වනු දැමියනට අයත් නුයි පළමු වැ ‘ධර්මප්‍රදීපිකා’ව කළහ. සියතනතුරුනමට යෙදෙන සේ

'පුරිසධම්මසාරථි' පදය තෝරා ගෙනැ නොඑක් තැනැ 'දැමි' පදය බහා ලමින් 'අමාවතුර' ද කළහ. දශකුමාරචරිතය කළ දණ්ඩීන් ග්‍රන්ථාරම්භයෙහිලා සියනමෙහි වැටෙන 'දණ්ඩ' ශබ්දය සිහි කළාක් සෙයින් ගුරුළුගොමීනු දු සියනමෙහි වැටෙන 'දැමි' යන්න 'අමාවතුර' කරමින් නොඑක් තැනැ දී සිහි කළසෙ පෙනේ.

මෙහි ලා වෙසෙසින් සැලැකියැ යුතු දැයෙක් ඇත. 'දැමි' කිව ද, 'මහොපාසක' කිව ද, කාර්යයෙහි නියුක්තයෙකි. එයින් සියබසෙහි වැටෙ 'දැමි' ශබ්දය පිණිස සකුවෙන් 'ගොමි' යනු යෙදියැ හැකි යැ. බෞද්ධව්‍ය වහාරයෙහි වැටෙන 'ගොමි' ශබ්දය 'මහොපාසක' යන් කියනසෙ නිඝණ්ඩුශාස්ත්‍රයෙහි පළට වේ. මේ හේතුවින් ගුරුළුදැමි යනු මැ ගුරුළුගොමි යැ යි වහර පත්සෙ පෙනේ. අග්බෝ දවසැ පළට වැ සිටි 'දැමින්' වෙන් කරනු පිණිසැ පෙළපත් නම් විසින් හෝ ග්‍රාමනාමවශයෙන් හෝ 'ගුරුළු' යන උපපදය යෙදිණ. එය අන් බසෙකින් නොතැබියැ යුතු ශබ්දයෙකි. 'දැමි' යනු පිණිසැ 'ගොමි' යනු යෙදුව ද 'ගුරුළු' යනු පිණිසැ යෙදුව මනා ශබ්දයෙක් නැත් නුයි, ගුරුළුදැමි - ගුරුළුගොමි යන දෙ තන්හි මැ 'ගුරුළු' ශබ්දය නොබුන් වැ එයි. ඇතැම් පඬිවරුන් ගොමි ගැමි, දැමි' යි විපර්යාසයක් සිතතුදු එය නොපිළිගත හෙයි. මෙ ලෙස විමසා බලත් බලත්, හෙළදිවැ ඉපැරැණි 'ගුරුළු' ගොත්‍රයෙහි උපන් 'දැමි' ඇඳුරිඳු ගුරුළුදැමි වේ නු යි, තෙල නම පෙළපත හා තනතුර හා කියන නමෙකි. අන් කරුණු තැන ද, ගුරුළුදැමි යන නැමින් මැ මේ පඬිවරයා පිරිසිදු හෙළයකු බව පෙනේ මැයි.

## අනුවාදමාර්ගය

ආචාර්ය ගුරුළුදැමියන් ධර්මවිනයෙහි දු සමයාන්තරයෙහි දු ශබ්ද ශාස්ත්‍රයෙහි දු කාව්‍යනාටකාදියෙහි දු කෙළපත් මහ පඬිවරයකුසෙ 'ධර්මප්‍රදීපිකා'යෙන් වුව ද දත හැකි යැ. ධර්මව්‍යාක්‍යානයෙහි ලා ඔවුන් දක්වන චාතුර්යය අත්‍යර්ථයෙන් මැ විස්මය එළවයි. අර්ථොද්ධාර යැ, නිරුක්ති යැ, පර්යායවචනයැ, ප්‍රත්‍යයොද්ධාරයැ, ප්‍රත්‍යයාර්ථ දිපන යැ, සාධක යැ, ආප්තවචන යැ යනාදි ව්‍යාඛ්‍යානාඞ්ග ඔවුන් ගේ 'ධර්මප්‍රදීපිකා' නම් ව්‍යාඛ්‍යානමාර්ගයෙහි බෙහෙවින් දක්නා ලැබේ. ඒ මතු ද නො වේ. එක් මැයෙකින් මැය වැළක් මවා-ගෙනැ ව්‍යාඛ්‍යානමාර්ගය පළල් කිරීමෙහි දු සමර්ථ වෙති. මෙ යැ, නිදර්ශනයෙක් නම්:

"දහනපරිගතා වීය කුඤ්ජරො වනගහනා ගෙහා නික්ඛමිත්වා-යන මෙයින් මහාපුරුෂයා ශ්‍රද්ධාදිපඤ්චධර්මයෙහි සිට පඤ්චදුශ්ශීලයෙහි ආදීනව දැකැ පඤ්චසීල හා උපොසථසීල ගිහිගෙයි සිට පිරියහැකි වූ ද, සර්වාකාරපරිපූර්ණ කොට සමාධිපදස්ථාන වූ බ්‍රහ්මචර්යා පුරන්නට අශක්‍යයෙන් 'මනාපකායිකා' නම් දෙවතාවන් බඳු අභිරූප ස්ත්‍රීන් විසින් රම්‍ය වූ ගිහි ගෙ පියා ලැව්ගිනි ගත් වනගහනයෙකින් නික්මෙන ඇතක්හු සෙයින් නික්මුණු පරිදි කීහු"

'ධර්මප්‍රදීපිකා'යෙහි ලා එන තෙල වැකියෙහි දී "දහනපරිගතා" යනාදි පාඨය මැය කොට තබා-ගෙනැ එයින් මැ ශ්‍රද්ධාදි පංචධර්මයෝ යැ, පංචදුශ්ශීල යැ, ප්‍රාණවධයෙහි ආදීනව යැ, අදත්තාදානයෙහි ආදීනව යැ, කාමමිථ්‍යාචාරයෙහි ආදීනව යැ, මෘෂාවාදයෙහි ආදීනව යැ, සුභාෂිතවචන යැ, මද්‍යපානයෙහි ආදීනව යැ, පංචශීල යැ, ශීලඵල යැ, පෞෂථශීල යැ, පෙහෙවස්හි ඵල යැ, දිව්‍යසුඛ යැ, මනාපකායිකදෙවතාවො

යැ, මනාපකායික දෙවත්වය කරන අෂ්ටධර්ම යැ, ස්ත්‍රීන් අභිරූප වන්නට හෙතු යැ යි ෂොඩශමාතෘකාවක් මතු කොට ගෙනැ පෙළිනුදු අටුවායෙනුදු ආප්තවචනයෙනුදු ප්‍රමාණ ඇරැ පාමින් සුවිස්තර ධර්මව්‍යාඛ්‍යානයක් කරති. එහි අවසනැ "මෙතෙකින් 'දහනපරිගතා විය කුඤ්ජරො වනගහනා ගෙහා නික්ඛමිත්වා' යනුයෙහි සම්භව වන පරිකථා උද්දේශයෙන් දක්වන ලදි." යනු කියමින් තමන් මෘතෘකා නැගූ සැටි දූ කියති. අල්පවස්තුවක් ව්‍යාසවශයෙන් වින්‍යාස කිරීමෙහි ලා මොවුන් තුළ පැවැති පාරිණත්‍යය මෙයින් පෙනේ.

"ශ්‍රමණඵල නම් කවරැ ය ක්ඃ ජාති ජරාමරණදුඃඛයෙන් පරිමුක්ති යැ"

මෙ ද 'ධර්මප්‍රදීපිකා' යෙහි එන වාක්‍යයෙකි. මෙහි "ගර්භාවක්‍රාන්තිමූලක දුඃඛ යැ, ගර්භපරිහරණ මූලක දුඃඛ යැ, ගර්භවිපත්ති මූලකදුඃඛ යැ, විජායනමූලකදුඃඛ යැ, ගර්භයෙන් බහිර්නිෂ්ක්‍රමණමූලකදුඃඛ යැ, ආත්මොපක්‍රමමූලකදුඃඛ යැ, පරොපක්‍රමමූලකදුඃඛ යැ යනාදි අනෙක දුඃඛයනට මුල් වන බැවින් ජාතිය දුකෙකි" යනාදී විසින් කියැ යුතු ඉතා පළල් ධර්මකථාවක් දෙ තුන් වචනයෙකින් කෙටි කොට කියා ඒ දුඃඛයෙන් පරිමුක්තිලක්ෂණ නිර්වාණපදප්‍රාප්තිය ද එක් මැ වචන යෙකින් සැකෙවින් කියත්. 'ශ්‍රමණඵල'ය මාතෘකා කොට 'රතනාවලි'ය සා මහත් පොතක් ලියූව ද, ගුරුළුගොමීන් ගේ තෙල කෙටි වැකියෙහි එ හැම ඇතුළත් වෙයි. සුවිස්තර ඇති දැයෙහි සාරය හකුළා කීමෙහි චාතුර්යය මෙයින් පෙනේ.

හැකුළු දැය අරුත් විසින් පළල් කොට ලිවීමෙහි දූ පළල් දැය හකුලා ලිවීමෙහි දූ යම් කෙනෙක් සමර්ථ වෙත් නම් එබඳු සමර්ථයෝ දුර්ලභයහ. එ බඳු සමර්ථ ලේඛකයන් කෙරෙහි දූ ගුරුළුගොමීන් නෙත්තියෙහි මැ සිටුනාසෙ මෙහි අළ නිදර්ශන කිහිපයෙක් දත හැකි යැ. ගුරුළුගොමීන් ගේ අනන්‍යසාධාරණ පද සටනාව ඔවුන් ගේ විශේෂය කියන චිහ්නයක් වුව ද, "පාළියෙහි පද සිටි සැටියෙන් ගත් ඡායාමාත්‍ර මිසැ උන් ගේ විශේෂදක්ෂතා නො වෙති"යි කියනුවෝ ඇත. "ප්‍රීතිමංගල ගීතෙහි" යන මෙහි පරිකථා ද "බොධිගුත්තාදිහි පාලිතො" යන මෙහි පරිකථා ඇයි ඔවුන් කළ ඉබොහෝ පරිකථා බලත් මැ, ඒ අනන්‍යසාධාරණ පදසටනාව ඇත. ඒ පරිකථා පාළිපාඨයෙක අනුවාද නො වේ. පාළිපාඨයෙක ඇසිරි ඇත ද, නැත ද, ඔවුන්ගේ පදසටනාව නම් ඔවුන් මැ ගේ විශේෂය දක්නට නුවණැතියන් යන සණ්ටාපථයෙකි. ඔවුන් 'ධර්මප්‍රදීපිකා'යෙහි දී සියබසින් 'කලිගු කථා'ව ලියමින් පළ කළ අනන්‍යසාධාරණ පදසටනාව පිණිසැ කිසි දූ පාළිපාඨයෙකැ ආශ්‍රයෙක් නැත.

**පන්සියපනස් ජාතක පොත** 'ජාතකට්ඨකථා'යෙහි අනුවාදයකි. **සද්ධර්මරත්නාවලිය** 'ධම්මපදට්ඨකථා'යෙහි අනුවාදයෙකි. **සද්ධර්මාලංකාරය** 'රසවාහිනි'යෙහි (-සහස්සවත්ථුයෙහි) අනුවාදයකි. **සිංහලබොධිවංශය** 'පාළිබොධිවංස'යෙහි අනුවාදයකි. **සිංහල ස්තූපවංශය** 'පාළිථූපවංස'යෙහි අනුවාදයෙකි. **එළුඅත්තනගලුවංශය** 'හත්ථවනගල්ලවිහාරවංස'යෙහි අනුවාදයකි. **සද්ධර්මරත්නාකරය** 'සාරසංගහ' නම් ග්‍රන්ථයෙහි අනුවාදයකි. මෙසේ පෙළබසින් වැටෙමින් ආ බොහෝ දැය පුරාණාචාර්යවරයෝ සියබසින් අරවා තැබූහ. ගුරුළුගොමීහු මතු නො වෙති. පෙළ ඇසිරි කොට පොත් කළ බොහෝ ඇදුරුහු ඇත. එසේ වුව ද, එ හැම පොත් එක් පසෙක තබා ගුරුළුගොමීන් කළ 'අමාවතුර' විරුදු පසැ තබා ශ්‍රැතිරම්‍ය වූත්,

විමර්දක්ෂම වූත්, ක්‍රමබද්ධ වූත් වාක්‍යවශයෙන් අගය නගත් මැ, එහැම පොත් එක වට මඩනට 'අමාවතුර' සමත් වෙයි.

ගුරුළුගොමින් ගේ අනුවාදයෙහිත් සෙසු ඇදුරන් ගේ අනුවාදයෙහිත් දක්නා ඉමහත් අතුර එයට හේතු වෙයි. සෙසු ඇදුරුහු පාළිපාඨය හෝ අටුවාපාඨය හෝ ඇසිරි කොට ගෙනැ තමන් සැපැයූ උපමායෙන් තමන් සැපැයූ පරිකථායෙන් සදමින් අනුවාද කෙරෙති. විදැහු මොණරපිල් කලබක් සෙයින් මූලපාඨය පළල් කොට දක්වති. එයින් මැ ඔවුන් ගේ චාතුර්යය හා බහුශ්‍රැතභාවය හා දක්වති. ගුරුළුගොමීහු අමාවතුරෙහි ලා එමඟ නො ගනිති. ඔහු මූලපාඨය අඩු වැඩි නො කොට සියබසින් අරවා තබත්. තමන් සැපැයූ උපමාවක් හෝ විස්තරයක් හෝ එහි ලා නො කියත්. **අංගුලිමාල දමන, නාලාගිරි දමන, නන්දෙපනන්දදමන, ආළවකදමන, සච්චකදමන, බකබ්‍රහ්මදමන** යන මේ කථා 'බුද්සරණෙ'හි ලියූ සැටි හා 'අමාවතුර'හි ලියූ සැටි හා සසඳන්නේ යැ. 'රතනාවලිකාර'යන් අටුවා අනුවාද කරන සිටි දූ ගුරුළුගොමින් අටුවා අනුවාද කරන සැටි දූ සසඳන්නේ යැ. ඒ සැසැඳිල්ලෙන් සෙස්සන් ගේ අනුවාදමාර්ගයෙහි මහත් අතුර පැහැදිලි වෙයි. ගුරුළුගොමිහු ශ්‍රැතිරම්‍ය වූත්, විමර්දක්ෂම වූත්, වචන යොදමින් මූලපාඨයෙහි බැසැ සිටුනා අර්ථය හකුළා ගෙනැ එහි ඇති සැටි මැ මිසැ නො කියති. ඔවුන් ගේ අනුවාදයෙහි දී විස්තෂ්ට සඳහා වත් මූලපාඨය අඩු වැඩි නො කෙරෙති. එසේ ද වත්, ගුරුළුගොමි ඇදුරිඳු බුත්සරණකාරයන් සෙයින් රතනාවලිකාරයන් සෙයින් කථා වස්තුවක් රස ඔවා විදහන්නට අසමර්ථයහයි නොසිතියැ යුතු යැ. 'ධර්මප්‍රදීපිකා'යෙහි ලා 'කලිඟුකථා'ව රස ඔවා විදහා කීමෙන් වස්තුවිකාශනයෙහි පරමාචාතුර්යය දක්වා-ලූ හෙයිනි.

ගුරුළුගොමීහු කථාශරීරයෙහි පිරුවිය යුතු තැනක් දුට අන් අටුවායෙකින් කරුණු ලා එ තැන පුරවනු මිසැ හානි නො කරති. 'අමාවතුරෙහි' එන 'ස්වසන්තානදමන'ය නම්, 'ජාතකඅටුවා'යෙහි එන 'අවිදූරනිදානකථා'ව ඇසිරි කොට ගෙන කළ අනුවාදයෙක් වේ. එහි "සිංහයො නාද කෙරෙති" යනුදු "තුඩු දසදහසක් සක්වළැ සතලිස් දහසක් වරම් රජහු සහපිරිවරින් අවුදු ගබ්දොර පහාදොර පටන් ගෙනැ සක්වලගල් දක්වා වටා අරක් ගත්හු" යනුදු "නැහැ හඬවනුවන්" යනුදු "දුගඳ වා විහිදුනවුන්" යනුදු 'අවිදූරනිදානකථා'යෙහි නැත. එසේ වුව ද, ඒ ඒ කරුණු අන් තැනෙකින් ගෙනැ යොදති. 'පරසන්තාන දමන'ය ද 'ජාතකඅටුවා'යෙහි මැ අනුවාදයෙක් වේ. එහි "එ කල්හි සැරියුත් මුගලන් දෙ දෙන දෙසිය පනස් දෙනකු ගෙනැ බුදුන් කරා එළඹැ එහිභික්ඛුභාවයෙන් පැවිජි වැ සහ පිරිවරින් රාත් වැ අගසවුතන් පත් වූහු" යනු දූ "එක්බිති කොසොල් රජහු දූ සමන්කුමාරි පන්සියක් රථපිරිවරින් ගඳමල් ගෙනැ නික්මුණු" යනුදු අන් තැනෙකින් ගෙනැ යොදති. 'ජාතක අටුවා'යෙහි 'සන්තිකනිදානකථා'යෙහි මෙ කරුණු නො එයි. මතුයෙහි දු ඒ ඒ තැනැදී අවශ්‍ය දැය අන් තැනෙකින් ගෙනැ ඌනපුරණ කරනසෙ මූලපාඨ හා අනුවාද හා සසඳත් මැ දත හෙන්නේ යැ. ගුරුළුගොමින් ඒ ඒ පරිච්ඡේදයෙහි අනුවාද සඳහා යම් මැ අටුවාකථාවක් ඉදිරියෙහි තබාගත ද, කිසි තැනෙක දී ඒ අටුවාකථායෙහි සඳහන් නොවන කරුණත් තෙවළායෙහි ඒ ඒ තැනින් නඟා ගෙනැ එහි ගළපා ලන සැටි සමහරු නො දනිති. එ නො දැනැ අනුවාද, මාත්‍රයෙහි සමත්සෙ කියා ගුරුළුගොමින් පසසන්නාහු බොහෝහ.

ගුරුළුගොමිහු පෙළ අටුවා නො තබා දත් නුවණ හා විස්මයාවහ ප්‍රතිභාශක්ති හා තමන් කළ ගත්ති ලා දක්වති. 'අමාවතුරෙ'හි 'දුරදාන්තදමන' නම් ප්‍රථම පරිච්ඡේදය වුව ද, ඔවුන් ගේ විස්මයාවහ ප්‍රතිභාගතිය කියා පානට නිසි නිබන්ධයෙකි. ඒ පරිච්ඡේදය මූලපාඨයෙකැ අනුවාදමාත්‍රයෙක් නො වේ. සියබසෙහි එන පැරැණි පද්මිණි පියන්පත ඒ ප්‍රථමපරිච්ඡේදය වේ. ඒ ඒ විෂය පිණිසැ ජාතකථා දෙසිය පහක් පමණ සිඳැ - ගෙනැ ආවත්මුතුවැළින් ඒ පියන්පත විසිතුරු කළසේ පෙනේ. 'ජාතකකථාසංග්‍රහයක්' හෝ ඇසිරි කොට ගෙන අමාවතුරෙහි ප්‍රථමපරිච්ඡේද ලියන ලදැයි නොකියැ යුතුයැ. 'ධර්මප්‍රදීපිකා'යෙහි දී "ජින්නං මෙ ගිනිබන්ධනං" යනුවට පරිකථා කරමිනුදු ගුරුළුගොමිහු ජාතකපොතෙහි ලා පැවැති කෞෂල්‍යය දක්වති. ජාතක අටුවායෙහි ගත් භාණ්ඩුකර්ණ-පාණ්ඩුකර්ණාදීන් ගේ පවත් ඈ නොඑක් දැ 'ධර්මප්‍රදීපිකා'යෙහි නොඑක් තැනැ නො පැකිළැ පැවැති නුවණ මැ ඔවුන් ගේ එළියසෙ පෙනේ. ගුරුළුගොමිහු තම නැණපමණින් දුටුවා මිසැ මෙරමා ගේ සංග්‍රහයන් තමන් සැපැයූ දැය සෙයින් පැහැරැ ගෙනැ සිය ගත්හි ලා ලොව වළහමින් වියත්කම් නොකියනු වෙති. 'දුර්දාන්තදමන' පරිච්ඡේදය මැ ගුරුළුගොමින් නවඟසසුන්හි එක අඟෙකැ පුහුණු ලත් සැටි කියතුදු එහි ලා විමති පහළ කරන අය ද මෙ කලැ ඇත. අනෙක් ශාසනාංගයෙහි ඔවුන් වියත්කම් දක්වන සැටි 'ධර්මප්‍රදීපිකා' යෙහි දී පෙනෙනුයෙන් අපට මෙහි විමතියෙන් නැත. ඔවුන් ගේ ආගමධරභාවය සඳහා 'අමාවතුර' උසස් නොවේ. 'අමාවතුරෙ'හි එන බුද්ධචරිත හැම ආ බෞද්ධයන් කෙරෙහි පළට වැ ඇත. බෞද්ධයන් දන්නා දැය වුව ද, එය කියන බසෙහි බැසැ සිටුනා රසය නිසා 'අමාවතුර' හෙළයනට රසවි පොතෙක් වි යැ. එයින් මෙහි වටනා කම නම් බස අතින් ඇති වටනාකම වේ. ගුරුළුගොමිනුදු සියබස පිණිසැ මැ මෙ ගත් කළසෙ සිතියැ හෙයි. සෙස්සන් වචන ශතයෙකින් කියන දැය තමන් දෙ තුන් වචනයෙකින් කියන හෙයිනුදු එ දෙ තුන් වචනය ද පවා විමර්දක්ෂම වත් මිසැ බොරු බස් නොවන හෙයිනුදු හෙළදිවැ පළ පැරැණි පදවැළ හා වියත් වැකි මිසැ කිලිටි පද හා නොවියත් වැකි නො ලියන හෙයිනුදු වියරණ වැට නො බිඳැ රැකැගන්නා සැටි දක්වන හෙයිනුදු වැකි බැඳුමෙහි දී පැරැණි හෙළ නියර මැසැ දෙමළ නියර අනු වැ නොයන හෙයිනුදු මූල පාඨයෙහි තුබූ සැටි මා සියබසින් අරවා තබනු මිසැ අඩු වැඩි නොකරන හෙයිනුදු ගුරුළු ගොමීන් ගේ 'අනුවාද'ය ඉස් වටා බණන්නක්හු සෙයින් හැම තැනැ මතු වෙයි.

## අමාවතුරු බස්වහර

සියබසෙහි පදවැළ පෙළ සකුවහරින් සිද්ධ යැ. තත්සමවශයෙනුදු තත්භවවශයෙනුදු අද ද පවා සියබස සඳහා පද එයි. අන්‍යදේශභාෂායෙන් පැමිණි පදයෝ ඉතා අල්පයහ. පෙළසකුවහර හා සබඳකම් ඇති පදයෙන් ගොතන වැකි ද පෙළනියර හා සකුනියර හා අනු වැ තුබුව මනා වෙයි. ගුරුළුගොමීහු මෙ කරුණ මැනැවින් දැනැ තමන් ලියන වැකි නිරතුරු පෙළසකුවහර අනු වැ මැ ලියූහ. ඒ සැටියෙන් නොලියූ උගතුන් කළ ග්‍රන්ථ හා ගුරුළුගොමීන් කළ ග්‍රන්ථ සසඳන විට මතු වන ඒ වෙනස රසාවහ වෙයි. ගුරුළුගොමීන් ගේ නිබන්ධන රසාවහ වනුයේ ඒ හෙතුවිනි.

ව්‍යක්තභාෂාව හා අව්‍යක්තභාෂාව හා ලොවැ හැම ආ ඇත. තෙල දෙ බසින් ලොකයාත්‍රාව පවත්නාසෙ අපි දැනුම්හ. ව්‍යක්තයෝ ඉතා විරලයහ. අව්‍යක්තයෝ බොහෝ වෙති. අව්‍යක්තයන් වැඩිසෙ දැක ව්‍යක්තයා ද අව්‍යක්තගණයට යා යුතු වේ

නම්, ව්‍යක්තයාගෙනුදු ව්‍යක්තභාෂායෙනුදු වැඩෙක් නො වෙයි. ව්‍යක්තයා ව්‍යක්තභාෂායෙන් ලියන්නේ යැ. ඒ නිබන්ධ අව්‍යක්තයන් ව්‍යක්ත කරන්නට සමත් වෙයි. පොළොන්නරු සෙමෙහි විසූ අව්‍යක්තජනයා ද උන් ගේ භාෂාව ද වැඩිසෙ දැකැ ගුරුළුගොමීහු අව්‍යක්ත නොවූහ. අව්‍යක්ත භාෂාව ද නො ලියූහ. ඒ හෙතුවින් ‘ධර්මප්‍රදීපිකා’ව ද ‘අමාවතුර’ ද අව්‍යක්තයන් ව්‍යක්ත කරන්නට සමත් වැ ඇත. ගත වූ දීර්ඝ කාලය තුළ මේ ව්‍යක්තරචනාව නිසා සිදු වූ වැඩ බොහෝ වෙයි. පොළොන්නරු අවධියට අයත් මුවදෙව්දවත-සසදවත ආදිය ලියූ බස එ කල රටවැසියන් බුණු බස් නො වේ. එසේ ද වත්, ඒ කවි රටවැසියන් පිණිසැ ගෙතිණ. ගුරුළුගොමින් ලියූ බස ද ඒ කලැ රටවැසියන් බුණු බස් නොවතුදු ඔවුන් ගෙතු ගත් රටවැසියන් පිණිසැ වෙයි. රටවැසියනට බසිනුදු වැඩදා වන සේ ලියයුත්තෝ නම් බස නිසි සේ දත් ව්‍යක්තයෝ මැ යැ.

බස අතින් සලකත් මැ ‘අමාවතුරෙ’හි කිසි තැනෙකැ ඉපැරැණි හෙළබස ද කිසි තැනෙකැ හුදු පෙළබස ද කිසි තැනෙක හුදු සකුබස ද කිසි තැනෙකැ මුසු බස ද කිසි තැනෙකැ සෙස්සන් නොලියූ වචනද ඇතිසෙ කියයුතු යැ. “සැබෙවින්, සඊරුන්. සිද්ධත්කුමර, දිවසොධා, තිඊයො, රඊණියෙන්, අභිභවන්නට, නොධැමිට්, කම්පඊ. පත්ධම්” ආදී විසින් මෙහි යොදන වචන හා ‘සිට්’ ආදි හලන්තශබ්ද පොළොන්නරු අවධියෙන් පෙරැ පැවැති වහර දක්වන යෙදුම් වෙයි. මෙහි පැනෙන පැරැණි බස් වහර නිසා ‘අමාවතුර’ ‘ධර්මප්‍රදීපිකා’වට වඩා පැරැණිසෙ පෙනේ. ගුරුළුගොමීහු කැලැ මැ ‘ධර්මප්‍රදීපිකා’ව ලියා පසු ‘අමාවතුර’ ලියූසෙ කියති. එයින් ‘අමාවතුර’ට වඩා ‘ධර්මප්‍රදීපිකා’ව පැරැණිසෙ දත හෙනු මිසැ බසින් නම් නොදත හෙන්නේ යැ. ‘අමාවතුර’ තුළ ඇති “තො කවරෙහි? තො කවරහු? දෙව්දුවක්මු” යනාදි යෙදුමුදු ප්‍රාකෘතලක්ෂණ බහුල කොට සිටුනා බස්වහර දු ප්‍රමාණ කොට ගනුත් මැ, පොළොන්නරු අවධියට වඩා පැරැණි බසින් හා පැරැණි සදනියරින් හා මෙ ගත් කළසෙ පෙනේ. “සන්තුසිත, එහි භික්ඛුභාව, ගයාසීය, සාසංක, සඤ්ඤම, දුබ්භොජන, දුක්ඛසෙය්‍යා, පටිපාටි, නිය්‍යාණික, පපටිකා, අබ්බොහාරික, පරියන්ත, ව්‍යාවට, ආලම්බන, අච්චන්තනිච්ච, අච්ඡන්දික” යනාදී පාළිවචන ද මෙහි යොදති. පාළිවචන සිට ව මැ ගෙනැ ලියනු අනුරාධපුරසමයෙහි පැවැති සේ හුදු පාළිවචන ද ඒ ඒ තැනැ යොදති. මෙයිනුදු ‘අමාවතුරෙ’හි බස පොළොන්නරු අවධියට වඩා පැරැණිසෙ පෙනේ. ‘පඤ්පධූපගන්ධ පරිවාසිත, පරමසෞභාග්‍යප්‍රාප්ත, ධ්‍යානචෙතනා, නිර්ව්‍යාපාර, ශත්‍රුමථන, ස්වර්ණශිවිකා, පරමදක්ෂිණීය, විප්‍රකාර, අනුයොගක්ෂම, විමාර්ජනක්ෂම, ප්‍රතිමුක්ත, නිෂෙධ. ප්‍රාදෙශිකඥාන, උද්වෙග, රොමහර්ෂ, යන්ත්‍රාරූඪ, ක්ලේශක්ෂොභ, උත්කර්ෂ, ශික්ෂිත, වික්ෂිප්ත, පර්යන්ත, අභිඥාපාදකධ්‍යාන, පර්ව, පරිෂෙක, නිරිහ, අන්තඃකූටාගාර” යනාදි සංස්කෘතවචන ද මෙහි ඇත. හුදු හෙළුවදන් වැළෙහි තැනැ තැන සකුවදන් ඇතියෙන් එ ඇතිබවෙකුදු නො පෙනේ. “කෙලෙස් වාසනාලව, වායව්‍යාදෙසෙහි, ගමන්ශ්‍රම, පුත්‍රසනා, ඍද්ධි පෙළහර, දූනුවායොධයන්, සර්වඥපවරුණ, ශිල්පසමහර, ස්වෙද බිඳුපොද, ඇඟිලිපර්වයක්, ලාරසපරිෂෙක, නැසමාගමයෙහි” යනාදි මුසුබස ද මෙහි ඇත. හෙළුපද හා පෙළසකුපද එක් කොට ලියනු වරදසෙ දක්නවුන් මෙ කලැ ඇත ද, එ ද වරද න තිසෙ ගුරුළුගොමීන් ගේ වහරවිදියෙන් පෙනේ. එ මතු නොවේ. “චුල්ලධර්මා, අනුපාදාවිමෝක්ෂ” යනාදි විසින් පෙළ සකු පද ද එක් කොට ලියූ තැන් මෙහි වෙයි. “ඔස” යන පදයෙක් 43, 69, 67, 86, 101, 114, 128, 193, 218, 242, 243, 250, 250, 264, 300, 302 යන ලකුණු ධරන ඒ ඒ පිටුයෙහි ඇත. අන් පොතෙකැ නුදුටුවිරූ පදයෙකි. සාහිත්‍යයෙහි දුර්ලභ පද ද මෙ

ගත්හි යෙදුසෙ එයින් පෙනේ. හුදු හෙළුව ලියන වර්ණමාලයෙන් පෙළසකුවදන් ලියා සියබසෙහි ලා ගත් තැන් ‘ගුප්තිලකාවය’ය, කාව්‍යශේඛර’ය යනාදි පොත්හි ඇත. එහි එන “සිල්ප-දෙසන්තර” ආදි වචන නිදර්ශන වශයෙන් එළැවිය හෙයි. ‘අමාවතුරෙ’හි දු පෙළසකුවදන් හුදු හෙළුව ලියන වර්ණමාලායෙන් ලියා සියබස්බවට ගත්සෙ නො එක් තැනැ දක්නට ඇත. මෙහි නිදර්ශන මතු නො කළ ද, ග්‍රන්ථය හදාරන විට එ බඳු තැන් පාඨකයනට හමු වෙයි. මෙ හැම යෙදුම් ගුරුළුගොමීහු ‘සියබස’ කොට ගනිත්. ග්‍රන්ථාරම්භයෙහි ලා “සියබසින්” සැබෙවින් දක්වන ලැබෙ’යි සඳහන් කළ ‘සියබස’ නම් මෙ හැම යෙදුම් වෙයි. පෙළවදන් වේ වයි, සකුවදන්, වේ වයි, මුසුවදන් වේ වයි කියුව මනා අර්ථය පහළ කරන්නට පොහොසත් පදවැළ සියබසෙහි අඟපසඟසෙ අමාවතුරින් ප්‍රකාශ වේ.

## වාක්‍යවිධි

ගුරුළුගොමීන් ගේ වාක්‍ය විමසා බලත්, සියබසෙහි පෙරැ පැවැති රීති බෙහෙවින් මත කරැ-ගත හැකි වෙයි. ඔවුන් යොදන පදවැළ බෙහෙවින් පැරැණි සන්න ගැටපද විවරණ පිටපොත් ආදියෙහි තුබූ පදවැළ වියැ හෙයි. ඒ පදවැළින් ගොතන වාක්‍යයෙහි දූ පැරැණි වාක්‍යරචනාවිධි තුඩුව මනා මැයි. මෙහි ලා අපට දුටු කිසි දෙයක් ඇදැ දැක්වීම වටතියි සිතම්හ. ‘අමාවතුර’ හදාරන ශිෂ්‍යයනට එයින් වැඩ සිදුවේ.

1. **දසමසින්** (-දසහි මාසෙහි) **කෙළෙන්** (-සටෙහි) **කේල්පතින්** (-කදලිපත්තෙහි) **නියෙන්** (-නඛෙහි) **දිවියෙන් සරණ ගියහ** (-පාණෙහි සරණං ගතා) **නවමහ වැස්සෙන්** (නවහි ...... වුට්ඨීහි) **යුවළ දෙර පුවරියෙහි** (-පඤ්චසු වෙරෙසු) **කෙහෙයෙහි ගෙනැ** (-කෙසෙසු ගහෙත්වා) **කනැ** (-කණ්ණෙසු) **සරණැ නො ද පිහිටියහ** (-න සරණෙසු පතිට්ඨිතා) මෙ ආදි විසින් අටුවාපාඨයෙහි අනුවාද ගත් සැටි බලත් මැ, අමාවතුරෙහි දී කරණාධාර දෙක්හි එකවචන බහුවචන වශයෙන් රූපභෙදයක් නොසලකනසෙ පෙනේ. බහුවචන පිණිසැ කී තෙල පද එකවචන පිණිසැ ද එ සැටි මැ මිසැ අන් සැටියෙකින් නොවැටෙන හෙයිනි. දම්පියාටුවාගැටපද ආදි පැරැණි ගත්හි දූ මෙ සැටිය මැ දක්නට ලැබේ. පැරැණි ගැදි පද දෙක්හි මැ කරණාර්ථ හා ආධාරර්ථ හා කියන අචෙතන පද දෙ බස්හි සම සේ යෙදිණ. සිදත් සඟරායෙහි දී කරණ විබත් දක්වන තැනැ දෙ බසෙහි සම රූපි කියකුදු, අදරවිබත්ති ‘අන්හි’ යන බහුවචන විභක්තිය කියති. “පහනැ තඹරන්හි බමන බමරමුළු තමඹ පිරියෙසැ සරන තිමිරබලල්වලා” යනු ආධාර බහුවචන පිණිසැ නිදර්ශන ද කෙරෙති. ආධාරබහුවචන සිදු කරන්නට අළ ඒ නිදසුන තබා අන් එක ද නිදසුනක් පැරැණි ඡෙකව්‍යවහාරයෙන් සපයා නොගත හැකි යැ. තඹරත්හි (-තාමර-සොදරයෙහි) යන පදය තඹරන්හි කියා ලිපිදොසින් තිබියැ දී ‘සිදතෙ’හි ප්‍රමාණපාඨ පිණිසැ ගියහයි ද එයින් ප්‍රමාණපාඨ නො වෙතියි ද නිශ්චය කොට ගෙනැ බැහැරැලන්නට වටනේ යැ. සියළසෙහි දී චෙතන ශබ්ද ගණයෙහිත් අචෙතන ශබ්ද ගණයෙහිත් කාරකාර්ථ කියන පදරූපයෙහි දක්නා වෙනස විමසත් මැ. ‘තඹර’ අචේතන නුයි එහි බහුවචන රූපයෙක් නොලැබියැ හෙන්නේ යැ. ගුරුළුගොමින් ආදි ඡෙකයන්ගේ වහරෙහි ‘ආධාරබහුවචනයහ’යි වෙන් කළ මනා රූපභෙද නොලැබේ.

2. ගුරුළුගොමීන් පෙළ අටුවා දෙක්හි ලැබෙන අනාගත ආඛ්‍යාතයෙකැ අනුවාද පිණිසැ ගන්නා ක්‍රියාපද වර්තමාන කාලය කියන්නට යෙදියැ හෙන පද මැ වෙයි. අනාගතාර්ථ කියන විශේෂ ක්‍රියා පදයක් සියබසෙහි ලා ඔහු කිසිදු තැනෙකැ නො දකිත්.

"සත්තමෙ දිවසෙ මරිස්සතී'ති වුත්තං, සො තථෙ'ව මතො. ඉදං පඨමංපාටිහාරියං. අලසකෙනා'ති වුත්තං. අලසකෙනෙ'ව මතො. ඉදං දුතියං, කාලකඤ්ජකෙසු නිබ්බත්තිස්සතී'ති වුත්තං, තථෙ'ව නිබ්බත්තො. ඉදං තතියං බීරණත්ථම්භකෙ සුසානෙ ඡඩ්ඩෙස්සන්ති'ති වුත්තං. තථෙ'ව ඡඩ්ඩිතො. ඉදං චතුත්තං. නිබ්බත්තට්ඨානතො ආගන්ත්වා සුනක්ඛත්තෙන සද්ධිං කථෙස්සතී'ති වුත්තං. සො කථෙසියෙව. ඉදං පඤ්චමං පාටිහාරියං"යි සුමංගලවිලාසිනියෙහි සඳහන් ලත් තෙල පාඨයෙහි අනුවාද කෙරෙමින් ගුරුළුගොමීහු මෙ සැටි ලියති.

"සත් දවසින් මියෙ'යි වදාළහැ. හෙ එසෙ මැ මෙළෙ. මෙ පළමු වන පෙළහර යැ. 'ආලස්‍යයෙකින් මියෙ'යි වදාළ හැ. හෙ එසෙ මැ මෙළෙ. මෙ දෙ වන පෙළහර යැ. 'කාලකංජකඅසුරයොන්හි උපද්දි' වදාළහැ. හෙ එහි මැ උපනැ. මෙ තුන්වන පෙළහර යැ. 'බීරණත්ථම්භක නම් සොහොනට ඇදැ - පියතී' වදාළ හැ. ඔහු එහි මැ ඇරැ දමා-පිහ. මෙ සතර වන පෙළහර යැ. 'උපන් තැනින් අවුදු සුනක්ඛත්තයා හා බෙණෙ'යි වදාළහැ. හෙ එසෙ මැ වියැ. මෙ පස් වන පෙළහරයි" (178 පිː) යනු ලියති.

මෙහි **මරිස්සති, නිබ්බත්තිස්සති, ඡඩ්ඩෙස්සන්ති, කථෙස්සති** යන අනාගත ක්‍රියා පිණිසැ පිළිවෙලින් **මියෙ, උපද්දි, පියති, බෙණෙ** යන පද සියබසෙහි ලා යොදනසෙ විමසන්නේ යැ. හැම තැනැ මෙ සැටියෙන් ම වර්තමාන කාලය කියැ හෙන ක්‍රියාපද මැ අනාගතාර්ථයෙහි දු යොදනසෙ පෙනේ. එයින් ගුරුළුගොමීන් ආදී ලේඛකයන් ගේ වහරෙහි මේ 'අනාගතරූප' යැයි වෙන් කළ හැකි විශේෂ රූපයෙක් නැත. එසේ නැති වත් මැ, කෙසේ නම් අනාගතාර්ථ වෙන් කොට දත හෙන්නේ යැ යත්; අර්ථ යැ, ප්‍රකරණ යැ, ලිංග යැ, ඖචිත්‍ය යැ, දෙශ යැ, කාල යැ යනාදිය ශබ්දාර්ථවිභාගයෙහි ලා ප්‍රමාණ කටයුතු බව ආචාර්යවරයෝ කියති. එ මගින් 'මෙ වර්තමාන යැ; මේ අනාගත යැ' යනු විනිශ්චය කළ හෙයි. වැකියෙහි වැදැ සිටුනා 'මතු' යනාදි පදයන්ගේ වහලිනුදු කාලවිභාගය දත හෙන තැන් ඉබොහෝ වෙයි.

**සිද්ධාන්තසංග්‍රහයෙහි** දී සියබසෙහි අනාගත ක්‍රියාපද වෙන් කොට ගනු පිණිසැ **අන්නේ, එන්නේ** ආදි ප්‍රත්‍යය දක්වා 'හනන්නේ' දෙන්නේ' ආදී උදාහරණ ද කියති. ඒ උදාහරණ බලත් මැ, ශබ්දයෙකැ වරනැගිල්ලක් වත් මුත් ධාතුයෙහි වරනැගිල්ලක් නොවන හෙයිනුදු වර්තමානකාලයෙහි වැටෙන හෙයිනුදු අනාගතක්‍රියාපද විසින් නොපිළිගත මනාසෙ **කුමාරතුංග** සූරීහු කියති. "තමා කෙරෙහි නැති පඨමජ්ඣාන් තමා කෙරෙහි ඇති එව්, සමවජිම් සමවැජිම් සමවජින්නෙම් එව්, අනික් මිනිස් සතක් හට බුහුමන් කැමැති සිත්තෙන් පරියාමුදා ඉඳුරා කිව, වැළැතැ සිටැ මොහු දන්වම් යන මිනිසුන් එවිගස දත පරිජි වේ" යන **සිඛවළඳවිනිස** වැකියෙහි එන 'සමවජිම්, සමවැජිම්, සමවජින්නෙම්' යන පද තුන විමසත් වටී. තුන් කල් වෙන් කොට කියනු පිණිසැ ඒ පද තුන එකිනෙක වෙනස් කොට එක්මැ තැනැ යෙදූහ. 'සමවජින්නෙම්' යනු අනාගත කාලය කියන විශේෂරූපය වෙයි.

'සමවජින්නෙම්' යනු අනාගත කාලය කියන විශේෂ රූපයක් කොට පිළිගනුත් මැ, 'දනන්නේ, දෙන්නේ' ආදි පද අනාගතක්‍රියාපද නො වෙතියි නොකියැ හැකි යැ. 'දනන්නේ, දෙන්නේ' ආදිය ශබ්ද වරනැගිල්ලෙහි වැටෙන පද වුව ද, කිසි ආචාර්ය කෙනකුන් අනාගත කාලය පිණිසැ වෙන් කළසෙ පිළිගත යුතු වේ. කාලයැ, කාරක යැ, පුරුෂ යැ යන මෙතෙක් දැය කිය හෙන පදය ක්‍රියාපදයෙක් වේ. සිය බසෙහි 'දනන්නේ' ආදිය පුරුෂ තුනෙහි වරනැඟෙමින් කාලය හා කාරකය හා කියන විටැ ක්‍රියාස්වභාවය ඇත් නුයි ක්‍රියාගණයෙහි ලා පරිගණනා කරනු වටනේ යැ. එසේ වතුදු ගුරුළුගොමීන් ආදි ආචාර්යවරයන් ගේ පදඝටනායෙකින් එබඳු 'අනාගතරූප' නො ලැබියැ හැකි යැ.

3. කිසි වැකියෙකැ පදාන්තරසංග්‍රහහෙතුවින් දක්නා පදවිධිද තැනැ තැනැ ඇත. ඒ පදවිධි පෙළසකුවහර හා නො සැසැඳෙයි. "මහරජ, තොප පියන් මුත්තන් ඈ සත් වන කුලපරම්පරායෙහි වූවන් රැස් කළ ධන යැ" (102 පි:) "හුරන් මුවන් ළිහිණියන් ඈ නොඑක් සතුන් නො ද මැරුහ" (107 පි:) "බුදුන් ආදීන් ගෙ ගුණ නො දන්නි" (137 පි:) තෙල වාක්‍ය තුනෙහි 'මුත්තන්, ළිහිණියන්, බුදුන්' යන පද විමසන්නේ යැ. පොළසකුවහරෙහි ලා මේ තැන් සමාසවිධියෙන් 'ආදි' ශබ්දයා හා එක් කොට ලියනු දක්නා ලැබේ. "බුද්ධාදීනං"යි 'බුද්ධ' - ශබ්දය හා 'ආදි' - ශබ්දයා හා සමාස විධියෙන් එක් කොට ලියනු පෙළවහර වේ. එසේ ද වත්, සියබසෙහි දී සමාසයට නිසි තැනැ සමාස නො කොට 'මුත්තන්, ළිහිණියන්, බුදුන්' යි ප්‍රත්‍යය යොදා-ලූ සැටි දක්නේ යැ. මෙහි කාරකාර්ථයක් නැතියෙන් සකුයෙහි කියන 'උපපදවිභක්තිගණ'යෙහි ලා සසඳා ලියැ හැකි යැ. වැකියෙහි දක්නා 'ඈ' යනාදි පදයන් ගේ සංසර්ගය මෙයට හේතු වෙයි. එසේ වුව ද සකුයෙහි උපපදවිභක්ති යොදනුයේ සමාසගොචර නොවන තන්හි වේ. මෙහි සමාසගොචර තන්හි දු උපපදවිභක්තිරීතිය ඇසිරි කරනසෙ පෙනේ. "(සච්චක) බුදුන් දක්නා ලැබෙයි. බණ අසනු ලැබෙයි." යනාදි තැනුදු විමසන්නේ යැ.

4. බහුවචනප්‍රත්‍යය නොයෙදුව ද, බහුභාවය ප්‍රකාරාන්තරයෙන් අඟවමින් පද යොදන තැනුදු ගුරුළුගොමීන් ගේ වාක්‍යයෙහි ඇත. තෙල වාක්‍යයන් විමසන්නේ යැ:

"ඔවුන් ඇනු වැ එ එ රටින් ආ මිනිස් පිරිස් බුදුනට මැ පිරිවර වී" (207 පි:)

"එ කල්හි මරපිරිස් ගල්සෙල් සෙයින් වැතිරෙමින් අවුදු වටා ගත්හ" (27 පි:)

තෙල දෙ වැකියෙහි 'පිරිස්' යනු නොවෙනස් වැ තිබියැ දී වාක්‍යවසානය වෙනස් වැ දෙ සැටියෙකින් සිටුනේ යැ. එක් තැනෙකැ එකවචන වෙයි. එක් තැනෙකැ බහුවචන වෙයි. මුල වැකියෙහි චෙතනයන් වෙන වෙන නො ගෙනැ පිරිස් විසින් එක් කොට සලකන ලද නුයි එහි 'වී' යන එකවචන ක්‍රියාව සටිත වෙයි. පිරිස් විසින් ගන්නා කලැ එකක් වුව ද, පිරිසෙහි හැම දෙන වෙන වෙන අවුදු වැටැලීම් ක්‍රියාව කෙළෙන් දෙ වන වැකියෙහි 'වටා-ගත්හු' යන බහුවචනය ද සටිත වෙයි. සමූහවාචී ශබ්ද චෙතනයන් කියන කලැ බහුවචනප්‍රත්‍යය නැත ද, උන් ගේ බහුභාවය වෙන් කොට ගත මනාසෙ පෙනේ නම් වාක්‍යාවසානපදය බහුවචනයෙන් යොදා-ලීම නිදොස්සෙ මෙයින් දත හෙන්නේ යැ. "යම්සෙ පර්ෂද් ඔහුගෙ රූප නො දකිත් ද" (227 පි:) යනාදි තැනුදු මෙ සැටියෙන් සැලැකිය යුතු යැ.

බහුවචනප්‍රත්‍යය නැත ද සමුච්චයාර්ථපදයන්ගේ වහලින් බහුභාවය සලකා ගන්නා තැන් පෙළ සකු දෙක්හි ඇත. ගුරුළුගොමීහු ඒ තැන් පෙළසකුනියර ගෙන ද ලියති. "සක්දෙව්රජ දූ ඔවුනට වල්ලභ වෙසවුණුරජු දූ මහතෙරුන් පෙරට කොටැ විජයත් පහයට ගියො" (278 පි:) යනු නිදර්ශන යි. මෙහි 'ගියො'යි බහුවචනයෙන් වාක්‍යාවසානය කරති. 'දූ' යන සමුච්චයාර්ථපදයෙන් 'කර්තෘහු බොහෝහ' යනු කියන හෙයිනි. "සක්කො ච දෙවානමින්දො වෙස්සවණො ච මහාරාජා ආයස්මන්තං මහාමොග්ගල්ලානං පුරක්ඛත්වා යෙන වෙජයන්තො පාසාදො තෙනුපසංකමිංසු" යනු මෙහි පෙළයි.

5. මාතෘභාෂායෙහි දක්නා අචෙතන ස්ත්‍රීලිංග ශබ්ද සියබසින් අරවන තැනැ ගුරුළුගොමීහු එකාන්තව්‍යවස්ථායෙකැ නො සිටිති. "මහ, පොළොව රැව් දහස් රැව් සුවහස් විහිදැ හැඬවැ" (29පි:) මෙහි මූලපාඨයෙහි 'මහාපඨවි' යනු එයි. පාළියෙහි ලා ඒ ස්ත්‍රීලිංග ශබ්දයෙකි. එයින් සියබසට එන 'මහපොළොව' යනු අචෙතන වුව ද, පෙරැ සිටි ස්ත්‍රීලිංග ගෙනැ එයට සරිලන සේ 'හැඬුවැ' කියා වාක්‍යාවසානපදය යොදති. "මහපෙළො ගුගුළෙ" (39 පි:) යන මෙහිලා වාක්‍යාවසාන පදය "ගුගුළෙ'යි යොදති. ඒ ස්ත්‍රීලිංගභාවය නො සලකා යොදන ලද පදයෙකි. ස්ත්‍රීලිංගභාවය සැලැකුව, 'ගුගුළ' හෝ 'ගුගුළා' යනු වත් මුත් 'ගුගුළෙ'යි 'එ' - විබත් නො යෙදිය හෙන්නේයැ. සිදත් සඟරායෙහි දු එන 'පණින් වෙළපන්නී අවිදු-කිවින් නුදුටුයෙ කෙළවම්" යන දෙ වැකි විමසත් වටනේ යැ. 'අවිදු' යන මෙහි ස්ත්‍රීලිංගභාවය ගෙනැ 'වෙළපන්නී'යි යෙදුව ද, 'උවම්' යන මෙහි ස්ත්‍රීලිංග භාවය නොසලා 'නුදුටුයෙ'යි යෙදුව ද, 'උවම්' යන මෙහි ස්ත්‍රීලිංග භාවය නොසලකා 'නුදුටුයෙ'යි යෙදිණ. මාතෘභාෂයෙහි සිටුනා අචෙතන ස්ත්‍රීලිංග ශබ්දයන්ගේ ස්ත්‍රිත්වය පිණිසැ සර්වනාමශබ්ද ද පවා යොදන තැන් ගුරුළුගොමීන් ගේ වැකියෙහි ඇත. "අවිජ්ජා සංසාරය හිස් වන බැවින් මුදුන. රාත් මහනුවණින් ඇය කඩන බැවින් විද්‍යාමුදුන් පැලුමැ" (208 පි:) යන මෙහි 'ඇය' යනු අවිජ්ජා' ශබ්දයෙහි ස්ත්‍රීලිංගභාවය දක්වමින් යොදන ලද පදයෙකි. ගුරුළුගොමීහු "උපමායෙක්, ප්‍රීතියෙක්, කථායෙක්" යනාදි පද එහි ස්ත්‍රීභාවය නො සලකා පුංරූප සෙයිනුදු ලියති. එතන්හිදී ශබ්දය ස්ත්‍රීලිංග වුව ද, එහි අචෙතනභාවය පිණිසැ පුංරූප කොට ලියනසෙ පෙනේ. මෙසේ විමසා බලත් මැ, මාතෘ භාෂායෙහි දක්නා අචෙතන ස්ත්‍රීලිංගශබ්ද සියබසින් අරවා තබන විට, ස්ත්‍රීරූපයෙනුදු කැමැත, පුංරූපයෙනුදු යෙදුව නිවරදසෙ නිශ්චය කට හෙයි.

6. "බන්ධනගත සත්ත්වයො බන්ධනයෙන් මුක්ත වූහ" (10 පි:) "ඇත්හු වල් ඇත් වෙති, අස්හු වල් අස්වෙති" (136 පි:) යන වාක්‍යයන් විමසත් මැ විශේෂ වාක්‍යවිධියෙක් මතු වෙයි. 'මුක්ත වූහ' යනු මිසැ 'මුක්තයො වූහ' යනු ගුරුළුගොමීහු නො ලියති. 'වල් ඇත් වෙති-වල් අස් වෙති' යන මිසැ 'වල් ඇත්හු වෙති-වල් අස්හු වෙති' යනුදු නො ලියති. සියබසෙහි ලා 'ව'-ධාතු (වූ) පුරණයක් අපේක්ෂා කෙරේ. පුරණාර්ථ පිණිසැ සිටුනා පදයෙහි උක්තානුක්තභාවයෙක් නොලැබීයැ හෙන්නේ යැ. මෙහි අළ 'මුක්ත-ඇත්-අස්' යන පදයෝ 'ව' - ධාතුයෙහි අර්ථ පූරණය කෙරෙමින් සිටිති. එයින් එහි ලා උක්ත භාවයෙක් වේවයි. අනුක්තභාවයෙක් වේ වයි නැත. එ හෙතුවින් ඒ පද හා උක්ත බව කියන ප්‍රත්‍යයෙක් හෝ අනුක්ත බව කියන ප්‍රත්‍යයෙක් හෝ නො යෙදේ. "බන්ධනගත සත්ත්වයො බන්ධනයෙන් මුක්තයො වූහ"යි කිව, "ඇත්හු වල් ඇත්හු වෙති"යි කිව, "අස්හු වල්" අස්හු වෙති"යි කිව වරද වන සැටිය මතුයෙහි 'එක්, අක්' යන රූප පිණිසැ ලියන පදවිභාගයෙහි ලා පැහැදිලි

කරම්හ. සකුයෙහි දී කියන ‘අර්ථාතිශයයොග’ය සියබසෙහි දූ ප්‍රකාරාන්තරයෙකින් ලැබෙනසෙ ගුරුළුගොමීන් ගේ තෙල වාක්‍යවින්‍යාසයෙන් කියැහෙන්නේ යැ.

7. “සිල්වත්හි” (96 පි:) “දිළිඳුහි” (119 පි:) “තො කිනම්හි” (168 පි:) “දත් නම්මි; මිත් නම්මි” (101 පි:) තෙල වාක්‍යයන් විමසන විට සියබසෙහිලා ශබ්ද ප්‍රකෘතිය තසදකරු අරුතෙහි දු මසදකරු අරුතෙහි දු යොදන සැටිය පෙනේ. අතීතාදි කාලභෙදය කියන ප්‍රත්‍යය නැතුවත් පුරුෂමාත්‍රය කියනු පිණිසැ ශබ්ද වුව ද යොදන්නට මෙයින් උපදෙශ ලැබේ. ඒ ඒ ශබ්ද අස්මදර්ථයෙහි වැටෙන විට ‘ම’ කාරයා හා යුෂ්මදර්ථයෙහි වැටෙන විට ‘හ’-කාරයා හා ලං කළ යුතුසෙ තෙල පදඝටනායෙන් පෙනේ.

8. සාමාන්‍ය ආමන්ත්‍රණ යැ, විශේෂ ආමන්ත්‍රණ යැ යන ආමන්ත්‍රණ දෙක එක් මැ වැකියෙහි යොදන විට සාමාන්‍ය ආමන්ත්‍රණය එකවචනයෙනුදු, විශේෂ ආමන්ත්‍රණය බහුවචනයෙනුදු යොදනු පැරැණි මතයෙකි. “පුතැ, තෙමියසිරෙනි” යන සිදත්සඟරා පාඨය ද එයට නිදසුනෙකි. ගුරුළුගොමීහු එය ගණනට නො ගනිති. “සබඥ, ජීවකය, යා තො මැ ඇතුන් සදවයි කී යැ” 6 120 පි:) “සබඥ, ජම්බූකය” (86 පි:) “පුතැ, පංචසිඛය” (288 පි:) තෙල වාක්‍යයෙහි ආමන්ත්‍රණ දෙක ඇත ද එකවචන බහුවචන වශයෙන් භෙදයක් නො දක්වති.

9. “එ කල්හි දෙවි පිබිදැ රජගහ සැළකළහ” (10 පි:) “රජපා ඔවුන් සිරිරු ලෙවැ යපෙත්” (115 පි:) “අප හැඹූ මඳක් යෙත්වයි” (260 පි:) “එ කල්හි මහසත් .......... වැඩැසිටියො” (25 පි:) “මහසත් පැරුම් සිම්දුමින් වැඩහුන්හු” (27 පි:) තෙල වැකි විමසන්නේ යැ. ‘සැලකළහ, යපෙත්, යෙත්වායි, වැඩැසිටියො, වැඩහුන්හු” යන වාක්‍යාවසානපදයෝ බහුවචනයහ. එහි උක්ත වන ‘දෙවී, රජපා, හැඹූ, මහසත්’ යන පදයෝ උත්තමයන් කෙරෙහි දු උත්තමාවන් කෙරෙහි දු ඒ ඒ තැනැ යෙදෙති. ඒ උත්තමයනට දූ උත්තමාවනට දූ ගෞරව පිණිස අවසානපද බහුවචනයෙන් තුබුසෙ පෙනේ. පෙළසකු වහරෙහි ලා ගෞරවාර්ථ බහුවචන ඇත ද, කර්තෘපදය එකවචනයෙන් තිබියැ දී ක්‍රියාපදය බහුවචනයෙන් තබන තැනෙක් නැත. සියබසෙහි දි අවිභක්තිකනිර්දෙශ වශයෙන් යොදන ශබ්දප්‍රකෘතිය කර්තෘවශයෙන් සිටියැ හෙයින් එහි එකත්වය හා බුහුත්වය හා අවසානපදයෙන් සැලැකිය හෙන්නේ යැ. “දීර්ඝතපස්වී වනාහි කලින් කලැ බුදුන් කරා එළඹැ සිටි, හිඳි, පැන පුළුවුස්සි” (56 පි:) තෙල වැකියෙහි ‘පුළුවුස්සි’ යන ක්‍රියාපදයෙහි කර්තෘ ‘දීර්ඝතපස්වී’ යන මෙයින් දැක්වේ. ඒ අවිභක්තික නිර්දේශයෙකි. විභක්තිප්‍රත්‍යය නො ගෙනැ සිට මැ කර්තෘත්වය හා එකත්වය හා ක්‍රියාපදයෙහි වහලින් දක්වා සිටුනේ යැ. එසේ වත්, වාක්‍යාවසානය බහුවචනයෙන් සිටුත් මැ, එහි වහලින් කර්තෘත්වය හා ගෞරවබහුත්වය හා දත හෙන්නේ යැ. “අප හැඹූ මඳක් යෙත්වා” යනු එයින් ව්‍යක්ත සේ සැලැකිය හැකි යැ. ‘ධර්මප්‍රදීපිකා’යෙහි එන “එක් සමයෙක්හි සමන් කුමරි පන්සියක් රථ පිරිවරින් දෙව්රම් ගොස් පන්සියක් කුමරියන් පිරිවරා බුදුන් කරා එළඹැ වැඳැ එකත්පස් වැ හිඳැ පැන පුළුවුසිත්” යනාදිය ද මෙ කී නියරින් විමසන්නේ යැ.

10. මූලපාඨයෙහි දී කර්මකාරක වශයෙන් සිටුනා වාක්‍යප්‍රදේශ අමාවතුරෙහි දී බෙහෙවින් මැ කර්තෘකාරක වශයෙන් අනුවද කරන සේ පෙනේ. “මෙ ළඳරු කලැ පියරජු හා ගොස් බුදුන් දුටුවිරි යැ” (123 පි:) – “ඉමිනා කිරි දහරකාලෙ පිතරා සද්ධිං ආගම්ම භගවා දිට්ඨපුබ්බො”) “කවරහ, අප ගෙ දදය මඩවා-පීහ?” (151 පි:) – (“කෙන

මහාධජො මද්පිතො?") "තෙපියැ, අප ගෙ දදය මඩවා-පිව?" (152 පිː)- (තුම්හෙහි අම්හාකං ධජො මද්දාපිතො?") යනාදි අනුවාද හා මූලපාඨ හා සසඳා බලත් මැ, පෙළෙහි කියන කර්මකාරකාර්ථය කර්තෘකාරකාර්ථයෙන් අරවා තබනසෙ පෙනේ. ගුරුළුගොමීන් ගේ වාක්‍යයෙහි බෙහෙවින් මේ සැටිය මැ දක්නා ලැබේ. "කෙටු, වැටු, ගැහැටු, වුහුටු, දුටු, පිවිටු" ආදි පදවැලෙහි කර්මකාරකාර්ථය ඇත ද, එ හැම එහි කර්තෘකාරකාර්ථය සලකා ගුරුළුගොමීන් යොදන තැන් සුලභ යැ. එයින් මැ ඔබ ගේ වැකි සිලුටුසෙ කියැ යුතු වෙයි.

11. "උපායයෙන්, සමයයෙන්, අසුරකායයෙහි, සමයෙයහි"යි යකාරාන්තපද යෙදුව මනා සෙයට මෙ කලැ විවාද කරතුදු "උපායක්" (62 පිː) "සමයෙන් (51 පිː) "අසුරකයෙහි" (176 පිː) "සමයෙහි" (22 පිː) යනාදි ප්‍රයොග 'අමාවතුරෙ'හි ඇත. 'ධර්මප්‍රදීපිකා' යෙහි දූ ඇත. එයින් උච්චාරණයෙහි පහසු සලකා ඒ පද එ සැටියෙන් ලියනු වටනේ යැ. එක් සැටියෙකින් ඒ පද ව්‍යක්ත නොවනසෙ පෙනෙතුදු, ඡෙකයන්ගේ ව්‍යවහාරය ද ප්‍රමාණ කටයුතු නුයි එයින් අව්‍යක්තභාවය වැසෙන්නේ යැ. වාෂ්ටිවාචි 'වර්ෂ' ශබ්දය අකාරාන්ත වුව ද 'වර්ෂා' යි ගුරුළුගොමීහු ලියති. "එක්බිති දෙවියො ඔහු රටැ පෙරැසෙයින් නවවිධ වර්ෂා වැස්වූහ." (69 පිː) යනු විමසන්නේ යැ. එයින් ඒ ඡෙකව්‍යවහාර වී නුයි 'වර්ෂා' යනු සාධුප්‍රයෝගයෙක් වෙයි. 'ඝොෂා, බ්‍රහ්මචර්යා' යන පද යෙදුම් ධර්මප්‍රදීපිකායෙහි ඇත. එ හෙතුවින් ඒ පද යෙදුම් සාධුප්‍රයොග කොට සලකන්නේ යැ. සකුවහර අනු වැ 'වර්ෂා' යි කිව නිත්‍යබහුවචනාන්ත ශබ්දයෙකි. එයින් වැසි සාරමස මිසැ වෘෂ්ටිමාත්‍රය නො කියන්නේයැ. සියබසින් 'වර්ෂා'යි කියත් මැ වෘෂ්ටිය කියැවෙයි. එය වැස්ස කියන ඡෙකව්‍යවහාර වන හෙයිනි. ගුරුළුගොමීන් ගේ බසෙහි දූ නිත්‍යබහුවචනාන්ත ශබ්දයෙක් ඇත. එ නම් 'සඟ' ශබ්ද වෙයි. කිසිදු තැනෙකැ ගුරුළුගොමීහු 'සඟ' ශබ්දය එකවදනයෙන් නො ලියති. 'සඟ' ශබ්දයන් කියන භික්ෂුපර්ෂද් බොහෝ දෙනකුන් වන නිසා නිරතුරු බහුවචනයෙන් ලියනු ගුරුළුගොමීන් හසළ මඟ වෙයි.

12. "හෙවත්-නොහොත්" යන නිපාතයන් කෙරෙහි 'හෙවත්' යනු අමාවතුරෙහි කිසිදු තැනෙකැ නොලැබේ. 'නොහොත්' යනු නම් කිසි තැනෙකැ ඇත. "ම-පියෙ තට ඉසුරු නො දුන්නෙද? නොහොත් සැදැහැ නැත්තෙහි දැ?" (119 පිː) යන වැකියෙහි 'නොහොත්' යනු යෙදිණ. 'හෙවත්' යනු නොයොදන්නට හෙතු කිමැ? ගූඪාර්ථපදයක් දැකැ එහි අර්ථ පැහැදිලි කරනු පිණිසැ මුත් අන් කරුණක් නිසා 'හෙවත්' යනු නො යෙදෙයි. මෙ කලැ උගතුන් 'හෙවත්' යනු කෙවල නිපාත පදවශයෙන් සලකතුදු නිපාතපදයෙක් ද නොවේ. මෙහි පද දෙකෙක් ඇත. එහි අර්ථ පරික්ෂා කරත් මැ, එ කරුණ ප්‍රකට වෙයි. "හෙ, මුලැ කී ඒ දැය; වත්, කියත් හොත්" යන අර්ථ තෙල දෙ පදයෙහි ඇත. "මුලැ කී දැය ගුඪ වන හෙයින් එය පහදා කියත් හොත්ː මෙසෙ ᵖවෙයි" යනු කියන්නට 'හෙවත්' යන දෙ පස සිය බසෙහි යෙදිණ. පසු කලෙකැ දෙ පද එක් කොට ගෙනැ කෙවලනිපාතවශයෙන් සලකා ගත්හ. පද්විභාග නැති වැ ගියෙන් එහි අර්ථ ද නිලීන වී යැ. ගුරුළුගොමීහු ගූඪාර්ථපදයක් ලියා නැවත එය තෝරා දී වැකි පටන් ගන්නාහු නො වෙති. එසේ වැකි ලියනු දුර්වල ලක්ෂණයෙකි. මේ හෙතුවින් අමාවතුරෙහි 'හෙවත්' යනු නොඑන පදයෙකි.

13.

I. "විජයත්පහයට උතුරු දෙසෙහි සුධම් නම් දෙව්සහයෙක් ඇති" (266 පිː)

II. “මෙ ලොව්හි මෙ බඳු මියුරු දිය නොලදින් නස්නා සත්හු හා ඇති” (300 පිː)
III. “මහණ ගොයුම් දර්ශන සම්පත් ඇත්තෙ යැ” (89 පිː)
IV. “කුමාරය, පෙරැ මිනිස්සු බොහො කලට ආ ඇත්තාහ” (113 පිː)
V. “සතර දෙනකුන් කෙරෙහි විස්වස් නැති” (1325 පිː)
VI. “අප ගෙ රජ සැදැහැ නැත්තේ යැ” (67 පිː)
VII. “පුහුදුන් සැදැහැත්තන් කෙරෙහි මෙ රජ හා සමයො නැති” (74 පිː)

මෙහි මුලැ සඳහන් සතර වාක්‍ය විමසා බලත්, එහි දෙ තැනෙකැ ‘ඇති’ යනු යෙදුණුසෙ පෙනේ. එකවචන බහුවචන විසින් භෙදයෙක් හෝ නො වෙයි. පෙළවහරෙහි ‘අත්‍ථි’ කියාත්, සකුවහරෙහි ‘අස්ති’ කියාත්, සියබසෙහි ‘ඇති’ කියාත්, එක් මැ පදය ව්‍යවහාරභෙදය ගෙනැ රූප විසින් වෙනස් වැ සිටුනේ යැ. මේ නිපාතපද විසිනුදු පෙළසකු දෙක්හි මැ යෙදේ. “අස්තික්ෂීරා - අස්තිධනා” යනාදි සමාසපද විවරණ කරන ලඝුවෘත්තිකාර පුරුෂොත්තමදෙවයෝ “අව්‍යයාභ්‍යාම ස්තිනාස්තිශබ්දාභ්‍යාං සමාසඃ”යි ‘අස්ති-නාස්ති’ යන පද නිපාත වනසෙ ද කියත්. විද්‍යමානාර්ථයෙහි වැටෙන වාක්‍යාවසානබොධක ‘අස්ති’ යන ක්‍රියා නිපාතපදය සියබලසෙහි ලා ‘ඇති’ කියා සිටුත් මැ, එකවචනබහුවචනභෙද නො ගෙනැ නිපාත විසින් මැ සිටුනේ යැ. මෙ හෙතුවින් ‘දෙව්සහයෙක් ඇති’ යන මෙහි දු ‘සත්හු හා ඇති’ යන මෙහි දු ‘ඇති’ යන පදය එකවචන බහුවචන නිසා වෙනස් නො වෙයි. එසෙ වතුදු එහි උක්තපදයෝ ‘දෙව්සහයෙක්’ කියා එක් තැනෙකැ එකවචන විසිනුදු ‘සත්හු’ කියා එක් තැනෙකැ බහුවචන විසිනුදු වෙනස් වැ සිටිත්.

“මහණ ගොයුම් දර්ශනසම්පත් ඇත්තෙ යැ, මිනිස්සු බොහො කලකට ආ ඇත්තාහ” යන තෙල දෙ වැකියෙහි ‘ඇත්තෙ, ඇත්තාහ’ යන පදයෝ දෙ දෙන ‘ඇති’ යන අසංඛ්‍යයෙන් මැ නිපන්හ. එසේ වුව ද, එකවචන බහුවචන විසින් වෙන් වෙන් වැ සිටිති. හෙතු කිමැ යත්ː ‘ඇත්තෙ, යන පදයෝ ද්‍රවශශරීරයෙහි වැටෙති. මුලැ කී දෙ වැකියෙහි ‘ඇති’ යනු වද්‍යමානමාත්‍රය කියන ‘වාක්‍යාවසානබොධක ක්‍රියා නිපාත’ වත් මුත් ද්‍රව්‍යයෙහි නො වැටේ. ‘ඇත්තෙ, ඇත්තාහ’ යන මෙයින් චෙතන වේ වයි, අචෙතන වේ වයි, යම් මැ ද්‍රව්‍යයක් කියත්. ‘ඇති, යන මෙයින් එසේ ද්‍රව්‍යය නො කියත්. මෙසේ විමසා බලත්, ‘ඇති’ යනු වාක්‍යාවසානයෙහි වැටෙන කලැක්‍රියානිපාත විසිනුදු ද්‍රව්‍යයෙහි වැටෙන කලැ ශබ්ද විසිනුදු සැලැකියැ හෙන්නේ යැ. ද්‍රව්‍යයෙහි වැටෙන කලැ ‘එ’ - ආදි ප්‍රත්‍යය ගෙනැ ‘ඇත්තෙ, ඇත්තාහ’ යනාදි විසින් රූපොන්නයනය ගනී. එසේ රූපොන්නයනය ගනුත් මැ, ඒ ද්‍රව්‍යයෙහි “ඇති දැය කිමෙකැ හෝ!” යන අපෙක්ෂායෙක් උදා වේ. එ විට අර්ථපූරණ වශයෙන් ඇති දැය සඳහන් කරන්නේ යැ. මාතෘභාෂායෙහි මෙ බඳු තැනැ එන ‘අස්ථ්‍යර්ථතද්ධිත’ය පිණිසැ සයබසෙහි තෙල මාර්ගය සිටුනේ යැ. ‘මහණ ගොයුම් ඇත්තෙ යැ’ කිව, හෝ කුමක් ඇත්තේ හෝ! යන අපෙක්ෂා ඇති වෙයි. ඇති දැ ආයුෂ නුයි, ‘මිනිස්සු බොහෝ කලට ආ ඇත්තාහ’ කියා වැකිය සිටී. ‘ඇත්තෙ, ඇත්තාහ’ යනාදී ද්‍රව්‍යවාචකපදයෝ අර්ථපූරණය ද බලා සිටිත් නුයි, අර්ථපූරණයක් නැති වැ කිසි දු කලෙකැ වැකියෙහි නො යෙදෙති. තෙල ව්‍යවස්ථායෙන් “බ්‍රහ්මදත්ත නම් රජෙක් ධන ඇත්තේ යැ” යනු නිර්දොෂ වාක්‍යයෙක් වේ. ‘ධන’ යන මෙයින් ඇති දැ කියූ හෙයිනි. ‘අස්ති’ යන නිපාත ක්‍රියායෙහි එන අර්ථය පිණිසැ වැකිය ගළපත් මැ, “බ්‍රහ්මදත්ත නම් නම් රජෙක් ඇති” යන මෙතෙක් මැ නිර්දොෂ වත් මුත් “බ්‍රහ්මදත්ත නම් රජෙක් ඇත්තේ

යැ" යනු නොවියැ හෙන්නේ යැ. එක් පදයෙක් වාක්‍යාවසානබොධක නිපාතක්‍රියා වෙයි. අනෙක් පදය අර්ථපූරණය ද අපෙක්ෂා කරන ද්‍රව්‍යවාචක පද වෙයි. මේ යැ, එයට හේතු නම්,

ආචාර්ය ගුරුළුගොමීන් ගේ යෙදුම්හි ලා මෙ කී ක්‍රමය හැම තැනැ පැතිරැ-ගෙන සිටුනේ ය. 'නැති, නැත්තේ යැ, නැත්තාහ' යනා දි පද පිණිසත් කියුව මනා දැය මෙතෙක් මැ යැ. 'ඇත්-ඇත, නැත්-නැත' යනු 'ඇති-නැති' යන දෙ පදයෙහි රූපාන්තර නුයි, විශෙෂාර්ථයෙක් නො ලැබේ.

"දැන් මට මෙහි අනෙක් පිළිසරණෙක් ඇත්තෙ නො වෙයි" (164 පි:)

"මෙහි මා කිසි නෑ කෙනෙක් ඇත්තාහු නො වෙති" (27 පි:)

තෙල දෙ වැකියෙහි අර්ථපූරණයක් අපේක්ෂා නො කොටැ 'ඇත්තෙ ඇත්තහු' යන පදයෝ යෙදුණහ. හේ කිමෙකැ යත්: 'ඇත්තෙ' යනු 'පිළිසරණෙක්' යන්නෙහි විශේෂණ වන බැවිනුදු 'ඇත්තාහු' යනු 'නෑ කෙනෙක්' යන්නෙහි විශේෂණ වන බැවිනුදු නාමවිභක්ති ගෙනැ පරනිපාත වැ යෙදුණුසෙ පෙනේ. සමානවස්තුක විශේෂණය විශෙෂ්‍යයෙන් පර වැ සිටුත් මැ. විශෙෂ්‍යයෙහි ඇති ලිංගවිභක්ති වචන ගන්නේ මැ යැ. එයින් මේ ප්‍රයෝග මුලැ කී ව්‍යවස්ථා නො බිඳුනේ යැ. 'ඇත්තෙ-ඇත්තාහ, නැත්තෙ-නැත්තාහ' යනාදි පද ක්‍රියාපද වශයෙන් ගෙනැ මෙ කලැ උගතුන් වාක්‍යසටනා කරතුදු ගුරුළුගොමීන් ගේ වහර අනු වැ සොයා බලන්නකුට ඒ සටනායෙහි වරද මහත්සෙ වැටැහෙයි. 'ඇති-නැති' යන පද ද්‍රව්‍යය කියන කලැ කම් කතු ආදි අර්ථ පහළ කරන්නට නාමවිභක්ති ගෙනැ වර නැගෙතුදු ක්‍රියාව කියන කලැ නාමවිභක්ති නොගන්නේ වේ.

14

I. "බෝසතාණො වනාහි ඇත්ගණනින් කෙළදහසක් ඇත්නට බල ඇතියව්හු" (19 පි:)
II. "බුදුහු වනාහි දෙ තිස්වරලකුණෙන් හා අසූ අනුව්‍යඤ්ජනයෙන් සැදි සිරිරු ඇතියව්හු" (124 පි:)

මෙහි 'බල ඇතියව්හු, සිරිරු ඇතියව්හු' යන පද ගුරුළුගොමීහු යොදති. 'හැකියව්හු, යනාදි මෙ බඳු අන් පද ද 'ධර්මප්‍රදීපිකා'යෙහි දී යොදති. මෙහි නිෂ්පත්තිය විමසත් මැ 'බල ඇතියාවූහ. කියැ යුතු තන්හි 'බල ඇතියව්හු'යි පදසිද්ධිය සිටුනාසෙ පෙනේ. 'වූ'- යනු ශබ්දයෙකි. එ වනාහි 'ව' - ධාතුයෙන් සිද්ධ යැ. එහි ලා බැහැරින් ළං විය යුතු අර්ථයක් පුරවනු පිණිසැ 'බල ඇති' යනු යෙදිණි. එ අනුප්‍රයෝගයෙකි. පද මැදැ 'ආ' - කාරාගමයෙන් හා පදඅගැ නාම විභක්ති ගැනීමෙන් හා 'බල ඇතියාවුහු' යනු සිද්ධ වෙයි. පසු වැ සන්ධිවිධියෙන් 'බල ඇතියව්හු' කියා වාක්‍යයෙහි සිටුනේ යැ. 'හැකියව්හු - වැනියව්හු' යනාදිය ද මෙ සැටිය මැ ගත් තැන් වෙයි. 'බල ඇතියහු'යි කියැ යුතු තැනැ 'ව' - කාරාගමයෙන් 'බල ඇතියව්හු' යනු සිද්ධ වනසෙ කෙනෙක් කියති. ඒ කථායෙහි ලා සත්‍යය ඇතිසෙ නො සිතම්හ. 'ව' - කාරාගමයකට හේතු නොපෙනෙන හෙයිනැ. "අරක් ඇතියා වැ, පිරිවර ඇතියා වැ" යනාදි තන්හි 'ව' -

ධාතුහු ගේ පූර්වක්‍රියාව හා අනුප්‍රයෝගය ප්‍රකට කොටැ පෙනෙන හෙයින් 'ව' - ධාතුයෙන් සිද්ධ 'වූ' ශබ්දයා හාත් අනුප්‍රයොග සලකන්නේ මැනැවැ.

'එ, මෙ' - ශබ්ද බුහුබසැ වර නඟන විටත් මෙ කි 'වු' - ශබ්දය සිය බසෙහි කිසි තැනෙකැ යෙදෙනසෙ පෙනේ. 'එවුහු' යනු ස්වරලෝපයෙන් 'එව්හු' කියා සිටුනේ යැ. එකපද බවට ගිය ද, 'එ, වු' යන පද දෙකක් මෙහි ඇතිසෙ කියැ යුතු යැ. 'එ' - යනු විශේෂණයි. 'වූ' යනු විශෙෂ්‍යයි 'හු යනු විභක්තිප්‍රත්‍යය යි. "නුවරැ වූවෝ මෙසේ කියති"යි කිව. 'වූවෝ' යනු තන්හි 'වු' - ශබ්දයෙන් එහි වැදැ සිටුනා ඇත්තන් කියත්. 'එව්හු යන මෙයිනුදු 'එ ඇත්තො' යන අර්ථ කියත්. විශෙෂණ විශෙෂ්‍යවශයෙන් සිටුනා 'එ, වු' දෙ සද එක් වැ විබත් ගෙනැ "එව්හු" ආදි පද සිද්ධ වෙයි. වකාර-උකාරයන් ගේ ඔෂ්ඨජත්වය පිණිසැ පිළිපෙරැළියෙන් "ඔව්හු" ආදි පද සිද්ධ වෙයි. අන්කරු බුහුබස් කිරියෙහි ලා "එහු, ඔහු" යන උක්තපද දක්නට ඇත. 'එ' - ශබ්දයා හා 'හු' විභක්තිය හා එක් වැ ගෙනැ 'එහු' යි වෙයි. අන්කරු බුහුබස් කිරියෙහි ලා "එහු, ඔහු" යන උක්තපද දක්නට ඇත. 'එ' - ශබ්දයා හා 'හු' - විභක්තිය හා එක් වැ ගෙනැ 'එහු' යි වෙයි. පර උපකාරයා ගේ ඔෂ්ඨජත්වය පිණිසැ පිළිපෙරැළියෙන් 'ඔහු' යනුදු සිද්ධ වෙයි. එසේ වතුදු, හුදු 'එ' - ශබ්දයෙන් කර්මාදීන් ගේ බහුත්වය පහළ නො කළ හැකි යැ. 'එ, වු' දෙ සද වෙසෙසුන් වෙසෙස් විදියෙන් එක් වැ සිටැ - ගෙනැ එ බඳු තැනැ බහුත්වය කියන්නේ යැ. 'මෙ' - ශබ්දය පිළිබඳ කොටැ ද මෙතෙක් මැ කියැ යුතු යැ. ගුරුළුගොමීන් මෙ ලෙස නිපන් පදරුප 'අමාවතුර' තුළැ බෙහෙවින් යෙදුසෙ ඒ ඒ තන්හි මැ දන්නේ යැ.

15. "මම වනාහි අඹුන් මිනිස්බැවැ විරාග ඇති වැ පිරිමිබවට පතා (291 පි:) තව්තිසැ වැසි දෙවියන් කෙරෙහි උපදනෙයිම් සක්දෙව්රජහු පුත් වැ ගොපක නම් දෙව්පුතක් වැ උපන්නෙමි" (291 පි:)

තෙල වැකියෙහි 'උපන්මි' යනු අවසානපදය වෙයි. 'මම' යනු එහි ප්‍රකෘතිකර්තෘ වෙයි. 'දෙව්පුතක්' යනු විකෘති කර්තෘ සිටි සැටිය වෙයි. මෙහි 'දෙව්පුතක්' යන පදය විමැසියැ යුතු තැනෙක් වේ. මෙ ගත් කරන ගුරුළුගොමීහු මෙහි මැ 'යක්ෂයක් වැ, මහතවසක් වැ'යි අන් තන්හි දු එ බඳු පද යොදති. ඔබ ගේ 'ධර්මප්‍රදීපිකා'යෙහි:

"ඔව්හු සසර වසන කලැ මගධ රට රජගහනුවර තරහල් දරුවෙක් වැ පාපමිත්‍රසංසර්ගයෙන් පරදාරපරිග්‍රහ කොට ජීවිතපර්යවසානයෙහි අවසර ගත් අනෙක් පින්කමෙකින් වගුරට කොසඹෑ නුවර අසූකෙළක් ධන ඇති සිටුදරුවක් වැ උපද කල්‍යාණමිත්‍රසංසර්ගයෙන් බොහෝ පින්කම් කොට මියන කල්හි රජගහ නුවර ලා කල පව් අවසර ගත්තෙන් රෞරවමහානරකයෙහි උපද අනෙකවර්ෂකොටිසහස්‍රයෙහි පැසී බොහෝ දුක් විඳැ පව් ගෙවා කර්ණාට ජනපදයෙහි කොටළුවක් ව උපන්හු"යි.

මෙ එක් මැ වැකියෙහි 'තරහල් දරුවක් වැ, සිටුදරුවක් වැ, කොටළුවක් වැ' කියා එ බඳු පද තුන් තැනෙකැ මැ යොදති.

I. "හො තෙරැ එක් සැඩෙලෙක් වෙසෙයි" (85 පි:)

II. “ඒ කල්හි ඒ නුවරැ ගණිකාවක් රථයට නැඟී පන්සියක් මාගමුන් පිරිවරා නුවර ගොඩවමින් ඇවිද්දි” (61 පි:)

තෙල දෙ වැකියෙහි ‘සැඩෙලෙක්’ යනුදු ‘ගණිකාවක්’ යනුදු අවසාන ක්‍රියායෙන් උක්තපදයි. එහි ‘සැඩොලෙක්’ යනු පුරුෂයකු කියයි. ‘ගණිකාවක්’ යනු ස්ත්‍රියක කියයි. මෙ බඳු වැකියෙහි පුරුෂයා කියන තැනැ, ‘එක්’ යනුදු ස්ත්‍රියක කියන තැනැ ‘අක්’ යනුදු ඇතියි ගෙනැ ලිංගභෙදවශයෙන් ‘එක්, අක්’ කියා ප්‍රත්‍යය දෙකක් කොට දක්නාහු මෙ කලැ ඇත. ‘දෙව්පුතක්, යක්ෂයක්, මහතව්සක්’ යනාදි විසින් මුලැ සඳහන් පදස්ත්‍රියක කෙරෙහි නොවැටෙනුයෙන් දුෂ්ටපද විසින් සලකා ‘දෙව්පුතෙක් වැ, යක්ෂයෙක් වැ, මහතව්සෙක් වැ’ කියා සංස්කරණ කරනුවෝ ද ඇත. එයින් මෙහි ලා යථාභූතාර්ථ කිමැයි? සොයනු වටනේ යැ.

‘සැඩෙලෙක් වෙසෙයි’ යන මෙහි ‘සැඩොලෙක්’ යනු උක්තකර්තෘපද වේ. එහි කකාරයා (-ක්) අඥාතාදි අර්ථයෙහි වැටෙන ප්‍රත්‍යයෙකි. ආචාර්ය පාණිනීහු දූ අඥාතෙ (15.2.73) ආදී සූත්‍ර කිහිපයෙකින් සකුවෙහි දූ ලා අඥාතාදී අර්ථයෙහි ‘ක’ - ප්‍රත්‍යය කියති. සියබසෙහි දු අඥාතාදි අර්ථ කියන්නට කකාරය (-ක්) යෙදෙනසෙ සලකන්නේ යැ. ‘එ’ - යනු අවසාන ක්‍රියාව නිසා උක්ත වූ පදයෙහි යෙදෙන එකවචන සම්බන්ධය නොගන්නා ප්‍රත්‍යයෙකි. එය කිසි දු තැනෙකැ ස්ත්‍රියක නො දක්වයි. චෙතනයන් කෙරෙහි පුරුෂභාවය මිසැ ස්ත්‍රීභාවය නොගන්නෙන් නියතාර්ථප්‍රත්‍යයෙක් ද වෙයි. ‘සැඩෙලෙක් වෙසෙයි’ කී කලැ කකාර (-ක්) යෙන් අඥාතභාවය කියැවේ. ඉන් පෙරට සිටුනා ‘එ’ - කාරයෙන් එ සැඩලා ක්‍රියායෙන් උක්ත වූ කර්තෘවශයෙන් සිටුනා පුරුෂයකු බව කියැවේ. ‘ගණිකාවක් ඇවිද්දි’ කී කලැ කකාරයෙන් අඥාතභාවය කියැවේ. ගණිකා පුරුෂයකු නොවනුයෙන් ‘එ’ - කාරය නො ළඟ වෙයි.

වැකියෙකැ උක්තපදය වේ වයි, අනුක්තපදය වේ වයි, එහි යෙදෙන විභක්ති ප්‍රත්‍යය එ වැකියෙහි මැ අන් පදයෙකැ යෙදෙත් මැ, ඒ දෙපදයෝ විශේෂණ විශෙෂ්‍ය විසින් එකාර්ථ වෙති. විශෙෂ්‍ය විසින් එකාර්ථ නොවත් හොත් සමානවිභක්ති නො ගනිති. මුලැ සඳහන් ලත් ‘දෙව්පුතක්, යක්ෂයක්, මහතව්සක්’ ආදී පදයෝ එ එ වැකියෙහිලා වෙන් වෙන් අර්ථ දක්වන පද වෙති. එයින් එකාර්ථ නො වෙත් නුයි, ප්‍රධාන වැ සිටුනා උක්ත පද හා සමානවිභක්තික වැ නො සිටිත්. සියබසෙහි ‘ව’ - යන ක්‍රියාර්ථය අර්ථපූරණයක් අපෙක්ෂා කෙරේ. එයින් සිද්ධ ‘වැ’ - යන පූර්වක්‍රියා නිපාතය ද අර්ථපූරණයෙන් මා සාර්ථක වෙයි. ‘දෙව්පුතක්, යක්ෂයක්, මහතව්සක්’ ආදි පදයො ‘වැ’ යන පූර්වක්‍රියායෙහි ලා අර්ථපූරණය පිණිසැ යෙදෙති. යම් පදයක් අර්ථපූරණය පිණිසැ ක්‍රියාපදයක් හා ළඟ වත් මැ, එ පදය ක්‍රියාපදයෙහි ‘උක්ත’ යැ කියා හෝ ‘අනුක්ත’ යැ කියා හෝ පරිගණනා නො ලබයි. එයින් උක්ත බව කියන ප්‍රත්‍යයෙක් වේ වයි, අනුක්ත බව කියන ප්‍රත්‍යයෙක් වේ වයි, එහි නො ලැබේ. මේ හේතුවින් ‘දෙව්පුතෙක් වැ, යක්ෂයෙක් වැ, මහතව්සෙක් වැ, යනාදි විසින් උක්තභාවය කියන ‘එ’ - කාරය නොයොදා - ලැයි හෙන්නේ මැ යැ. තෙල පදයෝ ‘දෙව්පුතක් වැ, යක්ෂයක් වැ, මහතව්සක් වැ’ යනාදි විසින් උක්තභාවය කියන ‘එ’ - ප්‍රත්‍යය නො ගෙනැ අර්ථපූරණය පිණිසැ සිටුනා අනුප්‍රයොග විසින් සිටිත්. එ එ වැකියෙහි අවසාන ක්‍රියායෙන් උක්ත වන ප්‍රකෘතිය තමාට අයත් විභක්තිප්‍රත්‍යය ගත් වන බැවින් එහි විකෘතිය ‘වැ’ යන ක්‍රියාර්ථයෙහි පුරණාර්ථ පිණිසැ අනුප්‍රයුක්ත වේ නුයි. ලිංග විභක්ති

වචන නො ගනී. 'ධර්මප්‍රදීපිකා' යෙහි ලා "ජනයො පාපමිත්‍රසංසර්ගයෙන් දුර්ජන වෙති. කල්‍යාණමිත්‍රසංසර්ගයෙන් සජ්ජන වෙත්" යනාදි නානා වාක්‍යසටනාත් මෙහි ලා සසඳන්නේ යැ. "දුර්ජනයො වෙති; සජ්ජනයො වෙත්" යනුවෙන් නොගෙනැ "දුර්ජනවෙති, සජ්ජනවෙති" යනුයෙන් සටනා කළේ, 'ව' - යන ක්‍රියාර්ථයෙහි පූරණ වන හෙයිනැ, මේ ප්‍රයොග පෙළ සකු වහර පිණිසැ බලත් හොත්, විපර්යසගණයෙහි වැටෙතුදු සියබස්වහර පිණිසැ බලත් හොත්, බසෙහි දහම මිසැ කියැ යුතු අන් දැයෙක් ඇත්තේ නො වෙයි.

16.

. "මෙ තෙක් කල් මෙවෙනි පෙළහරයක් නුදුටු විරිමු" (24 පිː)

. පිරිසිදු වන්නට යනුයෙම් සැඩලක්හු දිටිමු" (71 පිː)

. "මම දෙව්දුවක්මු" (228 පිː)

අමාවතුරෙහි එන මෙ තුන් තැනැ ම-ශබ්දකාරකයෙහි වැටෙන 'නුදුටු විරිමු, දිටිමු, දෙව්දුවක්මු' යන රූප ඇත. 'ධර්මප්‍රදීපිකා'යෙහි දු මිනිසක්මු, කැත දුවක්මු' යන රූප දෙකෙක් ඇත. මෙ හැම පසෙක් වේ. මෙ පස් තන්හි මැ 'මම්' යනු උක්තපද වෙයි. එ ද එකවචන මැ යැ. එයින් 'නුදුටුවිරිමු, දිටිමු, දෙව්දුවක්මු, කැතදුවක්මු" යනුදු එකවචනයි.

ගුරුළුගොමීන් ගේ ආම්නාය ප්‍රමාණ කොට-ගෙනැ 'නුදුටුවිරිමු' යනාදි පද පරීක්ෂා කරත් මැ, ම-ශබ්දකාරකබහුවචනයෙහි ලා සම්මත 'මු' - ප්‍රත්‍යය ඔව්නට අභිමත නොවනසෙ විශද කොට කියැ හෙන්නේ යැ. 'ධර්මප්‍රදීපිකා'යෙහි වේ වයි, 'අමාවතුරෙහි' වේ වයි. ම-ශබ්දකාරකබහුවචන කියන තැනැ 'මො, මහ, මිහ' යන මෙ තෙක් මැ ප්‍රත්‍යය විසින් කියත් මිසැ 'මු' - යන බහුවචනප්‍රත්‍යය නො කියති. 'අපි' - යනු උක්ත වනු පිණිසැ ම-ශබ්දකාරකබහුවචනයෙහි 'මු' - ප්‍රත්‍යය යොදා කළ එක ද පදයක් හෝ ඇත් නම් 'නුදුටුවිරිමු' යනාදිය බහුවචනයහයි කියැ හැකි යැ. ගුරුළුගොමීන් විසින් එ බඳු පදසටනායෙක් නො කැරිණ. 'මම්' - යනු උක්ත වන තැනැ මිසැ, 'අපි' - යනු උක්ත වන කිසි දු තැනෙකැ පදාන්ත 'මු' - කාරය නො ලැබෙනු යෙන් ගුරුළුගොමීන් ගේ ආම්නායෙහි ලා එකවචන වත් මුත් බහුවචන නො වෙති යි සුවිනිශ්චිත වෙයි.

'මු' (-ම්+උ) යන මෙහි මකාරය අස්මදර්ථය කියයි. අස්මදර්ථයෙහි වැටෙන ශබ්දයෙකැ වාච්‍යය ස්ත්‍රියක් වූ නම්, එ බව කියන්නට යෙදූ 'උ' - ප්‍රත්‍යය 'නුදුටුවිරිමු' යනාදියෙහි අගැ ලා යෙදිණ. 'නුදුටුවිරිමු. දිටිමු. දෙව්දුවක්මු. මිනිසක්මු. කැතදුවක්මු' යන පස් තැනැ මැ වාච්‍යය ස්ත්‍රියකැ, ඔ ද එකක් මැ යැ.

දම්පියාටුවාගැටපදයෙහි එන 'උම්' යන රූපය මෙහි හෙළි කළ 'මු' - කාරයෙහි මුල් අවස්ථා විසින් සැළැකියැ හෙයි.

(අ) "මතු ජෙනුයුම් කිසෙයින් ජෙම්" (29 පිː)

(ආ) "මානුසිම්හි, මිනිසකුම්" (61 පි:)
(ඇ) "රකෙන තැනක් නැහැයුම්" (173 පි:)
(ඈ) "උක්කණ්ඨිතා, දැන් භවගහණහි උකැටියුම්" (266 පි:)
(ඉ) "අඳුබල් දෙවියුම්" (173 පි:)
(ඊ) "නිරයට යනුවියුම්"(227 පි:)
(උ) "අනාවාසා, වසන තැනක් නැතියුම්" (277 පි:)

මේ සත් තැනැ පදාන්තයෙහි 'උම්' - යන රූපයෙක් ඇත. එහි 'ම' - කාරයා අස්මදර්ථය පහළ කෙරෙයි. 'උ' - කාරයා ස්ත්‍රීභාවය පහළ කෙරෙයි. 'දම්පියාටුවාගැටපද' යෙහි දී 'උකැටියුම්' යනාදිය 'ම' - ශබ්දකාරක එකවචන බව හා ස්ත්‍රියක වාච්‍ය වන බව හා කියන්නට 'උම්' - යනු යෙදූහු. බහුවචනයෙහි මෙබඳු යෙදුමෙක් නැත. ගුරුළුගොමීන් ගේ අවධිය වත් මැ, එ 'උ' - කාරයා 'ම' - කාරයා තුළැ වැදැ ගැන්ම නිසා 'මු' - යන රූපය නැඟිණ. 'දම්පියාටුවාගැටපද' යෙහි එන 'උම්' - යනුත්, 'අමාවතුරෙහි' එන 'මු' - යනුත් එයින් සමානාර්ථයි. පැරැණි සියබසෙහි ලා ස්ත්‍රීප්‍රත්‍යය එකවචනයෙහි සිටිය ද, බහුවචනයෙහි පහ වැ යෙයි. එයින් 'උම්' - යනු එකවචනයෙහි වත් මැ, එයින් මැ නිපන් 'මු' - යනු බහුවචන නොවියැ හේ. තවද, කියැ යුත්තෙක් ඇත. 'දම්පියාටුවාගැටපද' යෙහි ලා කිසි දු තැනෙකැ 'ම' - ශබ්දකාරක බහුවචනයෙහි 'මු - ප්‍රත්‍යය නොයෙදූහු. 'කව්සිළුමිණ' කව ද තෙල සම්ප්‍රදාය මැ ගෙනැ ලියුසෙ එහි එන 'නුළුමු' ආදි පද වැළෙන් පෙනේ. **වෙසතුරුදසන්නයෙහි** "මද්දී ච දෙව අහං තෙ හුසා" යන කැනැ "මහරජ, මම තොප යෙහෙළි මද්‍රීමි" යි ව්‍යාඛ්‍යාත යැ. "මද්දි අයෙය, අයං තෙ හුසා" යන තැනැ "හිමියා මව, මම තොප යෙහෙළි මද්‍රීමු" යි ව්‍යාඛ්‍යාත යැ. **වෙසතුරුදසන්නකාරයන්** ගුරුළුගොමීන් සෙයින් ව්‍යවස්ථායෙකැ නො සිටැ 'මි, මු' යෙදූ සැටි එයින් පෙනේ.

සිද්ධාන්තසංග්‍රහයෙහි ම-ශබ්ද කාරක බහුවචනයෙහි 'මු' - ප්‍රත්‍යය කියති. ගුරුළුගොමීන් ගේ පොත් මැ ප්‍රමාණ කොටගෙනැ බලත් හොත්, එබඳු ප්‍රත්‍යයෙක් සියබසෙහි නැති යි කියැ යුතු යැ. එසේ වුව ද බහුවචනයෙහි ප්‍රසිද්ධ 'මො' - යන ප්‍රත්‍යය 'මු' - යි විකාරයට යා හැකි වේ. අස්මදර්ථයෙහි පළට 'ම' - කාරයා (-ම්) හා බහුවචනයෙහි පළට 'ඔ' - කාරයා හා දෙ දෙන එක් වැ 'මො' - යනු සිද්ධ වේ. 'ඔ' - කාරයා කණ්ඨයෙනුදු ඔෂ්ඨයෙනුදු උපදනේයැ. 'උ' - කාරයා කෙවල ඔෂ්ඨයෙන් උපදනේ යැ. කණ්ඨ ඔෂ්ඨජ 'ඔ' - කාරයා ගේත් ඔෂ්ඨජ 'උ' - කාරයාගේත් එකදෙශයෙකින් සම්බන්ධයෙක් ඇත. ඒ සම්බන්ධය ගෙනැ 'මො' - යනු 'මු' බවට වැටේ. සිදතෙහි 'ම' - කාරයා හා 'උ' - කාරයා හා දෙක එක් වැ ගෙනැ 'මු' - ප්‍රත්‍යය (ම්+උ=මු) සිද්ධසෙ කියතුදු, 'මු' - යනු 'මො' යන්නෙහි විකාරයක් බව මැ පෙනේ. එසේ නොවේ නම්, ගුරුළුගොමීන් ආදීන්ගේ වහරෙහි මසදකරු බුහුබස්හි එය ආ යුතු වෙයි. ගුරුළුගොමීන් ආදීන් නො යෙදූව ද, ආචාර්යවරයන් ඔසදකරු බුහුබස් හි 'මු' - ප්‍රත්‍යය ගත්සෙ උන් උන්ගේ වහරින් දත හෙන තැන ඉබොහෝ වෙයි.

17.

. "මම මෙ පැනයන් බොහො දවස් බොහො මහණ බමුණන් පුළුවුස්නෙයිම් තොහො කොටන්නක්හු සෙයින් කිසි සාරයක් නො ලදුමි" (128 පි:)

. "මම් පෙරැ මෙ පියෙස්හි සිටියෙයිම් මෙරගල් දක්මී" (231 පි:)

. “තව්තිසැ වැසි දෙවියන් සුධම් දෙව්සභයෙහි නටන්නෙයිම් ඇසීමි” (287 පිː)

. “තව්තිසැ වැසි දෙවියන් කෙරෙහි උපදනෙයිම් සක්දෙව්රජහු පුත් වැ ගොපක නම් දෙව්පුතක් වැ උපන්මි” (291 පිː)

තෙල වාක්‍යයෙහි ‘පුළුවුස්නෙම්, සිටියෙම්, නටන්නෙම්, උපදනෙම්” යන අස්මදර්ථයෙහි වැටෙන පද මකාරයෙන් පෙරට වැ ‘ඉ’ - ප්‍රත්‍යයක් කොටැ ‘පුළුවුස්නෙයිම්, සිටියෙයිම්, නටන්නෙයිම්, උපදනෙයිම්’ කියා යොදති. ‘ධර්මප්‍රදීපිකා’ යෙහි දු ‘මහදන් දෙන්නෙයිම්’ යි මෙබඳු පද යෙදිණ. ගුරුළුගොමීහු මතු නොවෙති. පැරැණි කිසි ඇජර කෙනකුන් මෙබඳු පද යෙදූසෙ ඔවුන්ගේ ලිපියෙන් දත හෙන්නේ යැ. ‘ආයෙයිම්, ඇතියෙයිම්, වැසියෙයිම්’ ආදි විසින් එන දම්පියාටුවා ගැටපද ආදිය නිදර්ශන යි.

මේ පදසිද්ධි පිණිසැ සිදතෙහි විශෙෂ අනුශාසනා නැත ද, ඡෙකව්‍යවහාර වන හෙයින් පිළිගත මනා වෙයි. මේ ‘ඉ’ - ප්‍රත්‍යයෙන් කිමෙක් දැක්විණි ද? එ එ සිද්ධි අතීත බව දැක්විණ. ‘පුළුවුස්නෙම්, පුළුවුස්නෙයිම්’ යන රූප විමසා බලත් මැ, වර්තමානයෙහිත් අතීතයෙහිත් ලා පසරුත්සද වරනැඟිසෙ පෙනේ. කිසි විටෙකැ ශබ්ද ප්‍රකෘතිය ද ධාතුධර්ම ඇසිරි කරනසෙ මෙයින් නිශ්චය කළ හැකි යැ.

18.

. “තො කුමක් කොටැ තනතුරු පිළිලදහු” (62 පිː)

. “තො ඔසප්හු වෙහි” (77 පිː)

. “තො කවරෙහි? තො කවරහු?” (150 පිː)

. “තො කවරහු?” (228 පිː)

. “කුමට සාධුකාර දුන්හු” (228 පිː)

. “තො මෙ සුත බුදුන් දෙසන්නා ඇසුහු?” (228 පිː)

. “තො කොතැනැ සිටැ ඇසුහු?” (228 පිː)

. “තී සිටී තැන් දුරැ; බුදුන් දුටුහු” (228 පිː)

. “තො ද රාත් වුහු දැයි? කීහ.” (228 පිː)

. “තො සොවන්හු” (229 පි:)

මේ වාක්‍යයෙහි ලා ‘තො’ - යනු ස්ත්‍රියක කියයි. පෙළ සකුවහරෙහි දී ‘ත්‍වං’ - කාරය පුංස්ත්‍රීනපුංසක වශයෙන් භෙදකර පදයෙන් නොවේ. සියබසෙහි එ පදය ‘තො’ - යි සිටුනේ යැ. පුරුෂයකු කෙරෙහි වේ වයි ස්ත්‍රියක කෙරෙහි වේ වයි, යොදා-ලියැ හැකි වේ. මෙහි ‘තො’ - යන්න ස්ත්‍රියක කෙරෙහි වැටෙන හෙයින් ‘පිළිලදහු’ යනාදි පදත් ස්ත්‍රියක කෙරෙහි වැටෙනසෙ සළකන්නේ යැ.

‘තො’ - යනු එකවචන වන බැවින් ‘පිළිලදහු’ යනාදි පද ද එකවචන වෙයි. එකවදන වත් මැ, පදාන්ත ‘උ’ - කාරය ස්ත්‍රීප්‍රත්‍යය වශයෙන් සළකන්නේය. ‘දෙව්දුවක්මු’ යනාදි පදවැලෙහි බැසැ සිටුනා නියරට සරිලන නියරෙක් තසදකරු අරුතෙහි දු ඇති සැටිය මෙයින් පෙනේ. “තො ඔසප්හු වෙහි” යන මෙහි ‘වෙහි’ යන කිරිය තසදකරු අරුතෙහි එකවචන වෙයි. එහි විවාදයෙක් නැත, ‘තො’ - යනු එ කිරියෙහි උක්තපද වෙයි; එකවචන ද වෙයි. එහි දු විවාදයෙක් නැත. ‘ඔසප්හු’ යනු ‘තො’ යනුයෙහි විශේෂණ වෙයි. එ බහුවචන වෙතියි කියැ හේ ද? නො කියැ හේ මැයැ. එයින් ‘ඔසප්හු’ යනුදු එකවචන මැ වේ නුයි, පදාන්ත ‘හු’ - ප්‍රත්‍යයෙහි බැසැ සිටුනා ‘උ’ - කාරය ස්ත්‍රීප්‍රත්‍යය මැ වෙයි. ‘පිළිලදහු’ යනාදි හැමයෙහි වාච්‍යය ද ‘තො’ - යනු මිසැ අනෙකෙක් නොවේ. ‘පිළිලදහු’ යනාදි පදවැළ තශබ්දකාරයෙහි ස්ත්‍රීභාවය කියන එකවචන කොට අපි සිතම්හු. එහි වාච්‍යය ‘තො’ - යි එකවචන වන බැවිනැ. **දම්පියාටුවාගැටපදයෙහි** දු තෙල යෙදුම් ඇත. “ආරාධිකා, සිත් අරියහු විහි” යන ක්‍රියාපදය එකවචන නොවියැ හැකි යැ. මෙ ද ස්ත්‍රියක කියු තැනෙක් වේ. එහි මැ “කාසි ත්‍වං, තො කවරහු? සිල් රකින්නියක්හු? නොරක්නියක්හු?” (91 පි:) මෙ ආදි ප්‍රයෝග ඇත. **වෙසතුරුද සන්නයෙහි** දු, “ත්‍වං දහරා, තො ළදරියෙහි; රූපවතී, රූ ඇතියහු; පුරිසානං අභිපත්ථිතා, පිරිමින් විසින් වෙසෙසින් පතන ලදුවහු” (246 ගාථා) යනාදි ප්‍රයොග ඇත. මෙ හැම විමසත් මැ, පෙරැ සියබසෙහි ‘හු, මු’ ප්‍රත්‍යය දෙක ගෙනැ පැවැති ව්‍යවස්ථා අද වහරෙහි ලා බිඳුණුසෙ පෙනේ.

19.

. “හාත්පස්හි මල්වැසි වට” (11 පි:)
. “ආකාශයෙහි දිවබෙර ගුගුරයි” (11 පි:)
. “සුළඟ හමන කලැ අතු සැලෙයි” (51 පි:)
. “ඇස් පෙරැළී මළ මිනිසුන් ඇස් වැනි වි යැ” (82 පි:)
. “සියල් සිරිරින් ස්වෙද වැහිණ” (123 පි:)
. “සියලු නුවරැ ආයුධ දිළිණ” (130 පි:)
. “තුබු තුබු තැනැ ඇගිලිනස්සි” (132 පි:)
. “දඬු පහණ හකුරු අවුත් මහතෙරුන් මැ වෙරැ හෙයි” (141 පි:)
. “හැම ගඟ හො උඩුහො බලා යන්නෙ වී නම්” (182 පි:)
. “වර හො සිඳෙයි” (185 පි:)
. “පියෙහි පියෙහි පියුම් පිපෙයි” (257 පි:)
. “එකෙකී දළ සත් සත් පොකුරුණි වෙයි” (273 පි:)

'අමාවතුරෙ' න් ඉදිරු දොළොස් වැකියෙක් මෙහි දැක්විණ. අවසාන ක්‍රියායෙන් උක්ත වැ සිටුනා චෙතනපදයෙහි බහුත්වය හෙළි කරනු පිණිසැ, 'ඔ, හු' - යන විභක්තීහු ඇත. කිසි විටෙකැ එ විභක්තීන් අචෙතන පදයෙහිත් යෙදෙතුදු, නොයෙදෙන තැන් ද වෙයි. එසේ නොයෙදෙන විටැ අචෙතනපදයෙහි විද්‍යාමාන වන බහුත්වය ශබ්ද ශක්තීන් මැ හෙළි වෙයි. හෙළි වුව ද, බහුවචන විභක්ති නැතියෙන් අවසාන ක්‍රියාපදය බහුවචනයෙන් නො සිටුනේ යැ. එකවචනයෙන් සිටුනේ වෙයි. මෙහි අළ "අතු සැලෙයි" යනාදිය නිදර්ශන යි.

- "හැම බෙරහු තමන් තමන් ගෙ ධ්වනි වුහුට්හු" (10 පි:)
- "ගංගාවො නො ගොස් සිටියහ" (10 පි:)
- "ගල්කුළුහු දු අවි සුවහස්හු දු අහසින් ගොස් පැරුම් සිමිඳුමීන් හුන් මහ සත්හු කරා පැමිණැ දිවකුසුම් වැ වගුළො" (29 පි:)
- "පන්සියක් කූටාගාරයො අහසින් ගියහ" (228 පි:)
- "ඔවුන් ගෙ ඇත් අස්හු ද එලකායුධයො ද අපට කුම් කෙරෙති" (214 පි:)
- "හැම රුක්හු හැම තණ ආදීහු වියැළි දොළොස් අවුරුද්දක් නො නැඟෙති" (248 පි:)
- "පැනයො ද නො නසිත්ව යි" (251 පි:)

තෙල වැකියෙහි අචෙතනපදයන් 'ඔ, හු" - යන විබත් ගත් සැටිය දක්නට ලැබේ. අචෙතනපදයන් චෙතනපදයන් සෙයින් කිසි විටෙකැ යෙදෙන හෙයිනැ. දැන් බහුවචන විභක්ති ඇත් නුයි, අවසාන පදය බහුවචනයෙන් සිටුනේ යැ. "හැම බෙරහු ......... වුහුට්හු" යනාදිය නිදර්ශන යි.

"ඇත්හු ද අස්හු ද රිය ද පද ද - ඇත්අස්රියපද" යන සිද්ධාන්ත සංග්‍රහ පාඨයෙහි දී චෙතනඅචෙතනභෙදය 'හු' - විභක්තියෙන් දක්වන හෙයිනුදු, අමාවතුරෙහිත් "බුදුන් නොබුදුහයි, දහම් නොදහමැයි සඟහු නොසඟහයි" යන පාඨයෙහිත් චෙතන අචෙතනභෙදය 'හු' - විභක්තියෙන් දක්වන හෙයිනුදු 'හු' - විභක්තිය නම් වෙසෙසින් මැ චෙතනපද විෂය කොට ගත්සෙ සැළැකියැ හෙන්නේ යැ. 'ඔ' - විබත් ද මෙ සැටිය මැ වෙයි. ගුරුළුගොමීන් මෙ වෙනස නොඑක් තැනැ දී හෙළි වන සේ තමන්ගේ අනුවාද බෙහෙවින් මැ කළ බව පාඨසංසන්දනයෙන් ප්‍රකට වන්නේ යැ. "පඨවීහිමවන්තසිනෙරු චක්කවාළමහාසමුද්දචන්දසූරියා ඉමිනා නිම්මිතා" යන පාඨයෙහි ලා "පොළොව් හිමගල් මෙරගල් සක්වළගල් මහමුහුදු හිරිසඳ මුහු විසින් මවන ලද්දෙ යැ" යනු අනුවාද යි. මූලපාඨයෙහි විභක්තියෙන් බහුත්වය කියතුදු, අනුවාදයෙහි බහුවචන විභක්ති නැත. අචෙතනශබ්ද වන හෙයිනැ. මෙබඳු යෙදුම් තෙල අමාවතුරු අනුවාදයෙහි බොහෝ තන්හි දක්නට ඇත.

20.

- "ඉදින් මෙ කුලදූ මා නිසා මහත් යශස් නොලදූ නම්, මා සූවිසි බුදුන් අතැවැසියෙක් නම් නො වෙයි" (77 පි:)

තෙල වැකියෙහි එන 'මා සූවිසි බුදුන් අතැවැසියෙක් නම්, නොවෙයි" යන මෙහි වරද දක්නාහු ඇත. ඔහු "මම් සූවිසි බුදුන් ඇතැවැසියෙම් නම් නොවෙම්" කියා ශුද්ධ කොට

ලියති. අප දුටු පැරැණි පොත්හි 'මා සූවිසි බුදුන් අතැවැසියෙ නම් නො වෙයි" යනු එන බව ද එක් පොතෙ කැ 'අතැවැසියෙක්' යනු තුබූ බව ද මෙහි ලා කියම්හ.

මාතෘභාෂායෙහි ලා මකාරයා නැත ද උත්තමපුරුෂ ආඛ්‍යාතපද සිද්ධ වෙයි. පෙළෙහි 'කරෙ' යනු දු සකුවෙහි 'කුර්වෙ' යනු දු නිදර්ශනයි. එ දෙ පදයො පෙළසකු දෙක්හි පිළිවෙලින් උත්තම පුරුෂ ආඛ්‍යාතපද වෙති. එහි මකාරයෙක් නැත. සියබසෙහි දී මකාරයා නැති වැ උත්තමපුරුෂයෙහි වැටෙන ක්‍රියායෙක් සිදු නොවේ. එ ක්‍රියායෙන් උක්ත වන එකවචන පදය ද මකාරයා නැති වැ නො සිටුනේ යැ. එයින් වාක්‍යාවසාන පදයෙහි මකාරයා වැටෙත් මැ, ඒ පදයෙන් උක්ත ඒකවචනයෙහි දු මකාරයොගය නියත ලක්‍ෂණයෙකි. ඡන්දොහෙතුයෙන් වන විපර්යාසාදිය තබා විමසා බලත් මැ, සියබසෙහි තෙල නියර තහවුරු දැයෙක් වෙයි.

මහශබ්දයෙහි වේ වයි, අන් ශබ්දයෙකැ වේ වයි, මදසකුරු අරුතෙහි ක්‍රියායෙන් උක්ත බව කියන ප්‍රත්‍යය 'ම' - කාරයා වේ නුයි, 'මම්' - යන මෙහි දු පදාන්ත 'ම' - කාරයා මශබ්ද උක්ත බව දක්වයි. එය මශබ්දයෙහි 'පළමුවිබත් ලකුණැ' යි සලකනු කෂ්ටමතයි. එය මශබ්දයෙහි පළමු විබත් ලකුණ වේ නම්, "මම ගියෙම් වෙමි" යන මෙහි 'ගියෙම්' යනුදු මශබ්දයෙහි පළමු විබත් වියැ යුතු යැ. එසේ නොවේ.

මුලැ කී වැකියෙහි 'නො වෙයි' යනු මශබ්දකාරක ක්‍රියාපදයෙක් නොවේ. එයින් වැකියෙහි සිටුනා මශබ්දය අපෙක්‍ෂා නොකළසෙ පෙනේ. "අපි දෙ දෙන රාජ්‍යසම්පත් හැර මහණ වන්නමො ජීවත් වන උපායක් නැති හෙයින් මහණ වූවමො නොවෙයි" යනු රත්නාවලි පාඨයෙකි. මෙහි දු 'අපි මහණ වන්නෙමා - වූවමො' යන පද කෙරෙහි අපේක්‍ෂා නොතබා 'නො වෙයි' යනු යෙදිණ. සැමියන් අතින් මෙහෙ ගන්නා කුලයෙක මා උපන්නේ නැත" යනු බුත්සරණ පාඨයෙකි. මෙහි ද මෙහිලා සසඳන්නේ යැ.

මුලැ කී වැකියෙහි 'අතැවැසියෙක්' යනුවෙන් තමන්ගේ අවස්ථාන්තරයක් මත කෙළේ නුයි ඒ අවස්ථාන්තරය අපේක්‍ෂා කොට 'නො වෙයි' යනු යොදා මශබ්දාර්ථය අප්‍රධාන වන සේ යට කොට තැබූහ. එයින් එහි 'මා' යනුදු සදොස්සෙ නො කියැ හෙයි.

මසදකරු කිරියෙන් උක්ත නොවූවත්, මශබ්දයා පදාන්ත මකාර යොගය ගන්නා තැන් ද ඇත. "බුදු වූ මම් මැ වේ ද" යනාදිය නිදර්ශනයි. මේ නිදර්ශනයෙහි දු මනොද්වාරයෙහි අපාතයට ගිය අතීතාවස්ථාව බලා "වේ ද" යනු යෙදිණැයි සිතම්හ. මාතෘභාෂායෙහි එන ප්‍රයොගයෙන් හා සසඳත් මැ, 'සටිත නොවනසෙ ඇත් නුයි වහරවිදි පෙරළනු නොමනා දැයෙකි.

I. "වහන්සෙ සිතා පිරික්සා සරණ යන්නට වදාරන ඇ යැ" (88 පිː)
. "වහන්සෙ, අඟුල්මල් ඇ යැ හො!" (138 පිː)

මෙහි එන 'ඇ' - යන්න ගෞරවාර්ථප්‍රත්‍යය වශයෙන් පිළිගනිති. "කරන ඇ යැ, පුළුවුස්නා ඇ යැ, වැඩහිඳිනා ඇ යැ, ඉවසූ ඇ යැ" යනාදි විසින් තන් තන්හි තෙල රූපය ගත්සෙ පෙනේ. මේ 'ඇ' යන්න 'සෙ' - යන්නෙහි විකෘතියෙකිහි සළකම්හ. අත්‍යන්ත ගෞරව පිණිසැ පාත්‍ර වැ සිටිනවුන් ගේ නම එළියෙහි ලා කියනු නො

යෙදෙයි. ඉරියවු ඈ එළියෙහි ලා කියනුදු නො යෙදෙයි. පර්යාසයෙන් කියන කලැ යෙදෙයි. 'බුදුහු වැඩියහ' යනු එළියෙහි ලා කියමන් වෙයි. 'වැඩි බන්දහ, වැඩි වන්හ, වැඩි සේකැ, වැඩි ඈ යැ' යනු එළියෙහි ලා කියමන් නො වෙයි. එයින් 'වැඩියහ' යනුවට වඩා 'වැඩිබන්දහ' යනාදි පද ගෞරව දැක්වීමෙහි දී යුතු වේ. 'බඳු, වන්, සෙ දැ' ආදිය සමානාර්ථ යැ. තෙල පද යොදා ගෞරව දක්වනු ගුරුළුගොමීන් ගේ බසෙහි බෙහෙවින් ප්‍රසිද්ධ දැයෙකි. 'බඳු' - යන අර්ථ 'සෙ' - යන්න එකාරාන්ත වන හෙයින් 'ක' - කාරාගමයෙන් 'සෙයෙකැ'යි සිටුනේ යැ. 'සෙ' - යන මෙයින් නිපන් අන් ප්‍රකෘතියෙක් නම් 'දැ' යනුයි. 'ස, ද' යන දෙ දෙන උත්පත්ති ස්ථානයෙන් සම්බන්ධ වෙති. 'නමස්ස' යනු 'නමඳ - කියා සිටුනේ ඒ සම්බන්ධ හේතුවින් වේ. 'එ, ඈ' යන දෙ දෙනා ද උත්පත්ති ස්ථානයෙන් සම්බන්ධ වෙති. 'මෙ' යනු 'මැ' - කියා සිටුනේ ඒ සම්බන්ධ හෙතුවින් වේ. එහෙයින් 'සෙ' - යනු 'දැ' - කියා පෙරැළියැ හෙයි. 'භදන්ත' ශබ්දය බෞද්ධ ව්‍යවහාරයෙහි රූඪ ශබ්දයෙකි. එයින් නිපන් 'භන්තෙ' යනු සියබසෙහි ලා 'වහන්සෙ' කියා සිටුනේ යැ. පසු වැ ඒ රූපය මැ 'වහන්දැ'යි පෙළුණුසෙ පෙනේ. මෙසේ 'සෙ, දැ' දෙදෙනාගේ සම්බන්ධය ප්‍රකට වන හෙයින් 'වදාරන සෙ යැ' යනු 'වදාරන දැ යැ' යි අන් සැටියෙනුදු ලියතියි සළකම්හ. පසු කලෙකැ ගෞරවාර්ථ ප්‍රත්‍යය වශයෙන් බිඳැ-ගෙනැ, 'මැණියන්දැ' යනාදි පදසටනා යොදතුදු, ගුරුළුගොමීහු එබඳු පදසටනා නො කරති.

22.

i. "පස්වක් බමරගණන් හා නන් විසිතුරු ලිහිණිගණයො මියුරු සරයෙන් කුල්මින් ඇවිදිති" (12 පි:)
("පංචවණ්ණභමරගණා නානප්පකාරා ච සකුණසංඝා මධුරස්සරෙන විකූජන්තා විචරන්ති.")

ii. "කිසවච්ඡ නම් තවුස්පාණන් හා සෙනාපතිහි හා මවුන් පුස්නා රාම නම් වෙණෙඳ දරුවකු හා මෙ තුන් දෙන දිවි ලදහු" (65 පි:)
("කිසවච්ඡතාපසො සෙනාපති මාතුපොසකරාමො'ති තයො'ච මනුස්ස තා අරොගා අහෙසුං")

iii. "ඇතැම් බමුණන් හා ගහපතිහි බුදුන් වැඳැ එකත්පස් වැ හුන්හ" (100 පි:)
"බ්‍රාහ්මණගහපතිකා අප්පෙකච්චෙ භගවන්තං අභිවාදෙත්වා එකමන්තංනිසීදිංසු.")

iv. "කෙරාටිකයන් හා අන්ධබාලයො යි" (101 පි:)
("කෙරාටිකා චෙ'ව අන්ධබාලා ච")

v. "ශාක්‍යරජුන් හා කොලිය රජහු කිඹුල්වත් නුවර හා කොලිය නුවර හා දෙ අතුරෙහි රොහිණි නම් ගඟ එක් අවුණෙක් බඳවා බොහො ගොයම් කරවති" (214 පි:)
("සාකියකොලියා හි කිර කපිලවත්ථුනගරස්ස ච කොලිය නගරස්ස ච අන්තරෙ රොහිණිං නාම නදිං එකෙනෙව ආවරණෙන බන්ධාපෙත්වා සස්සානි කරොන්ති".)

මෙහි මුල් වැකියෙහි 'ඇවිදිති' යන ක්‍රියාව බමරගණන් කෙරෙහි දු ලිහිණි ගණන් කෙරෙහිදු සමසේ යෙදේ. එයින් එ දෙ ගණ ක්‍රියායෙන් එකාර්ථ යැ. එයින් මැ දෙ ගණ මැ ප්‍රධාන යැ. 'බමරගණන් හා' යන මෙහි සහාර්ථයෙහි කතු විබත් කිව,

බමරගණ අප්‍රධාන වෙයි. එ අප්‍රධාන නොවනුයෙන් සහාර්ථයෙහි කතුවිබතෙක් මෙහි නැත. මෙ තැනැ 'හා' - යනු වාචාර්ථයෙහි නිපාතයෙක් වේ.

භ්‍රමරගණයාගේ ද උක්තකර්තෘභාවය දක්වනු පිණිසැ තුබුව මනා වනුයේ 'ඔ, හු' දෙ විබතින් එකෙකි. "එකල්හි ලිච්ඡවි රජ්ජුරුවො ද බමුණු මහසල්කුලො ද ගැහැවි මහසල්කුලො ද නන් තොට්ටො ද මහණබමුණො ද පාධීකාරාමයට ගියො" (183 පි:) යනුයෙන් ගුරුළුගොමීහු මැ චාර්ථනිපාතයොගය ඇත ද, වාක්‍යාවසානපදය පිණිසැ තුබුව මනා 'ඔ' - විබත් ලියති. 'බමරගණන්' යන මෙහි දු 'ඔ, හු' දෙ විබතින් යමක් තුබුව මනා වුව ද, බමරගණා හා එක් කොට ගෙනැ 'ලිහිණිගණ' ශබ්දයෙහි ලා 'ඔ' - විබත් ලියති. එක් කොට ගත්සෙ දක්වන්නට 'හා' - නිපාතය යෙදිණ. උක්තභාවය කියන 'ඔ' - ආදි ප්‍රත්‍යය එහි නො යෙදේ නුයි 'බමරගණන්' යනුයෙන් 'අන්' විබත් යෙදුසෙ දන්නේ යැ. මාතෘභාෂායෙහි චාර්ථසමාසයෙන් පද එක් පිණිසැ 'හා' - නිපාතයෙනුදු පද එක් කොට ගෙනැ අගපදයෙහි විභක්ති ලියති. බමරගණන් හා නන් විසිතුරු ලිහිණිගණයො, බමුණන් හා ගහපතිහි, කෛරාටිකයන් හා අන්ධබාලයො, ශාක්‍ය රජුන් හා කොලිය රජහු" යන ප්‍රයොග නිදර්ශනයි. අටුවාපාඨ ඒ ඒ තැනැ දක්වා-ලුම්හ. අටුවාපාඨ හා සසඳා බලත් මැ, සියබසෙහි එන වෙනෙස හෙළි වෙයි. "නාගයන් හා සුපර්ණයො, අසුරයන් හා දෙව්යො, නෑයන් හා මිත්‍රයන් සෙයින්" යනාදි විසින් අමාවතුරෙහි අන් තන්හි දු මෙ යෙදුම් ඇත.

"කිඹුල්වත් නුවර හා කොලිය නුවර හා දෙ අතුරෙහි" (214 පි:) තෙල නිදර්ශනයෙහි 'හා' - යනු දෙ තැනෙකැ ඇත. එහි කියන අතුර (=අන්තරය) කිඹුල්වතට අයත් වෙයි. කොලියනුවරට ද අයැති වෙයි. එයින් එ දෙ තැනැ 'හා' - යනු තුබුව මනා වෙයි. සමුච්චයාර්ථය පිණිසැ 'හා' - යනු ඒ ඒ පදයෙහි වෙන වෙන යෙදෙත් මැ, එ හැම පදයෝ සමාන විභක්තික වැ සිටිත්. "ශාක්‍ය රජුන් හා කොලිය රජහු" යනාදි තන්හි 'හා' - යනු සමුච්චයාර්ථ වුව ද, එක් මැ තැනැ යෙදේ. භින්නවිභක්තික බව ද පෙනේ.

23.

i. "සෙනානී කෙළඹියා දූ සුජාතා නම් ඈරී" (23 පි:)

. "මෙ කථා වස්තුව ගෙනැ ගොස් මෙ තමා ගෙ සථරහු මහනුවට හට කියයි" (52 පි:)

. "අප වත්හිමියො දෙව්දත් තෙරහු මහත් අනුභාව ඇත්තාහ" (114 පි:)

. "වහන්සෙ, අප වත්හිමියො භාර්ගයො මන්ත්‍රාණිපුත්‍රයො සස්නෙහි අභිරත වෙත්වයි" (138 පි:)

. "අප වත්හිමියො පුණුමහතෙරහු වැඩියහ" (193 පි:)

. "අප නැන්දණියන් පුතණුවො බුදුහු වැඩියහ" (257 පි:)

. "අඟුරට භද්දිය නුවර මැඩ මහසිටහු පුතු ධනඤ්ජයසිටහු දූ විසාඛා නම් වැ" (259 පි:)

"තී පියා තිම්බරු නම් ගඳෙවු දෙව්රජහු වනමි" (285 පි:)

. "සක්දෙව්රජ මාතලීසංග්‍රාහකයා පිතෙක් සිඛණ්ඩි නම් ඔහට ඇය දියටී වැ සිටි" (287 පි:)

තෙල වැකියෙහි 'දූ සුජාතා' යනුදු 'සථරහු මහනුවට හට' යනු දැයි ඒ ඒ දෙ පදයෝ ඒකාර්ථ වෙති. 'වත්හිමියො දෙව්දත් තෙරහු' යනුදු 'වත්හිමියො භාර්ගයො

මන්ත්‍රාණිපුත්‍රයෝ' යනුදු 'වත්හිමියො පුණුමහ තෙරහු' යනුදු 'නැන්දණියන් පුතණුවො බුදුහු' යනුදු 'දූ විසාඛා' යනුදු 'පිතෙක් සිබණ්ඩි' යනුදු එ සැටියෙන් මැ එකාර්ථ යි.

"විශෙෂ්‍යයෙහි සිටුනා ලිංගවිභක්ති වචන විශෙෂණයෙහි දු තුබුව මනා වෙයි" යනු මාතෘ භාෂායෙහි ව්‍යවස්ථා යැ. එසේ වුව ද, සියබසෙහි ලා නීලපීතාදි ගුණවිශෙෂණ විශෙෂ්‍යයා හා එකාර්ථ වුව ද, පූර්වනිපාත වැ සිට ලිංගවිභක්ති වචන නොගනුතුදු, විශෙෂ්‍යයෙන් පරනිපාත වත් මැ, ලිංගවිභක්ති වචන සෙව්නේ යැ, "කිරිමව්හු ඇතුළුවටනැ වැදැ බලන්නාහු එ පෙළහර දැකැ ගොස් රජ හට කීහු" (16 පි:) යන මෙහි 'බලන්නාහු' යනුදු "පස්වගමහසඟහු බුදුන් වඩනවුන් දුරින් දැකැ" (34 පි:) යන මෙහි 'වඩනවුන්' යනු දැයි සියබසෙහි ඉබොහෝ නිදසුන් ඇත.

චෙතනයකු කියන සාමාන්‍ය වචනයක් හා විශෙෂ වචනයක් හා සමානාධිකරණ වැ සිටුත් මැ, පූර්වපද වුව ද ලිංග විභක්ති වචන සෙව්නාසෙ පෙනේ. 'වත්හිමියො, භාර්ගයො, මන්ත්‍රාණි පුත්‍රයෝ' යන පදයෝ තුන් දෙන තුල්‍යාදිකරණයහ- පද විසින් තුනක් වැ සිටිය ද එකවස්තුකයහ. එහි 'මන්ත්‍රාණිපුත්‍රයෝ' යනු විශෙෂවචන වෙයි. 'වත්හිමියො' භාර්ගයො' යන දෙ වචන සාමාන්‍ය වචනයි. විශෙෂ්‍ය වන 'මන්ත්‍රාණිපුත්‍රයෝ' යන්නෙහි සිටුනා ලිංගවිභක්ති වචන විශෙෂණ වන 'වත්හිමියො, භාර්ගයො' යන දෙ තන්හි දු ඇත. සියබසෙහි තුල්‍යාධිකරණ විශෙෂණ විශෙෂ්‍ය විධියෙහි ලා චෙතනයකු කියන සාමාන්‍ය වචනය පූර්වපද වැ සිට විශෙෂ්‍යයෙහි ලිංග විභක්ති වචන සෙව්නාසෙ කියැ හැකි වුව ද, නීලපීතාදි ගුණ විශෙෂණාදිය පූර්වනිපාත වැ සිට එසෙයින් නොපවත්නාසෙ ගුරුළුගොමීන් ගේ පදසටනායෙන් විනිශ්චය කළ යුතුයි. සාමාන්‍ය වචන විශෙෂ වචන විසින් වෙන වෙන සඳහන් කළ වචන 'පර්යායවචන' විසින් ගත ද වටී. ප්‍රාණිවාචක පර්යාය වචන සමානාර්ථ වුවත්, වෙන වෙන ලිංග විභක්ති වචන යොදා ගුරුළුගොමීන් ලියූසෙ පෙනෙන හෙයිනැ.

ගලන හොයෙක් එල්ලේ නො යෙයි. එ සෙයින් මැ ග්‍රන්ථභාෂාව මිසැ ව්‍යවහාර පථයෙහි වැටෙන බසෙක් එක් සැටියෙකින් මැ නො වැටෙයි. කාලවශයෙන් ප්‍රදෙශ වශයෙන් බිඳෙමින් නඟිමින් බස්මින් වැටෙයි. සියබසෙහි ද තෙල සැහැවී ඇත. එසේ ද වත්, එහිලා අව්‍යක්තයන් නිසා වන වෙනස ව්‍යක්තයන් විසින් නොගතමනාසෙ ගුරුළුගොමීන් ගේ පදසටනායෙන් ප්‍රකාශ වෙයි. පොළොන්නරු සෙමෙහි සාමාන්‍ය ජනයාගේ වහරවිදි නො ගෙනැ ග්‍රන්ථභාෂා වශයෙන් පිළිගත මනා ව්‍යක්ත භාෂායෙන් මැ අමාවතුර ලියූ බව මෙතෙක් මෙහි අල වාක්‍ය ප්‍රදෙශ රාශියෙන් දත හෙන්නේ යැ. සාමාන්‍ය ජනයා ලියු කියු බසින් 'අමාවතුර' කරන ලද නම්, යටැ කී 'වාක්‍යවිධි' අද තෙක් නො පවත්නේ වෙයි. ඇද දැක්වුව මනා වියරණ විදි මෙහි බොහෝ ඇත ද, මේ ලිපියෙහි එ හැම නොකියැ හෙන්නේ යැ. මෙ ග්‍රන්ථය සංස්කරණ කරත් මැ, ශොධන වශයෙන් අප කළ වෙනස මේ තැන් සිට දක්වම්හ.

## කිලිටිපද

දුර්දන්තදමනයෙහි එන "ආදිත්තජාතක දසබ්‍රාහ්මණ ජාතකාදියැ විචෙය්‍යදාන දෙවමින්" යන වැකියෙහි 'විචෙය්‍යදාන' යනු 'විශෙෂදාන' යි සොරතසංස්කරණයෙහි දු මහානාම සංස්කරණයෙහි දු යෙදිණ. "විචෙසදාන, විචෙවදාන, විචෙයදාන" යන

නානා පාඨ පුස්කොළ පොත්හි ඇත. සඳහන් කළ ජාතකකථා විස්තර කරමින් "විචෙය්‍යදානන්ති දක්ඛිණං ච දක්ඛිණෙය්‍යං ච විචිනිත්වා දින්නදානං" යනු අටුවාහි වදාළහ. "විචෙය්‍ය, (-සං: විචිත්‍ය) දෙයධර්ම හා පිළිගාවන් හා ඉලියා-අන්වෙෂණය කොට දෙන දානය 'විචෙය්‍යදාන' නම් වේ" යනු ඒ අටුවාවෙහි වදාළ සැටිය වෙයි. එයින් මෙහි ශුද්ධපාඨය 'විචෙය්‍යදාන" යනු පාළිපදය මැ වෙයි. පොත්හි එන 'විචෙයදාන' යන පාඨය බෞද්ධ සංස්කෘත වශයෙන් සලකත් මැ පිළිගත හෙතුදු, සංස්කෘත භාෂායෙහි 'විචෙය' යි පූර්ව ක්‍රියායෙක් නො ලැබේ. එයින් පොත්හි එන 'විචෙයදාන' යන පාඨය ශුද්ධරූපයෙක් ද නොවේ. 'අමාවතුරෙ'හි නොඑක් තැනැ පාළිපද සියබසෙහි ලා යොදනුයෙන් අටුවාහි වදාළ 'විචෙය්‍යදාන' යන පදය මැ මෙ තන්හි යෙදුසෙ සළකම්හ. ආදිත්ත ජාතකයෙහි දූ දසබ්‍රාහ්මණ ජාතකයෙහි දූ 'විචෙය්‍යදාන' යනු අප පාඨයෙකි. ශොධකයන් 'විචෙස' යන සදොසපාඨය පෙරළා 'විශෙෂ' කියා නිර්දොෂපාඨයක් තනා ගන්නට සිතුබව පෙනෙතුදු, අටුවා බලන්නට සිතුබවෙක් නො පෙනේ.

දුර්දන්තදමනයෙහි "භූරිදත්තජාතක සංඛපාලජාතක චම්පෙය්‍ය ජාතකාදියැ තණපතක් සෙ දිවි පියා පොළොව පෙරළන්නක්හුසෙ සිල් පොහො පිසමින්" යන වැකියෙහි "සිල් පොහො පිසමින්" යනු 'සිල් පොපියමින්' කියා පැරැණි පොත්හි එයි. ඒ කී ජාතක වනාහි සිල් හා පොහොය හා දෙක වෙසෙසින් දුක්වන ජාතක වෙයි. උපොසථය මතු නො දක්වයි. එයින් 'සිල් පොහො' යනු ශීලය හා උපොෂධය හා දෙක එකවට පරිපාචනා කළසෙ දැක්වීමෙකි. 'පිසමින්' යනු 'පාචනය කෙරෙමින් - මුහුකරුවමින්' යන අරුත් ඇති පදයෙකි. තෙල පරිච්ඡෙදයෙහි අගැ "ශීලසමාධිප්‍රඥාලක්ෂණ ගුණ ධර්මයන් පිසමින්" යන මෙහි දූ එය යෙදිණ. මෙ වැකියෙහි 'පිරිපසමින්' යි පොත්හි එන පදාන්තරය ද මෙයට පමණ කටයුතු තැනෙකි. මෙ හැම එක් කොටැ ගනුත් මැ, "ශීලය හා උපොෂධය හා දෙක පරිපාචනා කෙරෙමින්" යන අර්ථය ලැබේ. චම්පෙය්‍යජාතකාදිය එය මැනැවින් දක්වන්නේ යැ. 'පොළොව පෙරළන්නක්හු සෙ' යන මෙයින් කළ සෙ දුෂ්කර බව අඟවයි. ස්වසන්තානදමනයෙහි ලා "සහවුරුද්දක් පොළො පෙරළනුවන් සෙයින් අහස ගැට ලනුවන් සෙයින් කිසි කෙනකුනුදු විසින් නොකටහැකි කෙළ පත් මහත් වීර්යය කොට" - යනාදි වැකියෙහි ගුරුළුගොමීහු මැ දුෂ්කරභාවය කියන්නට එ උපමා අළහ. 'පොහොපො'යි ද පිසමින් - පියමින්' යි ඇයි පෙරැළුණු දෙ පද එක් වැ 'පොපියමින්' යන අප පාඨය සිද්ධ වී යැ. තෙල අපපාඨය ප්‍රමාණපාඨ කොට ගෙනැ ඒ ඒ උගතුන් නන් ලෙසින් ව්‍යාඛ්‍යාන කරතුදු, අපි මෙ සංස්කරණයෙහි දී 'සිල් පොහො පිසමින්' කියා සකස් කළම්හ.

ස්වසන්තානදමනයෙහි "බෝසතාණො වනාහි ඇත්ගණනින් කෙළ දහසක් ඇත්නට බල ඇතියව්හු. පුරුෂගණනායෙන් දස කෙළ දහසක් පුරුෂයනට බල ඇතියව්හු" යන වැකියෙහි "කෙළ ලක්‍ෂයක් පුරුෂයන්ට බල ඇතියව්හු" යනු සොරතසංස්කරණයෙහි එයි. හැම පුස්කොළපොත්හි එ පාඨය ඇත. අපි "දසපුරිසකොටිසහස්සානං" යන අටුවා බලා "දස කෙළ දහසක් පුරුෂයනට" යනු යොදා-ලුම්හ. ගුරුළුගොමීන් 'ධර්මප්‍රදීපිකා' යෙහි දී "ප්‍රකෘතිහස්තිගණනායෙන් කොටිසහස්‍රයන් ඇත්නට බල ඇත්තාහ. පුරුෂගණනායෙන් දශ කොටිසහස්‍රයක් පුරුෂයනට බල ඇත්තාහ" යනු කියුයෙත් 'අමාවතුරෙහි' හි දි ලියන්නන් කළ වරද විශද වැ පෙනේ.

ස්වසන්තානදමනයෙහි "අස් හට විළුම්සන් කොටැ, අසු, අඩ ඉස්බක් පමණ පළල් ගඟ පැනැ පරතෙර ගොස් සිටි කලැ අසුපිටින් බැසැ.........." යන වාක්‍යයෙහි දී සොරත සංස්කරණයෙහි "අසූ අට ඉස්බක්" යනු එයි. ඉස්බ ගණනින් අටාසූවෙක් ගොස් බඹ විසින් තුන් දහස් තිසෙක් වෙයි. බඹ තුන්දහස් තිසෙක් ගොස් රියන් විසින් දොළොස් දහස් තුන්සියවිස්සෙක් වෙයි. කන්ථක අස්රජ දොළොස් දහස් තුන්සිය විසිරියනක් පමණ පළල් ගඟ පැනැ ගියසෙ එයින් පැවැසිණ. මෙසෙ සොරතසංස්කරණයෙහි එනුයෙ පුස්කොළ පොත්හි එන සැටි මැයි.

"අස්සො උප්පත්තිවා අඩ්ඪ - උසභවිත්ථාරාය නදියා පාරිමතීරෙ අට්ඨාසි" යනු මෙහි අටුවාකථා වෙයි. "අසු පැනැ අඩ ඉස්බක් පමණ පළල ගඟැ පරතෙරැ සිටියෙ" එයින් වදාළහ. ඉස්බෙහි අඩ නම් : සැත්තෑ රියනෙකි. කන්ථක අස්රජු කුලවත් අසකු වන බැවින් සැත්තෑ රියනක් පමණ තැන් පනනු පිළිගත හෙයි. කිසි පොතෙකැ "අට්ඨ - උසභවිත්ථාරාය" යන පාඨ ඇත. එය ගනුත් මැ, 'අට ඉෂ්බෙක්' පැවැසෙ. එය ගොස් එක් දහස් එක් සිය විසි රියනෙක් වෙයි. කිසි පොතෙකැ "අට්ඨාරස උසභවිත්ථාරාය" යන පාඨ ඇත. එය ගනුත් මැ, 'අටළොස් ඉස්බෙක්' පැවැසෙ. තෙල පාඨ එකෙකුදු නො වටී. අද ද පවා අසු පැනැ ගිය තැන් ඇසින් දැකැ මැනැ ගත හෙන හෙයිනි. අමාවතුරු පාඨයෙහි එන 'සිටිකලැ' යනුවෙන් කී ස්ත්‍රීතික්‍රියායෙහි කර්තෘ 'අසු' යි දැක්විණ. එ "අශිති" යෙහි වැටෙන පද විසින් වරදවා ගැනීමෙන් "අසූඅට ඉස්බෙක්" ගෙතිණ. එයින් වූයෙ කිම? අසු පැනැ ගත් සැත්තෑ රියනක් පමණ පළල තැනෙක දොළොස් දහස් තුන්සිය විසිරියනක් පමණ පළල වී යැ. අපි 'අසු' යනු අශ්වවාචක වත් මුත්, අශීතිවාචක නොවන සෙ ගෙනැ පද බිඳැ යෙදුම්හ. "අඩ්ඪ - උසභවිත්ථාරාය" යන අටුවා ප්‍රමාණ කොටැ ගෙනැ "අඩ ඉස්බක්" යනු සුදුසු පාඨ සෙ ගතුම්හ.

ස්වසන්තානදමනයෙහි මාරයුද්ධය කියන තැනැ "වන දු, ගසුදු, රුකුදු එ සෙයින් මැ උපුරා........." යන වැකියෙහි දී "වන දහසුදු රුකුදු එ සෙයින් මැ උපුරා......" යනු දක්නා ලැබේ. පුස්කොළ පොත්හි දු එ සැටි මැ එයි. "වන ගච්ඡරුක්ඛාදීනි" යනු මෙහි අටුවා වේ. වනත් ගසුත් රුකුත් වෙන වෙන ගස්සෙ අටුවා පාඨයෙන් පෙනේ. 'වන ද, ගසුදු' න මෙහි 'ද' - කාරයා 'වන' ශබ්දයෙන් ඈත් වැ 'ගසුදු' යන්න හා සමඟ ළඟ වි යැ. එයින් සිද්ධියට ගිය 'දගසුදු' යනු දුටු ලියන්නො 'දහසුදු' යි සකස් කැරැ ගත්හ. සොරතසංස්කාරණාදියෙහි එනුයෙ ලියන්නන් කළ එ විපර්යාසය මුත් යථාර්ථය නොවන බව පෙනේ.

මාරයුද්ධය කියන තන්හි මැ "එ සෙයින් මැ මවන ලද වැලිවැසි දුමමින් දිලියෙමින් අහසින් ගොස් මහසත්හු පාමුලැ දිවසඳුන්සුණු බවට ගියො. එ සෙයින් මැ මවන ලද සියුම් වැලිවැසි දුමමින් දිලියෙමින් අහසින් ගොස් මහස්තහු කරා පැමිණැ දිවකුසුම්රොන් බවට ගියො" යනු සොරතසංස්කරණාදියෙහි දක්නා ලැබේ. මෙ දිනැ වාත යැ, වර්ෂ යැ, පාෂාණ යැ, ප්‍රහරණ යැ, අංගාර යැ, කුකුල යැ, වාලිකා යැ, කලල යැ, අන්ධකාර යැ යි නවවිධ වර්ෂායෙක් වැටිණ. "මෙ නවමහවැස්සෙන්" යි ගුරුළුගොමීහු දු එ බව සඳහන් කෙරෙති. 'වැලිවැසි එකෙකැ, සියුම් වැලිවැසි අනෙකෙකැ'යි වෙන වෙන ගණනට නොහැකි යැ. එහි ද්‍රව්‍යභෙදයක් නොවන හෙයිනි. එ දෙක එක් වත් මැ, සොරතසංස්කරණාදියෙන් ලැබෙනුයෙ අටමහ වැස්සෙකි. අටුවායෙහි නම් විසින් වෙන් කොටැ වදාළ 'කුකුලවර්ෂා' තුබුව මනා

තන්හි 'වැලිවැසි' යනු 'හළුවැසි'යි සකස් කැරැ ලුම්හ. එ විටැ අටුවා හා අමාවතුර හා සටිත වෙයි.

ගහපතිදමනයෙහි "කුමහර හට 'කිරිමිල වළමිල' යැයි එ එ තැනින් අළ ධන සියදහසක් කෙළ යැ" යන මෙහි මූලපාඨ නම්: "කුමාරස්ස ඛීරමණිමූලං හොතූති තතො තතො ආහතධනං කොටිසතසහස්සං අහොසි" යනුයි. එයින් වළමිල' යනු කුමරපළඳනා පිණිසැ එලවන වළලු සඳහා අළ මිලසෙ පෙනේ. "ඛීරමණිමූලං" යන මෙහි 'මණිකෙ ගණ්හථ මණිකෙ කියත්. සෙරිවාණිජ ජාතකයෙහි එන "මණිකෙ ගණ්හථ මණිකෙ ගණ්හ" යන තැනැ ගැටපද කරුවන් 'මණික ශබ්දය වළල්ලෙහි ලා අර්ථ කියූයෙන් 'මණිමූල' යන වළලු මිලසෙ සළකන්නෙ යැ. "වැළ, වල, වළා" යන රූප ද ගැටපදපොත්හි එතියි ජාතක අටුවා ගැටපදය ප්‍රකාශයට ලූ ශ්‍රීමත් ඩී.බී. ජයතිලක පණ්ඩිරත්නයෝ කියති. අමාවතුරු පොත්හි දු 'වැල මිල, වළමිල' යන දෙ සැටිය එයි. එයින් 'වළමිල' යනු බැහැර ලන්නට කරුණෙක් නැත. සොරතසංස්කරණයෙහි 'වැලමිල' යනු මෙ තන්හි යොදා ගත්හ.

"වැලමිල - වැලිකෙළිය සඳහා වුව මනා දෙයට අවශ්‍ය මුදල්; මේ දෙකම සඳහා පපංචසූදනියෙහි යෙදුනේ 'ඛීරමණිමූලං' යන්නෙහි එහි අර්ථය නම් 'කිරිමිල මණිමිල' යනුයි. 'මණිමූල' යයි කීයේ. ආභරණ සඳහා මුදල් යයි හඟිමු" යනු සොරත සංස්කරණයෙහි ලා කළ විවරණ යි. මූලපාඨයෙහි අර්ථ වටහා ගත් කලැ 'වැලිමිල' යන ශුද්ධිය නොපිළිගත හෙයි. 'මණි' ශබ්දය වළල්ලෙහි වැටෙනසෙ 'වළ' ශබ්දය සියබසෙහි 'වළලු' - අරුත් ඇතිසෙ පෙනෙන හෙයින් අපි පැරැණි පොත්හි එන 'වළමිල' යනු මැ ශුද්ධ සෙ සළකම්හ. 'වැලිමිල' යනු මූලපාඨය හා නොසැසැඳෙන හෙයිනුදු පැරැණි පොත්හි නො ලැබෙන හෙයිනුදු අශුද්ධ පාඨයෙකි.

ගහපතිදමනයෙහි "එතෙකුදු හොත් ශස්‍යඵල කැමැත්තාහු ගොඩද් දෙණද් අනුපයෙහිද් බිජු වපුරෙති. වැසි බොහෝ වී නම්, ගොඩ වපුළ බිජු ඵල දෙයි. තුබු වැනැ වපුළ බිජු කුණු වෙයි. වැසි මඳ වී නම්, දෙණ වපුල බිජු ඵල දෙයි. තුබු තැන වපුළ බිජු මියෙයි. සම වැසි වී නම්, තුන් තැනම වපුළ බිජු ඵල දෙයි. වැසි නැත්නම්, හෝ නිසා ගඟ නිසා වැවළවිල්වල වපුළ බිජු දියෙන් හෝ යෙයි (දියෙන් හෝ එයි)"

තෙල වැකිය පොත්හි අවුල් වැ සිටුනා තැනෙකි. සොරත සංස්කරණයෙහි වේ වයි, මහානාම සංස්කරණයෙහි වේ වයි, එ අවුල නිරවුල් නොවී. මෙහි අතිවෘෂ්ටි යැ, මන්දවෘෂ්ටි යැ, සමවෘෂ්ටි යැයි වැසිකල් තුනක් ගෙනැ, ස්ථල යැ, නිම්න යැ, අනූප යැයි කෙත් තුනක් ගෙනැ, අනුබු යන තුන් කෙත කියූ බැවින් 'වැසි බොහො වී නම්' යි පටන් ගත් අතිවෘෂ්ටිප්‍රතිඵල පිළිවෙලින් එ තුන් කෙතෙහි ලා කියැ යුතු යැ. පොත්හි එන සැටිය බලත් මැ, එ නොකියනසෙ පෙනේ. "වැසි නැත්නම්, හෝ නිසා ගඟ නිසා වැවළවිල්වල වපුල බිජු දියෙන් හෝ යෙයි. දියෙන් හෝ එයි" යන අගැ කොටස අතිවෘෂ්ටි ප්‍රතිඵල කියන තැනැ තුබුව මැනැවින් අපි ශුද්ධ කොටැ එ තන්හි යොදා ලුම්හ. එවිට අර්ථය සපුරා සිටුනේ යැ. ලියන්නකු ගෙ පමාදොසකින් කැඩී දුර ගිය එ කොටස අර්ථ සම්බන්ධ නැති වැ තුබුසෙ දුටු යමකු විසින් "වැසි නැත්නම්" යනුවක් ඇරැ සාර්ථක කැරුණේ යැ. එසෙ වතුදු, අටුවා හා සමඟ නො සැසැඳෙයි. "දියෙන් හෝ එයි, දියෙන් හෝ යෙයි" යනුදු කිලිටෙහි එරුණු තැනෙකි. වැකියෙහි බැසැ සිටුනා "වැවළවිල්වල" යනුදු දොෂදුෂ්ට යැ. වැ-වැව් නම්: වාපි යැ. වළ නම්: ආවාට යැ. විල්

නම්: තඩාග යැ. මෙ හැම අනූප - (-ජලබහුල භූමි) යි. එයින් මැ එය සට්ත වතුද්‍ද, බහ්වර්ථය අඟවන 'වල්' යනු ගුරුළුගොමීන් ගෙ බසෙක් නොවේ. ඔවුන් බසෙහි ආධාර බහුවචන කියන විශෙෂරූප නැතියෙනුදු නවීනයන් ප්‍රත්‍යයස්වරූපයෙන් ගන්නා 'වල්' යනු ඔබගේ වැකියෙහි නොයෙදෙන හෙයිනුදු අපි "වැවළවිලැ' යනු ශුද්ධරූප කොටැ යෙදුම්හ. එ ද පොත්හි එන පාඨයෙක් මැ යැ. දැන් සැසැඳිලි කරනුවන් පිණිසැ අටුවා හා සමඟ ශොධිත වාක්‍යය දක්වම්හ.

"සස්සඵලං ආසිංසමානා තීසුපි ඛෙත්තෙසු බීජං වපන්ති. තත්‍ථ අතිවුට්ඨිකාලෙ ථලෙ සස්සං සම්පජ්ජති. නින්නෙ පූතිකං හොති. අනූපෙ නදිං ච තළාකං ච නිස්සාය කතං ඔඝෙන වුය්හති. මන්ද වුට්ඨිකාලෙ ථලෙ ඛෙත්තං විපජ්ජති. නින්නෙ පන ථොකං සම්පජ්ජති. අනූපෙ න සම්පජ්ජතෙ'ව. සමවුට්ඨිකාලෙ ථලෙ ඛෙත්තං ථොකං සම්පජ්ජති. ඉතරෙසු සම්පජ්ජතෙ'ව" යනු අටුවා යැ.

"ශස්‍යඵල කැමැත්තාහු ගොඩැද් දෙණැද් අනුබුයෙහිත් බිජු වපුරති. වැසි බොහො වී නම්, ගොඩැ වපුළ බිජ් ඵල දෙයි. දෙණැ වපුළ බිජ් කුණු වෙයි. හො නිසා ගඟ නිසා වැවළවිලැ වපුළ බිජ් හො දියෙන් යෙයි. ගඟ දියෙන් හො යෙයි. වැසි මඳ වී නම්, දෙණැ වපුළ බිජ් ඵල දෙයි. තුබු තැනැ වපුළ බිජ් මියෙයි. සම වැසි වී නම්, තුන් කෙතැ මැ වපුල බිජ් ඵල දෙයි" යනු අනුවාද යි.

**උපාලිදමනයෙහි** "කන් හුරු කොටැ ගෙනැ ඇවිදුනෙ" යන මෙ තැනැ 'හුරු කොටැ - ගෙනැ' යනු උචිතාර්ථයක් දියැ හෙන පාඨයක් වුව ද, 'රැකොටැ' ගෙනැ' යන පාඨය ශුද්ධ සෙ සළකන්නේ යැ. **භික්ෂුදමනයෙහි** දු 'රැකොට-ගෙනැ' යන පාඨය එයි. එහි දී පුස්කොළ පොත්හි එන පාඨාන්තරයකුදු නුදුටුම්හ. 'රැකොටැ' යනු 'රැකුර' ධාතුයෙහි පූර්වක්‍රියා නිපාතයෙකි. **දම්පියාඅටුවා ගැටපද සන්නයෙහි තිස්සත්ථෙර** වස්තුයෙහි "පට්ඨපෙසි, රැකුළු" යි අර්ථ කීහ. එහි **විබ්භන්තක** වස්තුයෙහි "පට්ඨපෙත්වා, රැකොට" යි අර්ථ කීහ. මෙසෙ 'පට්ඨපෙසි, පට්ඨපෙත්වා' යන දෙ තැනැ පිළිවෙලින් 'රැකුළු, රැකොට' යි කී සැටියෙන් **රැකුර** ධාතුයෙහි රූප නැඟෙන සැටි දු පෙනේ. මාතෘභාෂායෙහි අසංඛ්‍යපූර්වක පදයක් මිසැ සෙසු තැනක් පිණිසැ **රැකුරධාතුයෙන්** අරුත් කියුසෙ නුදුටුම්හ. එයින් 'රැ+කර' - යන ප්‍රකෘති දෙක එක් වැ ගෙනැ 'රැකුර' ධාතු සිද්ධ යැයි ද, '**කර**' ධාතු හට අතිශයර්ථයක් දෙන්නට 'රැ' - යන ප්‍රකෘතිය ළඟ වැ සිටුනේ යැයි ද සැළැකියැ හෙයි. 'රැ' - යනු උපපද කොටැ සිටුනා '**කර**' ධාතු මෙහි පෙනෙතුදු, සිද්ධාන්ත සංග්‍රහයෙහි දී නිෂ්පන්න ප්‍රකෘති විසින් දුටහ. සියබසෙහි අලංකාරාර්ථ කියන '**ලකුර**' ධාතු ද මෙබඳු තැනෙකි. 'රැ' - යන මෙයින් කර ධාතු හට දෙන අර්ථාතිශය නම්: නතු කිරීම්, නඟා ලීම්, පටන් ගැනුම් ආදිය වේ. 'ආරොහ, ආරද්ධ' ආදි පද 'රැ' - ශබ්දයෙහි ප්‍රභවයෙහි ලා සැළැකියැ හෙන හෙයිනි. "කන් රැකොටැ - ගෙනැ" යනු යෙදුණේ 'ඔහිතසොත' යන මෙහි අරුත් දක්වනු පිණිස යැ, පොත්හි පාඨ කිහිපයක් එතුදු, එයින් ශුද්ධපාඨය නම්: 'රැකොටැ - ගෙනැ' යනු යි. සොරත සංස්කරණයෙහි "කුරු කොට ගෙණ" යනුත් මහානාම සංස්කරණයෙහි "කරුකොට ගෙන" යනුත් කියති.

**ගහපති දමනයෙහි** අගැ "ආදි ශබ්දයෙන් දසමගහපතිසිට්නුදු" යන තැනැ 'දසම' නම් ගහපතියකු කියයි. 'දස මහගහපති' යි අන් සැටියෙකින් ලියා-ගත් කිසි කෙනෙක් ගෘහපතීන් දශ දෙනා සොයමින් අද ද පවා වෙහෙස දරත්. ධර්මප්‍රදීපිකායෙහි: "උපාලි

ගහපති යැ, පොතලිය ගහපති යැ, විසාඛ ගහපති යැ, දසම ගහපති යැ, සුදත්ත පණ්ඩිතයො" යි **දසම ගහපති** වෙන මැ කී හෙයින් අපි එය වෙනස් කරන්න නො සිතුම්හ. ගුරුළුගොමීන් දුටු 'දසම' යන් ශොධකයො නො දැකැ 'දස මහගහපති' යි තමන් මැ මවා-ගත් ගනඳුරුයෙහි පිළිසරණට එළියකුදු නො ලැබැ ඇවිදුති.

**බ්‍රාහ්මණදමනයෙහි** "සත්ත ච අජසතානි සත්ත ච උරබ්භසතානි" යන පෙළ පිණිසැ "සත් සියක් එළුවන් සත් සියක් එළුදරු මැඬවුන්" යනු පොත්හි එන සැටි යැ. "එළුදරුමැඬවුන්, එළුනාම්බන්" යි ගැටපදකරුවෝ අර්ථ ද කියති. "තරුණමෙණ්ඩකා" යනු පෙළෙහි ලා අටුවා ආ සැටියි. 'ළදරුමැඬවුන්' යනු "එළුදරු මැඬවුන්" යි අව්‍යක්ත ලේඛකයන් අතින් කිලිටි වැ ගියසෙ එයින් පෙනේ. අපි 'ළදරු මැඬවුන්' යි ශුද්ධියට ගතුම්හ. එ විට 'තරුණමෙණ්ඩකා' යි අටුවාහි වදාළ අර්ථය යෙදේ. **බ්‍රාහ්මණදමනයෙහි** අගැ 'එළුපැටවුන්' යි එය මැ අන් වචනයෙකිනුදු කියත්. පුස්කොළපොත්හි 'ළ-එ' දෙ අකුරු බෙහෙවින් එකාකාර වැ සිටුනා හෙයින් 'එදරු' යි ලියැ වී ගිය පාඨය දුටු ලියන්නන්න 'එ' - කාරය හෙළා 'එළුදරු' යි ලියා-ගත්සෙ මිසැ ගත මනා දැයෙක් නැත.

**බ්‍රාහ්මණදමනයෙහි** "බුදුනට ඇඳිලි බැන්දාහු ළ දෙ ගත්තාහ" යන මෙහි 'ළ දෙ යනු 'ලද' යි පොත්හි එයි. සොරත සංස්කරණය පිණිසැ කළ ගැටපදයෙහි "ලද, අත්‍යලබ්ධි" යි අර්ථ ද කියති. මූල පාඨය හා අනුවාදය හා ළං කොට බලත් මැ, මහත් වරදක් මෙහි ඇතිසෙ පෙනේ.

"යෙ තෙ උභතොපක්ඛිකා තෙ එවං චින්තයිංසු. "සචෙ නො මිච්ඡාදිට්ඨිකා චොදෙස්සන්ති, කස්මා තුම්හෙ සමණං ගොතමං වන්දිත්ථා 'ති'? තෙසං, 'කිං අංජලිමත්තකරණෙන'පි වන්දිතං නාම හොතීති' වක්ඛාම. සචෙ නො සම්මාදිට්ඨිකා චොදෙස්සන්ති, 'කස්මා භගවන්තං න වන්දිත් ථා'ති? තෙසං, 'කිං සීසෙන භූමිං පහරන්තෙනෙ'ව වන්දිතං හොති, නනු අංජලිකම්මම්පි වන්දනා එවා'ති" යනු මූලපාඨයි.

"එහි බුදුනට ඇඳිලි බැන්දාහු ළ දෙ ගත්තාහ. ඉදින් මිසදිට්හ ගත්තාහු, 'තෙපි මහණ ගොයුම්හු වැන්දාව?'යි කීහු නම්, 'ඇඳිලි බැඳි මාත්‍රයෙකින් වැන්දාවමො ද?' යම්හ. සම්දිට්හ ගත්තාහු, 'බුදුන් කුමට නො වැන්දාව?'යි කීහු නම්, 'හිස බිමැ පහරවා මැ වැන්ද මනා ද? අත් නඟා වඳුනෙ වැඳුම් නො වෙද?' යම්හ' යි ඇඳිලි බඳහු" යනු අනුවාදයි.

ඇතැම් බමුණන් හා ගහපතිහු බුදුන් වැඳැ එකත් පස් වැ හුන්හ. ඇතැම්හු බුදුන් හා සාරාණිය කථා බැණැ එකත් පස් වැ හුන්හ. ඇතැම්හු බුදුනට ඇඳිලි බැඳැ එකත් පස් වැ හුන්හ. ඇතැම්හු නම් ගොත් කියා එකත් පස් වැ හුන්හ. ඇතැම්හු නො බැණැ එකත් පස් වැ හුන්හ. මෙයට වෙන වෙන හේතු දක්වමින් "එහි බුදුනට ඇඳිලි බැන්දාහු ළ දෙ ගත්තාහ" යනු කියත්. මිසදිටුවන් ඇසුව, 'මෙසෙ කියම්හ' සම්දිටුවන් ඇසුව, 'මෙසෙ කියම්හ' යි ළ දෙ (-සිත් දෙක) ඇත්තාහු යැ, ඇඳිලි බැන්දාහු නම්.

මූලපාඨයෙහි "උභතො පක්ඛිකා" යනු ඔවුන් ගෙනැ කීහ. එහි 'උභතො' යනු 'දෙ' යි සියබසින් මෙහි තැබූහ. මෙ ග්‍රන්ථයෙහි මැ මාතංගකථායෙහිලා "උභතො

අනන්තරගෙහවාසිකා" යනු "දෙ එක්බිති ගෙයි ඇත්තො"යි ගත් සැටි දු එය හා සසඳන්නේ යැ. මුලැ දී 'ළ දෙ' යි සිටි ද දෙක 'ළ ද'යි පෙරළී පසු 'ලද' යි එක් පදයක් වැ මූලරූපයෙන් අන් අතෙකැ ගිළිණ.

**රාජදමනයෙහි** "උවකමු දොළෙක තිට උපන්නෙ යැ" යන මෙහි ලා මහානාම සංස්කරණයෙහි 'සැවකමු' යනුත් සොරත සංස්කරණයෙහි 'සුවකමු' යනුත් යොදති. එයින් 'සැවකමු' යනු අමාවතුරු පුස්කොළ පොත්හි දක්නට ඇත ද, 'සුවකමු' යනු දක්නට නො ලැබිණ. "සැව කමු, සවකමු, සව්කම්, සැළුවකමු" යනාදි නානාරූප පොත්හි ඇත. අපි 'උවකමු' යනු ශුද්ධරූප සෙ සළකම්හ. මෙ ග්‍රන්ථයෙහි **නාගදමනයෙහි** එන "මහණ ගොයුම්හු ගෙ රූපයෙහි අග්පත් සිරිරු දැකැ කිසි මිනිසෙක් උපක්‍රම නොනිස්සැ" යන පාඨයෙහි 'උපක්‍රම' (-උවකමු) යනු කැඩුම් බිඳුම් ඈ විසින් ලේ සලන ක්‍රියායෙක් වෙයි.

**දම්පියාඅටුවාගැටපදයෙහි** "විදුරු නොබිඳෙතුජු අවුවෙහි තුබුව, හුණු තවාහි වන සෙයින් උවකුම් හම්යෙහි නොබිඳෙතුජු අන්තශ් චලන මාත්‍රයෙක් වේ"යි දෙව්දත් තෙරුන් වත්හි එන මෙ වැකියෙහි දු 'උවකුම්' යනු කැඩුම් බිඳුම් පිණිසැ කරන ක්‍රියායෙහි ලා යෙදිණ. පාළියෙහි දු 'උපක්කම' ශබ්ද ආයුධාදීන් ලේ සලන්නට දෙන පහර කියයි. ශාස්ත්‍රයෙහි 'උපක්‍රම' ශබ්දය චිකිත්සායෙහි දු පළට වේ.

"වෙදු ගෙන්වා - ගෙනැ රත් සැතින් දසරුව පළවා රන් තැටියෙන් ලේ ගෙනැ දිය හා මුසු කොටැ පොවා - ලී යැ" යන මෙයින් දොළ සන්හිඳුණුසෙ පැවැසිණ. 'උවකමුදොළ' එයින් මෙහි සටිත වෙයි. රජු ගෙ සිරිර සැත්කැමින් බිඳුණු හෙයිනුදු එයින් මැ චිකිත්සාවට පාත්‍ර වූ හෙයිනුදු එහි 'උපක්‍රම' යෙක් ඇත. එයින් එ දොළ 'උපකමුදොළ' නම් වී. උවකමුදොළක් වූයෙන් මැ "නෛමිත්තිකයො එ ගබ රදු සතුරු දරුයෙකැ, ඔහු විසින් රජ නස්සි යි කීහු. "යන අනාගත ඵල කථනය ද මෙහි සැසැඳේ. සොරත සංස්කරණයෙහි දී ප්‍රමාණපාඨ විසින් ගත් **පූජාවලියෙහි** එන 'සුවකමු' යන පාඨය ද 'උවකමු' යනු මැ වියැ හෙයි. එහි බන්ධුලමල්ලයන් ද දොළ සන්හිඳුවන්නට උපක්‍රමයක්-ලේ බිඳීමක් මැ කළ හෙයිනි. පූජාවලිකාරයන් අමාවතුරෙහි එන නොඑක් දැ පැහැර ගත්සෙ පෙනෙන හෙයින් ඔවුන් අමාවතුරෙන් උදුරා-ගත් 'උවකමුදොළ' යන පදය ලියන්නන් 'සුවකමුදොළ' කළහ යි සිතියැ හෙයි. පූජාවලිය කරන අවධියෙහි දු අමාවතුරෙහි ලිපිදොෂ වශයෙන් එ පාඨය තිබියැ හැකි ද වෙයි. පූජාවලියෙහි එන 'සුවකමු' යන මෙහි දු අමාවතුරෙහි පාඨාන්තරයන් කෙරෙහි එන 'සැළුවකමු' යන මෙහි දු 'උවකමු' යන්න ගිලිහී ඇත. පාළියෙහි 'උපක්කම' ශබ්දයත් අමාවතුරෙහි මැ 'උපක්‍රම' ශබ්දයත් ලේ බිඳීම කියනු පිණිසැ එළියෙහි මැ ඇත.

**අඟුල්මනයෙහි** "ශිල්පසමහරයට උපචාර" යැ යන තැනැ "සංහාරයට, සමාහාරයට, සම්භාරයට" යනාදි නානාරූප පොත්හි ඇත. සොරත සංස්කරණයෙහි දී 'ශිල්ප සංහාරයට' යනු යෙදුව ද, ගැටපදයෙහි දී 'ශිල්පසම්භාරයට' යි සකස් කැරැ-ලූහ. **පරිබ්‍රාජක දමනයෙහි** "සමහරයෙහි හුනස්නෙන් නැඟී" යන තැනක් **යක්ෂදමනයෙහි** "ගාථාව සමහර දු" යන තැනත් **භික්ෂුදමනයෙහි** "සමහරයෙහි මහත් කොටැ සාධුකාර දුන" යන තැනත් **ගහපතිදමනයෙහි** "බණ සමහර කළ කලැ" යන තැනක් මෙ වචනය යෙදිණ. මෙ හැම තැනැ 'සමහර' යන පදය පර්යවසානය කියයි. ශිල්ප

සමහරයට උපචාර යැ" යන මෙහිදු ශිල්පයා ගෙ පර්යවසානය කියයි. ශිල්ප සමහරට උපචාර යැ" යන මෙහිදු ශිල්පයා ගෙ පර්යවසානය මැ කියන හෙයින් "සමහර" යන පාඨය මැ අපි යොදා-ලුම්හ. "පරියොසානුපචාරො" යනු මෙ තන්හි අටුවා යැ. එයිනුදු අප ගත් සෙ සට්තෙ වෙයි. ගුරුළුගොමීන් 'ගමන්ශ්‍රම, පුත්‍රසනා' ආදි විසින් මිශ්‍ර කොටස් පදසටනා කෙළෙන් මෙහි දුර්සටයෙක් ද නැති.

අඟුල්දමනයෙහි අගැ "කෙළ දරුවන් කෙළකන්සුණු මහ තෙරුන් අතැවැසි නවසියක් සොරුනුදු" යන මෙ තැනැ දී 'කෙළරුවන් කසුබු' යනුවක් මහානාම සංස්කරණයෙහි එයි. සොරත සංස්කරණයෙහි 'කෙළරුවන් කල' යනුවක් එතුදු, ගැටපදයෙහි ලා 'කෙළකන් සෝණ' යි ගත මනා සෙයට කරුණු කියති. පොත්හි "කෙළරුවන් කල, කෙළරුවන් කෙළ, කෙළරුවන් කසුබු" යන පාඨ වෙන වෙනම දක්නට ඇත. හැම පොතෙකැ ම 'කෙළරුවන්' යනු එක සේ සිටුනේ යැ. එක සේ සිටුනා පාඨය හා 'කෙළ, කසුබු' යන ඉතිරි පාඨ හා පෙළ ගසා සකස් කළ කලැ 'කෙළරුවන් කෙළ කසුබු' යනු සිද්ධ වෙයි.

'මෙහි අගැ 'සුබු' යි සිටුනේ, 'සොණ' ශබ්දයෙහි තද්භවප්‍රකෘති වන 'සුණු, යනුයි. 'කෙළක' යි සිටුනේ, 'කොටිකණ්ණ' ශබ්දයෙන් ආ 'කෙළකන්' යනුයි. 'කෙළරුවන්' යි සිටුනේ, 'කෙළදරුවන්' යනුයි. මෙසේ අකුරු නැස්මෙනුදු පෙරළීමෙනුදු විලුප්ත වැ ගිය පදවැළ සස් කැරැ-ගත් කල්හි **කාලීපුත්‍ර කොටිකණ්ණසොණ** යන සංඥානාමය සිද්ධ වේ. වැකියෙහි කියන සොරමුළ **කොටිකණ්ණසොණ** තෙරණුවන් ගේ බණ අසා ඔබ අතැවැසි වූසෙ අටුවායෙහි වදාරති. සොණමහතෙරහු ශාසනයෙහි සුවිශ්‍රැත මහොපාසිකාවක වන **කාලිය** ගේ පුතණුවෝ යැ. එයින් අපි "කෙළ දරුවන් කෙළකන් සුණු මහ තෙරුන්" යි ශුද්ධියට නඟා-ලූම්හ.

**තාපසදමනයෙහි** "ධම්දෙසුන් නිමි කලැ ඒ ඒ රටැ සිටැ, තව්සන් අනු වැ ආ මිනිස්හු බුදුන් ගෙ ආනුභාවයෙන් තමන් තමන්ගේ ගම් නියම්ගම් ආදියැ පැනුණුහු" යන වැකියෙහි අගැ 'ආදියැ පැනුණුහු' යන තැනැ සොරත සංස්කරණයෙහි 'ආදියට පැමිණුනුහු' යි සිටුනේ යැ. වටාලා තමන් තමන්ගේ ගම් නියම්ගම් ආදියට පැමිණෙනු පිණිසැ බුදුන් ගේ අනුභාවයෙන් කම් නැත. එය නැත ද, ස්වශක්තියෙන් ආ ඔහු හැම ගම් බලා යෙත් මැ යැ. බුදුන්ගේ අනුභාවයෙන් වන දැය පෙළහරක් වුව මැනැවින් 'ගම් නියම්ගම් ආදියැ පැනුණුහු'යි කිව මැනැවැ, 'පැණුනුහු' යන පාඨය කරුණු නොදත් ලියන්න අතින් 'පැමිණුනුහු' යි වැරදි සෙ යෙදිණ. මෙහි මූලපාටය හා සසඳත් මැ, එ වරද හෙළි වෙයි. "නිට්ඨිතාය පන ධම්මදෙසනාය තතො තතො ආගතා මනුස්සා භගවතො ආනුභාවෙන අත්තනො අත්තනො ගාමනිගමාදීස්වෙ'ව පාතුරහෙසුං" යනු අටුවා යැ. මෙහි 'ගාමනි ගමාදීස්වෙ'ව පාතුරහෙසුං' යනු 'ගම් නියම්ගම් ආදියැ පැනුණුහු'යි සියබසින් අනුවාද කොට-ගෙනැ තුබුසෙ සළකන්නේ යැ. එවිට බුදුන්ගේ අනුභාවයෙන් වූ පෙළහර කියැ වෙයි.

**භික්ෂුදමනයෙහි** "කිඹුල්වත් නුවර වැස්සො ද, තොප දින් මැඩුන් කොටගෙන පුරා තුබූ කලැ, ඇපි රත්රන් නිල්මිණි කහවනු ගෙනැ මලු පැස් ගෙනැ තොප ගෙ - දොරැ ඇවිදුනට යමො ද!" යන වැකියෙහි 'දින්' - යනු ශස්‍යමඤ්ජරීන් කියයි. **දම්පියාඅටුවාගැටපදයෙහි** සක්වත්හි "දින් දන ඈ නන් නියරහි" යන මෙහි 'දින් දන' යනු ශස්‍යාන් කැපීම කියන තැනෙකි. එහි 'දින්' යි යෙදුණේ, ශස්‍යයන් කියනු

පිණිසයි. 'මැඩුන්' - යනු මැඩැ රැස් කළ වී කියයි. 'කොටගෙ යනු කුශලය කියයි.' "තුම්හෙසු කෙට්ඨෙ පූරෙත්වා ඨිතෙසු" යනු මෙහි මූලපාඨයි. 'කොට්ඨෙ පූරෙත්වා' යනු 'කොටගෙ පුරා' යි සියබසින් ගුරුළුගොමීහු අනුවාද කළහ. සොරත සංස්කරණයෙහි ලා 'දින් මැඩුන්' යනු කැපුම් පැගුම් දැක්වීමෙකි. 'කොටගෙ යනු පෙර කිරියක් හා ගෙයක් වෙන වෙන ගැනීමෙකි.

භික්ෂුදමනයෙහි "යම් කෙනෙක් නිවහලු වැ තිරිසන් ගතියැ සතුන් සෙයින් බුදුරු රුක්හි වුසුහු ද" යන වැකියෙහි එන 'බුදුරු රුක්හි' යනු 'බුහුරු රුක්හි' යි ලියති. සොරත සංස්කරණයෙහි දු එ ලෙස මැ එයි. 'බුහුරු' යනු සිදුරෙහි වැටෙයි. 'බුදුරු රුක්' කිය, සිදුරු ඇති ගස් මිසැ වෘක්ෂ විශෙෂයක් නොගත හෙන්නේ යැ. එයින් මෙ තන්හි තුබුව මනා විශෙෂවෘක්ෂ' වන 'කොලිවෘක්ෂ' වෙන් වැ නොසිටුනේ වෙයි. 'කොලිය' යන නම 'කොලි' නම් වෘක්ෂ විශෙෂය පිණිසැ කියත් මිසැ සිදුරු ගස් නිසා නො කියයි. දම්පියාඅටුවාගැටපදයෙහි 'සාකිය කොලිය' වත්හි ලා "කොලරුක්බෙ, කළරුක්හි" යි කී බව මුත් 'බුහුරුරුක්හි' යි නොකී සැටි දු විමසන්නේ යැ. මෙ හැම බලත් මැ, 'කොලරුක්බෙ' යන අටුවාපාඨය ගෙනැ 'බුහුරුරුක්හි' යි අනුවාද කළහයි නොපිළි ගත හැකි යැ. කොලිවෘක්ෂ කියන නම් වැළෙහි 'බදරී' යනුදු ඇත. එය 'බුදුරු' යි සියබසැ සිටී. එයින් "තිරිසන් ගතියැ සතුන් සෙයින් බුදුරු රුක්හි වුසුහු ද" යනු ශුද්ධ ලෙස සළකම්හ. අප සොයා-ගත් පොත් අතුරෙන් ඉපැරැණි පොතෙකැ 'බුදුරු' යනු දක්නට ලැබිණ.

භික්ෂුදමනයෙහි "පැදුන් සක්වළ මුවවිටියෙහි බට බඹ, නීලකිසුණු සමවත් සමවැද නිල්රැස් විහිදැ, දහදහස් සක්වළැ ඉඳුනිල්මිණි කවජ පොරොවන්නක්හු සෙයින් තමා ආ පරිදි දන්වා, බුද්ධවීථියැ කිසි කෙනකුන් සිටුනට නොපොහොසත් බැවින් පාළ මහත් බුද්ධවීථීන් අවුදු, පැදුන් සක්වළ මුවවිටියෙහි මැ ගොස් සිටියෙ යැ." යන වැකියෙහි 'පාළ මහත් බුද්ධවීථීන්' යන පදවැළ 'පාළ මඟක් බඳු විථීන්' යනුවෙන් පොත්හි ඇත.

තෙල කථායෙහි දී බඹහු සතර දෙනෙක් සතර දිගින් අවුදු බුදුන් සඟුන් ගුණ වනා වටා ලා පසු බැස, සිටි තැන්හි මැ සිටියහ. දකුණු පැල උතුරු නන් දිගින් ආ බඹහු බුද්ධවීථීන් ආ සැටි අමාවතුරෙහි මැ කියති. බුද්ධවීථීයැ කිසි කෙනෙක් සිටුනට නොපොහොසත් වෙති. එයින් මැ එ නිරාකුල යැ. එහි සිටිය, එ වීථිය ආකුලව්‍යාකුල වැ ගමනාගමනසම්පන්න නො වෙයි. හැම තැන දෙවියන් විසින් පරිපූර්ණ වූයෙන් යා හෙන මඟෙක් බුද්ධවීථිය මිසැ නැත. එයින් ප්‍රකට-විශද මහත් බුද්ධවීථීන් ආසෙ 'පාළ මහත් බුද්ධවීථීන් අවුදු' යනුවෙන් පැවැසිණ. "බුද්ධවීථි නාම කෙනචි ඔත්ථරිතුං න සක්කා. තස්මා මහතියා'ච බුද්ධවීථියා ආගන්ත්වා" යනු මෙහි මූලය වන 'සංයුක්තනිකායාර්ථකථා' වෙයි. 'මහතියා බුද්ධවීථියා' යන පද ගෙනැ ලියූ 'මහත් බුද්ධවීතින්' යන පාඨය ලිපිදොසින් අවුල් වැ 'මඟක් බඳු වීථීන්, යන සැටියෙන් පුස්කොළපොත්හි ඇත. මහානාම-සොරත සංස්කරණ දෙක්හි මැ 'මඟක් බඳු වීථීන්' යන ඒ දෝෂය එයි.

දෙවදමනයෙහි "සක්දෙව්රජහු මිනිස් පියෙහි වසන කලැ යන එන ගමනින් වැදැ වසන හලක් කරවා දුන් පින්කැමින් නිපන්නෙයි" යන වැකියෙහි 'ගමනින්' යනු බැහැර කොට එ පිණිසැ 'මඟින්' යන රූපය කිසි පොතෙකැ එයි. 'ගමනින්' යනු

වැරැදිසෙ සිතු ලියන්නන් එසෙ කළහයි සිතම්හ. මෙහි දී කෙනෙක් වැරදි සෙ එහි අර්ථ කීහු:

"යන එන ගමනින් වැදැ වසන හලක්-යන එන ගමන්වලින් වැළකී පිවිස වාසය කරන ශාලාවක්; 'ගමනින්' යනු අවධි විභක්ත්‍යන්ත පදයෙකි. මෙය උපාත්තවිෂය (අධ්‍යාහාර කරන ලද ක්‍රියාව විෂය කොට ඇති) අවධියි. ........කිසි අවධියෙක් අධ්‍යාහාර කරන ලද ක්‍රියාව විෂය කොට පවතී. 'වලාකුළින් විදුලිය බබළයි' යන තන්හි මෙනි. 'වලාකුළින්' යන අවධිය 'නික්ම' යන අධ්‍යාහාර ක්‍රියාව විෂය කොට පවතී. 'ගමනින් වැඳ යනු ද මෙසේ මැයි."

ඔවුන් කළ තෙල පරිකථායෙන් 'ගමනින්' යන පදය ගෙනැ අර්ථ පරිකල්පනා කළ අයුරු විශද වතුදු, එ අප සිත් නො ගන්නේ යැ. **දම්පියාඅටුවා ගැටපදයෙහි** "ගම්කස්ස; ගමනී හට" යනුදු (232 පිට) "පදගාමෙහි: පයෙළියෙහි ගැමනින්" යනුදු (176 පිට) **ජාතක අටුවා ගැටපදයෙහි** "අද්ධික මනුස්සො, ගමනී මිනිසෙක්" යනුදු (232 පිට) **සිඛවළඳවිනිසෙහි** "ගමනීවැ සඟවනු ආදි නො කොට උවසර හිමි එක් පසෙකින් ඉක්මෙ නම්" යනුදු (48 පිට) **ධම්මපදපුරාණසන්නයෙහි** 'පණ්ඩුපලාසො 'ව' යනාදි ගාථාවට ලියූ ගමනි මිනිසුන් ගෙ පූපාපූප ලුණු පුලුපු සාල් බත් ආදී මාර්ගෝපකරණ මෙන්" යනු ඇයි මෙ ආදි ඡෙකප්‍රයොග ගනුත් මැ, සියබසෙහි 'ගමනී' සදින් යන එන මැඟින් කියනසෙ පෙනේ. ගමන්හි යෙදෙනුයෙ 'ගැමනී' නම් වෙයි. එයින් යන එන මාර්ගිකයනට වැඳැ වසන හලක් කැරැලූ බව අමාවතුරු පාඨයෙන් සළකන්නේ යැ.

**දෙවදමනයෙහි** "සක්දෙව්රජහුගෙ පරිචාරිකාවො මහතෙරුන් දැකැ සුහුරක්හු දුටුව, ණියක සෙයින් විළී ඇති වැ, තමන් තමන්ගෙ අපවර කයට වැදැ දොර අඩවළ කොටැ බලා සිටියො" යන වැකියෙහි 'සුහුරක් දුටු බෑනියක සෙයින්' යනු සොරතසංස්කරණ යි.

"බෑනියක - යෙහෙළියක, ලේලියක; 'බෑන' 'භාගිනෙය්‍ය' ශබ්දයෙන් බිඳුනේය. 'භගිනිය' (-සහෝදරිය) ගේ දරුවා' යන අර්ථයි. සහෝදරිය ගේ දුව බෑනි (-ලේලි) යි. සහෝදරිය ගේ දරුවා නුවුව ද, දූවගේ හිමියාට ද 'බෑන' සද ව්‍යවහාර කරනු ලැබේ. එහෙයින් සහෝදරිය ගේ දුවක නුවුව ද පුතාගේ බිරින්දට ද 'බෑනි' යි සුහුරා විසින් කිය හැකි වේ. ලේලියට 'බෑනි' යි යෙදූ අන් තැනක නො දැක්කෙමු." යනු සොරත සංස්කරණයෙහි ගැටපද යන්නයි.

මහානාම සංස්කරණයෙහි "සුහුරක්හු දුටු බෑනියන් සෙයින්" යනු එයි. "සුහුරක්හු දුටු මණියක් සෙයින්, සුහුරක්හු දුටු වණියක්හු සෙයින්, සුහුරක්හු දුටු මැණියන් සෙයින්" මෙ ආදි පාඨ ද පොත්හි ඇත. මෙ අනුවාදයෙහි මුලය සූත්‍රපර්යාප්න පාඨයෙකි. "අද්දසාසුං ඛො සක්කස්ස දෙවානමින්දස්ස පරිචාරිකායො ආයස්මන්තං මහා මොග්ගල්ලානං දූරතො'ච ආගච්ඡන්තං. දිස්වාන ඔත්තප්මානා හිරියමානා සකං සකං ඔවරකං පවිසිංසු. සෙය්‍යථාපිනාම සුණිසා සසුරං දිස්වා" යනු "සුහුරක්හු දුටුව, ණියක සෙයින්" කියා සිය බසින් අනුවාද කළහ. පොත්හි එන 'වණියක්හු' යන පදයෙහි 'ව' - කාරය නම්, 'දුටුව' - යන පදයෙහි අග සිටිය මනා 'ව' - කාරය වෙයි. ලියන්නන් එය 'ණියක්' යන පදය හා ළං කැරැ ලියුයෙන් 'වණියක්' යනු සිද්ධ වී යැ. පසු වැ එය 'මණියක්, 'මැණියක්, මැණියන්' යි නොඑක් ලෙසින් පෙරළිණ. දම්පියාඅටුවා

ගැටපදයෙහි විශාඛා උපාසිකා වත්හි "සණිසාය, ණියන් ගෙ" යනුදු බ්‍රාහ්මණපුත්ත වස්තුයෙහි "සුණිසා, ණිහි" යනුදු විඩූඩභයා ගෙ වත්හි "ද්වත්තිංස සුණිසා. දෙතිස් ණින්" යනුදු කුක්කුටමිත්ත වස්තුයෙහි "සසුණිසං, ණීන් හා සමඟ" යනු දැයි ජෙකපාඨ දක්නට ඇතියෙන් පාළියෙහි වදාළ 'සුණිසා, යන පදය 'ණියක' යි ගත්සෙ විශද වැ පෙනේ. එයින් නිරවුල් කොටැ ලේලිය පැවැසෙ. 'බෑණි' යනු කපොලකල්පිත වත් මුත් පොත්හි නැත.

බ්‍රහ්මදමනයෙහි "මරහු ගරහා බඹුන් ගරහා" යන පාඨය "බඹපුත් ගරහා බඹුන් ගරහා" යන සැටියෙන් සොරත සංස්කරණයෙහි යෙදිණ. මහානාම සංස්කරණයෙහි දු එ සැටි මැ එයි. පොත්හි 'බඹහු' යනු මිසැ 'බඹපුත්' යනු නැත. එක් මැ වැකියෙහි බඹුන් වුව මැනැවැයි දෙ තැනෙකැ නො වුව මැනැවින් එක් තැනක් 'බඹපුත් වුව මැනැවැයි සිතුවන් කළ පෙරැළීමෙකි. "පජාපතිගරහකා" යනු මෙහි පෙළයි. පජාපතිහු කෙරෙන් බ්‍රහ්මයා වෙන් කොටැ - ගෙනැ මූලපරියාය සූත්‍රයෙහි දු වදාළහ. "මාරො පජාපති" යනු එහි අටුවායි. එයින් අපි පොත්හි එන 'බඹහු' යනුත්, ඒ ඒ සංස්කරණයෙහි හෙළා ගත් 'බඹපුත්' යනුත් බැහැරැ කොට 'මරහු' යනු යෙදුම්හ. මුලැ දී සිටි 'මරහු' යන්න කල් යත් යත්, ලියන්නන් විසින් 'බඹහු' යි පෙරැළිණි. පසු වැ ඒ ඒ ශෝධකයන් විසින් 'බඹපුත්' යි පෙරැළිණි. පෙළ ගෙනැ පරීක්ෂා කරත්, තෙල පෙරැළිය කළසෙ පෙනේ.

බ්‍රහ්මදමනයෙහි "උහු දැකැ බඹහු 'මෙ බකබ්‍රහ්ම විමන්හි හැලෙයි, කප්රුක්හි හැලෙයි, උළුලයෙන් හිඳි. තො 'අතුරුධන් වීම්' යි සිතුයෙහි'යි පරිහාස කළහැ. හෙ බඹුන් විසින් පරිහාස කරන ලද්දෙ දළ බුන් සපක්හු සෙ තෙජ නැති වී යැ" යන වැකියෙහි බඹුන් කළ කී දැ බුදුන් කළ කී දැ ලෙස සොරත-මහානාම සංස්කරණ දෙක්හි මැ එයි. දීර්ඝ කාලයෙකැ සිට පුස්කොළ පොත්හි එන ඒ මහ වරද එ ලෙස මැ ගන්නේ, ශොධනයෙක් නොවේ. එයින් අපි අටුවාපාඨ බලා යථාභූතාර්ථය දක්වා ලුම්හ.

මෙහි සඳහන් කළ තැන් තබා මතු කියන තැනුදු විමසන්නේ යැ. අන්‍යයන් ගේ සංස්කරණයෙහි එන පාඨ පළමු වැ දක්වා අප ගේ සංස්කරණයෙහි එන පාඨ දෙවනු වැ මෙහි කළු අකුරින් දක්වම්හ:

"මහදොර" යනු **පහාදෙර** (11 පිට) "**ලොධාහි එක්හෙළි වියැ**" යනු ලොධා එක් හෙළි වියැ (13 පිට) "**පස් පියුමෙන් සැදී, සත්රුවැන් මුවා පොකුණෙහි**" යනු පස්පියුමෙන් සත් රුවන්මුවා පොකුණෙහි (16 පිට) "ජව ඇත්තෙ යැ" යනු **ජව ඇත්තෙ යැ, සව්සුදු** (18 පිට) "අට සැට දහසක්" යනු **අටසැට සුවහසක්** (20 පිට) "උලෙල වී" යනු ඇළල වී (21 පිට) "නව යොදුන්" යනු **උසායෙහි නව යොදුන්** (27 පිට) "**දහදහසක් යොජනෙහි පටන් ගෙන**" යනු දහසක් යොදුනෙහි පටන් ගෙන (27 පිට) "විදුව" යනු බඳුව (27 පිට) "බුදුනට මෙම සෙනස්න නිසි ය" යනු බුදුනට **නිසි සෙනස්නැ** (39 පිට) "ළදරුවන් හා ළදැරියන්" යනු **ළඳරු ළඳරු දරුවන් හා දූරියන්** (42 පිට) "හැදවුව" යනු **හැදහුවාට** (48 පිට) "දෙවියන් හළ දොරින්" යනු **දෙවියන් වළ දෙරින්** (48 පිට) "ඇතක්හු සෙයින්" යනු **සෙ-ඇතක්හු සෙයින්** (55 පිට) "බුදුන් දුටු කලැ ම පහන්නාහු දු වඳිත්මැ යැ. නොපහන්නා හුදු බොහෝ සේ වඳිත් මැ යැ. වඳනාහු කවර කරුණෙන? යත්" යනු **බුදුන් දුටු කලැ මැ පහන්නාහු දු නොපහන්නාහු ද බොහොසෙ වඳිත් මැ යැ. නොවඳනාහු ඇලුප්හ** (56 පිට) "ප්‍රසන්න විසිතුරු ව්‍යාකරණ" යනු **විසිතුරු ප්‍රශ්න ව්‍යාකරණ** (59 පිට) "මුදුනෙහි දිය එව" යනු මුව සලා මුදුනෙහි දිය

එවැ (61 පිට) "**වරදෙක් නම් නොවේ කැමවූ තැනින් මත්තෙ සෙත්ම වෙයි**" යනු **වරදෙක් නම්, හෙ වැඳූ කැමවු තැනින් මත්තෙ, සෙත් මැ වෙයි** (64 පිට) "ගච්ඡයො නම් වලැ වෙති" යනු **ගච්ඡයො නම් වනළැ වැ වෙති** (74 පිට) "එ බත් වළඥ කරන්නාහු කන්නාහු බොන්නාහු හෝ වෙති" යනු **එ බත් වළඥන්නාහු බොන්නාහු යම් තැනෙක්හි ලැබෙති.** (80 පිට) "හවත්හු ගෙ" යනු **හගවත්හු ගෙ** (87 පිට) "මම් මුල ම කීම්" යනු **මම් මුහු වැළැකීම්** (90 පිට) "පහය වටා සත්පවුරු සත් දොරටු යැ" යනු **පහය වටා පවුරු, සත් දෙරොට්යැ,** (90 පිට) "එළුදරුමැඩවුන්" යනු **ළඥරු මැඩවුන්** (95 පිට) "සුවාසුදහස් සුවාසුදහස් පමණ දෙව්මිනිස්හු දූ" යනු **සුවසුදහස්සත්හු දූ අපමණ දෙව් මිනිස්හු දූ** (98 පිට) "සැරියුත් මහමුගල් මහසුබ් ඈ මහණ බමුණො" යනු **සැරියුත් මහමුගලන් මහසුබ් ඈ බමුණො** (98 පිට) "ඇතැම්හු පැන පුළුවුස්නට ගොස් තමන් විසජන්නට පැන නොපොහොසත්සෙ සිතා නො පිළිවිස නො බැණ හිඳිති" යනු **ඇතැම්හු පැන පුළුවුස්නට ගොස් තමන් පැන විසජුන් පිළිගන්නට නොපොහොසත්සෙ සිතා නො පිළිවිස මැ නො බැණැ හිඳිති** (98 පිට) "වුසුසෙ" යනු **ඉවැසුසෙ** (100 පිට) "යානයක්" යනු **යානයන්** (120 පිට) "අනෙක් අශ්වායන රථයාන ඇත ද" යනු **අනෙක අශ්වයාන රථයාන ඇත ද** (120 පිට) "ජීවකය, මා නො නස්හි ඈ යි" යනු **ජීවකය මා නො නස අභය දෙයි** (123 පිට) "හන් සළු පෙළා පියන පමණ විය" යනු **සළු පෙරළා පියන පමණ වියැ** (123 පිට) "පෙරට මොහු" යනු **පෙරටහු** (124 පිට) "දොස් දෙති" යනු **දෙස් දෙසති** (126 පිට) "ගර්ග" යනු **හර්ග** (130 පිට) "ශිල්පසංහාරයට" යනු **ශිල්ප සමහරයට** (131 පිට) "වෙදහම්" යනු **වෙද්දම්** (140 පිට) "ඒ ඒ කුලගෙහි" යනු **එකෙකිකුලගෙහි** (145 පිට) "සමාහාරයෙහි" යනු **සමහරයෙහි** (148 පිට) "නුවරැ හුන්නා වූ නොමඳ මිනිස්සු නික්මුනහ" යනු **නුවරැ හුන්නවුන් මැදූ වැ මිනිස්හු නික්මුණහ** (157 පිට) "පස්කෙළි කෙලිමින්" යනු **පස් කෙළිමින්** (158 පිට) "වෙදනාවත් වැ" යනු **වෙදනා මහත් වැ** (165 පිට) "සතුරහු වණන්නෙ තමා මැ හුවා ද" යනු **සතුරා හුවන්නෙ තමා මැ හුවා ද** (170 පිට) "වහන්සේ වහන්සේ පියා යෙමි" යනු **වහන්සෙ පියායෙමි** (173 පිට) "සුනක්ඛත්තය, විශාලා නුවරැ මොහු පෙර තුණුරුවන්හි ගුණ කියන කලැ මුව නො පොහොයි." යනු **සුනක්ඛත්තයා විසාලා නුවරැ වැද පෙරැ තුණුරුවන්හි ගුණ කියන කලැ මුව නො පොහොයි.** (174 පිට) "රහමස්මුත් බත්" යනු **රහමස් මිසැ, බත්** (179 පිට) "උත්තමපුරුෂයන් හා වාදයට නොනිස්ස හට දූ ප්‍රශංසා වේ" යනු **උත්තම පුරුෂයන් හා වාද කොට නොනිස්ස හට දූ ප්‍රශංසා වෙ** (181 පිට) "අරම්පසතැ" යනු **අරම්පසනැ** (184 පිට) "අඳුබඳනෙක්හි" යනු **අඳුබානෙක්හි** (184 පිට) "පාථිකපුත්‍රයා ගේ සමාගමයට රැස් වූ නුවටනුදු, ආදි ශබ්දයෙන් ගත් නුවටනුදු නුවටලද ගත් නොයෙක් දහස්නුදු" යනු **පාථිකපුත්‍රයාගෙ සමාගමයට රැස් වූ ආදි ශබ්දයෙන් ගත් නුවටනුදු, එවුන් ලද ගත් නොඑක් දහස්නුදු** (188 පිට) "අතැවැසි දහසත් හා සමඟ" යනු **අතැවැසි දහසුන් හා සමඟ** (207 පිට) "අතැවැසි දහස" යනු **අතැවැසි දහස්හු** (211 පිට) "වැඳැ වැඳැ වෙසෙමි" යනු **වැඳූ වෙසෙමි** (212 පිට) "රජවරොධිහු" යනු **රැජනවරහු** (216 පිට) "පන්සියෝ ම වන බැස" යනු **පන්සියො මහවන බැසැ** (219 පිට) "සයානුදහසක් කෙළපටනෙහි" යනු **සයානු ලක්ෂයක් කෙළපටනෙහි** (221 පිට) "තෙපණස් රුවන් ආකරයෙහි දූ" යනු **බත් සැළකුදු** (240 පිට) "සිතිවිලි නැති වැ" යනු **සිතිවිලි නැති ව.** (241 පිට) "ආකුල පාකුල කොළො" යනු **ව්‍යාකූල පහළ කොළො** (248 පිට) "තො මහණදම්හි සිටියේ විහි නම්" යනු **තො මහණදම්හි සිටිහි විහි නම්** (249 පිට) "ගිවිස ගෙන් නික්මුණහ" යනු **ගිවිසැ-ගෙනැ නික්මුණුහු** (249 පිට) "ලප්පෙකැ" යනු **ලප්පකැ** (250 පිට) "පලුපහණෙකැ" යනු **වලපහණෙකැ** (266 පිට) "සුධම් දෙව්සභාවට" යනු **සුධම් දෙව්සහයට** (267 පිට) "දහගබ් මහබෝ" යනු **දහ මහබො**

(271 පිට) "පුළුවුත්හ" යනු **පුළුවුත් කලැ** (280 පිට) "තොප දිලියෙන ආනුභාව ඇත්තේ යැ; සියලු බඹලෝ බබුළුවමින් සිටියේ යැ" යනු **තොප දිලියෙන අනුභාව සියලු බඹලො බුබුළුවමින් සිටියෙ යැ.** (302 පිට) "බුදුන් විසින් පරිහාස කරන ලද්දේ" යනු **බඹුන් විසින් පරිහාස කරන ලද්දෙ** (303 පිට) "දහසක් බඹහු රාත්වූහු" යනු **දස දහසක් බඹහු රාත්වුහු** (303 පිට).

"දස දහසක් සක්වළැ දියරට් නම් දස දහසක් වරම් රජහු ඇති. ඔහු හැමදෙන කෙළසුවහස් කෙළසුවහස් ගඳැවි දෙවියන් පිරිවරා අවුදු පැදුන් දෙසෙහි මෙ වනයෙහි පටන් ගෙන සක්වළගබ පිරී සිටියාහ" (226 පිට) මෙහි මූලපාඨය නම්: "දසසහස්සෙ චක්කවාළෙ ධතරට්ඨා නාම මහා රාජානො අත්ථි. තෙ සබ්බෙ'පි කොටිසතසහස්ස කොටිසතසහස්සගන්ධබ්බපරිවාරා ආගන්ත්‍වා පුරත්ථිමාස දිසාය කපිලවත්ථු මහාවනතො පට්ඨාය චක්කවාළගබ්භං පූරෙතවා ඨිතා" යනුයි. මූලපාඨය හා අනුවාදය හා සසඳත් මැ, "මෙ වනයෙහි" - යනු 'මහවනයෙහි' කියා තුබුව මනාසෙ පෙනේ. 'මෙ වනයෙහි' - යනු සතර පස් පළෙකැ ළං ළං වැ ඇත ද, එහි අර්ථයක් කියැ හැකි වුව ද, 'මහවනයෙිහ' යනු උචිත පද බව අටුවායෙන් විශද වෙයි. 'මහවන' යන්න 'හ' - කාරයා ගිළිහීමෙන් ම වන'යි තුබුවා දැකැ ලියන්නන් 'මෙවන' - කියා සකස් කළහයි සිතම්හ.

අමාවතුරෙහි මුල් පිටුයෙහි අධොලිපි කළ "මෙ වන" - යන්න ද හැම පොත්හි මැ එයි. එ ද 'මහවන' - කියා සකස් කරත් මැ, උචිතපදයෙක් මැ වේ. අමාවතුරෙහි සංස්කරණය කරමින් අප කළ පදශුද්ධි හා වාක්‍යශුද්ධි හැම මෙහි නො දැක්වූම්හ. ඒ ඒ උගතුන් පළ කළ අමාවතුරු හා මේ පොත සසඳා ලීමෙන් මෙහි එන වෙනස දත හැකි වෙයි. සංස්කරණය කළ යුතු වුව ද, එසේ නොකළ නෙ තැනුදු මෙහි ඇත. මේ යැ, නිදර්ශනයෙක් නම්;

"දියරට් නම් ගඳෙවු දෙව්රජ කෙළසුවහසක් ගඳෙවු දෙවියන් පිරිවරා කෙළසුවහසක් රන් පලග හා රන් අඩයටි හා ගෙන්වා - ගෙනැ පැදුන් දිසායෙහි පැල දිසා බලා දෙ දෙව්ලොවැ දෙවියන් පෙරට කොටැ අරක් ගෙනැ හිඳී" (269 පි:)

මේ අනුවාදයෙහි මූලපාටය නම්: "ධතරට්ඨො ගන්ධබ්බරාජා ගන්ධබ්බදෙවතානං කොටිසතසහස්සෙන පරිවුතො කොටිසතසහස්ස සුවණ්ණමයඵලකානි ච සුවණ්ණසත්තියො ච ගාහාපෙත්වා පුරත්ථි මාය දිසාය පච්ඡිමාභිමුඛො ද්වීසු දෙවලොකෙසු දෙවතා පුරතො කත්වා නිසින්නො" යනු යි.

ගුරුළුගොමීහු සතරවරමුන් සුධම්මදෙව්සභය අරක් ගන්නා සැටි කියමින් 'මහගොවින්ද සූත්‍ර වර්ණනා' යෙහි එන පාඨය සියබසින් අරවා තැබූහ. එයින් එය අටුවාකථා හා සැසඳේ. සක්දෙව් රජහු ගේ උයන්කෙළි කියමින්-

"දියරට් නම් වරම් මහරජ පැදුන්සක්වළ මුවවිටියෙහි තමා ගෙ සෙනඟ එවැ, රිදීමුවා අසිපතර ඉසුලු කෙළසුවහසක් ගඳෙවු දෙව්බළන් ගෙනැ වටා ලූ කෙළසුවහසක් රිදි දඬුවැට ඇතියා වැ සුදුබරණින් සැදී සුදු දිව අස්රජක්හු නැගී යුගඳුරු ගල් මුදුනෙහි පැදුන්දෙසෙන් අරක් ගන්නි" (271 පි:) යනු කියති. මේ අනුවාදයෙහි මූලපාඨය නම්:

“ධතරට්ඨො නාම මහාරාජා පාචීන චක්කවාළමුඛවට්ටියං අත්තනො සෙනඞ්ගෙන සද්ධිං ඔතරිත්වා රජතමය අසිපත්තධාරිකොටිසත සහස්සගන්ධබ්බගණෙහි සද්ධිං කොටිසතසහස්සරජතදණ්ඩදීපපරිවුතො සබ්බාලඞ්කාරසමලංකතං සුදෙවං නාම රජතවණ්ණතුරගචර මාරුය්හ යුගන්ධගිරිවරසිඛරෙ පාචීනදිසායං ආරක්ඛං ගණ්හාති” යනුයි. (ජිනාලංකාරවණ්ණනා)

දෙවදමන නම් සතළොස් වන පරිච්ඡේදයෙහි දී ගුරුළුගොමීන් සක්දෙවු රජු ගේ දෙව්සභය වනමින් සතර වරමුන්ගේ පැහැ සටහන් ආදිය පිණිසැ පළමු කී බස් හා එහි මැ උයන්කෙළි වනමින් කියන බස් හා නො ගැළපෙයි. 269, 271 පිටු සසඳා බලත් මැ, ඒ නොගැළපෙන සැටිය ප්‍රකට වන්නේ යැ. එතැනින් මෙතැනින් ගත් දඬු කඩ ගළපා කළ හෙයින් සෙයින් ‘දෙවදමන පරිච්ඡෙද’ ය එතැනින් මෙතැනින් ගත් අනුවාදපාඨ ගළපාලීමෙන් ගෙතූ ගෙතිලි යැ. එයින් එකිනෙක නොගැළපෙනසෙ පෙනෙතුදු, ඒ අනුවාද නිරාශ්‍රය නොවේ. එයින් මැ අන් සැටියෙකින් සංස්කරණය කරන්නට නොද හැකි වෙයි. ජිනාලංකාර වර්ණනායෙහි එන විස්තරය කොතැනින් ගත් දැයෙක් වේ දැයි නො දනුම්හ. අමාවතුරෙහි කියන ‘සක්දෙව් උයන්කෙළි’ ය පිණිසැ ජිනාලංකාර වර්ණනාව ආශ්‍රයස්ථාන කොට කියනු විනා දැක්වියැ හෙන අන් ග්‍රන්ථයෙක් ද මෙතෙක් නො ලැබිණ. පොළොන්නරු අවධිය තුන්නිකා සමගි කළ කාලය වේ. අභයගිරිවිහාරවාසීහු එ කලැ සිටියහ. ඔවුන් ගේ ග්‍රන්ථයෙකින් ගත් විස්තර ජිනාලංකාර වර්ණනායෙහි ලා ආ වනැයි සිතියැ හැකි යැ. සංවර්ණනා පිණිසැ නිකායාන්තර වාසනීගේ පත පොත ප්‍රමාණ කොට ගැනුම මහවෙහෙර වැසියනට ද අභිමත වේ. විනය අටුවාවෙහි දී **වණ්ණපට්ඨානය** බලා උගත මනා දැයක් සඳහන් කෙරෙති. ඒ ග්‍රන්ථය විරුද්ධ නිකායෙක ග්‍රන්ථයක් බව **සාරත්ථදීපනියෙහි** දැක්විණ. **අපදානයට** විරුද්ධ මත ඇතියෙනුදු **කථාවස්තුයෙහි** දී ‘සමයවිරුද්ධයහි’ යි ප්‍රතික්ෂේප කළ දැය ඇතුළත් කොට ඇතියෙනුදු අර්ථ කථා මාර්ගයට වෙනස් ලෙස කියන දැය ඇතියෙනුදු **මිලින්දප්‍රශ්නය** මහාවිහාරවාසීන් ගේ ග්‍රන්ථයෙක් නො වේ. එසේ ද වත්, **බුද්ධඝොසාචාර්යයෝ** ද පවා පෙළට අවිරුද්ධ බස් **මිලින්ද ප්‍රශ්නයෙන්** ගෙනැ ‘අටුවා’ යෙහි දී ප්‍රමාණ පාඨ සේ දක්වති. අමාවතුරෙහි එන සක්දෙව් රජු ගේ ‘උයන්කෙළි වැනුම’ නිකායාන්තරවාසීන් ගේ සංවර්ණනා වියැ හෙයි. එය ජිනාලංකාර වර්ණනායෙන් හෝ අන් ග්‍රන්ථයෙකින් හෝ ගෙනැ මෙහි ලා අනුවාද කළහයි සිතම්හ. ජිනාලංකාර වර්ණනා පාඨ හා බෙහෙවින් සැසැඳෙනුයෙන් එය ඇසිරි කොට කළ ‘අනුවාද’ යෙකැයි නිශ්චය කරනු නිසි වෙයි. මේ හෙතුවින් ගුරුළුගොමීන් කියන ‘උයන්කෙළිබස්’ හි ඇතැම් දැය අටුවායෙහි ඇත ද, නැත ද එයින් කිම? අනුවාදය පිණිසැ ගත් මූලපාඨයන් ගේ භෙදය නිසා වෙනසක් පෙනෙතුදු එහි ලා කළ හැකි දැයෙක් නැත.

‘සීල’ ආදි ශබ්ද සකුවහර අනු වැ ‘දිශා-ශීල’ යි තාලව්‍යශකාරයෙන් ලියනු උගතුන් හසළ සිරිත් වුව ද, මෙහි කිසි තැනෙකැ පෙළවහර අනු වැ යෙදිණ. සකුවහර අනුවත් පෙළවහර අනුවත් එබඳු ශබ්ද යොදා-ලුසෙ පෙනෙනුයෙන් අපි එය එක් සැටියෙකින් තුබුව මනාසෙ නො සැලැකුම්හ. පාළි වචන ද පවා මෙහි නොඑක් තැනැ ඇතියෙන් පෙළවහර අනු වැ ‘දිසා-සීල’ ආදි ශබ්ද යෙදුමෙහි දූර්සටයෙක් ද නො පෙනේ. හුදුහෙළුවට වෙන් වැ සිටුනා වර්ණමාලයෙන් සකුවදන් ලියා-ගෙනැ සියබස් බවට ගත්සෙ තොටගමුසෙ ශ්‍රී රාහුල මාහිමියන් ආදීන්ගේ පද්‍ය රචනායෙහි දු පෙනේ.

'එසෙ, මෙසෙ, බමණො, මහසල්කුලො' ආදි පදයෙහි 'එ, ඔ වර්ණයන් ගේ හ්‍රස්වරූපය මැ මෙහි හැම තැනැ යොදා-ලුම්හ. පැරැණි හැම පොතෙකැ ඒ සැටිය දක්නට ඇති හෙයින් අපි ඒ වර්ණ දික් සටහන් ලා දික් නො කළම්හ.

'සිරුරු, සිරිරු, සිරිරි' යන පද තුන මැ නිර්දොෂ වෙයි. අප ගේ සංස්කරණයෙහි දී ප්‍රධාන වශයෙන් තබා ගත් පුස්කොල පොතෙහි එන පදය පිළිගෙනැ ඉතිරි පොත්හි එන පද අධොලිපි වශයෙන් දක්වා ලූම්හ. අධොලිපි කළ පමණෙකින් 'එහැම අපපාඨයහ' යි නො සළකන්නේ යැ. එබඳු බොහෝ පාඨ ඇති බව මෙහිලා සඳහන් කිරීම යුතු වෙයි.

'න ණ ල ළ' - අකුරු පැරැණි පොත්හි එන සැටි බලා සේ නිසි සේ යෙදුම්හ. සකුයෙහි අක්‍ෂර වින්‍යාසය පිණිසැ බොහෝ ව්‍යවස්ථා ඇත. ඒ ව්‍යවස්ථා නො දැනැ සකුයෙහි වචන ලියන්නට ගියහොත් දෝෂ සිදුවන තැන් බෙහෙවි. පාළියෙහි දු අක්‍ෂර වින්‍යාසය පිණිසැ ව්‍යවස්ථා ඇත. ශාස්ත්‍රානුකූල අක්‍ෂර වින්‍යාසය ඇති මාතෘ භාෂා ඇසිරි කොට සිටුනා සියබසෙහි දු අකුරු පිළිබඳ නීති රීති තුබුව මනා මැ වෙයි. සියබසෙහි 'නණලළ' අකුරු පිළිබඳ නීති රීති තුබුව මනා මැ වෙයි. සියබසෙහි 'නණලළ' අකුරු පිළිබඳ වැ වාදවිවාද ඇත ද, දැන් රට හැම තැනැ එහි ශාස්ත්‍රීය ක්‍රමය පැතිරැ සිටුනේ යැ. අප ගේ සංස්කරණයෙහි එන අක්‍ෂර වින්‍යාසය ශ්‍රී ධර්මාරාම මාහිමියන් පහදා දුන් අක්‍ෂර වින්‍යාසය වෙයි. ඔබ පහදා - ලූ පමණෙකින් ඇපි නො ලියම්හ. පුස්කොළ පොත් බලන විට උන් වහන්සේ ගේ විනිශ්චය පිළිගත මනාසෙ අපට ද පෙනේ. සියබසෙහි අක්‍ෂර වින්‍යාසය සොයනුවනට 'සීගිරි පැදිවැළ' අගනා දැයෙකි. එදා ලියු ලෙස මැ අද ද පවා ඇත. අව්‍යක්ත ලේඛකයන් ගේ වරදින් කලින් කලැ වෙනස් වැ ගියහයි නොකියැ හෙයි. ත්‍රිසිංහලයෙහි ඒ ඒ දෙසින් සීගිරි ගිය උගතුන් සියතින් ලියූ සේ මැ දැනුදු ඇත. එකලැ මෙරට හැම පෙදෙසෙකැ මැ උගතුන් 'න ණ ල ළ' නො වරදවා ලියන්නට නිසි වන දැනුම් ඇතියවුන් බව සීගිරිපැදි වැළෙන් හෙළි වෙයි. ශ්‍රී ධර්මාරාම මාහිමියන් ලොවට හෙළි කළ අක්‍ෂර වින්‍යාසය සියබසෙහි පැවැති පැරැණි නියර බවට 'සීගිරි' ය ද පවා සාධක පිණිසැ නැඟැ සිටුනා කලැ මෙහි ලා කිනම් විරුද්ධවාද වේ ද? කෙසේ මුර ගැහුව ද, 'න ණ ල ළ' නිසි තැනැ ලියන්නට නො දනිත් නම්, ඔහු හැම අන් කුමක් දත ද සියබස නම් නොදත්තාහු වෙති.

තෙල සංස්කරණයෙහි ලා පද බිඳැ දක්වන හැම තැනැ දී "තෙම, තුමූ, විසින්, හට, කෙරෙන්, ගෙන්, ගෙ, කෙරෙහි, යැ, මැ" මෙ ආදිය වෙන වෙන පද විසින් බිඳිණ. පද බිඳින විට 'ගෙන්, ගෙ, හට යනුවෙන් නොකළ යුතුසෙ කියන පඬිවරුන් ඇත ද, එ වෙන මැ සිටුනා පද බවට ගුරුළුගොමීන් ගේ වාක්‍ය මැ දෙස් දෙයි. "ඇතක්හු මඩනා කලැ ඇතක්හු මැ ගෙ පයින් මැඩිය මැනැවැ" (119 පි:) "අප ද ගෙ" (168 පි:) මෙ ආදි වාක්‍ය ප්‍රදෙශයෙහි 'ගෙ' යනුයෙන් පෙරට 'මැ, ද' යන නිපාත එයි. එයින් 'ගෙ' යනු සම්බන්ධාර්ථය එළි කරන පදාන්තරයක් වත් මුත් විභක්තියක් නොවන බව කියැ වෙයි. මෙ ආදි හෙතු පිණිසැ අප විසින් ඒ ඒ පද වෙන වෙනම ගෙනැ යෙදිණ. එසේ ද වුව, පමාදොස් නිසා මෙහි වියවුල් වැ ගිය තැනුදු ඇතත්, බෙදකර නො වෙතියි සිතම්හ.

## ආශ්‍රය ග්‍රන්ථ

දුර්දන්තදමන නම් ප්‍රථම පරිච්ඡේදය පන්සියපනස්දාවැළින් ඇදැ ගත් දෙසියපස්දාවස් පමණ ගෙනැ ඒ ඒ ජාතියෙහි දුර්දාන්තයන් දැමුසෙ කියන්නට ගෙතිණ. මෙ හැම ජාතක අටුවායෙහි එයි. **භූරිදත්ත ජාතක, සඞ්ඛපාලජාතක, චම්පෙය්‍යජාතකාදිය** සිල් පිණිසැ සඳහන් කරනු 'සඟිඅටුවා' යෙහි දු පළට වෙයි. 'සත්කෘත්‍යාභ්‍යාස' ආදි අභ්‍යාස විධි 'චරියාපිටක අටුවා' යෙහි දු ඇත. එයින් ඒ ඒ අටුවා ද මෙහි ලා වහල් වූසෙ සිතියැ හෙන්නේ යැ. පීතෘශොක සන්හිඳුවනු කියන්නට මෙකී **තක්කලජාතකය** දැක්වූව ද, එහි ලා ඒ ජාතකය සටිත වන සෙයක් නො දනුම්හ. ඉදිරිපත් කරන කරුණට සාධක වශයෙන් කියන ජාතකයන් කෙරෙහි කිසිවක් යම්තමෙකින් යෙදෙනසෙ කියැ හෙන තැනුදු ඇත.

**ස්වසන්තානදමන - පරසන්තානදමන** නම් දෙවන තුන්වන පරිච්ඡෙද ජාතක අටුවායෙහි එන 'නිදානකථා' යෙහි අනුවාදයි. එහි දු තැනැ තැනැ අන් අටුවායෙන් ගත් ඇය ද දක්නා ලැබේ.

**ගහපතිදමන** නම් සතර වන පරිච්ඡේදය මැදුම්සඟියෙහි 'උපාලිසූත්‍ර' ය හා අටුවා ඇසිරි කොට කළ අනුවාදයෙකි. එහි එන **මාතඞ්ගකථා** යෙහි දී උපාලිසූත්‍ර අටුවා හා ජාතක අටුවා හා දෙකම ඇසිරි කළසෙ පෙනේ.

**බ්‍රාහ්මණදමන** නම් පස් වන පරිච්ඡෙදය දික්සඟියෙහි 'කූටදන්ත සූත්‍ර' ය හා අටුවා ඇසිරි කොට කරන ලද අනුවාදයි.

**රාජදමන** නම් සවන පරිච්ඡේදය දික්සඟියෙහි 'සාමඤ්ඤඵල සූත්‍ර' ය හා අටුවා ගෙන කළ අනුවාදයි.

**අඟුල්මල්දමන** නම් සත්වන පරිච්ඡෙදය මැදුම්සඟියෙහි 'අඞ්ගුලිමාල සූත්‍ර' ය හා අටුවා ඇසිරි කොට කළ අනුවාදයි.

**පරිබ්‍රාජකදමන** නම් අට වන පරිච්ඡේදය සූත්‍ර නිපාතයෙහි 'සභිය සූත්‍ර' ය අටුවා ඇසිරි කොට කළ අනුවාදයි. මෙහි දී 'බුද්ධවංස අටුවා' යැ. 'අඞ්ගුත්තරාගම අටුවා' යැ යන මෙ ද ඇසිරි කළසෙ පෙනේ.

**මාණවකදමන** නම් නව වන පරිච්ඡෙදය මැදුම් සඟියෙහි 'සච්චක සූත්‍ර' ය හා අටුවා ඇසිරි කොට කළ අනුවාදයි.

**දිගම්බරදමන** නම් දස වන පරිච්ඡෙදය දික්සඟියෙහි 'පාථිකසූත්‍ර' ය හා අටුවා ගෙනැ කළ අනුවාදයි.

**ජටිලදමන** නම් එකොළොස් වන පරිච්ඡේදය මැදුම්සඟියෙහි 'පුණ්ණොවාද සූත්‍ර' යා හා අටුවා ගෙන කරන ලද අනුවාදයි.

**තාපසදමන** නම් දොළොස් වන පරිච්ඡේදය සූත්‍ර නිපාතයෙහි 'පාරායණ සූත්‍ර' ය හා අටුවා ගෙනැ කරන ලද අනුවාදයි.

**භික්ෂුදමන** නම් තෙළෙස් වන පරිච්ඡේදය 'මහාසමයසූත්‍ර' ය හා සූත්‍රාර්ථ ඇතුළත් වැ සිටුනා 'දික්සඟි අටුවා' හා 'සංයුත්සඟි අටුවා' හා දෙක ඇසිරි කොට කරන ලද අනුවාදයි.

**නාගදමන** නම් තුදුස් වන පරිච්ඡේදය 'විශුද්ධිමාර්ග' ය හා 'ජාතකාර්ථකථා' ව හා ඇසිරි කොට කරන ලද අනුවාදයි. මෙහි දී 'පාදපඞ්කජස්තව' නම් පැරැණි ග්‍රන්ථයෙක් ද සඳහන් වේ.

**යක්‍ෂදමන** නම් පසළොස් වන පරිච්ඡේදය සංයුත්සඟි අටුවා යැ, සූත්‍රනිපාත අටුවා යැ යන මෙහි එන ආළවක කථාව හා 'ආළවක සූත්‍ර' ය ඇසිරි කොට කරන ලද අනුවාදයි.

**අසුරදමන** නම් සොළොස් වන පරිච්ඡේදය 'බුද්ධවංස අටුවා' යැ, 'දම්පියා අටුවා' යැ, 'දික් සඟිඅටුවා' යැ යනාදියෙන් කරුණු ගෙන කළසෙ පෙනේ.

**දෙවදමන** නම සතළොස් වන පරිච්ඡේදය දික්සඟියෙහි 'සක්ක පඤ්හ සූත්‍ර' ය මැදුම්සඟියෙහි 'චූලතණ්හාසඞ්ඛය සූත්‍ර' යැ, 'ජිනාලඞ්කාරවර්ණනා' යැ යනාදිය ඇසිරි කොට කරන ලද අනුවාදයි.

**බ්‍රහ්මදමන** නම් අටළොස් වන පරිච්ඡේදය මැදුම්සඟියෙහි 'බ්‍රහ්ම නිමන්තණිය සූත්‍ර' ය හා අටුවා ඇසිරි කොට කරන ලද අනුවාදයි.

ගුරුළුගොමීහු මැ කිසි තැනෙක දී ඒ ඒ සඟි හා සූත්‍ර සඳහන් කරති. මෙහි සඳහන් නොලත් පත පොතින් ගත් කරුණු විරල වෙයි.

මේ සංස්කරණය පිණිසැ පොත් දසයක් පමණ වහල් කැරැගතුම්හ. බම්බලපිටියේ වජිරාරාමාධිපති වැ වැඩ විසූ, යසවතුරින් මෙරට හෙළි කළ මහපඬිරුවනක් වූ, පැලැනේ **සිරි වජිරඤාණ** මහානායක හිමිපාණන් අතින් පුස්කොළපොත් සතරක් මුලැ දී මැ ලදුම්හ. මූලගිරිරාජමහා විහාරාධිපති වැ වැඩ විසූ, ගෞරවාර්හ මොදරවානේ **සිරි සොමානන්ද** නායක හිමිපාණන් අතින් ලත් පොත යැ, පණ්ඩිත දෙනගම **පියතිස්ස** ස්ථවිරයන් වහන්සේ සපයා දුන් පොත යැ, මාතර පඹුරන වාලුකාරාමාධිපති, කඹුරුගමුයේ **සිරි රතනජොති** හිමිපාණන් වෙතින් අප ශිෂ්‍ය ආචාර්ය **අමරපාල සේනාරත්න** මහතා සපයා දුන් පොත යැ, මිරිපැන්නේ **අරියාකරවිහාරයෙන්** ලත් පොත යැ යන පොත් හා අන් පොත් දෙකෙක් දැයි මෙ හැම පොත් දසයෙකි. මේ පොත් වර්ග කොට බලත් මැ, ආචාර්ය පරම්පරා තුනෙකැ පොත්සෙ පෙනේ. උඩරට පහතරට දෙක්හි මැ ලියූ පොත් තෙල පොත් අතර ඇත. අපි මෙ හැම පරීක්ෂාකාරී වැ බැලුම්හ. අනුවාදපාඨ හා පෙළ අටුවා හා සසඳාලුම්හ. දැන් පළ වැ ඇති පොත් අතුරින් මහානාම සංස්කරණය හා සොරත සංස්කරණය හා මෙහි ලා වෙසෙසින් සසඳා බැලුම්හ. අමාවතුරෙහි අගනාකම මතු කැරැ-ලීමෙහි ගෞරවය මහානාම සංස්කරණයට දියැ යුතු යැ. එහි දූ ශොධනය නොලත් බොහෝ තැන් සොරත

සංස්කරණයෙහි ශොධිත වෙයි. පුස්කොළ පොත් හා පෙළ අටුවා සසඳා බලන කහට වුව ද එය පෙනෙ දැයෙකි. සොරත සංස්කරණය සිය ගුරුකුලයෙහි අක්ෂර වින්‍යාසය ගුරුළුගොමීනුදු පිළිගත්සෙ දක්වතුදු 'ඒ සැබැවැ' යි නොකියැ හෙන්නේ යැ.

## සහාය

ශ්‍රී ලංකාවිශ්ව විද්‍යාලයෙහි මහාචාර්ය, **ඩී.ඊ. හෙට්ටිආරච්චි** සූරීන් අමාවතුර පිණිසැ ලියූ කුඩා පදවැළක් ද කරහම්පිටිගොඩ **පණ්ඩිත සුමනසාර** ස්ථවිරයන් දම්පියාටුවා ගැටපදය පිණිසැ ලියූ පදවැළ ද අපට බෙහෙවින් වහල් වූ බව කියම්හ. අහංගම එළුකැටියෙහි බිම්බාරාම විහාරාධිපති, අහංගම **සිරි පඤ්ඤාවාස** මහාස්ථවිරයන් වහන්සේ වෙතිනුදු වැලිගම අග්‍රබොධිරාජමහා විහාරාධිපති ගාලුමාතර දෙ පළාතෙහි ප්‍රධාන සංඝාධිකරණ නායකධූර දරන, අප ගේ කලණමිත්, වලානේ **සිරි සද්ධාවාස** හිමිපාණන් වෙතිනුදු බොහෝ විට අටුවා ටීකා ලබා ගත් බව ද මෙහි සඳහන් කරම්හ. **විද්‍යාචන්ද්‍ර** පිරිවෙන්හි ආචාර්ය ධුරයක් දැරූ වග **ඤාණලොක** ස්ථවිරයෝ ද අපගේ ශිෂ්‍ය ආචාර්ය, **පාතේගම මංගල** ස්ථවිර නම ද පත පොතෙහි එන විෂමපාඨ එකතු කැරැලීමෙහි ලා බෙහෙවින් වහල් වූහ. සුප්‍රසිද්ධ පණ්ඩිත රත්නයක් වන ලබුගම ලංකානන්ද හිමිපාණන් හා සාකච්ඡා කරමින් මේ සංස්කරණයෙහි බොහෝ තැනක් සකස් කළ බව ද මුද්‍රණයෙහි දී ලිපි දොස් පහ කැරැලීම පිණිසැ ඔබ වෙහෙස දැරූ බව ද තියු පිරිනමමින් මෙහි සඳහන් කරම්හ. අප අමාවතුර හදාළ ළදරු අවදියෙහි මැ අප ගේ ධර්මාචාර්ය වැ සිටි, විදග්‍රෙසර, **විද්‍යාලංකාර** පිරිවෙන්හි ආචාර්ය, මාදෝවිට **ඤාණානන්ද** හිමිපාණන් අතින් ලත් සදුපදෙශ තෙල සංස්කරණයෙහි ලා එළිය දින. අද ඔබ ජීවතුන් අතර නැත ද, ඒ වහල මෙහි ලා සඳහන් කළ යුතු වේ.

'අමාවතුරෙහි සංස්කරණයක් කළ මැනැවැ'යි කලකට පෙරැ අපට ආරාධනයෙක් ලැබිණ. ඒ ආරාධනය කළාහු නම් ග්‍රන්ථකාරයකු වශයෙන් ප්‍රසිද්ධියක් දරන **ජයසේකර අබේරුවන්** නොතාරිස් රාළහාමිහු යැ. ඔවුන් ගේ ආරාධනයෙන් කළ සංස්කරණය මුද්‍රණය පිණිසැ දුන ද, එය නිමහම් නො දැකැ මැ නැවැතිණ. පසු වැ **අබිරම් ගම්හේවා** මහතාණන් අතින් මෙහි ලා අපි මෙහෙයුම් ලදුම්හ. ඒ මහතා සියබසෙහි චතුරයකු වන හෙයිනුදු සියබස පණ සේ රක්නට වැර දරන හෙයිනුදු ඔහුගේ පාණ්ඩිත්‍යය කෙරෙහි අප තුළ මහත් සේ සැලැකිලි ඇති හෙයිනුදු ඒ ආරාධනය පිළිගෙන තෙල සංස්කරණය නිමහම් කළම්හ. මෙහි අගැ එන පදවැළ **අබිරම් ගම්හේවා** මහතා වෙහෙස දරා සකස් කළ දැයක් බව ද මෙහි කියම්හ.

**විද්‍යාචන්ද්‍රපිරිවෙන්හි** උපප්‍රධානාචාර්යය වූ, අප ගේ ධර්මාන්තෙවාසි පණ්ඩිත, යටියන **ජිනරතන භික්ෂු** නම දැරූ වෙහෙස නිසා මේ කෘතිය සාර්ථක වූ බව අවසාන වශයෙන් කියම්හ. ඒ භික්ෂු නම මුද්‍රණයෙහි දී වන ලිපි දොස් පහ කිරීමෙහිත් වරද තැන් දක්වා - ලීමෙහිත් වෙසෙසින් වියත් බව දැක්වියැ. අගැ එන 'පදවැළ' ගම්හේවා මහතා ලියුව ද, **පණ්ඩිත ජිනරතන** භික්ෂු නම යලි දු මුලැ සිට ලියා සකස් කළ සේ මනහර වි යැ. බෞද්ධලොකයා ගයන යසගී ඇති, **අග්ගමහාපණ්ඩිත බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය** මහානායක හිමිපාණන් අප ගේ සංස්කරණය ලොවට දෙමින් කළ 'පටන්බස' මෙහි එළියට හෙතු වෙයි. තෙල සංස්කරණය පළ කැරැ-ලීමෙහි ලා ඇම්.ඩී. ගුණසේන සමාගමයෙහි අධ්‍යක්ෂ **ඇම්.ඩී. සිරිසේන** මහතාණන් දැක් වූ වෙසෙස් සැළකිලි ද අප සිත් ගත් බව මෙහි සඳහන් කරම්හ.

ඇම්.වයි හේමචන්ද්‍ර මහතාණන් මෙහෙයා විද්‍යාචන්ද්‍ර පිරුවන පිහිටුවා ලීමෙන් ලොසසුන් වැඩ වසන, අප ගේ ආචාර්යෝත්තම, විද්‍යාචන්ද්‍ර පිරුවන්හි අධ්‍යක්‍ෂ, පරදුව සිරි ජිනරතනාභිධාන තල්පේ පත්තුව ඇතුළු මාතර දිසායෙහි ප්‍රධාන සංඝනායක මහාස්ථවිරපාදයන් වහන්සේට ගුරුපූජා වශයෙන් මේ සංස්කරණය පිරිනමම්හ.

තෙල සංස්කරණය නැවත පළ කැරැලීමෙහි සියලු හිමිකම්
අප සතු යැ. මෙහි ඇතුළත් ශුද්ධි අප නොදන්වා
පැහැරැ නොගන්නේ මැනැවි.

කෝදාගොඩ ඤාණාලෝකස්ථවිර

ශ්‍රී. බු. ව. 2502 } 3. 19
ක්‍රි. ව. 1959

අහංගම, විද්‍යාචන්ද්‍රපිරුවන

# අමාවතුර

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස**

## 1. දුර්දන්තදමන නම් පරිච්ඡේදය

**"ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්‍ථා දෙවමනුස්සානං බුද්ධො භගවා**[1]" යනු විස්තර කරත්, බුදුගුණ අනන්ත වන බැවින් නවගුණ හැම කියත්. නොපිළිවනින්[2] '**පුරිසදම්මසාරථී**' යන පදය ගෙනැ අප බුදුන් පැරුම් පුරා බුදු වැ දෙව්රම් වෙහෙර පිළිගෙනැ එහි වෙසෙමින් තුන් ලොව්හි[3] සැරිසැරැ[4] විෂම පුරුෂයන් දමා අමාමහනිවනින් පැමිණිවූ[5] සෙ නොවියත් හුදී ජනන්[6] සඳහා සියබසින් මා විසින් සැකෙවින්[7] දක්වනු[8] ලැබේ.

අප බුදුහු අතීතයෙහි සාරාසඞ්ඛ්‍ය කපුසුවහස්[9] මතුයෙහි **සුමෙධ** නම් මහ තව්සක් වැ දිව්කුරු බුදුන් හමු වැ අතට පත් නිවන් පියා මහ කුළුණින්[10] ගොර බිරම් සසර[11] වැදැ පැරුම් පුරා **පඤ්චායුධ**[12] ජාතක '**සුතනු**' ජාතකාදියැ බිහිසුණු දරුණුන වන යකුන්[13] සධම්[14] දෙස්නෙන් දමා පන්සිල්හි[15] පිහිටවමින්, **දෙවධම්මජාතක තයොධම්ම** ජාතකාදියැ පිහිටවමින්, **දෙවධම්මජාතක තයොධම්ම** ජාතකාදියැ දියරක්සන් දමා සුගිමොක් මඟට පමුණුවමින් **මහාසුතසොමජාතක ජයද්දිසජාතකාදියැ** මිනීමස් කන නරයකුන් දමා රජයෙහි පැවිජියෙහි[16] පිහිටවමින් **සුවණ්ණමිග** ජාතක **මහාමොරෙ** ජාතකාදියැ තමන් බැඳු වැද්දන් දමා ලොවී-ලොවුතුරා සැපත් වළඳවමින්, **ඉල්ලිස** ජාතක **සුධාභොජන** ජාතකාදියැ මහ මසුරන් දමා මහදන් දෙවමින්, **මතකභත්ත** ජාතක **ධොනසාඛ**[17] ජාතකාදියැ ප්‍රාණාතිපාතයෙහි[18] දොස් දක්වමින්, තුන් වන **සීලවිමංස** ජාතක පස් වන **සීලවීමංස** ජාතකාදියැ අදත්තාදානයෙහි දොස් දක්වමින්, **ලොහකුම්භි** ජාතක **මහානාරදකස්සප** ජාතකාදියැ, පරදාරසමාගමයෙහි දොස් දක්වමින්, **චෙතිය** ජාතක **තක්කාරු**[19] ජාතකාදියැ මෘෂාවාදයෙහි[20] දොස් දක්වමින්, **කුම්භ** ජාතක **භද්‍රඝට** ජාතකාදියැ සුරාපානයෙහි[21] දොස් දක්වමින්, **වණ්ණාරොහ**[22] ජාතක **සන්ධිභෙද** ජාතකාදියැ පිශුන[23] වචනයෙහි දොස් දක්වමින්, **නන්දිවිසාල** ජාතක

---

[1] භගවා'ති.
[2] පිළිවන.
[3] ලෙව්හි
[4] සැරිසරා සැරිසැරු, සැරිසැර
[5] පැමිණවූ සේ
[6] ජනයන්
[7] සැබවින්
[8] දක්වනු
[9] කප්සුවහස්
[10] මහකුළිණින්
[11] සසරට
[12] පඤ්චායුධ
[13] වනරක්සන්, මෙ වන රක්සන්,
[14] ධම්-මු,
[15] පන්සිල්, පන්සිල
[16] පැවිජ්ජයෙහි, පැවිජි
[17] වොණසාඛ, වෙනසාක - අටුවා
[18] පාණාතිපාතයෙහි
[19] තක්කාරි, කත්තර, තක්කාර, කක්කාර
[20] මුසා වාදයෙහි
[21] සුරාපාණයෙහි
[22] වණ්ණු රොහණ. වණ්ණරොහණ, වපණ්ණරොහණ, වණ්ණරොහ-මු.
[23] පිසුනු

**සුජාත**[1] ජාතකාදියැ පරුෂ වචනයෙහි දොස් දක්වමින්, **තිත්තිර** ජාතක **අකාලරාවි** ජාතකාදියැ ප්‍රලාපයෙහි[2] දොස් දක්වමින්, **දූරාජාන** ජාතක **ඉන්ද්‍රිය** ජාතකාදියැ සතුන් සතන්හි දිලි නැඟි[3] රා-ගිනි නිවමින්, **එකපණ්ණ** ජාතක **තිලමුට්ඨි** ජාතකාදියැ කො-ගිනි[4] නිවමින් **මාතඞ්ග** ජාතක **මහාබොධි** ජාතකාදියැ මිසදිට්හ[5] බිඳැ සතුන් සම්දිට්හයෙහි පිහිටවමින්, **සන්ථව** ජාතක **නඞ්ගුට්ඨ**[6] ජාතකාදියැ මිථ්‍යා තපස්හි දොස් දක්වමින්, **සෙතකෙතු** ජාතක **උද්දලක**[7] ජාතකාදියැ කොහොන්[8] පිළිවෙත්හි දොස් දක්වමින්, **පාරාපත** ජාතක[9] **රුචිර** ජාතකාදියැ ලොලතායෙහි දොස් දක්වමින්, **බ්‍රහ්මදත්ත** ජාතක **අට්ඨිසෙන** ජාතකාදියැ යාච්ඤායෙහි දොස් දක්වමින්, **ගිජ්ඣ** ජාතක **චතුද්වාර** ජාතකාදියැ දුර්වචස්ති දොස් දක්වමින්, **සාලිත්ථක**[10] ජාතක **කොකාලික**[11] ජාතකාදියැ අතිමුඛරතායෙහි දොස් දක්වමින්, **මහිලාමුඛ** ජාතක **මනොජ** ජාතකාදියැ විපක්ෂසෙවායෙහි දොස් දක්වමින්, **භීමසෙන** ජාතක **කටාහක**[12] ජාතකාදියැ විකත්ථනයෙහි[13] දොස් දක්වමින්, **සුවණ්ණහංස** ජාතක **මහාවාණිජ** ජාතකාදියැ අතිලොභයෙහි දොස් දක්වමින්, **කූටවාණිජ** ජාතක **මච්ඡුද්දාන**[14] ජාතකාදියැ කූට ව්‍යවහාරයෙහි[15] දොස් දක්වමින්, **ලාභගරහ**[16] ජාතක **ලොසක** ජාතකාදියැ ලාභොත්පාදයෙහි,[17] ලාභාන්තරායකරණයෙහි දොස් දක්වමින්, **සම්මොදමාන** ජාතක **භරු**[18] ජාතකාදියැ කලහයෙහි[19] දොස් දක්වමින්, **සඤ්ජීවක**[20] ජාතක **ගොධ** ජාතකාදියැ අනිෂ්ටප්‍රග්‍රහයෙහි[21] දොස් දක්වමින්, **වරණ**[22] ජාතක **ගජකුම්භ** ජාතකාදියැ අලසතායෙහි දොස් දක්වමින් **දධිවාහන** ජාතක **සීලානිසංස** ජාතකාදියැ අසුත් සමාගමයෙහි[23] දොස් දක්වමින්, සත්සමාගමයෙහි අනුසස් දක්වමින්, **අලීනචිත්ත** ජාතක **පදමාණවක**[24] ජාතකාදියැ ධැම්ට් වැ[25] රජ කෙරෙමින්, **උරග** ජාතක **කුලාවක** ජාතකාදියැ නාගුරුළුමුළු රක්මින්,[26] බරපුත්ත[27] ජාතක **දද්දභ** ජාතකාදියැ ගිනි වැදැ මියන රජනුදු මුහුදු වැදමියන සිවුපාවනුදු වළක්වමින්,[28] ලූස[29] ජාතක **මූසික** ජාතකාදියැ රජනට වන අනාගතභය වළක්වමින්,[30] **රාජොවාද** ජාතක අනෙක් **(තෙසකුණ) රාජොවාද** ජාතකාදියැ රාජානුශාසනයෙන්[31] සත්නටසෙත් කෙරෙමින්, **මහාසාර** ජාතක **බන්ධනමොක්ඛ** ජාතකාදියැ බන්ධනගත සත්ත්වයන් බන්ධනයෙන් මුදමින්, **කච්ඡප**[32] ජාතක **ජවසකුණ**[33] ජාතකාදියැ දුඃඛිත සත්ත්වයන් සුඛිත කෙරෙමින්, **මහාසුපින** ජාතක **අට්ඨසද්ද** ජාතකාදියැ සශොක සත්ත්වයන් නිශ්ශොක කෙරෙමින්,

---

[1] සුජාත, සුජාතක
[2] විප්‍රලාපයෙහි, සම්ඵප්‍රලාපයෙහි-මු
[3] දිලිනැඟී ගිය
[4] කෝගිනි
[5] මිසදුටුහැ
[6] නාථ කට්ඨ, නංගුෂ්ට
[7] උද්දාල-හැම
[8] කොහන්
[9] ලොලජාතක-අටුවා 'කපොත' නම්නුදු අටුවායෙහි එනුයෙ මෙය යි.
[10] සාලි, සාළි, සාලිත, සාලිත්ත-මු
[11] කොකාලි, කොක්කාලික
[12] කටාහ-හැම
[13] විකර්තණයෙහි
[14] මච්ඡාදාන
[15] කූටව්‍යවහාරයෙහි
[16] ලාභ ගරු-හැම
[17] ලාභොත් පාදනයෙහි
[18] ගරු
[19]
[20] මසක
[21] සච්චව, සච්චක
[22] අනිෂ්ට වාසනායෙහි, අනිෂ්ට ප්‍රස්තායෙහි, අශිෂ්ටසෙවායෙහි-මු
[23] වාරණ, පරන්ත, වපණ
[24] මෙය සමහර පොතෙකැ නැති
[25] පදමාණව,
[26] ධැම්වු වැ දැම්වු වැ
[27] රක්වමින්
[28] බරපත්ත
[29] වළකමින්
[30] ළුස, ලස
[31] වළකමින්
[32] රාජ්‍යානුශාසනයෙන්-මු
[33] කච්ඡ

**දසණ්ණක** ජාතක **කාම** ජාතකාදියැ සරොග සත්ත්වයන් නීරොග කෙරෙමින්, **කුස** ජාතක **භොජාජානීය** ජාතකාදියැ තමන් ගෙනැදුන්, රුපු රජුනට අභය දෙවමින්, **ගුණ** ජාතක **කුරුඞ්ගමික** ජාතකාදියැ උපකාරයනට ප්‍රත්‍යුපකාර කෙරෙමින්, **මහාඅස්සාරොහ** ජාතක **පලාස** ජාතකාදිය, මඳ උපකාරයෙක්හි පැහැදැ සත්නට අර්ධරාජ්‍ය[1] දෙමින්, **මහානිධාන පාමින් වට්ටක** ජාතක **මච්ඡ** ජාතකාදියැ ගින්නෙන් නස්නා සත්නට ලැව්ගිනි නිවමින්,[2] මහවැසි වස්වමින්, **අසදිස** ජාතක **මහා උම්මග්ග** ජාතකාදියැ යමක්හුවෙරින්[3] ලෙහෙ[4] නොසොල්වා කැටක් ගෙනැ ලුහුබඳනා කපුටු[5] සෙනඟක් සෙයින්, හීයක් ගෙනැ ලුහුබඳනා කපුටු සෙනඟක් සෙයින්, හීයක් ගෙනැ ලුහුබඳනා වඳුරු සෙනඟක් සෙයින්, [6]රුපුරජ සෙනඟ ලුහුබැඳ, බුදු වූ දවස් බුන් මරසෙනඟ සෙයින් බිඳැපියා සත්නට සෙත් කෙරෙමින්, **මාතුපොසක** ජාතක **සාලිකෙදර** ජාතක **සොණනන්ද**[7] ජාතකාදියැ සතුන් මවුවටන් පිය වටන් ධැම්හි පිහිටවමින්, **සොමදත්ත** ජාතක **මට්ටකුණ්ඩලී** ජාතකාදියැ දිලි-නැඟි පුත්‍රශොක නිවමින්, **සුජාත** ජාතක **තත්කල**[8] ජාතකාදියැ පීතෘශොක සන්සිඳුවමින්, **මතරොදන** ජාතක **උරග** ජාතකාදියැ සැනැහැති[9] මල් බෑයනුදු උරෙහිඳා දරුවනුදු මළ කලැ දොම්නස් නො කෙරෙමින්, **අනනුසොචීය** ජාතක **දසරථ** ජාතකාදියැ මළානට වලප්නා සතුන් සධම්[10] දෙස්නෙන් අස්වසමින්,[11] **තින්දුක**[12] ජාතක **සුරුචි**[13] ජාතකාදියැ පැන වෙසෙස් දක්වමින්, **පුණ්ණනදී** ජාතක **ගාමණිචණ්ඩ** ජාතකාදියැ පැන

---

[1] අර්ධරාජ්‍යය
[2] නිවා
[3] විරින්, වෙරෙන්
[4] ලේ
[5] කවුඩු
[6] "රුපු රජ සෙනඟ බුදු වූ දවස් බුන් මර සෙනඟ සෙයින් බිඳැ ලුහුබැඳැ-පියා" යනු පොත්වලැ එයි. කිසි පොතෙකැ 'බිඳැ ලුහුබැඳැ-පියා' යනු 'බිඳ-පියා'යි ඇති.
[7] යොගානන්ද
[8] තක්කල, තක්කාකොළ
[9] සැනැති, සැනැහැති, සිනෙහැති මුදිත
[10] දම්, සද්ධම්-මු
[11] අස්වසමින්
[12] කන්දුක, කින්දුක
[13] සුව

විජසමින්[1], **සුසීම** ජාතක **තිත්තිර**[2] ජාතකාදියැ ළදරුවක් වැ[3] එක රැයෙකින් ත්‍රිවෙද නිමවා-ගෙනැ, “තොප අතැවැස්සනට[4] මෙසෙ කියව”යි[5] ආචාර්ය හට වෙද සෝධා[6] දෙමින්[7], වටුවක් මැ ගල්මුදුනෙන් බස්නා හොයක් සෙ පන්සියක්[8] දෙන හට[9] ත්‍රිවෙද ප්‍රතිපාදනා කෙරෙමින්, **සම්භව** ජාතක **සත්තුභස්ත**[10] ජාතකාදියැ පැන විසජනෙන්, සතුන් සොම්නස් මහවිල්හි ගලා සනහමින්, **පරොසසහස්ස** ජාතක **සිරිකාලකණ්ණි** ජාතකාදියැ නුවණැතියන්ටද් ලොවැඩ[11] පසස්නානටද් සඞ්ග්‍රහ කෙරෙමින්, **සාධීන** ජාතක **නිමි** ජාතකාදියැ විජයත්රථ අරා දෙව්ලො[12] ගොස් දෙවියන් තුස්වමින්, **සිගාල** ජාතක **චුල්ලපලොභන**[13] ජාතකාදියැ ඡන්‍දරාගයෙහි දොස් දක්වමින්, **තක්ක** ජාතක **නලිනී**[14] ජාතකාදියැ ස්ත්‍රීලීලාවලොකනයෙහි දොස් දක්වමින්, **මුදුලක්ඛණා**[15] ජාතක **සඞ්කප්ප** ජාතකාදියැ ශුභ වශයෙන් බැලීමෙහි දොස් දක්වමින්,[16] **ආසඞ්ක** ජාතක **උම්මදන්තී** ජාතකාදියැ ස්ත්‍රීරූපදර්ශනයෙහි දොස් දක්වමින්, **මොර** ජාතක **කක්කට** ජාතකාදියැ ස්ත්‍රී ශබ්දයෙහි දොස් දක්වමින් **පුප්ඵරත්ත**[17] ජාතක **අලම්බුසා**[18] ජාතකාදියැ ස්ත්‍රී ශරීර ස්පර්ශයෙහි දොස් දක්වමින්, **කණවෙර**[19] ජාතක **අට්ඨාන** ජාතකාදියැ ස්ත්‍රී සංසර්ගයෙහි දොස් දක්වමින්, **කුම්මාසපිණ්ඩ**[20] ජාතක **ගඞ්ගමාල** ජාතකාදියැ තමන් අනන්තරජන්මයෙහි එක් දවසද් දුන් දනින් හා එක් රැයක් රැකි සිලින් රජසපු ලද[21] පරිදි[22] කියා සතුන් දන්සිල්හි[23] පිහිටවමින්, **ආදිත්ත** ජාතක **දසබ්‍රාහ්මණ** ජාතකාදියැ විචෙයාදාන[24] දෙවමින්, **කුම්භකාර** ජාතක **භික්ඛාපරම්පර**[25] ජාතකාදියැ පසේබුදුන් පුදමින්, **සඞ්ඛ** ජාතක **මහාජනක** ජාතකාදියැ සත් දවසක් නිරාහාරව වැ මහමුහුදු පිහිනන කලුදු දිවබොජුන් පිළිබෙව්[26] කොටැ පෙහෙවස් මැ රක්මින්, **තෙලපත්ත** ජාතක **සමිද්ධි** ජාතකාදියැ දිව්‍ය රූපද්[27] ඉන්ද්‍රිය භෙද කොටැ නො බලමින්, **ගන්ධාර** ජාතක **කණ්හ**[28] ජාතකාදියැ තවුස් පැවිජි වැ පන්සිල් මාත්‍රයක්[29] රක්නා කලැ ද පවා බලවත් අපිස්සතොස්බවට පැමිණෙමින්, **කාක** ජාතක **භද්‍රසාල** ජාතකාදියැ නෑයනට වැඩ කෙරෙමින්, **දුම්මෙධ** ජාතක **අයකූට** ජාතකාදියැ ලො[30] වැඩ කෙරෙමින්, **ධජවිහෙඨන**[31] ජාතක **මහාකණ්හ** ජාතකාදියැ සසුන් වැඩ කෙරෙමින්, **නිග්‍රොධමිග** ජාතක **නන්‍දිමිග** ජාතකාදියැ සධම්[32] දෙස්නෙන් දරුණු රජුන් දමා හැම සත්නට අභයදාන[33] දෙමින්, **සරභඞ්ග** ජාතක **සඞ්කිච්ච** ජාතකාදියැ තමන් පොළොව පළා පැ නරක දැකැ වෙවුළන සතුන් තදන්තර්ධානයෙන් අස්වසමින්,

---

[1] විසදමින්
[2] දද්දර-හැම,
[3] ළදරු දරුවක් වැ
[4] අතවැස්සහට
[5] කියා,
[6] යොදා සායා
[7] දෙවමින්
[8] පත්සියයක්
[9] දෙනා හට
[10] සත්තු හත්ත
[11] ලෙව්වැඩ,
[12] දෙව්ලොව,
[13] චුල්ලපලොභ,
[14] නළින
[15] මුදුලක්ඛණ
[16] ශුභ වශයෙන් දොස් දක්වමින්
[17] පුප්ප පත්ත
[18] අලම්බුස
[19] කණවෙරු
[20] කුම්මාසපිණ්ඩි
[21] රජසපුව වැලඳ,
[22] සරිජි
[23] දන්සිල්, දන්සිල
[24] විවෙස, විවෙච, විචෙය, විශෙෂ-මු
[25] භික්ඛාපරම්පරා
[26] පිළිකෙව්
[27] දිව්‍යරූප-මු
[28] අයකූට
[29] පන්සිල් මාත්‍රාවක්
[30] ලෝවැඩ-මු
[31] ධජවිහෙඨ
[32] සදාදම්, සදම්
[33] අභයදානය

ජවනහංස ජාතක වලාහකඅස්ස ජාතකාදියැ මරණ මුවපත්[1] හසුන්, යක් මුවපත්[2] මිනිසුන් පියායෙන් පිටින් තරවමින්, සච්චඞ්කිර ජාතක චුල්ලපදුම[3] ජාතකාදියැ දියෙන් යනුවන් ජලදුර්ගයෙන් නගමින්, සරභමිග ජාතක මහාකපි ජාතකාදියැ නරාවළැ[4] හුණුවන් නරක ප්‍රපාතයෙන් උද්ධරමින්,[5] මහාකපි ජාතක සුප්පාරක ජාතකාදියැ මරණ මුවපත් වඳුරන් වළබමුවපත් වෙණෙඳුන්[6] ගඟමුහුදු[7] පරතෙරට පමුණුවමින්, අබ්භන්තර ජාතක ලොමසකස්සප[8] ජාතකාදියැ උග්‍රතපසින් ශක්‍රභවන කම්පිත කෙරෙමින්, අකිත්ති ජාතක භිස ජාතකාදියැ ගිහිසපු[9] උර සක්මල් සෙ දැකැ තපොවන එළෙඹෙමින්, මඛාදෙව ජාතක සයභ[10] ජාතකාදියැ පඤ්චකාමගුණ විෂමිශ්‍ර අමෙධ්‍ය සෙ[11] ගරහමින්, සොමනස්ස ජාතක සුසීම ජාතකාදියැ වලප්නා නෑයන් යමපලුන් සෙපියා තවවල් නික්මෙමින්, සොණ ජාතක දරීමුඛ ජාතකාදියැ ලැව්ගිනිගත්[12] වන ගහනයෙකින් නික්මෙන ඇතක්හු සෙයින් රජසපු හැරැපියා[13] නික්මෙමින් උදඤ්චනී[14] ජාත චිත්තසම්භූත ජාතකාදියැ කාමපඞ්කයෙහි ගැලී-ගිය[15] සතුන් නඟා පැවිජිතලයෙහි පිහිටවමින්, චන්දකින්නර ජාතක සාම ජාතකාදියැ තමන් මියන සෙ වීදි රදුන්[16] කෙරෙහි දොම්නස්ස නො කෙරෙමින්, මහාඛන්තිවාද[17] ජාතක චුල්ලධම්මපාල[18] ජාතකාදියැ තමන් කටුමගිගායෙන් සප්වා[19] අත්පාකන්නාසාද්[20] කස්පා[21] පාවිළිඹින්[22] කඩුසිළින් ළෙහි ඇනැ මරන රජුන් කල්යහළුවන් සෙ දක්මින්,[23] මහාසීලව ජාතක එකරාජ ජාතකාදියැ ඇමැතිමඬුලු ඇතොවුරු කොටාරදහස් පැහැරැ ගෙනැ තමන් සොහොන්වළැ සිඟල්බත් කොටැ ගැලු, දොරතුරෙහි එල්වූ, රදුන් පිය පුතුන්[24] සෙ දක්මින්,[25] ඛදිරඞ්ගාර ජාතක සස ජාතකාදියැ දන් දෙනු සඳහා දිලියෙන ගිනිමැදට පුල්පියුම්විලට[26] සෙ වදිමින්, සීලවජාතක ඡද්දන්ත ජාතකාදියැ තමනට[27] වධ කළ වැද්දනට සිය අතින් සරස් විහිදිනා[28] දළ කපා-දෙමින්,[29] භූරිදත්ත ජාතක සංඛපාල ජාතක චම්පෙය්‍ය ජාතකාදියැ තණපතක් සෙ දිවි පියා පොළොව පෙරළන්නක්හු සෙ[30] සිල් පොහො පිසමින්, වෙලාම ජාතක මන්ධාතු ජාතකාදියැ සත්නට රුවන්වහරෙ වස්වමින්, කුරුධම්ම ජාතක සිවි ජාතක විසය්හ ජාතක වෙස්සන්තර ජාතකාදියැ දන්වහරෙ වස්වමින් මහෞෂධ පණ්ඩිත කල්හි, වීධුර පණ්ඩිත කල්හි, සෙනක පණ්ඩිත කල්හි, කෙවිලි රජකල්හි, හස්රජ[31] කල්හි, ගිරාසෙනෙවි කල්හි, සුවන් මොනර කල්හි,

---

[1] මරමුවපත්
[2] බිහිසුන් යක්...මු
[3] භිස
[4] නිරැවළ
[5] උද්ධරවමින්
[6] වෙණෙ දැන් වෙණෙදනන්-මු
[7] ගෙන මුහුදු-
[8] ලොමකස්සප
[9] ගිහිසපුව-මු
[10] හංස විසය්හ
[11] අමෙධ්‍යය
[12] පත්
[13] රජසුව හැරැපියා, රජසපුව පියා
[14] උදෙනි
[15] හැමීගිය
[16] රජුන්
[17] ඛන්තිවාද
[18] චූලධම්මපාල
[19] සප්පා
[20] අත්පාද්
[21] තප්පා
[22] පාවිළුඹින්
[23] දක්වමින්
[24] ප්‍රිය පුතුන්
[25] දකිමින්
[26] පුල් පියුම්විල
[27] තමන්
[28] විහිදන
[29] කඩා-දෙමිත්
[30] පෙරළෙන්නාක් සෙයින් සිල් පොපියමින්-හැම. පොහො ඝ පෝ පිසමින් ඝ පියමින් = පොපියමින් මෙසෙ වන ලෙඛ දොෂයි
[31] අස් රජ

රුරුමුව කල්හි, **කුකුරු** කල්හි, **සුපත්**[1] කපුටු කල්හි, **තුණ්ඩිල** හූරු කල්හි, සත්නට ධම්වහරෙ[2] වස්වමින්, **කුද්දල** සමාගමයෙහි **හත්ථිපාල**[3]

සමාගමයෙහි **ජොතිපාල** සමාගමයෙහි, **අයොඝර** සමාගමයෙහි, **චුල්ලසුතසොම**[4] සමාගමයෙහි, **මූගපක්ඛ** සමාගමයෙහි, සතුන් ශීලාදිගුණයෙහි පිහිටවමින් මෙසෙ තමන් බෝසත්කල්හි මැ පුරිසදම්මසාරථී වන බැවින් නො එක් දැකෙළසුවහස්හි[5] දුර්දාන්තසත්ත්වයන් දමා ශීල සමාධි ප්‍රඥාලක්‍ෂණ ගුණධර්මයන්[6] පිසමින්[7], සත්කෘත්‍යාභ්‍යාස[8] නෛරන්තර්යාභ්‍යාස[9] දීර්ඝකාලාභ්‍යාස විසින් බොධිසම්භාර ධර්මයන් මුහුකරුවමින්, දැමි දමනු සඳහා සවන්ඤණ ගබ්[10] ගන්වා-ගෙනැ[11] වෙසතුරු[12] අත් බැවින් සැවැ තුසී පුරෙහි[13] උපන්හු.

**දුර්දන්තදමන නම් පළමු වන පරිච්ඡේද[14] නිමි.**

## 2. සවසන්තානදමන නම් පරිච්ඡේදය

මෙසෙ ඔවුන් **තුසීපුරයෙහි** ඉපැදැ[15] සත්පනස් කෙළ සැට ලක්‍ෂයක් අවුරුදු දෙව්සපු[16] වළඳා වැඩැ වසන කල්හි[17] දසදහසක් ලොධාහි දෙව්බඹහු පූර්වනිමිත්ත දැකැ එක් සක් වළෙකැ මුළු දී "බුදු වන මහතෙක් කොහි[18] වෙසෙ හො[19]!" යි බලනුවො අප මහබොසතාණන් දැකැ තුසීපුරට[20] ගොස් වැදැ[21] මුදුනෙහි ඇඳිලි බැඳැ "බුදු වන්නට කලා" යි ආරාධනා කළහ.[22]

එ කල්හි මහබොසතාණො පඤ්චමහාවිලොකනා[23] කොටැ බුදු වන්නට කල් බව දැනැ දෙව්පිරිස් පිරිවරා නඳුන් උයන් වැදැ **තුසීපුරෙන්**[24] සැවැ දඹදිවැ මැදුම් පියෙසැ **කිඹුල්වත්** නුවර **ඔකාවස්කුල** අබරණ **සුදෙවුන්** මහ රජහු පිණිසැ **මහාමායා** දෙව්රුජින කුසැ[25] පිළිසිඳැ-ගත්හු.

**මහාමායදෙවී** ඇසළ පුනු පොහොයට[26] සත් දවසක් ඇති කුල පටන්-ගෙනැ දෙව්නුවරක් සෙයින් සදන ලද කිඹුල්වත්පුරෙහි දෙව්පිරිස් බඳු මහ පිරිස් පිරිවරා සැණකෙළැ[27] පොහොදවස්[28] ගඳදියෙන් නහා ගඳවිලෙවුන්[29] ගෙනැ සව් බරණින්[30] සැදී, සතර ලක්‍ෂයක් ධන වීසදා මහදන් දී වරභොජන වළඳා, පෙහෙ වැ, දිවවිමන් පරයන සිරියහන් ගබට වැදැ

---

[1] සුවපත් සුසාත්
[2] දහම් වතුරෙ
[3] හස්තිපාල
[4] චූලසුතසෝම
[5] දැකෙළ සුවහස්ගණින්
[6] ගුණධර්මයෙන්
[7] පිරිපසමින්, පිසමින්
[8] සතකත්‍යාභ්‍යාස
[9] රෙන්තරාභ්‍යාස
[10] ගබ
[11] ගන්නා ගෙනැ
[12] විසිතුරු, විසතුරු
[13] තුසීපුරයෙහි
[14] පරිච්ඡෙදය
[15] ඉපිද
[16] දෙව්සපුව
[17] වැඩවසන සේක්
[18] කොයි
[19] වෙයි, වෙසේදෝ-මු
[20] තුසීපුරයට
[21] ගොත් වැඳැ-මු
[22] කළාහ
[23] පඤ්චමහාවිලොකනාවලොකනස-මු
[24] තුසීපුරයෙන්
[25] දෙව්රජනී, දෙව්රජිනි
[26] ඇසළපුණු පෝයට
[27] සැණකෙළි කෙළ
[28] පොදවස්
[29] මල්ගඳ-විලවුන්
[30] සර්වාභරණින්

සිරියහන් මතුයෙහි හෙවැ නිදන්නට වන්නී, මෙබඳු ස්වප්නයක් දුටු. කිසෙයැ යත්:-[1] **සතරවරම්** මහ රජහු[2] ඇය යහනින් මැ නඟාගෙනැ හිමවත් පියෙසට ඇරැ සැට යොදුන් රග්ගල්[3] තෙලෙහි පිහිටි සත්යොදුන් මහසල්රුක් යටැ බහා-තබා එකත්පස් වැ සිටියො. එ කල්හි ඔවුන් ගෙ දෙවිහි අවුදු, දෙවිය **නූතත්දහතළට**[4] හැරැ මිනිස්මල හරනා[5] සඳහා නහවා දිවපිළී හඳවා දිවගඳින් විලෙවුන්[6] ගන්වා[7] දිවමල් පළඳවා, එයට නුදුරු තන්හි එක් රිදී පව්යෙක්[8] ඇති, එහි ඇතුළු[9] රන්විමනෙක් ඇති, එ විමන්හි පැදුන් දසට හිස ලා දිවයහනක් පන්වා[10] එ යහන්හි වඩා හෙවූහු.

එ කල්හි අප මහබොසතාණො සරා වලා ගබක් සෙයින් සුදු ඇත්වෙසක් දක්වා, එයට නුදුරු තන්හි එක් රන්ගලෙක් ඇති, එ ගල්හි සැරැ එයින් බැසැ රිදී පව්වට නැඟී[11] උතුරු දිසායෙන් අවුදු රිදීදමක් බඳු අතින් සුදුපියුමක් ගෙනැ, කිලැ, රන් විමනට වැදැ, මෑණියන් හොත් යහන තුන් යලක් පැදකුණු කොටැ දකුණු ඇලයෙන් කුසට[12] වන්නවුන් වැනි වූහු. මෙසෙ ඇසළ පුනු පොහොයැ උත්තරසළ[13] නකතින් මවුකුසැ පිළිසිඳැ-ගත්හු.

එ කල්හි දෙවි පිබිදැ රජ හට සැළ කළහ.[14] රජ සිවුවෙ ගෙවාදත් බමුණන් සූසැටදෙනකු[15] ගෙන්වා-ගෙනැ සත්කාර කොටැ මහත් හොග දී සිහින කියා "කිමෙක් වෙ?" යි පිළිවත. බමුණො "මහරජ, තා ගෙ දෙවිය කුසැ ගබ පිහිටි යැ. පිතෙක් තට උපද්දී. ගෙ ගිහිගෙහි සිටියෙ[16] නම්, සක්විති රජ වෙ[17] පැවිජි වී නම්, බුදු වෙ"යි කීහු.

ඔවුන් මවු-කුසැ පිළිසිඳැගත් විගැස එක පැහැරැ දසදහස් ලොධා කම්පිත වී යැ. දසදහසක් සක්වළැ අපමණ අලොක වී යැ. එශොභා දක්නට කණහු[18] ඇස් 'ලදැහැ. බිහිරිහු[19] ශබ්ද ඇසූහැ. ගොළුවෙ ගායනා කළහැ. පිළුහු[20] නැටුහැ. කුදුහු ඉදි සිරිරි[21] ඇති වූහැ. බන්ධනගත සත්ත්වයො බන්ධනයෙන් මුක්ත වූහැ. හැම නිරයැ ගිනි නිවිණ.[22] ප්‍රෙතයන් ගෙ සා-පිපාසා[23] සන්හිනැ.[24] තිරිසන් ගතිතැ සත්නට[25] හය නැති වි යැ. හැම සතුන් ගෙ රොග සන්හිනැ.[26] හැම සත්හු ප්‍රිය[27] තෙපුල් ඇති වූහ. අස්හු මියුරු ආකාරයෙන් කුල්ති. ඇත්හු සොම්නස් වැ ගර්ජනා කෙරෙති. සිංහයො නාද කෙරෙති.[28] හැම බෙරහු තමන් තමන් ගෙ[29] ධ්වනි වුහුට්හු. නොසොල්වන ලද දෙව් මිනිසුන් ගෙ පළඳනා රැව්පිළිරැව් දී ගුගුළෙ. හැම දෙසෙහි පහන් පැහැ වි යැ. හැම සත්නට සුව ජනවමින් සුවඳ මෙලෙක් සිහිල් සුළඟ හැමී යැ. අකාලමෙස නඟා වැසි වට. පොළොවිනුදු[30] දිය නැඟී පොළො-තෙලෙහි[31] ඇවිද්දි. පක්ෂීහි[32] ආකාශයෙන් යන ගමන් පීහැ. ගඞ්ගාවො[33] නො ගොස් සිටියහ. මහ මුහුදැ දිය[34] මියුරු වී යැ. හැම තැන්[1]

---

[1] කෙබඳු ද යත්-මු.

[2] අවුදු ඇය - කිසි

[3] රන්ගල්,

[4] අනුතත්දහතළාවට

[5] අරණ, අරනා

[6] දිවගඳවිලෙවුන්

[7] ගල්වා

[8] රිදීපවුයේ

[9] ඇතුළැ, ඇතුළත්හි

[10] පනවා

[11] නැඟ

[12] කුසයට

[13] උත්‍රසළ

[14] සැළකළා

[15] සූසැටදෙනෙකුන්-මු

[16] සිටී නම්, සිටියනම්

[17] වෙයි

[18] කණ්හු

[19] එ රැවු බිහිරහු ඇසූ හ

[20] පීළහු

[21] සිරිරු

[22] නිවීගියහ

[23] සා-පිපාස

[24] සන්හිදින, සන්සිඳින

[25] තිරිසන් ගත-මු

[26] සන්හුන, සන්හිඳුන

[27] පිරිය

[28] මෙය 'ජාතක' අටුවායෙහි නැත

[29] තමතමන්ගෙ

[30] පෙළෙවිනුදු

[31] පොළොව තෙළෙහි

[32] පක්ෂීහු

[33] ගඞ්ගා හො

[34] මුහුදුදිය

තැන්[1] පස්පියුමින් සැදුම් ලද දියෙහි ගොඩෙහි පුෂ්පයො විකසිත වූහැ. හැම රුකැ හැම ලියෙහි කඳවෙළෙපැ ශාඛායෙහි පස්පියුම් පිපි යැ.[2] පොළො-තල ගල්-තල[3] බිඳැ-ගෙනැ[4] මතුමතුයෙහි සත් සත්බුමු වැ දඬුපියුම්[5] නික්මිණ. අහසැ පියුම් වියන් වි යැ. හාත්පස්හි[6] මල්වැසි වට. ආකාශයෙහි දිවබෙර ගුගුරයි. සියලු දසදහසක් සක්වළ වටා වුහුටු මල් ගුළාවක්[7] වැනි වි යැ. පෙළා[8] බැඳි මල්කලබක් වැනි[9] වි යැ. සදා-තුබු මල් අස්නක් වැනි වි යැ. එකමාලා මාලිනි වී යැ. තෙවුනා වල් විදුනා ඇති වි යැ. පුෂ්පධූපගන්ධපරිවාසිත වි යැ. පරම සෞභාග්‍යප්‍රාප්ත වී.

මෙසෙ පිළිසිඳැ[10] ගත් මහසත්හු ගෙ **පිළිසිඳ** පටන් ගෙනැ මහබොසතාණ ට දූ මෑණියනට දූ උපද්‍රව වළකනු සඳහා මෙ සක්වළැ සතර **වරම්මහරජහු** කඩු ගත් අත් ඇති වැ ඇතුළු සිරියහන්ගබැ රකවල් ගත්හැ. තුබූ දස දහසක් සක්වළැ සතලිස් දහසක් වරම්මහරජහු[11] සහපිරිවරින් අවුදු ගබ්දොර[12] පහදොර[13] පටන්-ගෙනැ සක්වළගල් දක්වා වටා අරක් ගත්හු. මෑණියො සුවපත් වූවාහු. නොලෙඩ සිරිරු ඇත්තාහු, ඇතුළුකුසැ නැබමඬුලු බලා පලක් බැඳැ වැඩැ හුන් පුතණුවන් පහන් පැහැ ඇති මිණිරුවනෙක්හි ඇවුණු[14] රත්පලස්හුයක් සෙයින් දක්නාහු, දසමස් අවසන්හි දෙමා-පියන් කරා යාටි වැ[15] **සුදෙවුන්** මහරජාණනට සැළ කොළො.

රජාණො **කිඹුල්වත්** නුවර පටන්-ගෙනැ **දෙව්දහැ** නුවර දක්වා මඟ සම කරවා සුදුවැලි ඔවා කෙහෙල් ඉඳුවා[16] පුන්කලසදදපෙළින් සදා දෙවින් ගනරන්මුවා සිවිගෙකෙක්හි[17] සුදු මෙළෙක්[18] යහන්හි වඩා-හිඳුවා දහසක් ඇමැත්තන් ලවා සිවිගෙ ගන්වා[19] මහත් පිරිවරින් නඟා යවුහු. දෙනුවර මැදැ දෙනුවර වැස්සන් ගොස් සැණ[20]කෙළෙනා **ලුම්බිනීවන**[21] නම් මඟුල් සල්වනයෙක් ඇති.

එ කල්හි එ සල්වනය මුල පටන්-ගෙනැ ශාඛාග්‍ර[22] දක්වා මලින් සැදුම් ලද. ශාඛා අතුරෙහි දු මල් අතුරෙහි දු පස් වනක් බමර ගණන් හා නන් විසිතුරු ලිහිණිගණයො මියුරු සරයෙන්[23] කුල්මින්[24] ඇවිදිති. සියලු **ලුම්බිනීවනය තව්තිස**[25] දෙව්නුවරැ **සිත්ලිය** වනය වැනි වි යැ. එ දක්නා හා දෙවිනට සල්වනැ කෙළෙනා රිසි වී යැ.[26] ඇමැත්තො දෙවින් ගෙනැ සල්වනයට වන්හැ. දෙවිහි[27] කෙළෙමින් ගොස් මඟුල් සල්මුලට එළැබැ සල්අත්තැ[28] ගතැටි වූ හැ. සල්අත්ත හුයා-පී වෙබඩඅගක්[29] සෙයින්, නැමී දෙවීන් අතට උපගත වි යැ. ඔවුන් සල්අත්ත ගත් වීගසැ, කර්මජ වාතයො චලිත වූහැ. එකල්හි ඇමැත්තො වටා කඩතුරා බැඳැ පිටත් වැ සිටියාහැ. ඔවුන් සල්අත්ත මැ ගෙනැ[30] සිටියවුන්, කුසින් බොසතාණො ප්‍රසූත වූහැ.

---

[1] හැමතැන
[2] පිපීගිය
[3] ගලතල
[4] බිඳ
[5] පියුම්
[6] හාත්පසින්
[7] මල් කුලාවක්
[8] පොලා
[9] බඳු
[10] පිළිසිඳ
[11] සතරවරම්රජහු
[12] ගම්දොර
[13] පහදොර මහදොර-මු
[14] ඇමුණු
[15] යායටී වැ
[16] හිඳුවා
[17] සිවි ගෙයක්හි
[18] මොළොක්
[19] ගෙන්වා
[20] සැණකෙළි
[21] ලුම්බිනී නම්
[22] ශාඛාග්‍රය, ශාඛා අග
[23] මියුරුරසයෙන්-හැම
[24] කුල්මත් ව
[25] තව්තිසා
[26] උපන
[27] දෙවී
[28] සල් අත්ත, සල්අත්තක්-මු
[29] වේබඩයක්, වෙඅගබඩක්
[30] එ මැ සල් අත්ත, සල් අත්ත නම්මා ගෙනැ

එකෙණෙහි සුදවස්[1] වැසි රාත් මහබඹහු අවුදු රන්දැලින් බොසතාණන් පිළිගෙනැ මැණියන් පෙරට[2] සිටැ. "දෙවිය, සොම්නස් වා[3] මහානුභාව ඇති[4] පිතෙක් තිට උපනැ"යි කීහැ.

සෙසු සත්හු මවුකුසින් නික්මෙන කලැ, අසුචි මුසු වැ නික්මෙති. මොහු වනාහි බණ පලගෙකින් බස්නා මහතෙර කෙනකුන් සෙයින් දෙ අත් දෙපා දික් කොටැ සිටැ[5] මවුකුසැ කිසි දැයෙකින් මුසු නො වැ පිරිසිදු වැ විසදවැ[6] කසී වතෙක් හි වසා තුබූ දැරඟම්ණි රුවනක් සෙයින් දිලියෙමින් මවුකුසින් නික්මුණුහු. ඔවුන් එසෙ පිරිසිදු සිරිරි[7] ඇත ද, බොසතාණණ්ටද් මැණියන්ටද් සත්කාර සඳහා අහසින් දෙදියධාරායෙක් නික්මැ මැණියනුදු බොසතාණනුදු සැනැවි.[8]

එකල්හි මහබොසතාණන් රන්දැලින් පිළිගෙනැ සිටි මහබඹුන් අතින් සතරවරම් මහරජහු මඟුල් සම්මත වූ සුවපහස් ඇති අඳුන් දිවි සමින් පිළිගත්හු. ඔවුන් අතින් මඟුල් මහ ඇමැතියො දුහුල් සුඹුළුයෙන්[9] පිළිගත්හු. මිනිසුන් අතින් බැසැ පොළොවැ වැඩැ-සිටැ පැදුන් දසා.[10]" බැලූහු. එ දෙසෙහි අනත් අපරිසෙ[11] ලොධා[12] එක්හෙළි වි යැ. එහි දෙව්මිනිස්හු[13] ගඳින් මලින් මුදා "මහාපුරුෂය, මෙහි තා හා සම කෙනෙකුදු[14] නැති. තව වැඩි[15] කෙනෙක් නම් කොහි?"යි[16] කීහු. මෙසෙ සතර දිසාද්[17] සතර අනු දිසාද් උඩද් යටද් යන දසදිසා බලා තමන් හා සුදුසු කෙනකුන් නො දැකැ උතුරු දිසා[18] බලා සත් පියවර[19] නඟා[20] වැඩැ සිටියො.

එ කල්හි මහබඹ[21] තුන් යොජුන්[22] පමණ සෙ-සත් මුදුනට වැඩි යැ. සුයාම නම දෙව්රජ තුන්ගවු පමණ වල්විදුනා සැලි යැ. සන්තුසිත නම් දෙව්රජ මිණිවටාපත් සැලි යැ. සක්දෙව් රජ එක්සියවිසිරියන් විජයතුරා[23] සක[24] පිඹ[25]. සෙසු දෙවියො රුවන් කරඬු රුවන්මරවැඩි[26] මිණිවොටුනු ගෙනැ පිරිවැරූහු. බොසතාණො සත්පියවර වැඩැ සිටැ, අනත් අපරිසෙ ලොධාහි තමන් හා සම කෙනෙකුන් නැති පරිදි, හැම තැනට තමන් ඇගි වූ පරිදි, දක්මින්[27] "අග්ගොහමස්මිලොකස්ස" - යනාදීන් සිංහනාද කළහ. මවුකුස්හි පිළිසිඳැගත් කල්හි සෙයින් මැ මවුකුසින් ප්‍රසූත වූ කල්හි දු දෙතිස් පූර්වනිමිත්තයො[28] පහළ වූහු. එ කල්හි දෙ නුවරැ රජ දරුවො බොසතාණන් ගෙනැ කිඹුල්වත්පුර[29] මැ ගියො.

එ දවස් කුළුදෙවුල්[30] ඍෂියාණො සුදෙවුන් මහරජාණන් ගෙහි වළඳා දිවා විහාර සඳහා තව්තිස දෙව්නුවර[31] ගොස් නඳුන් උයන්හි සමවත් සමවැද නැංගාහු, සැණ[32] කෙළෙනා

---

[1] සුද්ධාවාස
[2] පෙරට වැ
[3] වව
[4] මහානුභාව පිතෙක
[5] සිට ම
[6] විශාරද වැ - හැම, විසෙදා-ජා අටුවා
[7] සිරුරු
[8] සැනැහැවි-මු
[9] දුහුල් සුඹුළුවෙන්
[10] පැදුම් දසා, පැදුම් දිසාව
[11] අපරිමිසෙ
[12] ලෝධාහි-හැම
[13] දෙව් මිනිස්සු
[14] කෙනකුනුදු
[15] වැඩිසිටි
[16] කොහිදැයි
[17] සතර දිගද්-මු
[18] දිසා, දිසාව
[19] සත්පියවරක්
[20] නඟා සිටියො, ගොස් වැඩ සිටියො
[21] බඹහු
[22] යොදුන් තුනක්
[23] විජතුරා
[24] සක්-මු
[25] පින්බහ
[26] රුවන්මිරිවැඩි
[27] දක්වමින්
[28] මහ පූර්වනිමිත්තයො
[29] කිඹුල්වත් නුවර
[30] කුළුල්දෙව්
[31] දෙව්නුවරට
[32] සැණකෙළි

දෙව්පිරිස් දැකැ “මෙ වෙනි[1] සොම්නසෙක් තොපට යම් කලෙකැ නුවූවිරී යැ. කවර කරුණෙන් මෙසෙ සැණකෙළුව?” යි පුළුවුත්හු. එ සඳැ දෙවියො සුදෙවුන් මහරජහු පුතණු[2] කෙනෙක් උපන්හු. ඔහු බොමැඩැ හිඳැ බුදු වැ ධම්සක්[3] පවත්වති. “ඔවුන් ගෙ අනන්ත වූ බුද්ධලීලා බලම්හැ.[4] බණ අසම්හ යි, සොම්නස්මහ”[5] යි කීහු. තවුස්පාණො[6] දෙවියන් ගෙ තෙපුල් අසා වහවහා දෙව්ලොවින් බැසැ රජගෙට වැඳැ පැන්වූ[7] අස්නෙ වැඩැ හිඳැ[8] “මහරජ, තා පුතණු කෙනෙක් උපන්හු ල. ඔවුන් දක්මහ”යි[9] කීහ.

එ කල්හි රජ, කුමරු[10] පළඳනායෙන් සැදි පුතණුවන් වඩාගෙනැ තවුස්පාණන්[11] වඳනට එළවි යැ. එ කෙණෙහි බොසතාණන් දෙපත්ල පෙරළි සෘෂියාණන්[12] මුදුනෙහි පිහිටි යැ. එ අත්බැවැ බොසතාණන් ගෙන් වැඳුම් ගන්නට නිසි කෙනෙක් මුළු තුන්ලොවැ ඇත්තාහු නො වෙති.

ඉදින් නො දැනැ බොසතාණන් හිස සෘෂියාණන් පා මුලට එළවූහ නම්, ඔවුන් හිස් සත් කඩක් වැ පැළෙයි. එ කල්හි සෘෂියාණො හුනස්නෙන් නැගී බෝසතාණන් වැන්දහු.[13] රජ එ පෙළහර දැක තමා පුතණුවන් වැන්ද. සෘෂියාණො අතීතයෙ සතලිස් කපක් හා අනාගතයෙහි සතලිස් කපක් හා මෙස අසූ කපක් දක්ති.[14] ඔහු බොසතාණන් ගෙ රූප සම්පත් දැකැ “බුදු වෙ හො” බුදු නො වෙ හො?[15] “බලන්නාහු, එකාන්තයෙන් බුදු වන සෙ දැක සතුටි වැ සෙන්නට වන්හැ. එක්බිති “මම මොහු, බුදු වූවහු[16] දක්මි හො නො දක්මී හො?”[17] බලන්නාහු, අතුරෙහි මැ තමන් මියැ අරූතෙලෙහි උපදනා සෙ දැක එ උතුමා දක්නා[18] නො ලැබෙමි”[19] වලප්නට වන්හැ. ඇමැත්තො එ දැකැ, “වහන්සෙ, කුමට සෙව? කුමට වල්පව” යි පුළුවුත්හ. “මොහු බුදු වන සෙ දැකැ සතුටි වැ[20] සෙමි; මා මොහු නොදක්නා සෙ දැකැ රැණි[21] වැ වලම්පි[22]” යි කීහු.

එක්බිති බොසතාණන් පස් වන දවස් නහවා පායින් ගන්වා රජගෙ[23] සිවුදැගඳින් පිරිබඩ කොටැ ලද පස්මල් ඉසැ හිඳිනා අසුන් පනවා සිවු වෙ[24] ගෙවා දත් බමුණන් අටතු රාසියක් දෙනා ඇරැ හිඳුවා[25] කිරිබත් වළඳවා සත්කාර කොටැ ලකුණු බැලැවූහු.[26] හැම දෙන මා සමඟ හුන් ප්‍රධාන බමුණන් අට දෙනා කෙරෙන් සත් දෙනෙක් බොසතාණන් දෙතිස් මහපුරිස් ලකුණු දැකැ “මෙ දරු ගිහිගෙයි සිටියෙ, සක්විතිරජ වෙ,[27] පැවිජි වුව, බුදු වෙ”යි කීහු.[28] ඔවුන් ඇම දෙනා හට[29] ළඳරු කොණ්ඩඤ්ඤ නම් බමුණු දරු බලා “එකාන්තයෙන් බුදු වෙ” යි කී.

---

[1] වැනි
[2] පුතණුවො
[3] දම්සක්
[4] බලම්හ
[5] සොම්නස් වුම්හ යි
[6] තවුසාණො
[7] පැනවූ
[8] හිඳ
[9] බලම්හ
[10] කුමර
[11] තවුසාණන්
[12] සෘෂියාණන් ගෙ
[13] වැන්දාහ
[14] දන්ති, දකිති
[15] බුදු වෙයි හොයි-බුදුනො වෙයි හොයි; බුදු වෙ හොයි බුදු නො වෙයි හොයි
[16] බුදුවූවාහු-මු
[17]
[18] දක්නට
[19] ලබමියි
[20] සතුටුයෙමි
[21] රැහැනි
[22] වලපම්
[23] රජගෙයි, ගෙයි
[24] තිණ්ණං වෙදානං පාරගෙ-අටුවා
[25] අසුන්හි හිඳුව
[26] බැල්වුහු
[27] වෙයි
[28] කීවාහු
[29] අට දෙනා හට-මු

එක් දවසක් රජු ගෙ වප් මඟුලෙක් වී යැ. එ දවස් මුළු නුවර දෙව් නුවරක්[1] සෙයින් සැදුහැ. රජ දෙව්පිරිස් බඳු මහපිරිවරින්[2] නික්මෙන්නෙ, පුතණුවන් වඩා-ගෙනැ කෙත්-වත් අබියෙසැ ගනසා දඹරුක්පයෙක්හි[3] යහන් සලකා පුතණුවන් එහි වඩා-හොවා උඩ විසිතුරු වියන් බඳවා වටා කඩතුරා බඳවා රකවල් දී සව්බරණින්[4] සැදී ඇමැති දහස් පිරිවරා කෙතට ගියෙ,[5] එ සඳැ බොසතාණන් පිරිවරා හුන් කිරි මවුහු රජු ගෙ ඉසුරු බලන්නට ජවනිකායෙන් පිටත් වූහු. බොසතාණන් ඇතුළු වටනැ කිසි කෙනකුන් නො දැකැ හොත් තැනින් නැඟි පලක් අවුළුවා වැඩ-හිඳැ 'අනාපන්'[6] හවා පළමුවන ධැන්[7] නිපද වූ කල්හි, කිරි මවුහු ඇතුළු වටනැ වැදැ බලන්නාහු එ පෙළහර දැකැ ගොස් රජ හට කීහු. රජ වෙළවි වැ අවුදු දඹරුක්[8] නො පියා සිටි, සෙ[9] දැකැ, පලක් බැඳැ යහන් මතුයෙහි උන් **බොසතාණන්** දැකැ "පුතණුවෙනි, මෙ දෙ, වැනි වැඳුමැ"[10] යි බැසැ-හෙවැ වැන්ද.[11]

එක්බිති **බොසාතාණො** පෙරඩ මසැ සඳ සෙ සිරින්[12] වැඩැ සත් හැවිරිදි විය පැමිණැ **සක්දෙව්රජහු** ගෙ යෙදුමෙන් **විශ්වකර්මයා** විසින් මවා දෙන ලද සොම් සිහිල් පහන් දිය පිරුණු පස් පියුමෙන් සත් රුවන්මුවා[13] පොකුණෙහි පොකුණෙහි සහ පිරිවරින් දියකෙළි කෙළැ[14] ක්‍රමයෙන් වැඩැ[15] සොළොස් හැවිරිදි විය පැමිණැ මුළු ලොවට එක් රජ වූහු.

එ කල්හි පියමහරජාණො **හිමන්**[16] **ගිමන් වසන්**[17] තුන් ඍතුවට නිසි කොටැ දිවවිමන් පරයන තුන් පහයක් කරවා "එකි එකි කුලෙන් "එකි එකි කුමරියක[18] සඳා දී එවන්නෙ"යැ යි නෑයනට හසුන් දුන්හු. එ කල්හි රජදරුවො "**සිද්ධත් කුමරු**[19] සිවුමැලි යැ; ළදරු යැ; කිසි ශිල්පයක් දන්නෙ නො වෙයි; සඞ්ග්‍රාමයෙක් වී නම්, කුමක් කෙරෙයි? ඇපි අප දරුවන් නො දෙම්හ"යි කීහු. එ පවත් අසා **මහබොසතාණො** "මාගෙ ශිල්ප බැලියටියන් අන් සත් දවසෙකින් එන්නෙ යැ"යි නුවර බෙර පියෙවි කරවා සත් වන දවස් රාජාඞ්ගනයෙහි මඩුවක් කරවා මඩුයෙහි මහ පිරිස් පිරිවරා වැඩැ-හිඳැ, දහසක් පිරිමින් දුනුදිය නගන දුන්නක් ගෙන්වා-ගෙනැ[20] යට දුනු මුඩාව වම් පයැ මහපට ඇඟිලි පිටැ[21] තබා හුනස්නෙ[22] මැ හිඳැ දුනුදිය නගා, අපොළො[23], මුළුලො[24] එකකොලාහල කොටැ අනුන් හා අසාධාරණ කොටැ ලොකයෙහි වැටෙන තාක් ශිල්ප දැක්වූහු. එ දැක්වූ පරිදි **සරභඞ්ග** ජාතකයෙහි ආ නියායෙන් දත යුතු.

එකල්හි ශාක්‍ය රජදරුවන් විසින් සඳා-දෙන ලද සතලිස් දහසක් නළුවන් පිරිවරා නන් විසිතුරු මිණිරසින් අලු රුවන්විමන්[25] බඳු තන් පහාකුස්හි නැටුම් ගඳෙවු[26] ගත්

---

[1] 'දෙවවිමානංවිය-ජා අටුවා
[2] මහපිරිස් පිරිවරා
[3] දඹරුප්පයෙක්හි
[4] සවබරණින්
[5] ගියෝ-මු
[6] අනාපන්සි
[7] දැන, ධැන ධ්‍යාන-මු
[8] දඹරුක
[9] සේය, සේ
[10] වැඳමයි
[11] වැඳි
[12] සඳසිරින්
[13] සත්රුවන්මුවා-මු
[14] දියකෙළකෙළ, දියකෙළ
[15] වැඩී
[16] හිමත්
[17] වසත්
[18] රජකුමරියන්
[19] කුමාර,
[20] ගෙන්නාගෙනැ
[21] මහපට ඇඟිල්ලෙ, මහපට ඇඟිල්ල
[22] හුන් සේ මැ
[23] අත් පොළා
[24] මුළුපොළොව
[25] රන්විමන්, රුවින් විමන්
[26] ගඳවු, ගඳැව්-මු

සුරවමියන් බඳු වර වමියන් ගෙ මඳලස් වහස්[1] බැල්මෙන් පිනපිනා මහත්[2] සම්පත් අනුභව කරන්නාහු, එක් දවසක් උයන් කෙළියට[3] යාටි වැ පහයින් බැසැ රුවන්රිය අරා සියුරඟසෙනඟ පිරිවරා උයන් වඩනාහු. ජරාරූ දැක නැවැතැ දෙවන වරැ ව්‍යාධි[4] රූ දැකැ, තුන්වන වරු මළ රූ දැකැ, සතරවනවරු පැවිජිරූ දැකැ උයන් ගොස් දෙව්පිරිස් පිරිවරා **නඳුන් උයන්** වන් **සක්දෙව්රජහු** ගෙ ලීලායෙන් උයන්කෙළි කෙළැ මඟුල් පොකුණෙහි සනහා[5] මඟුල් සලවට[6] වැඩැ-හිඳැ **විස්කම්** දෙව්පුත්හු විසින් **මඟුල්කපු** වෙස් ගෙනැ දසදහසක් දිවසළුවෙන් හිස් වෙළා මිණිවොටුනු පළඳවා සව්බරණින්[7] සදන ලද්දාහු, පසඟතුරු රැවින් හා මඟුල්ගීන් දසදිසා[8] පුරමින් රුවන්රිය අරා යසසිරින් වොරජමින් නුවර වැදැ **කිසාගොතමිය** විසින් කියන ලද **නිබ්බුතපද** අසා සුවහස්[9] වටනා මුත්හර දී පහාතල අරා සිරියහන්හි වැඩැ හොත්හු.[10]

එකල්හි දිවසරන් බඳු සතලිස්දහසක් නළුවො සව් බරණින්[11] සැදී, පසඟතුරු ගෙනැ මහපුරිසා[12] පිරිවරා[13] නැටුම් ගඳෙවු[14] පැවැත්වූහු. එකෙණෙහි මහබොසතාණො නිදන්නට වන්හු. ඔවුන් නිදන සෙ දැකැ නළුවො තමන් තමන්[15] ගත් පසඟතුරුයෙහි වැතිරැ හෙවැ නිදන්නට වන්හු.

එකල්හි මහබොසතාණො පිබිදැ යහන්මත්තෙ පලක් බැඳැ වැඩැ-හුන්නාහු, ගඳතෙලෙ[16] දිළියෙන පහනින් නිදි ගත් මාගමුන්, නැහැ හඬවනුවන්, මීයෙන් වැහෙන කෙළින් තෙත් සිරිරු ඇතියවුන්, දත් කනුවන්,[17] කස් නවුන්[18] වලප්නවුන්. වළ කට[19] ඇතියවුන්, නොමුවහ රහස් පියෙස් ඇතියවුන්, දුගඳ වා[20] විහිදුනවුන්, දැකැ සංවෙග කොටැ ශක්‍රභවනයක් බඳු මහල්තල අමුසොහොනක් සෙ වටහා-ගිය කල්හි, මුළු තුන්ලො[21] ගිනිගත් ගෙකක්[22] සෙ දැකැ “අද මා පැවිජි වන්නට ගිය මැනැවැ”යි යහනින් නැඟී, ගොස් හිණිගෙහි[23] හොත් **සත්**[24] මහ ඇමැත්තා පොබයා-ගෙනැ අසකු සඳා ගෙනැ එන් කොටැ අස්හලට නඟා-යවූහු.

හෙ ගොස් දිලියෙන පහන් ඇති සමන් මල්වියන් යටැ රමණී[25] බිම් පියෙසැ සිටි **කත්**[26] නම් අස්රජහු දැකැ ඉතා කැකුළු කොටැ සදන්නට[27] පටන් ගත්. එ සඳැ, අස්: “අද මහිමි මහබිනික්මන් කටටි බඳැ”යි සතුටු වැ මහත් කොටැ කුල්නට වනැ. පැතිරැ-ගිය එ හඬ දෙවියො කිසි කෙනකුන් නො ඇසියැ දුන්හු.

---

[1] පහස්
[2] මහ-මූ
[3] කෙළනට
[4] ව්‍යාධි රූප වියදි රූ.බැධිරූප, බැදිරූ, වැදිරූ
[5] සැනහා-මු
[6] යට
[7] සවබරණින්
[8] දසදික්
[9] සුවහසක්
[10] වැඩහුන්හු
[11] සවබරණින්
[12] මහාපුරිසා, මහපුරිස්
[13] පිරිවරා සිටැ
[14] ගඳවූ, ගැයුම්-මු
[15] තමතමන්
[16] ගඳතෙල
[17] කන්නවුන්
[18] කස්නවුන් වලප්නවුන්-ඇතැම්
[19] වල කට ඇතියවුන්
[20] දුදපා
[21] තුන්ලෙව්, තුන්ලෙව්හි
[22] ගෙයක්
[23] හිණිගෙයි, හිනගෙහි - මු -
[24] සඳ
[25] රමණීය
[26] කන්ථක
[27] සදන්ට-මු

බොසතාණො රාල්[1] කුමරුන් දැකැ පහයින් බැසැ අශ්වයා කරා එළඹැ, “මෙ රෑ තො මා තරවා. මම් මුළු ලො තරවමී” නැඟී අස් පිටැ වැඩැ-හුන්හු. එ අස් දිග අටළොස් හතැ. දිගට සුදුසු උසා.[2] ඇතියෙ යැ. බල ඇත්තෙ යැ, ජව ඇත්තෙ යැ, සව්සුදැ.[3] උහු කුල්නා හඬ හො ඇක්මෙන හඬ හො මුළු නුවරැ පැතිරැ-යන බියෙන් දෙවියො තමන්ගෙ අනුභාවයෙන් කුල්නා හඬ නො පැවැත්තැ දුන්හැ. ඇක්මෙන ඇක්මෙන පියවරට අත්[4] දිගු[5] කොටැ අත්ලෙහි ඇක්මවා-ගත්හු. **මහාබොසතාණො** අස්පිටැ වැඩැ-හිඳැ සන් මහ ඇමැත්තා අසූ වල[6] ගන්වාගෙනැ පසළොස්පැ ගිය වේලෙහි[7] මහදොර අබියෙසට වැඩියො.

එකල්හි[8] රජ: “**බොසතාණන්** යම් කවර වේලෙකැ නුවරදොර විවර කරවා නික්මෙතී[9]” බියෙන් යුවළ දොර පුවරියෙහි[10] එකි එකී දොරබියෙළි දහස් පුරුෂයන්[11] මිසැ විවර නොකට හැකි පරිද්දෙන් කැරැවි. **බොසතාණො** වනාහි ඇත්ගණනින් කෙළ දහසක් ඇත්නට බල ඇතියව්හු[12] පුරුෂගණනායෙන් දසකෙළදහසක්[13] පුරුෂයනට බල ඇතියව්හු. “ඉදින් දොර විවර නොවී නම්, මම අස් පිටැ හුන්නෙම් මැ[14] වල්පතැ[15] ගෙනැ සිටි **සන්හු** සමඟ[16] අසු දෙකළවෙයින්[17] හැඳැවාගෙනැ අටළොස් හත් පවුරු පැනැයෙමි” සිතූහු සන් මහ ඇමැති: “ඉදින් දොර විවර නොවී නම්, මහිමියා මා දසරුයෙහි හිඳුවාගෙනැ අසුරජු දකුණු කිසිල්ලෙන් ගෙනැ පවුරු පැනැ යෙමී” සිතී යැ. අස්තෙමෙ දු: “ඉදින් දොර විවර නොවී නම්, මම මහිමියා පිටැ හිඳුවා ගෙනැ, වල්හි ගත් **සන්හු** සමඟ පවුරු පැනැ යෙමී” සිති. එකල්හි දෙවියො දොර විවර කළො.

එ කෙණෙහි මැ මරදෙව්පිත් අවුදු අහසැ සිට **සිද්ධත්** කුමර, අන්[18] සත්දවසෙකින් තට **සක්රුවන්**[19] පාළ වෙයි; දෙ දහසක් කොදිව්[20] හා[21] සතර මහ දිවින් සැදුම් ලද සක්වළැ එක්රජ කෙරෙහි;[22] නො යා, නවත”යි, කී. එ කල්හි **බොසතාණො**[23] තො[24] කවරෙහි? පිළිවිසැ, “මම් මරදෙව්පිත්මි” කී කල්හි “මට **සක්රුවන්** පාළ වන බව් දන්මි. මම රජ නො කැමැත්තෙමි. දසදහස්ලොධා ගුගුරුවා බුදුවෙමි” වදාළො. එ සඳැ මරැ: “මෙ තන පටන් ගෙනැ තට කාමාදි තුන් විතර්කයෙන් යම් විතර්කයෙන් උපන් නම්, දනිම් නො!” යි සිත්හසර[25] බලනුයෙ සෙයක් සෙයින් පා නොවී.

**බොසතාණො** අතට පත් සක්විති රජ අලුයමැ ඇමූ කෙළ පිඬක් සෙයින් පියා “ඇසළපුනුපොහො” දවස් නුවරින් නික්මැ-සිටැ නුවර බැලියැටි වූහු. එකෙණෙහි මහ

---

[1] රහල්
[2] උප
[3] අසුදසුද, සුදු
[4] අත
[5] දිග්, දිග
[6] වාලධිය
[7] වේලේ
[8] එකල්
[9] නික්මෙතැයි, නික්මයන
[10] පුවරුයෙහි
[11] දහස් දහස්-මු
[12] ඇති වූහ
[13] කෙළලක්‍ෂයක්-හැම
[14] හුන්නෙම්, හුන්නේ මැ
[15] වල්පත සිටි
[16] හා සමඟ
[17] දෙකළවින්
[18] අදින්-මු
[19] සත්රුවන් හැම
[20] කොදෙව්
[21] හා සමඟ
[22] කෙරෙහි
[23] බෝසත්-මු
[24] තෙපි කවර-මු
[25] සිත්හර ඔතාරා පෙඛො, සිදුරු බලන්නේ, යනු මෙතන්හි ජා ගැටපදයි

පොළො කුඹල් සකක් සෙයින් කැඩි ඔවුන් නුවර බල්වා සිටිවි යැ.[1] ඔහු නුවර බලා නැවැතී අස්පිටැ හිඳැ මහත්[2] පෙරහරින් මහත් පිරිවරින් වඩිත්. එකල්හි දෙවියො **බොසතාණන්** පෙරට[3] සැටදහසක් මිණිදඬු වැට පහන් නැගුහු. පිටිපසැ දු දකුණත් පසැ දු වමත්පසැ දු සැට සැටදහස් මිනිදඬුවැටපහන් නැගුහු. සෙසු දෙවියො සක්වළගබ් පිරි, සක්වළ මුවවිටු දක්වා අපමණ මිණිදඬු වැඩ පහන් ගෙනැ සිටියො තුබු දෙවියො ද නා ගුරුළු ගජඹ ආදීහු ද දිවගඳින් දිවමලින් දිවදුමින් දිවසඳුන් සුන්නෙන් පුදමින් යෙති. පරසතු මදාරා ඈ දිවකුසුමින් මහ මෙවැසිදහරින් මෙන් අහස්කුස් පිරිණි. දිවගඳෙවු පැවැත්තැ. පෙරටද් පිටිපසැද් දකුණත්පස්හිද් වමත්පස්හිද් අටසැට සුවහසක්[4] දිවපසඟතුරු පැවැත්තැ. සෙසු දිවගඳැවියො[5] පසඟතුරු ගෙනැ සක්වළ මුවවිටු දක්වා සිටියාහැ. එ හඬ මුහුද්කුසු[6] මහමෙගජුන් [7]සෙයින් යුගඳුරු පව්යෙහි රළ ගැසෙන හඬ සෙයින් පොළො තෙලෙහි පටන් ගෙනැ අකනිටා බඹලො දක්වා එකකොලාහල වි යැ. මෙබඳු ශොභායෙන් වඩනාහු, එ රෑ තුන් රජයක් ඉක්මැ තිස්යොජනෙකින් මත්තෙහි **අනොමා** ගඟ තෙරට පැමිණියො.

එ අස් වනාහි නැබින් තුබු සක්නිමෙක්හි ඇවිදුනාක්හු සෙයින් සක්වළ මුවවිටියෙහි ගෙනැ සක්වළ ගබ වටාලා පෙරවරු බත්වේලෙ අවුදු සිටිනට නිසි ජව ඇතියෙ, එදා දෙව්බඹනාගුරුළු ආදීන් විසින් අහසැ සිටැ වුහුටු ගඳමල්හි ගැලී-ගිය සිරිරු ඇති වැ, දිවකුසුම් කඩා යනුයෙන් ලස් වැ තිස් යොජනක් තැන් මැ ගියෙ.

එ කල්හි **මහබොසත්** ගංතෙරැ වැඩැ-සිටැ, "මෙ කිනම් ගඟෙකැ"යි ඇමැත්තා පිළිවිසැ **අනොමා** නමැ යි කීයෙන් "අප ගෙ පැවිජි අනොම, අලාමක වෙ"යි අස් හට විළුම්සන් කොටැ අසු අඩ[8] ඉස්බක් පමණ පළල් ගඟ පැනැ පරතෙර ගොස් සිටි කලැ අසු පිටින් බැසැ රිදීපටක් බඳු වැලි විටැ වැඩැ පළඳනාද් අසුද් සන් මහ ඇමැත්තා හට දක්වා-දී, පැවිජි නො වියැ දි ඔහුට සමු දී, සිටැ, "මෙ කෙහෙ මහණ හට සරුප් නොවෙ"යි තමන් හිසැ කෙහෙ කපන්නට නිස්සන් නැත්තෙන්[9] දකුණ'තින් කඩුව ගෙනැ වමතින් මුහුළු[10] හා සමග කෙහෙ ගෙනැ සිඳැ, "ඉදින් මම බුදු වෙම් නම්, අහසැ සිටිව යි, බුදු නො වෙම් නම්, බිමට බසීව"යි අහසට වුහුට. එ කෙස් දා[11] යොජනක් පමණ තන්[12] නැගි අහසැ සිටියෙ යැ. **සක්දෙව්රජ** යොජුන් පමණ රුවන් කරඬියෙකින්[13] කෙස්දා පිළිගෙනැ මෙර මුදුනෙහි **තව්තිසා** දෙව්නුවරැ[14] **සිළුමිණිසෑ** පිහිටිවි.

එ සඳැ **මහබොසත්**, "මෙ මා හන් කසිවත් මහණ හට සරුප් නොවෙ"යි සිතී යැ. එ කෙණෙහි මහබඹ මහණ පිරිකර ඇරැ දක්වා-දී, සිවුරු හැඳ පෙරෙවැ උතුම් පැවිජි වෙස් ගෙනැ හැම සංවර ඉටා-ගත් කල්හි, ගැළැවු සළු සඟළ[15] හිසින් පිළිගෙනැ බඹලොවට ඇරැ දොළොස් යොජුහු **සළුමහසෑ** පිහිටිවි.

---

[1] සිටිය
[2] මහ
[3] පෙරට වැ
[4] අටසැටදහසක්-හැම
[5] දෙවියො
[6] මුහුදකුස මුහුදුකුස
[7] ගජුම්
[8] අසුඅට ඉස්බක්-මු
[9] නැති හෙයින්
[10] මුහුලස
[11] කෙස් ද
[12] තන්හි
[13] කරඬුයෙකින්-මු
[14] දෙව්නුවරස
[15] සඟළද්

**මහබොසතාණො** පැවිජි වැ **අනුපියඅඹවනයට** වැදැ පැවිජිසුවෙන් උපන් සොම්නසින් සතියක් එහි දවස් යවා[1] පෙරවරු පයින් තිස්යොජනක් තන් ගොස් රජගහානුවර වැදැ ගෙපිළිවෙලින් අහර සිඟත්.

එකල්හි මුළු නුවර මහසත්හු ගෙ රූදස්නෙන් **නාලාගිරිහි** වන් රජගහා නුවර සෙයින් අසුරන් වන් දෙව්නුවර සෙයින් ඇළලවී.[2] නුවරවැසියො ගොස් "මහරජ, මෙසෙ වූ සත්ත්වයෙක් නුවර වැද අහර සිඟයි. උහු[3] දෙවියකු බව් නො දන්මහ.[4] බඹකු[5] නයකු ගුරුළකු යකකු මිනිසකු බව් නො දන්මහ"යි සැල කළො.

රජ සිහිමැදුරෙ සිටැ බලනුයෙ, **මහපුරිසා** දැකැ විස්මිත වැ, "මම ද මොහු දෙවියකු බව නො දන්මි. බඹකු නයකු ගුරුළකු යකකු මිනිසකු බව් නො දන්මි. තොපට උපායක් කියමි. මොහු පස් පස්[6] යව. ඉදින් දෙවියෙක් වී නම්, බඹෙක් වී නම් නුවරින් නික්මැ දෙව්ලො බඹලො බලා යෙයි. නයෙක් වී නම්, පොළො කිමිදැ යෙයි; ගුරුළෙක් වී නම්, අහසැ පියා පහර යෙයි; යකෙක් වී නම්, නොපැනි යෙයි; මිනිසෙක් වී නම්, ලද් අහර ඇරැ එක් තෙනෙකැ[7] හිඳැ වළඳ කෙරෙ"යි යෙදී.

**මහසත්** යපෙන පමණ අහර[8] සිඟා-ගෙනැ වන් දොරින් නික්මැ **පඬවනම්** පවු අබියෙසට එළබැ රුක්සෙවළල්ලෙක්හි[9], වැඩැ-හිඳැ අහර වළඳන්නට ආරම්භ කෙළෙ.[10] පෙරැ ඔවුන් තෙවැසි[11] ගඳහැල් සාලෙබත් නන් අග්රෙසෙත්[12] වැළැඳුනට ඇසැ නො පහළ විරි අහර අත පහරුත් මැ,[13] අතුණු පෙරැළි කටින් නික්මැ යන පමණ පිළිකුල් උපනැ එකල්හි "**අහරැ පිළිකුල්සඤ්ඤ**"[14] භාවනා කොටැ පස්විකා වැළඳූහු.

පස් පස් ගිය දූතයො දැකැ ගොස් එ පවත් රජ හට සැළ කළහ. වෙලෙව් වැ[15] ගොස් **මහසත්හු** කරා එළබැ දැකැ පැහැදැ නම්-ගොත් පිළිවිසැ පෙරැ තමා සබඳ[16] බව් දැනැ තමාගෙ රජ ඔව්නට පිළිපෙවී යැ. ඔහු "මහරජ, මට රජෙන් කම් නැති. අතට පත් **සක්විති** රජ පියා ආයෙමි දැන් බුදු වන්නට යෙමි." වදාළහ. රජ,[17] තෙපි[18] එකාන්තයෙන් බුදු වව, බුදු වූ[19] කලැ මා ගෙ විජිතයට වඩනෙ මැනැවැ"යි අයදී යැ.

**මහසත්** රජ හට පිළින දී ගොස් **කලම්** තව්සා හා උද තව්සා හා දෙතව්සන් ගෙ අසපුවට එළබැ, ඔවුන් ගෙ සමයෙහි නිවන් නැති සෙ දැකැ, එහි ඉඳැ 'රුවාරු[20] අට

---

[1] ගළවා
[2] උලෙළවී-මු
[3] ඔහු-මු
[4] නොද දන්මහ
[5] බඹකු බව් යකකු බව් නා-ගුරුළු බව් මිනිසකු බව්-කිසි
[6] පසු පස්-මු
[7] තැනෙක්හි
[8] අහරක්
[9] රුක්සෙවණැල්ලෙක්හි
[10] කොළො
[11] නෙවැසිගත්
[12] නන්-නන් අගරෙසෙන්-මු
[13] පහරීත්මැ
[14] අහරපිළිකුල් සංඥා-මු
[15] එ වෙලෙහි දිවැ
[16] සබද්බව්
[17] රජතෙම
[18] තොප
[19] තොප බුදු වූ කලැ පළමු කොට මාගේ විජිතයට-මු
[20] රූපාරූප

සමවත්' උපයා උල්වෙල් දනවු ගොස්, නිල්දලා හො තෙර රමණී 'සල්වලයෙහි[1] වෙසෙමින් සහවුරුද්දක් පොළො පෙරළනුවන් සෙයින් අහට ගැට ලනුවන් සෙයින් කිසි කෙනකුදු විසින් නො කට හැකි කෙළ පත් මහත් වීර්යය කොටැ, එයින් නික්මැ ගම්-නියම්ගමට පැමිණැ, සිනිඳු අහරින් සිරිරු[2] සතපාගෙනැ, වෙසඟපුනුපොහො දවස් පස් මහසිහින දැකැ විචාරා පාසිවුරු ගෙනැ වේලා බලා අජපල් නුගරුක් මුල්හි සවනක් රසින් දිලියෙමින් වැඩැ හුන්හු.

එකල්හි උරුවෙල් දනවුයෙහි සෙනානී නම් නියම්ගම්හි සෙනානී කෙළෙඹියා දූ සුජාතා නම් දැරි තමා විය පත් කල්හි, "ඉදින් මම සමාන කුලදරුවක්හු කෙරෙ වැසැ කුලුඳුලෙ පුතකු ලදිම් නම්, තට හවුරුදු පතා ලක්‍ෂයක් ධන විසඳා කිරිබත් දෙමි" නුග දෙවියා අයදැ බරණැස් සිටිහු[3] කෙරෙ වැසැ යස නම් පුතකු ලද කල්හි දහසක් දෙනුන් වැල්මී වෙනෙහි කවා, ඔවුන් කිරි දෙවැ පන්සියක්[4] දෙනුන් පොවා ඔවුන් කිරි දෙවැ දෙසියපනස් දෙනක[5] පොවා, ඔවුන් කිරි දෙවැ එක්සියපස්විසි දෙනක පොවා, ඔවුන් කිරි දෙවැ සූසැට දෙනක පොවා, ඔවුන් කිරි දෙවැ දෙතිස් දෙනක පොවා, ඔවුන් කිරි දෙවැ සොළොස් දෙනක පොවා, ඔවුන් කිරි දෙවැ අට දෙනක පොවා, ඔවුන් කිරි[6] මෙසෙ බොල් මියුරු ඔජස් ඇති වූ කල්හි වෙසඟ පුනුපොහො දවස් උදය මා නැඟී එ අට දෙනුන් කිරි දෝනා සඳහා මුදා-ලූ[7] වස්සන් දෙනුන් තනමුලට ළඟා නොවූ[8] කල්හි, එළවු නවමු බඳුන්[9] පිරි කිරි වැහුණු[10] කල්හි, එ පෙළහර දුටි[11] සුජාතා සිය අතින් කිරි නෙැ නවමු බඳනෙහි එවැ[12] අගරු දෙව්දුරු - සඳුන් - කළුවැල්දර උදා කිරිබත් පිසන්නට පටන්ගත්.

බත් පැසෙන කල්හි මහත් මහත් බිබුළු නැඟී දක්‍ෂිණාවෘත්ත වැ ඇවිද්දි. එක ටිකෙකුදු පිටතැ නො හෙයි.[13] උදුනෙන් මදදුමෙකුදු නොනැඟෙයි. එ කල්හි සතර වරම් මහරජහු අවුදු[14] උදුනෙ සතර දෙසැ රකවල් ගත්හ. සක්දෙව්රජ අවුදු දදා බට පෙණෙහෙළි[15] නඟා[16] ගිනි දල්වයි. මහබඹ එජ් මුදුනට කොටැ සෙසත් නඟා සිටියෙ යැ. දස දහස් ලොධාහි දෙවියො දෙව්ලොව්හි මිනිස් ලොව්හි[17] ඇති තාක් ඔජස්හි[18] තමන් ගෙ අනුභාවයෙන් දඬුළුල්බෑ[19] මීයක් පෙළා.[20] මී ගන්නවුන් සෙ[21] ගෙනැ එ බජනෙහි[22] ඔත්හු[23]

සුජාතා එ අසිරි මහපෙළහර දැකැ "පුණු" නම් දස කැඳවා බැණැ "මෙ තෙක් කල් මෙවෙනි පෙළහරයක්[24] නුදුටුවිරුමු[25]. අපගෙ දෙවතා අද අපට ඉතා පහන් වනැ.

---

[1] සල්වනයෙක්හි
[2] සිරුරු
[3] සිටු, සිටුහු-මු
[4] පන්සියයක්
[5] දෙසිය පනසක් දෙනුන්, දෙනකු
[6] ඔවුන් කිරි-ඇතැම් පොතෙකැ නැති
[7] ලූ
[8] වන හැම
[9] නව බඳුන්
[10] වැහෙන
[11] දුටු
[12] එවා, කිරි වැ
[13] යෙයි.
[14] අවුද්
[15] පෙනෙලි, පෙනලි
[16] නගාලා
[17] ඇතැම් පොතෙකැ නැති
[18] ඔදස්
[19] දඬුවැල්බෑ-මීයක්, දඬුවැල්මියක්
[20] පොළා
[21] සෙයින්
[22] දෙබදනෙහි
[23] ඔසත්හු-මු
[24] මහපෙළහරයක්. පෙළහරයෙක්
[25] නුදුටුවිරුයැ

වෙළෙවි වැ ගොස් දෙවොල හැමැදැ එ"යි නඟා යවු. හො වෙළෙවි වැ වෙළෙවි වැ අජපල් නුගමුලට ගොස් රුක්මුල්හි පැදුන්ලොධා බලා වැඩැ හුන් මහසත්හු ගෙ ශරීරයෙන් නික්මෙන සවනක් රසින් සියලු රුක සතුරුවන් රුකක් සෙයින් දිලිසෙන සෙ දැකැ, "අද අපගෙ දෙවතා රුකින් බැසැ සිය අතින් කිරිපිඬු පිළිගන්නට හුන්නෙ වනැ"යි බිය පත් වැ ගොස් සුජාතාවනට සැළ කළා. හො ඇය තෙපුල් අසා සතුට් වැ[1] තමා දෙටු දූ තන්හි[2] තබා, සව්බරණින් සඳා, ලක්‍ෂයක් වටනා ගන[3] රන්පයක් කිරිබතින් පුරා, රන් තලියෙකින් පියා[4] සුදුපිළියෙන්[5] වසා, තොමෝ සව්බරණින් සැදී, කිරිබත් පය සිය මුදුනෙ[6] තබාගෙනැ, මහත් පෙරහරින්[7] මහත් පිරිවරින් නුගරුක් මුලට යන්නී, මහසත්හු දැකැ සොම්නසින් පිනා, රුක්දෙවිය යන සිතින් දුටු තැන පටන්-ගෙනැ නතු නතු වෙමින් ගොස් හිසින් කසුන්පය බහා-ගෙනැ පියන් ගළවා රන්කොතුරුයේ[8] සුවඳමලින් වැසු දිය ගෙනැ අතැ එවැ පය[9] අතැ තබා[10] බැසැහෙවැ වැඳැ "යම් සෙ මාගෙ මනොරථ[11] මුදුන් පත් ද, එසෙයින් මැ තොපගෙ මනොරථ නිපදිව"යි බැණැ සුවහස් වටනා රන්පය මහසත් හට පියා පැදකුණු කොටැ ගියා.

එකල්හි මහසත් හුනස්නෙන් නැඟී බත්පය ගෙනැ නිල්දලා- හො තෙර[12] ගොස් හැම මහබොසතුන් බුදු වන දවස් සනහන[13] සුපිහිටි තොට පය බහා-තබා දියට බැසැ සනා[14] සිවුරු හැඳැ පෙරෙවැ පැදුන් දසා බලා වැඩැ-හිඳැ එකුන් පනස් පිඬක් කොටැ වළඳා රන්පය ගෙනැ "ඉදින් මම් අද බුදු වෙම් නම්, මෙපය උඩුහො බලා යෙව"යි, "බුදු නොවෙම් නම්, යට හො බලා යෙව"යි දිය පිටැ විහිදැ, එ පය හො මැදට ගොස් දිය පිටින් හොමැදැ උඩුහො බලා අසූ හතක් තන් ගොස් එක් සළාවැටමෙක්හි ගැලී මහකෙළ නාරජහු භවනයට වැදැ පෙර තුන් බුදුන් වැළඳූ තුන් පය මතු කොටැ එයට යට වැ සිටි කල්හි, එ හොතෙර[15] පුපිපි සල්වෙනෙහි දිවාවිහාර කොටැ සවසැ දෙවියන් විසින් සල්වෙනෙහි පටන් ගෙනැ බොමඩ දක්වා පළල අට ඉස්බක් තන්හි රුවන්පවුරු හා රුවන්වැලි සියො රුවන් බිම්හි රුවන් කලස තබා, දිවමහනෙලින් සඳා, තන්හි තන්හි රුවන් තොරණ, මල්තොරණ නඟා රුවන්ඇගෑ මල්ඇගෑ නඟා, එහි මියුරු රැවින් හඬන මිණිකිකිණිදැන් බහා-ලා, නන් විසිතුරු[16] දද පෙළින් හා සෙසතින් සැදුම් ලද මැඟින් දෙව් බඹ නා ගුරුළු ආදීන් විසින් ඉස්නා දිවකුසුම් වහරෙයින් පුදන[17] ලැබෙමින් දිවගඳෙවු නැටුම් පවත්නා කල්හි, දසදහස්ලොධා එක මලස්නක් සෙයින් සැදුණු කල්හි,[18] සාධුකාර ශබ්දයෙන් එකනිනාද වූ කල්හි පුන් පැරුම් සෙත් බමුණා දැන් අටමිටක් කුසතණ ගෙනැ බොමඩට එළඹැ දකුණු දෙසෙහි උතුරුදසා[19] බලා වැඩැ - සිටියො.

---

[1] සතුටු වැ
[2] දෙටදූතන්හි
[3] ඝන
[4] පියාලා
[5] සුදුපිළියෙකින්,
[6] තමාසිය තමාහිස
[7] මහන්තෙන ආනුභාවෙන - අටුවා
[8] රන්කොනරුයෙන්
[9] බත්පය
[10] බහා තබා
[11] මනොරථය-මු
[12] හෝ තෙරට
[13] සනන - මු
[14] සනහා
[15] මහසත් - යනුදු හැම
[16] වෙසතුරු
[17] පුද
[18] "එක ගඳකිළියක් සෙයින් වැසුණු කල්හි" යනු දු - ඇතැම්
[19] උතුරුදිසා

එ කෙණෙහි දකුණුසක්වළ බැසැ රසාතෙලෙහි ගැලී ගියාක් වැනි වි යැ. උතුරු සක්වළ නැඟී බව අග්හි[1] පහරනාක් වැනි වි යැ. ඔහු “මෙ තන්[2] හිඳැ බුදු වන්නට නොතන් වනැ”යි මහබො පැදැකුණු කොටැ පැළ දෙසෙහි දු උතුරු දෙසෙහි දු වැඩැ-සිටැ එසෙයින් මැ ගැලෙන[3] දෙස් දැකැ පැදුන් දසට එළබැ එතන[4] නො ඇළැලසිටි සෙ දැකැ “මෙ හැම බුදුන් විසින් අවිජහිත කෙලෙස් පඳුරු විදහස තනැ”යි[5] තණ අගැහි[6] ගෙනැ සලා[7] එ විගස නිපන් තුදුස් හත් තණපලග්[8] මතුයෙහි මහබොකඳට පිට දී පැදුන් දස බලා දැමී[9] දැමුව මැනවින් “බුදු වැ මිසැ නො නැඟෙමී” සිවුරඟවර ඉතා වැඩැ-හුන්හු.

එකල්හි **සක්දෙව්රජ** එක් යලක් පිඹී කලැ[10] දසදහසක් යොජුන් තවුතිසැ දෙව්නුවරැ පැතිරැ සාර මසින්[11] සන්හිඳුනා ධවනි ඇති එක්සියවිසිරියන් ‘විජයතුරා’ - සක මහපුරිසා පෙරට පිඹිමින් සිටියෙ යැ. එසෙයින් මැ **පන්සිකා** දෙව්පිත් **බෙල්වපඬු**[12] නම් තුන් ගවු පමණ වෙණ ගෙනැ වයමින් සිටියෙ යැ. **සුයාම** නම් දෙව්රජ තුන්ගවු[13] පමණ වල්විදුනා ගෙනැ සලමින් සිටියෙ යැ. **සන්තුසිත** නම් දෙව්රජ මිණිතල් වැට ගෙනැ සලමින් සිටියෙ යැ. **මහබඹ** පුන්සඳක් බඳු සෙසත් වඩා සිටියෙ යැ. **මහකෙළ** නාරජ අසූදහසක් නළුවන් පිරිවරා ස්තුති කෙරෙමින් සිටියෙ යැ. දෙතිස් දෙව්කුමරියො දිවකුසුම් පිරුණු රුවන් සුමුගු ගෙනැ පුදමින් සිටියාහ. සියලු දසදහසක් සක්වළැ දෙවියො සැණවෙස් ගෙනැ හාත්පස්හි දදපෙළ කෙහෙල්පෙළ තොරණ පෙළ මල්දම්පෙළ පුන්කලසපෙළ දුමොළොසුපෙළ මිණිදඬු වැටපෙළ අටමඟලාපෙළ ගෙනැ, පොළොතෙලෙහි පටන් ගෙනැ අකනිටා බඹලො[14] දක්වා, අතුරු නැති වැ සිටියො.

එකල්හි **මරදෙව්පිත්**, “සිද්ධත්කුමර මාගෙ විෂය ඉක්මීයැටි[15] වනැ. ඔහු කාමවිෂය ඉක්මැ නොයා-දුන මැනැවැ”යි දහසක් අත් මවා ගිනි ගෙනැ දිලියෙන නොඑක් ආයුධ ගෙනැ යෙළසියක්[16] යොදුන් **ගිරිමෙවුලා** නම් ඇතහු[17] නැඟී පෙරට දොළොස් යොදුන්, දකුණත් පස්හි දු වමත් පස්හි දු දොළොස් දොළොස් යොදුන්, පිටිපසින් සක්වළගල් දක්වා සිටි, (උසායෙහි) නවයොදුන්, නොඑක් වෙස් නොඑක් අවි ගත්, පොළොව පැළි යන්නාක්[18] වැනි හඬ ඇති මර සෙනඟ පිරිවරා දහසක්[19] යොදුනෙහි පටන් ගෙනැ සෙණ[20] සුවහස් බස්නා කලක් බඳු ගොර බිරම් හඬින්[21] මුළුලොම් එකනිනාද කෙරෙමින් “**සිද්ධත් - කුමරහු** ගන්ව, අන්ව, බඳුව,[22] පයැ ගෙනැ පරසක් වළ පියව”යි අණවමින්[23] එයි.

---

[1] හව අගහි, හව අක්හි
[2] තන්හි
[3] ගැලෙන නැඟෙන සේ ඇතැම්
[4] තැන්, තැන්හි
[5] තැනයයි, තැනයි
[6] අග්හි
[7] සලාලා
[8] තණපලග
[9] දැම්ව-මු
[10] පිඹැජිකලැ
[11] සාරමයෙකින්
[12] බේලුව පාඩව
[13] තුන්ගව්වක්
[14] බඹලොව
[15] ඉක්මවියැටි-මු
[16] යෙළසියයක්-මු
[17] ඇතක්හු-මු
[18] යන්නක්-මු
[19] දසදහසක්-මු
[20] සෙන හැම
[21] මහහඬින්-මු
[22] විදුව
[23] ඇණවමින්

ඔහු එසෙ මරසෙනඟ ගෙනැ එත් එත්, දසදහස් ලොධාහි දෙව්බඹහු නතු නතු වූ දෙසෙහි හී පැලැහැ.[1] මහකෙළ නා රජ පොළො කිම්දැ පන්සියක් යොදුන් මන්දෙරික[2] නම් නාග භවනයට ගොස් දොහො අතින්[3] මුහුණු පියාලා හොත්තෙ යැ. සක්දෙව්රජ විජයතුරා-සක පිටට[4] කොටැ ගෙනැ ගොස් සක්වළ මුවවිටියෙහි සිටියෙ යැ. මහබඹ සෙසත සක්වළගල[5] හෙළාපියා බඹලො බලා ගියෙ.

මෙසෙ හැම දෙව්බඹන් පැලැ කල්හි මහසත් එකලා වැ හිඳැ පිටිපසින්[6] එන මරසෙනඟ දැකැ "මෙතෙක් දෙන මා හුදකලහු යා යුද්ධයට එති. මෙහි මා කිසි නෑ කෙනෙක් ඇත්තාහු නො වෙති. දසපාරමිතාවො මා බොහො කලක් පුටු යොධයන් වැන්නාහ. එබැවින් පාරමිතා බල ගෙනැ මරබල මැඩැ-පිව මැනැවැ"යි පැරුම් සිම්දුමින් වැඩැ-හුන්හු. එකල්හි මරපිරිස් ගල්සෙල් සෙයින් වැතිරෙමින් අවුදු වටා-ගත්හ.

එකල්හි[7] මෙයින් මැ මුහු ලුහුබැඳ-පිව මැනැවැ"යි මරහු විසින් මවන ලද මහ සුළඟහු[8] සතර දෙසින් නැඟී යොජුන් දෙයොජුන් තුන්යොජුන් පමණ ගල් කුළුහු[9] උපුරා අහසට නඟා ලා, වන[10] දු, ගසුදු, රුකු[11] දු, එසෙයින් මැ උපුරා අහසට නඟා ලා, සුන් සුන් කෙරෙමින් ගොස් මහසත්හු කරා පැමිණැ සිවුරු කනකුන් සලන්නට නොපොහොසත් වැ ගියො. එක්බිති "දියවතුරෙහි[12] ගලා පරා-පිව මැනැවැ"යි වලාකුළු සහස් සුවහස් නඟා පොළොව් සිල් කොටැ පියන්නා සෙ වස්වන ලද වැසි වනහිස් ගලමින් ගොස් මහසත්හු ගෙ සිවුරෙහි පිනිබිඳක් සා දියබිඳක් නො හෙළි යැ. එක්බිති පහණ වැසි වස්වන මරහු විසින් මවන ලද මහත් මහත් ගල් කුළුහු දුමමින් දිලියෙමින් අහසින් ගොස් මහසත්හු කරා පැමිණැ දිව මල්ගුළුබවට ගියො. එක්බිති ආයුධ වැසි වැස්වන[13] මරහු විසින් මවන ලද නන් නන් ආයුධයො දුමමින් දිලියෙමින් අහසින් ගොස් මහසත්හු කරා පැමිණැ කිවමල් දම් බවට ගියො. එසෙයින් මැ මවන ලද අඟුරුවැසි දුමමින් දිලියෙමින් අහසින් ගොස් මහසත්හු කරා පැමිණැ දිවමල් බවට ගියෙ.[14] එ සෙයින් මැ මවන ලද හළුවැසි[15] දුමමින්[16] දිලියෙමින් අහසින් ගොස් මහසත්හු පාමුලැ දිව සඳුන් සුනු බවට ගියෙ. එසෙයින් මැ මවන ලද සියුම් වැලිවැසි දුමමින් දිලියෙමින් අහසින් ගොස් මහසත්හු පාමුලැ[17] දිවකුසුම් රොන් බවට ගියෙ. එසෙයින් මැ වස්වන ලද කලල් වැසි දුමමින් දිලියෙමින් අහසින් ගොස් මහසත්හු පාමුලැ දිවගඳ බවට ගියෙ. එක්බිති "සිද්ධස් කුමරහු බවා ලුහුබැඳ පිව මැනැවැ"යි මරහු විසින් මවන ලද සිවුරඟින් යුත් මහ අඳුරු මහසත්හු කරා පැමිණැ හිරිරසින් බුන් අඳුරු සෙයින් අතුරුධන් වී.

---

1 පලහ පැලහ
2 මන්‍දරික, මඤ්ජෙරික අටුවා
3 දෝතින් මුහුණ-මු
4 පිටට ගෙනැ
5 එකස්කොට-හැම, චක්ක වාළකොටිය-අටුවා
6 උත්තරපස්සේන-අටුවා
7 ගත් කල්හි
8 සුළඟ
9 කුළු දු
10 වන දහසදු-හැම
11 රුක් දු
12 දියවගුරෙහි-මු
13 වස්වන ලද
14 ගියො
15 වැලිවැසි-මු
16 දුවමින්-මු
17 කරා පැමිණැ.

මෙසෙ මර මෙ නවමහ වැස්සෙන් මහසත්හු නො නට සෙ දැකැ කො-ගිනින් දිලි[1] මෙරගල් සක්වළගල් පවා කිළිල් සෙයින් කඩන්නට පොහොසත් වූ තමාගෙ චක්‍රායුධය මහසත් හට විහිටැ. හෙ ගොස් මහසත්හු මුදුනෙ මල් සතක්[2] සෙයින් සිටියෙ.[3] මරපිරිස්වැසියනුදු විසින් විහිදුනා ලද, ගල්කුළුහුදු අවිසුවහස්හුදු අහසින් ගොස්, පැරුම් සිම්දුමින් හුන් මහසත්හු කරා පැමිණැ, දිවකුසුම් වැ වගුළො.

දෙවියො සක්වළමුවවිටියෙහි සිටැ කකර නඟ නඟා "සිද්ධත් - කුමරහු ගෙ රූසපුවට නට හො! නො නට හො!" - බලත්. එ කල්හි මරදෙව්පිත් කෙළවරට තකා-ගත් චක්‍රායුධයෙනු[4] දූ කරුණු දෑ නැති සෙ දැකැ මහසත්හු කරා එළඹැ "සිද්ධත් කුමර, තෙල පලඟින් නැඟි යැ.[5] පලග තා නො ගැත්තෙ යැ; මා ගැත්තෙ යැයි" කී[6] යැ.

කියග මාරය, "පැරුම් පිරූ මහබොසතුන් බුදු වන දවස් පැමිණෙන පලග තා ගැති බවට දෙස්හු කවරහ?"යි කීහ.[7] "මුහු හැම දෙන මැ දෙස් හ"යි මර සෙනඟට හත[8] පෑ කල්හි, මරපිරිස්[9] වැසියන් විසින්, "මම දෙස්මි, මම දෙස්මි"යි පොළොව් පැළී යන පමණ මහහඬ පැවැත් වූ කල්හි, මරහු විසින්, "සිද්ධත් කුමර, තට දෙස්හු කවරහ?" යි කීයෙන් "මට මෙ තන දෙස් කියන්නට නිසි සිතක් ඇති කෙනෙක් ඇත්තාහු නො වෙති"යි කියා සිවුරුගැබින් දකුණත් නෙරැ සෙසු අත්බව් හැරැ වෙසතුරු අත්බැවැ සතසතුමහදන් දුන් තැන් පටන්-ගෙනැ පැරැම්බිම්හි ලා රැව්පිළිරැව් දී හඬා දැන් කුමට නො[10] බණහි? පොළොවට අත් දිගු කළහැ.

එ සඳැ මහපොළොව රැව්දහස් රැව්සුවහස් විහිදැ හැඬුවැ. එ සඳැ යෙළසියක් යොදුන් ගිරිමෙවුලා නම් ඇත් දණ එවැ, බැසැ-හෙවැ, මහපුරිසා සරණ ගියෙ. මරදෙව්පිත් බිය පත් වැ මරපිරිස්[11] හා සමඟ ගත් ගත් අවි පිළි පළඳනා පියා[12] පැලැයි. එකල්හි දෙව්බඹහු පලන[13] මරපිරිස් දැකැ, මර පරද;[14] සිද්ධත් කුමර දිනි යැ, ජයමඟුල්[15] කරම්හ"යි නයි නයින් කරා යවු හැ. ගුරුළුහු ගුරුළුන් කරා යවුහැ. දෙවියො දෙවියන් කරා යවුහැ. බඹහු බඹුන් කරා යවුහැ. මෙසෙයින් දසදහස් ලොධා වැසි දෙව් බඹහු සතුටු සොම්නස්වැ ජයමඟුල් ගොහමින් ගඳමල් ගෙනැ අවුදු මහසත්හු[16] පිරිවැරූහ.

මෙ සෙයින් මහපුරිසා හිරි නොඑප්සෙන තුරු මාර විජය කොටැ පෙරයම්හි නොඑක් ඉකුත් දෑ කෙළසුවහස්හි නො පැකිලැ පවත්නා පුවෙනිවස්නුවණ ලදින් මැදුම්යම්හි[17] අනත්අපරිසෙ ලොධාහි තමන්[18] තමන් කළ කැමින් දුක් විඳුනා සුව විඳුනා සතුන් නිරවසෙස්නෙන් දක්නා දිවසක් නුවණ උපයා[19] අලුයම්හි දොළොස් ඇඟින් යුත් පිළිසසුමුපා[20] වටව්වට[21] විසින් අනුලොම් පිළිලොම් විසින් සිමිඳුත් සිම්ඳුත්,

---

[1] දිලිහි
[2] මල්සේසතක්
[3] සිටියෙයි-හැම
[4] චක්‍රයෙනුදු
[5] යවූ
[6] කියා කීහ.
[7] කියා, කියැ-මු
[8] අත්
[9] මරසෙනහ
[10] නොබැණ හිදිනේ දැයි.
[11] මරපිරිස්හු
[12] පියාලා
[13] පැලයි
[14] පලන්
[15] පැරද ගිය යි පැරද ගියේ-මු
[16] පියමඟුල්
[17] මහසත්
[18] මැදින්යම්හි
[19] තමතමන්
[20] උපදවා
[21] පිළිසාසුමුපා, පිළිසමුපා-මු

දසදහසක් සක්වළ දියපොළොව අවසන් කොටැ දොළොස් වටෙකැ කම්පිත වී යැ. මහසත් වනාහි දසදහස් ලොධා ගුගුරුවා අරුණු නැඟෙන තුරු[1] සව් කෙලෙස් පහා බුදු වී.

එ කල්හි පැදුන් සක්වළ මුවවිටියෙහි සිටැ නැඟු දදයෙහි අග්[2] පැළ සක්වළ මුවවිටියෙහි ලෙළෙයි. පැළ සක්වළ මුව විටියෙහි සිටැ නැඟු දදයෙහි අග්[13] පැදුන් සක්වළ මුවවිටියෙහි ලෙළෙයි. උතුරු සක්වළ මුවවිටියෙහි සිටැ නැඟු දදයෙහි අග්[13] දකුණු සක්වළ මුවවිටියෙහි ලෙළෙයි. දකුණු සක්වළ මුවවිටියෙහි සිටැ නැඟු දදයෙහි අග්[13] උතුරු සක්වළ මුව විටියෙහි ලෙළෙයි. පොළො තෙලෙහි සිටැ නැඟු දදයෙහි අග්[13] අකනිටා බඹලොවැ ලෙළෙයි. අකනිටා බඹලොවැ සිටැ නැඟු දදයෙහි අග් පොළො තෙලෙහි[4] ලෙළෙයි. එදා දසදහසක් සක්වළ එක දදවනයක් සෙයින් එක මල්අස්නක් සෙයින් එක ගඳසැළියක්[5] සෙයින් එක මල් කලබක් සෙයින් සැදුම් ලද.[6]

මෙ සෙයින් බුදුහු ගිනි ගත් යපිඬෙක්හි අබ්ධා සෙයින් තමන් සතන්හි සිටි කෙලෙස් වාසනාලව දු[7] නො තබා මඟ නුවණින්[8] කඩා සව්නෙ දැනැ "අනෙකජාතිසංසාරං" - යනාදීන් උදන් ඇනුහු.

**ස්වසන්තානදමන නම් දෙවන පරිච්ඡෙද[9] නිමි.**

## 3. පරසන්තානදමන නම් පරිච්ඡේදය

මෙසෙ බුදු වැ උපන් අනා හිඳැ "මම් සියුරා[10] සැකි කප් සුවහසක් මෙ පලග සඳහා දිවීමි. මෙ තාක් කල් මෙ[11] පලග සඳහා මැ[12] හිස් කඩා දින්මි. ඇස් උපුරා[13] දින්මි. හදමස් උපුට දින්මි. රන්ලිය සෙයින් වොරොජනා[14] දරුවනුදු නවයොව්නෙන් දිළියෙන අඟනනුදු අන් හට[15] දස් කොටැ දින්මි. මෙහි මැ හිඳැ මාරවිජය කෙළෙමි. මා මෙහි හුන්නහු ගෙ මනදොළ පිරිණ. මෙ පලගින් දන් නො නැංග මැනැවැ"යි අනෙකෙළ සුවහස් සමවත් සමවජමින්[16] සතියක් එහි මැ වැඩැ-හුන්හු.

එකල්හි ඇතැම් දෙව් කෙනෙක්,[17] "සිද්ධත් කුමර තව පලග නො පියයි. බුදු නු[18] වූ බන්දැ"යි සිතුහු.

---

[1] වට විසින්
[2] නැඟෙන තුරු වේලෙහි-මු
[3] රංසියො-අටුවා
[4] තලයෙහි-මු
[5] ගඳකිළියක්-මු
[6] ලද්-මු
[7] ද්
[8] මහනුවණින්-ඇතැම්
[9] පරිච්ඡෙදය-මු
[10] සිවුරා
[11] මෙ මැ පලග-මු
[12] ද-හැම
[13] උපුට
[14] ඔරොජනා
[15] අන්නට
[16] සමවදිමින්
[17] දෙවියෝ
[18] නොවූයෙ, නොවූ-මු

එකල්හි බුදුහු දෙවියන්[1] ගෙ අදහස් දැකැ අහසට නැඟී අහස් යුවළ යුවළ කොටැ ගිනිකඳ දියකඳ විහිදුවමින් සවනක් රස් වීරමින් 'යමාමහපෙළහර' දක්වා දෙවියන්[16] ගෙ කුකුස් හැරැ, අහසින් බැසැ මහබොයින්[2] ඉසාන[3] දෙසෙහි වැඩැ සිටැ "මෙ රුක්මුල්හි හිඳැ බුදු වීමි" යි සියුරා සැකි කප්සුවහසක් පිරූ පැරුමෙහි පල[4] ලද තුන් සත්දවසක් එක ඉරියව්වෙන් වැඩැ-සිටැ ඇසිපිය නො හෙළා පස්පෑ දිස්නා දිගුපුළුලැසින් පිදුහු. එක්බිති බොපලග හා නුවණින් පිදු තැන් හා දෙඅතුරෙහි[5] දෙවියන් මැවූ පැළපැදුන් දිග්[6] රුවන් සක්මන්හි සද්දවසක් සක්මන් කොළො. එක්බිති මහබොයින්[7] වායව්‍යාදෙසෙහි දෙවියන් මැවු රුවන්ගෙයි වැඩැ-හිඳැ සද් දවසක් දහම් සිමිඳියො. මෙසෙ සතර සතියක් බොමැඬැ දවස් යවා අජපල් නුග මුලට එළබැ එහි වැඩැ හිඳැ සද් දවසක් සමවත්සුව අනුභව කොළො. එ කල්හි මාරකන්‍යාවො තුන් දෙන "බුදුන් කාමපාසයෙන් බැඳැ- ගෙනැ යම්හ"යි අවුදු තුන් දෙන සියක් විලස් දක්වා නොඑක් ලීලායෙන් භාවභාවයෙන් නො පැලැඹියැ හී[8] පැරැදැ ගියො.

එක්බිති[9] මුදලිඳුවිල්[10] තෙරට එළබැ මිදෙල්රුක් මුල්හි වැඩැ-හුන්හ. එකල්හි මුදලිඳු නාරජ විලින් නැඟී දසදෙසෙහි ගැවැසි-සිටි නිල් වදුල් දැකැ බුදුනට වැසිසුළඟ මැසිමඳුරු පිරිපත් වළකනු සඳහා වටා සද්දරණ පටක් එවැ පණයෙන්[11] සොයා ගෙනැ සිටියෙ යැ. බුදුහු පිළිම්ණිමුවා ගඳකිළියෙක්හි වසනුවන් සෙයින් දරණගැබැ සද්දවසක් සමවත්සුවෙන්[12] දවස් යවුහු.

එක්බිති කිරිපළුවනට එළබැ කිරිපළු රුක්මුල්හි වැඩැ හිඳැ සද්දවසක් සමවත් සුවෙන් මැ දවස් යවුහු. මෙසෙ සත්සතියැ එකුන් පනස්දවසක් අතර කිස නැති වැ සමවත් සුවෙන් දවස් යවු කල්හි සක්දෙව්රජ අමාඅරළු ඇරැ-දිනැ. එ වැළඳු කල්හි බුදුනට සිරිරු කිස[13] ඇති වි යැ. එක්බිති ඔහු මැ දුන් නාලිය දැහැටි[14] වළඳා නුතන්දහතළා[15] පැනින් මුව දෙවැ එ මැ රුක්මුල්හි වැඩැ - හුන්හු.

එ සඳැ තපුස්ස භල්ලික[16] නම් දෙ බෑ වෙණෙඳො[17] පන්සියක්[18] ගැලින් බඩු ගෙනැ කිරිපළුවනය වෙත[19] ගෙනැ යෙති. පෙරැ ඔවුන් නෑ වූ දෙව්දුවක්[20] එ වනයෙහි වසන්නී, ඔවුන් ලවා බුද්නට[21] දන් දෙවී යැටි වැ ඔවුන් ගෙ පන්සියක් ගැල් නැබ දක්වා පොළොව ගලා-පිව. ඔවුන් ගඳමල්දුම් පුදා දෙවියන් අයදනට වන් කල්හි දෙව්පිරිස් පිරිවරා අහස්හි සිටැ දෙව් දූ බුදුන් ගෙ අපමණ ගුණ කියා බුදුනට දන් දෙනු කළා. ඔහු[22] මිහිපිඬු ගෙනැ බුදුන් කරා එළැබැ මීපිඬු පිළිගන්නට අයජියහ.[23]

---

[1] ඒ දෙවියන්ගේ-මු
[2] මහා-බොධින්
[3] ඉසානා
[4] එල
[5] දකුරෙහි
[6] දික්, දිග
[7] මහා බොධින්
[8] පැළැමි හී, ලබියහී, ලැබියහි
[9] එ කල්හි
[10] මුචලිඳුවිල්
[11] පෙණයෙන්
[12] සමවත්සුවයෙක
[13] සිරිරුකිස, සිරුරුකිස
[14] දවිට, දවටී, දවිටි
[15] අනොතත්දහතලා, අනුතත්දහතලා
[16] තපස්සු-භල්ලුක
[17] දෙ වෙණෙදෝ, ද්වෙ 'භාතරො වාණිජා' - සමන්ත පාසාදිකා, 'වෙ වාණිජා' - ජාතකඅටුවා
[18] පන්සියයක්
[19] වෙතට
[20] දෙව්දුවක්
[21] බුදුනට, බුදුන්ට
[22] ඔව්හු
[23] අයදියහ-මු

**මහබඹුහු** දුන් පය බුදුන් කිරිපිඬු පිළිගන්නා දවස්[1] අතුරුධන් වී.[2] කිරිපිඬු පිළිගත් පය නාලොවැසියනට[3] සෙත් නිසා නිවාමින් ගියෙ. බුදුහු "කිමෙකින්[4] මී-පිඬු පිළිගන්මි හො!" යි සිතූහු. එ සඳැ **සතරවරම්මහරජහු** ඉඳුනිල් මිණිමුවා සතරපයක් එළවූහ. බුද්හු[5] එ පා නො ගත්හු.[6] එ සඳැ මුගුවන් පැහැ ඇති සෙල්මුවා සතරපයක් එළවුහු. බුද්හු සතර දෙව්පුතුන් කෙරෙහි අනුකම්පායෙන් සතර පය පිළිගෙනැ මතුමත්තෙහි තබා "එක්[7] වෙව" යි ඉටුහු. සතර පය මුවවිටි[8] පැනෙන සතර හිරක් ඇති එක්පය[9] වි යැ. බුදුහු එ පයින් මීපිඬු පිළිගෙනැ වළඳා අනුමෙව්නි[10] කොටැ දෙවෙණෙඳන් බුද්සරණ-දහම්සරණ[11] දෙකැ පිහිට්වුහැ.[12] එව්හු පුදන්නට නිසි[13] වතක් ඇරැවූහු. බුදුහු ජලවුල'ත්ලෙන්[14] හිස් පිරිමැදැ කෙස්දු දී වදාළහ. එව්හු රුවන් කරඬියෙන් පිළිගෙනැ රථයෙ වඩා-තබා පුද කෙරෙමින් සිය නුවර ඇරැ දාගප්[15] කොටැ දා නිදන් කළහ.

බුදුන් හුනස්නෙන් නැඟී **අජපල්** නුගමුලට එළැබැ එහි වැඩැ-හිඳැ "තමන් පිළිවුදු දහම් ගැඹුරුසෙ, සතුන් කෙලෙස්බැරිසෙ, සිතත්, සිතත් බුදුනට "ධම්[16] දෙසම්හ." යන සිත් නො උපන. එකල්හි **මහබඹ** බුදුන් ගෙ අදහස් දැනැ[17] මුළුලො නස්සි"යි දසදහස්[18] ලොධා උපුල්වා[19] මහහඬින් හඬා දසදහසක් සක්වැළැ බඹපිරිස් දෙව්පිරිස් පිරිවරා දික් කළ අතක් වක් නොකරන තුරු අවුදු බුදුන්[20] පෙරට පෙනි බුදුන් වැඳැ වටදැණි[21] වැ මුදුනෙහි ඇඳිලි බැඳැ හිඳැ ධම්[22] දෙසුව මනා සෙයට ආරාධනා කෙළෙ.[23]

එ සඳැ බුදුහු බුදු ඇසින් දසදහස්[24] ලොධා බලනුවො, විනෙජනන් දැකැ මහබඹහු අයජමෙහි[25] ගිවිසැ, පළමු ධම් කහට දෙසම් හො!" යි සිතා "**ආළාර-කලම් නම් උදරම් නම්** දෙමහතව්සො නුවණ ඇතියව්හු"යි බලනුවො, ඔවුන් පෙරට[26] මැ මියැ අරූතල ගියසෙ දැකැ පස්වග සඟුන් තම හට[27] වහල්සෙ සිතා "ඔහු කොහි වෙසෙති[28] හො!" යි බලනුවො, **බරණැස්** නිසා **ඉසිපතන්හි** වසනුවන් දැකැ එයට ගොස් එව්නට[29] **ධම්සක්** පැවැත්වුව මැනැවැ"යි කිහිපදවසක් බොමඩ අබියෙස්හි වැසැ **ඇසළපුනුපොහො** දවස් **බරණැස්** වඩනට අටළොස් යොජුන් මඟ පිළිපන්හ.[30]

බුදුහු අතර මඟැ **උපක** නම් ආජීවකයක්හු දැකැ මත්තෙ ඔහට[31] වන වැඩැ දැකැ තමන් බුදු පරිදි[32] වදාරා එ මැ දවස් සවස් වෙලෙ **ඉසිපතනයට** වැඩියො.

---

[1] පිළිගත් දවස්
[2] වීයැ
[3] නාලොව වැසියනට
[4] මීපිඬු කිමෙකින්
[5] බුදුහු,
[6] නොපිළිගත්හු-මු
[7] එකක්-මු
[8] මුවවිටු
[9] එක්පසෙක්
[10] අනුමෙවෙනි
[11] ධම්සරණ
[12] පිහිටුවූහ.
[13] කිසි
[14] දලවුල්අත්ලෙන්
[15] දාගබ්
[16] දම්
[17] දැකැ
[18] දසදහසක්
[19] උපුල්ලා
[20] බුදුන්ගෙ
[21] අඬදැනී-මු
[22] ධර්මය-මු
[23] කොළේ-මු
[24] දහස්ලෝ
[25] අයජමෙන්
[26] එයට පෙරටු වැ මැ-මු
[27] තමනට
[28] වසති
[29] උන්ට
[30] පිළිපන්හැම
[31] ඔහුට
[32] බුදු වූ පරිදි

**පස්වග** සඟහු බුදුන් - වඩනවුන්, දුරින් දැකැ “මෙ පධනින් පහ වැ ඉසුරුකුලෙහි ඉපැදු[1] සිනිඳු අහර වළඳා පිරිහුන්[2] සිරිරු ඇති වැ, පහන් ඉඳුරන් ඇති වැ, රන්වන් වැ එයි. “මුහු[3] නො[4] වඳම්හ; හුනස්නෙන් නො ද නැඟෙම්හ; උතුම් කුලෙයි උපන් වන බැවින් හිඳුනා අසුන් දෙම්හ”යි අස්නක් පන්වා තබා **කතිකා** කොටැ-ගෙනැ හුන්හු.

බුදුහු ඔවුන් අදහස් දැනැ හැම සතුන් කෙරෙහි පැතිරැ සිටි මෙත් සිත් හකුළුවා ඔවුන් කෙරෙහි පැවැත්වූහ. ඔහු[5] බුදුන් වඩුත් වඩුත්, තමන් ගෙ කතිකායෙහි නො සිටියැ හී හුනස්නෙන් නැඟී ගොස් වැදැ පාසිවුරු ගෙනැ වඩා-හිඳුවා පා දොවා බුදුබව නොදන්නාහු, නම්[6] කිය කියා බෙණෙති. එ කල්හි බුදුහු, “මහණෙනි, මට නමිනුදු ‘ආවුසො වාද’[7] යෙනුදු ව්‍යවහාර නො කරව.[8] මම රාත්මි[9]” තමන් බුදු බව් හඟවා පැන්වූ උතුම් අස්නෙහි දසදහස් ලොධාහි දෙව්බඹපිරිස් පිරිවරා වැඩැ හිඳැ, **පස්වග** සඟුන් අමතා **දම්සක්** පවතුන්[10] සුතන්[11] දෙසූහු. ඔවුන් කෙරෙහි කොණ්ඩඤ්ඤ මහතෙරහු සොවාන් වූහු. අටළොස් කෙළක් බඹහු රාත් වූහු. අසඞ්ඛ්‍යක් දෙවියො සොවන් සෙදගැමි අනගැමි වූහු. බුදුහු එහි මැ වෙස් එළබැ, තුබූ සතර දෙන හට සතර දවසක් අවවාද කොටැ සොවන් කළහ.

විසේණියැ පස් දෙන හට **අනත්ලකුණුසුත්** දෙසා රහත් කොළො.

එකල්හි බරණැසැ **යස** නම් සිට්දැරියෙක්[12] හිමන් ගිමන් වසන් තුන්[13] සෘතුවට කරවන ලද[14] තුන් පහාහි නළුපිරිස්[15] පිරිවරා උඩුමහලින් යටිමහල් නො[16] බැසැ වසනුයෙ, එ දවස් රෑ නැටුම් ගඳෙවු[17] විඳුමින්[18] හෙවැ නිදනුයෙ, පිබිදැ, තමන්[19] තමන් ගත් පසඟතුරුයෙහි වැතිරැ හෙවැ නිදන මාගමුන් ගෙ විකාර දැකැ සංවෙග ඇති වැ හොත් යහනින් නැඟී රුවන්මරවැඩි සඟල පයින් ගෙනැ පහයින් බැසැ නුවරින් නික්මැ **ඉසිපතන්** ගොස්, අලුයම්හි විහාරයෙන් නික්මැ අබවස්හි[20] දිළියෙන පහන්රුක්[21] සෙයින් සිටැ සක්මන් කරන බුදුන් දැකැ “මොබ[22] එ යස[23]”යි වදාළ කල්හි නිසැක වැ අවුදු වැඳැ ධම්දෙසුන්[24] අසා සොවාන් වැ අලුයෙහි සොස්නෙන්[25] ආ පිය හට දෙසූ දෙස්නෙන් රාත් වි යැ. පියෙ සොවන් වී. ඔහු සබඳ සෙසු සිට් දරුවො සූපනස්දෙනෙක්, “ඔහු පැවිජි වූහැ.” යනු අසා **ඉසිපතන්** ගොස්, දැකැ, බුදුන් කෙරෙ බණ අසා එහි **භික්ඛුභාවයෙන්**[26] පැවිජි වැ රාත් වූහු.

---

[1] ඉපිදු-මු
[2] පිරිපුන්-මු
[3] ඔහු-මු
[4] නො ද
[5] ඔව්හු
[6] නම-මු
[7] ආවුසවාද
[8] කරවු-වු
[9] රාත්මී බුදුමි,
[10] පැවතුන්
[11] සුතන්, සුන්
[12] සිට්දැරි, සිටුදැරි
[13] යන තුන්-මු
[14] කරනලද
[15] නළුවන්
[16] නො හැඳින
[17] ගඳැව්
[18] විදිමින්
[19] තමන්ගත්
[20] අහස්හි
[21] පහන් රුකක්
[22] මුඹ
[23] යසස, සගය
[24] දෙසුම්
[25] සොයමින් සොස්මින්
[26] එහි භික්ෂුභාවයෙන්

මෙසේ ලොකයෙහි බුදුන් ඇතුළු වැ රාතන් එක් සැට දෙනකු නිපන් කල්හි, බුදුහු වස් වැසැ පවරා, “මහණෙනි, දනවු සැරී සරන්නට එළඹෙව. දෙදෙනෙක් එක් මඟින්[1] නො යව. ගිය ගිය තන්හි ධම් දෙසව. සත්වැඩ සාහව[2]” යි සඟුන් සැට දෙනා එ එ තැනට නඟා-යවා තුමුහු[3] **උරුවෙල්** දනවු වඩනාහු, අතර මඟැ **කපුවන** උයන්[4] කෙළනට ගිය රජ කුමරුවන් තිස් දෙන හට ධම් දෙසා සොවාන් සෙදගැමි අනගැමි කොටැ එහි **භික්ඛුභාවයෙන්** පැවිජි දී සැරිසරනුවට නඟා-යවා, **උරුවෙල්** දනවු එළඹැ තුන් දහස් පන්සිය සොළොස් පෙළහරක් දක්වා තවුස් දහස් පිරිවර ලද[5] **උරුවෙල් කසුබු**,[6] **ගයාකසුබු**[13] **නදීකසුබු**[13] නම් තුන් මහතව්සන් ගෙ දුලද බිඳැ, එහි භික්ඛුභාවයෙන් පැවිජි දී **ගයාසීසයෙහි** වැඩැහිඳ “**ආදිත්තපරියාය**”-සුතන්[7] දෙසා රාත් කොටැ ගෙනැ එ රාත් සඟුන් දහසක් දෙනා පිරිවරා **බිම්සරමහරජ** හට[8] දුන් පිළිනයෙන් මිදෙනු සඳහා **රජගහා** නුවර අබියෙස්හි **යටිවන** උයන් වැඩියො.

එ කල්හි රජ බුදුන් වැඩි පරිදි උයන්පල්ලා අතින් අසා දොළොස් නුහුවක්[9] බමණන්[10] හා ගහපතීන්[11] පිරිවරා අවුදු තරුපිරිවර ලද[12] පුන්සඳක් සෙයින් සඟපිරිස් පිරිවරා සවනක් ගණ බුදුරසින්[13] දිළියෙමින් වැඩැහුන් බුදුන් දැකැ, සක්ලකුණින් විසිතුරු පතුල් දැකැ වැඳැ, සහපිරිවරින් එකත්පස් වැ හිනි.[14] එ[15] පිරිසැ ඇතැම් කෙනෙක්, “කිම හො? මහමහණ **උරුවෙල්කස්බන්** නිසා බඹසරවස් සෙරෙයි[16] හො? යි සිතුහු. බුදුහු ඔවුන් ගෙ අදහස් දැනැ[17] “කස්බ, ජනයන්[18] සිතැ කුකුස් හර”යි වදාළො. එ කල්හි **උරුවෙල්කසුබ්** මහ තෙරහු හුනස්නෙන් නැගි බුදුන් වැඳැ ‘බුදුහු මට ගුරුහ. මම්[19] බුදුන් ගෙ සවුයෙමි” යි අහස්හි[20] තලයක් පමණ තැනට නැඟී දුමදුමා දිළිදිළී හොමින් හිඳිමින් සිටිමින් සක්මන් කෙරෙමින් අතුරුධන් කෙරෙමින්[21] අහසින් බැසැ බුදුන් පා වැඳැ තමන් සවු පරිදි හඟවා, දෙවන වටැ අහස්හි දෙ තලයක් පමණ තැනට නැඟී,[22] තුන් වන වටැ තුන් තලයක් පමණ තැනට නැඟී, පස් වන වටැ පස් තලයක් පමණ තැනට නැඟී, සවන වටැ ස තලයක් පමණ තැනට නැඟී, සත් වන වටැ, සත් තලයක්[23] පමණ තැනට නැඟී දුමා දිළී හෙවැ හිඳැ සිටැ සක්මන් කොටැ අතුරුධන් පැමිණැ පෙළහර දක්වා අහසින් බැසැ, “බුදුහු මාගෙ ගුරුහ. මම්[24] බුදුන් ගෙ සවුයෙමි”යි බුදුන් පා වැඳැ එකත්පස් වැ හුන්හු.

එ කල්හි මුළු පිරිස් වැසියො එ පෙළහර[25] දැකැ, “අහො! බුදුහු මහානුභාව ඇතියව්හැ. එබඳු දුලද්[26] ගෙනැ ‘**රාත්මී**’ වැටෙන **උරුවෙල් කස්බො** පවා දුල්ද් බිඳැ බුදුන් විසින්

---

[1] එකමහකින්
[2] සාහවව-මු
[3] තුඹු
[4] උයන්හි
[5] ලදු, ලද්-මු
[6] කසුබ්, කසුප්
[7] සුතත්, සුත්ත
[8] මහරජහුනට
[9] නුවත්
[10] බමුණන්
[11] ගෘහපතීන්-මු
[12] තරු පිරිවරන ලද
[13] බුදුරැසින්
[14] හුණ. හිඳ-මු
[15] එ කල්හි ඒ පිරිස් අතුරෙන් ඇතැම් කෙනෙක්
[16] කෙරෙයි
[17] දැක
[18] දනයන්
[19] මම්
[20] අහස්තලයක්
[21] වෙමින්
[22] බැසැ නැඟී
[23] සත්තලක්
[24] මම
[25] පෙළහැර
[26] දුලද

දමන ලදහ"යි බුදුන් ගෙ ගුණ වැනුහු බුදුහු "මුහු[1] දැන් මතු දැමුයෙම් නො වෙමි. අතීතයෙහි දු දැමුයෙමි"යි ඔවුන් මියුලු[2] නුවරැ **අඞ්ගාති** නම් රජක් වැ ගුණ නම් නුවටක්හු කරා එළබැ "මෙලො නැති. පරලො නැති. කම් නැති කම්හි[3] එල නැති" දුලද්[4] ගෙනැ වැටෙන කල්හි, තමන් බඹ[5] වැ ඉසිවෙසින්[6] අවුදු ධම් අසා දුලද් බුන්[7] පරිදි දක්වමින් **මහානාරදකස්සප**[8] ජාතකය දෙසා සිවුසස් වදාළහ.

එ කල්හි, **බිම්සර** රජ[9] එකොළොස් නුහුවක්[10] දෙනා හා සමඟ සොවාන් වි යැ. එක් නුහුයෙක්[11] වැඳැ සරණ ගියෙ[12]. රජ බුදුන් කෙරෙහි හිඳැ තමාගෙ පස් මනදොළක් පිරුණු[13] සෙ කියා සරණ ගොස් සෙට දවසට පවරා හුනස්නෙන්[14] නැඟී බුදුන් වැඳැ පැදකුණු කොටැ නුවර ගියෙ[15]. අලුයෙහි බුදුන් දුටු නුදුට්[16] අටළොස් කෙළක් **රජගහා** වැසියො[17] බුදුන් දක්නට උදයැ මැ නුවරින් නික්මැ **යට්වන** උයන් ගියො. තුන් ගවු මඟ[18] නොපොහොනු වි යැ. සියලු **යට්වන** උයන් මිනිසුන් විසින් අතුරු නැති වි යැ. සියලු **යට්වන** උයන් මිනිසුන් විසින් අතුරු නැති වි යැ. මහජනයො තමන් ගෙ ඇස්පසුරෙන් බුදුන්ගෙ රුමුහුදු[19] පිහිනා[20] පරතෙර සො දැක්කැ හෙත්. මෙසෙ දෙතිස්වරලකුණෙන් සැදුම් ලද අසූ අනුව්‍යඤ්ජනයෙන් දිළියෙන බුදුන් බඳ බලන මහජනා[21] අතුරු නැති වැ උයනද් මඟද්[22] හැසි ගැවසි සිටි කල්හි, එක් පැවිජිකෙනකුදු[23] නික්මෙන්නට මඟ අවසර නොවී.

එ කල්හි **සක්දෙව්** රජ බුදුන් සඟුන් සුන්බත් වන බියෙන් යහපත් මණව්වෙසක් මවා-ගෙනැ බුදුන් පෙරමඟට[24] බැසැ-සිටැ දෙවානුභාවයෙන්[25] අවසර කොටැ-ගෙනැ බුදුන් ගෙ ගුණ වනා යසගී කියමින් පෙරට[26] වැ ගියෙ. මහජනයො ඔහුගෙ රුසිරි[27] දැකැ "ඇප්[25] මෙවෙනි දරුවකු යම් කලෙකැ නුදුටුවිරිම්හ. මෙ කෙසෙ වු දරුයෙකැ[28] හො!" යි කීහු. එකල්හි දෙව්රජ "තමා බුදුන් ගෙ මෙහෙකරු[29] පරිදි" කී යැ. බුදුහු **සක්දෙව්** රජහු අවසර කොටැ දුන් මඟ පිළිපැදැ මහණ දහස් පිරිවරා **රජගහා** නුවරට වන්හැ.

රජ බුදුපාමොක් සඟනට[30] දන් දී "වහන්සෙ, මම තුණුරුවන් විනා වාස[31] කරන්නට නොහැක්කෙමි. වෙලෙ වුව, මැනැ මැ යැ; නොවෙලෙ වුව, මැනැ මැ යැ; බුදුන් කරා එළබෙමි.[32] **යට්වන** උයන් ඉතා[33] දුරැ; මෙ මා ගෙ **වෙළුවන** උයන් නොදුරු;[34] නො ද

---

[1] මොහු
[2] මිළු
[3] කම්පල නැතැයි
[4] දුලද
[5] බඹලොවැ
[6] ඉසින්වෙසින්
[7] බිඳැ-පු
[8] මහානාරදකාශ්‍යප
[9] මහරජ
[10] නුවක්
[11] නුහුවක්
[12] ගියෝ
[13] පිරු
[14] හුන් අස්නෙන්
[15] ගියො
[16] දුටු නුදුටු
[17] .........කෙළක් මිනිස්සු
[18] තුන් ගව්වක් මඟ
[19] බුදුරුමුහුදු
[20] පිනා
[21] මහජනයා
[22] උයනුදු මගදු, උයනදු, මගදු
[23] කෙනකුනුදු
[24] පෙරට
[25] දෙවතානු භාවයෙන්
[26] පෙරමඟට
[27] රුසිරු රු
[28] දැරියෙක් දෝහො යි, දැරියෙකු, දරුවෙක්
[29] මෙහෙකරුවකු
[30] මහ සඟනට
[31] වාසය
[32] එළඹෙමියි
[33] ඉතා ම
[34] නො ද දුර

ආසන්න යැ; යන එන කලට සුව යැ; බුදුනට නිසි සෙනස්නැ. මාගෙ මෙ උයන් පිළිගන්නෙ මැනැවැ"යි රන් කොතුරුයෙන් මලින් ගඳින් වැසුණු මිණි වන් පහන් දිය ගෙනැ වෙළුවන උයන් දෙනුයෙ, බුදුන් අතැ දිය ඔත. බුදුන් උයන් පිළිගත් විගසැ "බුදුසස්නෙහි මුල් බටැ" යි මහා පොළො ගුගුළෙ. දඹදිව් තෙලෙහි වෙළුවන උයන් තබා, පොළො ගුගුරුවා ගත් අනෙක් වෙහෙරෙක් නැති. ලක්දිවැ මහවෙහෙර තබා පොළො ගුගුරුවා ගත් අනෙක් වෙහෙරෙක් නැති. බුදුහු වෙළුවන උයන් පිළිගෙනැ රජ හට අනුමෙව්නි[1] කොටැ හුනස්නෙන් නැඟී සඟුන් පිරිවරා වෙළුවන උයන් වැඩියො. එකල්හි සැරියුත් මුගලන්[2]" දෙදෙන දෙසිය පනස් දෙනකු[3] ගෙනැ බුදුන් කරා එළබැ එහි භික්ඛුභාවයෙන් පැවිජි වැ සහපිරිවරින් රාත් වැ අගසවු තන් පත් වූහු.

මෙසේ බුදුන් වෙළුවන උයන්හි සත් වැඩ සාහමින් වසන කල්හි, සුදොවුන්[4] මහරජාණො "මපුතණුවො බුදු වැ ධම්සක් පවත්වා රජගහා[5] නිසා වෙළුවන උයන්හි වෙසෙති" යනු අසා එක් "මහ ඇමැත්තක්හු දහසක් පුරුෂයන් පිරිවරා රජගහා[6] නුවර ගොස් සුදෙවුන් මහරජාණො තොප දැක්කැටියහයි, ම පුතණුවන් ගෙනැ[7] තා අව මැනැවැ"යි නඟා යවුහු. "හෙ ඉතා මැනැවැ"යි සුදෙවුන් මහරජාණන් ගෙ තෙපුල් මුදුනෙන් පිළිගෙනැ දහසක් පුරුෂයන් පිරිවරා වහා මැ සැට යොජුන් මඟ ගෙවා ගොස් බුදුන් පිරිස් මැදැ වැඩැහිඳැ ධම් දෙසන වෙලායෙහි වෙහෙරට වැදැ, "රජු ගෙ හසුන් දැන් තබම්හ"යි පිරිස් අන්තයෙ සිටැ බුදුන් කෙරෙහි[8] බණ අසා සහපිරිවරින් රාත් වැ නො බැණැ බුදුන් කෙරෙහි විසි. රජානො එ මැ නියායෙන් අනෙක් අට වරෙක්හි දහස් දහස් පුරුෂයන් පිරිවර දී ඇමැත්තන් අට දෙනකු යවූහු. ඔහු හැමදෙන[9] රාත් වැ පැවිජි වැ නො බැණැ බුදුන් කෙරෙහි මැ වුසුහු. රජාණො හස්නකුදු ඇරැ[10] කියන කෙනකුන් නො ලදින්, "එ තෙක් දෙනා කෙරෙහි මට සැනැහැත්තන්[11] නැත්තෙන්[12] මට හස්නකුදු ඇරැ[13] නො කීහැ.[14] මා කීවක්[15] කරන්නෙ[16] කවර හො!"යි, සියලු රජබල බලනුවො, තමන්ගෙ හැම කාර්ය[17] සාධන, ඇතුළත්, විස්වස් ඇති, පුතණුවන් හා එක දවස් උපන්, වැලි කෙළියෙහි පටන් ගෙනැ ඔවුන්[18] හා පුරුදු සබඳ, කාලුදයි[19] නම් ඇමැත්තක්හු දැක ඔහු කැඳවා-ගෙනැ, "මපුතණුවන් දැක්කැටි වැ නව වරෙකා නව ඇමැත්තකු දී නවදහසක් පුරුෂයන් යවීමි.[20] එකෙකුදු[21] අවුදු[22] හස්නකුදු නො කී.[23] දිවියෙහි නියන නැති. මා දිවි ඇති විගසැ මපුතණුවන් ඇරැ මා දක්වන්නට[24] නිස්සෙහි දැ?"යි කීහැ. "මහරජ මම් පැවිජි වන්නට අවසර ලැබෙම් නම්, නිස්සෙමි" කී යැ. "තො පැවිජි වැ හො, නොපැවිජි වැ හො මපුතණුවන් ඇරැ මා දක්ව"යි කීහැ. හෙ[25] "මහරජ[26] ඉතා මැනැවැ"යි රජාණන්

---

[1] අනුමෙවෙනි
[2] මහමුගලන්
[3] දෙනකුන්-මු
[4] සුදවුන්
[5] රජගහ
[6] රජගහ
[7] ගෙන්නා-මු
[8] කෙරේ
[9] හැමදෙන මැ ඇමදෙන
[10] හැරැ
[11] සෙහෙහැත්තන්
[12] නැතිහෙයින්
[13] හැරැ
[14] කීහු
[15] කීවා
[16] කරන්නෙක්
[17] කාරිය
[18] ඔවුනොවුන්
[19] කළුදායි-හැම
[20] යවීමියි-මු
[21] එකතු
[22] ඇවිත්. අවිදු
[23] කීහ-හැම
[24] දක්වාලන්නට
[25] හෙතෙම
[26] සමහර පොතෙක නැති

ගෙ හසුන් ගෙනැ රජගහා නුවර ගොස් බුදුන් ධම් දෙසන වෙලෙහි පිරිස් අන්තයෙහි සිටැ බණ අසා සහපිරිවරින් රාත් වැ එහි භික්ඛුභාවයෙන් පැවිජි වී.

ඔහු සතට දවසක්[1] ගිය කලැ මැදින්දිනැ පුර පොහො දවස් "හිමන්[2] කල් ඉකුත්යෙ යැ; වසන්[3] කල් පත්තෙ යැ; පොළො තල හීතණයෙන් ගැවැසීගත්තෙ යැ; වන ළැව් සුපිපියෙයැ;[4] වඩනට නිසි කලැ"යි සළකා[5] බුදුන් කරා එළබැ සැට ගයෙකින් බුදුන් කුලනුවර වැඩිය[6] මනා බව් කියා ගමන් වැනුහු.[7] එ කල්හි බුද්හු "කිම, උදය, මියුරු සරයෙන් ගමන් වනහි?"යි වදාළො. එ සඳැ මහතෙරහු, "වහන්සෙ මුබ පියාණො සුදෙවුන් මහරජාණො මුබ දැක්කැටියහ"යි කීහු. "මැනැවැ උදය, නෑයනට සංග්‍රහ කෙරෙමි, බික්සඟනට සැල කරව"යි වදාළො. "මැනැවැ, වහන්සෙ" යි ගොස් නඟනට සැළ කළහ. සඟහු අවුදු බුදුන් පිරිවැරුහු. බුදුහු අඟු-මගධ දෙරටවැසි කුල දරුවන් දසදහසක් දෙනා හා කිඹුල්වත් වැසි දසදහසක් දෙනා හා මෙසෙ විසිදහසක් රාත් සඟුන් පිරිවරා හස්ගණ[8] පිරිවර[9] ලද මහහස්රජක්හු[10] සෙයින් රජගහා නුවරින් නික්මැ එක් දවසකට එක් යොජනක් බැවින්[11] රජගහා නුවරින්[12] සැටයොජුන් කිඹුල්වත් නුවර,[13] යොජුන් යොජනෙහි[14] වෙහෙර වෙසෙමින්, "දෙමසෙකින් ගිය මැනැවැ"යි නික්මුණුහු.

මහතෙරහු, "බුදුන් නික්මුණු පරිදි රජ හට සැල කළ මැනැවැ"යි අහසින් ගොස් රජගෙයි පාල වූහු.[15] රජාණො මහතෙරුන්[16] දැකැ සතුටු වැ මහාරඟ පලක් මත්තෙ වඩා හිඳුවා තමනට යුතු කොටැ තුබූ නන්[17] රසබොජනෙන්[18] පය පුරා දුන්හු. මහතෙරහු, හුනස්නෙන් නැඟි යන ආකාර දැක්වූහු. "හිඳැ වළඳන්නේ යැ"යි කීයෙන්, "බුදුන් කරා ගොස් වළඳම්හ"යි කීහු. "බුදුහු කොහි යැ පුතණුවෙනි?" කීයෙන්, "විසිදහසක් සඟුන් පිරිවරා තොප දක්නට නික්මුණුහු"යි කීහ. රජාණො සතුටු වැ "තෙප් වළඳව. මපුතණුවන් මෙ නුවර එන තන් දක්වා මොබින් බත් ගෙනැ වඩව[19]" යි කීහු. මහතෙරහු ගිවිස්සහ. රජාණො මහතෙරුන් වළඳවා පය ගඳසුන්නෙන් උළා-පියා උතුම් බොජනෙන් පුරා, "බුදුනට දෙව"යි මහතෙරුන් අතැ තුබූහු. මහතෙරහු හැමදෙනා දක්නාසෙ මැ පය අහසට විහිදැ තුමුහු ද අහසට නැඟි බත් ඇරැ බුදුන් අතැ තුබූහු. බුදුහු වැළැඳූහු. එ නියායෙන් මහතෙරහු දවසැ දවසැ බත් ගෙනැ යෙති. බුදුහු අතරමඟැ පියමහරජාණන් ගෙ මැ බත් වැළැඳූහු. මහතෙරහු බුදුන් බත් වැළඳවූහු. එක්බිත්තෙන දවසැ දවසැ "බුදුහු මෙ තෙක් තන්[20] වැඩියහ. මෙතෙක් තන් වැඩියහ"යි බුදුනු ගෙ ගුණ කියා සියලු රජකුලන් බුදුන් නුදුටු[21] ද, බුදුන් කෙරෙහි ප්‍රසාද ඉපදවූහු[22] එයින් ඔව්නට බුදුහු කුල පහදවන්නන් කෙරෙහි අග තනතුරු වදාළො.

---

[1] සතටක් දවස් මු
[2] හිමත්
[3] වසත්
[4] මල් පිපියෙ ය
[5] අමතා-හැම
[6] එළඹි-ය මනා පරිදි
[7] පැනවූහු
[8] හස්ගනු
[9] පිරිවරන
[10] හස්රජක-
[11] බැගින්
[12] නුවර සිට
[13] නුවරට
[14] යොදුන්, යොදුනෙහි
[15] පාමුන වුහු
[16] මහ තෙරුන් වහන්සෙ
[17] නන්නන්
[18] භොජනයෙන්
[19] වඩ-යි
[20] තැන්
[21] නුදුට-මු
[22] ඉපැදව හැ

රජහු බුදුන් වැළැතැ[1] වැඩි කල්හි, "අප ගෙ නෑ උතුමා දක්මහ"යි රැස් වැ බුදුන් වාස[2] කරන්නට නිසි තැන් බලන්නාහු, නිග්‍රොධ නම් ශාක්‍යරජහු ගෙ උයන රමණීසෙ දැකැ එ සදන්නට යොදා තුමූ[3] ගඳමල් ගෙනැ පෙරමඟට යන්නාහු, පළමු[4] සව්බරණින්[5] සැදි ළදරු ළදරු දරුවන්[6] හා දැරියන් නඟා-යවුහු. එක්බිති රජකුමරුවන්[7] හා රජ කුමරියන් නඟා-යවුහු. ඔවුන් එක්බිති තුමුහු ගොස් ගඳින් මලින් පුදමින් බුදුන් ගෙනැ නිග්‍රොධරාමයට වැඩුහු. බුදුහු එහි[8] විසිදහසක් සඟුන් පිරිවරා පැන්වූ බුදුඅස්නෙහි වැඩැහුන්හු. සැහැමහරජහු[9] අභිමානයෙන්, "සිද්ධත් කුමර අපට ළදැරි යැ. අප මලැ, අප බෑනෙ යැ, පිතැ, මුනුබුරෙ යැ"යි සිතා ළදරු ළදරු රජකුමරනට, "තෙපිවඳව. ඇපි තොප පිටිපසැ හිඳුම්හ" කීහු. ඔවුන් එසෙ හුන් කල්හි, බුදුහු ඔවුන්ගෙ අදහස් දැනැ "මා නැයො නො වඳිති. ඔස! ඔවුන්[10] වැඳැවුව මැනැවැ"යි සතර වන ධැන්[11] සමවැදැ හුනස්නෙන් නැඟී ඔවුන් හිසැ පියපස් ඕනවුන් සෙයින් අහසට නැඟී සියල් සිරිරින් දියකඳ ගිනිකඳ විහිදමින් සවනක් රැස් විරමින් යමාමහපෙළහර දැක්වූහු.

පියමහරජාණන් එ අසිරි මහපෙළහර දැකැ, "වහන්සෙ, මම තොප, උපන් දවස් කළුදෙවුල්[12] මහතව්සා වඳවන්නට එළවුවන් ගෙ, පා පෙරළී ඔහු මුදුනෙ පිහිටිසෙ දැකැ තොප වහන්සෙ වැන්දෙමි. හෙ මාගෙ පළමු වන වැඳුම යැ.[13] වප්මඟුල් දවස් දඹරුක් පයැ සිරියහන් මතුයෙහි පලක්[14] බැඳැ වැඩහුන්නා දැක, දඹසෙයද් නොපෙරෙළෙනසෙ දැකැ, වැන්දෙමි මැ යැ. හෙ දෙවන වැඳුම යැ දැන් මෙ[15] නොදුටු විරි පෙළහර දැකැ වඳිමි.[16] මෙ මාගෙ තුන් වන වැඳුමැ"යි[17] වැඳි කල්හි, බුදුන් නො වැඳ සිටිනට නිසි එක රජෙකුදු නො වීයැ. හැම දෙන මැ වැඳියො.

මෙසෙ බුදුහු නෑයන් වඳවා[18] අහසින් බැසැ පැන් වූ අස්නෙ වැඩැ-හුන්හ. බුදුන් වැඩ-හුන් කල්හි නෑයන් ගෙ සමාගම මුදුන් පැමිණි යැ. හැමදෙන[19] එකඟසිත් වැ හුන්නාහු. එ කල්හි මහමෙ නැඟී පොකුරුවැසි වට. එ වැස්සෙහි[20] "තෙමෙම්හ"[21] යි සිතුවො තෙමෙති. "නො තෙමෙම්හ"[14] යි සිතුවන් වෙරැ එක දිය බිඳෙකුදු නො හෙයි. එ අසිරි පෙළහර[22] දුටු රජහු විස්ම පත් වූහු. බුදුහු "දැන් මතු නොවෙයි, මාගෙ නෑ සමාගමයෙහි පොකුරු වැසි වටුයෙ[23]; අතීතයෙහි දු වට" යි වෙසතුරුදා වදාළහ. ධම්දෙසුන්[24] අසා හැම දෙන[25] හුනස්නෙන් නැගි වැඳැ නුවර ගියහ. එක රජෙක් හො, රජඇමැත්තෙක් හො, අනෙක් දවසට පැවැරු කෙනෙකුදු නොවූහු.

---

[1] වැලතට
[2] වයස-හැම
[3] පළමු වැ
[4] සව්බරණින්
[5]
[6] ළදරු දරුවන් "දහර දහරෙ නාගර දාරකෙ ච දාරිකායො ච" යනු අටුවා
[7] කුමරුන්
[8] ඔවුන්ගෙ එහි-හැම
[9] සැහැරජහු
[10] මොවුන්
[11] ධන්, ධ්‍යාන්, දන්
[12] කළුල් දෙවූ. කුළුල් දෙවූ, කළුන්දෙවූ, කළුදෙවුල්නම්-මු
[13] වැඳීම යැ
[14] පගලක්
[15] මා
[16] වැන්මදෙමි
[17] වැඳැමැයි, රජාණන්-හැම
[18] වඳවාගෙන-මු
[19] දෙන මැ
[20] වැස්සෙන්
[21] තෙමුමුව
[22] මහපෙළහර
[23] වටුයෙ යැයි
[24] එ ධම්දෙසුන්
[25] දෙන මැ

බුදුහු අනෙක් දවස් විසිදහසක් සඟුන් පිරිවරා **කිඹුල්වත්** නුවර සිඟන්නට වැඩියහ. පෙරමඟට ගොස් පා ගත් කෙනෙක් හො, පැවැරු කෙනෙක් හො, නොද වූහු. බුදුහු එළිපතැ වැඩැ සිටැ, පෙරැ බුදුහු, කුලනුවරැ කිසෙ පිඬු සුරුහ[1] හො! ගෙපිළිවෙළ හැරැ ඉසුරු ජනන් ගෙ ගෙට එළඹියහ හො! නොහොත්, සපදන්සැරි සුරුහ, හො!"යි බලනුවො, ගෙ-පිළිවෙල පියා එක් බුදු කෙනකුනුදු[2] නො වැඩිසෙ දැකැ, "දැන් මයිදු එ මැ වංසය[3] රැක්ක මැනැවැ.[4] අනාගතයෙහි මාගෙ සව්වො මා අනුවැ හික්මෙන්නාහු, සපදන්සැරිවත් පුරනු වෙති" කෙළවරැ ගෙහි පටන්-ගෙනැ සිඟමින් වඩිති. "අප හිමි **සිද්ධත්** කුමර පිඬු සෙරෙල"යි දෙබුමු තුන්බුමු ආදි පහාහි සිහිමැදුරු[5] විවර කොටැ බලන ජනයො දැක්මෙහි[6] ව්‍යාවට වුහු.

**යසොධරා** දෙවි වනාහි "හිමිහාපිත් මෙ මැ නුවරැ රුවන්රිය අරා දෙව්පිරිස් බඳු පිරිස්[7] පිරිවරා දැන් මුඬු වැ කහවත් හැඳැ පෙරෙවැ පා කබලක් ගෙනැ අහර සිඟා ල. හෙ ඔහට හොබී[8] හො! නොහොබී හො!" යි සිහිමැදුරු[9] විවර කොටැ බලන්නී, බුදුන්, නන් විසිතුරු පැහැයෙන් දිළියෙන සිරිරු රසින් නුවර මහවෙ බබුළුවනුවවන්, බ්‍යාම ප්‍රභායෙහි[10] ගැලී-සිටි අසුඅනුව්‍යඤ්ජනයෙන් බබළන දෙතිස් වරලකුණෙන් සැදුම් ලද රූපකය ඇතියවුන්, උපමා නැති බුදුසිරින් වොරජනන්, දැකැ හිස පටන්-ගෙනැ පතුල් දක්වා **නරසීගා** නම් අට ගයෙකින් බුදුන් වනා **සුදෙවුන්** මහරජාණන් කරා ගොස්, "තොප පුතණුවො අතුරුවෙ බැසැ සිඟති"යි වැ.[11] රජාණො[12] බිය පත් වැ සළුව හඳිමින් වෙළෙවි[13] වැ ගොස් බුදුන් පෙරට[14] සිටැ, "වහන්සෙ, මට ලජ්ජා කුමට කරව? කුමක් සඳහා සිඟව? මා මෙ සඟනට බත් නොදිය හෙතී,[15] ගත්තාව?"යි කීහ. "මහරජ, මෙ අප[16] ගෙ වංස යැ"යි වදාළො.[17] "වහන්සෙ, තොප ගෙ **මහාසම්මත**වංසයෙහි එක රජෙකුදු නොසිඟුයෙ නො[18]?"යි කීහු. "මහරජ, හෙ තොප ගෙ වංස යැ. අපගෙ වූ කල බුද්ධවංසයැ. හැම බුදුහු[19] සිඟා-වැටුණහ." යි, අතුරුවෙයැ සිටැ ගාථාවක් වදාළහ. එ[20] ගාථාව අසා සොවන් වූහ; දෙවන ගාථාව අසා සෙදගැමි වූහ; මහධම්පල්දා අසා අනගැමී[21] වූහ; මීයන කලැ සෙසත් යටැ සිරියහන් මත්තෙ හෙවැ රහත්වූහු.

රජාණො, සෙදගැමි වූවාහු, බුදුන් අතින් පා ගෙනැ විසිදහසක් සඟුන් හා බුදුන් පහයට වඩා සිනිඳු මියුරු බත් දුන්හු. බත් වළඳා උන් කල්හි සතලිස්දහසක් නළුවො බුදුන් වැන්දාහ. **යසොධරා** දෙවී වනාහි, "බුදුන් වඳනට එව"යි කීයෙන් "සැබවින් මම ගුණවත් වීම් නම්, ඔහු මැ ම කරා එති. එ කලැ මැ[22] වඳිමි"යි නොගියා[23] බුදුහු පියමහරජාණන් ලවා පය ගෙන්වාගෙනැ දෙඅග සව්වන් හා සමඟ ඇය ගෙ සිරියහන්

---

[1] සැරුහ

[2] ද්

[3] 'අයමෙව' ව වංසො-අටුවා

[4] මැනැවැයි

[5] සිවු

[6] දැක්මෙහි මැ

[7] මහපිරිස්-මු

[8] සොබී

[9] සිහි මැදුර-මු

[10] රශ්මිප්‍රභාවයෙහි, රශ්මප්‍රවාහයෙහි-මු

[11] කීහු

[12] මහරජාණො

[13] වෙළෙයි වැ

[14] පෙරට වැ

[15] දියහෙතියි.

[16] මා

[17] වදාළහ.

[18] සිඟුයේ නොවෙයි

[19] බුද්හු ම, බුදුහු ම

[20] හෙ

[21] අනාගාමි

[22] ම්ම-මු

[23] ගියාහ

ගබට එළඹැ 'ඇය[1] රිසි සෙ වඳනා කල්හි නොවළක්කෙ යැ[2]" යි වදාරා පැන්වූ අස්නෙහි වැඩැ-හුන්හු. දෙව් වෙළෙව් වැ ගොස් ගොප් මසැ අත්ලා-ගෙනැ [3]පා-පිටැ හිස් තබා වනවනා වැලැපැ රිසි සෙ වැන්ද. රජාණො, ඇය බුදුන් කෙරෙහි[4] සනාබුහුමන් ඇති පරිදි කියන්නාහු, "වහන්සෙ, මදු 'තොප කහවත් හන්හ' යනු අසා කහවත් හන. 'තොප එක් වෙලෙ වළඳති[5] අසා එක් වේලෙ වළඳයි. 'තොප මහත් සම්පත්[6] පී-බව්' දැනැ මහත් සම්පත් පිටවැ. 'මහයහන් පීහ' යනු දැනැ මහ යහන් පියා පට හැඳෙකැ[7] හොවී, 'තොප මල්ගඳ[8] නොපළඳනා බව් දැනැ මල්ගඳ හළ. තමා නෑයන් කෙරෙහි, ඇපි ඇපි පස්වටම්හ'යි හසුන් දුන් කලැ, එක් රජක්හු දූ කීයෙහි නො ගිවිස්සි. මදු මෙසේ ගුණවතැ"යි කී හැ. "මහරජ, දැන් තොප විසින් රක්නා ලද්දිය මෙසෙ වැටෙනු කිසි පෙළහරෙක්[9] නොවෙයි. පෙරැ කිසි කෙනකුන් විසින් නොරක්නා ලද්දී, නොපිරිපැසුණු නුවණ[10] දු තමා රැක්කැ"යි වදාරා සන්කිඳුරුැද[11] දෙසා ඇය අස්වසා හුනස්නෙන් නැඟි වැඩියො.

දෙවන දවස් තමන් මලු[12] නන්‍ද කුමරහු ගෙ තනතුරු මඟුල්, ගෙවදනා මඟුල් විවාමඟුල් මෙ තුන් මඟුලට සරහන කල්හි ඔහු[13] ගෙට එළඹැ පැන්වූ අස්නෙ[14] වැඩැ හිඳ මඟුල් වදාරා ඔහු පැවිජි කටැටි වැ පය අතැ නඟා තබා හුනස්නෙන් නැඟි වැඩියො. ජනවුකලණ නම් රජ කුමරි[15] බුදුන් හා යන කුමරහු දැකැ, "හිමියාපිත, වහා එ"යි කියා කර දික් කොටැ කවළියෙන් බැලුව[16]. හෙද බුදුනට "පය ගන්ව, වහන්සෙ"යි කියන්නට නොපොහොසත් වූයෙ, බුදුන් හා[17] වෙහෙ මැ ගියෙ. බුදුහු ඔහු නොකැමැති සෙ පැවිජි කැරැවූහු. මෙසේ බුදුහු කිඹුල්වත් නුවර ගොස් තුන් වන දවස් නඳ[18] කුමරහු පැවිජි කළහ.

සත්වන දවස් යසොධරා දෙව් තමා පුතු රාල් කුමර[19] කුමරබරණින්[20] සඳා මෙ "විසිදහසක් මහණ ගණ පිරිවර[21] ලද, රන්වන් උතුම් රූ ඇති, මහබඹහු සෙයින් දිළියෙන, මහණ තා පියෙ[22] යැ. ඔහු ගෙ මහානිධි සතරෙක් ඇති. ඔබ නික්මැ ගිය තැන් පටන්-ගෙනැ එ නො දක්මහ. උහු කරා ගොස් දායාද ඉල්ලා-ගන.[23] පියන් ගැති[24] දෙයෙක් නම්, පුතුන් ගැති වේ ද!"යි නඟායවු.[25] කුමර බුදුන් කරා ගොස්, "මුහු ම පියාණහ" යන සෙනෙහෙන් සතුටු සිත් ඇතියෙ, "මහණ, තාගෙ සෙවණ සුව යැ"යි ළඳ බොළඳ බස බෙණෙයි. බුදුහු වළඳා අනුමෙව්නි කොටැ හුනස්නෙන් නැඟී වැඩියහ. කුමර ද දායාද ඉල්ලමින් බුදුන් හා මැ ගියෙ. බුදුහු දරුවා[26] නො නැවතූහ.

[1] එය-හැම
[2] වළකන්නෙ යැ
[3] අල්වා-ගෙන
[4] කෙරෙ
[5] වළඳනු
[6] සම්පතක්
[7] පටු හැඳෙක-මු
[8] මල්ගඳවිලෙවුන්-මු
[9] පෙරහරයෙක්
[10] නොපිර පැසුණු නුව දුක් මා, නොපිරිපැසුණු නුවණ දුන් මා-මු
[11] සඳකිඳුරුදා-මු
[12] මල්
[13] ඔහුගෙ-මු
[14] අස්නෙහි
[15] රජ කුමරිය
[16] බැලූහැ
[17] හා මැ
[18] නන්‍ද
[19] කුමරහු
[20] සව්බරණින්
[21] පිරිවරන ලද
[22] පියෝසැ
[23] ගෙන ගනයි
[24] නැති
[25] යවුහ යවුයැ-මු
[26] දරුවාණන්-මු

පරියනයොද් බුදුන් හා යන්නහු නවතන්නට නොපොහොසත්[1] වූහු. මෙසෙ හෙ බුදුන් හා සමඟ අරම් ගියෙ.[2]

එ සඳැ බුදුහු, "මෙ පිය අයත් ධන ඉල්ලයි. මොහට සසරවැසිකරණ[3] ධන නො දුන මැනැවැ. මා බො-මඬහි[4] ලද[5] සත්වැදැරුම් අරිධන දුන මැනැවැ. ලොවුතුරු දායාද යෙහි මොහු හිමි කළ මැනැවැ"යි සැරියුත් [6]මහතෙරුන් කැඳවා මොහු පැවිජි කරා[7]"යි වදාළහ.[8] ඔහු රාල් කුමරහු පැවිජි කොළො.

ඔවුන් පැවිජි වූ කල්හි සුදෙවුන්[9] මහරජාණනට බලවත් දුක් උපන. අධිවාසනා කරන්නට නොපොහොසත් වූවාහු, බුදුන් කරා එළබැ, "මවුපියන් නො අනුදත් දරුවන් පැවිජි නොකරන්නට[10] වරයක් මට වදාරනු මැනැවැ, වහන්සෙ"යි කීහ. බුදුහු ඔව්නට[11] එ වරය දුන්හ.

අල්ලෙ[12] දවස් බුදුන් රජගෙහි[13] වළඳා වැඩැ-හුන් කල්හි, රජාණො "වහන්සෙ, මම්, පධන්හි යොග කරන කල්හි එක් දෙව්දුවක්[14] අවුදු, මහරජ, තපිත්[15] මෙළෙ'යි කී කල්හි, ම පිත් 'බුදු වැ මිසැ, නො මියෙ' යි දෙව්දුව කීවා නො හැදැහිමි"[16] යි කීහු. බුදුහු "මහරජ, තෙපි දැන් කිසෙ හදහව? පෙරැ 'ත පිත් මෙළෙ' යි ඇට ඇරැ-පෑ කල්හි දූ නො

[1] නො පොහොසත්හු
[2] ගියො
[3] සසරවැඩි-මු
[4] බොමඬ හිඳ
[5] ලත්
[6] සැරියුත්
[7] කරවායි, කරවයි-මු
[8] වදාළො
[9] සුදවුන්, සුදෙවුන්
[10] කරවන්නට
[11] ඔවුන්ට
[12] අනෙක්-මු
[13] රජගෙයි
[14] දෙව්දුවක්
[15] කා පිත්
[16] හැදිහිමි

හැදැහුවාව[1]!" යි වදාරා මහධම්පල්ද දෙසූහ. දෙසුන් අවසන් හි රජාණන් අනගැමිපල පසක් කොළො. මෙසෙයින් බුදුහු පියාණන් තුන් මග තුන් පල[2] පමුණුවා සඟපිරිස් පිරිවරා කිඹුල්වතින් නික්මැ රජගහා නුවර ගොස් සීතවනයෙහි වැඩැවුසුහු.

එ කල්හි සැවැත් නුවරැ අනෙවඬුමහසිටු පන්සියක්[3] ගැලින්[4] බඩු ගෙන්වා[5] ගෙනැ රජගහා නුවරැ තමා සබඳ සිටිහු[6] ගෙට එළබැ එහි සිටැ බුදුන් උපන් බව් දැනැ රැ බොහො වෙලෙහි මැ දෙවියන් වළ[7] දොරින් නික්මැ බුදුන් කරා එළබැ බණ අසා සොවාන් වැ අනෙක් දවස් බුදු පාමොක් සඟනට මහදන් දී බුදුන් සැවැත් නුවර[8] වඩනට ගිවිස්වා-ගෙනැ අතරමඟ පන්සාලිස් යොජනක් තන්හි ලක්‍ෂ ලක්‍ෂ විසඳා යොජනෙහි[9] යොජනෙහි මහ වෙහෙර කරවා සැවැත් නුවර ගොස් ජෙත[10] නම් රජකුමරහු ගෙ උයන මසු සුළසින් අතොට අටළොස් කෙළෙකින් විකිණිගෙනැ එ රමණි[11] උයන් මැදැ බුදුනට ගඳකිළි කරවා එ වටා සෙසු සෙනසුන් කරවා පවුරු දොරොටු යොදා රැ වටන් දිවා වටන් සක්මන්[12] පිරි පොකුණු කරවා අටළොස් කෙළක් ධන විසඳා මනොරම[13] කොටැ වෙහෙර කරවා බුදුන් කරා යවී.

බුදුහු මහසඟුන් පිරිවරා රජගහා නුවරින් නික්මැ අනුක්‍රමයෙන් සැවැත් නුවර[14] වැඩියහ. මහසිටි[15] වෙහෙර මහන් සරහා[16] බුදුන් දෙව්රම් වෙහෙර වඩනා දවස් පුතු සව්බරණින් සදා[17] එ සෙයින් මැ සැදි පන්සියක්[18] දරුවන් දී බුදුන් පෙරමඟට යවීයැ. දරු සහපිරිවරින් පස් පැහැයෙන් දිළියෙන පන්සියක් දද ගෙනැ බුදුනට පෙරටු වි යැ. ඔවුන් පස් පස් 'මහා සුභද්දා'[19] නම් 'චුලසුභද්දා'[20] නම් දෙසිටි දුහු සව්බරණින් සැදි පන්සියක් කුමරියන් හා සමඟ පුන්පැන[21] ගෙනැ නික්මුණහ. ඔවුන් පස්පස්[22] සිටිදු සව්බරණින් සැදී එ සෙයින් මැ සැදුණු පන්සියක් අඟනන් හා සමඟ පුන් පැණ[23] ගෙනැ නික්මුණු.[24] එක්බිති කොසොල් රජහු දූ සමන් කුමරි පන්සියක් රථපිරිවරින් ගඳමල් ගෙනැ නික්මුණු.[25] හැම දෙන හට පසු වැ දහවළු හන් පන්සියක් සිටුන් හා සමඟ ගඳමල් ගෙනැ බුදුන් කරා ගියෙ.[26] බුදුහු මෙ උපාසක පිරිස් පෙරට කොටැ මහසඟුන් පිරිවරා සවනක් ගනරසින්[27] දසනුදස බබළවමින්[28] අනත් අපරිසෙ[29] බුදුසිරින්[30] වොරජමින් දෙව්රම් වෙහෙර වන්හු. එකල්හි සිටි බුදුපාමොක් සඟනට[31] වෙහෙර දිනැ, බුදුහු අනුමෙවුන් කළහ. සිටි අනෙක් අටළොස් කෙළක් ධන විසඳා වෙහෙර මහන් කැරැවී.

---

[1] හැදහුහයි, හැදවුවයි
[2] එල
[3] පන්සියයක්
[4] ගැළින්
[5] ගන්වා
[6] සිටුහු
[7] හළ
[8] නුවරට
[9] යොදුන්යොදුනෙහි
[10] ජෙතවන
[11] රමණීය
[12] සක්මන්හල්
[13] මනොරම්‍ය
[14] නුවරට
[15] මහසිටු
[16] සදා, සරසා-මු
[17] සරහා-සදා
[18] පන්සියයක්
[19] මහාසුභද්‍රා
[20] චූලසුභද්‍රා
[21] පුණ්ණකලස, පූර්ණකලස
[22] පස්පස්හි
[23] පුන් පැන, පුන්පැන කලස-මු
[24] නික්මුණහ - හැම
[25] නික්මුණ, නික්මුණෙ, නික්මුණහ
[26] ගියෝ
[27] ඝනරසින්
[28] බබළමින්
[29] අපිරිසෙ
[30] බුදුරසින්
[31] සඟ හට

මෙ සෙයින් බුදුහු තමන් පුරිසධම්මසාරථී වන බැවින් ධම්සක් පවත්නෙහි පටන්-ගෙනැ අනෙකසෘද්ධි ප්‍රාතිහාර්යයෙන් හා දෙශනාවිලාසයෙන් හා මහණ දුළුලු බමුණු ගැහැවි සැහැරජ[1] ඈ අනෙසිය දහස් සතුන් සතන්හි දුලද්[2] බිඳැ-දමා අමාමහනිවනින් පමුණුවමින් ගොස් අනෙවඩු මහසිටිහු සූපනස් කෙළෙක් ධන විසඳා කරන[3] ලදු දෙව්රම් වෙහෙරැ හැම බුදුන් වුසු තන්හි අමා රස වහන පුන්සඳක් සෙයින් විනෙකුමුදුවන පුබුදුවමින් වැඩැ වුසුහු.

**පරසන්තාන දමන නම් තුන්වන පරිච්ඡෙද නිමි.**

## 4. ගහපතිදමන නම් පරිච්ඡේදය

මෙසෙ බුදුහු දෙව්රම් වෙහෙරැ දහම් අමාවහරෙ වස්වමින් වැඩැ වසනුවො, තුන් ලොව්හි සැරිසැරැ[4] **උපාලිගහපතිහි** ඈ සිටිනු[5]දු **කූටදන්ත** ඈ බමණනුදු අජාසත් ඈ රජනුදු[6] **අඟුල්මල්** ඈ සොරුනුදු[3] **සභිය** ඈ පරිබ්‍රාජක යනුදු[3] **සච්චක** ඈ නුවටදරුවනුදු[3] **පාඨිකපුත්‍ර** ඈ දිගම්බරයනුදු[3] **සච්චබද්ධක**[7] ඈ ජටිලයනුදු **බාවරික**[8] ඈ තව්සනුදු[3] **ශාක්‍යභික්ෂු**[9] ඈ මහණනුදු[3] **නන්‍දෙපනන්‍ද** ඈ නාගරාජයනුදු[10] **නාලාගිරිහි**[11] ඈ මහානාගයනුදු[3] **ආලවක** ඈ යක්‍ෂයනුදු[3] රාහු ඈ අසුරනු[12]දු[3] **සක්දෙව්රජහු** ඈ දෙවියනුදු[3] **බක** ඈ බඹනු[13]දු[3] දමා අමා මහනිවන් පැමිණිවූහු.[14]

මෙහි **උපාලි** ගහපතිහි දැමු පරිදි කිසෙ යැ යත්:

එක් සමයෙක්හි බුදුහු මිණිකව ද පෙරෙව් ගඥැතුන් බඳු රත්පහුල් පෙරෙව් මහානුභාව[15] සඟපිරිස් පිරිවරා දෙව්රමින් නික්මැ ගම් නියම්ගම් නුවර දනවු[16] මලමඬුලු ගල්වල් සවනක් ගනබුදුරස්හි කුමුදුවමින්[17] දනවු සරමින[18] ගොස් මගධ රට **නාලන්ද** නුවර නිසා **පාවාරික** නම් සිටිහු[19] ගෙ අඹ උයන්හි වැඩැ වෙසෙති. එ කල්හි **නිගණ්ඨනාථපුත්‍ර** නම් නුවට[20] මහත් නුවටපිරිස් පිරිවරා නාලන්දායෙහි උහු[21]ගෙ **දීර්ඝතපස්වී** නම් නුවටෙක් **නාලන්දයෙහි** වළඳා **පාවාරික** නම් අඹ වනයට[22] බුදුන් කරා එළබැ සාමීචි කොටැ අවසන් ගෙනැ එකත් පස් වැ හුන්නෙ යැ. හුන්නා හට බුදුහු, “කියග තපස්විය,

---

[1] සහරජ
[2] දුලදු
[3] කරනු
[4] සැරිසරා, සැරිසර, සැරිසැරූ-මු
[5] සිටිනුදු
[6] ද්
[7] සච්චබද්ද
[8] බාවාරික
[9] සාතිභික්ෂු
[10] නාරජුනුදු
[11] නාලාගිරි
[12] අසුරයනුදු
[13] බඹනුදු
[14] පැමිණවූහු
[15] මහානුභාව සම්පන්න-මු
[16] දනවුමඬුළු
[17] කුමුටුවමින්
[18] සැරිසරමින්
[19] සිටුහු
[20] නිවට
[21] ඔහු
[22] අඹවනය

**නිගන්ඨනාථපුත්‍ර** පව්කම් කිරීමට කිහි කමක් දක්වයි?" වදාළහ. "**ගොයුම් ගොතුව**, හෙ 'කැමැ, කැමැ'[1]යි නො දක්වයි. 'දඬ, දඬ,[2] යත්, මිසැ"යි කීයෙ.

එ සඳැ බුදුහු නුවටුන් ගෙ සමයෙන් පුළුවුස්නාහු, "හෙ පව්කම් කිරීමට කිහි දඬක්[3] දක්වයා? වදාළහ. "කායදණ්ඩ යැ, වාග්දණ්ඩ යැ, මනොදණ්ඩ යැ යන තුන් දඬක් දක්වයි"කී. එහි පළමු[4] දණ්ඩද්වය නුවටහු අචිත්තක කොටැ දක්වත්, කිසෙ යැ යත්: "යම්සෙ[5] සුළඟ හමන කල අතු සැළෙයි. දිය සැලෙයි, එහි සිත් නැති, එසෙයින් මැ, 'කායදණ්ඩ දු [6]අචිත්තක වෙයි. යම්සෙ සුළඟ හමන කලැ තල්පත් ආදීහු හඬත් මැ යැ, දිය හඬා මැ යැ, එහි සිත් නැති, එසෙයින් මැ වාග්දණ්ඩදු[7] අචිත්තක (මැ) වෙයි. යෙත්. මෙසෙ මෙ දණ්ඩද්වය අචිත්තක කොටැ දක්වති. සිත් වූ කලැ 'මනොදණ්ඩ' කොටැ දක්වත්.

එ සඳැ බුදුහු උහු[8] ගෙ තෙපුල් සිටිවියටි වැ "කියග, තපස්විය, කායදණ්ඩ අනෙකෙක් මැ යැ හො? වාග්දණ්ඩ අනෙකෙක් මැ යැ හො? මනොදණ්ඩ අනෙකෙක් මැ යැ හො?" යි වදාළො. "**ගොයුම්ගොතුව**, කායදණ්ඩ අනෙකෙක් මැ යැ. වාග්දණ්ඩ අනෙකෙක් මැ යැ. මනොදණ්ඩ අනෙකෙක් මැ යැ"යි කී. "මෙ තුන් දණ්ඩයන් කෙරෙහි පව්කම් කිරීමට **නිගණ්ඨනාථපුත්‍ර** කවර දණ්ඩය මහාසාවද්‍ය කොටැ දක්වයි?" වදාළො. "**ගොයුම්ගොතුව**, කායදණ්ඩ මහාසාවද්‍ය කොටැ දක්වයි" කී. "කායදණ්ඩයෙහි[9] තපස්විය?" යි වදාළහ. 'කායදණ්ඩ යෙමි. **ගොයුම්ගොතුව**" යි කී යැ. ("කායදණ්ඩ යෙහි තපස්විය?"යි වදාළහ. "කායදණ්ඩ යෙමි, **ගොයුම්ගොතුව**" යි කී යැ. "කායදණ්ඩ යෙහි තපස්විය?"යි වදාළහ. "කායදණ්ඩ යෙමි, **ගොයුම්ගොතුව**"යි කී යැ.)

මෙසෙ බුදුහු තුන් යලක් ඔහු මෙ[10] කථා වස්තුවැ පිහිට්වූහු[11] බුදුහු මෙසෙ කුමට කළාහ යත්: "මෙ කථා වස්තුව ගෙනැ ගොස් මෙ තමා ගෙ ස්ථරහු මහනුවට හට කියයි. එ[12] පිරිසැ හුන් **උපාලි** මහසිටි[13] එ අසා මට වාදාරොපණයට එයි. මම් උහු[14] පුළුවුත් පැන විසජම්. හෙ පැහැදැ තුන් යලක් සරණ යෙයි. එක්බිති සිවුසස් දෙසම්. හෙ[15] දෙස්නෙන් සොවන් වෙයි. අන්නට[16] වැඩ සඳහා යැ, මා පැරුම් පිරුයෙ[17]"යි දක්නා බුදුහු තුන් යලක් ඔහු කථාවස්තුවැ පිහිට්වූහු.[18]

එ කල්හි නුවට "**ගොයුම්ගොතුව** පව්කම් කිරීමට කිහි දඬක්[19] දක්ව?" යි කී යැ. "තපස්විය, තථාගත[20] 'දඬ දඬ'[21] යි නො දක්වයි. 'කැමැ කැමැ' යත්, මිසැ[22]" යි

---

[1] කැමැයි කැමැයි
[2] දඬදඬ යයි මිස යයි කීය, දඬදඬය යත් මිසයයි කිය
[3] දඬයක්
[4] පළමු වන
[5] සමහර පොතෙකැ නැත
[6] ද්
[7] වාග් දණ්ඩයටත්
[8] ඔහු
[9] කායදණ්ඩය
[10] ගෙ
[11] පිහිටුවූහු
[12] එම
[13] මහසිටු
[14] ඔහු
[15] එ
[16] අන්හට-මු
[17] මා බුදුවූයෙ
[18] පිහිටුවූහු, පිහිටවූහු
[19] දඬයක්
[20] තථාගතයන්
[21] දඬදඬයයි
[22] කැම කැමයක් මිසයයි

වදාළහ. එ සඳැ නුවට බුදුන් ගෙ සමයෙන් පුළුවුස්නෙ, "ගොයුම්ගොතුව පව්කම් කිරීමට කිහි කමක් දක්ව[1]?"යි කී යැ. "තපස්විය මම් කායකර්ම යැ, වාක්කර්ම යැ, මනඃකර්ම යැ, යන තුන් කමක් දක්වමි" යි වදාළො.

සැකෙවින් මෙහි[2] ත්‍රිවිධකායදුශ්චරිත කායකර්ම නම් වෙයි. චතුර්විධවාග්දුශ්චරිත වාක්කර්ම නම් වෙයි. ත්‍රිවිධ මනොදුශ්චරිත මනඃකර්ම නම් වෙයි. කායද්වාරයෙහි පැවැති චෙතනා කායකර්ම යැ; වාග්ද්වාරයෙහි පැවැති චෙතනා වාක් කර්ම යැ; මනොද්වාරයෙහි පැවැති චෙතනා මනඃකර්ම[3] යි. කුමට චෙතනා කර්ම නම් වී යැ යත්: චෙතනා මුල්කොටැ ඇත්තෙ යැ කර්ම. එයින් කියත්,[4] මෙහි අකුසලට පැමිණැ "කායකර්ම වාක්කර්ම මහතැ"යි කියන්නෙ නො කලකිරෙයි. කුසලට පැමිණැ "මනඃකර්ම මහතැ යි කියන්නෙ නො කලකිරෙයි. කිසෙ යැ යත්: පස් අනතුරු කම්හි මවුන් මරනු ආදි සතර කම් කයින් කෙරෙයි.[5] නිරයැ කපක් දවස් පස්නා සඞසභෙද කම් වාග්ද්වාරයෙන් කෙරෙයි.[18] මෙසෙ අකුසලට පැමිණැ "කායකර්ම වාක්කර්ම මහතැ"යි කියන්නෙ නො කලකිරෙනු නම් වෙ.[6] එක ධ්‍යානචෙතනායෙන්[7] සුවාසූදහසක්[8] කප් සුගිසපු වළඳයි.[9] එක මාර්ග චෙතනායෙන්[10] හැම අකුසල් නසා රාත් කෙරෙයි. මෙසෙ කුසලට පැමිණැ "මනඃකර්ම මහතැ"යි කියන්නෙ නො කලකිරෙනු නම් වෙ. මෙතැනැ[11] බුදුහු අකුසලට පැමිණැ මනඃකර්ම මහාසාවද්‍ය කොටැ දක්වන්නාහු. නියත මිසදිට්හ[12] සඳහා වදාරත්. එයින් (මැ) වදාළහ:-[13]

**"නා 'හං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, (යං) එවං මහාසාවජ්ජං, යථයිදං භික්ඛවෙ මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨිපරමානි භික්ඛවෙ වජ්ජානි"යි.**

එකල්හි නුවට කියන්නට නිසි අනෙකක්[14] නො දැකැ බුදුන්[15] ගත් මඟ ගෙනැ "කිම ගොයුම්ගොතුව, කායකර්ම අනෙකෙක් මැ යැ හො? වාක්කර්ම අනෙකෙක් මැ යැ හො? මනඃකර්ම අනෙකෙක් මැ යැ හො?"යි කී යැ. "තපස්විය, කායකර්ම අනෙකෙක් මැ යැ. වාක්කර්ම අනෙකෙක් මැ යැ. මනඃකර්ම අනෙකෙක් මැ යැ"යි වදාළො. "මෙ තුන් කර්මයන් කෙරෙහි පව්කම් කිරීමට කවර නම් මහාසාවද්‍ය කොටැ දක්ව[16]?"යි කී යැ. "මනඃකර්ම මහාසාවද්‍ය කොට දක්වමී" වදාළො. "මනඃකර්ම යෙහි ගොයුම්ගොතුව?"යි කී යැ. "මනඃකර්ම[17] යෙමි, තපස්විය"යි වදාළො.[18] "මනඃකර්ම යෙහි ගොයුම්ගොතුව?"යි කී යැ. "මනඃකර්ම යෙමි, තපස්විය"යි වදාළො. ("මනඃකර්ම යෙහි ගොයුම්ගොතුව?"යි කී යැ. මනඃකර්ම යෙමි, තපස්විය"යි වදාළො.) මෙසෙයින් දීර්ඝ තපස්වී බුදුන් මෙ කථාවස්තුවැ තුන් යලක් පිහිට්ටා[19] හුනස්නෙන් නැඟී නිගණ්ඨනාථපුත්‍රයා කරා ගියෙ. හෙ[20] මහත් නුවටපිරිස් පිරිවරා හුන්නෙ යැ.[21]

---

[1] දක්වහි-මු
[2] මේ
[3] මන ඃකර්මයයි
[4] චෙතනා මුල්කොට ඇත්තෙ කර්ම විසින් කියත්.
[5] කැරෙයි
[6] වෙයි
[7] ධ්‍යානචෙතනායෙක්
[8] සුවාසූදහසක්
[9] වළඳවයි
[10] මාර්ග චෙතනායෙක්
[11] තන
[12] මිසදිට්ය
[13] කීහ-හැම
[14] අනිකක්
[15] බුදුහු
[16] දක්වයි
[17] මන ඃකර්මය යි
[18] වදාළහ
[19] පිහිටුවා
[20] එ
[21] මහත් නුවට පිරිවරාගොස් හුන්නෙ යැ

**උපාලි** ගහපති දූ තමා ගෙ බාලකලොණකාර නම් ගැමෙකින්[1] අය අළ මිනිස්නට "එව, අප සථරහු දක්නට යම්හ"යි පිරිස් පිරිවරා **නිගණ්ඨනාථපුත්‍රයා** කරා ගොස් වැඳැ එකත්පස් වැ හුන්නෙ යි. එ සඳැ **නිගණ්ඨනාථපුත්‍ර දීර්ඝතපස්වී** ආවහු[2] දැකැ "කොයට ගොස් ආහි[3]?" යි පිළිවිත. හෙ **මහණගොයුම්හු** කරා ගොස් ආමි" යි කී යැ. "උපන් කථා කිමැ?" යි කීයෙන් බුදුන් හා තමා හා කළ තාක් කතා හැම කී යැ. එකල්හි **නිගණ්ඨනාථපුත්‍ර දීර්ඝතපස්වී** හට සාධුකාර දී "සථරහු[4] සසුන දත්තෙහි නම් තො යැ. ලාමක වූ **මනොදණ්ඩ** ය මහත් වූ කායදණ්ඩය හා සම වන්නෙ නො වෙයි. පව්කම් කිරීමට **කායදණ්ඩ** ය මැ මහාසාවද්‍ය යැ. **වාග්දණ්ඩ මනොදණ්ඩ** එසෙ වන්නෙ නොවෙ" යි කී.

එ කල්හි **උපාලි** ගහපති **දීර්ඝතපස්වි** හට ඔහු සෙ මැ සාධුකාර දී **නිගණ්ඨනාථපුත්‍රයා** හට[5] "වහන්සෙ, මම මෙ කථාවස්තුවැ මහණ **ගොයුම්** හට[6] වාදාරොපණය කරන්නට[7] යෙමි. යම්සෙ බල ඇති පුරුෂයෙක් දික් ලොම් ඇති එළුවක්හු ලොමැ[8] ගෙනැ මොබට ඔබට ඇදැ[9] ආකර්ෂණ පරිකර්ෂණ සම්පරිකර්ෂණ කෙරෙ ද, එසෙයින් මැ මහණ **ගොයුම්හු** ගෙ වාදයෙන් වාද කොටැ කථා මාර්ගයෙන් දොස් දක්වා මොබට ඔබට ලා[10] ආකර්ෂණ පරිකර්ෂණ සම්පරිකර්ෂණ කෙරෙමි. යම්සෙ සුරාධූර්තයෙන් රහ පරහන[11] මටුලු කස්ස දෙවියටි[12] වූයෙ, කසට හරනා සඳහා දෙකනැ[13] ගෙනැ ඇදැ කිබිසිනි කොටැ පිඹැ[14] පියා ද, උඩුකුරු[15] කොටැ පිඹැ[16] පියා ද, පුනපුනා ගසා-පියා ද, එසෙයින් මැ මම[17] මහණ **ගොයුම්හු** හා වාදයෙන් වාද කොටැ අවධූනන නිර්ධූනන නිෂ්පොටන[18] කෙරෙමි. යම්සෙ බල ඇති මිනිස්සු සණපිළි කරනු සඳහා සණවැහැරි ගෙනැ, මිටිමිටි කොටැ, බැඳැ, දියෙහි ගලා-තබා විලික්සැ-ගිය කලැ, තුන් වන දවස් එ තුබු තැනට[19] ඇඹුල[20] හඹු[21] රහ ඇ උපකරණ ගෙනැ ගොස් දකුණත් පසැ පුවරුවක් තබා, වමත් පසැ පුවරුවක් තබා, පෙරට පුවරුවක් තබා, කෙළවර අත් ලා හැරැ-ගෙනැ එක් යලක් දකුණත් පුවරියෙ[22] පැහැරැ, එක් යලක් වමත් පුවරියෙ[23] පැහැරැ, එක් යලක් පෙරට පුවරියෙ පැහැරැ, කන්නාහු බොන්නාහු සණ දොවුන් කෙළි කෙළිද්දැ, මම ද සණදොවුන් කෙළි කෙළෙනා මිනිසුන් සෙයින්, "මහණ **ගොයුම්හු** හා වාද කෙළියක් කෙළිමි.[24] යම්සෙ රදු ගෙ[25] ඇත් සණ දොවුන් කෙළි කෙළෙනා මිනිසුන් දැකැ, ගැඹුරු දියට වැදැ, සොඬින් දිය ගෙනැ, එක් යලක් කුඹැ එවැ, එක් යලක් පිටැ එවැ, එක් යලක් දකුණත් පසැ එවැ, එක් යලක් වමත්පසැ එවැ, එක් යලක්

[1] ගමෙකින්
[2] ආවාහු
[3] අහි
[4] සථරහුගෙ
[5] නිගණ්ඨනාතපුත්‍රයහට
[6] ගොයුම්හුට
[7] කරන්ට
[8] ලොම-හැම
[9] ලා-මු
[10] නොයාදි
[11] පහන
[12] දෙවියටියෙ
[13] දෙකන
[14] බිම
[15] උඩකරු, උකරු
[16] බිම
[17] මම්
[18] නිස්ථාටන, නිස්පොටන, නිෂ්ථොටන-මු
[19] තනට තෙන
[20] ඇඹුල්
[21] අඹු
[22] දකුණු පුවරුවෙහි, දකුණත පුවරුවෙහි
[23] වමත පුවරුයෙහි
[24] කෙළපාමි
[25] රජු, රජහු

කළවෙ අතුරෙ[1] එවැ, කෙළී ද, එසෙයින් මැ මම[2] ද මහණ ගොයුම්හු හා වාදයෙන් වාද කොටැ සණ දොවුන් කෙළි කෙළෙනා සෙ-ඇතක්හු[3] සෙයින් මොබට ඔබට ලා ආකර්ෂණ පරිකර්ෂණ සම්පරිකර්ෂණ කෙරෙමි" යි කී යැ.

එ කල්හි **නිගණ්ඨනාථපුත්‍ර**, "මහසිට[4] මහණ ගොයුම්හු[5] හා වාදයට මම හො[6] නිස්සෙමි. **දීර්ඝතපස්වී** හො නිස්සැ. තො හො නිස්සෙහි" යි කී යැ. "එකල්හි **දීර්ඝතපස්වී නිගණ්ඨනාථපුත්‍රයා** හට, "වහන්සෙ, **උපාලි** මහසිට්හු මහණ ගොයුම්හු හා වාදයට යනු මට නො රිසුණෙ[7] යැ. හෙ මායාවී යැ. අනුන් ගෙ සව්වන් ආවර්තනය කොටැ ගන්නා මායාවක් දන්නි"[8] කී යැ. එ සඳැ **නිගණ්ඨනාථපුත්‍ර**, "තපස්විය, **උපාලි** මහසිට් මහණ ගොයුම්හු ගෙ සවු වන්නට නො නිස්සැ. මහණ ගොයුම්හු[9] උපාලි මහසිට්හු ගෙ සවු වන්නට නිස්සැ. තො යා මහසිට" යි කී යැ.

මෙසෙ තුන් යලක් දීර්ඝතපස්වීහි[10] කියතුද්, **උපාලි** මහසිට් කුමට නඟා යවයි යත්: **නිගණ්ඨනාථපුත්‍ර** බුදුන් හා එක් නුවර නිසා වසතුදු, බුදුන් නුදුටුවිරි, යමෙක් 'බුදුමි' යන පිළින කෙළෙ වී නම්, එ පිළින නො පියා, හෙ බුදුන් දක්නට නොනිස්සැ. එයින් මෙබුදුන් නුදුටුවිරි වන බැවින් බුදු ගෙ දර්ශනය සම්පතුදු නෛර්යාණික කථා දු නො දන්නෙ[11] සිට්හු බුදුන් කරා යන්නට අවසර දින්.[12]

**දීර්ඝතපස්වී** වනාහි කලින් කලැ බුදුන් කරා එළබැ සිටි;[13] හිඳි;[14] පැන පුළුවුස්සි. හෙ බුදුන් ගෙ දර්ශන සම්පතුදු කථා නෛර්යාණික පරිදි දු දන්නි. එයින් හෙ, "මෙ සිට්[15] ඉතා නුවණ ඇත්තෙ යැ. මහණ ගොයුම්හු කරා ගොස් දැක්මෙහි දු පහද්දි. නෛර්යාණික කථායෙහි දු පහද්දි. එසෙ වන්නා හා වටාලා අප කරා නො වද්දි[16] යි තුන් යලක් නොගිය මනා සෙ කී.

එකල්හි **උපාලි** ගහපති **නිගණ්ඨලාථපුත්‍රයා**[17] තෙපුල් ඉතා මැනැවැ, වහන්සෙ" යි පිළිගෙනැ හුනස්නෙන් නැඟී වැඳ පැදකුණු කොටැ පාවාරික නම් අඹ වනයට ගොස් බුදුන් කරා එළබැ[18] වැඳැ එකත්පස් වැ හුන්නෙ"යි. බුදුන්[19] දුටු කලැ මැ, පහන්නාහු දු[20] නොපහන්නාහු දු බොහො සෙ වඳිත් මැ යැ, නොවඳනාහු[21] ඇලුපහ. කවර කරුණෙනැ[22] යත්: "බුදුහු ඉතා සියුම් කුලෙහි උපන්නාහැ. ගිහිගෙයි වසතුදු[23]

---

[1] අතුරෙහි
[2] මම්
[3] ඇතක්හු
[4] මහසිට්
[5] ගොයුම්
[6] නො
[7] නොරිසිහායැ
[8] දන්නීය යි
[9] ගොයුම්හු
[10] දීර්ඝතපස්වී
[11] දන්නෙන්
[12] දිනු
[13] සිට-හැම
[14] හිද-හැම
[15] සිටු
[16] වද්ද
[17] නිගන්ඨනාතපුත්‍රයා ගෙ
[18] එළඹ ගොස්
[19] බුදුන් කරා ගොස්
[20] "පහන් නාහුද් බොහො සෙ වඳිත්මය" "පහන්නාහු වඳිත් මැ යැ, නො පහන්නාහු බොහොසෙ වඳිත් මැ යැ, නො වඳනා මනාහු" පොත් "පසන්තා පි අප්පසන්තා පි යෙභුයොයන වන්දන්තියෙව. අප්පකා න වන්දන්ති. "කස්මා?" - අටුවා.
[21] වඳනාහු - මු
[22] කරුණෙයැ, කරුණෙක-මු
[23] වසනුවන් විසින් "අගාරං අජ්ඣාව සන්තො පි, වන්දිතබ්බොයෙව" - අටුවා

වැන්දැයුතුවහ.” එයින් වඳත්. මෙ සිටි[1] වූ කලැ පහන්නෙන් මැ වැන්ද.[2] දැක්මෙහි[3] මැ බුදුන් කෙරෙ ප්‍රසාද කෙළෙ.

මෙසෙ බුදුන් වැඳැ එකත්පස් වැ හුන් **උපාලි** මහසිටි, “වහන්සෙ, **දීර්ඝතපස්වි** මෙයට ආ යැ[4] හො?” යි කී යැ.

ආ යැ මහසිට”යි වදාළො. “උහු[5] හා උන් කථායෙක් හා ඇත හො?” යි කී යැ. “ඇත, මහසිට” යි වදාළො. “කුමන කථායෙකැ හො?” යි කී යැ. බුදුහු උහු හා උපන් කථා තාක් වදාළො.

එ සඳැ **උපාලි** මහසිටි **දීර්ඝතපස්වි** හට සාධුකාර දී “සඨරහු ගෙ සස්න දත්තෙ නම්ः හෙ යැ. ලාමක වූ **මනො දණ්ඩය** මහත් වූ **කායදණ්ඩය** හා සම වන්නෙ නොවෙයි.[6] පව්කම්[7] කිරීමට **කායදණ්ඩ** මැ මහාසාවද්‍ය යැ. **වාග්දණ්ඩ මනොදණ්ඩ** එසෙ වන්නෙ නොවෙයි” කී බුදුහු “ඉදින් මහසිට, තොරුසෙකැ[8] ඉඳුවූ[9] කණුවක් සෙයින් නොසෙල්වී[10] සැබැවැ පිහිටා සිටිනෙයි[11] වී, නම්, තා හා කථා කරම්හ” යි වදාළො. “වහන්සෙ, මම සැබැවැ පිහිටා සිටිමි. වදාරනු මැනැවැ”යි කී. “කියග, මහසිට, මෙ ලොකයෙහි සිහිල් දිය නො ගෙනැ හුණු දිය වළඳ කරන[12] නුවටෙක් බලවත් ලෙඩක් වැ සිහිල් දිය නොලදින් මෙළෙ වී නම්, **නිගණ්ඨනාථපුත්‍ර** උහු කොයි උපද්දී[13] යෙයි” වදාළහ. “වහන්සෙ, ‘මනස්සත්ත්ව’[14] නම් දෙව් කෙනෙක් ඇති. ඔවුන් කෙරෙහි උපද්දි. මනස්හි බැඳි මෙළෙන් හා යැ”යි කී යැ.

ඔහු සිහිල් දිය වළඳ නොකරනු කුමට යැ යත්ः නුවටහු “දියෙහි[15] දිවි ඇත” යන සිතින් සිහිල් දිය නො ගත්ති. එහි “කුඩා දිය බිඳු කුඩා පණුවහ” යන සිතින් සිහිල් දිය වළඳ නොකරනුවහට පිත්තජ්වරයෙක් ඇති. ඔහට[16] හුණු දිය බොනු හො අත් පා දෝනෙ හො පරිෂෙක[17] කරනු හො නො රිසියෙයි. රොගය බලවත් වෙයි. සිහිල් දිය වුව මැනැවැ. එයින් රොග සන්හිඳී. මෙ වනාහි හුණු දිය මැ වළඳ කෙරෙයි. එ නොලද කලැ කාඩි[18] වළඳ කෙරෙයි. සිතින් වූ කල සිහිල් පැන් බියටිද් වෙයි. වළඳ කටටිද් වෙයි. එයින් ඔහුගෙ **මනොදණ්ඩ** එහි මැ බිඳෙයි. හෙ “**කායදණ්ඩ වාග්දණ්ඩ** රක්මි”යි “මම් සිහිල් පැන් බියටියෙමි, මට සිහිල් පැන් දෙව” යි කියන්නට නොනිස්සැ. ඔහු මෙසෙ රක්නා ලද **කායදණ්ඩ වාග්දණ්ඩයො** චුතිය හො පිළිසිඳ හො අරන්නට නොහැක්කාහ. **මනොදණ්ඩය** වනාහි බුදුන්නෙ ද,[19] චුති දු[20] පිළිසිඳ දූ[2] අරා මැ යැ. මෙසෙ දුර්වල වන බැවින් **කායදණ්ඩ. වාග්දණ්ඩයො** ලාමකයහ. **මනොදණ්ඩ** ය මැ බලවත් වෙ. මහත් වෙ.

---

[1] සිටුහු, සිටු
[2] වැඳැ-මු
[3] දක්මින්, දැක්මෙන්-මු
[4] අය
[5] උන්, ඔහු
[6] නොවෙයි කී යැ
[7] පව්
[8] තෝරයෙක
[9] හිඳිවු
[10] නොසෙල්වී, නොලස්වී
[11] සිටිනෙ
[12] කරනු
[13] උපදිතියි, උපදි, උපද්දියි-මු
[14] මනස්සත්‍ය-හැම, මනස්සක්ත මු
[15] දියෙයි
[16] ඔහුහට
[17] පරිකෂෙප
[18] කාඩිදිය
[19] ත්, දු
[20] ද්

මෙසෙ උපාලි ගහපතිහි “බුන්[1] මනොදණ්ඩ ඇති නුවට[2] මනස්සත්ත්ව[3] නම් දෙවියන් කෙරෙහි උපද්දී” කී කලැ “මහසිට, සිහි එළවා කියා.[4] තා කායදණ්ඩ මහතැ යි පළමු කී බස් හා දැන් මනොදණ්ඩ මහතැ යි පසු වැ කියන බස්[5] හා සටිත නොවෙයි” වදාළො.

මෙ සිටි[6] බණන කලැ මැ සිති: මූර්ච්ඡා වශයෙන් සංඥා නැත්තා හට සතියකුදු අසස් පසස් නො පවත්ති. සිත ඇති තාක් කලැ ‘මළ හ’ යි නො කියැ හැක්කැ. යම් කලෙක්හි ඔවුන් සිත නො පවත්නෙ වී නම්, “මුහු[7] මළහ. ඇරැ දවාපියව”[8] යි යෙති. කායදණ්ඩ නිරීහ යැ; නිවර්යාපාර යැ. වාග්දණ්ඩ දු එ තෙක් මැ යැ. ඔවුන් ගෙ චුති දු පිළිසඳු දු[9] සිතින් මැ වෙයි. මෙ සෙයිනුදු මනොදණ්ඩ ය මැ මහතැ, බිඳී දු චුති[10] පිළිසිඳ[11] දෙන බැවින්, අප ගෙ මහනුවටහු ගෙ කථා අනෛර්යාණික යැ”යි සළකා බුදුන් ගෙ විසිතුරු පැන විසජුන් ඇසියටි වැ “එසෙ ද හොත්, වහන්සෙ, කායදණ්ඩ ය මැ මහාසාවද්‍ය යැ”යි කී.

එ සඳැ බුද්හු[12] අනෙක් කාරණයක් දක්වන්නාහු, “මහ සිට, මෙ ලොකයෙහි නුවටෙක් තෙමෙ සතුන් නො මරයි. නො ද මරවයි. සමාදන් නො ද කෙරෙයි. සොරකම් නො[13] කෙරෙයි; නො ද කරවයි; සමාදන් නො ද කෙරෙයි; බොරු නො කියයි; නො ද කියවයි; සමාදන් නො ද කෙරෙයි; පස්කම්ගුණ අනුභව නො කෙරෙයි; නො ද කරවයි. සමාදන් නො ද කෙරෙයි. සිහිල්දිය මළදඬු පරණලා හකුරු කැබිලි[14] ‘පණුවහ’ යෙයි. හෙ ඇක්මෙන්නෙ, බොහො පණුවන් මිරිකා මරයි. උහුට[15] නිගණ්ඨනාථපුත්‍ර කිනම් විපාකයක් දක්වයි?” වදාළහැ. “චෙතනා නැත්තෙන් මහා සාවද්‍ය කොටැ නො දක්වයි” කී යැ. “ඉදින් චෙතනා ඇත්නම්, (කිනම් විපාකයක් දක්වයි?” වදාළහ. “මහාසාවද්‍ය කොටැ දක්වයි” කී යැ. “චෙතනා කවර කොටසැ එවැ දක්වයි?” වදාළහ.[16] “මනොදණ්ඩයෙහි එවැ දක්වයි” කී යැ. “මහසිට,[17] සිහි එළවා කියා[18] තා පළමු කී බස් හා දැන් පසු වැ කියන බස් හා සටීත නො වෙයි” වදාළො.[19]

මේ සිටි[20] කලැ මැ සිතී: “අප ගෙ මහනුවට චෙතනා නැතිකම් ‘අල්පසාවද්‍ය’ කොටැ චෙතනා ඇති කම් ‘මහාසාවද්‍ය කොටැ දක්වා,[21] චෙතනා[22] ‘මනොදණ්ඩ’ යැ යෙයි.[23] ඔහු ගෙ කථා අනෛර්යාණික යැ.[24] මොවුන් ගෙ කථා නෛර්යාණික යැ” සිතා වැළි දු බුදුන් ගෙ විසිතුරු ප්‍රශ්නව්‍යාකරණ[25] ඇසියටි වැ නො අනුදත්.

---

[1] බුදුන්
[2] නුවටහු
[3] මනස්සත්‍ය-හැම
[4] කිය
[5] බස
[6] සිටු
[7] ඔහු
[8] දවා-පියව
[9] පිළිසැළුද්-මු
[10] චුතිද්
[11] පිළිසඳුද්, චුතිපිළිසිදු දු
[12] බුදුහු
[13] නොද
[14] කැබිලිති
[15] ඔහුට
[16] වදාළො
[17] මහසිට මහසිට
[18] කීය
[19] වදාළහ
[20] සිටු, සිට
[21] නො දක්වා
[22] චෙතනාවට
[23] යෙහි
[24] අනෛර්යාණිකය යි සිතා
[25] ප්‍රසන්න විසිතුරු ව්‍යාකරණ-මු

එ සඳැ බුද්හු[1] අනෙක් කාරණයක් දක්වන්නාහු, “මහ සිට, මෙ නාලන්ද නම් නුවර[2] බොහො ඇතුන් අසුන් මිනිසුන් විසින් ගහන යැ. ඉදින් පුරුෂයෙක් කඩුවක් ගෙනැ අවුදු ‘මෙ නාලන්දයෙහි යම් තාක් සත්හු ඇද්ද, ඔවුන් එක පහරින් මරා මස් රැසක් කොටැ පියමී’ කියන්නෙ වී නම්, හෙ එ කරන්නට[3] නිස්සැ හො?” යි වදාළහ. “වහන්සෙ, පුරුෂයො දසදෙනෙකුදු[4] විසිතිස්සතලිස් දෙනෙකුදු එයට නොනිස්සහ. එක පුරුෂයෙක්[5] කුමට නිසි දැ!”යි කී යැ. “කියග මහසිට, මෙ ලොකයෙහි සෘද්ධිමත් මහණෙක් හො බමුණෙක් හො අවුදු[6] දැහැවැ, මෙ නාලන්ද එකවට භස්ම කොටැ පියමී” කියන්නෙ[7] වී නම්, හෙ එ කරන්නට නිස්සැ හො?” යි වදාළහ. වහන්සෙ, මෙවෙනි දස නාලන්දවකුදු විසිතිස්සතලිස්පනස් නාලන්දවකුදු එක වට භස්ම කොටැ පියන්නට නිස්සැ. එක නාලන්දයෙක් නම් උහුට කිමෙක් දැ!”යි කී යැ. ‘මහසිට’[8] සිහි එළවා කියා.[9] තා පළමු කී බස් හා දැන් පසු වැ කියන බස් හා සටිත නො වෙයි” වදාළහ.

මෙ සිටි බණන කලැ මැ සිතී: ‘කායප්‍රයොගයෙන්[10] මිනිස්හු පනස්දෙනෙකුදු එක නාලන්දව එක මස්රැසක් කරන්නට නොනිස්සහැ.[11] සෘද්ධි ඇති. එකෙක්[12] වනාහි එක වට දැහැවැ හළු කරන්නට නිස්සැ. අප මහනුවටහු ගෙ කථා අනෛර්යාණික යැ. බුදුන් කථා නෛර්යානික යැ”යි සලකා වැළි දු බුදුන් ගෙ විසිතුරු ප්‍රතිභාන[13] දැක්කැටි වැ නො අනුදත්.

එ සඳැ බුද්හු[14] අනෙක් කාරණයක් දක්වන්නාහු, “මහසිට, ‘දණ්ඩකාරණ්‍ය - කාලිඞ්ගාරණ්‍ය - මෙධ්‍යාරණ්‍ය මාතාඞ්ගාරණ්‍ය’ වල් වූ පරිදි හා ඇසුවිරි දැ”යි වදාළහ. “ඇසුවිරිම් වහන්සෙ” යි කී යැ. “එ කිමෙකින් වල් වී යැ යනු ඇසීහි[15]?” වදාළහ. “සෘෂින් ගෙ දැහැවිලින් වල් වී යැ යනු ඇසීමි” කී. එ[16] වනාහි: රදුන් සෘෂිනට කළ අපහාස දැකැ දැහැවි දෙවියන් විසින් ඔවුන්ගෙ රට නසන ලද. ලොකයො[17] වූ කල “සෘෂිහි දැහැවැ නැසුහ” යි ගත්හු, ලොකයන් ගත් පරිද්දට කොටැ මෙ වාදාරොපණය කරන ලද.[18]

එහි දණ්ඩකාරණ්‍ය වල් වූ පරිදි කිසෙ යැ යත්; සරභඞ්ග බොධිසත්ත්වයන් ගෙ තවුස් පිස් අතිවිපුල භාවයට ගිය කල්හි බොසතාණන් අතැවැසි, සත් තව්සන් කෙරෙහි කිසවච්ඡ නම් තවුස්පාණ කෙනෙක් විවික්ත වැ වාස[19] කටටි වැ තවුස්ගණ[20] පියා ගොදවරී හො තෙරෙහි ගිවුළු වනයෙන් නික්මැ කලිඟු රට දණ්ඩකී නම් රදු ගෙ[21] කුම්භවතී නම් නුවරක් නිසා උයන්හි වෙසෙති. ඔව්නට සෙනාපති[22] උපස්ථාන

---

[1] බුදුහු
[2] නුවරැ-මු
[3] හෙ කරන්නට
[4] දහස් දෙනෙකුද් එයට නොනිස්සහ-සමහර
[5] පුරුෂයෙක් නම්
[6] ඇවිද්
[7] භස්ම කරමි කියෙ
[8] මහසිට මහසිට
[9] කිය
[10] කායප්‍රයොගයෙහි
[11] නොහැක්කහ
[12] එකෙකුදු එකෙකුද්
[13] ප්‍රාතිහාර්යය
[14] බුදුහු
[15] ඇසීදැයි
[16] එහි-මු
[17] ලොකෙයහි, ලොකයෙ
[18] ලදු ලද්.
[19] වාසය
[20] තවුස්ගණන්, තවුසන්
[21] රදාගෙ, බරදාගෙ
[22] ඔහුනට ඔවුන්ට

කෙරෙ. එ කල්හි එ නුවරැ ගණිකාවක් රථයට[1] නැඟී පන්සියක්[2] මාගමුන් පිරිවරා නුවර හොබවමින් ඇවිද්දි. මහාජනයො[3] ඇය[4] බල-බලා පිරිවරා-ගෙනැ[5] ඇවිදුති. මිනිසුන් ගෙ ගැළියායෙන් මහවෙ නො පොහොයි. රජ සිහිමැදුරෙහි සිටැ බලනුයෙ, ඇය දැකැ "හො[6] කවර?"[7] යි පිළිවිත. "මහරජ, තොප ගෙ **නගරසොභිනී**[8] යැ" යි කීහු. හෙ ඊර්ෂ්‍යායෙන් "කිම? නුවර ඇය විසින් හොබී ද! තෙමෙ තමා විසින් මැ හොබී" යි ඇයට උදහස් වැ තනතුරු හරවා ගතැ.[9] හො ඔවුනොවුන් හා සසග[10] කොටැ තම හට වහල් වනුවන් සොයා[11] ඇවිදුනී[12] එක් දවසක් රදු ගෙ[13] උයනට වැදැ සක්මන් කෙළවරැ ආලම්බන ඵලකයෙහි වැතිරැ පහණ සලවටැ හුන් තවුස්පාණන්[14] දැකැ "මෙ තවුස් කිලිටි.[15] පහයින් නොගත්තෙ යැ. උඩුඇළියෙන් මුව[16] වැසුණෙ යැ. යටි ඇළියෙන් ළමැඩි[17] වැසුණෙ යැ. දෙකිසිල්ලෙහි කෙහෙ දිගැ. මම එක් දැයක් සඳහා ඇවිදුනෙයිම්.[18] දැන් **කාලකණ්ණියක්හු** දිටිම්. දිය ගෙනෙව, මා ඇස් දෝනටයැ"යි දිය දැහැටි[19] ගෙන්වා-ගෙනැ දැහැටි[23] කා[20] තවුප්සාණන්[21] වෙරැ පිඩි[22] කොටැ කෙළ පියා, දැහැටි[23] දළමඬුලුමුදුනෙහි බහා-ලා මුව සලා[23] මුදුනෙහි දිය එවැ[24] "මා විසින් කාලකණ්ණි[25] දුටු ඇස්[26] දෝනා ලද. පව් පුවහන ලදැ"යි කියා[27] ගියා.

එ දවස් රජ ඇය සඳහන් කොටැ "නගරසොභිනි කොහි යැ?" පිළිවිසැ[28] "මෙ[29] නුවරැ (මැ) යැ" යනු අසා "ඇය ගෙ තනතුරු ඇයට මැ දෙන්නෙ යැ" යි දෙවි. හො තමා පෙරැ කළ පිනින් ලද තනතුරු තවුස්පාණන් සිරිරැ[30] කෙළ ඔත්තෙන් ලදැ"[31] යි සිතූ.

එයින් කිහිපදවසක් ගිය කලැ රජ පෙරෙවි බමුණු ගෙ තනතුරු ගත. හෙ **නගරසොභිනිය** කරා ගොස් "සොඳුර, තො කුමක් කොටැ තනතුරු පිළිලදහු දැ[32]?" යි පිළිවිත්. "බමුණ, අනෙක් කළමනා දෙයෙක්[33] ඇත්තෙ නො වෙයි. රජ උයන්හි **කූටජටිලයෙක්** ඇති. හෙ කාලකණ්ණියෙකැ, ඔහු ගෙ ශරීරයෙහි කෙළ ඔව,[34] එසෙ වන්නා හා තනතුරු ලැබෙයි" කිව,[35] "ඉතා මැනැවැ"යි බමුණු එයට ගොස් ඇය කළ තාක් දැ කොටැ ගියෙ. රජ එ[36] දවස් උහු[37] සඳහන් කොටැ "බමුණු කොහි යැ?" යි

---

[1] රථයකට
[2] පන්සියයක්
[3] මහරජ
[4] ඈ
[5] පිරිවරගෙන, පරිවාර ගෙන
[6] හෙ
[7] කවුරුැයි
[8] නුවරැ-සොභනීයයි
[9] හරවාගත්
[10] සමඟ
[11] සොයසොයා
[12] ඇවිදිනි
[13] රජුන්ගෙ
[14] තවුසාණන්
[15] කිලිටි, කිලිට
[16] මුවය
[17] ලමීඩී, ලමැඩිය-මු
[18] ඇවිදුනෙම්
[19] දැවටු, දැහැටි, දැහැටු
[20] කකා-හැම.
[21] තවුසාණන්
[22] පිඩු පිඩු.
[23] 'මුවසලා' මුද්‍රිත පොත්වලැ නො එයි. 'මුඛං වික්ඛාලෙත්වා' අටුවායි.
[24] හෙට
[25] කාලකණ්ණිහු
[26] දුටැසු
[27] කිය කියා.
[28] පිළිවිත
[29] මෙමැ
[30] සිරුැරැ ලදිමියි'.
[31] ලද දෙය යි.
[32] පිළිලදුදැයි
[33] දැයෙක්
[34] එව
[35] කීවහු
[36] එම
[37] ඔහු, ඔවු-මු

පිළිවිසැ, "මෙ[1] නුවරැ මැ යැ" යනු අසා, අප විසින් නො පිරික්සා[2] කරන ලද. "උහුගෙ තනතුරු උහුට මැ දෙව"යි දෙවී. හෙ ද තමා පෙරැ කළ පිනින් ලද තනතුරු, "තවුස්පාණන් සිරිරු[3] කෙළ ඔත්තෙන් ලදැ[4]" යි සිති.

එයින් කිහිප දවසක්[5] ගිය කලැ රජු ගෙ පසන්[6] දනවු කුපිත වි යැ. රජ "පසන්[16] දනවු සන්හිඳුවමි" යි සිවුරඟ සෙනඟ ගෙනැ නික්මිණ. පෙරෙවි බමුණු ගොස් රජු[7] පෙරට ජය කියා සිටැ, "මහරජ, තෙප් ජය කැමැති වැ යව්[8] දැ? යි කී යැ. "එසෙ යැ බමුණැ"යි කී යැ.[9] "එසෙ වුවහොත්, රජ උයන්හි කුට ජටිලයෙක් ඇති, හෙ කාලකණ්ණියෙකැ, ඔහු ශරීරයෙහි කෙළ ඔව" යි කී යැ. රජ ඔහු කියමන් ගෙනැ[10] උයනට වැදැ ගණිකාව විසිනුදු පෙරෙවි බමුණු විසිනුද් කළ තාක් දැ කොටැ ඇතොරනුදු[11] "මෙ කුටජටිලයා ගෙ ශරීරයෙහි කෙළ ඔව" යි යෙදී යැ. ඇතොරෝ[12] දු ඇතොරන්[13] රක්නාහුද එසෙ මැ කොළො. එක්බිති රජ උයන් දොරොට්යෙහි[14] රකවල්[15] ගන්වා, "මා හා එන තාක් දෙනා තව්සා සිරිරැ[16] කෙළ එවැ මිසැ,[17] නොයා දෙන්නෙ යැ" යි යෙදී. එකල්හි බලකාය[18] දු හැම මෙහෙතන් වැස්සො දු එමැ නියායෙන් තවුස්පාණන් මුදුනෙහි කෙළ දු දැහැටි දු[19] මුවදෙවි[20] දිය දු ඔත්හ. කෙළින් හා දැහැටි සියල් සිරිරු[21] මුවහ වී.[22]

**සෙනාපති** පසු වැ එ පවත් අසා "මාගෙ පින්කෙත්, සගපුරට රුවන්හිණි,[23] හගවත්, සඑර හට ගහට කළො ල" යි කකියන හදවත් ඇති වැ කටින් සුසුම් විහිදුවමින් වහා උයන් ගොස් කෙළින් හා දැහැටින්[24] මුවහ වැ හුන් තවුස් පාණන් දැක කැසපට ගළා හැඳැ-ගෙනැ දෙ අතින් දැහැටි[25] පා කොටැ-පියා, නගා, හිඳුවා, දිය ගෙන්වා ගෙනැ නහවා,[26] වෙර බෙහෙත් ගල්වා,[27] දෙවනු[28] සිවුදැගඳින් උළා, සියුම් සළුවෙන් පිසැ, පෙරට ඇඳිලි බැඳැ, සිටැ, "වහන්සෙ, මිනිසුන් විසින් කළ[29] දැ නො යෙදෙයි. ඔව්නට කිමෙක් වෙයි හො?" යි පිළිවිත්.

එ කල්හි තවුස්පාණො "**සෙනාපතිය**, දෙවියො තුනක් වැ බුන්.[30] ඇතැම් කෙනෙක් 'රදු මැ[31] නසම්හ' යි යෙති. ඇතැම් කෙනෙක් 'රදු පිරිස් හා සමග නසම්හ' යි යෙති.

---

1 මෙමැ
2 පිරික්ස, පරීක්ෂා
3 සිරුරැ
4 ලද්දෙයයි, ලදුදෙයයි
5 දවසෙකින්
6 පසල්
7 රජුගෙ, රජහට ජය කියා
8 කැමැති වාදැයි, කැමැතියව්දැ යි
9 මෙ වැකිය සමහර පොතෙක නැත
10 අසාගෙනැ
11 ඇතෙවුරනටදු, ඇතොවුරනුදු, ඇතෙවුරනටද්
12 ඇතොවුරොද්
13 ඇතොවුරන්
14 දොරටුයෙහි, දොරටයෙහි
15 රැකවල්
16 සිරුරැ, සිරැ
17 කෙළ නො එවැ
18 බලකායුදු, බලකායුද්-මු
19 දැවටිද්
20 මුව දිවි
21 සිරුරු
22 කෙළෙන් හා දැහැටින් මුවහ ව හුන්-තවුසාණන් - සමහර
23 හීන්, හීණ්, හිණු-මු
24 දැවටින්
25 දැහැටු, දැහැට්-මු
26 නහවා දිය ගෙන්වා ගෙනැ-පොත්
27 ගල්වාගෙනැ
28 දේම, දෙව, දෙවූ, දෙවැ-මු
29 මිනිසුන් කළ-සමහර
30 බුන්හැ
31 රදුව මරම්හ.

ඇතැම් කෙනෙක් 'රදු[1] රට හා නසම්හ'යි යෙති (මෙසෙ කියා). තුමුහු මඳ කොපයකුදු නො කොටැ ලොවට සෙත් සඳහා උපාය'[3] ද දක්වන්නාහු, "වරදෙක් නම් හෙ, වැඳැ[4] කැමැති තැනින් මත්තෙ සෙත් මැ වෙයි" කීහ.

**සෙනාපති** නය ලදින් රජු කරා ගොස් "මහරජ, තොප නිවරද, මහත් ඉදුහ ඇති, තවුස්පාණනට වරදන වුන් විසින්, බැරි කමෙක් කරන ලද. දෙවියො තොපට දැහැවියාහු ල. කැමවූ කලැ සෙත් වෙයි. රට නො නසව. තවුස්පාණන් කමව"යි කී යැ. රජ "තම හට කළ දොස් දැකැ එස කියයි. මම එහු නො කමවමි[5]" යි කී යැ. **සෙනාපති** තුන් යලක් අයදැ රජු නොගිවිස්නෙන්[6] "මහරජ, මම තවුස්පාණන් ගෙ බල දන්මි,[7] ඔහු මුසවා නො කියති. නො දැහැවියහැ. මෙයිද්[8] සතුන් කෙරෙහි කුළුණින් කියති. ඔවුන් කමව"යි බැණැ[9] "නො කමවමී' කී කලැ[10] "ඔස මහරජ, සෙනෙවි තන් අනෙකක් හට දෙව[11]. මම තො ගෙ අණසක් පවත්නා[12] තන්හි[13] නො වෙසෙමී" කී යැ. 'තො රිසියුණු තැනකට[14] යා. මම මට සෙනාපතියක්හු[15] ලැබෙමි" යි කී යැ.

එ කල්හි සෙනාපති තවුස්පාණන් කරා ගොස් වැඳැ "වහන්සෙ, කුමක් කෙරෙමි හො?" යි කී යැ. "සෙනාපතිය, යම් කෙනෙක් තා කීවා කෙරෙද්ද, ඔවුන් හැමදෙනා ගෙනැ ධන ගෙනැ වළඳ ගෙනැ සරක් ගෙනැ[16] සත් දවසෙකින් ඇතුළතැ රාජ්‍යසීමායෙන්[17] පිටත් වැ යා. දෙවියො ඉතා[18] දැහැවියහ. එකාන්තයෙන් රට නසති[19]" යි කීහ. සෙනාපති එ සෙයින් මැ නික්මැ ගියෙ,[20] රජ යෙමින් මැ ශත්‍රුමථන[21] කොටැ ගොස් ජයකඳවුරෙහි හිඳැ සැදූ[22] නුවර වනැ.

එකල්හි දෙවියො පළමු වැසි වැස්වූහ. මහාජනයො "කූටජටිලය හට වැරැද්[23] තැන් පටන්-ගෙනැ අප මහරජ හට වැඩ වි යැ.[24] විජය කොටැ ආ දවස් මැ වැසි වට"යි සතුටි[25] වූහු. දෙවියො වැළි දූ **සමන්මල්** වැසි වැස්වූහ. මහාජනයො ඉතා[26] සතුටි[27] වූහ. එක්බිති කුඩු මසු[5] වැසි වැස්වූහ. එක්බිති **කහවුන්**[28] වැසි වැස්වූහ. එක්බිති **රුවන් අබරණ** වැසි වැස්වූහ. මහාජනයො සත්බුමුපායැ[29] සත් වන මාලෙහි සිටියාහු, බැසැ දිව අබරණ පළඳනාහු, කූට ජටිලයා වෙරැ කෙළ පී තන් පටන් ගෙනැ අප මහරජ හට

---

[1] රදුහෙ
[2] හැම-මු
[3] උපායක්
[4] නො වෙද-හැම
[5] වදිමියි
[6] ගිවිස්සෙන්
[7] දනිමි-මු
[8] මෙද, මෙයිදු
[9] කීයෙන්
[10]
[11] දෙවව
[12] පවතිනා
[13] තැනැ
[14] තෙනෙකට
[15] සෙනාපතිය, සෙනාපතියකුදු
[16] ධන ගෙන වළඳ ගෙන සරක් ගෙන - ඇතැම් පොත්වල නැත
[17] රාජ්ජසීමායෙන්
[18] ඉතා මැ
[19] නසිතියි
[20] ගියො
[21] ශත්‍රැමථනය-මු
[22] සැදි
[23] වරදු
[24] වියයි
[25] සතුටු-මු
[26] ඉතාම
[27] මසුන්වැසි
[28] කහ වුණු
[29] සත්බුමු මහා පහය

වැඩ වි යැ.[1] රිපුවිජය[2] කෙළෙ. නුවර වන් දවස් මැ වැසි වට, එක්බිති සමන්මල් වැසි වට, මසු වැසි වට, කහවුන්[3] වැසි වට, රුවන් අබරණ වැසිවට" යි සතුටි[4] වැ බණන්නාහු, රජහු[5] කළ පව් අනුමෙවියහැ.

එකල්හි දෙවියො සියුම් ධාරා ඇති, දිළියෙන, සැත්වැසි[6] වැස්වූහු. මහාජනයො සැත්[7] වැස්සෙන් පුවරියෙහි[8] තබා කොටන[9] මස් සෙයින් සුන් සුන් වැ ගියහ. එක්බිති දුම් නැති, දල[10] නැති, කැහැලමල්[11] සුදුසු. අඟුරුවැසි වැස්වූහ. එක්බිති කුළාරගෙ සා රත් කළ ලොහො පිඬු සෙයින් දිළියෙන, පහණවැසි වැස්වූහ. එක්බිති[12] ඇතුළු මීට්[13] නොසිට්නා[14] පමණ සියුම් ගිනි වන් වැලිවැසි වස්වා පොළොවින් අසූ හතක් තැන් පුරා-පීහු. රජු[15] ගෙ විජිතයෙහි කිසවච්ඡ නම් තවුස්-පාණන් හා සෙනාපතිහි[16] හා මවුන්[17] පුස්නා රාම නම් වෙණෙඳ දරුවකු හා මෙ තුන් දෙන දිවි ලදහු.[18]

රජු ගෙ[19] පව්කැම්හි[20] නො සභා තෙසු[21] තිරිසන් ගතියැ සත්නට පැන් ඇති තන්හි පැන් නො වී යැ.[22] තණ ඇති තන්හි තණ නො වීයැ. ඔහු "පැන් කොහියැ හො! තණ කොහි යැ[23] හො!" යි සොයමින් ගොස් සත්දවසින් ඇතුළතැ මැ **රාජ්‍යසීමායෙන්** පිටත් වූහු. එයින් කීහ. **සරභඞ්ග බොධි සත්ත්වයොඃ**

**"කිසං හි වච්ඡං අවකිරිය දණ්ඩකී**
**උච්ඡින්නමූලො සජනො සරට්ඨො**
**කුක්කුලනාමනිරයම්හි[24] පච්චති**
**තස්ස ඵුලිඞ්ගානි පතන්ති කායෙ"යි.**

මෙ සෙයින් **දණ්ඩකාරණ්‍යය** වල් වූ පරිදි දත යුතු. **කාලිඞ්ගාරණ්‍යය** වල් වූ පරිදි කිසෙයැ යත්ඃ **කලිඟුරට නාළිකීර**[25] නම් රජක්හු රජ කරන කල්හි **හිමවු**[26] යෙහි පන් සියක් තව්සො බ්‍රහ්මචාරී වැ අඳුන් දිවිසම් ජල මඬුලු[27] වල්කල[28] ධර වැ වනමූලඵල[29] වළඳා වසන්නාහු, බොහො දවසක් ගිය කලැ ලුණු ඇඹුල් සෙවුනා සඳහා මිනිසුන් වසන තැනට අවුදු අනුක්‍රමයෙන් **කලිඟු** රට **නාළිකීර**[30] රජුගෙ නුවරට පැමිණැ පා සිවුරු ගෙනැ හැඳැ, පෙරෙවැ, ජළ මඬුලු බැඳ අඳුන්දිවිසම් එකස් කොටැ බහා-ලා, පැවිජි වෙසට හොබනා උපසමසිරි දක්වමින් අහර සඳහා නුවර

[1] වියයි
[2] රුපුවිජය
[3] කහවුණු වැසි
[4] සතුටු
[5] රජු
[6] සත්වැසි
[7] සත්
[8] පුවරුයෙහි
[9] කපන
[10] ජල
[11] කැලමල්
[12] ඉග්බිති
[13] ඇතුලු මිටි, ඇතුලු පිටු ඇතුළු මිටැ-මු
[14] සිට්වුනා
[15] එ රජුගෙ
[16] සෙනාපතිහු
[17] ඔවුන්-හැම "මාතුපොසකාරාමො" අටුවා
[18] ලද්හු
[19] එ රජු ගෙ
[20] පවුකම්හි
[21] සෙසු
[22] නැති විය
[23] කොහි ගිය හො
[24] කුක්කුල නිරයම්හි, කුක්කුලනාමෙ නිරයම්හි-මු
[25] නාළිකෙර
[26] හිමව්යෙහි-මු
[27] ජටාමඬුලු
[28] වල්කලා
[29] වනමුල්ඵල
[30] නාළිකෙර

වන්හු. මිනිස්හු[1] බුද්ධොත්පාද නැති කල්හි තවුස් පැවිජියන් දැකැ පැහැදැ, හිඳුනා[2] තැන් සංවිධාන කොටැ අතින් භික්‍ෂාභාජන ගෙනැ, වඩා හිඳුවා, අහර තන් කරවා, දුන්හු. තව්සො බත් වළඳා හිඳැ අනුමෙව්නි[3] කළහ. මිනිස්හු බණ අසා සතුටු[4] වැ "භවත්හු[5] කොයට වඩිතී[6]?" පුළුවුත්හු. "සැප තැනකට[7] යම්හ"යි කීහ. "වහන්සෙ, බැහැරැ නො වඩව.[8] රජ උයන්හි වසව. ඇප්[9] බත් කා අවුදු[10] බණ අසම්හ"යි කීහ.

තව්සො ගිවිසැ[11] උයන් ගියහ. නුවරවැස්සො බත් කා, සුදු පිළී හැඳැ, උතුරුසළු එකස් කොටැ, "බණ අසම්හ"යි රැස් වැ උයන් යෙත්.[12]

එකල්හි රජ පහයැ උඩුමහලෙහි සිටියෙ, ඔවුන් යනු වන්, දැකැ[2] මොහු කොට යෙති? මොවුන් කෙරෙහි නටන ගයන[13] වයන මිනිස්හු හා ඇද්දැ?"යි පිළිවිසැ, "නැති, මහ රජ, මොහු තව්සන් කෙරෙහි බණ අසන්නට උයන් යෙති" යනු අසා, "ඔස, මම ද යෙමි.[14] මා හා සමඟ[15] යන්නෙ යැ"යි කියා යවි යැ.[16] නුවර වැස්සො "අපගෙ රජ සැදැහැ නැත්තෙ යැ; සිල්වත් ගුණවතුන් කෙරෙහි නො පහන්නෙ[17] යැ; දුශ්ශීල යැ; තව්සො ධැමිටිහ. නොධැමිටි රජ ධැමිටි වෙ"යි සතුටු[18] වූහු. රජ නික්මැ ඔවුන්[19] පිරිවරා උයන් ගොස් තව්සන් හා පිළිසඨර[20] කොටැ එකත් පස් වැ හුන්නෙ යැ. තව්සො රජු දැකැ පරිකථා කරන්නට නිසි තව්සක්හු රජ හට බණ කියනු කළහැ.

තවුස් පිරිස් බලා පස්දුසිල්කැම්හි ආදීනව හා පන්සිල්හි අනුසස් හා[21] කියනුයෙ, "පණිවා නොකට යුත්තෙ යැ. අයිනාදන් නො ගත යුත්තෙ[22] යැ. මීස හසර නො සිරියැ යුත්තෙ[23] යැ. මුසවා නොකියැ යුත්තෙ යැ. රහ නො බියැ යුත්තෙයැ. පණිවා නිරුහිද්[24] තිරිසන් යොනිහිද්[14] ප්‍රෙතවිෂයෙහිද්[14] අසුකයෙහිද්[14] පිළිසිඳ[25] දෙයි. අයිනාදන් ආදීහුදු[26] එතෙක් මැ යැ. පණිවා කෙළෙ නිරුහි[27] ඉපැදැ,[28] අනෙවා[29]දහස් සුවහස් පැසී[30] සතර අපායෙහි වෙහෙසී, මිනිස් පියට[31] ආයෙ වී නම්, සම්පත් නො වළඳා නව යොව්නෙහි[32] මැ මියෙයි.[33]

[1] මිනිස්සු
[2] හිදිනා
[3] අනුමෙවෙනි
[4] සතුටු වැ
[5] භවත්
[6] වඩිති
[7] තෙනකට, තැනෙකට-මු
[8] නො වඩුව
[9] අප
[10] ගොස්-හැම, 'ආගන්ත්වා,-අටුවා
[11] 'අධිවසෙත්වා' - අටුවා
[12] ඔවුන් දැක
[13] ගසන
[14] ඔවුන් හා මම ද යෙමි - සමහර
[15] මා හැ මැ
[16] යවා කියවිය
[17] නො පහදින්නේය.
[18] සතුටු
[19] ඔහුන්
[20] පිළිසඳර.
[21] අනුසස්
[22] නොකට යුත්තෙ ය
[23] නොකට යුත්තෙය, නො රිසිය යුත්තෙය
[24] ත්, දු
[25] පිළිසැඳ-මු
[26] ද්
[27] නිරය
[28] උපැද, ඉපිද,
[29] අනෙවු
[30] නිරය පැසි
[31] මිනිස් පියසට
[32] නවයෝ නෙහි, නව යෞවනහි
[33] මියයෙයි-මු

අයිනාදන් ගත්තෙ[1] දිළිඳු වෙයි. මිසහසර සෙවියෙ සතුරන් ඇති වෙයි. මුසවා කීයෙ[2] අභූතයෙන් අවඥා[3] කරනු ලැබෙයි. රහ පූයෙ[4] උන්මාද ඇති වෙ"යි පස්දුසිල්කම්හි ආදීනව දැක්වී.

රජ සැදැහැ[5] නැත්තෙ යැ, දුශ්ශීල යැ. දුශ්ශීලය හට සීලකථා කනැ යහුල්[6] දෙන කල් තැනි වෙයි. එයින් රජ: "මම් මොවුන් සගන්මි'යි ආයෙමි. මොහු මා ආ තැන් පටන්-ගෙනැ ඔවිජැ පිරිස් මැදැ තෙපුල් කෙරෙති. මොව්නට කළමනා[7] දන්මි." යි සිතා බණ සමහර කළ කලැ, "සෙට මාගෙ ගෙහි[8] වළඳන්නට වඩනෙයැ"යි කියා ගියෙ. දෙවන[9] දවස් මහත් මහත් සැළි[10] ගෙන්වා-ගෙනැ එහි අසූචි පුරවා කේල්පතින්[11] මුව වසා බඳවා[12] තන්හි තන්හි තැබැවි යැ.[13] බොල් මී තෙල් හා කුබුක්[14] බෙලසුල් හා කෙළෙහි පුරවා හිණිහිසැ තැබැවි යැ. මල්ලවයන් කැඳවාගෙනැ, "තෙප්[15] කැසපට ගළා හැඳැ මුගුරු ගෙනැ සිටැ කුටතාපසයන් පහයින් බස්නා කලැ කෙළෙන් බෙලසුල්[16] හිණි හිසැ සිටැ වටා[17] පියා හිසැ මුගුරෙන් පැහැරැ කැරැ අත්ලා[18] ගෙනැ හිණැ හෙළා-පියව"යි යෙදී යැ. හිණි[19] පාමුලැ කැකුළු බල්ලන් බඳවා සිටිවී. තව්සොද්, "සෙට රජගෙහි වළඳන්නට ගිය මැනැවැ. රජගෙ නම්, සාසඞ්ක යැ. සභය යැ. පැවිජියන් විසින් සදොරට හමු වූ සඅරමුණෙහි සඤ්ඤම[20] ඇති වියැ යුත්තෙ යැ, දුට් දුට්[21] අරමුණෙහි නිමිත්[22] නොගත යුත්තෙ යැ"යි ඔවුනොවුනට[23] අවවාද කොටැ වේලා බලා තවුස් පිරිකර ධරා[24] භික්ෂාභාජන ගෙනැ පිළිවෙළින් රජගෙට නැංගාහැ.

රජ ඔවුන් මහලට නැඟි බව දැනැ සැළමුවවිට බන්[25] කේල්[26] පත් මුදවා-පී යැ. දුගඳවා තව්සන් නාසායෙ පහළ. හිස්මුල[27] වැම්හ යන පමණ පිළිකුල් වියැ. මහතවුස් රද බැලි යැ, රජ: "මෙහි තොප කන පමණ කව. ගෙනැ යන පමණ ගෙනැ යව. තොපට මෙ නිස්සැ. 'ඊයෙ[28] මම් තොප සගන්මි' යි ගියෙමි. තෙපි[29] මා ඔවිජැ[30] පිරිස් මැදැ බිණුව[31] මෙ තොපට නිසි භොජන යැ. වළඳව'යි මහතවුස් හට[32] එවින්[33] අසුචි ගෙනැ එළැවි යැ. තවුස්[34] 'ධිග් ධිග්'[35] ගරහමින් පසුපස්නෙන්[36] බට. "තෙපි මෙ

---

[1] කෙළෙ
[2] කීයෙන්
[3] අවඥා, අවශ්‍ය, අවර්ඝ්‍ය කර, අමා-මු
[4] පීයෙ
[5] සැදැ
[6] යවල්, යවුල්
[7] කළමනා දෑ
[8] ගෙයි
[9] ගොස්දෙවන
[10] මහත් සැළී
[11] කේලිපතින්
[12] බැඳ
[13] තැබ්බ විය, තබවියැ තැබ්වියැ-මු
[14] කුඹුක්
[15] තෙපි
[16] බෙලසුල් හා
[17] වඩා
[18] අල්වා
[19] හින්, හිණ
[20] සංයම්
[21] දුටු දුටු
[22] නිමිත්ත
[23] ඔවුනොවුන්ට
[24] ධරවැ
[25] බැඳි, බඳ, බද
[26] කෙහෙල්
[27] හිස මුල්, හිසමුල
[28] ඊ
[29] තොපි
[30] ඔවිද
[31] බුන ව
[32] මහ තවුසාට, මහ චවුසා හට
[33] පාමින් ලුවින්-මු
[34] මහ තවුස්
[35] දිදි, දිග්, දිග්
[36] පසුව පස්සෙන්

තෙකින්[1] යාටියාව නො[2]!" යි කෙළෙන් බෙලසුල් හිණිහිසැ ඔවා-පියා මල්ලවයනට හිඟි[3] කෙළෙ. මල්ලවයො මුගුරෙන් හිස්පළා, පැහැරැ[4] කරැ[5] ගෙනැ, හිණැ හෙළා-පීහ. එක් කෙනකුදු[6] හිණැ සිටිනට[7] නොනිසි වැ[8] වැටෙමින් ගොස් හිණිමුලැ හුණුහැ. හුණුහුණුවන් ප්‍රචණ්ඩ බල්ලො, "පටත් පටත්" යන අනුකරණ ඇති කොටැ[9] සිඳැ බිඳැ කා-පීහ. ඔවුන් කෙරෙහි[10] යමෙක් නැඟී[11] පලායෙ ද, හෙද් ගොස් බිඳැ තුබූ වළැ හෙයි. එහි ද[12] කීණ[13] බල්ලො ඔහු[14] ලුහුබැඳ ගොස් කත් මැ යැ.

මෙසෙ එ රජ සිල්වත් ගුණවත් පන්සියක් තව්සන් එක දවිසන් මැ දිවි ගැළැවී. එක්බිති දෙවියො ඔහු[15] රටැ පෙරැ සෙයින් මැ නවවිධ වර්ෂා[16] වැස්වූහු. ඔහු ගෙ රජය[17] සැටයොජනෙක් තැන්, උස අසූහත්[18] වැලිතෙලෙන් පිළිසන් වී. එයින් කීහ, සරභඞ්ගබොධිසත්ත්වයො:

**"යො සඤ්ඤතෙ පබ්බජිතෙ අවඤ්චයි**
**ධම්මං භණන්තෙ සමණෙ අදූසකෙ[19]**
**තං නාළිකීරං සුනඛා පරත්‍ථ**
**සඞ්ගම්ම ඛාදන්ති විඵන්‍දමානං"යි**

මෙසෙයින් කාලිඞ්ගාරණ්‍යය වල් වූ පරිදි දත යුතු.

**මෙධ්‍යාරණ්‍යය** වල් වූ පරිදි කිසෙ යැ යත්: අතීතයෙහි බරණැස් නුවරැ සතලිස් කෙළද් ධන ඇති, සිටක්හු ගෙ **දිට්ඨමඞ්ගලිකා** නම් එක මැ දුවක් වැවැ. යහපත, පැහැපත, රූපත. හො රූපසම්පත්තීන් භොග සම්පත්තීන් කුලසම්පත්තීන්[20] සම්පන්න වන බැවින් බොහො දෙනා විසින් පතන ලදු.[21] යමෙක් යමෙක් ඇය කැමැති වී[22] ද, ඔහු ඔහු[23] දැකැ උහු[24] ජන්මයෙහි හො අත්පා ආදියැ හො දොස් දක්වා "උහු කෙරෙහි කවුරු වෙසෙති![25] ඔබ[26] නෙරව[27]" යි නෙරවා,[28] මෙසෙ වූවක්හු දිටිමි. දිය ගෙනෙව, ඇස් දෝනට යැ"යි දිය ගෙන්වා-ගෙනැ අසු දෙවූ.[29] එයින්[30] **දිට්ඨමඞ්ගලිකා** නම් වුවැ. මුල නම් අතුරුධන් වී. හො එක් දවසක්[31] ගඟැ දිය කෙළෙනට[32] යාවි[33] වැ තොට

---

[1] මෙපමණකින්
[2] 'යාටියා නො ව'යි, යාටියා නො වව යි, "එත්ත කෙනෙ' ව ගච්ඡිස්සථ තුම්හෙ'ති?" - අටුවා, යටුයෙහි නො දෙව යි' - කිසි
[3] ඉඟි
[4] පැහැරැගෙන
[5] කර අල්ලා
[6] ද්
[7] සිටිනට
[8] නො හැකිව
[9] පැහැරැගෙන
[10] කෙරෙන්
[11] නැඟිට
[12] එයිදු, එහි දී, එහිදීද්-මු.
[13] දීන
[14] ඔහුද්
[15] ඔහු ගෙ, උහු ගෙ
[16] වර්ෂාවන්
[17] රට
[18] සට්ඨියොජනුබ්බෙධෙන'-සඟි අටුවා
[19] අදොසකෙ
[20] කුලසම්පත්තීන් භොගසම්පත්තීන්
[21] ලද
[22] වේද-මු
[23] ඕ ඔහු-මු, "යො යො පන'ස්සා විවාහත්ථාය පහිණාති. තං තං" - අටුවා
[24] ඔහුගෙ
[25] කවර
[26] ඔහු මම
[27] නෙරපීයව යි
[28] නෙරපියවා
[29] දොවී, දෙව්
[30] එයින් හො
[31] එග්දවසක්
[32] කෙළිනට
[33] යායටි, යටැටි

සදවා, බොහො කන බොන දෑ ගැල් පුරා සරහවා-ගෙනැ, බොහො ගඳමල් දුම් ආදි[1] ගෙනැ[2], පිළිසන් යානයකට[3] නැඟී, නෑ නො පරිජනයන් පිරිවරා, ගෙන්[4] නික්මුණු[5].

එකල්හි අප මහසත් කර්මපරවශ වැ සැඬල්[6] කුලෙහි ඉපැදැ[7] පිටිනුවරැ සම්ගෙකෙකැ[8] වෙසෙ.[9] උහුට[10] **මාතඞ්ග** නම් නමෙක් වි යැ. හෙ සොළොස් හැවිරිදි කල්හි කිසි කාර්යයක්[11] නිසා[12] ඇතුළු නුවර[13] වැද්දැටි වූයෙ, එක් නිල් පියල්ලක් හැඳැ, එක් නිල් පියල්ලක් අතැ බැඳැ, එක් අතෙකින් පැසක් ගෙනැ, එක් අතෙකින් සණ්ටාවක්[14] ගෙනැ, “පහ වව. සැඬෙලෙක්මි” දන්වනු සඳහා වයමින් යටත් සිතින් දුටු දුටුවන් වඳමින්[15] නුවර[16] වනැ.

එකල්හි **දිට්ඨමඞ්ගලිකා** සණ්ටායෙහි හඬ අසා ජවනිකා අතුරෙන් බලන්නී, ඔහු දුරින් එන්නහු, දැකැ “මෙ කවරෙ[17]?”යි පිළිවිසැ “සැඬෙලෙකැ[18]” යනු අසා. “ඇපි කිනම් අකුසලයක් කළම්හ හො! මෙ කවර පාපයක්හු ගෙ[19] විපාක යැ හො! මා නස්නා කලෙක් වන්නෙ වෙයි. පිරිසිදු වන්නට යනුයෙම්[20] සැඬලක්හු[21] දිටිමු[22]” යි සිරුරු වෙවුළුවා, ගරහා, කෙළ පියා, දැස්නට, “වහා දිය ගෙනෙව. සැඬලක්හු[23] දුටි[24] ඇස,[25] නම් කී මුව,[26] දෙවියැ මැනැවැ”යි දෙවැ රථය නවතා-ගෙනැ[27] හැම[28] ගෙට දී යවා ගොස් පහයට නැංග.

රහසොඬ ආදීහුද් ඇයගෙ පරිජනයොද් “සැඬල්හු[29] නිසා රහමස් ගඳමල් ආදි වළ කරනු නො ලදුම්හ. ඔහු ගත මැනැවැ”යි ගොස් නිවරද **මාතඞ්ගපණ්ඩිතයා** තර්ජන[30] කෙරෙමින් කෙහෙයෙහි ගෙනැ,[31] බිම පැහැරැ හෙළා[32] පියා, විළුමින්[33] වැළමිටින්[34] පහණින් තලා, ‘මළහ’ යි සිතා, පයැ,[35] ගෙනැ ඇදැ කසළගොඩැ දමා-පියා ගියො. **මහසත්** සන්[36] ලදින් අත් පා පිරිමැදැ, “මෙ දුක් මට[37] **දිට්ඨමඞ්ගලිකා** නිසා[38] උපන්නෙ යැ. ඉදින් මම පිරිමියෙකිම් වීම් නම්, ඇය මට **පාදපරිචාරිකා** කරවමි”යි

[1] ආදිය
[2] ගෙන්වා ගෙනැ
[3] යානාවකට යානායකට
[4] පිරිවරාගෙන-හැම
[5] නික්මුණුහු
[6] සැඬොල්, සැඬුල්
[7] උපෙද, උපද, ඉපද
[8] ගෙයෙක
[9] වෙසෙයි
[10] ඔව්හට, ඔහුට
[11] කාරියක්, කාරියයක්
[12] සඳහා
[13] නුවරට
[14] හඬාවක්, ඝණ්ඨාවක්-මු
[15] වඳිමින්
[16] නුවරට
[17] කවුරු
[18] සැඬලෙක
[19] පාපයා ගෙ
[20] යනුයම් - ඉපැරණි පොත්
[21] සඬලක්හු
[22] දුටිමි, දුටිමි.
[23] සඬලක්හු, සැඬෙලක්හු
[24] දුටු
[25] ඇසන්දු, ඇසත් ඇසදු
[26] මුවයද
[27] නවත්වාගෙන
[28] හැමදැ
[29] සැඬොල්හු
[30] තර්ජනා
[31] කෙහෙයෙන් හිස, කෙහෙයෙන්හි, කෙහෙයෙයි.
[32] ගසා
[33] විළුඹින්, විළුබින්
[34] වැලමිටින්
[35] ප, පා
[36] සන්නිය, සනය, සනයා, සන්න-මු
[37] මට වූයෙ
[38] නිසා යැ

සිතා වෙවුළමින් ඇය[1] ගෙට ගොස් දිට්ඨමඞ්ගලිකාව ලද හොත් මෙතෙනින් නැඟෙමි. නො ලද, මෙහි මැ වැදැ[2] - හෙවැ මීයෙමි" ගෙඅඟණයෙහි[3] හොති.

එ සමාහි දඹදිවැ "යමක්හු ගෙ ශබ්දොරැ[4] සැඬෙලෙක්[5] දැහැවැ හෙවැ මෙළෙ වී නම්, යම් කෙනෙක් එ ගබැ[6] වෙසෙද්ද, ඔහු හැම සැඬල්[7] වෙති. ගෙ මැදැ හෙවැ මෙළෙ වී නම්, ගෙ වැස්සො හැම දෙන සැඬල්[8] වෙති. දොරැ හෙවැ මෙළෙ වී නම්, දෙ එක්බිති ගෙහි[9] ඇත්තො සැඬල්[10] වෙති. ගෙ-අඟණයෙහි හෙවැ මෙළෙ වී නම්, දෙපසින් සත් සත් ගෙ බැවින්[6] තුදුස් ගෙකෙකැ මිනිස්හු සැඬල්[4] වෙති" යන[7] ව්‍යවස්ථාවයි. මහසත් වනාහි ගෙ අඟණයෙහි හොත්තෙ යැ.[11]

එකල්හි සිට්හු ගෙ පරිජනයො "ස්වාමිය, ගෙ අඟණයෙහි සැඬෙලෙක්[12] හොත්තෙ යැ"යි කීහ.[13] "කුමට හොත්තෙ දොහොයි ගොස්[14] පිළිවිසැබලා, මෙමස්සැඋහුට[15] දී නඟා-පියව"යි යවී යැ. ජනයො ගොස්, "මෙ මස්ස ගෙනැ නැඟී යා[16]" යි කීහ. "මම්[17] මස්සක් නිසා හොත්තෙම් නොවෙමි. දිට්ඨමඞ්ගලිකාව නිසා හොත්තෙමි" කී යැ.[18] "ඇය කවර වරදැ?"යි කීහැ.[19] "මා නිරපරාධය හට[20] ඇය ගැත්තන් කළ දැ නො දක්ව? ඇය[21] ලද, හොත් තැනින් නැඟෙමි. නො ලද, නො නැඟෙමි" යි කී යැ. සිට්[22] එ පවත් අසා දුව ගෙ දොස් බව් දැනැ එක් කහවනුවක් දී යවී යැ. "මම් ඇරිය කැමැත්තෙමි. කහවුනු[23] නො කැමැත්තෙමි" කීයැ. සිට් ද[24] සිට් දු ද[21] "අප සැනැහැති[25] එක මැ දුවැ. වංස රක්නට නිසි අනෙක් දැරයෙක්[26] ඇත්තෙ නොවෙ"යි බිය පත් වැ "යව, දරුයෙනි,[27] අප නොසහන[28] යමෙක් ඔහු මැරුයෙ[29] වී නම්, ඇප් හැම දෙනමො[30] නස්මහ. ඔහු රක්ව"යි වටා ඔහට[31] රකවල්[32] දෙවා හඹු[33] දී යවූහැ.[34] බත් දී යවූහැ. (ධන දී යවූහැ) හෙ එයිදු පිළිබෙව් කෙළෙ. මෙ නියායෙන් දවස් යත් යත්, දෙපස්හි සත් සත් ගෙහි මිනිස්හු[35] නැඟී, "ඇපි තොප නිසා සැඬල්[36] වන්නට නො නිස්සම්හ[37] අප නො නසව. ඇරිය දී උහු හොත් තැනින් නඟා පියව[38]"

---

[1] ඇය ගෙ
[2] හිඳ, හෙව
[3] ගෙ අහණයෙ, අඞ්ගණයෙහි
[4] ගම්දොර-හැම
[5] සැඬොලෙක්
[6] එ ගම, එම ගම
[7] සැඬුල්
[8] දෙක භික්තියෙහි, දෙ භික්තියෙහි, 'උභතො අනන්තරගෙහවාසිකා'-ුවුව
[9] බැගින්
[10] යනු
[11] යි
[12] සැඬොලෙක්, සැඬලෙක්
[13] ගොස් කීහ
[14] ගොස් බලා-සමහර
[15] උඟහට, උහට, උන්ට, ඔහුට
[16] 'ගෙන ය' යි
[17] මෙ
[18] කීහැ
[19] කීහු-මු
[20] නිරපරාධයාට, නිරපරාධයහට
[21] ඇ
[22] සිටු
[23] කහවණු
[24] දු
[25] සෙනහැති
[26] දැරියෙක්, දැරියක්
[27] දරුවෙනි
[28] නො පසස්නා, නො පසස්නාව, නො නසනා
[29] මැරුයෙහි
[30] හැමදෙනා මැ
[31] ඔහුහට
[32] රක්වල්
[33] සමු
[34] යවීයැ-බොහො
[35] මිනිස්, මිනිස්සු
[36] සැඬුල්, සැඬොලින්
[37] නො හැක්කම්හ
[38] නඟා යවයි

යි කීහ. උහු ක්‍රමයෙන් සියක් දී දහසක් දී ලක්‍ෂයක් දී[1] යවුහැ. හෙ එය පිළිබෙව් කෙළෙ.

මෙසෙ සදවසක්[2] ගිය කලැ දෙපස්හි තුදුස්ගෙහි මිනිස්හු රැස් වැ "අප සැඬල්[3] නො වුව මැනැවැ. තොප නොකැමැතුදු, දැරිය ඇපි ඔහට ඇරැ දෙම්හ"යි කීහු. මවුපියො සොක පත් වැ සන්[4] නැති වැ යහන්හි ගැළැ[5]-හුණහ. ඔහු දැරිය ගෙ සිරියහන් ගබට වැදැ[6] දැරිය හැරැ ගෙනැ සුපිපි කැහැල රුකෙක්හි මල් අතු බිඳිනවුන්[7] සෙයින්[8] ඇය ගෙ සව්බරණ ගළවා[9] නියෙන් සීමන්ත[10] දක්වා, සැඬල්[11] කෙහෙ බැඳැ, නිල් පියල්ලක්[12] හඳවා, නිල් පියල්ලක් අතැ බැඳැ, කනැ තුබු[13] පට[14] පළඳවා තල්පන[15] පැසක්[16] දී, දෙ අත් කරැ ගෙනැ පහයින් බහා ඇරැ,[17] "තී සැමියා ගෙනැ යා[18]" යි මහසත් හට දුන්හු.

මානෙල් මලකුදු "ඉතා බරැ"යි නොපළඳනා සිවුමැලි[19] දැරි "නැඟෙව හිමි"[20] කියන්නී, '**උට්ඨාන සාමි**' යි කිවැ. මහසත් "මම් '**උට්ඨාහ**' නම් නො වෙමි" යි කී යැ. වැළි කුම් යෙම්[21] දැ"යි කිව. "නැඟෙව, හිමි මාතඞ්ගය, (කියා"යි) කී යැ. ඇය එසෙ කී කල්හි, "තී ගෙ මිනිස්හු මා නැඟී හිඳුනා[22] පමණ ශක්ති නැති කළහ. දෙ අත්කරැ ගෙනැ නඟාගනැ"යි කී යැ. ඇය තමා නඟා ගන්නා කලැ නැඟෙන වන් වැ පෙරැළි බිමැ වැටී හි දිට්ඨමඞ්ගලිකාව විසින් නටමි. පළමු මා තමාගෙ මිනිසුන් ලවා තළවා දැන් තොමො තළයි" හැඬී යැ.[23]

එකලැ අත් ලා නඟා-හිඳුවා, "යම්හ, හිමි, කියන්නී, **ගච්ඡාම, සාමි**"යි කිවැ. මහසත් "**ගච්ඡයො**" නම් වන ළැවැ වෙති."[24]

මම තී ගැත්තන් විසින් තර කොටැ තළා පියන ලද්දෙමි. පයින් නොයා - හෙමි. පිටින්[25] මා ගෙනැ යා" යි කී යැ. හො නැමී පිට[26] දී මහසත්හු තමා පිට[27] නැඟි කලැ "කොයට ගෙනැ යම් ද හිමි?"යි කිවැ. "පිට්නුවරට ගෙනැ යා" යි කි යැ. හො පැදිදොරතුරට ගොස්, "හිමි, තා වසන්නෙ මෙහි වෙදැ?" යි කිවැ. "මෙ කොතෙනෙක්[28] දැ?"යි කී යැ. "පැදිදොරතුර යැ, හිමි" යි කිවැ. "පැදි දොරතුරෙහි සැඬල්[29] නො විසියැ-හැක්කැ"යි කී.[30] මෙසෙ තමා වසන තන්[31] නො කියා ඇය හැම දොරතුරෙහි

---

[1] ලක්‍ෂයක් දී - සඟි අටුවායෙහි නැ
[2] සත් දවසක්
[3] සැඬොල්හු-මු
[4] සන්න
[5] ගැලැ
[6] ගොස්
[7] බුන්නවුන්
[8] සෙ
[9] ගළවා
[10] සීමාන්ත
[11] සැඬොල්
[12] පියලියක්, පිළියක්
[13] කුඹු
[14] පටක්
[15] පත්-පත
[16] තල් පැසක්
[17] ඇරැ-ගෙනැ
[18] යවයි
[19] ඉතාසියුමැලි
[20] හිමි යි.
[21] යෙමි, යෙම
[22] හිදිනා
[23] හැඬිව
[24] වනළ වෙසෙති
[25] පිට හිඳුවා
[26] පිටු
[27] පිටට
[28] කොතනෙක්
[29] සැඬෙළුන්, සැඬලුන්
[30] කීයැ
[31] තැන්

ඇවිදුවා-පී.[1] මෙසෙ කුමට කෙළෙ.[2] යත්: භව අග් දක්වා නැඟි ඇයගෙ[3] මන් බිඳුනා[4] සඳහා කෙළෙ. මහාජනයො "තොප[5] තබා මැය ගෙ මන් බිඳුනට[6] නිසි අනෙක්[7] කෙනෙක් නැති[8]"යි ගුගුළො. හො පැළදොරතුරට පැමිණැ "හිමි[9] තා වසන්නෙ මෙහි වෙදැ?"යි පුළුවුත. "මො කොතෙනෙක්[10] දැ?"යි කී කල්හි "පැළදොරතුරැ[11] හිමි" කිවැ. "මෙ දොරින් නික් මැ සම්ගෙ[12] බලමින් යා" යි කී යැ. හො එයට ගොස් "මෙ සම්ගෙ තා වසන තන්[13] ද හිමී?" කිවැ, "මා වසන තැනැ[14]" යි ඇය පිටින් බැසැ සම්ගෙට වනි.

එහි සතක'ටක් දවස්[15] වසන මහබොසතාණො ඇයගෙ ජන්මහෙද නො කොටැ දවස් යවා, "ඉදින් මෙ කුලදු මා නිසා මහත් යශස් නො ලදු නම්, මා[16] සූවිසිබුදුන් අතැවැසියෙක්[17] නම් නොවෙයි.[18] මැය පා දෙවි දිය මුළු[19] දඹදිවැ රජනට අභිෂෙකොදක[20] කළ මැනැවැ,[21] ගිහිමිනිස් වැ එ නො පාළ කට[22] හැක්කැ. පැවිජි වුව, මැනැවැ"යි සිතා, දිට්ඨමඞ්ගලිකාව,[23] මම[24] හුදකලා කලැ මෙහෙ කොටිනුදු[25] නෙකොටිනුදු වැටෙන්නට නිස්සෙමි. දැන් වූ කලැ නො[26] හුදකලා බැවින් මෙහෙ නො කොටැ වැටෙන්නට නො පිළිවනැ. මා එන තන් දක්වා තො උකටලී නො වා" යි කියා ගොස් වනයට වැදැ, සොහොන් පියළි සොයා හඳනා පොරෝනා සිවුරු කොටැ රඳා, පෙරෙවැගෙනැ[27] පැවිජි වැ, කිසුණු පිරියම්[28] කොටැ සත් දවසින්[29] ඇතුළතැ අටසමවත් හා පස් අභිඥා නිපයා, දැන් කලි දිට්ඨමඞ්ගලිකාවට වහල් වන්නට නිස්සෙමි"යි අහසින් ගොස් සැඬල්[30] ගම්දොරැ[31] බැසැ සිඟමින් දිට්ඨමඞ්ගලිකාව ගෙ ගෙදොරට ගියො.[32] හො දොරැ සිටියන්[33] දැකැ නො හැඳිනැ "වඩඩ[34] වහන්සෙ, සැඬල් ගෙකෙකැ[35]"යි කිවැ. ඔහු නොගොස් එහි මැ වැඩැ සිටියො.

හො පුනපුනා බලන්නී, හැඳිනැ අතින් ලෙහි[36] පැහැරැ හඬා පාමුලැ හී "හිමි, තොපට මෙවෙනි[37] සිතක් ඇති බැවින් මා මහත් යශසින් පිරිහෙළා අනාථ කුමට කළාව[38]?" යි නොඑක් සෙ වැහැසැ ඇසැ කඳුළු පිසැ-පියා නැඟී, අතින් පය ගෙනැ, ඇතුළු ගෙයි

---

[1] ඇවිද්දාපිහ, ඇවිද්දාපි
[2] කෙළෙය
[3] මිනිසුන්ගෙ - හැම
"භවග්ගප්පත්තම'ස්සා මානං" - අටුවා
[4] බිඳුවන
[5] ත
[6] බිඳුමට
[7] අනෙකෙක් නම්
[8] නැතැයි
[9] හිමිය
[10] කොතනෙක්
[11] පැළදොරතුරය
[12] ගෙය
[13] තැන්හි, තැන
[14] තැනයයි
[15] සතටදවසක්, සතකටක් දවසක්
[16] මම්-මු:
[17] අතැවැසියෙම් - මු.
[18] වෙම් - මු
[19] මුලු
[20] අභිෂෙකකොට
[21] මැනැවැයි සිතා
[22] පළකොට
[23] දිට්ඨමඞ්ගලිකාය - හැම
[24] මා - හැම
[25] ද්
[26] තා, තෝ
[27] පොරෝගෙන
[28] පිළියන්
[29] දවසකින්
[30] සැඩොල්
[31] ගම්දොරට
[32] සිටියො, ගියෙ
[33] සිටියා
[34] වඩ
[35] ගෙයකැයි
[36] ළෙහි අත්පැහැර-මු
[37] වැනි
[38] කළව, කළහයි.

වඩා-හිඳුවා, බත් දුන. වළඳා හිඳ෴ දිට්ඨමඞ්ගලිකාව, නො සොස්;[1] නො වහස; මම් තී පා දෙව් දිය මුළු දඹදිවැ රජනට අභිෂෙකොදක කරන්නට පොහොසත්මි. තො මා කීවා කර. නුවර වැදැ 'ම-සැමි සැඬෙලෙක්[2] නො වෙයි. මහබඹහ[3] හි හඬ ගසා ඇවිද" යි කීහැ. හො "මම් මාගෙ මුවදොසින්[4] මැ දුක්පත් වීමි. එසෙ කියන්නට නොනිස්සෙමි"යි කිවැ. ඔහු "මම ගිහි මිනිස් කලැ දු බොරු නො කීයෙමි.[5] දැන් පැවිජි වැ කුමට කියම් ද! අද පුර අටවකැ. තො 'අන් සත්දවසෙකින් පනුරැසි පොහොදවස් ම-සැමි මහබඹ සඳමඬල බිඳ පියා මා කරා එයි'. මුළු නුවරැ හඬ[6] ගහා[7]" යි කියා, නැඟී ගියො. හො හදහා සූර වැ සතුටු වැ සවසැ හා රැයිම්මෙ[8] නුවර වැදැ කී පරිද්දෙන් හඬ ගහයි.[9]

මිනිස්හු අත් පිඬු ගසා, "බලව, දිට්ඨමඞ්ගලිකා අපට සැඬල් දරුවා මහබඹ කෙරෙයි" සෙමින්[10] කෙළි[11] කෙරෙත්. හො අනෙක් දවස්හි දු එසෙයින් මැ සවසැ හා රැයිම්මෙහි නුවර වැදැ "අන් සදවසෙකින් පස්දවසෙකින් සතර දවසෙ කින් තුන් දවසෙකින් දෙදවසෙකින් එක් දවසෙකින් ම-සැමි මහබඹ සඳමඬල බිඳැ-පියා මා කරා එයි" හඬ ගැහු.

එකලැ බමුණො "මෙ දිට්ඨමඞ්ගලිකා ඉතා සූර වැ කියයි. සැබැවෙක් වන්නෙ වෙයි. එ,[12] දිට්ඨමඞ්ගලිකාවගෙ සදම්හ"යි ගොස් 'සම්හෙ' වටා වැලි එවුහු. හො ද පොහො දවස් රැයිම්මෙහි නුවර වැදැ "අද ම-සැමි[13] එයි" හඬ ගැහු. බමුණො 'මො නුදුරු[14] කොටැ කියයි. අද[15] මහබඹ එල වසන තැනක් බලම්හ"යි ගොස් සම්ගෙ පිළින් වසා බිම ගඳින් තෙවෙර[16]-ගෙනැ උඩ සෙල්වියන් බැඳැ ගඳදුම් දී, මල්දැමින් ලල් දී, සුදුහු[17]. ගෙ සදත්[18] සදත්[19] හිරි එජ්සිණ.[20] 'මහසත්' සඳු නැඟෙත් මැ ඉදුහයෙන්[21] දොළොස් යොදුන් බඹවෙසක් මවා-ගෙනැ[22] අහසට නැඟී සඳවිමන් ඇතුළට වැදැ වනාන්තයෙන්[23] නැඟෙන සඳ බිඳැ නික්මැ සඳවිමනට පෙරට වැ "මහාජනයො මා දකිත්ව" යි ඉටුහු, ජනයො ඔවුන් දැකැ, "දිට්ඨමඞ්ගලිකාව කී දැ සැබැවැ. එන්නෙ, මහබඹ. බඹහු පුදම්හ[24]" යි ගඳ-මලු ආදි ගෙනැ[25] ඇය[26] ගෙ පිරිවරා සිටියො. මහසත් නුවර මුදුනෙහි ගෙනැ සත් යලක් වටා ඇවිදැ මහජනා[27] දුටි[28] බව් දැනැ දොළොස් යොදුන් අත්බව් හැරැ මිනිස් පමණ[29] කොටැ මවා හැමදෙනා දක්නා සෙ

[1] නොසය, දොම්නස් නොව, තො, සොස්නොව - මු නො සොස - මු
[2] සැඬැලෙක්, සැඬොලෙක්
[3] මහබඹයි
[4] මුවදොරින් - හැම, 'මුඛ දොසෙනෙ 'ව' - අටුවා
[5] කියමි
[6] හඬා
[7] ගසායි
[8] රැයින්හි රැයිම්හි, රැයිම්මෙහි දු - මු
[9] ගසයි
[10] යෙති
[11] සැනකෙළි
[12]
[13] මා ස්වාමි
[14] නොදුරු දුරු
[15] අදම
[16] ගෙවර, ගේවර
[17] ගඳදුමින් මල්දුමින් ලල් දී සැදුහු, ගඳදුමින් මල්මින් ලල් දී සැදැහු, ගඳින් මලින් සරා සැදුහු. 'ධූමංදත්වා' ජා:අටුවා.
[18] සඳද් සදද්
[19] හිරු, සිරි,
[20] එජ්සින්
[21] ඉදහයෙන්, ඉද්හයෙන්
[22] මවා
[23] වනඅන්තයෙන්
[24] දුටුම්හයි
[25] ඇරගෙන
[26] ඇයගේ ගෙය
[27] මහජන, මහජනයා
[28] දුටු
[29] මිනිස් පමණකට

සම්ගෙට ගොස් වනැ.[1] ජනයො දැකැ, "අපගෙ මහබඹ බට"යි ජවනිකා ගෙන්වා-ගෙනැ වටා[2] බඳවා පිරිවරා සිටියාහ. මහසත් සිරියහන් මැදැ වැඩැහිඳැ, දිව්‍යමඞ්ගලිකාව වැළත් වැ සිටියට[3] "තො ඔසපජ්හු වෙහි[4]දැ?"යි කී යැ.[5] "එසෙ යැ[6] හිමි" යි කිවැ. "මා දුන් පුතක්හු ගනැ"යි ඇඟිල්ලෙන් නැඹමඬුලු පිරිමටට එ මැ විගස ගබ[7] පිහිටි යැ.[8] "මෙ පමණෙකින් තී පා දෙවී දිය මුළු දඹදිවැ රජනට අභිෂෙකොදක වෙයි. තො සිට" යි කියා බඹ අත්බව් මවා හැම දෙනා දක්නා සෙ[9] නික්මැ අහසට[10] නැඟි සඳමඬලට ගොස් වනි. හො එතැන් පටන් ගෙනැ බ්‍රහ්මපජාපතී[11] නම් වුව.

බමුණො "මහබඹහු අඹුව ඇතුළු නුවරැ වුව මැනැවැ"යි ඇය සව්බරණින්[12] සදා ස්වර්ණශිවිකායෙකැ[13] හිඳුවා-ගෙනැ සත් වන කුල කෙළවර දක්වා නොපිරිසිදු කුල[14] ඇතියන් සිවිගෙහි[15] නො ගත දී, පිරිසිදු කුල ඇති බමුණන් සොළොස් දෙනක්හු[16] ලවා ගන්වා, ගඳ මල් ආදීන් පුදමින් නුවරට[17] ගෙනැවැදැ "බ්‍රහ්මපජාපතිය ඉඳුල් ගෙහි නොවිසියැ හැක්කැ. බිම් පිසැ[18] ගෙකක්[19] කරවම්හ. කරවන තැන් දක්වා මඬුයෙහි[20] වුසුව මැනැවැ"යි මඬු ගෙකෙක්හි වාස කැරැවූහු. එතැන් පටන් ගෙනැ ඇස් හමුයෙහි සිටැ ඇය වැඳැසිටියො කහවුනක්[21] දී වඳති. බස් ඇසෙන[22] තැනැ සිටැ වැඳැටියො සියක්[23] දී වඳති[24], ළඟවැ සිටැ වැඳැටියො පන්සියක්[25] දී වඳති[26]. පා-විටැ[27] හිස් තබා වැඳැටියො දහසක් දී වඳති. පා දෙවි දිය කැමැත්තාහු දස දහසක් දී ගන්ති.[28] පිටිනුවර පටන් ගෙනැ ඇතුළුනුවරැ මඬුව නැඟු තැන්[29] දක්වා එන්නිය ලද්[30] ධන සියක් කෙළ පමණ වියැ. සියලු දඹදිවැ හැම රජහු "බ්‍රහ්මපජාපතිය පා දෙවි දියෙන් අභිෂෙක කරම්හ[31]"යි ලක්‍ෂ ලක්‍ෂ දී ඇය පා දෙවි දිය ගෙන්වාගෙනැ මුදුනෙහි ඕති.[32]

මඬුයෙහි වෙසෙමින් පුතකු ලද. මහපුරිසා පිණිසැ උපන් කුමර ඔහු සෙ මැ යහපත් වි යැ[33]. හැම ලකුණෙන් පරිපූර්ණ වී. "මහබඹහු පිතෙක් උපනැ" යි සියලු දඹදිවැ එකකොලාහල වී යැ. කුමර හට "කිරිමිල වළ මිල[34] යැ" යි එ එ තැනින්[35] අල ධන

[1] වන්හ
[2] වට - මු
[3] සිටිය, සිටිනට
[4] ඔසපජ්හු දැයි, සවුහු වෙහි දැයි
[5] කීයේයැ
[6] එසෙව
[7] ගැබ්
[8] පිහිටියේය, පිහිටියා
[9] සෙයින්
[10] අහස
[11] බ්‍රහ්මප්‍රජාපති
[12] සවබරණින්
[13] සිවිකායෙක්හි
[14] ජන්ම
[15] සිවිගෙ
[16] දෙනකු
[17] නුවර
[18] පියස, රිස
[19] ගෙයක්
[20] මඬුයෙහිම
[21] කහවනුවක්
[22] අසන
[23] සියයක්
[24] වඳිත්
[25] පන්සියයක්
[26] වඳිත්, වඳිති
[27] පා පිට
[28] ගනිති
[29] මඬුතැන්
[30] ලදු, ලද
[31] "............ කරම්හයි පිටිනුවර පටන් ගෙන ඇතුළුනුවර මඬුතැන් දක්වා ලක්‍ෂ ලක්‍ෂදී" කිසි.
[32] ඔති, ඔච්ති-මු
[33] වී
[34] වැලමිල-හැම, වැලිමිල-මු
[35] තන්හි

සියදහසක්[1] කෙළ යැ. පහය[2] දූ දසමසින්[3] නිමි[4] යැ. "කුමරහු[5] නම් තබම්හ[6]"යි ගෙ සදා, දරුවා ගඳදියෙන් නහවා කුමරබරණ පළඳවා, පහයට[7] වඩා "මණ්ඩපයෙහි උපන්නෙන් මණ්ඩව්‍ය[8] නම් කළො.[9] කුමරහු සුවයෙන්[10] මහත් පෙරහරින්[11] මහත් පිරිවරින් වැඩැ සත'ට හැවිරිදි[12] වය[13] පත්[14] කල්හි, සියලු දඹදිවැ ශිල්ප දන්නා තාක් දෙන අවුදු,[15] ශිල්ප උගන්වති. දරු නුවණැත්තෙ යැ. ඇසු-ඇසුවා මුතු අවුණන්නක්හු සෙයින් ගන්නි. ගත් ගත් දැ රන්බජනෙහි ඕත් සී-තෙල්[16] සෙයින් සිටි. බසින් උගන්නා තාක් දැයින් ඔහු නො උගත් දැ නම් නැති. බමුණො ඔහු පිරිවරා ඇවිදිති.

හෙ ද බමුණන් කෙරෙහි භක්ති ඇත්තෙ[17] යැ. සොළොස් හැවිරිදි කල[18] පටන් ගෙනැ බමුණනට[19] බත් දෙයි. නිත්තෙන් ගෙහි බත් කන්නාහු අසූදහසක්[20] බමුණහ. ඔවුන් සතර වන දොටුයෙහි හිඳුවා දන්[21] දෙයි. එසෙ දන් දෙමින් සිටි කලැ එක් දවසක් ගෙහි කිරිබත් පක්හ.[22] අසූදහසක් බමුණො සතර වන දොරටුයෙහි හිඳැ ගිතෙලින් හා (පක්) මීකඬසකුරෙන්[23] කිරිබත් කති. දරු සව්බරණින්[24] සැදි, රන් මරවැඩියට නැඟි, අතින් ලද දඬුවක්[25] ගෙනැ "මුහු[26] පෙර සකුරු තබව. මුහු පෙරට ගිතෙල් ඔව,[27] මිහි ඔව" යි විචාරමින්[28] ඇවිද්දි.

එ කෙණෙහි[29] මාතඞ්ග පණ්ඩිත හිමවත්හි ආශ්‍රමපදයෙහි[30] වසනුයෙ, දිට්ඨමඞ්ගලිකාව පුතුගෙ පවත් කිම හො!"යි බලනුයෙ, දලදු සැඬ සළා කිඹුල් මුවරසියො, නොතොටට බට බව්[31] දැනැ "අද (මැ) ගොස් දරුවා දමා යම් කෙනක්හට දුන් දනැ[32] එල මහත් වෙ ද, ඔව්නට දන් දෙවා අව මැනැවැ"යි සිතා අහසින් ගොස් අනුතත්දහතළායෙහි දැහැටි[33] වළඳා රක්[34] ගල් තෙලෙහි සිටැ, දෙපට සිවුර හැඳැ, වළඳා රක්[19] ගල් තෙලෙහි සිටැ, දෙපට සිවුර හැඳැ, පටිය බැඳැ, පහුල්සඟළසිවුර පෙරෙවැ, මැටිපස ගෙනැ, අහසින් ගොස්, සතර වන දොරටුයෙහි අසූදහසක් බමුණන් බත් කන තැනැ මැ බැසැ සිටියෙ.[35]

---

[1] දස දහසක් - හැම 'කොටිසතසහස්සං' - අටුවා
[2] පහයද්; පහයැ දූ-මු
[3] නවාම් දසමසින්
[4] වියැ
[5] කුමරහුට
[6] තබන්නාහු
[7] ගෙය
[8] මණ්ඩප්ප
[9] කොළො
[10] සුවසෙ, සමයෙ
[11] පෙල හරින්
[12] සත් - හැවිරිදි - හැම
[13] වයසට
[14] පැමිණි
[15] අවුත්
[16] සීතෙල් - සමහර පොත්වල නැත.
[17] ඇතිව
[18] කල්
[19] බමුණන්ට
[20] සොළසබ්‍රාහ්මණසහස්සානි-ජා: අටුවා
[21] බත්
[22] පත්හ පත්හා, පක්හා, පහ
[23] තෙල්මී හා කඬ-සකුරෙක්
[24] සවබරණින්
[25] ලදඬුවක්, ලාදඬුවක්; දළදඬුවක්
[26] මොහු
[27] තබව
[28] ඔවයි කියමින් විචාරමින්
[29] එකල්හි-හු
[30] ආශ්‍රමපථයෙහි
[31] බව
[32] දන්
[33] දැහැටි, දැවිටි, දැහිටි
[34] රත්
[35] සිටියො සිටියේයි

මණ්ඩව්‍ය[1] කුමර බලනුයෙ, මහසත්හු දැකැ දැහැව'ගතැ[2] පහයින් නො ගත් බැවින් කසළපිස්සක්හු[3] වැනි වූ, තොට පියලි ගොතා හන්[4] බැවින් ලාමක වූ, මා දෙ දන් ගන්නට නොනිසි වන බැවින් දක්ෂිණිය[5] නො වූ තො[6] මාගෙ පරමදක්ෂිණිය වූ බමුණන් හුන් තනට කුමට ආහි?[7]" කී යැ. එ අසා මහසත් මෙළෙක්[8] සිතින් අවවාද කරනුයෙ, "යශස්විය, තා ගෙ බත් යුතු කෙළෙ යැ. ජන්මවත්හු එ බත් වළඳන්නාහු, බොන්නාහු, යම් තැනෙක් හිඳු ලැබෙති.[9] සැඬල්නට දෙනුවො කවරහ? මට නො දැහැව[10] මා යපෙන පමණක් දෙ යි කී යැ.

එ සඳැ කුමරඃ "මෙ බත් මට වැඩ සඳහා සැදැහැයෙන් ජන්මවත් බමුණනට[11] යුතු කෙළෙ යැ. අප වැන්නො තා වැනි සැඬල්නට[12] දන් නො දෙති; යා. කුමට සිටිහි[13] දැ?"යි කී යැ. මහසත්ඃ 'දන් නම් ගුණවත්නට දු[14] නොගුණ වන්නට දු දියැ යුත්තෙ යැ. යම්සෙ දෙණැ ද ගොඩැ ද වපුල බිජු පොළොව්රස දු[15] දියරස දු ගෙනැ එල දෙයි, එ සෙයින් එල නොදෙන දෙනෙක්[16] නම් නැති. එ බැවින් යම් කෙනෙක්නට මැ දියැ යුත්තෙ යැ. එතෙකුදු[17] හොත් ශස්‍යඵල කැමැත්තාහු ගොඩැද් දෙණැද් අනුබුයෙහිද්[18] බිජ්[19] වපුරති.[20] වැසි බොහො වී නම් ගොඩැ වපුල බිජ් එල[21] දෙයි. දෙණැ[22] වපුල විජ් කුණු වෙයි. හො කිදා ගඟ නිසා වැවළවිලැ[23] වපුල බිජ් හො-දියෙන් යෙයි. ගඟැ දියෙන් හො යෙයි. වැසි මඳ වී නම්, දෙණැ වපුළ බිජ් එල දෙයි. තුබු තැනැ වපුල බිජ් මියෙයි. සමවැසි වී නම් තුන් කෙතැ[24] මැ වපුළ බිජ් එල දෙයි.[25] තොද් එ සෙයින් මැ

[1] මණ්ඩප්ප, මණ්ඩප
[2] තා - හැම
[3] පිසසක්හු - මු
[4] හස්
[5] දක්ෂණිය
[6] තොප
[7] අයිහි, අයි, අහියි-මු
[8] මොලොක්
[9] 'එබත් වළඳාගන්නාහු බොහො ජන්මවෙත්හු යම් තැනෙක් ද ලැබෙති" "එ බත් වළඳගන්නාහු........" "එ බත් වළඳන්නාහු ජන්මවත්හු යම් තැනෙක් ද ලැබෙති" – පොත් "එ බත් වළඳ කරන්නාහු කන්නාහු බොන්නාහු හෝ වෙති" - මු
[10] දැහැයට
[11] බමුණන්ට, බමුණට
[12] සැඬලන්නට
[13] සිටීදැයි
[14] ද
[15] ද්
[16] දනෙක්-මු
[17] එතෙකුද් හොද්
[18] උනුමුයෙහිද්, අමුණුයෙහිද්
[19] බිජු (මෙලෙස ද ඇත.)
[20] වපුරෙති
[21] විපුල වෙයි
[22] තුබු තැනැ-හැම
[23] වැවළ විල්වල
[24] තුන් තැනක මැ, තුන්තැන ම-මු.
[25] .......... දෙයි වැසි නැත්නම් හො නිසා ගඟ නිසා වැවළවිල්වල වපුළ බිජු දියෙන් හො යෙ යි. දියෙන් හො එයි" - හැම

එල කැමැති විහි[1] නම්, ආ තාක් දන හට සැදැහැයෙන්[2] දන් දෙ. එසෙ දෙන කලැ සිල්වත් ගුණවත් කෙනෙක් සමුඩු වුහු නම්, සරුකෙතැ වපුල පිජ් සෙයින් තට එල මහත් වෙ" යි කී යැ.[3]

කුමර: "මම් කෙත් හැඳිනැ බිජ් පිහිට්වමි.[4] ජාතිමත්, වෙද දන්නා බමුණො සරු[5] කෙත්හ"යි කීයැ.[6] **මහසත්:** ජාතිමදමානලොභද්වෙෂමොහෙයො යම්[7] කෙනකුන් කෙරෙහි ඇද්ද, ඔහු ඇසිවසන් පිරුණු තුඹස්[8] වැන්නහ.[9] ඔව්නට දුන් දනැහි එල මහත් නොවෙයි.[10] යම් කෙනකුන් කෙරෙහි ජාතිමදමානලොභද්වෙෂ (මොහ) යො නැද්ද, මෙත්කුළුණු නුවණ ඇද්ද, ඔහු සියුමියුරු[11] පිරු[12] බඳුන් වැන්නහ. ඔව්නට දුන් දනැ එල මහත් වෙයි. එ දන තට සුගිසපුව දෙන්නෙ[13] යැ"යි කී යැ.[14]

මෙසෙ මහසත්හු පුනපුනා සිල්වත් ගුණවත්නට දුන් දනැ[15] එල[16] මහත් පරිදි කියත් කියත්, දඬුයෙන් පහළ ඇසිවසක්හු[17] සෙයින් කුපිත වැ "මෙ තුන් දොරොටුයෙහි ගොව්වො කොයට[18] ගියහ?" යි කී යැ. ඔහු අවුදු[19] වෙළෙව්[20] වැ වැඳැ සිටියාහ. "මොහු කුමට වැද්ද[21] දුන්ව?" යි කී යැ. "වදනා කලැ නො දුටුවම්හ.[22] 'මෙ නම් තෙනෙකැ[23] ගෙනැ අය' ය නු නො දුටුවම්හ.[22] 'මෙ නම් තෙනෙකැ[23] ගෙනැ අය' යනු නො ද දන්මහැ. මායාකාරයෙක් දො හො! විද්‍යාධරයෙක් දො හො! අප විසින් කළ මනා කිමෙක් දැ? යි කීහ.[24] "මොහු[25] මුහුණ (මැ) පැහැරැ පළා-පියා[26] දඬුයෙන් හුණුපත්තෙන් සපා, පිටවරළු නඟාපියා, කරැ[27] ගෙනැ සත් වන දොරොටුයෙන් පිටතට නෙරව[28]" යි කී යැ. **මහසත්** ඔහු ළඟ නොවන තුරු මැ, නැඟී අහසැ සිටැ[29] "තො විදුරුගල් නියෙන් කැණියටියෙහි වහනෙ දතින් කැයටීයෙහි[30] ගින ගිලියටියෙහි" කියා ඔහු දු බමුණනුදු දක්නා සෙ අහසින් නැඟී ගියො. එයින් වදාළහ බුදුහු

**"ඉදං වත්වාන මාතඞ්ගො**
**ඉසි සච්චපරක්කමො,**
**අන්තලික්ඛස්මිං පක්කාමි**
**බ්‍රාහ්මණානං උදික්ඛතං"යි.**

---

[1] වී
[2] සැදැහෙන්
[3] කීහ, කීහු
[4] පිහිට්වීම්, පිහිටවම්
[5] සතර
[6] කීහ.
[7] යම් යම්
[8] තුබස
[9] වැන්නාහ
[10] වෙ
[11] සියම්යුරු, මියුරු
[12] පිරුණු, පිරි
[13] ගෙනදෙන්නය
[14] කීහ.
[15] දන්
[16] මහත් එල
[17] ඇසිවිසක්හු
[18] කුමට
[19] අවුත්
[20] වෙළෙයී
[21] වැද, වදු
[22] නොදුටුමුහ-මු
[23] තැනෙකැ
[24] කීය
[25] මුහු
[26] තළා පියා-මු "හින්දන්නා" - අටුවා
[27] කර
[28] නෙරපියවයී, නොවියවයී
[29] අහසට නැඟි සිට, අහස නැඟී සිට
[30] කැටියෙහි, කැයටිහි

**මහසත්** පැදුන් දස[1] බලා ගොස් එක් වෙයෙකැ බැසැ[2] "මා පියවර **දිට්ඨමඞ්ගලිකාවට** පැනෙවයි, ඇත් අස් ආදීන් විසින් නො මැකෙව"යි ඉටා කෙණෙසිඅහර සිඟා-ගෙනැ එක් සාලායෙකයැ වළඳති.[3] එ නුවරැ දෙවියො: "අපගෙ සිල්වත් ගුණවත් වහන්සෙට ඔහු බුණු සෙ නොයෙදෙ"යි, දැහැවැ ගියහ.[4] ඔවුන් කෙරෙහි නායක යක් දරුවා ග්‍රීවා ගෙනැ පෙරලා තිබී යැ. සෙසු යක්හු සෙසු බමුණන් ග්‍රීවා[5] ගෙනැ පෙරළා තුබූහ.[6] "මෙ **මහපුරිසා** පිතැ"[7] යි, මෙළෙක්[8] සිතින් (කුමරු) නො මැරූහ. කුමරහු මුහුණ[9] පෙරැළී සිටි පස්[10] බලා තුබුයෙ යැ. ඇස් පෙරැළී මළ මිනිසුන් ඇස් වැනි වි යැ. මීයෙන් කෙළ පෙණ වැහෙයි. සිරිර[11] තද වි යැ. අත්-පා දැඩි වී.[12] සෙසු බමුණො මීයෙන් පෙණ නඟමින්[13] පෙරැළි-පෙරැළී අත්-පා සපත්![14] ඔහුගෙ රපිජනයො ගොස්[15] එ පවත් **දිට්ඨමඞ්ගලිකාවට** කීහ. හො වෙළෙවි[16]වැ පහයින් බැසැ ගොස් "ම-පුත්[17] හට මෙ කළාහු කවරහ[18]!" යි කිව. ජනයො: මෙයට ආ පහුල් පෙරෙවි මහණෙකැ මෙ කෙළෙ[19]" යි කීහ. හො එ අසමින් මැ. "අනෙක් කෙනකුන් ගෙ බල නො වෙයි. මට මහත් සම්පත් දුන් **මාතඞ්ග** පණ්ඩිතයන්[20] ගෙ බල යැ.[21] ම-පුතු[22] පමා සෙ දැකැ ආයෙ යැ. හෙ මෛත්‍රිභාවයෙන් සම්පන්න යැ. මෙතෙක් දෙනා[23] දුක් පත් කොටැ හොවා-පියා නොයෙ"යි සිතා "හෙ කොයට  ගියෙ?" යි පිළිවිසැ, "පුන් සඳක් සෙයින් තෙව්මින්[25] අහසින් පැදුන්දස බලා[26]" ගියෙ යැ" යනු අසා, "ම පුතු දිවි සඳහා එ උතුමා අයදනට[27] ගිය මැනැවැ"යි රන්කලස රන්මාලා[28] ගන්වා ගෙනැ දැසිගණා[29] පිරිවරා ගොස්, **මහපුරිසා** පියවර දැකැ, "මෙ ම-හිමියා[30] පියවරැ"යි, බලමින් ගොස්, ඔවුන් පුටුයෙකැ හිඳැ වළඳනුවන් දැකැ, වැඳැ සිටියා.[31]

**මහසත්** ඇය දැකැ මද බතක් පයැ තිබි යැ. හො මහපුරිසා රන්කලසයෙහි දිය ගෙනැ[32] අත් දොවා, මුව දොවා, "ම-පුත් හට මෙ දුක් කළාහු කවරහ[33] හො?" යි කිව.[34] තී පුතු තපස්වීනට කළ ආක්‍රොශ දැකැ, ඔවුන් ගෙ ගුණ දන්නා දෙවියහ[35] උහුට[36] මෙ තෙක් දැ කළාහ[37]" යි කී යැ.[38] "මම පුත්‍රශොකයෙන් ආයෙමි. තොප පා සරණ යෙමි. ම-පුත් හට නො දහව[39]" යි කිව. "තී පුතු මට ආක්‍රොශ කරන කලැ

---

[1] පැදුම් බලා, පැදුම් දසබලා
[2] වැස
[3] වළඳයි
[4] දැහැවැ ගොස්
[5] ගිරිවා
[6] තිබූහ
[7] පුතැයි
[8] මොළොක්
[9] සීසං-ජා: අටුවා
[10] පිටිපස්ස
[11] සිරුරු
[12] වියැ විනි-මු
[13] නඟා
[14] සිපත්
[15] ගොස් - සමහර
[16] වෙළෙයිවැ ගොස්
[17] මපිත්
[18] කවුරුහ
[19] කෙළෙයයි.
[20] පණ්ඩිතයාගෙ
[21] බැලැයැ
[22] මපුත්, පුතු
[23] දෙනාහට, දෙනාට
[24] මෙතෙක් දුක්
[25] තෙව්මින්
[26] පැදුම්දසබාල අහසින්
[27] අයදුනට
[28] රන්මාලා
[29] දැස්ගණ, දහස්ගණන්
[30] හිමියා, මාහිමියා
[31] සිටි, සිටියැ-මු
[32] දියෙන්
[33] කවරහොයි
[34] කීහ.
[35] දෙවියො
[36] ඔහුට
[37] කළාහුය, කළහයි
[38] කීහු, කීහ
[39] නොදැහැවයි

හො, දැන් තී අයජනා[1] කලැ හො, මා සිතැ දොම්නස් ඇත්තෙ නො වෙයි. හෙ වෙදමදයෙන් මතැ. අර්ථ අනර්ථ නො දන්නී" යි කී යැ.

"ඔහු දිවි ගැළැ නොයන තුරු එ[2] බාලය හට ක්‍ෂමා කරන්නෙ යැ වහන්සෙ"යි කමවා වැන්ද.[3] එසෙ බැවින් "යකුන් පලා-යනු සඳහා තිට අමා ඔස්සක් දෙමි. මා ඉඳුල් බත් එව්නට ගෙනැ යා" යි කී.[4] "මැනැවැ වහන්සෙ" යි රන්මලාව[5] එළවුව. මහසත් එහි ඉඳුල්බත් එවැ, ඉඳුල්දිය එවැ "මෙයින් සමහරක් තී පුතු[6] මියෙහි[7] ඔව[8], තුබුවා සැළැ දිය නඟාපිය එහි ලා, අළලා සෙසු බමුණන් මියෙහි ඔව. ඔහු හැම දෙන[9] නීරොග වෙති"යි කියා අහසට නැඟී හිමවත් ගියහ.

හො එ රන්මාලාව හිසින් ගෙනැ, "අමා-ඔස්සක් ලදුමි[10]" යි කියමින් ගෙට ගොස් පළමු පුතු මියෙහි ඔතැ.[11] නායක යක්රජ[12] "ස්වාමිහි[13] තමා බෙහෙත් කරන කලැ, අප කිසි දැ නොකට[14] හැක්කැ" යි පලා-ගියෙ. දරු වෙරැ ධූලි පිස්මින්[15] නැඟී, "අන්න, මට මෙ කෙළෙ කිමෙකැ?" යි කී යැ. "තා කළ දැ තො මැ දන්හි[16]" මොබැ[17] එ, තා පරමදක්ෂිණිය කොටැ ගත් බමුණන් ගෙ විප්‍රකාර[18] බල" යි කිව. හෙ බමුණන් ගෙ විප්‍රකාර දැකැ විපිළිසර ඇති වි යැ. එ කල්හි ඔහු මවු: "පුතැ, මණ්ඩව්‍යය,[19] තො බාලයෙහි. දානඵල මහත් වන තැන් නොදන්හි. පරමදක්ෂිණාර්හයො[20] නම් මෙසෙ නොවෙති; මාතඞ්ග පණ්ඩිතයා සෙ වෙති. මෙතෙනැ පටන් ගෙනැ මෙ දුශ්ශීලයනට දන් නො දෙ; සිල්වත්නට දෙ.[21] මෙ බල,[22] තා ගෙ කුලුපගයන් අමාඔසු පොවා නීරොග කරම්හ" යි ඉඳුල් කැඳ දිය සැළැ එවැ, අළලා, අසූදහසක්[23] බමුණන් මියෙහි[24] එවුව.[25] බමුණො වෙරැ ධූලි පිස්මින්[26] නැංගහ. එකල්හි සෙසු බමුණො එ බමුණන් "සැඬල්හු ඉඳුල් දිය පූහ"යි නොබමුණු කළහ. ඔහු ලජ්ජා ඇති වැ පලා-ගොස් මෙධ්‍ය මහරජහු කෙරෙහි වුසූහ. මණ්ඩව්‍ය[27] කුමර බරණැසැ මැ විසි.

එක්බිති වෙත්‍රවතී නම් නුවර[28] නිසා වෙත්‍රවතී නම් හො-තෙරැ ජන්මවත් බමුණෙක් පැවිජි වැ ජන්ම නිසා මහත් මන් කොටැ වෙසෙයි.[29] මහසත්, "ඔහු ගෙ මන්

---

[1] අයදනා
[2] එම
[3] වැන්දාහ, වැන්දා
[4] කීහ. කී-මු
[5] රන් මාලාව.
[6]ත පුතු
[7] මුයෙහි
[8] ඔ
[9] දෙනා
[10] ලද්මි, ලත්මී
[11] ඔත්
[12] දෙව්රජ
[13] ස්වහමිහි ස්වාමි
[14] කොට, කොළ
[15] පුස්මින්
[16] දන්නෙහි
[17] මොබට
[18] විකාර-හැම
[19] මණ්ඩප්පය-හැම
[20] දක්ෂිණාර්හයො
[21]
[22]
[23] දියසැළලා අසූදහසක්.......
[24] මුයෙහි
[25] එවූහ.
[26] පුස්මින්
[27] මණ්ඩප්ප - හැම
[28] නුවරක්්ක
[29] වෙසෙති

බිඳුමි[1]”යි, එයට ගොස් උඩු-හොයැ[2] වාස කරනුයෙ, එක් දවසක් දැහැටි[3] කා “මෙ **ජාතිමත්හු** ගෙ ජටායෙහි[4] ලග්න වෙව” යි ඉතා හොය දියෙහි බහා-පී යැ.[5] දැහැටි[6] ගොස් නහන්නහු[7] ගෙ ජටායෙහි ලග්න වී යැ. හෙ දැකැ දැහැවැ උඩු හොයට යනුයෙ, **මහසත්හු** දැකැ “තා ගෙ කවර ජාති යැ?” පිළිවිසැ, “සැඬල්[8] ජාති යැ” යනු අසා, “තො යැ දියහි දැහැටී[9] බහා-ලූයෙහි?”[10] පිළිවිසැ “මම” යැ[11] කීයෙන් “නස,[12] යටත, සැඬල්[13] කළුවණ, මෙහි නො වසා. යට හොසැ වසා[14]” යි, කී යැ. යට හොයැ වසන්නහු[15] විසින් බහා-ලූ දැහැටි[16] උඩු හොයට ගොස් ජටායෙහි ලග්න වූ කල්හි “යටත, ඉදින් තො මෙහි වෙසෙයි නම්, සත් වන[17] දවස් තා හිස සත්කඩ[18] කොටැ පළා-පියමී[19]” කී යැ. **මහසත්** “ඉදින් මම මුහුට දැහැවියෙම් නම්, මාගෙ සිල් නො රැකෙයි. උපායෙන් මුහුගෙ මන් බිඳැ-පිව[20] මැනැවැ”යි, සත් වන දවස් හිරු[21] නො නැංග[22] දින.

මිනිස්හු[23] ප්‍රතිහත[24] වැ රජු ගෙනැ[25] ජාතිමත් තව්සාණන්[26] කරා ගොස් “තෙපි යැ[27] හිරුනො නැංග දෙන්නාව?[28]” යි, පුළුවුත්හ. හෙ “මා කළ දැයෙක් නො වෙයි. හො- තෙරැ එක් සැඬෙලෙක් වෙසෙයි. ඔහු කළ දැයෙක් වන්නෙ වෙයි” කී යැ. මිනිස්හු මහසත් කරා එළබැ[29] “තෙපි යැ, වහන්සෙ, හිරු නො නැංග දෙන්නාව[30]?” යි, පුළුවුත්හ. “මම” යැ[31] කීහ. “හිරු කුමට නො නැංග[32] දෙව?” යි පුළුවුත් කල්හි, “තොප ගෙ කුලයට එළබෙන තවුස් මා නිවරද් හට[33] සාප කෙළෙ. ඔහු අවුදු[34] මා කමවා[35] පා-විටැ[36] හොත් කලැ හිරු විහිද්වමි[37]” කීහ. ඔහු ගොස් එ තව්සා අත පය අත්ලා ඇදැ-ගෙනැ අවුදු **මහසත්හු** පා-මුලැ හොවා, වඳවා, “හිරු විහිදුව, වහන්සෙ” කී කලැ “මම වූ කල ක්‍ෂමා කෙරෙමි.[38] මොහු ක්‍ෂමා නොකළ තාක් කල්[39] හිරු නො විහිද්ද හැක්කැ”යි, කීහ. ඔස,[40] වහන්සෙ, කුම් කරම්හ!යි කීහ. **මහසත්** “මැඩිපිඬක් ගෙනෙව” යි ගෙන්වා-ගෙනැ “මෙ මැටි පිඬ තව්සා හිසැ[41] තබා, ඔහු දියට බහා,

---

[1] බිදිමි
[2] හුඩුහොය
[3] දැහිටි, දැහැටි
[4] ජටාවෙහි
[5] බහාපියා
[6] දැහිටි, දැහැටි
[7] නහන්නාහු
[8] සැඬොල්, සැඬුල්, සැඬැල්
[9] දැහැටි, දහිටි
[10] බහාලුයෙ
[11] යි
[12] නසැ
[13] සැඬල
[14] වස
[15] වසන්නාහු
[16] දැටි, දැහැටු, දැටිදඬු
[17] වනු
[18] සත්කඩක්
[19] පළමි
[20] පිය, පි
[21] හිරුහු
[22] නැඟිදුන
[23] මිනිස්සු
[24] ප්‍රතිගත
[25] ගෙනගොස්
[26] තවුසා
[27] තෙපි
[28] දුන්නාවයි; දෙන්නාවනැ
[29] ගොස්
[30] දුන්නාහ
[31] මමයයි
[32] නැඟි
[33] නිවරද හට
[34] අවිදු
[35] කමා
[36] මාපිට
[37] විහිදුවමි
[38] විමි
[39] කල
[40] ඔබ
[41] හිසට

දියෙහි සිටිව[1]" යි, සිටිවා හිරු[2] වුහුට. හිරු රස්[3] පහළ විගස මැටි පිඬ සත්කඩක් වැ පැළී-ගියෙ.[4] තව්සා[5] දියෙහි ගැලී කිමි දැ අනෙක් තොටෙකින් නැඟී, ගොස්, එතන්[6] පටන් ගෙනැ "ජාතීන් කම් නැති, පැවිජියන් සිතැ ගුණදහම් මිසැ යැ"යි, මන්විසි නො වැ විසී.

**මහසත්** ඔහු දමා, "අසූදහසක්[7] බමුණො කොහි[8] වෙසෙති හො!"යි, අවජනෙ, **මෙධ්‍ය** නම් රජු කෙරෙහි වසනුවන් දැක, ඔවුන් දමනු සඳහා ඉදුහයෙන්[9] ගොස්, නුවර අබියෙස්හි බැසැ, පය ගෙනැ, නුවර වැඳ, සිඟන්නට වන. බමුණො දැකැ, හැඳිනැ, "මෙ මෙහි එක් දෙදවසක්[10] විසි නම්, අපට පිහිට නැතැ"යි, වෙළෙවි[11] වැ ගොස්, "මහරජ, මායාකාර එක් විජ්ජාධරයෙක්[12] මෙ නුවරට ආ යැ.[13] ඔහු වහා හරවා-පියව" යි, කීහැ. රජ "මැනැවැ"යි, ගිවිස්සැ.[14]

**මහසත්** කෙණෙසි[15] අහර සිඟා-ගෙනැ, එක් තැනෙක්හි හිඳැ වළඳා, උයන් ගොස්, අතීතයෙන් හා අනාගතයෙන් අසූකපක් දකුතුද්[16] ආවර්ජනා නැති වැ, නිවරද වන බැවින් සැක නැති වැ, මඟල්සලවට හුන්නෙ යැ. රජ අනුන් කියමන්[17] ගෙනැ තෙමෙ මැ ගොස්, කඩුයෙන් **මහසත්හු** හිස්[18] සින්ද.[19] හෙ මිය බඹලොවැ උපනැ.

දෙවියො දැහැවැ පෙරැ කී සෙයින්[20] නවවිධ වර්ෂා වැස්වූහ. මෙහි අට වනු වැ විරුවූ ලොහො දිය බඳු ලොහො මඬවැසි[21] වටැ. නව වනු වැ එමැ බඳු හුණු කලල්වැසි[22] වටැ. **කැලැණි රජු**[23] සඟනට කළ වධයෙන් ඔහු ගෙ රජය[24] මුහුදු ගැලුවා[25] සෙයින්[26] **මෙධ්‍ය** නම් රජු **මාතඞ්ග** නම් සෘෂීන් හට[27] කළ වධයෙන් උහු[28] ගෙ රට නොරට වි යැ. එ රජ සහපිරිවරින් ගොස් මහා නරකයෙහි[29] උපන්.[30] එයින් කී හ, **සඞ්කිච්ච පණ්ඩිතයො:**

**"උපහච්ච[31] මනං මෙජ්ඣො**
**මාතඞ්ගස්මිං යසස්සිනො**
**සපාරිසජ්ජො උච්ඡින්නො**
**මෙජ්ඣාරඤ්ඤං තදා අහු[32]" යි**

---

[1] සිටුවයි, සිටුවහයි, සිටුවවයි, සිට්ටවයි, සිටවවයි
[2] හිරහු
[3] රැස්
[4] ගියේයැ
[5] තවුස්
[6] තන තැන්
[7] "සොළස බ්‍රාහ්මණ සහස්සානි" ජා: - අටුවා
[8] කොයි
[9] එයින්, ඉදියෙන්
[10] එක්දවසකුදු, එක් දෙදවස්
[11] වෙළෙයි, වෙලයි මු
[12] මායාකාරයෙක් ද විජ්ජාධරයෙක් ද, විද්‍යාධර සොරෙක්
[13] අය
[14] ගිවිස්සහ
[15] එකෙනෙහි, කෙණෙහි
[16] දක්තුද්, දක්තුදු
[17] කිවමන්
[18] හිස
[19] සිඳපීයැ
[20] සයින් මැ
[21] ලොහොවැසි, ලොහො මඩුවැසි
[22] කල්ල වැසි-මු.
[23] කැලනි මහරජහු
[24] රාජ්‍යය
[25] ගිලුවා
[26] සෙයින් ම
[27] සෘෂිහට
[28] ඔහු
[29] නරකයෙ
[30] උපන, උපන්හ
[31] උපගච්ඡ
[32] ආහු

මෙ සෙයින් මෙධ්‍යාරණ්‍යය වල් වූ පරිදි දත යුතු. මාතඞ්ග සෘෂිහි[1] නැමින් හෙ මැ මාතඞ්ගාරණ්‍ය නම් වී.

මෙසෙ උපාලි මහසිටිහු[2] "දණ්ඩකාරණ්‍යාදීන් සෘෂින් ගෙ[3] දැහැවිලින් වල් වූ පරිදි ඇසීමි[4]" කී කල්හි බුදුහු,[5] "මහසිට,[6] සිහි එළවා කියා.[7] තා "කායදණ්ඩ මහතැ" යි පළමු කී බස්[8] හා දැන්. 'මනොදණ්ඩ මහතැ' යි පසු වැ[9] කියන බස් හා නො ගැළැපෙයි" වදාළො. එ සඳැ උපාලිගහපති "වහන්සෙ, මම[10] පළමු උපමායෙන් මැ ප්‍රසාද කෙළෙමි. එතෙකුදු[11] වුව, භගවත්හු[12] ගෙ (මෙ) විසිතුරු ප්‍රශ්න ව්‍යාකරණ ඇසියටි වැ විරුද්ධයක්හු[13] වැනි වීමි"[14] පැහැදැ සරණ ගියෙ "මහසිට, සිතා[15] පිරික්සා සරණ යනු මැනැවැ. තොප වැන්නවුන් මා දැකැ මා සරණ යන කලැ, නුවටු[16] දැකැ නුවටු[29] සරණ යන කලැ, 'මෙ උපාලි මහසිටි දුටි දුටිවන්[17] සරණ යෙ'[18] යනු නො කියවුව[19] මැනැවැ. තොප වැනි ප්‍රසිද්ධ මිනිසුන් සිතා[20] පවත්නා තැන්[21] යෙදෙයි" වදාළො. "වහන්සෙ, මම 'සිතා පිරික්සා සරණ යනු මැනැවැ' යන මෙයින් මැ ඉතා සතුටිමි.[22] වහන්සෙ, තීර්ථකයො සව්වන් ලද[23] කලැ 'අසුවල් රජ, අසුවල් ඇමැති, අසුවල් සිටි, අප සරණ ගියෙ. සවු වී යැ'යි දද[24] නගා, නුවරැ හඬ ගහා, ඇවිදුති.[25] තමන් මහත් බව්[26] පාළ[27] කරනු සඳහා යැ. මා දු[28] ලද කලැ එසෙ මැ කළහැ. වහන්සෙ සිතා, පිරික්සා, සරණ යන්නට[29] වදාරන දැ යැ. වහන්සෙ, මම් දෙවන වටැ දු සරණ යෙමි"[30] සරණ ගියෙ. බුදුහු "මහසිට, තාගෙ ගෙය බො දවස්[31] නුවටනට පැන් පොකුණක් සෙ සිටියෙ යැ. පෙරැ තො[32] ආ තාක් දෙන හට 'නැත'[33] නො කියා දෙහි.[34] දැන් මා සරණ ගිය බැවින් මැ ඔව්නට දෙන දැ නො සිඳැ ආ කෙනක්නට දෙන්නෙ යැ"යි වදාළහ. "වහන්සෙ, මම් මෙ[35] නුවටුන් කියන්නා ඇසුයෙමි: 'මහණ ගොයුම් මට මැ දන් දිය යුත්තෙ යැ, මාගෙ සව්වනට මැ දන් දිය යුත්තෙ යැ. මට මැ[36] දුන්නෙහි ඵල මහතැ. මාගෙ සව්වනට මැ දුන්නෙහි ඵල මහතැ, අනුන් ගෙ සව්වනට දුන්නෙහි ඵල මහත් නො වෙයි' කියන්නා යැ.[37] දැන් වහන්සෙ මා

[1] මහ සෘෂිහු
[2] මහසිටහු
[3] ගෙණ
[4] අසමි - හැම
[5] බුද්හු
[6] මහසිට මහසිට - මු
[7] කිය
[8] බස
[9] පසු
[10] මම්
[11] එතෙකුදු
[12] භවත්හු
[13] ඉර්ධියක්හු
[14] වීමියි
[15] තා
[16] නුවටුන්
[17] දුටුදුටුවන්
[18] යෙයි
[19] කියුවුව
[20] සිත
[21] තැන
[22] සතුටු විමි
[23] ලදු, ලද්
[24] ධ්වජ
[25] ඇවිද්ති
[26] බව
[27] පාලනය, කළ
[28] මා, මාත්-මු
[29] සරණය ගනුව
[30] යෙමියි
[31] බෝදවසක්, බොහෝ දවසක්
[32] තොප
[33] නැතැයි
[34] දෙයි
[35] මම්ම, මම්
[36] මගෙ ගුණ දන්නහු මට ම-ඇතැම්
[37]

නුවනටුන්[1] කෙරෙහිද්[2] දනැ[3] සමාදන් කරවන ඇ යැ.[4] මම් මෙයට[5] කටයුතු[6] දන්මි. වදාරන ඇයට සතුටිම්.[7] 'වහන්සෙ, මම් තුන් වන වටැ දු සරණ යෙමි" යි මෙසේ තුන් යලක් තුණුරුවන්[8] සරණ ගියෙ. එ කල්හි[9] බුදුහු ඔහට සිවුසස් දෙසූහ. හෙ සොවාන් ඵල පසක් කොටැ
දුට්ධම්[10] ඇති වැ, පත්ධම් ඇති වැ, දත්ධම් ඇති වැ, "වහන්සෙ, ඇප්[11] බොහො කාර්ය ඇත්තම්හ"යි කී යැ. "කල් දන[12] මහසිට" යි වදාළහ.

එ කල්හි **උපාලි** ගහපති හුනස්නෙන් නැඟී බුදුන් වැඳැ පැදකුණු කොටැ තමා ගෙ ගෙට ගොස් දොරොටි[13] ගොව්වා කැඳවා-ගෙනැ අද පටන් කොටැ නුවටුන් ගෙට නො වැද්ද දෙන්නෙ යැ. බුදුන් සඟුන් උපාසකයන් උපාසිකාවන් ආ කලැ වැද්ද දෙන්නෙ යැ. ඉදින් කිසි නුවටෙක්[14] ආ[15] නම්, උහු[16] කැමැත, බත් ගෙන්වා දෙන්නෙ යැ" යි යොදා ගොට වනැ.

එකල්හි **දීර්ඝතපස්වී** ඔහු බුදුන් කරා ගිය තැන් පටන් ගෙනැ "සිට්[17] මහනුවණැත්තෙ යැ.[18] **මහණගොයුම්** දර්ශන සම්පත් ඇත්තෙ යැ. නෛර්යාණිකකථා ඇත්තෙ යැ. උහු[19] ගෙ දර්ශනයෙහිද් පහද්දි. (නෛර්යාණික කථායෙහිද් පහද්දි.) පැහැදැ සරණ යෙයි, "තව සරණ ගියෙ හො, නොගියෙ හො!" යි කන්රු[20] කොටැ-ගෙනැ ඇවිදුනෙ,[21] ඔහු සරණ ගිය පරිදි[22] අසා **නිගණ්ඨනාථපුත්‍රයා** කරා ගොස් "**උපාලි** සිට්[23] මහණ **ගොයුම්හු** සරණ ගියෙ ල"යි කී යැ. එ අසා **නිගණ්ඨනාථපුත්‍ර** "**උපාලි** මහසිට්, මහණ **ගොයුම්හු** ගෙ සවු වන්නට[24] නිසි නො වෙයි. මහණ **ගොයුම් උපාලි** මහසිට්හු ගෙ සවු වන්නට නිස්සැ"යි කී යැ.

මෙසෙ **දීර්ඝතපස්වී** තුන් යලක් කියා **නිගණ්ඨනාථපුත්‍රයා** නොහදහන සෙ දැකැ[25] "වහන්සෙ, මම් **උපාලි** ගහපති[26] මහණ **ගොයුම්හු** ගෙ සවුබවට ගියෙ! නොගියෙ! යනු ගොස් දන්මි හො?"යි කී යැ. "මැනැවැ, ගොස් අතුරැ දනැ"යි කී යැ.

එ සඳැ **දීර්ඝතපස්වි** උපාලි ගහපතිහි ගෙ ගෙට ගියෙ[27] දොරොට්ගොව්[28] ඔහු නො වැද්ද දී "සිට, අප මහසිට් මහණ **ගොයුම්හු** ගෙ සවුබවට ගියෙ.[29] නො වැද්ද දෙමි. බත් කැමැත, මෙහි මැ සිට. මෙයට ගෙනැ එතී[30]" කී යැ. "මට බතින් කම් නැති"යි

---

1

2

3

4 කරවනසේක්

5 මම් ම එයට

6 යුතු

7 සතුටු වීමි, සතුටුමි, සතුටිමි

8 තුණුරුවන්හි

9 මෙතැනැ සමහර පොතෙකැ "උපාලිගෘහපති හුනස්නෙන් නැඟි බුදුන් වැන්ද" - යනු දු ඇත.

10 දුටුධම්

11 අප

12 දැන, දනු-මු

13 දොරටු, දොරට්

14 නුවටක්

15 ආයි

16 ඔහු, ඔහුට

17 සිට්හු

18 නුවණැත්තෙයැ

19 ඔහු

20 රූ, කන්කරු, කන්කුරු-මු

21 ඔ ඇවිදිනෙ

22 පරිජී

23 මහසිට්

24 වනට

25 නො හදහන් හෙයින්

26 ගහපතිහි

27 ගොස්

28 දොරටුගොව්වා, දොරට්ගොවු

29 ගියේය

30 එතියි

එහි මැ සිටැ නැවැතැ[1] නිගණ්ඨනාථපුත්‍රයා කරා ගොස් "උපාලි ගහපතිහි මහණ ගොයුම්හු ගෙ සවුබවට ගියෙ සැබැවැ. මම් මුහු වැළැකීම්,[2] වහන්සෙ උපාලි මහසිට්හු මහණ ගොයුම් හට වාදාරොපණයට යනු මට නොරිසුණෙ යැ. හෙ මායාවී යැ. අනුන් ගෙ සව්වන් ආවර්තනය කොටැ ගන්නා මායාවක් දන්නෙ යැ. දැන් තොප ගෙ උපාලි මහසිට් මහණ ගොයුම්හු සෙ ආවර්තිනී[3] මායාවෙන් ආවර්තික[4] වි යැ"යි කී.[5]

එකල්හි නිගණ්ඨනාථපුත්‍ර දීර්ඝතපස්විහි තුන්යලක් කීව ද, නො හදහා "මම් මැ ගොස් දන්මි"[6] යි මහත් නුවට පිරිස් හා සමග උපාලි ගහපතිහි ගෙට ගියෙ. දොරොට් ගොවු[7] ඔහු නො වැද්ද දි "සිට, අප මහසිට් මහණ ගොයුම්හු සවුබවට ගියෙ. තොප නො වැද්ද දෙම්හ. බත් කැමැතැ, මෙහි මැ සිට[8]. මෙයට[9] ගෙනැ එති" කී යැ.

හෙ බලවත් ශෝකයෙන් අභිභූත වැ "මෙහි මැ සිට[10]" යන බස්[11] නො සළකා "තො ඔහු කරා ගොස් මා අවුදු[12] දොරොට්යෙහි[13] පිටතැ තමා දැක්කැටි වැ සිටි පරිදි කියා"යි කී යැ. දොරොට්ගොවු ගොස් සිට් හට කී. උපාලි මහසිට්හු ගෙ පහය වටා පවුරැ සත්දොරොට් යැ.[14] හෙ දොරොට් ගොව්වහට මධ්‍යයෙහි සතර වන දොරොට්යෙහි[15] තමා හිඳිනා අසුන් පනවන්නට[16] කී යැ. හෙ අසුන් පනවා ගොස් කී යැ. සිට් එයට ගොස් හැමයට උතුම් අස්නෙ[17] හිඳැ "නුවටුන්[18] එම්හ[19] යි සිතුව[20], එනු කරා"යි කී යැ.[21] දොරොට් ගොවු ගොස් නුවටනට කී යැ. එ කල්හි නිගණ්ඨනාථපුත්‍ර මහත් නුවට පිරිස් හා සමඟ සතර වන දොරොට්වට[22] ගියෙ.

පෙරැ[23] උපාලි මහසිට් නිගණ්ඨනාථපුත්‍රයා එන කලැ දුරැ මා දැකැ පෙරමඟට ගොස් අත වටා[24] ගෙනැ ගෙට ඇරැ හැමයට උතුම් අස්නෙහි, උතුරු සළුයෙන් පිසැ-පියා, එ මැ උතුරුසළුව බඩ වටා ඕමින් "ආචාර්යය,[25] සෙමෙන් හිඳුව, සෙමෙන් හිඳුව" යෙමින් මහත් තෙල්කළක්[26] බහා තබන්නක්හු සෙ[27] දොහො අතින්[28] ගෙනැ බහා හිඳුවයි. හෙ දැන් හැමයට උතුම් අස්නෙ තෙමෙ හිඳැ, "හිඳැටි වුව, තිලි බැසැ හිඳුව"යි කී යැ.[29]

එ සඳ නිගණ්ඨනාථපුත්‍ර බලවත් ශොකයෙන් අභිභූත වැ "මහසිට, ඇළල ගියෙහි? මහසිට, ඇළල ගියෙහි? 'වහන්සෙ, මම් මහණ ගොයුම් හට වාදාරොපණයට යෙමි[1]'යි

---

[1] නැවතී
[2] මම් මුළ ම කීම්
[3] ආවර්තනය - හැම, ආවර්තනීය - මු
[4] ආවර්තනය, ආවර්තන, 'ආවට්ටො'-පෙළ
[5] කී යැ
[6] මම් මයෙමි ගොස් දන්මි
[7] දොරටුගොවු, දොරටුගොවු
[8] සිටුව
[9] මෙයට මැ
[10] සිට්ව, සිටුව, සිවු
[11] බස
[12] අවුද්
[13] දොරොට්යෙන්, දොරට්යෙන්, දොරටයෙන්, දොරටුයෙහි
[14] සත්පවුරු සත් දොරටු යැ, සත්පවුරු යැ, සත්දොරටු යැ
[15] දොරටුයෙහි
[16] පන්වන්ට
[17] අස්නෙහි
[18] නුවටු
[19] එව්වයි.
[20] සිතූහ
[21] කියා, යවූහ
[22] දොරටුවට පෙරෙ
[23] පෙරෙ
[24] වඩ වඩා
[25] ආර්යය, ආවාරිය
[26] තෙල් කබලක්, තෙල් කළයක්
[27] සෙයින්
[28] දො අතින්
[29] කීහ

යෙමි[1]'යි ගොස් මහත් වාදබන්ධනයෙන් තිරැ වැ උහු ගෙ ආවර්තනී මායායෙන් ආවර්තිත වැ ආහි[2]" කී.[3]

එකල්හි සිටි තමා පිළිවුද්[4] සොවන් මඟ සඳහා, "වහන්සෙ, ආවර්තනී මායා භද්‍රයැ, සුන්දර[5] යැ, කල්‍යාණ යැ. මා සැනැහැති නැයො මෙ ආවර්තනී[6] මායායෙන් ආවර්තික වෙත්වයි, හෙ[7] මා සැනැහැති නැයනට බොහො කල් හිතයට සුවයට වැටෙයි.[8] හැම රජ්ජුරුවො හැම බමුණො හැම වෛශ්‍යයො හැම ශුද්‍රයො හැම දෙවියො හැම මිනිස්හු[9] මෙ ආවර්තිනී[10] මායායෙන් ආවර්තිත වෙත්වයි, හෙ ඔව්නට[11] බොහො කල්[12] හිතයට සුවයට වැටෙයි. තොපගෙ සසුන් අනෛර්යාණික යැ. අප බුදුන්ගෙ සසුන් නෛර්යාණික යැ. තොපට උපමාවක් දක්වමි. නුවණැති කෙනෙක් දන්ති. "පූර්වයෙහි එක්තරා මහලු බමුණක්හු ගෙ ළදැරි[13] භාර්යාවක් වුව. හො ගබ[14] ගෙනැ වදන වර වූ කලැ, "යා,[15] බමුණ, අවුණුදොරැ දිවි ඇති නැති කෙළිබඩු,[16] තබා විකුණිති.[17] තිලින් මිලයක් ගෙනැ ගොස් ම-පුතු කෙළෙනට[18] නිසි වඳුරුපැටකු[19]. විකිණි-ගෙනැ එ" යි කිව.[20] දැන් බල[21]. තී වැදූ[22] කලැ "පිතෙක් වී නම්, වඳුරු පැටකු[7] ගෙනැ එමී. දුවක් වූ නම්, වඳුරු[23] පැටියක[24] ගෙන එමී" කී යැ. මෙසෙ දෙයලත් තුන්යලක්[25] ඇය කී[26] කලැ "කැමැත්තා කළ මැනැවැ"යි බමුණු අවුණු[27] දොරින් වඳුරු පැටකු[7] විකිණීගෙනැ ඇරැ, "පුතු කෙළෙනට මුහු බලා-ගනැ" යි කී යැ. එකල්හි බැමිණිය: "බමුණ, මෙ වඳුරු පැටහු[28] රඟ පොවන රදා දරුවා[29] කරා ඇරැ[30] රන්වන් කොටැ පොවා තළා ගුළා මට කොටැ ඇරැ දක්වා දෙනු කරා[31]"යි කිව. බමුණු, "ඇය[32] කැමැත්තා[33] කළ මැනැවැ"යි රදා දරුවා කරා ගොස් "මුහු රන්වන් කොටැ පොවා තළා ගුළා මට කොටැ දෙ[34]"යි කී යැ. එකල්හි රදා දරු "දිවි ඇති නැති වත් රඟ පොවන බැවින් ම වඳුරු පැටෙ[16] රන්වන් කට හැක්ක. කඳැ තබා[35] කොළන මුගුරෙන්[36] කුසැ[37] පහළ[38] කලැ කුස මිරිකෙයි. වසුරු නික්මෙයි. හිසැ[39] පහළ කලැ හිස මිරිකෙයි. මුල් නික්මෙයි. මිණි වහණැ[40] තබා ගුළන කලැ ලොම් නැති වෙයි. සිවි

[1] ගියෙමි යි
[2] ආමිහි, ආමි
[3] කීයැ
[4] පිළිවිදි, පිළිවුදු, පිළිලත්
[5] සුනාර යැ
[6] ආවර්තන
[7] මෙ, හෙම
[8] වෙයි
[9] මිනිස්සු
[10] ආවර්තන
[11] ඔවුන්ට, ඔහුම
[12] කලක්
[13] ලැදි, ලෙදැරි
[14] ගබ්, මගව
[15] ය
[16] කෙළිමඩු
[17] විකුණෙති, විකුණෙන
[18] කෙළිනට
[19] පැටවකු
[20] කී යැ
[21] බලා, බැල
[22] වැදැ, වැදා, වැද
[23] වැදිරි
[24] පැටියෙ
[25] යලක්, දෙයලක්
[26] කියන
[27] අවුන්
[28] පැටවු, පැටව් පැටැව්
[29] රදදරුවා
[30] ගොස්
[31] ක-රයි
[32] අය
[33] කැමැත්ත
[34] දෙව-යි
[35] දැන බා
[36] කොණනඟු-රෙන්
[37] කුස
[38] පහරන
[39] හිස
[40] මිටිවහන, මිටිමහණ 'මණිපාසාණෙන' - අටුවා

දු නැති වෙයි. දිවි[1] නැති වන්නහු[2] වුව, තළන කලැ කඩ කඩ[3] වැ යෙයි. ගුළන කලැ සුනු සුනු වැ[4] යෙයි. මෙ වඳුරු පැටෙ[5] රඞ්ගක්‍ෂම වෙයි[6]. ආකොට නක්‍ෂම නො[7] වෙයි. විමාර්ජනක්‍ෂම නො ද[8] වෙයි" කී යැ. එ සෙයින් මැ බාල නුවටුන් ගෙ කථා ප්‍රිය වැ රාගමාත්‍රයක් ජනවන[9] බැවින් රඞ්ගක්‍ෂම වෙයි.[10] පණ්ඩිතජනයන් විසින් නුවටුන්ගෙ කථාද්[11] සෙසු බරත-රාමායණාදි නිරර්ථක කතා මාර්ගද්[5] විමසා බලත් බලත්, තොහො පැරැ[12] සාල් සොයන්නා සෙයින්, කේල්ගසැ හර සොයන්නා සෙයින්, සිස්වන බැවින් අනුයොගක්‍ෂම නො[13] වෙයි; විමාර්ජනක්‍ෂම නො ද වෙයි.

එ බමුණු අනෙක් සමයෙකැ හා පිළී සඟළක් ගෙනැ රඟ පොවන රදා දරුවා කරා ගොස්, "මෙ සඟළ රන්වන් කොටැ පොවා තළා ගුළා මට කොටැ දෙ" යි කී යැ. එකලැ රඟ පොවන රදා දරු, "වහන්සෙ, මෙ සඟළ වූ කල රඞ්ගක්‍ෂම යැ, ආකොටනක්‍ෂම යැ, විමාර්ජනක්‍ෂම යැ" යි කී යැ. එ සෙයින්[14] මැ අප සම්මා සම්බුදුන් ගෙ සිවුසස් දිස්නා කථා පණ්ඩිත ජනයනට ප්‍රිය[15] වන බැවින් රඞ්ගක්‍ෂම යැ. අනුයොගක්‍ෂමයැ. විමාර්ජනක්‍ෂ[16] ම යැ. හවුරුදු[17] සියකුදු අසත්, තෘප්ති නැති. මහ මුහුදු[18] සෙයින් ගැඹුරු වෙයි කී.

එ කල්හි නිගණ්ඨනාථපුත්‍ර, "මහසිට, සරාජික[19] පර්ෂද්"[20] තා අප ගෙ සවුබව් දන්නි,[21] දැන් තා 'කාගෙ සවු යැ' යනු දන්මහ?" යි කී යැ. එ සඳැ උපාලි ගහපති හුනස්නෙන් නැඟී, උතුරුසළු[22] එකස් කොටැ ලා බුදුන් වසන[23] දසට[24] ඇඳිලි බැඳැ, "මම් යමක්හු ගෙ සවුයෙම් ද, ඔහු ගෙ ගුණ අසව" යි බුදුන් ගෙ ගුණ වනනුයෙ, තමා සැකෙවින්[25] කී දැයක්[26] අනෙකාකාරයෙන් දන්නා උද්ඝටිතඥ පුගුල් වන බැවින් සොවන්මඟින් මා ආ පිළිසිඹියා විසයෙහි[27] සිට[28] වන බැවිනුද්-

**ධීරස්ස විගතමොහස්ස**[29]
**පභින්නඛිලස්ස විජිතවිජයස්ස**
**අනීඝස්ස සුසමචිත්තස්ස**[30]
**වුද්ධසීලස්ස**[31] **සාධුපඤ්ඤස්ස**
**වෙස්සන්තරස්ස විමලස්ස**
**භගවතො තස්ස සාවකො 'හමස්මි'**

---

[1] සිවිදු
[2] වන්නා, වන්නාහා, වන්නාහ
[3] ඛණ්ඩ ඛණ්ඩව, කඩව
[4] සුනුව
[5] වැටි
[6] නොවෙයි
[7] නොද
[8] නොම
[9] රජවන, රඤ්ජනවන
[10] නො වෙයි
[11] දු, ද
[12] හැර
[13] නුදු, නො ද
[14] එයිම්ම
[15] පිය
[16] අනුමාර්ජනක්ෂම
[17] හවුරුද්
[18] මුහුද්, මුහුද
[19] සරදිකා
[20] පර්ෂදු
[21] දන්ති
[22] උතුරුසළුව
[23] වන-හැම
[24] දෙසට
[25] සබෙවින්
[26] දැයෙක්
[27] විෂයෙහි
[28] සිටින
[29] විගතමොහතමස්ස - හැම
[30] සුසමාහිතචිත්තස්ස
[31] සුද්ධසීලස්ස

යනාදි විසින් දස ගාථායෙකින් සියක් පදයෙන් බුදුන් ගෙ ගුණ වනා, "මම් මෙබඳු ගුණ ඇති බුදුන් ගෙ සවුයෙමි" කී යැ.

එකලැ නිගණ්ඨනාථපුත්‍ර තෙ මහණ ගොයුම්හු කරා දැන් ගොස් ආහි.[1] එ විගසැ මෙ ගුණ කිසෙ කියන්නට නිසි විහි[2]" කී යැ. එ සඳැ සිටි 'යම්සෙ නානාපුෂ්පයන් ගෙ[3] මහත් මල්රැසක් දක්‍ෂ වූ මල්ලරෙක් තමා දක්‍ෂවන බැවිනුදු[4] මල්හි නොඑක්[5] පැහැ ඇති වන බැවිනුදු විසිතුරු කොටැ ගොතා ද, එසෙයින් මැ බුදුන් ගෙ නන් නන් ගුණ කුසුම් ගොතන්නට මා වැනි දක්‍ෂ[6] පුරුෂයෙක් නොනිසි වෙ දැ!"යි කී යැ. එ අසා **නිගණ්ඨනාථපුත්‍ර**, "මෙ සිටි[7] අප කෙරෙන් පහ[8] වියැ. දැන් කලි නටම්හ.[9] අප ගෙ බත් කුඹ[10] බුනැ"[11]යි සිතන්නා හට බලවත් ශොක උපනැ. හදවත කකියා ගියෙ. පයක් පමණ ලේ කටින් නැංග.[12] එහි මැ දණින් හිණ. ඔහු හිදොළුයෙකින්[13] පිටිනුවර හැරැ[14] හැඳෙකින් පාවා නුවර ගෙනැ-ගියහ. හෙ පාවා නුවරැ මෙළෙ.

මෙසෙයින් බුදුහු තමන් 'පුරිසදම්මසාරථී' වන බැවින් උපාලි මහසිටිහු දු[15] ආදි ශබ්දයෙන් ගත් දසමගහපති සිටිහු දු,[16] දමා අමාමහනිවන් පැමිණිවූ[17] හු.

**ගහපතිදමන නම් සතර වන පරිච්ඡේද[18] නිමි.**

## 5. බ්‍රාහ්මණදමන නම් පරිච්ඡේදය

**කූටදන්ත** නම් බමුණු[19] ඇමූ පරිසි කිසෙ යැ යත්: එක් සමයෙක්හි බුදු ඇසින් දසදහස්[20] ලොධා බලන බුදුන් ගෙ නුවණ දැල්හි **කූටදන්ත** නම් බමුණු[21] පැනිණි.[22] එ කල්හි බුදුහු, "මෙ බමුණු මා ගෙ නුවණ දැල්හි පැනෙයි. මුහුට[23] උපනිඃශ්‍රය ඇති හො!"යි බලන්නාහු, "මා එයට ගිය කලැ උහු අතැවැසියො[24] දොළොස්[25] ආකාරයෙකින් බමුණා ගෙ ගුණ කියා මා කරා නොයා දෙති. හෙ ඔවුන් ගෙ වාද බිඳැ, එකුන්තිස් ආකාරයෙකින් මාගෙ ගුණ කියා, මා කරා අවුදු[26] පැන පුළුවුස්සි. මා පැන

[1] අව-හැම
[2] විය
[3] ගෙන
[4] ද්
[5] නොයෙක්
[6] දක්‍ෂ වූ
[7] සිටු
[8] කහ
[9] නටම්හයි
[10] කුබ
[11] බිඳිනැයි
[12] නැඟු
[13] හිදුළුයෙකින්
[14] ඇරැ
[15] ද්
[16] දසමහගහපති සිටිහුදු - මු
[17] පැමුණුවූහ, පැමුණුවූහ, පැමිණුවූහ
[18] පරිච්ඡේදය
[19] බමුණානන්, බමුණ
[20] දස දහසක්
[21] බමුණ, බමුණ්
[22] පැමිණි, පැමිනිනි
[23] මොහුට්
[24] අතවැස්සො
[25] සොළොස්-හැම "මයි තත්‍ථ ගතෙ, එතස්ස අන්තෙවාසිනො වාදසහා'කාරෙහි බ්‍රාහ්මණස්ස වණ්ණං භාසිත්‍වා මම සන්තිකං ආගන්තුං න දස්සන්ති" - සොණ දණ්ඩ සුත්ත වණ්ණනා
[26] අවිදු

විසජු කලැ සරණ යෙ" යි පන්සියයක්[1] සඟුන් පිරිවරා මගධ රට සැරිසරමින් **බාණුමත**[2] නම් බමුණුගමට පැමිණැ අඹයටි උයන්හි වැඩැ-වෙසෙති.

එකල්හි **බිම්සර** රජහු[3] විසින් බඹදෙයෙන්[4] තම හට පමුණු කොටැ දුන් **බාණුමත**[10] නම් බමුණු ගම්හි වසන කුටදන්ත නම් බමුණු මහත් යාගයක් කරන්නට සැරැවි[5]යැ. සත්සියක්[6] ගොනුන් සත්සියක් වස්සන්[7] සත් සියක් වැස්සන් සත්සියක් එළුවන් සත්සියක් ළදරු මැඩවුන්[8] නොඑක් ලිහිණියන් සත්සත්සිය බැවින්[9] මරා යාග කරන්නට යාගසාලායෙහි ටැඹ ඇරැ බැඳැ සිටිවි යැ. එකල්හි (**බාණුමත** නම් බමුණුගම්හි වසන බමුණන් හා ගැහැවියො*) "**තං ඛො පන භගවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො** - යනාදීන් පැවැති බුදුන් ගෙ යසඟී අසා බුදුන් දක්නට අඹයටි උයන් යෙත්.

එකල්හි **කුටදන්ත** නම් බමුණු තමා වසන පහයැ උඩු මහලෙහි දවයහන්හි[10] හෙවැ කවළියෙන් බලන්නෙ, බුදුනු දක්නට යන බමුණන් (හා ගැහැවියන්) දැකැ පුළුවුත් පුළුවුත් දැ කියන ඇමැත්තා කැඳවා-ගෙනැ "මෙ බමුණන් හා ගැහැවියො කොටය යෙති" පිළිවිසැ බුදුන් දක්නට යන පරිදි අසා "මහණ භවත් ගොයුම් තුන් යාගසම්පත් හා සොළොස් පිරිවර[11] දනී ල. මම එ නො දන්මි.[12] මහායාග ද කටැටියෙමි. මහණ භවත් ගොයුම්හු කරා ගොස් එ පිළිවිසැ ගත මැනැවැ"යි සිතා බමුණන් (හා ගැහැවියන)ට "කුඩාතමක් බලන්නෙ යැ. මම ද එමි" කියා යවී.

එකල්හි (යාග අනුභව කරන්නට රැස් වූ) බමුණො ඔහු බුදුන් දක්නට යන පරිදි අසා, "මෙ **කුටදන්ත** නම් බමුණු උතුම් බමුණෙකැ; බොහො සෙ සෙසු බමුණො මහණ භවත් ගොයුම්හු සරණ ගියහ. මෙ මත්න සරණ නො ගියෙ.[13] ඉදින් මෙ එයට ගියෙ වී නම්, උහු ගෙ[14] ආවර්තනී මායායෙන් ආවර්තිත වැ සරණ යෙයි. එසෙ වන්නා හා මුහු ගෙ ගෙදොර බමුණනට හුණු සෙණක්[15] වැනි වෙයි. උහු ගෙ ගමනට අන්තරාය කළ මැනැවැ"යි බැණැ-ගෙනැ "තමා ගෙ ගුණ කී කලැ සතුටි[16] නොවන සතෙක් නම් නැති; උහු ගෙ ගුණ කියා වළකම්හ"යි උහු කරා ගොස් "සැබැවැ[17] තා මහණ භවත් ගොයුම්හු කරා යන්නෙ යැ?" යි පිළිවිසැ "සැබැවැ"යි කීයෙන් "තො ඔහු කරා නො යා. තො උහු[18] දක්නට යන්නට නොනිස්සෙහි. හෙ තා දක්නට එන්නට නිස්සැ. තො ඉදින් උහු කරා ගියෙහි නම්, තාගෙ යශස් පිරිහෙයි. උහු ගෙ යශස් වඩී. අභිජාතයෙහි, මහත් ධන ඇත්තෙහි ත්‍රිවෙදයෙහි පාරයට ගියෙහි, අභිරූපයෙහි, සිල්වත්හි, වියත් තෙපුල් ඇත්තෙහි, තුන්සියක්[19] බමුණු දරුවනට ඇදුරෙහි, නොඑක් දිසාවෙන් බමුණු දරුවො අවුදු[20] තා කෙරෙහි ශාස්ත්‍ර උගනිති. තො මහල්ලෙහි, මහණ භවත් ගොයුම්

---

[1] පන්සියයක්
[2] බාණුමත්, භානුමත්, බානුමත්ත
[3] මහරජහු
[4] බඹදෙසෙන්-හැම
[5] සැරවිය
[6] සියයක්
[7] වැස්සියන්
[8] එදරු-මැඩවුන්, එදරුමැඩවුන්, 'තරුණමෙණ්ඩිකා'-අටුවා
[9] බැගින්* යාග අනුභව කරන්නට රැස් වූ බෙමුනා, -පොත්
[10] දිවයන්හි
[11] පරිවාර
[12] නොදත්මි
[13] නොගියෙය
[14] උන්ගේ, ඔහුගෙ
[15] හුන් සෙනස්නක්
[16] සතුටු
[17] සබඳ, සබැඳ
[18] උහු තො,
[19] තුන්සියයත්
[20] අවුද්.

ළඳැරූ ය. තො බිම්සර මහරජහු විසින් පුදන ලද්දෙහි. පොක්ඛරසාති බමුණා විසින් පුදන ලද්දෙහි. මගධ රජහු තට බඹදෙයෙන් දුන් පමුණුයෙහි වාස[1] කෙරෙහි. තො මහණ භවත් ගොයුම්හු දක්නට යන්නට නොනිස්සෙහි. හෙ තා කරා එන්නට නිස්සැ"යි බිණුහු.[2]

එකල්හි කූටදන්ත බමුණු, "මෙ බමුණො ජාති ආදීන් මා ගෙ ගුණ කියති. තමා ගෙ ගුණයෙහි රැඳෙනු යෙදෙන්නෙ නො වෙයි. එසෙ බැවින් මොවුන් ගෙ වාද බිඳැ මහණ භවත් ගොයුම්හු ගෙ මහත් බව් හඟවා මොවුන් එයට යනු කළ මැනැවැ"යි සිතා, "තෙපි මා හා කියනු අසව,[3] මම් කවරෙම්! මහණ භවත් ගොයුම්හු ගෙ ජන්ම සම්පත් ආදි ගුණයො කවරහ! මෙර ගල් පිණිස සිද්හතු[4] සෙයින් මහ මුහුණු පිණිස බොලට ගැලෙන දිය සෙයින් සත් දහතළා[5] පිණිස පිනිබිඳු සෙයින් මහණ භවත් ගොයුම්හු ගෙ ජන්ම සම්පත් ආදී ගුණයන් පිණිස අප ගෙ ගුණයො ලාමකයහ. එ බැවින් භවත් ගොයුම්හු දක්නට යන්නට ඇපි මැ නිස්සම්හ.

මහණ භවත් ගොයුම් අභිජාත යැ; මවුපියන් විසින් කිය හැකි දොස් නැතියෙ යැ; ඔහු මැණියන් ගෙ පක්‍ෂයෙහි අසූදහසක් කුලවැස්සහ; පියාණන් ගෙ පක්‍ෂයෙහි අසූදහසක් කුලවැස්සහ. මෙසෙ එක් ලක්‍ෂ සැට දහසක් කුල වැස්සන් පියා පැවිජි වූයෙ යැ. බිමැ නිධාන කොටැ තුබූ ධන මිසැ උහු උපන් දවස් මැ සඞ්ඛ නම්, එල නම්, උත්පල නම්, පුණ්ඩරීක නම්, සතර නිධිකුම්භියෙක් නැංග. එහි සඞ්ඛ නම් නිධිකුම්භිය ගවු පමණැ. එල නම් නිධිකුම්භිය දෙගවු පමණැ. උත්පල නම් නිධිකුම්භිය තුන් ගවු පමණැ. පුණ්ඩරීක නම් නිධිකුම්භිය යොදුන් පමණැ.[6] හි ගත් ගත් තැන් පිරෙයි. මෙසෙ මහත් ධන පියා පැවිජි[7] වූයෙ යැ. තුරුණු වියෙහි සොඳුරු යොව්නෙහි ගිහිගෙන් නික්මැ ගොස් පැවිජි වූයෙ යැ. මවුපියන් නොකැමැති සෙ කඳුළු මුසු මුහුණු ඇති නෑයන් වලප්වා පැවිජි වූයෙ යැ. අභිරූප යැ; දර්ශනී යැ; ප්‍රසාදජනක යැ; පැහැසපුවෙන් උපෙත යැ. මහබඹහු සෙයින් දිලිසෙයි. රාහු අසුරිඳුහු දු පමණ නො ගත හැකි අපමණ අවකාශ ඇත්තෙ යැ. සිව්පිරිසිදු සිල්වතැ. කළ මියුරු වියත් තෙපුල් ඇත්තෙ යැ. ආදි මධ්‍යාවසාන ප්‍රකට කොටැ කියන වූයෙ යැ. උහු ගෙ එකෙකි ධම්දෙස්නෙන් සුවසූදහස් (සත්හුදු) අපමණ දෙව් මිනිස්හු දු[8] මඟපලා අමා වළඳති. එයින් බොහො දන හට ඇදුරැ[9]කාම රාග පැහුයෙ යැ. අචපල යැ.[10] කර්මවාදී යැ. ක්‍රියාවාදී යැ. නව ලොවුතුරා දහම් පුරස්සර කොටැ වැටෙයි. සැරියුත් මහ මුගලන් මහසුබ් ඈ බමුණො[11] උහුට පිරිවැරැ[12] වැටෙති. තම හට විරුද්ධ වූ බමුණනට අවිරුද්ධ වැ හිතකාම වැ වැටෙයි. උතුම් කුලෙන් පැවිජි වූයෙ යැ. නොනට කුලෙන් පැවිජි වූයෙ යැ. මහත් ධන ඇති මහත් භොග ඇති සමෘද්ධ කුලයෙන් පැවිජි වූයෙ යැ. පර රටින් ක්‍ෂත්‍රියපණ්ඩිත ආදීහු දු, දෙව්බඹනාගජඹ ආදීහු දු, පැන පුළුවුස්නට[13] එති. ඇතැම්හු පැන පුළුවුස්නට

---

1 වාසය
2 බමුණු කීහු
3 අසනුව
4 සිදුහතු
5 සදත් දහ තළා, සදහතළා
6 සතර ගවු පමණ
7 බුදු
8 සුවාසූදහස් සූවාසුදහස් පමණ දෙව්මිනිස්හු ද, සුවාසූදහස් අපමණ දෙව්මිනිස්හුදු "චතුරාසීතිම්පි පාණසහස්සානි, අපරිමාණ'පි දෙව මනුස්සා" - අටුවා
9 ඇදුරු
10 අචලයැ
11 මහණ බමුණො-පොත්, "සාරිපුත්ත මොග්ගල්ලාන මහා කස්සපාදිභෙදාය බ්‍රාහ්මණපජාය" - අටුවා
12 පිරිවර, පිරිවර වැ-මු
13 පුළුවුසුනට

ගොස් තමන් පැන විසඳුන් පිළිගන්නට[1] නොපොහොසත්සෙ සිතා නො පිළිවිසැ මැ නොබැණැ හිඳිති. ඇතැම්හු පුළුවුස්ති. හෙ ඔවුන් පැනයෙහි උත්සාහා ජනවා කියයි[2]. මෙසෙ ඔවුන් හැම දෙනාගෙ විමතිහි වෙලෙළ පැමිණැ බිඳෙන මහමුහුදැ රල සෙයින් ඔහු කරා පැමිණෙමින් මැ බිඳෙති. නොඑක් දෙව්දහස්හු දිවියෙන් උහු සරණ ගියහ. මහණ භවත් ගොයුම්හු ගෙ, "**ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො**" යනාදි යසගොස් දසදෙසෙහි පතළෙ යැ. හෙ සුපිහිටි පතුල් ඈ දෙතිස් මහපුරිස් ලකුණෙන් සැදුණෙ යැ. දෙව්මිනිස්[3] ගිහිගෙ සසුන් වැස්සන් කෙරෙහි තමා කරා ආවනට[4] පළමු මැ[5] 'එව, සුවඳ[6] යෙයි. කනට සුව මෙළෙක් තෙපුල් බෙණෙයි. පිළිසඵරහි දක්‍ෂයැ. සිව්වනක් පිරිස් වැස්සන් ආ ආ කලැ ගමන් ශ්‍රම නිවන්නවුන් සෙයින් පෙරට වැ ස්වාගත කෙරෙයි. සිව්වනක් පිරිස් දුටි[7] කලැ ඔහට[8] ළහිරිරසින් පුබුදු[9] පියුමක් සෙයින් මුවපියුම් විකසිත වෙයි. පුන් සඳක් බඳු සොම් මුහුණු ඇති වෙයි. ඇතැම්හු පිරිස් දුටි කලැ කර බහා-ගෙනැ නො බැණැ හිඳිති. මහණ භවත් ගොයුම් වූ කල සුලභ කථා ඇත්තෙ යැ. උහු කරා ආවනට 'ඇපි මෙයට කුමට ආම්හ!' යන විපිළිසර[10] නො උපද්දි. ධම්දෙසුන් අසා සතුටි[11] වෙති. කාලයුක්ත වූ, ප්‍රමාණයුක්ත වූ, අර්ථවත්, තෙපුල් බෙණෙයි. සිව්වනක් පිරිස් වැස්සන් විසින් පුදන ලදුයෙ යැ. දෙව් මිනිස්හු පහන්හ.[12] යම් ගමෙකැ හො නියම් ගමෙකැ හො වසන්නෙ වී නම්, මහෙශාඛ්‍ය දෙවියො අරක් ගන්ති. යකුන් විසින් එහි මිනිස්නට උපද්‍රව නො වෙයි. ඔහු ඔවුන් ගෙ[13] අනුභාවයෙන් දුරු වෙති. ඔහු ගෙ මෛත්‍රී බලයෙනුදු යක්‍ෂයො මිනිසුන් නො පෙළත් මැයැ. තමා විසින්[14] නිපදවන ලද සඟුන් ඇත්තෙ යැ. එ සෙයින් මැ නිපදවන ලද මහණගණන් ඇත්තෙ යැ. ගණ ඇදුරැ අග්‍රදර්ශනයෙහි සිටියෙ යැ. ඇතැම් මහණබමුණු කෙනෙකුන් ගෙ යශස් නම් තම්[15] ප්‍රකාරයෙකින් වඩි,[16] මහණ භවත් ගෞතමයන් ගෙ යශස් වූ කල එසෙ නො වෙ. අනුත්තර වූ විජ්ජාචරණ සම්පත්තීන් වඩි. බිම්සර මහරජ අඹුදරුවන් ඇමැත්තන් හා සමඟ සහපිරිවරින් ප්‍රාණයෙන් භවත් ගොයුම්හු සරණ ගියෙ යැ. කොසොල් රජ එ සෙයින් මැ සහපිරිවරින්[17] සරණ ගියෙ යැ. පොක්ඛරසාති බමුණු සහපිරිවරින් සරණ ගියෙ යැ. සොණදණ්ඩ[18] බමුණු සහපිරිවරින් සරණ ගියෙ යැ. මහණ භවත් ගොයුම් බිම්සර මහරජහු විසින් පුදන ලදුයෙ[19]යැ. කොසොල් රජහු විසින් පුදන ලදුයෙ යැ. පොක්ඛරසාති බමුණා විසින් පුදන ලදුයෙ[20]යැ. සොණදණ්ඩ බමුණා විසින් පුදන ලදුයෙ යැ.* මහණ බවත් ගොයුම් දැන් ඛාණුමත නම් බමුණුගමට අවුදු අඹයටි උයන්හි වෙසෙයි. යම් කවර[21] මහණ බමුණු කෙනෙක් අප ගෙ ගම්කෙතට අවු ද, ඔහු[22] අපට අමුත්තහ. අමුත්තන්ට අප සත්කාර කළ මැනැවැ. මහණ[23]භවත් ගොයුම්

---

[1] තමන් විසජන්නට පැන "පුච්ඡාය වා දොසං විස්සජ්ජන සම්පටිච්ඡනෙ වා අසමත්ථතං සල්ලක්ඛෙත්වා අපුච්ඡිත්වා'ව තුණ්හී නිසිදන්ති අටුවා

[2] කියවයි.

[3] දෙව්මිනිසුන්

[4] ආවුන්ට, ආවන්ට

[5] පළමු ව

[6] සුවද්

[7] දුටු

[8] ඔහුහට

[9] පුබුද්නා, පුබුදනා

[10] පිළිවිසර

[11] සතුටු

[12] පාන්නාහ, පාන්හ

[13] ඔවුනොවුන්ගෙ

[14] ගුණයෙන්

[15] යම් යම්

[16] වැඩි

[17] මහපිරිවරින්

[18] සොණදණ්ඩ නම්

[19] ලද්දේ යැ

[20] ලදු වෙයි.

[21] කවුරු

[22] උහු,

[23] එබැවින් මහණ..........

අප දක්නට එන්නට නොනිස්සැ. ඇපි මැ ඔහු දක්නට යන්නට නිස්සම්හ. මා දන්නෙ, එ භවත් ගොයුම්හුගෙ මෙ පමණ ගුණයෙකැ; හෙ තෙම පමණ ගුණ ඇත්තෙ නො වෙයි. ඔහු සෙ මැ සව්නෙ දන්නා බුදුකෙනකුනුදු කියත්, නොගෙවෙන ගුණ ඇත්තෙ යැ. අප වැන්නො නම් කුම් කියති" කී යැ.

එ කල්හි බමුණො කූටදන්තයා කියන බුදුගුණ අසා, "යම්සෙ මෙ බමුණු මහණ භවත් ගොයුම්හු ගෙ ගුණ කියා ද, හෙ උතුම් ගුණ ඇත්තෙ යැ. මෙසෙ ඔහු ගෙ ගුණ දන්නා ආචාර්යයා විසින් මෙතෙක් දවස් ඉවැසුසෙ[1] වෙසෙසැ.[2] එ බැවින් උහු මැ අනුවම්හ" යි අනුවැ බණන්නාහු "භවත් ගොයුම් මෙයට සියක් යොජනෙහි දු වෙසෙ නම්, සැදැහැ ඇත කුලපුතක්හු විසින් පාථෙය[3] ගෙනැ දු ගොස් දක්නට නිස්සැ. එසෙ බැවින් ඇපි හැම දෙනමො මැ මහණ භවත් ගොයුම්හු දක්නට යම්හ"යි කීහු. එකල්හි කූටදන්ත බමුණු මහත් බමුණුගණා[4] හා සමග අඹයට් උයන් ගොස් බුදුන් කරා එළබැ සාමීචි කොටැ එකත්පස් වැ හිනි. ඇතැම් බමුණනු හා ගහපතිහි බුදුන් වැඳැ එකත්පස් වැ හුන්හ. ඇතැම්හු[5] බුදුන් හා සාරාණීයකථා[6] බැණැ එකත්පස් වැ හුන්හ. ඇතැම්හු බුදුනට ඇඳිලි බැඳැ එකත්පස් වැ හුන්හ. ඇතැම්හු නම්ගොත් කියා එකත්පස් වැ හුන්හ. ඇතැම්හු නො බැණැ එකත්පස් වැ හුන්හු.

විජිත නම් වී. එ රජ ආඪ්‍ය ය; මහාධන යැ;[7] මහාභොග යැ. බොහො රන් රිදි ඇත්තෙ යැ. සතුට් සොම්නස් උපද්නට[8] නිසි රන් බදුන් රිදී බදුන් ඈ බොහො උපකරණ ඇත්තෙ යැ. බොහො ඇතුන්[9] ඇත්තෙ යැ; බොහො අසුන් ඇත්තෙ යැ; බොහො රථ ඇත්තෙ යැ; බොහො රට ඇත්තෙ යැ. ධනයෙන්[10] පිරුණු ධාන්‍යයෙන් පිරුණු පිළින්[11] පිරුණු නොඑක් දහස්[12] කොටගෙ ඇත්තෙ යැ. එ රජ එක් දවසක් සතුරුවනින් පිරුණු කොටාර දහස් බලා "මෙ ධන හා රැස් කෙළෙ යැ?" යි භාණ්ඩාගාරිකයන් පිළිවිත. "මහරජ, තොප පියන් මුත්තන් ඈ සත්වන කුලපරම්පරායෙහි වූවන් රැස් කළ ධන යැ"යි කීහැ. "ඔහු[13] කොයට ගියාහ?" යි කී යැ. "මියැ පරලොව ගියාහ"යි කීහැ. "තමන් උපැයූ[14] ධන නො ගෙනැ ගියො දැ?"යි කී හැ. "මහරජ කුම්[15] කියවඃ ධන තබා පියා යත් මිසැ, ගෙනැ යන්නාහු නො වෙති"යි කීහ. එ කල්හි රජ නැවැතී සිරි යහන්ගබ ගොසින් හිඳැ, "මම් මිනිස්ලොවැ විපුල මහත් භොග ලදිමි[16] මුළු දඹදිව් දැනැ වෙසෙමි. පරලොව්හි දු[17] මා සුව විඳුනා[18] සඳහා මහත් යාගයක් කළ මැනැවැ"යි සිතී.

'යාග' ශබ්දය දෙවපූජායෙහි දු සඞ්ගති[19] ක්‍රියායෙහි දු දානයෙහි දු වැටෙයි. මෙතැනැ වූ කල 'යාග' ශබ්දයෙන් දන් කියත්.

---

1 වුසු සෙ, වුසෙ, 'අධිවාසිතං' - අටුවා
2 වෙසේය
3 පාථෙය්‍ය
4 බමුණු ගණයා
5 ඇතැම් බමුණු
6 සාරාණීය*සොණදණ්ඩ බමුණා ගැනැ සූත්‍රයෙහි හො අටුවායෙහි හො සඳහනෙක් නැත. මේ නම් මෙහි ලා අධිකයෙකි.
7 මහත්ධනය
8 උපදනට
9 ඇතුන් අසුන් ඇත්තෙ යැ
10 ධනධාන්‍යයෙන් පිරුණු
11 පිළියෙන්
12 දහස් ගණන්
13 උඟ
14 ඉපවූ, ඉපදවූ උපැවූ-මු:
15 කුමක්
16 ලදිමි
17 ලෙව්හි
18 විඳිනා
19 සඞ්ගතක්‍රියායෙහිද්

“දන් දෙනන්න් එක් පණ්ඩිතපුරුෂයකු හා බැණැ-ගෙනැ දූන මැනැවැ”යි තමා ගෙ පෙරවි බමුණා ගෙන්වා - ගෙනැ “ආචාර්ය, මම මහායාගයක් කටටියෙමි, පරලොවැ ද සුව විඳුනා සදහා යැ. මට අනුශාසනා කළ මැනැවැ”යි කීයැ.

එ කල්හි පෙරෙවි බමුණු, “මෙ රජ මහදන් දියටි වෙ.[1] ජනවියෙහි සොරහු බොහොහැ. ඔවුන් නොසන්හිඳුවා දන් දෙන කලැ ගෙනෙන කිරි දිහි සාල් ඈ දානසම්භාර වොලො ගන්ති. ජනදය සොරුන් විසින් ආකුල වෙයි. එසෙ වන්නා වූ රජු ගෙ දන් බොහො කලක් නො පවත්ති. ඔහු සිතට සුව ද නො වෙ”යි සිතා, “මහරජ, තා ගෙ රටැ සොරහු බොහොහැ. ඔවුන් නො සන්හිඳුවා බඳු කරවුවර ගන්නෙ දහම් නො වෙයි. සොරුන් මැරුව හොත් ඔවුන් කෙරෙහි දිටි තිබූ කෙනෙක් තා ගෙ රට වැස්සන් පෙළති. තා ගෙ මෙ සංවිධානයට පැමිණැ සොරහු සන්හිඳෙති.[2] එ බැවින් තා ගෙ රට ගොවිකම් කටටියනට බිජු බත් හුදැලු කැති සිහිවැල් දෙනු මැනැවැ. වෙණෙඳහම් කටටියනට[3] බඩුමිල දෙනු මැනැවැ සැම්වැටියනට ඔවුනොවුන් තුබූ පරිද්දෙන් නිබඳ[10] දිවෙල් තනතුරු ගම් නියම්ගම් දෙනු මැනැවැ. ඒ මිනිස්හු තමන් තමන් කළ මනා ගොවිකම් වෙණෙඳාම් ඈ කම්හි යෙදුණාහු, රට නො පෙළති. එසෙ වන්නා හා තට ධන ධාන්‍යයො රැස්[4] වෙති. සොරුන් නැති වන්නා හා මිනිස්හු භය නැති වැ සතුටි වැ[5] දරුවන් ළමැඩියෙහි[6] නටවමින් දොර සො පියාලා නිසැක වැ දවස් යවනු වෙති රජ හට අනුශාසනා කෙළෙ,

එ කල්හි රජ, “ඉතා මැනැවැ”යි ගිවිසැ-ගෙනැ ගොවිකම් කටටියනට[2] බිජු බත් හිදැනු කැති සිහිවැල් දින. වෙණෙඳාම් කටටියනට බඩුමිල දින. තමා සැම්වැටියනට ඔවුනොවුන් තුබූ පරිද්දෙන් නිබඳ දිවෙල් තනතුරු ගම් නියම්ගම් දින. එ මිනිස්හු තමන් තමන්ගෙ කම්හි යෙදුණහු, රජු ගෙ රට නො පෙළුහු.[7] රජ හට ධනධාන්‍යයො රැස්වූහ. මිනිස්හු සොරුන් නැති වන බැවින් භය නැති වැ සතුටි වැ දරුවන් ළමැඬියෙහි[8] නටවමින් දොර නො පියාලා නිසැක වැ වෙසෙති.

එ කල්හි රජ හැම සෙ මැ[9] රට සමෘද්ධ බව දැනැ පෙරෙවි බමුණා කැඳවා-ගෙනැ “ආචාර්ය, තා ගෙ උපායෙන් රටැ සොරහු දූ නැති වූහු. ධනධාන්‍යයෙන් කොටාර දහස්[10] පිරිණ. රටවැස්සනට ද භය නැති වී යැ. මම මහායාග කටටීයෙමි, පරලොවැ සුව විඳුනා[11] සඳහා යැ. මට අනුශාසනා කරනු මැනැවැ”යි කී යැ.

එ කල්හි පෙරෙවි බමුණු, “මෙ රජ මහාදාන දෙන්නට මහත් උත්සාහ ඇත්තෙ යැ. ඉදින් තමා ගෙ රට රජ ආදීනට නො කියා දෙන්නෙ වී නම්, ඔහු හැම දෙන නො සතුටු වෙති. ඔවුන් සතුටි වන නියාවක් කළ මැනැවැ”යි සිතා “මහරජ, තා මහ දන් දියටි බැවින් තා ගෙ රටැ රජනට දූ තා සැනැහැති ඇමැත්තනට දූ පිරිස් වැස්සනට දූ

[1] ව. වැ. වන - මු:
[2] සන්හිදුනි. සන්හිදුති
[3] කැටියනට
[4] බොහොරැස්
[5] සතුටු වෙති
[6] ලයෙහි
[7] පෙරළුැහ
[8] ළමෙහි
[9] හැමදෙයින් මැ
[10] දහස් ගණන්
[10] නිමඳ - හැම දෙවසිකහත්තවෙතනං - අටුවා
[11] විදින, විදිනා

බමුණුමහසල්කුලට දූ[1] නියම්ගම් වැස්සනට දූ දනවූ වැස්සනට දූ "මම් මහායාග කටටියෙමි, පරලොවැ ද මට සුව සඳහා යැ. එයට මට අනුදන්නෙ මැනැවැ"යි කියන්නට යෙදී යැ. මහරජ, "ඉතා මැනැවු"යි තමා ගෙ විජිතයෙහි රජ ආදීනට කී යැ. ඔහු "මෙ රජ 'ඉසුරුම්' යි අභිභවා දන් නොදී අපට කියයි. කළ සෙ හෙවූ යැ.[2] නො කී කලැ දාන සම්භාර බලන්නට[3] දූ නො යතී" සතුටි වැ "මහරජ, දෙයධර්ම නැති කලැද් මහලු කලැද් මෙ බඳ් දනක් දෙන්නට නො පිළිවන. තො මහත් ධන ඇත්තෙහි. ළදරුයෙහි, ඉතා මැනැවැ මහා යාග කරන්නෙ යැ"යි කීහු. "බමුණ, මෙ සතර අනුමති දායකයො යාගයට පිරිවර වෙතී" වදාළො.

**මහාවිජිත** නම් රජ අට අඟෙකින් සමුපෙත යැ. කවර අට ඇඟිනැ[4] යත්:- අභිජාත යැ, අභිරූප යැ, මහත් ධන ඇත්තෙ යැ, මහත් සිවුරඟසෙනඟ ඇත්තෙ යැ, මහත් සැදැහැ ඇත්තෙ යැ, බහුශ්‍රැත යැ, කී කී බසැ අර්ථ දන්නි, පණ්ඩිත යැ, ව්‍යක්ත යැ, අතීත අනාගත වර්තමාන අර්ථයන් සිතන්නට සමර්ථ යි. කීසෙ යැ යත්:- මට මෙ[5] සම්පත් "අතීතයෙහි පින් කෙළෙන් ලද්දෙ යැ"යි සිතනුයෙ, අතීත අර්ථයන් සිතන්නට සමර්ථ නම් වෙයි. "දැන් කළ පින් කැමින් අනාගතයෙහි සම්පත් ලබන්නට නිසි වෙමි"යි සිතන්නෙ අනාගත අර්ථයන් සිතන්නට සමර්ථ නම් වෙයි. "මෙ පින් කම්[6] නම් හැම මහාපුරුෂයන් විසින් ඇසුරුයෙ යැ,[7] මා ගෙ භොග දූ ඇති, දානචෙතනා දූ ඇති, එබැවින්[8] පින්කම්[9] කෙරෙමී" සිතනුයෙ වර්තමාන අර්ථයන් සිතන්නට සමර්ථ නම් වෙයි. මෙ අට ඇඟින්[10] සමුපෙත වැ දෙනුවහු ගෙ[11] දනට හැම දෙසෙන් මහාජයො එළඹෙති. "අජන්මවත් තෙමෙහෙ කෙතෙක් කල් දෙ ද! දැන් මැ විපිළිසර ඇති වැ සිඳැ පියතී[12]" මෙ ඈ නොඑක් සිතිවිලි සිතා කිසි කෙලෙක් මැ නො එළැඹියටි වෙති. මෙ අට ඇඟින් සමුපෙත වැ දෙන දනට එළැඹියටි වෙති. **මහාවිජිත** නම් රජ මෙ අට ඇඟින් සමුපෙත යැ. මෙ අට අඟ ද මෙ මැ යාගයට පරිවාර වෙ.

එ රජුගෙ පෙරෙවි බමුණු සතර අඟෙකින් සමුපෙත යැ. කවර සතර ඇඟි නැ යත්:- අභිජාත යැ, තුන් වෙදයෙහි පාරයට ගියෙ යැ, සිල්වතැ, නුවණැත්තෙ යැ, අභිජාතාදි ගුණෙන් යුත් පුඟුලන් ගෙ සංවිධානයෙන් දෙන දන බොහො කල් පවත්ති[13]. හැම දෙසින් මැ මහාජනයො එළඹෙත් මැ යැ, අගර්හිත වන බැවින් එළඹෙත් මැ යි. මෙසෙ එ රජු ගෙ පෙරෙවි බමුණු සතර අඟෙකින් සමුපෙත යි. මෙ සතර අඟ ද එ යාගයට පරිවාර වෙ.

එ කල්හි පෙරෙවි බමුණු රජු ගෙ යාගයට පෙරට වැ මැ සිතී: "දන් දෙන්නාහු තුන් තැනින් එක් තැනෙකැ චලිත වෙති. මෙරජු තුන් තැන්හි පළමු වැ[14] අචල කළ මැනැවැ"යි. රජ හට තුන් විධාන[15] දෙසී. කිසෙ යැ යත්:- "මහරජ, තා යාග කටටියහු විසින් කිනි කවර විපිළිසරයක් නො කළ මැනැවැ:- 'මා ගෙ ධන[16] නස්සි' කියා යැ.

[1] කුලයට දූ (ද්)
[2] හෙතුවැ
[3] ලබන්නට
[4] අටඅඟය
[5] මට මෙ සෙ, මා මෙ - මු.
[6] පින්කම
[7] සුරුයෙය
[8] වන බැවින්
[9] කම්
[10] අඟෙකින්
[11] දෙනුවන්ගෙ
[12] පියයි-මු:
[13] පවතිත්-මු
[14] මා
[15] විධානා 'නිස්සොවිධා' - පෙළ
[16] ධාන්‍ය

යාග කරන්නහු විසින් කිසි කවර විපිළිසරයක් නොකළ මැනැවැ- 'මාගෙ ධන නස්මින් සිටියෙ යැ' කියා යැ. යාග කළහු විසින් කිසි කවර විපිළිසරයක් නොකළ මැනැවැ; 'මා ගෙ ධන නස්මින් සිටියෙ යැ' කියා යැ. යාග කළහු විසින් කිසි කවර විපිළිසරයක් නොකළ මැනැවැ- 'මාගෙ ධන නට'යි කියා යැ. පසු වැ නොතැවුණ මැනැවැ. පූර්ව චේතනා අචල කොටැ පිහිට්විය යුත්තේ යැ. එසෙ වන්නා හා දානයෙහි ඵල මහත් වෙයි. මධ්‍යචෙතනාද් අපරචෙතනාද් එ සෙයින් මැ අචල කොටැ පිහිට්විය යුත්තෙ යැ. එසෙ වන්නා හා දානයෙහි ඵල මහත් වෙයි. එසෙ නො කරන්නා හට දානඵල විපුල නොවෙයි. උළාර වූ සම්පත් ලද් කලැද් රොරුව මහා නරකයෙහි උපන් අපුත්‍රක සිට් හට සෙයින් සම්පත් වළඳ[1] රිසි නොඋපද්දි. පෙරෙවි බමුණු මෙසෙ මහා විජිත රජුගෙ යාගයට* පෙරට වැ මැ ආදිචෙතනා මධ්‍ය චෙතනා අපරචෙතනා පිරිසිඳු කළ[2] මනා පරිදි දක්වනුයෙ තුන් විධාන දෙශනා කෙළෙ.

එක්බිති "ඉදින් මෙ රජු දුශ්ශීලයන් දැකැ 'මාගෙ දානය නස්සි- 'දුශ්ශීලයහ වළඳන්නාහ'යි, සිල්වතුන් කෙරෙහිද් විපිළිසර ඉපැයුයෙ[3]වී නම්, දානය මහාඵල නොවෙයි. විපිළිසර නම් දායකයනට පිළිගාවන් කෙරෙන් ද[4] උපද්දි. එසෙ බැවින් පළමු මැ එ විපිළිසර නො උපැද්ද දුන මැනැවැ"යි දස ආකාරයෙකින් පිළිගාවන් කෙරෙහි විපිළිසර නොකළ මනා පරිදි කියනුයෙ "මහරජ, තාගෙ[5] දන් ගන්නො පණිවා කරන්නාහු ද නොකරන්නාහු දු එති. එහි යම් කෙනෙක් පණිවා කරන්නාහු වූහු නම්, ඒ පාපයෙන් අනිෂ්ට[6] විපාක උනට මැ වෙයි. සෙස්සනට වන්නෙ නොවෙයි. එහි යම් කෙනෙක් පණිවා නො කෙරෙද්ද, ඔවුන් සඳහා දන් දෙන්නෙ යැයි සිත් පහදවන්නෙ[7] යැ. එසෙයින් මැ අයිනාදන් ගන්නාහුදු නොගන්නාහු දු කාමමිථ්‍යාචාරයෙහි පවත්නාහු දු නොපවත්නාහු දු මුසවා කියනුවො දු නොකියනුවො දු අනුන් ගෙ අයිණි[8] කියන්නාහු ද නොකියන්නාහු ද අන්නට කර්කශ තෙපුල් බණන්නාහු නොබණන්නාහු දු සම්ඵප්පලප[9] බණන්නාහු දු නොබණන්නාහු දු අනුන්ගෙ සම්පතැ ලොභ කරන්නාහු දු නොකරන්නාහු දු අනුන් කෙරෙ ගැටෙන්නාහු දු නොගැටෙන්නාහු දු මිසදිටිහ ගත්තාහු දු නොගත්තාහු ද තාගෙ දන් ගන්නට එළඹෙත්. එහි යම් කෙනෙක් අයිනාදන් ඇ ගන්නාහු වූ නම්, එ පාපයෙන් අනිෂ්ට විපාක උනට මැ වෙයි. සෙස්සනට වන්නෙ නොවෙයි. එහි යම් කෙනෙක් අයිනාදන් ඇ නොගන්නාහු වූ නම්, ඔවුන් සඳහා යැ මා දන් දෙන්නෙ යි, සිත් පහදවන්නෙ යැ"යි මෙ දස ආකාරයෙන් පිළිගාවන් කෙරෙහි විපිළිසර නොකළ මනා පරිදි යාගයට පෙරට වැ මැ කියා ගිවිස්වි යැ.

එක්බිති "මහරජ, තා මෙසෙ දන් දෙන කලැ 'අපට නොකියා රජ යාග කෙරෙ'යි කියන්නට නිසි යමෙක් නැති" යනාදි විසින් සොළොස් ආකාරයෙකින් රජ හට සොම්නස් උපැද්දී.[10] එ යාගයෙහි ගෙරින් නො ද මැරුහ. එළුවන් නො ද මැරුහ. කුකුළන් නො ද මැරුහ. හූරන් මුවන් ලිහිණියන් ඇ නොඑක් සතුන් නො ද මැරුහ. යූපයට රුක් නො ද සුන්හ. ඉලුප් දා නො ද අළහ. දන් ඇස් ආදි කම්කරුවො යාග

[1] වළඳන
[2] කළපරිදි
[3] ඉපැදවූයෙ
[4] මැ
[5] තාගෙන්
[6] අනිච්ඡ
[7] පාදවන්නේය
[8] අයණි
[9] සම්ඵප්ඵල, සම්ඵප්පලාප * "බමුණ මෙසෙ = මහාවිජිත රජු ගෙ පෙරෙවි බමුණු රජු ගෙ යාගයට" - පොත්.
[10] උපද්දි

කරන තැනැ මෙහෙවර කටටි වුව, කෙරෙති. නොකටටි වුව, නො කෙරෙති. යමක් කටටි වුහු නම්, කටටි ද කෙරෙති. නොකටටි ද නො කෙරෙති. දඬු මුගුරු ගෙනැ "මෙහෙ කෙරෙහි ද? නො කෙරෙහිද?"යි කියන්නාහු නැති. "ඉදින් මෙහෙ කෙරෙහි නම්, කරා. නො කෙරෙහි නම්, තළම්හ, බඳම්හ[1]" යි යන්නො නැති. කඳුළු මුසු මුහුණු ඇති වැ වැලැපැ වැලැපැ මෙහෙ කරන්නාහු නැති.[2] මිහිරි තෙපුල් බැණැ මෙහෙ කැරවූහ. එහි දස්නට 'දස්හ' යි නොකියති. දැස්නට 'දැස්හ'යි නොකියති. කම්කරුවනට 'කම්කරුවහ'යි නො කියති. පිය තෙපුල් බැණැ අඹුන්මිනිස් පිරිමින් කෙරෙහි බැල[3] ඇත්තනට බැල[4] නැත්නට නිසි නිසි මෙහෙ දක්වා දී 'මෙයිදු මෙයිදු කරව' යෙති. ඔහු තමන් තමන් සිත් වූ[4] පරිද්දෙන් මෙහෙ කළො. ගී තෙල් වෙඬරු දිහි මී සකුරු ආදීන් යාග කොටැ නිමැවූහු.

කිසෙ යැ යත්:- රජු පිටිනුවර[5] සතර දොර ද ඇතුළු නුවර මැද ද මෙ පස් තන්හි මහ දන්හල් කරවා එකෙකි දන්හලැ ලක්‍ෂ ලක්‍ෂ[6] බැවින්[7] දවසැ දවසැ පස් ලක්‍ෂයක් ධන විදා හිරු නැගි තැනැ පටන් ගෙනැ සිය අතින්* රන් කෙණෙස්ස ගෙනැ එ එ කලට[8] නිසි, පිණි වූ ගීතෙල් වෙඬරු දිහි මී සකුරු මුසු කොටැ හඹූ කඳු[9] බත් මාළු බොන ද ආදීන් මහ ජනා සැතැපී[10] ගෙනැ යාටියනට එ සෙයින් මැ බඳුන් පුරා දෙවි[11]. සවස් වෙලෙහි පිළින් ගඳින් මලින් පුදයි. ගී තෙල් ආදී මහසැළ පුරා, යමෙක් යමක් වැළැඳියටි වී නම්, හෙ එ වළඳාව'යි[12] නොඑක්සියතන්හි තබවයි.

එකල්හි එරජු ගෙ රට රජහු දු ඇමැත්තො ද පිරිස් වැස්සො ද බමුණුමහසල්කුලවැස්සො ද ගැහැවිමහසල්කුල වැස්සො ද නියම්ගම්වැස්සො ද දනවුවැස්සො ද, "මෙ රජ ගිතෙල් ආදී ජනපදවාසීන් කෙරෙන් ගෙන්වා නො ගෙනැ තමා ගැති ද වියදම්කොටැ මහදන් දෙයි. අපට කිසි දැයක් නො කියයි. අප නො බැණැ හිඳුනා තැන් නො යෙදෙයි. රජගෙහි ධන අපමණ[13]යැ. එතෙකුදු වුව ද[14] ධන ඇරැ දුන මැනැවැ"යි ගැමින් නියම් ගැමින් නුවරින් ධන නගා-ගෙනැ වෙන වෙනම ගැල් පුරා රජු කරා ගෙනැ ඇරැ "මහරජ, මෙ ධන බලා ගන්නෙ මැනැවැ"යි කීහු. රජ "මාගෙ ධන බෙහෙවැ. ධැමින් සෙමෙන් ගත් කරවුවරින් රැස් කෙළෙ යැ. තෙලෙ තොපට මැ වෙව යි. කැමැත, මොබින් ගෙනැ යව"යි කියා නොගත.

මහාජනයො එක තැනෙකැ ගොස් සිටැ බැණැ-ගෙනැ "මෙ ධන නැවැතැ අප ගෙ ගෙට ගෙනැ යන තැන් සොබනෙ නො වෙයි. රජ මහායාග කෙරෙයි. ඇපි අනුයාග කරම්හ"යි යම්සෙ පැදුන් දෙසෙන් එන්නාහු "අපගෙ දන්හලැ හඹූ බී රජු ගෙ දන්හලැ බත් වළඳා නුවර වදිද්ද, එබඳු තන්හි අනුයාග කරම්හ"යි රජ්දරු[15] ආදීහු පැදුන් දෙසෙහි දන්හල් කරවා දන් දුන්හ. එසෙසින් මැ දකුණු දෙසෙහි ඇමැති ආදීහු දන්හල් කරවා දන් දුන්හ. පැළදෙසෙහි බමුණු ආදීහු දන්හල් කරවා දන් දුන්හ. උතුරු දෙසෙහි

---

[1] බඳිම්හ
[2] කරන්නෝ නැති. කරන්නෝ නම් නැති
[3] බල
[4] සිත්තුබු
[5] පිටිනුවර
[6] එකෙකි ලක්‍ෂ ලක්‍ෂ
[7] බැගින්
[8] කුලට
[9] කැඳ, කනදැ, කද
[10] සතැප්පි
[11] දෙවයි
[12] වළඳවයි
[13] පමණය
[14] වුවද් *"එ එ කලට නිසි බොජුන සිය අතින්......"පොත්
[15] රජ්ජුරු, රජ්ජුරු, රජදරු

ගොවි ආදීහු දන්හල් කරවා දන් දුන්හු. ඔවුන්ගෙ යාගයෙහි දූ ගෙරින් නො ද මැරුහ. එළුවන්[1] කුකුළන් හූරන් මුවන් ලිහිණියන් ඈ නො එක් සතුන් නොද මැරුහ. රුක් නො ද සුන්හ. ඉලුප් දා නොද අළහ. දස් දැන් කම්කරුවන් නොද කළකිරුවූහ.[2] ගිතෙල් වෙඬරු දිහි මිහි සකුරු ආදීන් යාග කොටැ නිමැවූහු.

"මෙසෙ රට වැස්සන් අතින් ගත් සතර අනුමති හා රජුගෙ අට අඟ හා පෙරෙවි බමුණා ගෙ සතර අඟ හා තුන් විධාන හා මෙ යැ, බමුණ, තුන් යාග සම්පත් හා සොළොස් පරිවාර[3] යැ"යි වදාළො. එකල්හි බමුණො ගිතෙල් ආදින් නිමාවට[4] ගිය යාගවිධි අසා "ලොකයෙහි යම් මියුරෙක් ඇද්ද, මහණ ගොයුම් එමැ කියයි, එසෙ බැවින් යාග පස්සම්හ"යි සතුටි සිත් ඇත්තාහු මහත් කොටැ "යාග මෙසෙ වුව මැනැවැ. යාගසම්පත් නම් මෙයැ"යි ගුගුළො.

එකල්හි **කුටදන්ත** නම් බමුණු මත්තෙ කිව මනා අර්ථයක් සිතා නොබැණැ හුන්නෙ යැ. බමුණො ඔහු නො බැණැ හුන්සෙ දැකැ "හැයි, තො මහණ භවත් **ගොයුම්හු** ගෙ කථා නොඅනුමෙව්නෙහි[5] නො?" යි කීහු. "මම් එ නොඅනුමෙව් නෙම් නොවෙමි. යමෙක් මහණ භවත් **ගොයුම්හු** ගෙ කථා නොඅනුමෙව්නෙ නම්, උහු හිස් සත් කඩ වැ පැළෙයි. ඒකාන්තයෙන් මහණ භවත් **ගොයුම්හු** එකල්හි යාගස්වාමි **මහාවිජිත** රජහු හො වුව මැනැවැ. යාග කරුවූ පුරොහිතයා හො වුව මැනැවැ යි සිතා හුන්නෙමි" කී යැ. එ සඳැ **කුටදන්ත** බමුණු "තෙපි එ කාලයෙහි රජ වූව? පුරොහිත වුව?[6] යි ඉඳුරා කියනු හරසර නොවෙ"යි යන සිතින් පර්යායයන් පුළුවුස්නෙ "මෙබඳු යාග කළාහු දු කැරැවූවාහු ද කුමක් වෙති හො?" යි
කීයැ. "බමුණ, මෙබඳු යාග කළාහු දු කැරුවූවාහු දු සුගතියැ උපදිති. මම එකාලයෙහි **මහාවිජිත** රජුගෙ යාග කැරුවූ පෙරෙවි බමුණම්"[7] වදාළො.

එකල්හි **කුටදන්ත** බමුණු, "මෙ තුන් යාග සම්පතට හා සොළොස් පරිවාරයට වඩා මහත් ඵල ඇති අනෙක් යාගයෙන් හා ඇති හො?" යි කීයැ. එයට වඩා නිත්තෙන් සිල්වත්නට දෙන දන්හි ඵල මහත්සේ වදාළහ. එයට වඩා සෙනසුන් දනැ ඵල මහත්සෙ වදාළහ. එයට වඩා සරණගමන්හි[8] ඵල මහත්සෙ වදාළහ. එයට වඩා පන්සිල් රැක්මෙහි[9] ඵල මහත්සෙ වදාළහ. එක්බිති බුද්ධොත්පාදයෙහි පටන් ගෙනැ අර්හත් ඵල පර්යන්ත කොටැ **"ඉධ තථාගතො ලොකො උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො"** යනාදි විසින් ධම් දෙසා, අර්හත් ඵලයට වැඩි අනෙක් උතුම් පිණි යාගයෙක් ඇත්තෙ නො වෙයි වදාළො.

එකල්හි **කුටදන්ත** නම් බමුණු බුදුන් වදාළ ධම්දෙස්නෙහි පැහැදැ වැඳැ තුණුරුවන් සරණගොස්, "වහන්සෙ, මම් යාග සාලායෙහි සත් සියක් ගොනුන් සත් සියක් වස්සන් සත් සියක් වැස්සන් සත් සියක් එළුවන් සත් සියක් එළු පැටවුන් නොඑක් මුවන් ලිහිණියන් සත් සත් සිය බැවින්[10] ගෙනැ ටැඹැ බැඳැ සිටවූවන් විහිද්මි,[11] දිවි දෙමි,

[1] එළුවන් නො ද මැරුහ
[2] කල කිරුවා
[3] පිරිවර
[4] නිමාවට
[5] අනුමෙවුනි
[6] වුව ද, වූද
[7] බමුණෙමි
[8] සරණාගමනයෙහි
[9] රැකීමෙහි
[10] බැගින්
[11] විහිදුම්

නිල් තණ කා සිහිල් පැන් බොත්වයි, ඔවුන්ගෙ සරීරදරථ නිවමින් මනා මෙළෙක් සිහිල් සුළඟ[1] හමාව"යි බැණැ එක් පුරුෂයෙක් හට යෙදීයැ. හෙ ගොස් හැම සතුන් මුදවා පියා අවුදු බමුණාට කී යැ. හෙ අසා සතුට වී යැ.

බුදුහු ධම් දෙසුහු. බමුණු සොවාන් වැ බුදුන් සඟුන් පවරා වැඳැ පැදකුණු කොටැ ගෙට ගොස් අලුයෙහි සිනිඳු මියුරු පිණි බොජුන් යුතු කරවා "කල් දන්නෙ මැනැවැ"යි කියා යවී යැ. බුදුහු සුගත් මහපහුල් පෙරෙවැ පන්සියක් සඟුන් පිරිවරා ගොස් පැන් වූ අස්නෙහි වැඩැ හුන්හැ. බමුණු සිය අතින් දන් දී වැඳැ එකත් පස් වැ හුන්නෙ යැ. බුදුහු එවි හට[2] ධම් දෙසා හුනස්නෙන් නැඟී වැඩියො.

මෙ සෙයින් බුදුහු තමන් '**පුරිසදම්මසාරථී**' වන බැවින් **කූටදන්ත** බමුණා දු ආදි ශබ්දයෙන් ගත් **වඞ්ගීසාදි** අනෙ සිය දහස් බමුණනුදු දමා අමා මහනිවන් පැමිණිවූහු.

**බ්‍රාහ්මණදමන නම් පස් වන පරිච්ඡේද[3] නිමි.**

---

[1] සුවඳ සුලහ-මු.

[2] ඔහුහට, ඔහට

[3] පරිච්ඡෙදය - මු:

# 6. රාජදමන නම් පරිච්ඡේදය

**අජාසත් මහරජහු දැමූ පරිදි කිසෙ යැ යත්:-**

බුදුහු තමනට විරුද්ධ දෙව්දත් තෙරුන් ලදු ගත්, තමන් ගිහි කල්හි යහළු, බුදු කල්හි අරි සවු, **බිම්සර** මහරජහු මරා රජය ගත්, අජාසත් රජහු පුළුවත් පැන විසජා ධම් දෙසා සරණසිලැ පිහිට්වුහු.

කිසෙ යැ යත්:-

මගධ රට **රජගහා** නම් නුවරෙක් වී. එ නුවර මන්ධාතු **මහාගොවින්දදි** රදුන් විසින් පිරිගා කරන ලද් බැවින් **රජගහා** නම් වි යැ. බුදුන් දවසුදු **සක්විත්තන්** දවසුදු නුවර වෙයි. සෙසු කලැ සිස් වැ යකුන් විසින් පිරිගා කරන ලදු වැ ඔව්නට වසන්[1] උයන් සෙයින්[2] සිටි. බුදුහු එ නුවර නිසා අඩතෙලෙස් යල් සියක් සඟුන් පිරිවරා **ජීවකයන්** ගෙ **අඹවන** උයන්හි වැඩ වෙසෙති.

එ වනය කිසෙ වූයෙ යැ යත්:-

එක් සමයෙක්හි **ජීවකයො** මහනෙල් මල් සුඹුවා[3] බුදුන් දොස් හැරැ, **පජ්ජොත** මහරජහු තමන් කළ පිළියමැ පැහැදැ දී එවු පිළිසඟළක් දී, අනුමොදනාවසානයෙහි සොවාන් වැ, "එක් දවසකට දෙතුන් වටෙකැ[4] බුදුන් කරා ගිය මැනැවැ. **වෙළුවන** උයන් දුරැ. මාගෙ **අඹවන** උයන ආසන්න යැ. බුදුනට වෙහෙරක් කළ මැනැවැ"යි තමන් **අඹවන** උයන්හි වෙහෙර කොටැ අටළොස් හත් මහපවුරෙන් පිරිබෙව් කොටැ බුදු පාමොක් මහසඟනට වෙහෙර කොටැ දුන්හු.[5] මෙ සෙයින් බුදුහු **ජීවකයන්** ගෙ **අඹවන** උයන්හි වැඩ වෙසෙති.

එයට පෙරට වැ සැවත් නුවරැ මහ **කොසොල්** රජහු ද **රජගහා** නුවර **බිම්සර** මහ රජ[6] හට බිසො වැ **අජාසත්** කුමර හට ගබ් ගත. ඔහු කුසැ වසන කලැ බිසොවට[7] රජු දකුණු දසරුයෙන් ලේ බොන දොළෙක් උපන. හො තමහට උපන් දොළ කිසි කෙනකුනට නොකියා වැහැරැ ගියා. රජ පිළිවිසැ බලා නොකියන්නෙන්, "තී මට විපරීත වනු කුමට යැ?" යි යත්නයෙන්[8] පිළිවිසැ-ගෙනැ, "උවකමු[9] දොළෙක තිට උපන්නෙ යැ"යි වෙදු[10] ගෙන්වා-ගෙනැ රන් සැතින් දසරුව පළවා රන් තැටියෙන් ලේ ගෙනැ දිය හා මුසු කොටැ පොවාලී යැ. දොළ සන්හිඳිණ[11]. නෛමිත්තිකයො, "එ ගබ රදු[12] සතුරු දරුයෙකැ. ඔහු විසින් රජ නස්සි"යි කීහු. බිසව් එ අසා ගබහෙළා පියටි වැ උයන් ගොස් කුස මඩවයි. ගබ නො හෙයි. රජ ඇය එක්වන් උයන් යනසෙ දැකැ පරිජනයන් පිළිවිසැ අතුරු දැනැ, "තී කුසැ පුතකු බව් නො දැනෙයි. දුවක බව නො ද

---

[1] වසත්

[2] ලෙසින්

[3] හුඹුලුවා

[4] වරෙකැ

[5] දන් දුන්හු

[6] මහනිරිඳුහට

[7] දොළෙක් උපදනෙ-කිසි

[8] යත්නෙන්

[9] සැවකමු, සවකමු, සවකමු යන, සව්කම්, සැළුව කමු, සුවකමු-මු:

[10] වෙදුන්

[11] සන්හින

[12] රද

දැනෙයි. "අසුවල් රජ තම හට උපන් දරුවක් හට මෙසෙ කැරැවී යැ[1] යන මහත් අගුණරාසියෙක් දඹදිව් තෙලෙහි පැතිරැ යෙයි. වටා ලා එසෙ නො කරා"යි රකවල් දෙව් යැ. හෙ, "ඔහු උපන් කලැ මැරුව මැනැවැ"යි සිතුව දරුවා. උපන් කලැ රකවලැ සිටි මිනිස්සු දැකැ රජහු ගෙ කීමෙන් කුමරහු පා කළහ. කුමරහු මහත් වූ කලැ ඇරැ මව්බිසව් දැක්වූහු. හෙ ඔහු දැකැ පුත්‍රසනා කළා. එයින් ඔහු මරන්නට නොපොහොසත් වුව. රජද් අනුක්‍රමයෙන් ඔහුට යුවරජතන් දින්.

එකල්හි දෙව්දත් මහතෙරහු සිතුහු: "සැරැයුත්මහ තෙරහු දු මහමුගලන් මහතෙරහු ද මහසුබු මහතෙරහු ද වෙන වෙන පිරිස් ගෙනැ වාස කෙරෙති. මයිදු පිරිසක් කොටැ ගත මැනැවැ. ලාභ විනා පිරිස් කොටැ-ගත නොහැක්ක. එසෙ බැවින් ලාභ උපයුව මැනැවැ"යි විනයෙහි කී නිසායෙන් අජාසත් කුමරහු ඍද්ධි පෙළහරයෙන් පහදවා සවසැ දු රැයිම්මෙහි දු පන්සියයක් රථ පිරිවරින් තමා කරා එළඹෙනසෙ විස්වස් කළසෙ දැනැ[2] ඔහුට මෙසෙ කීහ:- "කුමාරය, පෙරැ මිනිස්සු බොහො කලට ආ[3] ඇත්තාහ. දැන් එසෙ නොවෙයි. තො පියා[4] මරා රජ ව, මම් බුදුන් මරා බුදු වෙමි"යි පියරජහු මරන්නට යෙදූහු.[5] එකල්හි රජකුමර, "අප වත්හිමියො දෙව්දත් තෙරහු මහත් ආනුභාව ඇත්තාහ. මොවුන්[6] නොදත්[7] දැයෙක් නම් නැති" කළවෙයැ සිරියක් බැඳැ-ගෙනැ දෙවෙන් දහවල්[8] වෙවුළමින් රජගෙට ගොස් වනි. එකල්හි ඇමැත්තො 'ඔහු තිරු කොටැ-ගෙනැ සබව දැනැ, "කුමාරයා ද මැරුව මැනැවැ. දෙව්දත්හු ද මැරුව මැනැවැ. හැම මහණහුද මැරුව මැනැවැ"යි බැණැ-ගෙනැ "සැළ කොටැ කළ මැනැවැ"යි රජ හට කීහු.

රජ, "කුමරුවා මරම්හ"යි සිතු ඇමැත්තන් අතැ[9] මෙහෙවර ගෙනැ, "නො මරම්හ" යි සිතු ඇමැත්තනට මහත් මෙහෙවර දී කුමර හට "කුමක් සඳහා 'මරමී' සිතුයෙහි?" යි පිළිවිත.[10] "රජය සඳහා"යි කීයෙන් "ඉතා මැනැවැ. තා කැමැති රජය බලා-ගනැ"යි රජය ඔව්හට දක්වා දිනි. හෙ "මාගෙ මනොරථ නිපනැ"යි දෙව්දත් තෙරුනට කී යැ.

එකල්හි දෙව්දත් තෙරහු "තො මීයන් ඇතුළු කොටැ බෙර සදන[11] මිනිසක්හු වැන්නෙහි. කිහිප දවසෙකින් තා පියෙ තා ගෙ නිහරසර[12] සඳහන් කොටැ බලා රජය ගන්නී" කීහ. "ඔස වහන්සෙ, කුමක් කෙරෙමි?" කී යැ. "රජු මරා-පිව මැනැවැ"යි කීහ. "මා පිය රජ හට සැතින් වධ නොකට හැක්කැ"යි කීයැ. "තැවෙන්නට නිසි ගෙකෙකැ ලා අහර වළකා මරා-පියව" යි කීහු. හෙ පිය රජු තැවෙන්නට නිසි ගෙකෙකැ බහා-පියා, "අන්නිය මිසැ, අනෙකක්හු නො වැද්දැ දෙන්නෙ යැ"යි යෙදී, එතැන පටන් ගෙනැ දෙවීහි රන් තැටියෙකු බත් එවැ හිඟැ තබා-ගෙනැ වදිති.[13] රජ එ වළඳා යපෙයි. හෙ "මබපාණො[14] කිසෙ යපෙතී?" පිණිවිසැ එ පවත් අසා, "ඇය හිඟින් යම් දැයක් ගෙනැ නො වැද්දැ දෙන්නෙ යැ"යි යෙදී.

---

[1] කැරවී ල
[2] දැක
[3] ආයු
[4] තො තා පියා මරා, තො තොප පියා මරා
[5] යෙදි 470-0
[6] ඔවුන්
[7] නොදන්නා
[8] දාවල්, දවාල්
[9] ඇත
[10] පිළිවිස
[11] බඳින
[12] නියසර, නිහසර,
[13] වදිති
[14] මවපියාණො, පමණෙ

එතැන් පටන් ගෙනැ දෙව්හි බත් මුහුළු තබා-ගෙනැ වදිති. එයිදු අසා, “අන්නිය කෙහෙ බැඳැ නො වැද්දැ දෙන්නෙ යැ”යි යෙදී. එතැන පටන් ගෙනැ රන්මරවඩියැ බත් වැ පියා-ලා පයින් ගෙනැ වදිති. රජ එ අසා, “අන්නිය මරවඩි ලා නො වැද්දැ දෙන්නෙ යැ”යි යෙදී. එතැන පටන් ගෙනැ දෙවීහි ගඳ දියෙන් නහා සරීරයෙහි සියු මියුරු ගල්වා පිළි පෙරෙවැ-ගෙනැ වදිති. රජපා ඔවුන් සිරිරු ලෙවැ යපෙත්. වැළි දු පිළිවිසැ එ පවත් අසා, “අන්නිය නො වැද්දැ දෙන්නෙ යැ”යි වැළැකී. දෙව්හි දොරොට්ගෙමුලැ[1] සිටැ, “හිමි, **බිම්සර** මහරජ, ඔහු ළදරු කලැ නො මරා පිව දුන්හ. තොප සතුරා තෙපි මැ පුටුව. මෙ තොප ගෙ නිමාම් දැක්ම යැ. මම් මෙ තන් පටන් ගෙනැ තොප දක්නා නො ලැබෙමි. මාගෙ වරදෙක් ඇත් නම්, මා කෙරෙහි ක්‍ෂමා කරන්නෙ ය”යි වැලැපැ වැහැසැ නැවැත්හැ.[2] එතැන පටන් ගෙනැ රජ හට අහර නැති වි යැ.

සොවන් රජ මඟපලසුවෙන් සක්මන් කොටැ යපෙයි. “රජු ගෙ සරීරය දිළියෙ” යි අසා “කිසෙ යපෙතී?” පිළිවිසැ, සක්මනින් යපෙනසෙ සරීරය දිළියෙනසො අසා, “සක්මන් නොකට-දුන මැනැවැ”යි. “බපාණන්[3] පතුල්, කරයෙන් පළා ලුණු තෙල් ගල්වා කිහිරඟුරෙහි ‘චිටිචිටි’ යන අනුකරණ ඇති කොටැ* (පස්ව”යි නැව්යන් යවී. රජ ඔවුන් දැකැ “මපිත් කිසිවක්හු විසින් එකැතින් දන්වන ලද්දෙ වනැ. මොහු මා මස්වලුමෙහෙ සඳහා ආහ!” යි සිති. ඔහු ගොස් රජු වැඳැ සිටියාහැ. “කුමක් සඳහා ආව?”යි පුළුවුස්නා ලද්දාහු එ හස්න සැළ කළහ. “තොප රජු අණ කරව”යි රජ කී යැ. “දේවයන් වහන්ස, වැඩැ හිඳුනෙ මැනැවැ”යි කියා රජු වැඳැ “දේවයිනි, ඇපි රජු ගෙ අණ කරම්හ. අප කෙරෙහි නො දහව. මෙ තොප බඳු දැහැමි රජ කෙනෙකුනට නිසි දෙයක් නොවෙ” යි කියා වමතින් ගුල්එයෙහි ගෙනැ දකුණතින් කරය ගෙනැ පතුල් පළා ලුණු තෙල් ගල්වා කිහිරඟුරෙහි ‘චිටි චිටි’ යන අනුකරණ ඇති කොටැ) පක්හැ.

එ රජ පූර්ව ජන්මයෙහි දාගබඟණෙක්හි වහන් ලා ගියෙ යැ. සඟුන් හිඳුනට අතුළ කළාලක් නොදෙවි පයින් ඇක්මිණ. මෙ එහි එල යි.

රජ හට මහත් වෙදනා උපන. “**අහො බුද්ධො! අහො ධම්මො! අහො සඞ්ඝො!**” යි තුණුරුවන් සඳහන් කරනුයෙ මැ දාගබණෙක්හි[4] බහා-ලූ මලක් සෙයින් මෙළෙ[5] **සව්මහරජ** දෙව්ලොව්හි වෙසවුණු මහරජාණන් පිරිවරැ **ජනවසභ** නම් යක්‍ෂයෙක් වැ උපන. පළමු සවරෙක්හි එහි උපැදැ මහත් සම්පත් වැළැඳුයෙ යැ. සවරෙක් හි දඹදිවැ රජ වූයෙ යැ. දැන් සත් වන වරැ, රජ වැ සත් වන වර සපුරමින් ගොස් උපන්. එ දවස් මැ **අජාසත්හු** පුතෙක් උපන. පුතු උපන් බව් දු පියාණන් මළ බව් දු දන්වන්නට දෙපත එක වට මැ අලහ ඇමැත්තො පළමු “පුතු උපන් බව් කියම්හ” යි එපත රජු අතැ තුබුහු. රජ හට එ කෙණෙහි මැ පුතුසනා උපැදැ[6] සියල් සිරිරු පැතිරැ ඇටමුල් පැහැරැ සිටියෙ යැ. එකෙණෙහි පියරජහු ගෙ ගුණ සඳහන් කොටැ “මා උපන් කලැ බපාණ[7]නටද් සනා මෙසෙ මැ උපන්නෙ යැ. යව, බපාණන් විහිද්ව”යි යෙදී යැ. “කුමක් විහිද්වම්හ! මහරජ”යි අනෙක් පත අතැ තුබුහු. හෙ ට පවත් අසා වල්පමින් මැණියන් කරා ගොස් “අන්න, බපාණනට මා කෙරෙහි සනා හා වී යැ හො?” යි

[1] දොරටුගෙමුල
[2] නැවැත්ත-මු
[3] මපණන්, මපියාණන්,* වරහන් තුළ ඇති වැකි අටුවායෙන් ගෙනැ යෙදිණ.
[4] දාගජ්අස්නෙහි
[5] මළා
[6] උපනැ
[7] මපණනටදු

පිළිවිත. ඔහු "බාල පුතු, කුම් කියහි? තා ළදරු කලැ ඇඟිල්ලෙහි පොළෙක් නැංග.[1] ඒ කල්හි වලප්නහු සන්හිඳුවන්නට නොපොහොසත් වූවාහු, විනිසමඬලෙහි හුන් තා පියරජහු කරා ගෙනැ ගියහ. හෙ තා ඇඟිල්ල මුවයෙහි තිබි යැ. පොළ මුවයෙහි මැ සිල් වී යැ. හෙ තා කෙරෙහි සෙනෙහෙන් ලේ මුසු පුයා නො දමාපියා මැ ගැලැ-පී යැ. තපියා තා-කෙරෙහි සනා මෙ බන්දැ"යි කීහු. හෙ වැලැපැ වැහැසැ පියාණන් සිරිරු හළු කිස කැරැවී.

දෙව්දත් මහතෙරහු දු **අජාසත්** මහරජු කරා ගොස් බුදුන් මරන්නට දුනුවා යොධයන්[2] ඉල්ලා-ගෙනැ නඟා යවා එයිනුදු කැරුණු දැ[3] නැතිසෙ දැකැ, තුමුහු **ගිජුකුළුපව්වට** නැඟී ගල්පාතැ සක්මන් කරන බුදුන් මුදුනට සෙල් විහිදැ එයිනුදු[4] කරුණු දැ නො දැකැ **නාලාගිරි** ඇතු විහිදැ, යම්කිසි උපායෙකින් බුදුන් මරන්නට නොපොහොසත් වැ, ලාභසත්කාරයෙන් පිරිහී, බුදුන් පස්වරයක් ඉල්ලා එ නොලදින් සතුරු වැ, සඟුන් පන්සියක් දෙනා බිඳැ අරගෙනැ ගොස්. **සැරැයුත්**[5] **මහමුගලන්** දෙ අගසව්වන් තමන්ගෙ පිරිසැ[6] සඟුන් ගෙනැ ගිය කල්හි කටින් හුණු ලෙ නඟා නව මසක් දවස් ලෙඩ වැ හෙවැ, තමන් කළ තාක් ඇයට විපිළිසර[7] උපයා, "දැන් බුදුහු කොහි වෙසෙති හො?" යි පිළිවිසැ "දෙව්රම්හි වෙසෙති" යනු අසා, "හැඳෙකින් මා ගෙනැරැ බුදුන් දක්වව" යි කියා ගෙනැ යන ලද්දාහු[8], බුදුන් දක්නට නිසි පිනක් නොකළ බැවින් **දෙව්රම්** පොකුණු තෙර දෙකක් වැ පැළී ගිය පොළොවට වැදැ **අවීචිමහා** නරකයෙහි පිහිටියහ.

එකල්හි[9] **රජගහා** නුවරැ සැණකෙළියක් වී යැ. නුවර වැස්සො එ නුවර දෙව්නුවරක් සෙයින් සදා සැණවෙස් ගෙනැ දෙවියන් සෙයින් සැණකෙළි කෙළිත්. **අජාසත්** රජ පනුරැසි පොහොදවස් රැ සරා සඳුරසින් රිදීකෙළෙන් නික්මුණු කිරි[10] දහර සෙයින්, රිදීවිමනින් නික්මුණු මුතුවැළ සෙයින්, සමන් කුසුම්දම් සෙයින්, දිලියෙන රාත්‍රියැ නිරිඳුමහලෙහි[11] ඇමැති මඬුලු පිරිවරා සෙ සත් යට ගන රන්මුවා අස්නෙහි හුන්නෙහි. කුමට හුන්නෙ යැ යත්* - නිඳි වළකනු සඳහා හුන්නෙයි.

මෙ රජ[12] පියා මළ තැන් පටන් ගෙනැ නිදන්නට ඇස පියා-ලු විගසැ මැ, සියලු සරීරයෙහි සැත්දහස් ඔත්කල් සෙයින් හඬමින් මැ පුබුද්දි, "මහරජ, කිමැ?" යි පුළුවුත් කල්හි වළහයි. එයින් ඔහට නිඳි නො රිසියෙයි. මෙසෙ නිඳිවළකනු සඳහා හුන් රජ "මෙ රැ සඳුරසින් රමණීය යැ,[13] අභිරූප යැ, දර්ශනීය යැ, සිත් පහදවයි, කවර මහණ බමුණු කෙනකුන් කරා යම්හ![14] කා කරා ගිය කලැ අප සිත් පහද්දි!" යි උදන් ඇනී. එ අසා එක්තරා රජමහ ඇමැත්තෙක්, "මහරජ, **පුරණ කස්සපයා**[15] කරා එළඹෙන්නේ යැ. එකලැ සිත් පහද්දි"යි කී යැ. එජ එ අසා නො බිණී යැ. අනෙක්[16] ඇමැත්තෙක්, "**මක්ඛලිගොසාලයා** කරා එළඹෙන්නෙ යැ"යි කී යැ. අනෙකෙක්[2],

---

[1] නැඟී
[2] දුනුවායන්, යොධ දුනුවායන්
[3] කරුණු
[4] කරුණු සේ.
[5] සැරියුත්
[6] පිරිස
[7] විපිළිසර
[8] යන කලද්, යන ලද්දාවූ
[9] එකලැ
[10] කීරු, කිරුළු
[11] මඟලෙහි, මඟුලෙහි
[12] මෙසෙ
[13] රමණීසේය
[14] යම්හයි
[15] පුරාණ කාශ්‍යපයා
[16] අනික්

“**අජිතකෙසකම්බලයා** කරා එළබෙන්නෙ යැ” යි කී යැ. අනෙකෙක්[2],
“**පකුධකච්චායනයා** කරා එළබෙන්නෙ යැ”යි කී යැ. අනෙකෙක්[2],
“**සඤ්ජයබෙලට්ඨි**[1]**පුත්‍රයා** කරා එළබෙන්නෙ යැ” යි කී යැ. අනෙකෙක්[2],
**නිගණ්ඨනාථපුත්‍රයා** කරා එළබෙන්නෙ යැ, එකලැ සිත් පහද්දී” කී යැ.

මෙසෙ ඇමැත්තන් තමන් තමන් ලද[2]ගත් නුවටැජරන් කී කල්හි, රන්වන් මියුරු රස ඇති අඹපකක් කැටි[3] පුරුෂයක්හු තමා අතැ තුබූ කදුරුපකක්[4] දැකැ දමා-පියන්-නක්හු[5] සෙයින් නො ගිවිසැ නො බැණැ හිඳැ, තම හට නොදුරු තන්හි[6] හුන් **ජීවකයනට**, “හැයි, සබඳ, නො බැණැ හුන්නෙහි නො?” යි කී යැ. රජ මෙ තෙක් පරිකථා කරනු **ජීවකයන්** සඳහා කෙළෙයි. කුමට යැ යත්:- තමා ඇරැ බුදුන් දක්වනු[7] සඳහා යි. තෙමෙ ගොස් දක්නට නොනිසි ද යත්: තමා මහාපරාධයෙන් ගොස් දක්නට නොනිසි වැ, “**ජීවකයා** පිටි පසැ හිඳැ බුදුන් දුට මැනැවැ”යි මෙතෙක් පරිකථා කෙළෙ.[8] රජු ගෙ අභිප්‍රාය ජීවකයො නො දනිද්ද යත්: දන්ති.[9] වැළි කුමට නො බැණැ හුන්නාහ[10] යත්: විබෙව් පසිඳුනා[11] සඳහා යි. කිසෙ යැ යත්: එ පිරිසැ නුවටැජරන් සදෙනා ලද ගත් ඇමැත්තො බොහො දෙන රැස් වූවාහු. ඔහු, “මා බුදුගුණ කියන්නට වන් කැලැ අතරතුරෙහි නැඟී[12] තමන් තමන් ලද ගත් නුවටුන් ගෙ ගුණ කියති. එසෙ වන්නා හා[13] මා කියන බුදුගුණ නිමාමට නො යෙයි. රජ වූ කල[14] පෙරැ මා මොවුන් ගෙ නුවටැජරන්[15] කරා එළබැ නිස්සාර බව දත්තෙන් ඔවුන් ගෙ ගුණ කථායෙහි නොසතුටු වැ මා පුළුවුස්සි. එකල්හි මම බුදුන් ගෙ ගුණ කියා රජු බුදුන් කරා ගෙනැ යෙමි” රදුගෙ අභිප්‍රාය[16] දනුතුද් විබෙව් පසිඳුනා සඳහා නො බැණැ හුන්හ.

එකල්හි රජ ඇමැත්තන් ගෙ බස් අසා, “මම යමක්හු යමක්හු බස් නො ඇසියටියෙමි ද, හෙ මැ හෙ මැ බෙණෙයි. යමක්හු ගෙ බස් ඇසියටියෙමි ද, හෙ මැ නාරජවස වළඳා සිටි ගුරුළක්හු සෙයින් නො බෙණෙයි. මට මහත් පිරිහිණෙකැ”යි සිතී, සිතා බලා “**ජීවක** උපශාන්ත වූ බුදුන් ගෙ සවි[17] යැ. තෙමෙ ද උපශාන්ත යැ. එබැවින් වත් සපන් මහණක්හු සෙයින්[18] නො බැණැ හුන්නෙ යැ. මා නොබුණු[19] කලා හෙ නො බෙණෙයි. ඇතක්හු මඬනා[20] කලැ ඇතක්හු මැ ගෙ පයින් මැඩිය මැනැවැ”යි සිතා ජීවකයනට මෙ “ඇමැත්තන් තමන් තමන් ලද[21]ගත් මහණුන් ගෙ ගුණ කියන්නන් මුව නො පොහොයි. මොවුන් සෙ මැ තා දු ලද ගත් මහණහු නැද්ද? කිම දිළිඳුහි ද? ම-පියෙ තට ඉසුරු[22] නොදුන්නෙ ද? නොහොත් සැදැහැ නැත්තෙහි ද?” යි පිළිවිත්.

---

[1] ලෙලට්ඨ, බෙලට්ඨා
[2] ලගත්
[3] කායැටි
[4] කරුපකක්
[5] පියන්නාසෙ
[6] නුදුරු නුදුරුස
[7] දක්වන
[8] කොළෝ
[9] දනිති
[10] හුන්නාහුද යත්
[11] පසිදිනා
[12] නැඟිනැඟි
[13] හැමු හාමු
[14] කලි
[15] නිවටජරන් නිවටැදුරන්
[16] අභිප්‍රා, අභිප්‍රාව
[17] සව්
[18] සෙ
[19] බිණූ
[20] මඩුනා
[21] ලැද
[22] ඉසිර

එකල්හි ජීවකයො, "මා ලවා මෙ රජ බුදුන් ගෙ ගුණ කියවැයටි බන්ද.[1] දැන් මා නො බැණැ හිඳුනට කල් වෙයි. යම්සෙ මෙ ඇමැත්තො රදු වැඳැ හිඳැ මැ[2] තමන් තමන් ලද ගත් නුවටුන්ගෙ ගුණ කීහු ද, මා එසෙ බුදුන් ගුණ නොකිව මැනැවැ"යි හුනස්නෙන් නැඟී බුදුන් වසන දස බලා පසඟ පිහිට්ටා වැඳැ නියරසින් දිලියෙන ඇඳිලි බැඳැ, "මහරජ, 'මා යම්තම්[3] මහණක්හු කරා එළබෙතී' නො සිතව. අප බුදුන් මවුකුස්හි පිළිසිඳැ ගන්නා කලැ දු මවු කුසින් නික්මෙන කලැ දු මහබිනික්මන් කරන කලැ දු බුද්වන කලැ දු ධම්සක් පවත්වන කලැ දු දසදහසක් සක්වළ කම්පිත වියැ. මෙ සෙයින් යමාමහ පෙළහර කළහ. මෙසෙ දෙව්ලොවින් බටහ. අප බුදුන් ගෙ ගුණ කියමි. එකඟ සිත් ඇති වැ අසා, මහරජ" යි*

**"අයං දෙව භගවා අරහං සම්මාසම්බුද්ධො අම්හාකං අම්බවනෙ විහරති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං අඩ්ඪ තෙළසෙහි භික්ඛුසතෙහි. තං ඛො පන භගවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො 'ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්ම සාරථී සත්‍ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති. තං දෙවො භගවන්තං පයිරුපාසතු. අප්පෙවනාම දෙවස්ස භගවන්තං පයිරුපාසතො චිත්තං පසීදෙය්‍ය"යි.**

බුදුන්ගෙ ගුණ කියන්නාහු, "මහරජ, අප බුදුහු මා ගෙ අඹ වනයෙහි අඩතෙළෙස් යල් සියක් සඟුන් පිරිවරා වැඩැ වෙසෙති. තොප වැනි සියනුදු සුවහස්නුදු සිත් ගෙනැ බණ කියති. රිසි සෙ එළබැ පැන පුළුවුස්නෙ යැ"යි කීහ.

රජ බුදුන් ගෙ ගුණ අසත් අසත් සියල් සිරිරු[4] පස්වනක් ප්‍රීතින් අතුරු නැති වැ පිරි ගියෙ. හෙ එ[5] විගසැ මා බුදුන් කරා යාටි වැ,[6] "මා මෙ වෙලෙ බුදුන් කරා යන්නා හට අනෙක් කිසි කෙනෙක් යානයන්[7] යොජන්නට නොනිස්සහ, ජීවකයා විනා යැ"යි සිතා, "සබඳ, ජීවකය, යා. තො මැ ඇතුන් සදව" යි[8] කී යැ. අනෙක[9] අශ්වයාන රථයාන ඇත ද, ඇතුන් මැ සදා එළවන්නට කියනු කුමට යැ යත්: උත්තමයන් කරා යන කලැ උත්තමයානයෙන්[10] ගිය මැනැවිනුදු, අශ්වයානරථයාන සශබ්දයෙන්[11] දුරැ මැ[12] එහි හඬ ඇසෙන්නෙනුදු, පස් පස් යන්නා හට ද[13] හස්තියානයෙහි හඬ නො ඇසෙන්නෙනුදු, "නිවි බුදුන් කරා නිවි යානයෙන්[14] ගිය මැනැවැ"යි සිතා ඇතුන් සදා එළවන්නට යෙදී.

ජීවකයො "රජ මෙ වෙලෙ 'බුදුන් දක්නට යෙමි' යෙයි. රජ්ජුරුවන් සතුරො බොහොහැ. ඉදින් අතරමඟැ කිසි අන්තරායයෙක් වී නම්, අන්හු මා ගරහති: 'ජීවක-රජ මා කීවා කෙරෙ'යි. අකාලයෙහි රජු ගෙනැ නික්මෙ' යි කියා යැ. බුදුනුදු ගරහති: "මහණ ගොයුම් තමා කීවා කැරෙති[15] කියා 'කල් නො නහමා මැ කථා කෙරෙ'යි කියා

---

[1] කියැවියැටිබව දැනැ
[2] මැද හිඳ
[3] යම්තමන්* බුදුන් ගෙ ගුණ කියන්නාහු-හැම පොතෙක මෙතැන ඇත.
[4] සිරුැර, සිරුැර, සිරිරු
[5] එම
[6] යාටිය, යාවිය
[7] යානායෙක්, යානයක්
[8] ඇත් සදාවායි, සදුවයි
[9] අනෙක්
[10] යානායෙන්
[11] සව් ශබ්දයෙන්, ශබ්දයෙන්
[12] දුර
[13] පස් යන්නාහටද්
[14] යානායෙන්
[15] කරුැති, කරති

යැ. එබැවින් මා හා.[1] බුදුනුද් නොගරහන නියායෙන් යම්සෙ රජ හට රකවල් සුසංවිහිත වෙ ද, එසෙ කෙරෙමි" සිතූහු.

එක්බිති "අඹුන්මිනිසුන් නිසා පුරුෂයනට භය නම් නැති. සුවයෙන් අඹුන්මිනිසුන් පිරිවරින් යෙති"යි පන්සියයක් ඇතින්නන් සදවා පන්සියක් මාගමුන් පිරිමිවෙස් ගන්වා "අසි තොමර ගත් අත් ඇති වැ.[2] රජු පිරිවරව" යි.[3] කියා වැළිදූ සිතූහු: "මෙ රජ හට මෙ අත්බැවැ මඟඵලයට උපනිඃශ්‍රය නැති. බුදුහු උපනිඃශ්‍රය බලා ධම් දෙසති. එසෙ බැවින් මහජනා.[4] රැස් කරවමි. එසෙ වන්නා හා බුදුහු කිසි කෙනකුන් ගෙ උපනිඃශ්‍රය හෙයින් ධම් දෙසති. එ දෙසුන් මහජනයා හට උපකාරයට මැ වෙ" යි.[5] එබඳු දනට.[6] කියා යවුහැ. නුවරැ බෙර පියෙවි කැරැවූහැ: "අද රජ බුදුන් කරා යෙයි. හැමදෙනා තමන් තමන්ගෙ කරමිණි.[7] තුබු පරිද්දෙන් අවුදු රජ හට අරක් ගන්නෙ යැ"යි යෙදූහු.

එකල්හි මහජනයො, "රජ බුදුන් දක්නට යෙ ල. එ ධම් දෙසුන් කිබඳ හො! සැණකෙළියෙක් කිම! එයට යම්හ!යි හැම දෙන ගඳමල් ගෙනැ රජු පෙරමඟ බලා මඟැ සිටියො. එ සැඳැ ජීවකයො "මහරජ, ඇතුන් සදා එළවූයෙ යැ. කල් දන්නෙ මැනැවැ"යි කීහු. රජ පන්සියක් මාගමුන් පන්සියක් ඇතුන් නඟා තෙමෙහෙ මඟුල් ඇතු නැඟී මිණිදඬුවැට පහනින් එකලු කොටැ මහත් අනුභාවයෙන් නුවරින් නික්මිණි.

එකෙණෙහි පන්සියක් මාගම්හු පිරිම්වෙස් ගෙනැ හිස් වෙළා දසරුයෙහි කඩු තබා මිණිතොමර ගෙනැ නික්මුණාහැ. ඔවුන් එක්බිති සොළොස් දහසක් නළුවො රජු පිරිවැරුහ. ඔවුන් එක්බිති කුද්කුරු.[8] කිරාතාදීහැ.

ඔවුන් එක්බිති රජගෙ රක්නා රජු කෙරෙහි විස්වස් ඇති පුරුෂයහැ.[9] ඔවුන් එක්බිති විසිතුරු වෙශවිලාසධර වූ සැටදහසක් මහාමාත්‍රයහැ.[10] ඔවුන් එක්බිති නොඑක් පළඳනෙන් සැදී නන් නන් ඇවි ගත් විද්‍යාධරතරුණයන් බඳු අනූදහසක් පමණ රැටිදරුවහැ. ඔවුන් එක්බිති සියක් වටනා.[11] පිළී හැඳැ පන්සියක් වටහා පිළී එකස් කොටැ බහා ලා නහා ගඳ විලෙවුන් ගත් රන් මල් ආදි නන් බරණින්[12] සැදුණු දසදහසක් මත්.[13] බමුණො දකුණු අත් ඔසොවා ජයශබ්ද ගොහමින්[14] යෙති. ඔවුන් එක්බිති පසඟ තුරු ගත් පුරුෂයො පසඟතුරු වයමින් යෙති. ඔවුන් එක්බිති දුනුබැල යැ;[15] ඔවුන් එක්බිති ඔවුනොවුන් වෙර පැහැරැ යන ඇත්පන්ති යැ; ඔවුන් එක්බිති ගෙලෙන් ගල.[16] පැහැරැ යන අස් පන්ති යැ; ඔවුන් එක්බිති එහි එහි පැහැරැ සිටි රථපන්ති යැ. ඔවුන් එක්බිති එහි එහි පැහැරැ සිටි රථපන්ති යැ; ඔවුන් එක්බිති දසරියෙන් දසරියෙහි පැහැරැ සිටි යොධයහැ. ඔවුන් එක්බිති තමන් තමනට නිසි ආභරණ සම්පතින්[17] වොරොජනා අටළොස් සෙනිහ යි යම්සෙ කෙළවර සිටැ වුහුටු

---

[1] මහදු, මහද්, මහණද්
[2] ඇතියාවැ
[3] පිරිවරා යවයි
[4] ජනන්
[5] වැටෙයි
[6] එබදනට
[7] කුරුමිනි, කැරැමිණි, කැරුම්නි, තුමිණි 'විභාවානුරූපෙන' - අටුවා
[8] කුරුකුද්කිරාකාදීහ
[9] ඇමැති
[10] මහාමාත්‍යයහ
[11] "සතසහස්සග්ඝනිකානි" - අටුවා
[12] නනබරණින්
[13] දසදහසක් බමුණො
[14] ගොහිමින්
[15] බෙළෙ යැ-මු.
[16] ගෙල
[17] සම්පත්තීන්

සරයෙක් රඳු කරා නොපැමිණෙ ද, එ සෙයින් **ජීවකයො** රජු ගෙ පිරිස් සංවිධාන කොටැ, "ඉදින් රජ හට කිසි උපද්‍රවයෙක් වෙ නම්, හැම දෙන හට පෙරට වැ රජ හට දිවි දෙමි"යි තුමුහු රජු[1] වැළැත ගෙනැ යෙති. ලියවැට මිණිදඬුවැටපහන් 'මෙතෙක් සිය යැ, මෙතෙක් දහසැ' යන පමණ නැති.

මෙසෙ මහත් රාජානුභාවයෙන් එ රජ[2] දෙතිස් මහ දොරක් හා සූසැට සුළු දොරක් හා ඇති **රජගහා** නුවර පැදුන් දෙසෙහි දොරින් නික්මැ නුවර පවුර හා **ගිජුකුළුපව්ව** හා දෙ අතුරෙහි **ජීවකයන්** ගෙ අඹ වනයට වෙත් වැ ගියෙ.[3] "එකල්හි බුදුන් කරා යන කලැ නිශ්ශබ්ද වැ ගිය මැනැවැ"යි රජගෙහි මැ සිටැ **ජීවකයන්** කීයෙන්[4] බෙර නො ගැසියැ දි මහත් කොටැ නොබිණියැ දි යන රජ හට භය උපන. කුමට යැ යත්: "අඩතෙළෙස් යල් සියක්[5] සඟුන් වසන අඹ වනයෙ කිබිස්නා හඬෙකුදු පොවා නැති. '**ජීවක** මා නුවරින් පිටතට නෙරැ-ගෙනැ පෙරටින්[6] බලකාය[7] දක්වා මා මරා තෙමෙ රජ වියටි යැ. මෙ පස් ඇතක් හට බල ඇත්තෙ යැ. මා වැළැත ගෙනැ යෙයි. මා කෙරෙහි ආයුධ ගත් එක පුරුෂයෙකුදු නැති. මට කැරුණෙ මහත් පිරිහිණෙකැ"යි සිතා බියපත් වැ "**ජීවකය**, මා නො නස. අභය දෙ"[8] යි කී යැ.

එකල්හි ජීවකයො "මෙ රජ මා ගෙ මාත්‍රා නො දන්නි. මම් ලිහිඬින්ලකුදු[9] දිවි නො ගළවමි. රජු නො අස්වැසීම් නම්, නස්සී" යි සිතා තර කොටැ අස්වසන්නාහු "මහරජ, නොබව, නොබව.[10] තෙලෙ බලා ගනැ. මණ්ඩලමාලයෙහි පහන් දිලියෙන්නාහ"යි කීහ. එ කල්හි රජ දොරොටුයෙන්[11] පිටතැ මැ සිටැ. ඇත්පිටින් බට. බැසැ බිමැ සිට විගසැ මැ බුදුන් ගෙ තෙජස් රජු වෙර පහළ. එකල්හි රජ හට එකෙණෙහි සියල් සිරිරින් සෙවද වැහිණ,[12] සළු[13] පෙරළා[14] පියන පමණ වි යැ. තමා ගෙ අපරාධ සඳහන් කෙළෙන් මහත් භය උපන.

හෙ ඉඳුරා බුදුන් කරා යන්නට නොපොහොසත් වූයෙ **ජීවකයන්** අතැ ගෙනැ අරම් සැරිසරන්නක්හු සෙයින්[15] "**ජීවකය**, තා මෙ කැරැවු සෙ යහපතැ. මෙ කැරැවු සෙ යහපතැ"යි ගුණ කියමින් අනුක්‍රමයෙන් මණ්ඩල මාලයට සම්ප්‍රාප්ත වැ "බුදුහු, සබඳ, කොහි යැ?" යි පිළිවිත්. කුමට පුළුවුස්සි යත්: ඇතැම්හු 'නොහඳුනන්නෙන් පිළිවිතැ' යෙත්. අකාරණ යැ. මෙ ළදරු කලැ පියරජු හා ගොස් බුදුන් දුටුවිරි යැ. පැසුළු පාපමිත්‍රයන් ගෙ සැසැඟින්[16] පිය රජහු මරා බුදුන් මරන්නට දුනුවායන් මෙහෙයා **නාලාගිරිහි** විහිදැ මහත් අපරාධයක් කොටැ සිටියෙන් බුදුන් කරා නොවන්නා මිසැ

---

[1] රජුට
[2] රජහු
[3] ගිය කල්හි
[4] කී සෙයින්
[5] අඩතෙළෙස් සියක්
[6] පරරටින්
[7] බලකායක්
[8] නො නසව හියදැයි, නො නැස්සීදැයි, නො නස්හිදැයි
[9] ලිහිඬිල්ල
[10] නොබා නොබා
[11] දොරටුයෙන්, දොරටුන්
[12] සෙවදහස්
[13] හන් සළු
[14] හෙළා, පෙළා
[15] මෙන්
[16] සසඟින්

නොහඳුනන්නෙ නො වෙයි. බුදුහු වනාහි දෙතිස් වරලකුණෙන් හා අසූ අනුව්‍යඤ්ජනයේ සැදි සිරිරු ඇතියව්හ. සවනක් රසින් දිලියෙමින් සියලු අරම් බබුළුවා තරු පිරිවරන ලද පුන් සඳක් සෙයින් මහණගණා පිරිවරා මණ්ඩලමාල මධ්‍යයෙහි වැඩැ හුන්නාහ. බුදුන් කවුරු නොහඳුනති![1] මෙ රජ තමා ගෙ ඉසුරු ලීලායෙන් පිළිවිතැ. හඳුනතුදු නොහඳුනන වන් වැ පුළුවුස්නෙ රජුන්ගෙ සිරිති. ජීවකයො වනාහි රජු ගෙ බස් අසා "මෙ රජ පොළොවැ සිටැ 'පොළොව් කොහි යැ?" යන්නක්හු වැන්න. අහස් බලා 'හිර[2] සඳ කොහි යැ?" යන්නක්හු වැන්න. මෙරමුලැ සිටැ 'මෙරගල කොහි යැ?" යන්නක්හු වැන්න. බුදුන් පෙරට සිටැ 'බුදුහු කොහි යැ?" යි පුළුවුස්නෙ යැ. එසෙ බැවින් මොහු බුදුන් දක්වමි" ඇඳිලි බැඳැ, "මහරජ, පෙරටහු[3] අප සම්මා සම්බුදුහ. මැද ටැඹ නිසා පැදුන් දස බලා සඟපිරිස් පිරිවරා වැඩ හුන්නාහ"යි කීහු.

රජ බුදුන් කරා එළැබැ සඟනට ගහට නො කොටැ එක් තැනෙක්හි බුදුන් නො වැඳැ මැ සිටැ, නිවාත තැනෙක්හි පිපි රත් පියුම්වනයක් සෙයින්, නො බැණැ වැඩහුන් සඟුන් දිට.[4] එහි එක්කෙනෙකුදු අතක් සොල්වනුවො නො ද ඇති. පයක් සොල්වනුවො නො ද ඇති. සව්බරණින්[5] සැදි නළු පිරිස් පිරිවරා බුදුන් පෙරට සිට රජ හො රජ පිරිස් හො එක් කෙනෙකුදු නො බැලූහ. හැම සඟහු[6] සවනක් පැහැයෙන් දිලියෙන බුදුන් බලා වැඩහුන්හු. රජ සඟුන් ගෙ උපසමයෙහි පැහැදැ, මඩ නැති පහන් විලක් සෙයින්, සන්හුන් ඉඳුරන් ඇති සඟුන් මෙ පුන පුනා බලා, "මෙ උපසමය ම-පුතු උද කුමරු හට වෙව"යි සිතා උදන් ඇනී.

ඔහු පැවිජි වැ මෙ සඟුන් සෙයින් උපශාන්ත වනු සඳහා නො වෙයි. මෙ රජ සඟුන් දැකැ පැහැදැ පුතු සඳහන් කෙළෙ. දිලිබ්[7] ඇයක් ලදින් හො අපූර්ව ඇයක්[8] දැකැ හො පිය වූ නෑයන් මිතුරන් සඳහන් කරනු ලොකයා ගෙ සිරිති.

එ සඳ බුදුහු රජු ගෙ සිත්හසර දැකැ, "මෙ රජ[9] මා හා සමඟ කථා කරන්නට නොපොහොසත් වූයෙ, බික්සඟුන් බලා පුතු සඳහන් කෙළෙ. මා නොබණන කල්හි මෙ රජ කිසි ඇයක් කියන්නට නොනිස්සැ. මුහු හා සමඟ කථා කළ මැනැවැ"යි "මහරජ, යම්සෙ උන් තැනැ වට දිය නතු තැනට යෙ ද, එ සෙයින් මැ සිත් තමා[10] පුතු කරා නතු වි යැ"යි වදාළො. එ සඳ රජු සතුටු වැ "බුදුගුණ අචින්ත්‍ය පරිදි මම් මැ[11] දන්මි. මා සෙ බුදුනට[12] අපරාධ කළ කෙනෙක් නම් නැති. මා මැ විසින් බුදුන් ගෙ අක්වටා[13] රජ මරන ලද. දෙව්දත්හු කියමන් ගෙනැ දුනුවාවන් මෙහෙයීමි. නාලාගිරිහි විහිද්විමි.[14] මා නිසා යැ, දෙව්දත් ගල්කුළු වුහුටුයෙ.[15] මෙසෙ අපරාධ ඇති මට බුදුහු පියතෙපුල්[16] කරන ඇ යැ. අහො! යහභ![17] බුදුහු පස්වැදෑරුම් තාදිගුණයෙහි පිහිටියාහ. මෙබඳු ගුණමුහුදු සථරුන් තබා බැහැරැ[18] සථරුන් පිරියෙස්මහ!"[19] යි

---

[1] හඳුනෙති හැම
[2] හිරි
[3] පෙර, පොරමහු, පොරමොහු පෙරටොහු-මු
[4] දුට
[5] සවබරණින්
[6] සඟම, සමගම
[7] දිලුබ්, දිලිබු
[8] අපූර්වයක්
[9] රදු
[10] තම්පුතු, තපුතු
[11] මම්දැන්
[12] බුදුගුණට
[13] අග්වටා, අගුවටා
[14] විහිදිමීම් විහිදුවීම්
[15] වුහුටුයේ යැ, වුහුටුවූයේ යැ
[16] ප්‍රිය තෙපුල්
[17] යගහ, යහාහා යහහා
[18] බැරැ
[19] පරියස්සම්හයි

සොම්නස් වැ පුතු තම හට පිය පරිදි කියා, බුදුන් පසඟ පිහිටුවා වැඳ, "සඟුන් වඳුත් බුදුනට පිටි පෑ[1] වැන්ද මනා වෙ" සඟනට බැඳැ පැන පුළුවුස්නට අවසර ගත්.

එ සඳැ බුදුහු "රිසියුණුදැයක්[2] පුළුවුස, මහරජ" යි සර්වඥ පවරුණෙන් පැවරුහු. මෙසෙ බුදුන් සර්වඥපවරුණෙන් පැවරු කල්හි රජ පැන පුළුවුස්නෙ "වහන්සෙ, ඇත්අරු[3] අස්අරු රියසැරි ආදීහු තමන් තමන් දන්නා ශිල්පයෙහි එල මෙ මැ ජන්මයෙහි ලැබෙති. රජකුලෙන් මහත් සම්පත් ලදින් තුමූහු දූ සුවයෙන් වැටෙති. මවුපියනුදූ අඹුදරුවනුදූ මිත්‍රයනුදූ ඇමත්තනුදූ සුවයෙන් පස්වටති. මහණ බමුණනට, සුගතියැ උපැද මහත් සම්පත් වළඳන්නට නිසි, දනුදූ දෙති. වහන්සෙ, එසෙයින් මැ මෙ ජන්මයෙහි මහණුව මැ එල දැක්විය හැක්කැ හො?" යි පිළිවිත. බුදුහු පැන නො විසජා මැ සිතුහු: "තීර්ථකයන් ගෙ ලද ගත් බොහො ඇමැත්තො මෙයට ආවාහ. හළ මනා පක්‍ෂය දූ ගත මනා පක්‍ෂය දූ දක්වා කියන කල්හි 'අප මහරජ මෙයට මහත් උත්සාහයෙන් මෙ ආ යැ. ඔහු ආ තැන් පටන්-ගෙනැ මහණ ගොයුම්හු මහණුන්ගෙ කොලාහල හා සටන් කියති' යි මුමුණනු වෙනි. සකස් කොටැ බණ නො අසති. රජු කියන කලැ[4] දහනට නොනිස්සහ. රජු මැ අනු වැ පවතිති.[5] එබැවින් රජු මැ හර කළ මැනැවැ"යි. "මහරජ, මෙ පැන සෙසු මහණ බමුණන් පුළුවුත් විරියෙක් හා ඇද්ද? ඔවුනොවුන් කී දැ තා සඟහන් ඇත් හොත්, යා"[6] යි වදාළහැ.

එකලැ රජ, "පණ්ඩිත ප්‍රතිරූපකයනට කියනු දුකැ. ඔහු පෙදෙහි පෙදෙහි අකුරෙහි අකුරෙහි[7] දොස් දෙසති.[8] එකාන්ත පණ්ඩිතයො වූ කලැ කියනු අසා මනා කොටැ කිව, පසස්ති. නෙසෙ[9] කී දැයක් ඇත, ඉදි කොටැ දෙසති[5]. බුදුන් හා සම ඒකාන්ත පණ්ඩිත කෙනෙක් ඇත්තාහු නොවෙති. එ බැවින් කිව මැනැවැ"යි සිතා "වහන්සෙ, මම එක් සමයෙක්හි පූරණ කස්සප නම් නුවටහු කරා ගොස් මෙ මැ නියායෙන් පැන පුළුවුත්මි. හෙ 'පව්කැමැ දූ පින්කැමැ දූ එල නැති' යනාදි විසින් තමාගෙ දර්ශන කී යැ. 'අම්බං වා පුට්ඨො ලබුජං ව්‍යාකරෙය්‍ය' යන සෙයින් මා පුළුවුත්තා තබා අනෙකක් කී යැ.[10] මම ඔහු කී දැය නො ගිව්සැ 'අසුවල් රජ තමා ගෙ විජිතයට ගිය මහණ බමුණනට මෙනම් දෙයක් කෙළෙ ල' යනු නො කියවුව මැනැවින්, නො බැණ නැඟී ගියෙමි" කී යැ. මෙ නියායෙන් සනුවටැජරන් කරා එළබැ පැන පුළුවුත්සෙ, ඔවුන් තමා පුළුවුතු දූ තමා තමන් තමන් දර්ශන දැක්වූසෙ, එහි තමා නොසතුටුසෙ කියා "වහන්සෙ, මම් වැලි පෙළා තෙල් නො ලබන්නක්හු සෙයින් තීර්ථයන් ගෙ[11] දර්ශනයෙහි සාරයක් නොලදින් වහන්සෙ පැන පුළුවුස්නට ආමි. වහන්සෙ, මෙ මැ ජන්මයෙහි මහණුවමැ එල දැක්විය හැක්ක හො?" යි කී යැ.

---

[1] පිටිපා-මු.

[2] රිසිවුණු දෙයක්, රිසියෙන දෙයක්, රිසියෙනු දෙයක්

[3] අත්අරු

[4] කලට

[5] පවත්ති

[6] කියායි

[7] අතුරෙහි

[8] දෙති-හමැ 'දෙසෙන්ති' - අටුවා

[9] නොසෙ

[10] කියයි

[11] තිර්ථයන් ගෙ

එකලැ බුදුහු "කියග, මහරජ, තා මැ පුළුවුස්මි. තා ගෙ කීකරු දසෙක් 'පිනැ ඵල පෙළහර යැ. මෙ අජාසත් රජ දු මිනිසැ, මම ද මිනිස්මි, මෙ රජ පස්කම්ගුණෙන් පිනපිනා රජ කෙරෙයි, දෙව්රජක්හු වැන්නැ, මම ඔහුගෙ දස්මි, මා මුහු සෙ මැ පින් කළ මැනැවැ. ඉදින් දන් දෙමි නම්, රජු එක් දවසක් දුන් දන් සියක් භාග කළ කලැ එයින් එක් භාගයක් පමණ දිනක් මම් දිවිපමණින් දෙන්නට[1] නො නිස්සෙමි, ඔස, මා පැව්දි වැ සිල් රැක්ක මැනැවැ'යි පැව්ජි වෙයි.[2] පැව්ජි වැ සිල්වත් වැ අපිස්සතොස් වැ වෙසෙයි. ඔහු එසෙ වසන කලැ 'මා දසු මට මෙහෙයට එන්නෙ යැ' යි හා කියහි දැ?" වදාළහ. "වහන්සෙ, එස නොකියම්හ. ඇපි මැ ඔහු වැඳැ පුදා දන් දෙම්හ" යි කී යැ. "කියග, මහරජ, ඉදින්[3] එසෙ වෙ නම්, මෙ මැ ජන්මයෙහි මහණුවමැ මෙ ඵල නොවෙ දැ"යි වදාළහ. "වහන්සෙ, ඒකාන්තයෙන් මෙ මැ ජන්මයෙහි මහණුවමැ මෙ ඵල යැ"යි කී යැ. "මහරජ, මෙසෙ මා විසින් මෙ මැ ජන්මයෙහි මහණුවමැ පළමු වන ඵල පනවන ලදැ"යි වදාළහ.

"වහන්සෙ, මෙ සෙයින් මැ මහණුවමැ මෙ ජන්මයෙහි මැ අනෙක් ඵලයක් හා පැනවිය හැක්කැ හො?" යි කී යැ. "මහරජ, එයිත් තා මැ පුළුවුස්මි. තට උපයා දෙන ගොවියෙක් තාගෙ විධි දැකැ 'මයිදු පින් කළ මැනැවැ'යි කුදු මහත් සැපත් පියා පැව්ජි වැ සිල්වත් වැ ගුණවත් වැ වැටෙයි. ඔහු එසෙ වසන කලැ 'මා ගෙ ගොවිහි මට උපයා දෙන්නට එන්නෙ යැ' යි හා කියහි දැ?" යි වදාළො. "වහන්සෙ, එසෙ නො කියම්හ.[5] ඇපි මැ ඔහු වැඳැ පුදු සතර පසයෙන් දන් දෙම්හ"යි කී යැ. "කියග, මහරජ, ඉදින් එසෙ වෙ නම්, මෙ මැ ජන්මයෙහි මහණුවමැ මෙ ඵල වෙ ද? නොවෙ දැ?"යි වදාළො. "වහන්සෙ, ඒකාන්තයෙන් මැ මෙ මැ ජන්මයෙහි මහනුවමැ ඵල යැ" කී යැ. "මහරජ, මෙසෙ මා විසින් මෙ මැ ජන්මයෙහි මහණුවමැ දෙවන ඵල පනවන ලදැ?"යි වදාළහ.

---

[1] දෙන්ට

[2] වියැ

[3] ඉදින් එය, ඉදින් එ

[4] විති

[5] නොකියමි.

“වහන්සෙ, මෙ මැ ජන්මයෙහි මෙයට වැඩි මහණුවමැ අනෙක් අතිශය ඵලයක් හා පැනවිය හැක්කැ හො?” යි කී යැ. “ඔස, මහරජ, අසා[1] දනැ”යි - “**ඉධ තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො**” යනාදි ක්‍රමයෙන් බුද්ධොත්පාදයෙහි පටන්-ගෙනැ අර්හත් ඵලය පර්යන්ත කොටැ අහස්ගඟ වතුරු සෙයින් ධම් දෙසා “මහරජ, මෙ මැ ජන්මයෙහි මහණුවමැ[2] මෙ ඵල යැ. මෙයට වඩා උතුම් අනෙක් අතිශය ඵලයෙක් නැති” වදාළො. මෙහි විස්තර **දික්සඟියැ සාමඤ්ඤඵල සුතින්** දන්නෙ යැ.

එකල්හි රජ තන්හි තන්හි සාධුකාර දී ආදි මධ්‍යාවසාන පහසා[3] සකස් කොටැ අසා “මම් මෙ පැනයන් බොහො දවස් බොහො මහණ බමුණන් පුළුවුස්නෙයිම්[4] තොහො කොටන්නක්හු සෙයින් කිසි සාරයක් නො ලදුම්. බුදුන් ගෙ ගුණ සපුව මහතැ. බුදුන් වහන්සෙ මට පහන් දහස් දල්වා[5] අලු කරන්නක්හු සෙයින් මෙ පැන විසජුහ. බොහො දවස් මම් බුදුන් ගෙ ගුණානුභාව නො දැනැ බැදිණිමී” සිතා බුදුගුණ සඳහන් කිරීමෙන් උපන් පස්වනක් ප්‍රීතින් පිනන ලද සිරුරු ඇති වැ “දිවි පියම්නි දු සරණ නො පියමී” **තුණුරුවන් සරණ** ගොස් ඉදින් “මා තියුණු කඩුයෙකින් හිස් සිඳිත් නම්, බුදුන් ‘නොබුදුහු’ යි නො ද කියමි. දහම් ‘නොදහමැ’යි නො ද කියමි. සඟහු ‘නොසඟහ’යි නො ද කියමි. මා සරණ ගිය බව් උපාසක බව් කැපකරු බව්[6] දන්නෙ මැනැවැ”යි දන්වා තමා පියා ධම්රජහු මැරු වරදට කමවා වැඳැ තුන් යලක් පැදකුණු කොටැ නියරසින් දිලියෙන ඇඳිලි මුදුනෙහි පිහිටුවා පැනෙන තාක් තැනැ බුදුනට අභිමුඛ වෙමින් ගොස් දසුන්[7] විජහන තැන සිටැ බිමැ පසඟ පිහිටුවා වැඳැ බුදුන් ගෙ ගුණ සඳහන් කෙරෙමින් නුවර ගියෙ.

ඔහු ගිය කලැ බුදුහු, “මහණෙනි, මෙ රජ පියා නො මැරුයෙ වී නම්, දැන් මෙහි මැ හිඳැ සොවන් වූයෙ යැ.

පාපමිත්‍ර සංසර්ගයෙන් එයට අන්තරාය වි යැ. එතෙකුදු වත් හොත් යම් හෙතුවෙකින් මෙ රජ **තථාගතයා** කරා එළඹැ **තුණුරුවන් සරණ** ගියෙ ද, එ හෙතුවින් මාගෙ සස්නෙහි මහතින්, යම්සෙ කිසිවෙක් මිනිසකු මරා මල් මිටක් පමණ දඬ දී ගැළවෙ ද, එසෙයින් මැ මෙ රජ **ලොහොකුඹුනිරයැ** උපැද[8] තිස්වාදහසෙකින් පත්ලට බැසැ තිස්වාදහසෙකින් සැලමුවවිටට නැඟී ගැළැවී යෙ”යි වදාළො.

මෙරජ පියා මැරු තැන් පටන්-ගෙනැ රෑඳවල් නිදි නො ලැබෙයි. බුදුන් දරා එළඹැ මියුරු ඔජ ඇති ධම් දෙසුන් ඇසූ තැන් පටන්-ගෙනැ නිදි ලද. **තුණුරුවනට** මහත් සත්කාර කෙළෙ. පුහුදුන් සැදැහැත්තන් කෙරෙහි මෙ රජු හා සමයො නැති. අනාගතයෙහි **විදිතවිසෙස**[9] නම් පසෙබුදු වැ පිරිනිවෙයි.

[1] අසය
[2] මහණුවමයෙහි
[3] පහාසා
[4] පුළුවුස්සෙමි.
[5] ලවා, දලවා
[6] කැපහර
[7] දසු
[8] උපද
[9] විජිතවිසෙස

මෙසෙයින් බුදුහු තමන් 'පුරුෂදම්‍යසාරථී' වන බැවින් අජාසත් රජහු පුළුවුත් පැන විසඳා.[1] ධම් දෙසා සරණසීලැ පිහිට්ටා.[2] ආදිශබ්දයෙන් **පායාසි, පොක්සී.**[3] ඈ රජුන් දමා අමා මහනිවන් පැමිණිවුහු.

**රාජදමන නම් සවන පරිච්ඡෙද නිමි.**

## 7. අඟුල්මල්දමන නම් පරිච්ඡේදය

**අඟුල්මල්** සොරහු ඇමු පරිදි කිසෙ යැ යත්: **කොසොල්** රජහු ගෙ.[4] හර්ග.[5] නම් පුරොහිතයා පිණිස **මන්තාණි** නම් බැමිණි ගබ් ගෙනැ රෑ.[6] පුතකු ප්‍රසව.[7] කළා. ඔහු මවු කුසින් නික්මෙන කලැ සියලු නුවරැ ආයුධ.[8] දිලිණ. රජුගෙ යහන්හි තුබූ මඟුල්කඩුව ද, සෙසු ඇවි දු.[9] දිලිණ. බමුණු නික්මැ නකත්තුරු බලන්නෙ සොරනකතින් උපන් බැව් දැනැ.[10] රජු කරා ගොස් "දවස් ගිය සෙ සුව ඇ?"යි පිළිවිත. රජ "දවස් ගිය සෙ නොසුව යැ. රෑ මාගෙ මඟුල් ඇවි.[11] දිලිණ. රජයට හො දිවියට.[12] හො අන්තරායවෙයි යන සිතින් නිඳි නොලත්මී" කී යැ. "මහරජ, නො බව.[13] මාගෙ ගෙහි කුමරෙක් උපන. උහුගෙ ආනුභාවයෙන් තොපගෙ මතු නොවෙයි, සියලු නුවරැ ආයුධ දිලිණැ"යි කී යැ. රජ එකල්හි "කිමෙක් වෙ?" යි පුළුවුත්තෙන්.[14] "සොරෙක් වෙ" යි කි යැ "එක සොරෙක් වෙයි හො? බොහො සොරුන් ගෙනැ රට පහරනට නිසි සොරෙක් වෙයි හො?" යි කී යැ. "එක සොරෙක් වෙයි, මහරජ" යි කී යැ. එසෙ කියා තමා රජු සිත් ගන්නා සඳහා "උහු හැරැ-පියුව.[15] මැනැවැ හො?" යි කී යැ. "එකා සොරකු බැවින් කුම්.[16] කෙරෙයි! පිළිදගුව උහු.[17] යැ" යි කී යැ. ඔහු නම් තබන්නාහු "සියලු නුවරැ දිළියෙන ආයුධයො කිසි කෙනෙක් හට හිංසා නොකළහ" යි **අහිංසක** නම් තුබූහ.

ඔහු විය පත් කල්හි මවුපියො ශිල්ප උගන්නට **තක්සලා** නුවර නගා-යවූහ. හෙ ධර්මාන්තෙවාසික වැ ශිල්ප උගන්නි. වත්සපනැ, කී කී ඇයක් වහා සපයයි, මන වඩන නියායෙන් හැසිරෙයි. පෙම් වඩන.[18] නියායෙන් බෙණෙයි. සෙසු දරුවො පිටත් වූහු.[19] ඔහු "අහිංසක මාණවකයා ආ තැන් පටන් ගෙනැ අපි නො පෙනෙම්හ. උහු.[20] කිසෙ බිඳුවම්හ!" බැණැ-ගන්නාහු "හැම දෙනා හට වඩා නුවණැති බැවින් 'නුවණ නැත්තෙ යැ' යි නොකිය.[21] හැක්ක. වත්සපනින් 'නොවත් සපනැ'යි නොකිය හැක්ක.

---

[1] විසජා, විසදා
[2] පිහිටිහි, පිහිටුවා
[3] පොත්සි
[4] රජහු
[5] භාර්ගව ගර්ග
[6] රෑ
[7] ප්‍රසූත
[8] රජුන් ගෙ ආයුධ 'සකල නගරෙ ආවුධානි'-අටුවා
[9] අවි ද
[10] දැක
[11] අවි, ඇවිදු, කඩු
[12] රජහට හො දිවිහට, රජහට ගො වියට හො, රජහට ගොවිහට, රජගට දෙවියට
[13] නුබව
[14] පුළුවුස්නෙන්
[15] හැරපිය, හැරපිව, හැරැපියව
[16] කුමක්
[17] ඔහු
[18] වඩනා
[19] වූහ
[20] ඔහු
[21] නොදැකිය

කුමක් කරම්හ! යි. ආචාර්යයා අඹුව හා සසඟ[1] අත්තෙ යැයි බිඳැ-පියම්හ! යි. බැණැ-ගෙනැ තුන් රැසක් වැ පළමු ඇතැම් කෙනෙක් ආචාර්යයා කරා එළඹැ වැඳැ සිටියාහ. "කිම් ද දරුයෙනි?"[2] කීයෙන් "මෙහි ඇසෙන දැයෙක් ඇති"යි කීහ. "කිමෙකැ හො?" යි කීයෙන් "**අහිංසක** මාණවකයා තොපට වරද්දයි[3] ගත්තාම්හ" යි[4] කීහ. ආචාර්ය උනට දැහැවැ[5] "යටත්නි, මපුතු මා කෙරෙහි[6] නොබිඳැ-පියටියාව" යි[7] නෙරැ-පීයැ.[8] 'අනෙක් වටැ අනෙක් රැසැ[9] ඇත්තො ආහ. අනෙක් වැට අනෙක් රැසැ ඇත්තො ආහ'යි තුන් රැසැ මැ ඇත්තො අවුදු එසෙ මැ කියා "අප නො හදහා නම් තෙපි මැ පිරික්සා බලව"යි කීහැ.

ආචාර්ය ඔවුන් තමා සනා ඇති වැ[10] බණනසෙ දැකැ "ඇය හා ඔහු සසඟ ඇති සෙ යැ"යි බිඳී "ඔහු මරමී" සිතී. "ඉදින් ඔහු මැරුයෙම් වීම්[11] නම්, '**දිසාපාමොක්** ඇදුරු තමා කරා ශිල්ප උගන්නට ගිය දරුවන් දොස් දක්වා මරයි, කියා වටාලා[12] ශිල්ප උගන්නට එන්නො නොවෙති.[13] එසෙ වන්නා හා[14] මට ලාභ පිරිහෙයි. එසෙ බැවින් ශිල්ප සමහරයට[15] උපචාර යැයි කියා මිනිස් දහසක් මරන්නට කියමි. ඒකාන්තයෙන් එයින් එකෙක් ඔහු මරයි" සිතා "පුතැ, මිනිස් දහසක් මැරුව මැනැවැ. එසෙ වන්නා ශිල්පයට උපචාර කළා වෙ"[16] යි කී යැ. "ඇපි අන්නට හිංසා නොකරන කුලෙහි උපන්නම්හ.[17] එසෙ නොකට හැක්කැ"යි කි යැ. "ශිල්පයට උපචාර නොකරන්නා ඵල නොදෙයි, පුතැ," යි කී යැ. හෙ පඤ්චායුධ ගෙනැ ආචාර්යයා වැඳ අටවියට වැදැ අටවියට වදනා තන්හි දු අටවිමධ්‍යයෙහි දු අටවියෙන් නික්මෙන තන්හි දු සිටැ[18] මිනිසුන් මරයි. පිළී ඈ කිසි අයතියක් නොගන්නි. 'එකෙකැ, දෙකෙකැ'යි ගණන් මතු කෙරෙමින් යෙයි. මෙ නුවණ ඇත ද, පණිවා කරනුවත් සිත්[19] නොපිහිටන බැවින් කල් යත් යත් ගණනුදු නොදත. එකෙකි ඇඟිලි කපාගෙනැ තබයි. තුබු තුබු තැනැ ඇඟිලි නස්සි. එ නස්නාසෙ දැකැ ඇඟිලි විද මාලා කොටැ ධැරි යැ. එයින් ගෙ **අංගුලිමාල** නම් වි යැ.

හෙ හැම අරණ්‍යයෙහි හසර නැති කොළෙ. දර පලා සඳහා වල් යන්නාහු නැති. රෑගමට වැදැ පයින් පැහැරැ දොර ගළවා පියා එහි හොතුවන් මරා-පියා 'එකෙකැ දෙකෙකැ' යි ගැණැ-ගෙනැ යෙයි. එකල්හි ගම්වැස්සො ගම් පියා ගොස් නියම්ගම් වන්හ. නියම්ගම්වැස්සො ගොස් නුවර වන්හු. තුන් යොජනක් තන්හි මිනිස්සු[20] ගෙ පියා දරුවන් අතැ ගෙනැ ගොස් සැවැත් නුවර වටා කඳවුරු බැඳැ රජාඞගණයෙහි රැස් වැ "මහරජ, තාගෙ රට අඞගුලිමාල නම් සොරෙක් වී යැ" කියා කියා වලපිත්.

---

[1] සමඟ
[2] දැරියෙනි
[3] වරද්දහයි, වැරැද්දහයි
[4] ගත්තම්හයි
[5] දැහැ
[6] කෙරෙ
[7] බිදැපියටියවයි, බිදවයි
[8] නෙරපියා
[9] රස
[10] ඇතිවන් වැ ඇති බැවින්
[11] මැරුයෙ වී නම්
[12] වටලා
[13] නේති
[14] එසෙ වන්නාහ
[15] සංහාරයට සමහාරයට සම්හාරයට, සමහාදනයට, 'පරියොසානුපචාරො'-අටුවා
[16] කළා නම් වෙයි
[17] උපන් නෙම්හ.
[18] සිටි
[19] සිත් ගෙන
[20] මිනිස්සු

පිය බමුණු "මපිත්[1] වන්නෙ වෙයි" සිතා මවුබැමිණියට "අඟුල්මල් නම් සොරෙක් උපන. හෙ අනෙකෙක් නොවෙයි, තී පිත්[2] අහිංසක කුමාර යැ.[3] දැන් රජ ඔහු ගන්නට යෙයි. කුමක් කට යුත්තෙ යැ?" යි[4] කී යැ. "යා හිමි, මපුතු ගෙනැ එ"යි[5] කිව. "සොඳුර, මම් යන්නට නොනිස්සෙමි. සතර දෙනකු කෙරෙහි විස්වස් නැති: සොර 'පෙරැ මා සබඳහ' යි විස්වස් නොකට[6] යුත්තෙ යැ. තමා පළමු අතොට[7] හුන් කොළ 'මා පෙරැ වළඳ ගත්තෙ යැ'යි විස්වස් නොකට යුත්තෙ යැ. රජ 'මා හා සබඳහ' යි විස්වස් නොකට යුත්තෙ යැ. ස්ත්‍රී 'මට වශ්‍ය[8] යැ' යි විස්වස් නොකට යුත්තෙ[9] යැයි කී යැ. මවුන් වනාහි ළ මෙළෙක් වෙයි. එයින් හො "මම් මැ මපුතු ගෙනැ එමී" නික්මුණ.[10]

එදවස් බුදුහු දෙව්රම්හි වෙසෙමින් අලුයම් සමාහි[11] ලො බලන්නාහු අඟුල්මල් සොරහු දැකැ "මා ගිය කලැ ඔහුට[12] සෙත් වෙයි. ගම් නැති තැනැ මහ වල්හි සිටියෙ සිවුපදගයක්[13] අසා මා කෙරෙහි පැවිජි වැ රාත් වෙයි. ඉදින් නොගියෙම් නම්, මව මරා සසරින් නොනැගිය හැකි වෙයි. ඔහට සඞ්ග්‍රහ කළ මැනැවැ"යි පෙරවරු සුගත් මහපහුල්[14] හැඳැ පෙරෙවැ නුවර වැදැ වළඳා වෙහෙර ගොස් ඔව්හට සඞ්ග්‍රහ කටටි වැ දෙවරමින් නික්මැ අධන්මඟ පිළිපන්හු. එකල්හි ගොන් රක්නාහු වස්සන් රක්නාහු සහන්නාහු ගමන් යන්නාහු බුදුන් එකලා වැ බුදුරැස් නොවිහිදැ වඩනුවන්[15] දැකැ නොහැඳිනැ "මහණ, එ මඟට නොයා. එ මඟැ අඟුල්මල් නම් සොරෙකැ,[16] දරුණැ, ලෙහෙ මුඩු[17] අත් ඇත්තෙ යැ, සතුන් කෙරෙහි කුළුණු නැත්තෙ යැ, ගම් නොගම් කෙළෙ, නියම් ගම් නොනියම්ගම් කෙළෙ, දනවු නොදනවු කෙළෙ, මිනිසුන් මර මරා ඇඟිලි විදැ මාලා කොටැ ධරයි. මහණ, තෙල මඟට පුරුෂයො දස දෙ දූවිසි තිස් සතලිස් පනස් දෙන දු සැක ඇති වැ සන්නද්ධ වැ වග වග වැ[18] යෙති. ඔහු දු අඟුල්මල් සොරහු අතැ නස්ති" කීහ. බුදුහු ඔවුන් තුන් යලක් කියතුදු නොබැණැ නැඟී වැඩියො.

සොරදු[19] එසමාහි[20] දුබ්භොජනයෙනුදු දුක්ඛසෙය්‍යායෙනුදු උකටලි වී. ඔහු මැරු මිනිස්හු එකක්හු උනු දහසක් දෙන යැ. හෙ වනාහි "එකකු විසින් දහස සපිරෙ" යි යන සිත් ඇති වැ "යමක්හු පළමු දිටිම් ද, ඔහු මරා ගණන් සපුරමි.[21] ශිල්පයට උපචාර කොට ඇළි කප්වා නහා පිළි පෙරළා[22] මවුපියන් දක්මි"යි අටවියට වදනා තැනට අවුදු මඟින් පහ වැ සිටියෙ, බුදුන් දැකැ විස්මිත වැ "මෙ මඟට පුරුෂයො දස දෙන දු විසි තිස් සතළිස් පනස් දෙන දු සැක ඇති වැ සන්නඬ වැ වග වග වැ එති. ඔහු දු මා අතැ නස්ති.

---

[1] මපුත්
[2] තී පුතු (-පුත්)
[3] කුමරුයැ
[4] කටයුත්තෙදැයි-මු
[5] එවයි
[6] නොදකට යුත්තේය-මු
[7] අතුට
[8] විස්වස්, විශය, විසි-මු
[9] යුත්ති-මු
[10] නික්මිණ
[11] අලුයම්හි, අලුසමාහි
[12] උහුට
[13] සිවුපදයක්
[14] මහපවුල්
[15] වඩිනාහු, වඩනවුන්
[16] සොරෙක්
[17] ලෙහෙමුසු, ලෙමුඩු
[18] වග වැ වග වැ
[19] සොරහු, සොරුදු
[20] එසමයෙහි දු
[21] සපුරෙමි
[22] පෙරවැලැ හෙළා

එතෙකුදු හොත් මෙ මහණ එකලා වැ මා අභිභවමින් මෙන් එයි.[1] මෙ මහණහු මැරුව මැනැවැ"යි කඩු පලඟ ගෙනැ දුනු හියවුර[2] බැඳැ බුදුන් පස් පස් ලුහුබඳවමින් යෙයි. යම්සෙ අඟුලුමල් සොර බුදුන් පියෙවිගමනින් වඩනුවන්[3] බැලපමණින්[4] දිවෙනුයෙ හඹා නොගත හෙද,[5] එවැනි අධිෂ්ඨානයක් කොළො. කිසෙ යැ යත්: "මහපොළොව නැඟි නැඟි බස්නා රසළ සෙයින් උහු ඇරැ බහ බහා සිටිවයි.[6] හි-සනක් පමණ තැන් පියා යෙයි. ගිය කලැ බුදුහු පෙරට මහත් අඬගණයක් දක්වා තුමූහු මධ්‍ය වෙති. හෙ අන්ත්‍ය[7] වෙයි. "දැන් මොහු හඹා-ගන්මි"යි බැල පමණින් දිවෙයි. බුදුහු එ අඬගණයෙහි කෙළවරැ වෙති.[8] සොර මධ්‍යයෙහි වෙයි. හෙ "මෙ තැනැ දි ඔහු හඹා-ගන්මි[9]" යි වෙළෙවි වැ දිවෙයි. බුදුහු එහි පෙරට වළක් හො ගොඩක් හො දක්වති.[10] මෙ නියායෙන් ඔහු තුන් යොජනක් තැන් ගෙනැ වැඩියො.

සොර ක්ලාන්ත වි යැ. මියෙහි කෙළ සිඳී ගියෙ. ශරීරයෙන් සෙව ද බස්සි. එකලැ අඟුල්මල් සොර විස්මිත වැ "මම් පූර්වයෙහි දිවෙන[11] ඇතුන් ලුහුබැඳ ගනිම් මැ යැ. අසුන් ලුහුබැඳැ ගනිම් මැයැ. රථ ලුහුබැඳැ ගනිම් මැ යැ. දිවෙන[11] මුවන් ලුහුබැඳැ ගනිම් මැ යැ. එතෙකුදු හොත් මම් මෙ මහණහු පියෙවිගමනින් යන්නහු[12] බැල පමණින් දිවෙනුයමේ හඹා නොගත හෙමි[13]යි සිටැ බුදුනට "සිට[14] මහණ," යි කී යැ. බුදුහු "මම සිටියෙමි. තොද සිට" යි වදාළො. එ සඳැ අඟුල්මල් සොර "මෙ සෑ[15] මහණහු සබව් කියති. මෙ මහණ යනුයෙ මැ "මම සිටියෙමි. තොද සිට'යි යෙයි. යම් කාරණයෙකින් මෙ මහණ යනුයෙ 'සිටියා' නම් වෙද, මම සිටියෙමි 'නොසිටියා' නම් වෙම් ද, එ කාරණය පිළිවිසැ බැලුව මැනැවැ"යි සිතා "මහණ,

'තො යන්නෙහි, 'සිටියෙමි'යි යෙහි. මා සිටියා හට 'නොසිටියාහ' යෙයි. තො කිසෙ සිටියෙහි?[16] මම් කිසෙ නොසිටියෙමි? පිළිවිත්.

එ සඳ බුදුහු "අඞ්ගුලිමාලය, හිංසා සඳහා සතුන් කෙරෙ පැවැත්විය යුතු යම් දඬෙක් ඇද්ද, ඒ හැම කල්හි පියා ක්‍ෂාන්ති මෛත්‍රියැ සිටි වන බැවින් මම් 'සිටියා' නම් වෙමි. මෙතෙක් දහස්[17] සතුන් මරණ තා ක්ෂාන්ති මෛත්‍රියැ නොසිටි වන බැවින් තො 'නොසිටියා' නම් වෙහි.[18] දැන් තො ඉරියවු විසින් සිටියෙහි ද, නිරයැ හො සිටිහි,[19] තිරිසන් යොනියැ හො ප්‍රෙත විෂයයෙහි හො අසුරකායයෙහි නො සිටිහි"යි[20] වදාළො.

එකල්හි අඟුල්මල් සොර[21] බුදුන් ගෙ දේශනා අසා "මෙවෙනි සිංහනාදයෙක් අනෙකක් හට වන්නෙ නොවෙයි. මෙ මහාමායා දෙවිය යුතු සිඬත් මහණ රජහුගෙ ගර්ජනා යැ.

---

[1] අභිභවමින් එයි
[2] හියවුරු, හියොහර, හියොහුරු හියෙර
[3] යන්නවුන්, වඩිනවුන්-මු
[4] බලපමණින්
[5] හඹා ගත නොහේද
[6] සිටිවයි සිටුවයි
[7] අන්තැ, අන්තයෙ, අන්ත
[8] යෙති
[9] ගන්වමි
[10] දක්වමින් යෙති
[11] දිවන, දුවන
[12] යන්නාහු
[13] යෙමි
[14] සිට සිට
[15] ස, හැම, සැහැ-මු
[16] සිටිහි
[17] දවස්
[18] වෙයි
[19] සිටියෙහි, සිටිහි
[20] සිටිහි, සිටුහි
[21] සොරහු

මම් තියුණු නුවණ ඇති සම්මාසම්බුදුන් විසින් දක්නා ලද බන්දෙමි.[1] බුදුහු යැ මට සඞ්ග්‍රහ සඳහා සඳහා මෙයට වැඩියහ"යි සිතා "දෙව්මිනිසුන් විසින් පුදන ලද බුදුරජ බොහො කලක් ගිය කලැ මට වැඩ සඳහා මෙ මහ වලට වැඩියැ. මෙතැන් පටන්-ගෙනැ පව් නො කෙරෙමි; තොපගෙ මියුරු කථා අසා යැ"යි තමාගෙ පඤ්චායුධ ප්‍රපාතයෙහි බහා-පියා බුදුන් වැදැ පැවිජි අයදි යැ. බුදුහු ඔහට එහි භික්ෂුභාවයෙන්[2] පැවිජි දුන්හ.

බුදුන් මොවුන් පැවිජි කරන කලැ "කර සෙවුව මැනවැ පාසිවුරු සෙවුව මැනැවැ" යන කිස[3] නැති. මොහු පූර්වයෙහි සිල්වත්නට[4] අටපිරිකර දුන් බව් දැනැ "එ,[5] මහණැ"යි දකුණත දික් කළහ. එ විගස ගිහිවෙස් අතුරුධන් වීයැ. මහණ වෙස් පහළ වී යැ. ඍද්ධිමය පා සිවුරු ශරීරයෙහි ප්‍රතිමුක්ත වියැ. මෙ මැ ඔහට[6] පැවිජි වි යැ. හෙ මැ උප සපත්කම්[7] වි යැ. එහි භික්ෂුභාවයෙන් උපසපන්නානට[8] සඟුන් ගෙ උපසපන්කම් ඇත්තෙ නොවෙයි.

මෙසෙ බුදුහු අඟුල්මල් සොරහු දමා මහණ කොටැ පා සිවුරු ගන්වා[9]-ගෙනැ සැරිසරමින් සැවැත් නුවර ගොස් දෙව්රම් වෙහෙර වැඩ වෙසෙති. එදවස් ඔවුන් මවු එ වනයට ගොස් අට ඉස්බක් පමණ තැනින් අන්තරික වැ "පුතැ අහිංසකය, කොහි සිටියෙහි? කොයි හුන්නෙහි? කොයට ගියෙහි? පුතැ, මා හා නො බෙණෙහි[10] නො?" යි කියමින් වැදැ ඇවිදැ නො දැක ගෙට ගියා.

එකල්හි මහාජනයො කොසොල් රජු ගෙ ගෙවද්දොර[11] රැ ස් වැ "මහරජ, තොපගෙ රට අඟුල්මල් නම් සොරෙකැ. දරුණැ. ලෙමඬු අත්[13] ඇත්තෙ යැ, සතුන් කෙරෙහි කුළුණු නැත්තෙ යැ. ගම් නොගම් කෙළෙ, නියම්ගම් නොනියම්ගම් කෙළෙ, දනවු නොදන වූ කෙළෙ, මිනිසුන් මරා ඇඟිලි විදැ මාලා කොටැ ධරයි. ඔහු වළකා"යි කියා මහා හඬින් හැඬුහු.

රජ නොඑක් වර "ඔහු ඇතැණියෙන් තිරු[14] කොටැ ගන්නෙ යැ"යි ඇතුන් දී යවී යැ. "අසැණියෙන් තිරු[6] කොටැ ගන්නෙ යැ"යි අසුන් දී යවී යැ. "රථණියෙන්[15] තිරු[6] කොටැ ගන්නෙ යැ"යි රථ දී යවී යැ. ඔවුන් ගොස් එ[16] වටා-ගත් කල්හි[17] ඔහු නැඟී "මම අඟුල්මල්මි' ශබ්ද කරන්නා හා[18] ආවුධ පෙරළන්නට නිසි එකෙකුදු නැති. හෙ හැමදෙනා කොටා මරයි. ඇත්හු වල්ඇත්[19] වෙති. අස්හු වල් අස් වෙති. රථ එහි මැ තිබී නස්සි. එකල්හි රජ මහජනාගෙ ගිගිරියෙන් "මා මැ ගිය මැනැවැ. ඉදින් සොර හට

---

[1] ලදුබනොමි, බන්දොමි
[2] එහි භික්ඛුභාවයෙන්
[3] කිසිත්
[4] සිල්වත්හට
[5] එව
[6] ඔහුහට
[7] උපසම්පත්කම්
[8] උන්නාහට, උපන්නානට
[9] ගෙන්වා
[10] බැණෙහි, බෙණෙහි
[11] ගෙවදුදොර, ගෙවදුන දොර, ගෙවදො, ගෙවදු, වත්දොර-මු
[13] ලෙමුසු ගත්
[14] තිරු
[15] රථැණියෙන්-මු
[16] එය
[17] එවාගත්කල්හි
[18] කරන්නාහ
[19] ඇත්තු

පරාජය වී නම්, ලුහුබැඳැ ගන්මි. ඉදින් මට පරාජය වී නම් සල්හු වැ පලායෙමි"[1] පන්සියයක් අසුන් සඳා-ගෙනැ සිවුරඟ සෙනඟ ගෙනැ සැවැත් නුවරින් නික්මැ සොරු කෙරෙ බිරි සිතින්[2] නොයාටි[3] වූයෙ ද ගරහනු බියෙන් යනුයෙ "බුදුන් දැකැ ගිය මැනැවැ"යි දෙව්රම් වෙහෙර ගියෙ. කුමක් සිතා ගියෙ යත්: "ගොස් බුදුන් වැඳැ එකත්පස් වැ හිඳිමි. 'කවර හෙයින් බැල[4] ගෙනැ නික්මුණුහි?[5]යි බුදුන් වහන්සෙ මා පුළුවුස්නා දැ යැ. එකලැ මම් කියමි. බුදුහු වනාහි මට හුදු පරලොවින් මැ සඞ්ග්‍රහ කරන්නාහු නොවෙති. මෙලෙව් නුදු සඞ්ග්‍රහ කෙරෙත් මැ යැ. ඉදින් මට ජය වෙ නම්. ගිවිසැ නොබැණැ වැඩහිඳිනා දැ යැ. පරාජය වෙ නම්, "මහරජ, එක් සොරකු සඳහා තා ගිය මනා නොවෙ'යි වදාරන දැ යැ. එකලැ මහජනයො 'රජ සොරු නසන්නට යන්නෙ බුදුන් විසින් නවත්නා[6] ලද' යනු දන්ති. එසෙ වන්නා හා මා නොගරහති" යන සිතින් වෙහෙර ගියෙ, ගොස් බුදුන් වැඳැ එකත්පස් වැ හුන්නෙ යැ.

එකල්හි බුදුහු "කිම, මහරජ, තට **බිම්සර** මහරජ කුපිත වි යැ හො? **විසාලා** මහනුවර වැසි **ලිච්ඡවි** රජහු කුපිත වූහ. හො? සෙසු ප්‍රතිපක්‍ෂ රජ කෙනෙක් කුපිත වූහ.[7] හො?" වදාළහැ. "වහන්සෙ, මට දැහැවි රජ කෙනෙක් ඇත්තාහු නොවෙති. මාගෙ රට **අඟුල්මල්** නම් සොරෙකැ, උහු ගන්නට යෙමි"කී යැ. එකලැ බුදුහු "ඉදින් මහරජ, තො **අඟුල් මල්හු**[8] කෙහෙ බහා සිවුරු හැඳැ පෙරෙවැ පැවිජි වැ පණිවා ඈ පවකැමින් විරත වැ[9] එක් වෙලෙ වළඳා බඹ[10]සරවස් රැකැ සිල්වත් වැ කලණදහම්[11] පුරා වසන්නහු[12] දිටිහි නම්, උහුට කුමක් කෙරෙහි?" යි වදාළහැ. "වහන්සෙ, ඇප්[13] උන් වඳම්හ.[14] දුටු කලැ හුනස්නෙන් නැඟෙම්හ. හිඳුනා අසුන් දෙම්හ. සතර පසයෙන් උපස්ථාන කෙරෙම්හ"යි[15] කී යැ. කියා තබා "බුදුහු ඔහුගෙ උපනිඃශ්‍රය බලා උහු ඇරැ පැවිජි කළාහු වුහු නම්, යහ යැ"යි[16] සිතා බුදුන් පිරික්සනු සඳහා "වහන්සෙ, එ දුසිල් පවිටිහට[17] මෙබඳු සීලසංයමයෙක් කොහි වෙදැ!"යි කී යැ. එසමාහි අඟුල්මල් මහතෙරහු බුදුනට නුදුරු තන්හි වැඩහුන්නාහ.[18] බුදුහු දකුණත නඟා "මහරජ, මෙ **අඟුල්මලැ**"යි වදාළහ.

එ සඳ **කොසොල්** රජ බිය පත් වැ වෙවුළා 'ගියෙ. තුබු මහජනයො බිය පත් වැ කඩු පලඟ දමා-පියා එ එ දසායෙහි[19] හි පලා නුවර වැදැ දොර පියා-ලා අගුළු ගෙනැ අටල්ලට නැඟී බලමින් සිටියාහු[20] "**අඟුල්මල්** සොර 'රජ මා කරා එ[21]' යනු දැනැ පළමු අවුදු දෙව්රම් හි හුන්නෙ යැ, රජු[22] ගත, ඇපි පලා ආවාමො[23] දිවි ලදුම්හ"යි කීහු. බුදුහු රජ හට භය උපන් බව් දැනැ "නොබව, මහරජ, නොබව, මහරජ, මෙ දැන් කිහිඹියකු දු දිවි නොගළවයි. මුහු කෙරෙන තට භය නැති" වදාළො.

---

[1] සොරහට පරාජය වී නම් සල්හුවැ පලායෙමි, (පලාඑමි)
[2] හයින් සිතන්නෙ, බිරින්සිතින්
[3] නොයටි.
[4] බල, බලා
[5] නික්මුණුහු-මු
[6] නවතන-මු
[7] කුපිත වූවා නොයි
[8] අංගුලිමාලයා
[9] විතරවැ, විතවැ
[10] බිම්සර
[11] කලණධම්
[12] වසන්නාහු
[13] අපි
[14] වඳිම්හ
[15] කරම්හයි
[16] යහපතැයි
[17] පවිටුහට
[18] වැඩහුන්නහ (-හුන්නහු)
[19] දසයෙහි
[20] සිටියාහ
[21]එයි, ඒල-මු,
[22] රජ
[23] ආවමො

බුදුන් මෙසෙ වදාරත් මැ රජ හට භය සන්හින. රජ අඟුල්මල් මහතෙරුන් කරා එළඹැ "වහන්සෙ, අඟුල්මල් දැ යැ හො?"යි කී යැ. "එසෙ යැ මහරජ" යි කී යැ. රජ පැවිජියනට දරුණු කැමින් ලද නම් කියනු නො යෙදෙයි. මවුපියන් ගෙ ගොත් විසින් බැවැහර[1] කරනු මැනැවැ"යි සිතා "වහන්සෙ, තො පියෙ කවර? මවු කවර?"යි පිළිවිත. "මහරජ, මා පියෙ **හර්ග**[2] නම් බ්‍රාහ්මණ යැ. මවු **මන්තාණි** නම් බ්‍රාහ්මණි යැ"යි කීහු. "වහන්සෙ, අප වත්හිමියො **හර්ගයො**[3] **මන්ත්‍රාණි** පුත්‍රයො සස්නෙහි අභිරත වෙත්ව යි, මම සතර පසයෙන් උපස්ථාන කෙරෙම්ව"යි කී යැ. කියමින් මැ බඩැ බඳ සළුව ඇරැ-ගෙනැ මහතෙරුන් පාමුලැ තිබී යැ. මහතෙරහු තමන් තෙළෙස් ජුහඟ[4] සමාදන් වැ පහුල් සිවුරු[5] පොරෝනෙන් "මහරජ, තුන් සිවුරු සැපිරැ[6] ඇතී" කීහ. රජ බුදුන් කරා එළඹැ වැඳැ එකත්පස් වැ හිඳැ "ආශ්චර්යය යැ! වහන්සෙ, අද්භූත යැ! වහන්සෙ, යම්තාක් අදාන්ත සතුන් දමන දැ යැ. අශාන්ත සතුන් සන්හිඳුවන දැ යැ. නොපිරිනිවී සතුන් කෙලෙස් පිරිනිවනින් නිවන දැ යැ. වහන්සෙ, ඇපි දඬියෙනුදු සැතිනුදු සතුන් දමන්නට නො හැක්කම්හ. වහන්සෙ සතුන් නොදඬියෙන් මැ නොසැතින් මැ දමන දැ යැ වහන්සෙ, අපි යම්හ. බොහො කාර්යය[7] ඇත්තම්හ"යි කී. "කල් දැනැ, මහරජ" යි වදාළහැ. රජ බුදුන් වැඳැ පැදකුණු කොටැ ගියෙ.

මහතෙරුන්[8] කුලගම් සිඟන්නට ගිය කලැ මිනිස්සු ඔවුන් දැකැ වෙවුළත් මැ යැ. පලත් මැයැ. දොරපියා-ලත් මැ යැ. ඇතැම්හු අඟුල්මල් නම[9] අසමින් මැ පලා වලට හො වදිති.[10] ගෙට වැදැ දොර පියා-ලා අගුළු හො ගන්ති. පලා නොයා හෙන්නාහු පිට් පෑ සිටුති.[11] මහතෙරහු එවක්[12] හඹු දූ කෙණෙස්සක් බතු දූ නො ලැබෙති. අහරින් ක්ලාන්ත වෙති. අහර නොලබන්නාහු "නුවර නම් සර්ව සාධාරණයැ"යි නුවරට වදිති.[4] යම් දොරෙකින් වන්හු ද, එහි මිනිස්සු "අඟුල්මල් අය" යි කළ[13] දහස් බිඳිමින් පලත්. එක් දවසක් අඟුල්මල් මහතෙරහු පෙරවරු පා සිවුරු ගෙනැ සැවැත් නුවර වැදැ, සපදන්සැරි වන බැවින්, ගෙපිළිවෙලින් කෙණෙසි අහර සිඟන්නාහු මූඪගර්භ වැ නො වැදිය[14] හෙන මාගමක දැකැ කරුණායෙන් කම්පිත වූහු ඔවුන් පෙරැ එකක්හු[15] උනු දහසක් මිනිසුන් මරන්නානට එක දවසකුදු කුළුණු නො උපන. මූඪගර්භ මාගම දුටු පමණින් කුළුණු කිසෙ උපන යත්: පැවිජි බලයෙන් උපන්.

එකල්හි අඟුල්මල් මහතෙරහු අහරකිස කොටැ බුදුන් කරා එළඹැ වැඳැ එකත්පස් වැ හිඳැ "වහන්සෙ, සැවැත් නුවරැ කෙණෙහි අහර සිඟනුයෙම් මූඪගර්භ මාගමක දිටිමි. ඇය විඳුනා[16] දුක් මට නුරුස්සී" කීහ. "එසෙ බැවින් තො ඇයදරා ගොස් 'මා උපන් තැන් පටන්-ගෙනැ දැනැ සතක්හු දිවි නො ගැළවී[17] නම් එ සයින් තිට දූ ගබට දූ සෙත් වෙව'යි සස්[18] කරා"යි වදාළො. "වහන්සෙ, හෙ මට මුසවා වෙයි. මා විසින්

---

1 පියො දවරහ
2 භාර්ගව
3 භාර්ගවොය
4 ධූතාංග දුහ(ව) ඟ
5 පවුල්සිවුරු
6 තුන්සිවුරු ඇති
7 කාරිය
8 මහතෙරුන් වහන්සේ
9 අඟුල්මල් නම් නම
10 වදති
11 පිටි(ටු) පා සිටිති
12 සරළුවක්
13 අයයි අසත්, කළහදස් ගණන්
14 වැදහෙන, වැද්දහෙන-මු
15 විදිනා
16
17 නො ගැළවීම නම්
18 සත්

බොහො සත්හු දැනැ මරන ලදහ"යි කීහු. "අඞ්ගුලිමාලය, හෙ තා ගිහිමිනිස් කලැ. ගිහිමිනිස්හු නම් සතුන් මරනු ආදි කෙරෙති. දැන් තට ආර්ය නම් ජාතියෙක් ඇති එසෙ බැවින් තො 'මා උපන් තැන් පටන්-ගෙනැ යැ'යි කියන තැනැ කුකුස් ඇති විහි නම්, ආර්ය ජාතියැ උපන් තැන් පටන්-ගෙනැ යැ' කියා"යි නඟා යවුහු.

මහතෙරහු "මැනැවැ වහන්සෙ" යි එයට ගොස් "තමන් සස් කොටැ සෙත් කරන්නට ආ පරිදි කියා"යි යවුහු. මිනිස්හු වටා ජවනිකා බැඳැ මහතෙරනට ජවනිකායෙන් පිටතැ පුටුවක් තුබූහ.[1] මහ තෙරහු ඉහි වැඩහිඳැ "මා ආර්ය ජාතීන් උපන් තැන් පටන්-ගෙනැ දැනැ සතක්හු දිවි නො ගැළවී නම් එ සයින් තිට දූ ගබට දූ සෙත් වෙව"යි සස් කළහ. පසක් තෙපුල් හා සමඟ ඩබරායෙන් ගුළු දියක්[2] සෙයින් දරු නික්මිණි. දිපිත්[3] මවුනට සෙත් වී.

මහතෙරුන් හිඳැ සස් කළ තන්හි පිළක් කළහ. මූඪ ගර්භ වූ තිරිසන් ගතියැ සත්හු දු ඇරැ එහි හොවති. එ විගස මැ සුවයෙන් බර මුසිත්. යමක්[4] දුර්බල ද, ගෙනැ එන්නට නොහැකි ද, ඇයට පිළ දෙවි දිය ඇරැ හිසැ ඔත් කලැ එකෙණෙහිම බර මූසී. සෙසු රොග ද සන්හිඳී.[5] මෙ කප සිටුනා පෙළහරයි.

කිම හො බුදුහු මහතෙරුන් ලවා වෙදකම් කරවූවා වෙති හො! යත්ඃ එසෙ නොවෙයි. කිසෙ යැ යත්ඃ මහතෙරුන් දැකැ මිනිස්සු බා පලති. ඔහු කෙණෙසි අහර නොලදින් ක්ලාන්ත වැ මහණුවම් කරන්නට නොනිස්සහ.[6] මෙසෙ වන්නා හා "දැන් අඟුල්මල් මහතෙරහු මෙත්සිත් පිළලදින් සස් කොටැ මිනිස්නට සෙත් කෙරෙති"යි මිනිස්හු මහතෙරුන් නොබා එළැඹියටි වෙති. එකල්හි අහරින් ක්ලාන්ත නොවැ[7] මහණුවම් කරන්නට නිසි වෙත්. එයින් බුදුහු ඔවුන් කෙරෙ අනුග්‍රහයෙන් සත්‍යක්‍රියා කැරැ වූහ. සස් කොටැ සෙත් කරනු වෙද්දම්[8] නොවෙ. මහතෙරුන් "මහණුවම් කෙරෙමි"යි කමටහන් ගෙනැ උන් කල්හි අට වියෙහි මිනිසුන් මැරු තැන් මැ පහළ වෙයි. "වහන්සෙ, දුගීමි. බොහො දරුබිළිඳුන් ඇත්තෙමි. මට දිවි දෙව"යි මරණ බියෙන් වලප්නා පරිදි දු, අත් පා සපන[9] පරිදි දු, ආපාතයට එයි. ඔහු විපිළිසර[10] ඇති වැ හුන් තැනින් නැඟි යෙති. එයින් බුදුහු ඔව්නට එ ජාතිය අබ්බොහාරික කොටැ "එසෙ වන්නා හා මෙ විදර්ශනා වඩා රාත් බව ගන්නි"යි පැවිජි වූ තැන් මුල් කොටැ ආර්ය ජාතීන් සත්‍යක්‍රියා කැරැවූහු.

එකල්හි අඟුල්මල් මහතෙරහු නොපමා වැ මහණුවම් කොටැ රාත් වූහ. මහතෙරුන් කෙණෙසි අහර සිඟන්නට නුවර වන් කල්හි කපුටු බලු ආදීන් නෙරනා සඳහා වටා හීසනක්[11] පමණ තන්හි යම් කවර දිශාභාගයෙකින් දමා-ලූ දඬු පහණ හකුරු අවුත් මහතෙරුන් මැ වෙරැ හෙයි. ඔහු මහසම් සිඳී ඇට දක්වා බුන් ඉසින් ලෙස වගුරුවමින් බුන් පා ඇති වැ හිණැ. හිරුණු සිවුරු ඇති වැ බුදුන් කරා ගියාහැ. බුදුහු ඔවුන් දැකැ "බ්‍රාහ්මණය, අධිවාසනා කරා. බ්‍රාහ්මණය, අධිවාසනා කරා. යම් කමක්හු ගෙ

[1] තිබූහ
[2] දියයක්, දියත්තක්
[3] දිපතමවුනට, දිපුතුමවුනට-මු
[4] යමක්හු
[5] සන්හිදිණැ සන්හින්දි-මු
[6] නොරිස්සහ
[7] ක්ලාස්ත නොවෙති
[8] වෙත්දදැම්, වෙදදහම් වෙදහම්-මු
[9] සිපන
[10] විපිළිසර
[11] හිසක්, හීයක්

විපාකයෙන්[1] සසර සිටියහොත් නොඑක් වා දහස් සුවහස් නිරයැ පස්හි[2] එ කම්හු ගෙ විපාක තො මෙ අත්බැවැ විඳිහි"[3] වදාළො.

මෙහි සත් ජවන්සිත්හි කුසල් වැ හො අකුසල් වැ හො උපන් පළමු ජවන් සිත් මෙ මැ අත්බැවැ විපාක දෙයි. මෙ අත්බැවැ විපාක දෙන්නට නොපොහොසත් වී නම්, විපාක නොදෙන බවට පැමිණෙ.[4] සත් වන ජවන් සිතින් අනතුරු අත්බැවැ විපාක දෙයි. අනතුරු අත්බැවැ විපාක දෙන්නට නොපොහොසත් වී නම්, වටාලා විපාක නොදෙන බවට පැමිණෙ. එ දෙදෙනා අතුරෙහි පස් ජවන් සිත් අනාගතයෙහි යම් කලෙකැ අවකාශ ලද නම්, එ කලැ විපාක[5] දෙයි. සසර සිටුනා තාක්[7] කලැ විපාක නොදෙන බවට නොපැමිණෙ මෙ කර්මයන්ගෙ විභාග **ධර්ම ප්‍රදීපිකා** නම් **මහාබොධිවංශ පරිකථා**යෙන් දන්නෙ යැ. මෙ බුද්ධ ධර්මයැ. මෙ බුද්ධ චරිතයැ.

මෙ මහතෙරනට වූ කල[7] අනතුරු අත්බැවැ දු අනාගතයෙහි යම් කලෙකැ දු විපාක දෙන කර්මයො රාත් මැගින් කැඩුණහ. මෙ අත්බැවැ විපාක දෙන කර්ම[8] වූ කල රාත්බවට පතානට ද[9] වෙ. එයින් එ වී. එ කල්හි **අඟුල්මල්** මහතෙරහු රහොගත වැ වැඩහිඳ ඵලසමවත් සුව විඳැ එයින් නැඟී බුදුන් තම හට වහල් වුසෙ සිතා සොම්නස් වැ උදන් අනන්නාහු-

"දණ්ඩෙනෙකෙ දමයන්ති - අඞ්කුසෙහි කසාහි ච,
අදණ්ඩෙන අසත්ථෙන - අහං දන්තොම්හි තාදිනා"

යනාදි ගාථායෙන් උදන් ඇනුහු.

මෙසෙයින් බුදුහු තමන් 'පුරිසදම්මසාරථී' වන බැවින් අඟුල්මල් සොරහු දු[10] ආදි ශබ්දයෙන් ගත් **සඞ්කිච්ච** නම් හෙරණපාණන් අතැවැසි පන්සියක් සොරුනුදු **අතිමුත්තක** නම් හෙරණපාණන් ඇතැවැසි පන්සියක් සොරනුදු **බාණු කොණ්ඩඤ්ඤ** නම් මහතෙරුන් අතැවැසි පන්සියක් සොරු නුදු **කෙළදරුවන් කෙළකන්සුණු**[11] මහතෙරුන් අතැවැසි නවසියක් සොරුනුදු මෙ ඇ නොඑක් සිය නො එක් දහස් සොරුන් දමා අමා මහනිවන් පැමිණිවූහු.

**අඟුල්මල්දමන නම් සත් වන පරිච්ඡේදය නිමි.**

## 8. පරිබ්‍රාජකදමන නම් පරිච්ඡේදය

---

[1] විපාකයෙන්
[2] පස්සී, පසයි
[3] විනාහි, විහි
[4] පමුණුවයි
[5] විපාකඵල
[6] තෙක්
[7] වුකල විපාක නොදෙන බව-ඇතැම්
[8] කළකර්ම
[9] ප්‍රාර්ථනාවට, ප්‍රාප්තයනට-මු
[10] සොරහුද් දමා
[11] කෙළරුවන් කල (කළ), කෙළරුවන්කසුබු

**සභිය** නම් පරිබ්‍රාජකයා දැමූ පරිදි කිසෙ යැ යත්: එක් සමයෙක්හි බුදුහු රජගහා නුවර නිසා ගන නිල් වෙළු වෙනෙන් පරිබෙව්[1] ලද වන බැවින් **වෙළුවන** නම් ලද අටළොස්හත් පවුරු හා දොරොටු[2] ඇති පරමරමණීය වූ උයන්හි වැඩ වෙසෙති. එකල්හි **සභිය** නම් පරිබ්‍රාජකයෙක් ගොස් බුදුන් පැන පිළිවිත්.

එ කිසෙ යැ යත්:

පෙරැ **කසුබුසම්මාසම්බුදුන්** වහන්සෙ නොඑක් කප්කෙළ සුවහස් මතුයෙහි පැරුම් පුරා අවුදු **තුසීපුරෙහි** ඉපිදැ[3] දස දහස්ලොධාහි දෙව්බඹුන් ගෙ අයජමෙන් මිනිසුන් විසිවා දහසකට ආ ඇති කල්හි, **තුසීපුරෙන්** සැවැ **බරණැස්** නුවරැ **බ්‍රහ්මදත්ත** නම් බමුණා පිණිස **ධනපති** නම් බැමිණිය කුසැ පිළිසිඳ ගෙනැ දස මස් ඇවෑමෙන් **ඉසිපතන්** උයන්හි මවු කුසින් නික්මැ ගොත් විසින් **කසුබු**[4] නම් වැ **හංසවත්** නම් **යශොවත්** නම් **ශ්‍රීනන්දන**[5] නම් තුන් පහයැ අට සාලිස් දහසක් නළුවන් පිරිවරා දෙ වාදහසක් ගිහිගෙයි වාස[6] කොටැ අග මෙහෙසුන් **සුනන්ද** නම් බැමිණිය **විජිතසෙන** නම්[7] පුතකු ලද කල්හි, සතර නිමිත්ත දැකැ "මහබිනික්මන් කෙරෙමි" යි සිතූ විගස පහය අහසට[8] නැගි මහජනා නුවන් මන[9] වුලුඹු මින් ගොස් නුග මහබො ඇතුළු කොටැ බිමැ පිහිටි කල්හි, පහයින් නික්මැ පැවිජී වැ, නළුගණා පහයින් බැසැ[10] අඩ ගව්වක්[11] පමණ තැන් ගොස් සහපිරිවරින් කඳවුරු[12] බැඳැ හුන් කල්හි, තමන් අනු වැ පැවිජී වූ කෙළක් පමණ දෙනා[13] පිරිවරා සතියක් පධන්හි සැරැ **සුනන්ද** නම් බැමිණිය දුන් මීපිඬු වළඳා **කිහිරිවනයෙහි**[14] දිවාවිහාර කොටැ, සවස්හි **සොම** නම් යවපාලයක් හු දුන් අට මිටක් කුසතණ ගෙනැ නුගරුක් මුලට එළබැ තුන් යලක් පැදකුණු කොටැ පසළොස් හත් තණ පළඟ මතුයෙහි පැදුන්ලොධා බලා වැඩහිඳැ **මාර** විජය කොටැ **සම්මාසම්බුදු** වැ උදන් අනා සත් සතිය ගළවා[15] **මහබඹහු** ගෙ අයජමෙන් අහසින් ගොස් **ඉසිපතන්හි** දම්සක් පවත්වා කෙළදහස් දෙනා සසර මුහුදින් නඟා **තිස්ස**[16] නම් **භාරද්වාජ** නම් දෙ අගසව්වන්[17] හා **සර්වමිත්‍ර** නම් අගඋවටා මහතෙරුන් හා **අනුලා** නම් **උරුවෙලා** නම් දෙ අගසැවුන් හා සමඟ අනෙදහස් සඟුන් පිරිවරා නොඑක්දහස් මිණිදඬුවැට පහන් මැදැ දිලියෙන පහන්රුකක් සෙයින් වොරජමින් සැරිසැරැ [18]දහම්වාරෙ වස්වා කෙලෙස්රජසළා සන්හිඳුවා සොළොස්වාදහසක් සිට **කසීරට** **සෙතව්‍යපුර** නම් නුවර අබියෙස්හි **සෙතව්‍යවන** නම් උයන්හි අනුපාසෙස්නිවන්ධයින් පිරිනිවියාහ. ධාතු නොසුන් වැ කසුන් කඳක් සෙයින් සිටියෙ යැ.

සියලු දඹදිව් වැස්සො රැස් වැ ගන රන් උළුයෙන් යොදුන්[19] අස්[20] දාගබ්[21] බඳහ.[22] මෙසෙ රුවන්දාගබ පිහිටි කල්හි කුලදරුවො සත් දෙනෙක් බුදුසස්නෙහි මහණ වැ

---

[1] පිළිබෙම්
[2] දොරටු
[3] උපැද
[4] කසුබ්
[5] ශ්‍රීනන්දා ශ්‍රිනිදා
[6] ගිහිගෙයි වැස
[7] විජනසෙන
[8] පහයට නැඟී
[9] මනනුවන්
[10] බා
[11] දෙගවු, දෙගව්වක්
[12] කඳයුරු
[13] කෙළක්දෙනා
[14] කිහිරුවනයෙහි
[15] ගළපා
[16] තිස්
[17] සවුන්, සැව්වන්-මු
[18] සැරිසරා
[19] යොදුනක්
[20] උස
[21] දාගබක්
[22] බැන්දුහ,

සර අනුරු[1] කමටහන් ගෙනැ පසන්[2] දනවු ගොස් වලැ මහණු වම් කරන්නාහු අතුරතුරෙහි බණ අසන්නට නුව එති. ආවාහු සඟුන් ගෙ පිළිවෙත් නොපෙළහර[3] සෙ දැකැ "සස්න අතුරුන් නොවන තුරු අපට පිහිටි කොටැ ගත මැනැවැ"යි රුවන්දාගබ වැඳැ අරණ්‍යයට[4] වැදැ එක් පර්වතයක් දැකැ "දිවියෙහි ආශා ඇති කෙනකුන් නවත්නෙ. නැති කෙනකුන් නැඟෙන්නෙ යැ"යි හිණි බැඳැ හැම දෙන මැ පර්වතයට නැඟී හිණ හෙළා-පියා මහණුවම් කොළො.

ඔවුන් කෙරෙහි මහලු මහතෙරහු තමන් උපනිඃශ්‍රය ඇති වන බැවින් එ මැ ආ රැ රාත් වැ සෘද්ධීන් හිමව්වට ගොස් නුතන්දහතෙළෙහි මුව දෙවැ නාලිය දැහැටු වළඳා උතුරු කුරුදිව් ගොස් බත්කිස නිමවා පා පුරා අහර හා නුතත් පැන් හා නාලිය දැහැටු ගෙනැ ඔවුන් කරා අවුදු, "ඇවැත්නි, මෙ උතුරුකුරුදිවින් අළ බත. මෙ හිමවියෙන් අළ දිය දැහැටැ. මෙ දියෙන් මුව දෙවැ මෙ දැහැටු කා මෙ අහර වළඳා මහණුවම් කරවු. මෙ සෙයින් මම් තොපට හැම කල්හි උපස්ථාන කෙරෙමි"යි කීහ. "වහන්සෙ, පළමු යම් කෙනෙක් රාත් වුහු ද, ඔවුන් අළ අහර වළඳා මහණුවම් කරම්හ යි මුලැ අප කළ ව්‍යවස්ථායෙක් ඇද්ද?"යි කීහ. "නැති ඇවැත්නි," කීහ. "ඉදින් ඇපි දු තොප සෙ මැ නිපන්නමො නම්, ඇපි මැ ඇරැ වළඳම්හ[5]" යි නො ගිවිස්සහ.

අනෙක් දවස් වැළත මහතෙරහු[6] අනාගාමි වැ එ සෙයින්ම මැ අහර හා දිය දැහැටු ගෙනැ අවුදු වළඳා මහණුවම් කරන්නට කීහු. "වහන්සෙ, මහලු මහතෙරුන්[7] අල අහර නො වළඳා අනුතෙරුන් අළ අහර වළඳම්හ යි මුලැ අප කළ ව්‍යවස්ථායෙක් ඇද්ද?" යි[8] කීහ. "නැති, ඇවැත්නි," කීහ. "ඉදින් ඇපි දු තොප සෙ මැ නිපන්නමො නම්, ඇපි මැ ඇරැ වළඳම්හ" යි නො ගිවිස්සහ. අනෙක් අනෙක් දවසුදු අවුදු එ සෙයින් ඔවුන් අයජනා[9]සෙ දැකැ, "වහන්සෙ, මොබ හා කරන කථාමාත්‍රයෙකුදු[10] අපට ප්‍රපඤ්ච යැ. මෙසෙ ද වඩනෙ කුමට දැ"යි කීහ. ඔහු යම් කවර පරියායෙකින් ඔවුන් නො ගිවිස්සියැ හී නැඟී වැඩියහ.

ඔවුන් කෙරෙ රාත් වූ මහතෙරහු පිරිනිවියාහ. අනාගාමි වූ මහතෙරහු සුදවස්[11] නම් බඹතෙලෙහි උපන්හ. තුබු පස් දෙන කිසි විශෙෂයක් නො ලදින් වියැළී සත් වන දවස් මියැ කමවජරි[12] දෙව්ලොව්හි උපැද[13] සදෙව්ලොවැ අනුලොම් පිළිලොම් විසින් දෙව්සැපත් වළඳා මෙ[14] බුදුරජයෙහි දෙව් ලොවින් සැවැ එකෙකි කුලගෙහි[15] උපන්හු. ඔවුන් කෙරෙහි එක් කෙනෙක් පොක්සි මහරජ වූහ. එක් කෙනෙක් කුමර

[1] සැරඅනුරු, සාර අනුරු
[2] පසත්
[3] පැළහර
[4] අරණ්‍යපුරයට
[5] නම්..... අහර වළඳම්හයි
[6] මහලු මහතෙරහු
[7] මහතෙර
[8] ඇත්තේ දැයි
[9] අවජනා
[10] කථායෙකුදු
[11] සදසතු, සුසත, සුදස්ස
[12] කාමාවචර, කම්වජරි
[13] ඉපද
[14] මෙබව
[15] ඒ ඒ කුලෙහි-මු

**කසුබු** මහතෙර වූහ. එක් කෙනෙක් **දරුචීර**[1] මහතෙර වූහ. එක් කෙනෙක් **දබ්මලුපුත්**[2] මහතෙර වූහ. එක් කෙනෙක් **සභියපරිබ්‍රාජක** වූහ. එහි **සභිය**, පරිබ්‍රාජිකාවක කුසැ පිළිසිඳ ගත්

කිසෙ යැ යත්:

හො එක්තරා රජදුවකැ. ඇය සමයාන්තර උගන්වනු සඳහා එක් පරිබ්‍රාජකයක් හට දක්වා දුන්හු. ඔහු අතැවැසි පරිබ්‍රාජකයෙක් ඇය හා සසඟ[3] කෙළෙ. හො එයින් ගබ් ගත.[4] ඇය දැරි ඇතිසෙ[5] දැකැ පරිබ්‍රාජකයො නෙරැ-පීහ. හො අනෙක් තැනෙකැ යන්නී, අතර මඟැ සභායෙකැ වැදුව.[6] එයින් ඔව්හට **සභිය** නම් කළා. **සභිය**, තමා විය පත් කල්හි පරිබ්‍රාජක පැවිජියෙහි පැවිජි වැ නොඑක් වාද[7] උගෙනැ 'මා හා වාද කරා'යි.[8] සියලු දඹදිව් තෙලෙහි ඇවිදුනෙ, තමා හා සුදුසු වාදියකු[9] නොදැකැ නුවරදොරැ ආශ්‍රමපදයක් කරවාගෙනැ රජකුමරු ආදීන් හික්මවමින් එහි වෙසෙයි.

එකල්හි බුදුහු දම්සක් පවත්වා අනුක්‍රමයෙන් **රජගහා** නුවර අවුදු **වෙළුවන** උයන්හි වැඩැ වෙසෙති. හෙ බුදුන් උපන් බව නොදන්නි. එකල්හි පෙරැ උහු හා ගල් නැඟී මහණුවම් කළ සුදවස් වැසි මහබඹ, සමවතින් නැඟී "මම් මෙ සුව කා ගෙ ආනුභාවයෙන් ලදිම් හො!" යි බලනුයෙ **කසුබුසම්මාසම්බුදුන්** වහන්සෙගෙ සස්නෙහි මහණුවම් කළ පරිදි දූ එ සබඳුනුදු සඳහන් කොටැ, "එක් කෙනෙක් පිරිනිවියහ. තුබුවො දැන් කොහි යැ හො!" යි අවජනෙ. දෙව්ලොවින් සැවැ දඹදිවැ උපන් බව් දැනැ "ඔවුන් කෙරෙහි **සභිය**, බුදුන් උපන් බව නොදන්නි. ඔහු බුදුන් කරා යන පරිද්දක් කළ මැනැවැ"යි විසි පැනයක් සිතා ගෙනැ රෑ අවුදු අහසැ සිටැ "**සභිය**, **සභිය**," යි කැඳවී. හෙ නිදමින් හොත්තෙ, තුන් යලක් එ හඬ අසා නික්මැ දිලියෙන මහබඹහු දැකැ ඇඳිලි බැඳැ සිටියෙ යි. එ සඳැ එ බඹ, "**සභිය**, මම් තට විසි පැනයක් අළම්, එ උගනැ"යි කියා විසි පැනය කී. පරිබ්‍රාජක මහබඹහු කෙරෙහි විසි පැනය පිළිවෙලින් එකවටින් මැ උගත.[10] එමැ මහබඹ **කුමරකසුබු** මහතෙරනට පසළොස් පැනය කීවා සෙයින් මැ විසි පැනය උහුට කියා, **දරුචීර** මහතෙරනට කීවා සෙයින් බුදුන් උපන් පරිදි නො කියා, "මෙහි අර්ථ සොයන පරිබ්‍රාජක, තෙමෙ මැ බුදුන් හැඳිනැ-ගන්නි. මෙයින් පිටත් මහණ බමුණන් සිස් බව් දන්නි" යන සිතින් "**සභිය**, යම් මහණෙක් හො බමුණෙක් හො තා මෙ පැන පුළුවුත් කලැ විසැජුයෙ[11] වී නම්, තො උහු කෙරෙ බ්‍රම්සර[12] වස්සරා"යි කියා බඹලො ගියෙ.

එකල්හි **සභිය** පරිබ්‍රාජක, දඹදිවැ ප්‍රසිද්ධ වූ බොහො, දෙනා විසින් සම්මත වූ පන්සිය පන්සිය ශිෂ්‍යපරිවාර ඇති **පූරණකස්සප** යැ, **මක්ඛලිගොසාල** යැ, **අජිතකෙසකම්බල** යැ, **පකුධකච්චායන** යැ, **සඤ්ජයබෙලට්ඨිපුත්‍ර** යැ, **නිගණ්ඨනාථපුත්‍ර** යැ යන "සව්නෙ ගෙවා දත්මහ, බුදුම්හ"යි පිළින කරන නුවටැජරන් සදෙනා කරා ගොස් පැන පුළුවුස්සී. එහු එ පැන නො විසැජියැ හී ක්‍රොධ කොටැ ඇහැවැ උහු මැ පුළුවුස්ති. හෙ

---

[1] දාරුචීවර
[2] දම්පල්පුත්තිස්-හැම
[3] සමඟ
[4] ගබ ගත්
[5] දැරියසෙ
[6] වැදැව
[7] වාදහස්
[8] මහාවාද කරයි-මු
[9] වාදයක්, වාදියක්
[10] ඉගෙන
[11] විසදුයෙ
[12] බ්‍රහ්මසර, බ්‍රම්හම්සර

ඔවුන් සිස්සෙ දැකැ යම් තැනෙකැ සාරයක් නො දැකැ "ගිහිමිනිස් වැ පස් කම්ගුණ අනුභව කළ මැනැවැ"යි සිතී. එක්බිති "මහණ ගොයුම් සාධුජනයන් විසින් සම්මත යැ. ඔහු කරා ගොස්[1] පැන පුළුවුස්මී" සිතී.

එක්බිති "මෙවැනි මහලු සම්දරු වැ සිටි නුවටැජරන් නො විසැජු පැන ළදරු මහණ ගොයුම් මැ කුමක් විසජා!" යි සිතී. එක්බිති විතක්විසී නොවැ වැළිදු පිරික්සනුයෙ "මහණුන් දරුවහ යි[2] අවඥා නොකළ මැනැවැ. ඔහු දු මහත් සෘද්ධි ඇති වෙති. මහත් අනුභාව ඇති වෙති.[3] මහණ ගොයුම්හු කරා ගොස් මෙ[4] පැන පුළුවුත මැනැවැ"යි අනුක්‍රමයෙන් සැරි සරමින් රජගහා නුවර ගොස් වෙළුවන වෙහෙරැ බුදුන් කරා එළබැ සාමීචි කොටැ එකත්පස් වැ හිඳැ බුදුන් ගෙ රූප සම්පත්තීන් හා උපශමසම්පත්තීන් හැඟෙන සර්වඥභාවයෙ බුහුමන් කොටැ සත්හුන් සිත්

[1] ගොසින්
[2] දරුවන්හයි
[3] ඇති
[4] මෙසෙ

ඇති වැ පැන පුළුවුස්නට අවසර ගත්. එ සඳ බුද්හු "සභිය, නො පැන විසජනුවන් සොයා සත් සියක් යොජුන් තැන් ඇවිදැ දුරැ සිටැ ආයෙහි. තා කැමැති දැයක් පුළුවුස. මම් එ කියම්" සර්වඥ පවරුණෙන් පැවරූහ. එකල්හි සභිය පරිබ්‍රාජක විස්මිත වැ "සෙසු මහණ බමුණන් කෙරෙ මෙ පමණ අවකාශයකුද් නො ලද්මි"[1] සතුටු වැ විසි පැනය පිළිවෙලින් පිළිවිත. බුදුහු නිරවශෙෂයෙන් වීසැජූහු. පරිබ්‍රාජකයා පැන පුළුවුත් පරිදි දු බුදුන් පැන විසැජූ පරිදි දු **සුත්තනිපාතයෙහි සභියසුතින්** දන්නෙ යැ.

එකල්හි **සභිය** පරිබ්‍රාජක කැපෙන සැතෙකින් මහනෙල් දඬුකලබක් කපන්නක්හු සෙයින් බුදුන් ගෙ විසිතුරු පැන විසජුම් අසා සතුටු සොම්නස් වැ තන්හි තන්හි සාධුකාර දී සමහරයෙහි[2] හුනස්නෙන් නැඟී උතුරුසළුව එකස් කොටැ බුදුනට ඇඳිලි බැඳැ -

**"යා මෙ කඞ්ඛා පුරෙ ආසි තං මෙ ව්‍යාකාසි චක්ඛුම**
**අද්ධා මුනිසි සම්බුද්ධො නත්‍ථි නීවරණා තව"**

යනාදි විසින් අට ගාථායෙකින් බුදුනට ස්තුති කොටැ "වහන්සෙ, මා මුදුනෙහි පළඳනට තොප පාපියුම් දී වදාරව"යි දෙ පත්ල ඉල්ලා ගෙනැ හිසැ තබා-ගෙනැ පසඟ පිහිටුවා වැඳැ **තුණුරුවන්** සරණ ගොස් පැවිජි අයදි යැ. එ සඳැ බුදුහු "සභිය, තීර්ථකයො මෙ සස්නෙහි පැවිජි වන කලැ සාර මසක් පිරිවෙස් වෙසෙති. සාරමස් අවසන්හි ආරාධිත සඟහු පැවිජි කෙරෙති" වදාළො. "ඉදින් වහන්සෙ, තීර්ථකයො මෙ සස්නෙහි පැවිජි වියටි කලැ සාරමසක් පිරිවෙස් වෙසෙද්ද, සාරමස් අවසන්හි ආරාධිත වූ සඟහු ඔවුන් පැවිජි කෙරෙද්ද, වහන්සෙ, මම සතර අවුරුද්දක් පිරිවෙස් වෙසෙමි. සතර අවුරුද් අවසන්හි මා පැවිජි කරන්නෙ යැ"යි කී යැ. එකල්හි බුදුහු ඔවුන් පැවිජි කැරැවූහ. ඔහු රාත් වූහු.

මෙසෙයින් බුදුහු තමන් 'පුරුෂදම්‍යසාරථී' වන බැවින් **සභිය** නම් පරිබ්‍රාජකයාද් ආදි ශබ්දයෙන් ගත් **සකුලුදායි** ඈ පරිබ්‍රාජකයනුද් දමා අමාමහනිවනින් පැමිණිවූහු.

**පරිබ්‍රාජකදමන නම් අට වන පරිච්ඡෙද නිමි.**

## 9. මාණවකදමන නම් පරිච්ඡේදය

**සච්චක** නම් නුවට දරුවා ඇමු පරිදි කිසෙ යැ යත්: එක් සමයෙක්හි බුදුහු **විශාලා** මහනුවර නිසා මහාවන[3] නම් වෙහෙරැ කූටාගාරසාලා[4] නම් ගන්ධකුටියෙහි[5] වැඩ වෙසෙති. එයට පෙරට වැ එක් නුවටකු හා නුවටක[6] හා දෙදෙනෙක්[7] පන්සිය පන්සිය වාද උගෙනැ වාදාරොපණ කෙරෙමින් දඹදිවැ ඇවිදුනාහු, **විසාලා** මහනුවර

---

[1] ලදුමි
[2] සමාහාරයෙහි
[3] මහවන
[4] කූටාගාරසාලායෙහි
[5] ගන්ධකුටිකයෙහි
[6] නුවටයක
[7] දෙදෙන, දෙදෙනෙ

ලා ඔවුනොවුන් දුටහ. **ලිච්ඡවි** රජහු ඔවුන් දැකැ, "තො කවරෙහි, තො කවරහු?"[1]යි පුළුවුත්හු. නුවට, "මම් වාදාරොපණයට දඹදිවැ ඇවිද්මි"[2]යි කී යැ. නුවටුත් එසෙ මැ කිව.[3] **ලිච්ඡවීහි**, "මෙහි මැ ඔවුනොවුනට[4] වාදාරොපණ කරව" යි කීහ. නිවටු[5] තමා අගත් පන්සියක් වාද පුළුවුත් නුවට[6] කී යැ. නුවට පුළුවුත්තා ද නුවටු[7] කිව. [8]කක් හට දු[9] ජය නොවීයැ. පරාජය නොදවියැ. දෙදෙන මැ සම සම වූහු. **ලිච්ඡවීහු** "තෙපි දෙදෙන මැ සමසම ව. ඇවිදැ[10] කුම් කරා ද? මෙහි මැ වසව"යි ගෙක්ක[11] දී වැටුම්[12] තබා-දුන්හු.

දෙදෙනා ගෙ සංවාසයෙන් දුහු සතර දෙනෙක් උපන්හ. **සච්චක** නම් එක් පුතෙක් උපන්. ඔවුන් සතර දෙනා කෙරෙහි එකක් **සච්චා** නම. එකක් **ලාලා** නම. එකක් **පටාචාර** නම. එකක් **ආවට්ටකායා**[13] නම. ඔහු නුවණ ඇත්තාහ. මවුපියන් කෙරෙන් පන්සිය පන්සිය වාද උගත්හ. ඔවුන් වියපත් කල්හි මවුපියො, "අපගෙ කුලයෙහි දැරියො නම් රන් රිදී ඈ දායජ[14] දී කලත්‍රයට යවුවීරිහි නම් නැති යම් ගිහි මිනිසෙක් ඔවුන් ගෙ වාද මඬනට නිසි වී නම්, ඔහට[15] පාදපරිචාරිකා වෙති. යම් පැවිජි කෙනෙක් මඬනට නිසි වූහු නම්, ඔවුන් කෙරෙ පැවිජි වෙති. තෙපි කුමක් කටටියා[16]?" දැ යි කීහ. "ඇපි දු එසෙ මැ කරම්හ" යි සතර දෙන මැ පරිබ්‍රාජක පැවිජියෙහි පැවිජිවෙස් ගෙනැ, "මෙ දඹදිව් නම් දඹරුකින් පැනෙයි. අප මුළු දඹදිවට වාද කරන බව හඟවම්හ"යි දඹඅත්තක් හිසට කොටැ-ගෙනැ සැරිසරමින් ගියො. යම් ගමකට පත්හු ද, ඒ ගම්දොරැ පස්රැසෙකැ හො වැලිරැසෙකැ හො දඹඅත්ත ධජයක් කොටැ හිඳුවාලා "යමෙක්[17] වාදයට නිසි වෙ ද, හෙ මඬිව[18]" යි කියා ගම් වදිති.[19] මෙසෙ[20] ගමින් ගමට යන්නාහු, සැවැත් නුවරට පැමිණැ එසෙයින් මැ නුවරදොරැ දඹඅත්ත හිඳුවා-ලා එහි සිට මිනිස්නට කියා-ලා ඇතුළු නුවර වන්හු.

එකල්හි බුදුහු සැවැත් නුවර නිසා දෙව්රම්හි වැඩැ වෙසෙති. දම්සෙනෙවි සැරැයුත් මහතෙරහු ලෙඩ සඟනට ගිය දවස් පුළුවුස්මින් නොහමට තන් හමඳමින්[21], තමන් කළ මනා දැ බෙහෙවින්, සෙසු සඟුන් හා නොගොස්[22] දව වැ සිඟන්නට වන්හු[23], නුවරදොරැ හිඳුවූ දඹඅත්ත දැකැ "කිමෙකැ මෙ යැ?" යි දරුවන් පිළිවිසැ එ පවත් අසා, "එසෙ බැවින් මැඬ-පියව"යි වදාළහ. "මඬනට නො හැක්කම්හ. බම්හ, වහන්සෙ" යි කීහ. "නොබව. 'කවරහ අප ගෙ දදය මඬවා-පීහ? යි කී කලැ 'බුත්[24]සවු සැරැයුත්

---

[1] තො කවර තො කවර, තා කවර තො කවරහු, තො කවර තො කවරහු. තො කවරෙහි තො කවර-මු
[2] ඇවිදීමි, ඇවිදුමි, ඇවිද්දමි
[3] කී, කීකල්හි
[4] ඔවුනොවුන් හට
[5] නුවට
[6] නුවටි
[7] නුවට
[8] කීයැ
[9] එකක් හට,
[10] අද
[11] ගෙයක්
[12] වැටුප්
[13] අවාවටකයා, වාටකායා-මු අවටකායා-මු
[14] දායාද, දායාද, දයජ්-මු
[15] ඔවුහට, ඔහුහට
[16] කැටැටියා
[17] යම් කෙනෙක්
[18] මඬවයි
[19] වදති
[20] මෙසෙ මෙසෙ
[21] තන්හි මනාමින්, තන්හි මනායම්
[22] නොවැඩ
[23] වන්නාහු, වඩනාහු
[24] බුදුන්ගෙ, බුදුන්, බුදු

මහතෙරහු මඬවා-පීහ. වාද කට්ටි[1] වුව, දෙව්රම් වෙහෙරැ තෙරුන් කරා යව'යි කියව, දරුයෙනි"[2] යි වදාළහ.

ඔහු මහතෙරුන් ගෙ බස් අසා දදය මැඬ දමා-පීහ. මහ තෙරහු නුවර වැදැ සිඟා වළඳා වෙහෙර වැඩියො පරිබ්‍රාජිකාවො ද නුවරින් නික්මැ, "අපගෙ දදය මැඬියාහු කවරහ?" යි කීහු.[3] දරුවො එ පරිදි කීහු. ඔහු "ඉතා මැනැවැ"යි නැවැත නුවර වැදැ එකෙකි දෙනෙ එකෙකි වීථිය බැසැ "බුත්සවු[4] සැරැයුත් මහතෙරහු නම් කෙනෙක් අප හා වාද කෙරෙත් ල[5] ඇසියටි කෙනෙක් නික්මෙත්ව"යි හඬ ගැසූහ. නුවර වැස්සො නික්මුණුහු[6] ඔවුන් හා සමඟ පරිබ්‍රාජිකාවො දෙව්රම් ගියො. මහතෙරහු, "අප වසන තැනට මාගමුන් එනු නොයෙද"යි වෙහෙර මැද ගොස් වැඩහුන්හු. පරිබ්‍රාජිකාවො ගොස් මහතෙරුන් කරා එළඹැ "තෙපි යැ[7] අපගෙ දදය මඬවා-පිව?" යි[8] පුළුවුත්හු. "මම යැ මඬවා-පීමි[9]"යි වදාළහ. එසෙ බැවින් "ඇපි තොප හා වාද කරම්හ"යි කීහු. "ඉතා මැනැවැ, වාද කරව. කා පුළුවුත[10] මැනැවැ හො? කා විසැජුව මැනැවැ හො?"යි වදාළහ. එක්බිති "පුළුවුස්නට කිව, පුළුවුස් මහ; විජසන්නට කිව, විසජම්හ" යි කීහ.[11] "පුළුවුස්නෙ අපට පත්තෙ යැ. තොප[12] මාගම් බැවින් පළමු පුළුවුස්ව"යි වදාළහ. ඔහු සතර දෙන[13] සතර දිසායෙහි සිටැ මවුපියන් කෙරෙ[14] උගත් වාද දහස්[15] පුළුවුත්හු. මහතෙරහු කඩුයෙකින් නොළඹු දඬු[16] කඩනුවන් සෙයින් පුළුවුත් පුළුවුත් දැ අවුල් නැති කොටැ[17] ගැට නැති කොටැ විසජූහු[18] විසජා,[19] "වැලි දු පුළුවුස්ව"යි වදාළහ. "වහන්සෙ, අප දන්නා දැ[20] මෙතෙකැ"යි කීහු.

මහතෙරහු, "තොප විසින් පුළුවුස්නා ලද දහසක් වාද මා විසින් විසජන ලද. මම් තොප සතර දෙනා එක පැනයක් පුළුවුස්මි. තෙපි එ කියා ද?"යි වදාළහ. ඔහු මහතෙරුන් ගෙ නුවණ වෙසෙස්සෙ දැක,[21] "පුළුවුස්ව වහන්සෙ, ඇපි විසජම්හ"යි කියන්නට නොපොහොසත් වූහු. "දතුමො නම්,[22] කියම්හ" යි කීහ. මහතෙරහු, "මෙ කුලදරුවන් පැවිජි කොටැ පළමු හික්මවන පැනය"යි වදාරා "එකෙක් නම් කිමෙකැ?"යි වදාළහැ. ඔහු පැනයෙහි ආදිමධ්‍යාවසාන නුදුටහ. මහතෙරහු, "කියව"යි[23] වදාළහ. "නො දක්මහ[24]

---

[1] කැටටි
[2] දරුවෙනි
[3] කියහු
[4] බුදුන් සව්, බුදුසව්
[5] වාද කෙරෙත් ලැයි ඇසිමි.
[6] නික්මුණහු
[7] තෙපි
[8] මඩවාපියවයි
[9] පියෙමි, පියමි, පියාමි
[10] පුළුවත්-හු
[11] කියා, කීය
[12] තොපට
[13] හතරදෙනෙ
[14] කෙරෙන්
[15] දහස, දහසක්
[16] නෙලුබු (ඹු) දැලි (දළු, දලු)
[17] අවුල් හැර
[18] විස දුහු
[19] විසදා
[20] දෙ
[21] වෙසෙස් දැකැ
[22] දතුම් නම්
[23] කියායි
[24] නොදැක්ම

වහන්සෙ" යි කීහ. "තොප විසින් දහසද් වාද පුළුවුස්නා ලද. මා විසින් කියන ලද. තෙපි එක පැනයකුදු[1] කියන්නට නොහැකි වුව.[2] මෙසෙ බැවින් කහට ජය යැ, කහට පරාජය යැ?" යි වදාළහ. "වහන්සෙ, තොපට ජය යැ, අපට පරාජය යැ"යි කීහ. "දැන් කුමක් කරව?"යි වදාළහැ. මවුපියන් කී දැ සැල කොටැ, "තොප කෙරෙ පැවිජි වම්හ"යි කීහ. තෙපි මාගම් ව. තොප පැවිජි කරනු අපට නොවටී. අපගෙ හසුන්[3] ගෙනැ මෙහෙණවර ගොස් මාගම් සඟුන් කෙරෙහි පැවිජි ව" යි.[4] වදාළහ. ඔහු, "මැනැවැ, වහන්සෙ,"යි මහතෙරුන් ගෙ හසුන් ගෙනැ මාගම් සඟුන් කරා ගොස් පැවිජි වූහ. පැවිජි වූවාහු, නොපමා වැ දවස් යවා[5] මඳ දවසෙකින් මැ රාත් වූහු.

**සච්චක** වනාහි තමා[6] බුහුනුන්[7] සතර දෙන හට වඩා නුවණ ඇත්තෙ යැ. මවුපියන් කෙරෙහි දහසක් වාද උගෙනැ එයට බොහො වාද සමයාන්තරයෙක් උගෙනැ[8] කිසි තැනකට නොගොස් රජකුමරුන් හික්මවමින් විසී. නුවණින් ඉතා පිරුණු වන බැවින් "මාගෙ කුස පැළීයෙ" යි බිය පත්වැ යපටෙකින්[9] බඩ වැළඳ-ගෙනැ ඇවිද්දි. කථාමාර්ග ඇත්තෙ යැ "මා හා සම පණ්ඩිත කෙනෙක් ඇද්ද!" යෙයි. යම් යම් නකතෙකින්[10] යමක් වෙයි කී ද, හෙ බොහොසෙ එසෙ මැ වෙයි. එයින් "සාධු යැ, භද්‍ර යැ"යි බොහො දෙනා විසින් සම්මත යැ. හෙ විසාලා නුවර[11] පිරිසැ මෙසෙ බෙණෙ. "මා විසින් වාදයෙන් වාදාරොපණ කොටැ දොස් ගෙනැ වන් කලැ කම්පිත නොවන ප්‍රකම්පිත නොවන වෙවුළා නොයන කක්ෂයෙන් සෙවද නොසිලියෙන මහණක්හු හො බමුණක්හු හො නොහොත් 'රාත්මි, බුදුමි' යි පිළින කරනුවන් හො නො දක්මි. ඉදින් මම් අචෙතන වූ ටඹට වාදාරොපණ කෙළෙම්[12] නම්, හෙද කම්පිත වැ ප්‍රකම්පිත වැ වෙවුළා යෙයි. මිනිසෙක් නම් කිමෙක් ද!" යෙයි.

---

[1] පැනයකුත්
[2] වූහ
[3] අසුන්
[4] වවයි
[5] යවන්නාහු
[6] තමන්
[7] බහුනන්, බුහුමන්
[8] ගෙන
[9] පටෙකින්
[10] නකතෙන්
[11] විසාලා මහනුවර-මු
[12] කෙළෙ නම්.

එහි බුදුනට ඇඳිලි බැන්දාහු[1] ළ දෙ[2] ගත්තාහ. ඉදින් මිසදිට්හ ගත්තාහු "තෙපි මහණ ගොයුම්හු වැන්දාව?"යි[3] කීහු නම් "ඇඳිලි බැඳි මාත්‍රයෙකින්[4] වැන්දාවමො ද!"[5] යම්හ. සම්දිට්හ[6] ගත්තාහු "බුදුන් කුමට නො වැන්දාව?"යි[7] කීහු නම්, "හිස බිමැ පහරවා මැ වැන්දැ මනා ද? අත් නඟා වඳුනෙ වැඳුම් නො වෙ ද? යම්හ" යි ඇඳිලි බඳහු නම් කියන්නාහු" මම් අසුවල්හු පුත්මි. දත් නම්මි. මිත් නම්මි. මෙයට ආයෙමි"යි නම් කියති. ගොත් කියන්නාහු "මම් වාසෙට්ඨ ගොත්‍රයෙමි. කච්චායන ගොත්‍රයෙමි. මෙයට ආයෙමි"යි ගොත් කියති. මෙසෙ නම් ගොත් කියන්නාහු දිළිඳු කුලෙහි උපන් දරුවහ. "පිරිස් මැදැ නම් ගොතින් පාළ වම්හ"යි කොළො. නො බැණැ හිඳුනාහු කෛරාටිකයන් හා අන්ධබාලයො යි. එහි කෛරාටිකයො "එක්[8] දෙබස් බණන්නා හා විස්වස් කෙරෙති. එසෙ වන්නා හා එක් දෙ දා අහර දුන මැනැවැ"යි නො බැණැ හුන්හ. අන්ධබාලයො තමන් නුවණ නැති වන බැවින් කිබිසිනි කොටැ බහා ලූ මැටි පිඬු සෙයින් නො බැණැ බැසැ හුන්හු.

මෙ සෙයින් හැම දෙනා පිරිවරා හුන් කල්හි එකත්පස් වැ හුන් කූටදන්ත බමුණු බුදුනට, "තොප තුන් යාග හා සොළොස් පිරිවර දන්ති[9] ඇසීමි.[10] මම් නෙ නො දන්මි.[11] මහත් යාගයක් කටටියෙමි. එමට කියනු මැනැවැ"යි කී යැ. "ඔස, බමුණ, සකස් කොටැ අසා, මම කියමි"යි වදාළහ. හෙ, "ඉතා මැනැවැ"යි ගිවිස්සැ. එ සඳැ බුදුහු පොළොවැ තුබු[12] නිධියක් නඟා පෙරට රැස් කරනුවක්හු සෙයින් භවයෙන් පිළිසන් මහාවිජිත රජහු ගෙ චරිත ඇරැ දක්වූහු.

කීසෙ සැ යත්:-

අතීතයෙහි දඹදිවැ මහාවිජිත නම් රජෙක් වි යැ. මෙ මුහුදින් පිරිසුන්[13] මහත් පොළොමඬල දුනුයෙන් මහා එකල්හි පස්වග සඟුන් කෙරෙහි[14] ඇතුළත් අස්සජි මහ තෙරහු පෙරවරු සිවුරු පෙරෙවැ[15] පා ගෙනැ සිඟන්නට විසාලා නුවර[16] වන්හු. සච්චක එ නුවර එ රජගෙන් එ රජ ගෙට පයින් වැදැ[17] ඇවිදුනෙ,[18] මහතෙරුන් දැකැ, "මම් මහණ ගොයුම් හට වාදාරොපණ[19] කෙරෙමියි ඇවිදුමි. ඔහුගෙ සමය නො දන්නෙන් වාදාරොපණ නො කෙරෙමි. පරයන් ගෙ සමය දැනැ වාදාරොපණ කළ කලැ යැ, මනාවන්නෙ.[20] මෙ මහණ ගොයුම්හු ගෙ සවි යැ,[21] අස්සජි නම් මහණ. තමා සථරහු ගෙ සමය කොවිජ[22] කොටැ දන්නි. මම් මොහු[23] පිළිවිසැ කථා පිහිට්ටා[24] මහණ ගොයුම් හට වාදාරොපණ කෙරෙමි"යි සිතා මහතෙරුන් කරා එළබැ "කියග,

[1] බද්දාහු
[2] ලද - පොත්
[3] වැඳවයි, වඳවයි
[4] මාත්‍රාවකින්, මාත්‍රායෙකින්
[5] වැඳවමො
[6] සම්දිටු
[7] වැඳවයි
[8] එකක්
[9] දන්ති යනු
[10] අසමි
[11] නො දත්මි
[12] තිබූ
[13] පිරිහුන්
[14] කෙරෙන්, අස්සජිමහතෙරහු
[15] පෙරව, පෙරැව
[16] නුවරට
[17] වැදගෙන
[18] ඇවිදිනෙ
[19] වාදාරොපණයක්
[20] වන්නෙය
[21] සව්යැ
[22] කොවිජී
[23] මොහු විසින
[24] පිහිටවා, පිහිටුවා

අස්සජිය තොප ගෙ මහණ ගොයුම් සච්චන් කිසෙ හික්මවයි? සච්චන් කෙරෙහි ඔහුගෙ අනුශාසන බහුල වැ[1] පවත්නා පරිදි දිසෙ යැ?"යි පිළිවිත්.

මහතෙරහු, "මම් මුහුට දුක් ලකුණු කීම් නම්, "අස්සජිය, තෙපි කුමක් සඳහා පැවිජි වූව' යි[2] පුළුවුස්ස. 'මහඵල සඳහා පැවිජි වූම්හ' යි කී කලැ 'මෙ තොප ගෙ සස්නෙක් නම් නොවෙයි. මහ දම්ගෙඩි නම්, ඔසුපත්නිරැ[3] නම්. තොපට සුවයෙහි ආශා නම් නැතී' දොස් දෙයි. එසෙ බැවින් මුහුට දුක් ලකුණු නොකිව මැනැවැ"යි සිතා අනිත් ලකුණු අනත් ලකුණු විසින් දක්වන්නාහු - ගිනිවෙස්නඃ

**"රූපං භික්ඛවෙ අනිච්චං. වෙදනා අනිච්චා. සඤ්ඤා අනිච්චා. සඞ්ඛාරා අනිච්චා. විඤ්ඤාණං අනිච්චා රූපං භික්ඛවෙ අනත්තා. වෙදනා අනත්තා. සඤ්ඤා අනත්තා. සඞ්ඛාරා අනත්තා, විඤ්ඤාණං අනත්තා. සබ්බෙ සඞ්ඛාරා අනිච්චා. සබ්බෙ ධම්මා අනත්තා"** යි මෙසේ පස්කඳ අනිත්[4] අනත්සෙ කියා, "අප බුදුහු සච්චන් මෙසෙ හික්මවති. සච්චන් කෙරෙහි අප බුදුන් ගෙ අනුශාසනා බහුල වැ පවත්නා පරිදි මෙසෙ යැ"යි වදාළො.

---

[1] බලයෙන්
[2] වුහයි
[3] උසුපත් නිරැ
[4] අනිස්

එකල්හි සච්චක, "අස්සජිය, ඇපි නො ඇසුව මනා දැයක් ඇසූම්හ. කිසි දවසක් ගියමො නම්, බිණීමෙක් උපන් නම්, මෙ පවිට් දිට්හයෙන්[1] ඔහු ගළවා-පියම්හ"යි කීහු. එ දවස් පන්සියක් ලිච්ඡවී කිසි කාර්යයක් සඳහා සන්ථාගාරයෙහි රැස් වූහ. එකල්හි සච්චක, "මම පූර්වයෙහි සමය නොදන්නා වන බැවින් මහණ[2] ගොයුම් හට වාදාරොපණ නො කෙළෙමි. දැන් ඔහු ගෙ මහසව්වා විසින්[3] සමය දන්මි.[4] මොහු මා අතැවැසි පන්සියක් ලිච්ඡවීහි රැස් වූවාහ. මොවුන් ගෙනැ ගොස් මහණ ගොයුම් හට වාදාරොපණ කෙරෙමි"යි ඔවුන් කරා ගොස් "හවත් ලිච්ඡවීහි, එත්ව යි, එත්ව යි, අද මා හා[5] මහණ ගොයුම්හු හා කථා සල්ලාප වෙයි. යම්සෙ ඔහුගෙ අස්සජි නම් ප්‍රසිද්ධ මහසව්වා විසින් පිහිටා කී දැයෙක් ඇත් ද, ඉදින් මහණ ගොයුම් එ සෙයින් එහි පිහිටියෙ[6] වී නම්, යම්සෙ බැල[7] ඇති පුරුෂයෙක් දිග් ලොම් ඇති එළුවක්හු ලොමැ[8] ගෙනැ මොබට ඔබට ලා අකර්ෂණ පරික්‍ෂණ සම්පරික්‍ෂණ කෙරෙ ද, එ සෙයින් මැ මම් මහණ ගොයුම්හු හා වාදයෙන් වාද කොටැ කථා මාර්ගයෙන් දොස් දක්වා මොබට ඔබට ලා ආකර්ෂණ පරිකර්ෂණ සම්පරිකර්ෂණ කෙරෙමි. යම්සෙ සුරාධූර්තයෙක් රා පරහන මටලුකස්ස දෙවියට් වූයෙ, කසට හරනා සඳහා දෙ කනැ ගෙනැ ඇදැ[9] කිබිසිනි කොටැ පිඹැ-පියා ද, උඩුකුරු කොටැ පිඹැ-පියා ද, පුනපුනා ගසා පියා ද, එසෙයින් මැ මම් මහණ ගොයුම්හු හා වාදයෙන් වාද කොටැ අවධුනන නිර්ධුනන නිෂ්පොටන[10] කෙරෙමි. යම්සෙ සණ[11] පිළි කටටි[12] මිනිස්සු සණවැහැරි[13] මිටි ගෙනැ සණදොවුන් කෙළි[14] කෙළිද්ද, රජුගෙ[15] ඇත් සණදොවුන් කෙළි කෙළෙනා මිනිසුන් දැකැ ගැඹුරු දියට වැදැ සොඬින් දිය ගෙනැ සණදොවුන් කෙළි කෙළී ද, එසෙයින් මැ මම් මහණ ගොයුම්හු හා වාදයෙන් වාද කොටැ සණදොවුන්

[1] පවිටු දිටුහයෙන් (දිටුයෙන්)
[2] මා, මාණ
[3] විසින්ද-හැම
[4] දක්මි
[5] මා
[6] පිහිටුයෙ, පිහිට්යෙ
[7] බල
[8] ලොම්
[9] ඇද
[10] නිස්පොටන
[11] සැණ
[12] කැටවී, කටැථි
[13] වහිරු, වැහැරු, වැහිරු
[14] සණදොවුල්කෙළි
[15] රජුන්

කෙළි[1] කෙළෙනවුන් සෙයින් මොබට ඔබට ලා ආකර්ෂණ පරිකර්ෂණ සම්පරිකර්ෂණ කෙරෙමි. භවත් ලිච්ඡවීහි එත්වයි, එත්ව"යි කී යැ.

එහි ඇතැම් ලිච්ඡවීහි[2] "මහණ ගොයුම් මුහුට කුමයන[3] වාදාරොපණ කෙරෙයි? මුහු මැ මහණ ගොයුම් හට වාදාරොපණ කරත් මිසැ යැ"ය කීහ. ඇතැම් ලිච්ඡවීහි "සච්චක, බුදුනට යක් වැ වාදාරොපණ කෙරෙයි[4] හො! දෙව් වැ බඹ වැ හො වාදාරොපණ කෙරෙයි[5] හො! පියෙවි[6] මිනිසෙක් නම් බුදුනට වාදාරොපණ කරන්නට නො හැක්කැ"යි?[7] කීහු. එකල්හි සච්චක පන්සියයක් ලිච්ඡවි රජුන් පිරිවරා හිරිමුදුනෙහි මහවන වෙහෙරට එළඹැ[8] "මහණ ගොයුම්[9] කොහි යැ හො?" යි පිරිවෙනින් පිරිවෙනට වැදැ බැලනුයෙ,[10] මිණිකව ද පෙරෙවි ගඳැතුන් සෙයින් රත් පහුල්[11] පෙරෙවි,[12] පිණි බොජුන් වළඳා මහසක්මන්හි සක්මන් කරන, සඟුන් දැක ඔවුන් කරා එළඹැ, "භවත් ගොයුම් කොහි යැ හො? උහු දැක් කැටියම්හ"යි කී යැ.

එදවස් බුදුහු අලුයම්හි මහකුළුණුසමවත්[13] සමවැද දස දහසක් සක්වළ විනෙජනන්[14] බලන්නාහු, සච්චකයා අලුයෙ[15] මහත් ලිච්ඡවි පිරිස් ගෙනැ තමනට වාදාරොපණ කටටි වැ එනෙස දැකැ පෙරවරු සඟපිරිස් පිරිවරා විසාලා මහනුවර වැදැ අහරකිස සාහා[16] වෙහෙර අවුදු "මහපිරිස් හිඳුනට සුව තැනෙක්හි හුන මැනැවැ!"යි ගඳකිළියට නො වැදැ මැ මහවනයෙහි එක් රුක්මුලෙක්හි[17] දිවාවිහාර කොටැ වැඩ හුන්හු. එ සඟහු බුදුනට වතාවත් දක්වා ආවාහු සච්චකයා පුළුවුත් තැනැ සිටැ දුරැ[18] වැඩහුන් බුදුන් දක්වන්නාහු, "ගිනිවෙස්න, අප බුදුහු මහවනයෙහි එක්තරා රුක්මුලෙක්හි[19] දිවා විහාර කොටැ වැඩ හුන්හ"යි කීහු.

---

[1] දෙවුන්කෙළි
[2] ලිච්ඡවීහි කෙනෙක්, ලිච්ඡවි කෙනෙක්
[3] කුම් යන, කුමය ද යන, කුමන
[4] ලිච්ඡවීහි කෙනෙක්
[5] කෙරෙහි
[6] පියවි
[7] නොහැක්කහයි
[8] ගොස් එළඹ
[9] ගොයුම්හු
[10] බලන්නාහු
[11] පවුල්
[12] පෙරෙවැ-මු
[13] සමවතින්
[14] විනේජනයන්
[15] ඇතුළු වූසෙ, වූසෙ, අනාදවසේ-මු,
[16] සහසා, නිමවා
[17] රුකක් මුලහි
[18] දුරුවැ
[19] රුකක් මුල්හි, රුක්මුල්හි

එකල්හි **සච්චක** මහත් **ලිච්ඡවි** පිරිස් ගෙනැ[1] මහවනයට වන. පළමු කී පන්සියො[2] එහු අතැවැස්සහ. "ඇතුළු නුවර වනාහි සච්චක පන්සියක් **ලිච්ඡවි** රජුන් ගෙනැ බුදුන් හා වාදාරොපණයට ගියෙ" යනු අසා "පණ්ඩිතයන් දෙන්නා ගෙන බස්කම් අසම්හ"[3] යි නුවර හුන්නවුන් මැදැ වැ[4] මිනිස්හු නික්මුණහ.

මෙසෙ අපමණ පිරිස් පිරිවරා බුදුන් කරා එළඹැ සාමීචි කොටැ එකත්පස් වැ හුන්නෙ යැ.[5] එහි ඇතැම් **ලිච්ඡවි** කෙනෙක් බුදුන් වැඳැ එකත්පස් වැ හුන්හ.[6] ඇතැම්හු බුදුන් හා සාරාණීය[7] කථා කොටැ එකත්පස් වැ හුන්හ.[6] ඇතැම්හු අත් නඟා වැඳැ එකත්පස්වැ හුන්හ.[6] ඇතැම්හු බුදුන් පෙරට[8] තමන්ගෙ නම්ගොත් කියා එකත්පස් වැ හුන්හ.[6] ඇතැම්හු නො බැණැ[9] එකත්පස් වැ හුන්හු. එකත්පස් වැ හුන් **සච්චකයා** බුදුනට, "මම් භවත් ගොයුම්හු කිසි දෙයක්[10] පිළිවිසැ බැලියටියෙමි, අවකාශ හළ හොතිනැ"යි කී යැ. බුදුහු, "තට[11] රිසියෙන[12] දැයක් පුළුවුස. පැන විසජනු මට නොබර තා පුළුවුස්නා[13]තාක් දැ හැම විජසමි" **පසේබුදු අගසවු මහසව්වන්**[14] හා අසාධාරණ සර්වඥ ප්‍රවාරණයෙන් පැවරුහු. ඔහු "රිසියුණු ජැයක්[15] පුළුවුස්ව"යි නොකියති. "අසා දන්මහ" යි යෙති. බුදුහු වූ කල "**පුච්ඡාවුසො යදකඞ්ඛසි**" යි අළව් යක්හු සර්වඥ ප්‍රවාරණයෙන් පැවරු මැ යැ. "**පුච්ඡ මහාරාජ යදකඞ්ඛසි**" යි අජාසත් රජහු[16] පැවරු මැ යැ.

**"පුච්ඡ වාසව මං පඤ්හං යං කිඤ්චි මනසිච්ඡසි,**
**තස්ස තස්සෙව අඤ්ඤස්ස[17] අහං අන්තං කරොමි තෙ"** යි

**සක්දෙව් රජහුද්**[18] පැවරු මැ යැ.

**"බාවරිස්ස[19] ච[20] තුම්හං වා සබ්බෙසං සබ්බසංසයං,**
**කතාවකාසා පුච්ඡව්හො යං කිඤ්චි මනසිච්ඡථ"** යි තව්සන් පැවරු මැ යැ.

**"පුච්ඡ මං සභිය පඤ්හං යං කිඤ්චි මනසිච්ඡසි,**
**තස්ස තස්සෙව පඤ්හස්ස අහං අන්තං කරොමි තෙ"** යි

පරිබ්‍රාජකයන් පැවරුහු මැ යැ. "**තෙන හි ත්වං භික්ඛු සකෙ ආසනෙ නිසීදිත්වා පුච්ඡ යදකඞ්ඛසි**" යනාදි විසින් මහණ බමුණන් පැවරුහු මැයි.

මෙසෙ බුදුහු යකුන් රදුන් දෙවියන් තව්සන් පිරිවැජි යන් මහණ බමුණන් සර්වඥ ප්‍රවාරණයෙන් පවරත්. ඔවුන් බුදු බවට පැමිණැ සර්වඥ ප්‍රවාරණයෙන් පවරනු

---

1 පිරිවරා ගෙන-මු
2 සියය
3 බලා අසම්හයි
4 නුවර හුන්නා වූ නොමඳ-මු
5 හුන්නේයි
6 උන්නහ, හුන්නාහ, හුන්න. උන්හ
7 සාරාණීය-මු
8 පෙර වැ සිට
9 මුවෙන් නොබැණ
10 දැයක්, දැසක්
11 තම හට
12 රිසියුනු, රිසියන
13 පුළුවුස් තාක්
14 පසෙබුදු අගසව්වන් හා
15 ජයත්, ජයක්
16 අජාසත් රජු
17 පඤ්හස්ස-අටුවා
18 සක්දෙව්රජදු (-හුදු)
19 බාවාරිස්ස
20 වා

ආශ්චර්ය නොවෙයි. තමන් බොධිසත්තවභූමියැ ප්‍රාදෙශික ඥානයෙහි සිටි කලැ සරභඞ්ග ජාතකයෙහි සක්දෙව් රජහු ඈ රජුන් සඳහා ඍෂීන් විසින් අයජනා ලදු වැ-

**"කතාවකාසා පුච්ඡන්තු භොන්තො**
**යං කිඤ්චි පඤ්හං මනසාභිපත්ථිතං,**
**අහං හි තං තං වො ව්‍යාකරිස්සං**
**ඤත්වා සයං ලොකමිමං පරඤ්ච"යි**

සර්වඥ ප්‍රවාරණයෙන් පැවරූ මැ යැ. සම්භව ජාතකයෙහි සියලු දඹදිවැ තුන් යලක් ඇවිද පැන කියන කෙනකුන් නො දැකැ සුචිරත නම් බමුණා විසින් පැන පුළුවුස්නට අවකාශ කැරැවූ කල්හි සත් හැවිරිදි වයසැ වලිවෙයැ[1] පස්[2] කෙළිමින් සිටැ පලග් බැඳැ අතුරු වෙයැ බැසැ හිඳැ-

**"තග්ඝ තෙ අහමක්ඛිස්සං යථාපි කුසලො තථා,**
**රාජාව බො තං ජානාති යදි කාහති වා නවා"** යි සර්වඥ ප්‍රවාරණයෙන් පැවරුහු මැ යි.[3]

මෙසෙ බුදුන් විසින් සර්වඥ ප්‍රවාරණයෙන් පැවරූ කල්හි සච්චක පැන පුළුවුස්නෙ, "භවත් ගොයුම් සව්වන් කිසෙ හික්මවයි? ඔවුන් කෙරෙහි භවත් ගොයුම්හු ගෙ අනුශාසනා බහුල වැ පවත්නා[4] පරිදි කිසෙ යැ?"යි පිළිවිත්. එකලැ බුදුහු, "භවත්නි, මෙ දුටු ද? සච්චා කීයෙ, අනෙකෙකැ.[5] සථරහු[6] කියන්නෙ, අනෙකෙකැ.[2] මම් පළමු මැ කීමි.[7] යම්සෙ සච්චා පිහිටා කී දැයෙක් ඇද්ද,[8] ඉදින් මහණ ගොයුම් එ සෙයින් මැ ඉහි පිහිටියෙ වී නම්, වාදාරොපණ කෙරෙමි"යි.[9] මෙ වනාහි අනෙකක් මැ කියයි. එයට මා කුම්[10] කට[11] හැකි දැ?යි නුවටහු කියන්නට අවකාශ නොවෙව" යි පළමු අස්සජි මහතෙරුන් කී නියායෙන් වදාරනුවො[12], ඔහුගෙ ගොත්‍රනාම[13] ගෙනැ, "ගිනිවෙස්න, **'රූපං භික්ඛවෙ අනිච්චං -පෙ- සබ්බෙ ධම්මා අනත්තා"** යි මෙසෙ සව්වන් හික්මවමි. සව්වන් කෙරෙහි මාගෙ අනුශාසනා බහුලවැ[14] පවත්නා පරිදි මෙසෙ යැ"යි වදාළො.

"භවත් ගොයුම්ගොතුව, මට එක් උපමායෙක්[15] වටහයි"යි කී යැ. "කියා, ගිනිවෙස්න"යි වදාළහ. "යම්සෙ, ගොයුම්ගොතුව, යම් කෙතෙකැ[16] කළ[17] බිජු කෙනෙක් නැගී වැඩැ විපුල වන්නාහු, පොළොව් නිසා පොළොවැ පිහිටා වැඩැ විපුල වන්නාහු, පොළොව් නිසා පොළොවැ පිහිටා වැඩැ විපුල වෙද්ද, බාහුබලයෙන් කටයුතු ගොවිකම් වෙණෙඳාම් ඈ කර්මාන්ත කෙනෙක් පොළොව් නිසා පොළොවැ පිහිටා සිටැ කරන ලැබෙද්ද, එසෙයින් මැ රූපය ආත්ම කොටැ ඇති, 'රූප ආත්ම යැ' යි ගත්, පුඟුල් රූපයෙහි පිහිටා සිටැ පින් පව් ඈ ප්‍රසව කෙරෙයි. වෙදනා ආත්ම කොටැ ඇති, 'වෙදනා ආත්ම යැ'යි ගත්, පුඟුල් වෙදනායෙහි පිහිටා සිටැ පින් පව් ප්‍රසව කෙරෙයි.

---

[1] වැලියෙ
[2] පස්කෙළි
[3] පැවරූමැයි
[4] පවතිනා
[5] අනිකෙක
[6] සතරහු
[7] කියමි, කියම්
[8] ඇද්දැයි
[9] කෙරෙමි
[10] කුමක්
[11] කටැටි
[12] වදාරන බුදු (රජ-රද) හු
[13] නාම ගොත්‍ර
[14] බලවත්ව
[15] උපායෙන්
[16] කෙනෙක්, කෙතෙක්
[17] කොළ-හැම, වපුළ-මු

සංඥා ආත්ම කොටැ ඇති ‘සංඥා ආත්ම යැ’යි ගත්, පුගුල් සංඥායෙහි පිහිටා සිටැ පින් පව් ප්‍රසව කෙරෙයි. සංස්කාර[1] ආත්ම කොටැ ඇති, ‘සංස්කාර[2] ආත්ම යැ’යි[3] ගත්, පුගුල් සංස්කාරයන් කෙරෙහි පිහිටා සිටැ පින් පව් ප්‍රසව කෙරෙයි. විඥාන ආත්ම කොටැ ඇති, ‘විඥාන ආත්ම යැ’යි ගත්, පුගුල් විඥානයෙහි පිහිටා සිටැ පින් පව් ප්‍රසව කෙරෙයි. මෙසෙ පස්කඳ මෙ සත්නට පොළො සෙයින් සිටියෙ යැ. සත්හු මෙ පස්කඳැ පිහිටා සිටැ කුසල් අකුසල් සිද්ධ කෙරෙති. තෙපි මෙසෙ විද්‍යමාන ආත්මයනට නිෂෙධ කරන්නාහු, පස්කඳ අනාත්ම යැයි දක්ව”යි ඉතා සකාරණ කොටැ උපමා ඇරැ දැක්වි.

මෙ නුවටහු උපමා අළ නිසා බැලු කලැ සව්නෙ දන්නා බුදුන් මිසැ අනෙක් කෙනෙක් එහු ගෙ වාද බිඳැ දොස් දෙන්නට[4] පොහොසත්හු නම් නැති. පුගුලො දෙවදැරුම් ඇති.[5] බුදුන් විසින් විනෙය වන පුගුලහ,[6] සව්වන් විසින් විනෙය වන පුගුලහ’යි. එහි සව්වන් විසින් විනෙය වන පුගුලන් සව්වො ද විනය[7] කෙරෙති. බුදුහු ද විනය[4] කෙරෙත්. බුදුන් විසින් විනෙය වන පුගුලන් සව්වො විනය[4] කරන්නට නොනිස්සහ. බුදුහු මැ විනය[4] කරන්නට නිසි වෙත්. මෙ නුවට දු[8] බුදුන් විසින්[9] විනෙය[4] වෙයි. එයින් ඔහුගෙ වාද බිඳැ දොස් දෙන්නට[10] අනෙකෙක් නම් නැති. එයින් බුදුහු තුමු මැ උහු ගෙ වාදයෙහි දොස් දක්වනු සඳහා “කියග **ගිනිවෙස්න**, තො ‘රූප මාගෙ ආත්ම යැ’ යෙහි? “වෙදනා මාගෙ ආත්ම යැ’ යෙහි? ‘සංඥා මාගෙ ආත්ම යැ’ යෙහි? ‘සංස්කාර මාගෙ ආත්ම යැ’ යෙහි? ‘විඥාන මාගෙ ආත්ම යැ’ යෙහි?” වදාළො.

එකලැ “මහණ ගොයුම් ඉතා මැ මා ගෙ වාද[11] පිහිට්වයි.[12] ඉදින් මත්තෙ කිසි දොසෙක්[13] වී නම්, මා හුදකලහු[14] මැ නිගන්නි. එබැවින් මෙ වාද හැමදෙනා කෙරෙහි බහාලුව මැනැවැ”යි සිතා “හවත් ගොයුම් ගොතුව, මම් ‘රූප මාගෙ ආත්ම යැ’ යෙමි. ‘වෙදනා මාගෙ ආත්ම යැ’ යෙමි. ‘සංඥා, සංස්කාර, විඥාන, මාගෙ ආත්ම යැ’ යෙමි. මෙ මහාජනයො ද ‘තමන්[15] තමන් ගෙ ආත්ම යැ’යි යෙති” කි.

බුදුහු “**ගිනිවෙස්න**, මුහු මා හා වාදයට ආවාහු නොවෙති. තො මැ යැ, සියලු විසාලා නුවරැ වැස්සන් ඔසොවා-ගෙනැ ආයෙහි.[16] එබැවින් තාගෙ මැ වාද කියා. කුමට මහජනා කෙරෙහි බහාලහී?”[17] වදාළො. හෙ ප්‍රතිඥා කරනුයෙ, “මම රූපාදීන් ‘මා ගෙ ආත්ම යැ’ යෙමි” කී.

මෙසෙ බුදුහු උහු ගෙ වාද පිහිට්ටා[18] “යම් හෙතුවෙකින් තො ‘පස්කඳ ආත්ම යැ, විසියැ වැටෙ’යි පිළින කෙරෙහි ද, හෙ අනාත්ම පරිදි, විසියැ[19] නොවැටෙන පරිදි, තා මැ පුළුවුස්මි: කියඟ. **ගිනිවෙස්න**, කැත කුලෙහි උපන් අභිෂික්ත රජ හට උහු ගෙ රට

---

[1] සංස්කාරයන්
[2] සංස්කාරයන්, සංස්කාරයො
[3] ආත්මයහයි.
[4] සොම්නස් දනවන්නට ‘දොසං දාතුං සමත්‍ථො නාම නත්‍ථි’-අටුවා.
[5] දෙවැදෑරුම් වෙත්
[6] පුගුල්
[7] විනෙය, විනෙනය විනෙ
[8] නුවටහු, නිවටදු, නුවටු-මු
[9] විසින්ම
[10] වෙන්නට
[11] වාදයෙහි
[12] පිහිටුවායි, පිහිටවයි, පිහිටුවයි
[13] දෙයෙක්, දැයක්
[14] හුදකලාහුමැ, හුදකලාවුහු මැ
[15] තම
[16] ආයෙහි ය
[17] බහාලයි, බහාලවයි
[18] පිහිටුවා, පිහිටවා
[19] විසිව

ඉසුරු පවත්ති? මරවන්නට නිස්සන් මරවන්නට ධන හානියට නිස්සන් දිළිඳු කරවන්නට රටින් නෙරනට නිස්සන් රටින් නෙරවන්නට යැ. **කොසොල්** රජහු[1] **අජාසත්** රජහු සෙයින්.

"මෙ වැදි රට වැසි[2] රජනට දු මල රට වැසි රජනට දු ඔවුනොවුන් ගෙ රට ඉසුරු පවත්ති. කැත කුලෙහි අභිෂික්ත රජ හට වූ කල ඔහුගෙ රට ඉසුරු පවත්ති මැ යැ නො!"යි කී.

මෙසෙ නුවට තමාගෙ වාද බිඳුනට අළ[3] කාරණ තමා මැ මරනු සඳහා කළ ආයුධයක් තිහිණි[4] කරන්නක්හු සෙයින් වෙසෙස් කොටැ දැක්වී.

මෙහි අභිප්‍රාය කවරැ යත්:

"රජු විසින් මරන මිනිසුන් ගෙ නෙරවන මිනිසුන් ගෙ[5] රූපාදීහු ඔවුන් විසියැ නො වැටුණහ" යූ සෙ යි. බුදුහු **ගිනිවෙස්න**, 'රූප මාගෙ ආත්ම යැ'යි තො යමක් කිහි ද, මාගෙ රූප මෙසෙ වෙව'යි, 'මෙසෙ නොවෙව'යි. යන තාගෙ ඉසුරු එ රූපයෙහි පවත්ති හො?" යි වදාළො

මෙහි අභිප්‍රාය කවරැ යත්:

"මාගෙ රූප යාපත් වෙව යි, සඳා[6] තුබූ රන් තොරණක් වැනි වෙව යි, සිතුරු පිළියක්[7] සෙයින් සිත් ගනිව යි, මාගෙ රූප විවන නො වෙව යි, දුසටහන් නො වෙව යි, නර[8] නො වෙව යි, කළ තලා නො වෙව යි, සිතුයෙන් එසෙ වන්නෙ නොවෙ?" යි සෙයි.

බුදුන් මෙසෙ වදාළ කලැ නුවට තමා පරදු[9] බව් දැනැ මහණ **ගොයුම්** මාගෙ වාද බිඳුනට කාරණ[10] අළ. මම් මාගෙ නොදැන්මෙන් එමැ වෙසෙස් කොටැ දැක්වීමි. දැන් නටමි. ඉදින්, "පවත්ති" යි[11] කීම් නම්, මෙ රද්දරුවො[12] නැඟී, **ගිනිවෙස්න**, තො රූපයෙහි මාගෙ ඉසුරු පවත්ති යෙහි. ඉදින් තාගෙ ඉසුරු රූපයෙහි පවත්නෙ වී නම්, යම්සෙ මෙ **ලිච්ඡවි** රජ්ජුරුවො **තව්තිසැ** වැසි දෙවියන් සෙයින් වොරජති, අභිරූපයහැ, ප්‍රසාදිකයහැ, තො එසෙ කුමට නො වොරජහි'[13] යෙති. ඉදින් 'නො පවත්තී' කීම් නම්, මහණ **ගොයුම්** නැඟී, **ගිනිවෙස්න**, තො පළමු මාගෙ ඉසුරු රූපයෙහි පවත්තී, කියා දැන් 'නො[14] පවත්තී, යෙහි'යි මා නිගන්නි. මෙසෙ 'පවත්තී' කිව, එක් දොසැ. 'නො පවත්ති' කිව, එක් දොසැ"යි නොබිණි.

---

[1] යම්සෙ කොසොල් රජහු සෙ (සෙයින්)
[2] වැදිරට වැදි රජනට දු, මෙ වැදිරජනට දු
[3] බුදුනට කළ
[4] තියු (හි) ණු
[5] මරන මිනිසුන් ගෙ නසන මිනිසුන් ගෙ- ඇතැම්
[6] සදන්, විසිතුරු
[7] මිණියක්-හැම "සුසජ්ජිත චිත්තපටොවිය" - අටවා, විසිතුරු පෙතියක්-මු
[8] දුනට
[9] රජවූ
[10] කාරණා
[11] පවති යි
[12] රදදරුවො, රජදැරවො
[13] බාරජහි
[14] තො නො

දෙවන වට ද බුදුහු පුළුවුත්හ. දෙවන වට දු නොබණී. තුන් යලක් බුදුන් පුළුවුත් කලැ නොබණන්නහු හිස් සත් කඬවැ[1] පැළෙයි. බුදුහු සතුන් මැ සඳහා සියුරාසැකි කප්සුවහස් පැරුම් පිරුවහු.[2] සතුන් කෙරෙහි බලවත් කුළුණු ඇත්තාහැ. එයින් තුන් වන වටැ නො පිළිවිසැ, "කියග, ගිනිවෙස්න, තා නොබණන්නට කල් නොවෙයි. යමෙක් තථාගතයා තුන් යලක් පුළුවුස්නා[3] දැ නො කියන්නෙ වී නම්, මෙ තැනැ මැ හිස් සත් කඬ වැ[4] පැළෙ"යි වදාළො.

එකල්හි සක් දෙව්රජ (මහත් හිස් ඇති, කඳල*) කැකුළු බඳු තිහිණි[5] දළ[6] ඇති, අඟාළ මුව ඇති, පළල් නළල් ඇති, බුන් බැම ඇති, ගොර බිරම් බැලුම් ඇති, උඩු බලා දිලියෙන කෙහෙ ඇති, රත් දෙලෙන් අවුල් සිරිරු[7] ඇති, හත් විසිතුරු පට ඇති, ගර්ව සහිත රොෂ සහිත භයානක යක් වෙසක් මවා ගෙනැ යුගත් ගිනිකඳක් බඳු හාත්පසින් දිලියෙන වජ්‍රායුධ[8] ඇරගෙනැ, "ඉදින් මෙ නුවට බුදුන් තුන් යලක් පුළුවුසුතුද්[9] නොකියන්නෙ වී නම්, මෙ තැනැ මැ උහු හිස සත් කඩක් කොටැ පළා-පියමී" උහු හිස්මත්තට වැ අහසැ සිටියෙ යි.

මෙ කුමට ආයෙ යත්:

උහු ගෙ දිට්හ විහිද්වන්නට[10] ආයෙ යි. කිසෙ යැ යත්: බුදුන් බුදු වැ අට වන සතියැ අජපල් නුගමුලැ වැඩැ-හිඳැ, "මා ධම් දෙසුවද්[11] ගන්නාහු[12] නැත, ධම් කහට දෙසම්දැ!"යි නිරුත්සාහ වූ කල්හි සක් දෙව්රජ මහබඹහු හා අවුදු, "වහන්සෙ, තෙප් ධම් දෙසව. තොප ගෙ ආඥායෙහි නොපවත්නවුන් ඇපි පවත්වම්හ. තො ගෙ ධම්සකැ. අපගෙ අණසකැ"යි පිළින කෙළෙ. එයින් "අද සච්චකයා උත්ත්‍රස්ත කොටැ පැන විසජුන් කරවමී" ආයෙ යැ. ඔහු බුදුහු දු දක්ති.[13] සච්චක දු දක්කි. ඉදින් ඔහු අනෙකෙක් දිටි නම්, "මහණ ගොයුම්, සච්චකයා තමාගෙ වාදයට නොබස්නාසෙ දැකැ යක්ෂයක්හු[14] ගෙන්වා දැක්වියැ. එකලැ සච්චක භයින් කී යැ" යනු වෙ. එයින් ඔහු බුදුහු[15] දක්ති. සච්චකද් දක්කි.[16]

සච්චකයා හට උහු දකුත් මැ[17] උත්ත්‍රාස ඇති වි යැ, උද්වෙග ඇති වි යැ, රොමහර්ෂ ඇති වි යැ, සියල් සිරිරු[18] ස්වෙද වැහිණැ, ඇතුළු කුස පෙරළි[19] මහ හඬ හැඬි. හෙ, "සස්සො දක්ති හො?" යි බලනුයෙ, කිසිවක්හු ගෙ රොමහර්ෂ මාත්‍රයකුදු නොදැකැ "මෙ භය මට මැ උපන්නෙ යැ. ඉදින් මම, 'යක්ෂයෙකැ'යි[20] කීම් නම්, 'මම, තට මැ ඇස් ඇති? යක්හු තො මැ දක්හි? ඇතහොත්, ඇපි දු නො දක්මො ද! පළමු යක්ෂයක්හු

---

[1] කඩක් වැ
[2] පැරුවාහ
[3] පුළුවුස්දැ පුළුවත්දැ-මු
[4] සත්කඩක් කොට
[5] තිහුණු, තිහින්, තිහිණ
[6] දළු * "මහන්තං සීසං කන්‍දලමකුලසදිසදාඨා" යනු අටුවා ඇත. පුස්කොළ පොත්හි නැත ද, අටුවායෙන් මෙහි ලා වැකිය පිරැවිණ.
[7] දෙලෙන් අවුල් සී
[8] වජ්‍රායුධයක්
[9] පුළුවුස්තුදු, පුළුවුසුදු
[10] විදුටීයහ විහිදිවන්නට
[11] දෙසුවදු
[12] ගන්නවුන්
[13] දකී, දකිති
[14] යක්හු
[15] බුදුන්
[16] දකී
[17] දකිත්ම
[18] සිරුරු, සිරිර
[19] පෙරළිණ
[20] යකෙකැයි.

නොදැකැ, 'මහණ ගොයුම්හු විසින් වාදාවර්ථයෙහි[1] බහා-ලන ලදුයෙහි[2] යක්‍ෂයක්හු දිටිහි[3] කියනු වෙති" සිතා "දැන් මට මෙහි අනෙක් පිළිසරණෙක් ඇත්තෙ නොවෙයි. මහණ ගොයුම්හු මිසැ[4]"යි භගනෙ බුදුන් මැ තම හට සරණ කොටැ, "භවත් ගොයුම් මා පුළු වුසිව යි,[5] කියමි" කී යැ. එ සඳ බුදුහු, "**ගිනිවෙස්න**, 'රූප මාගෙ ආත්ම යැ'යි[6] තො යමක් කීහි ද, 'මාගෙ රූප මෙසෙ වෙව යි, මෙසෙ නො වෙව' යි යන තාගෙ ඉසුරු රූපයෙහි පවත්ති හො?" යි වදාළො "නො පවත්ති, **ගොයුම්ගොතුව**,"යි කී යැ. "**ගිනිවෙස්න**, සිහි එළවා කියා. තා පළමු කි දැ හා පසු වැ කියන දැ හා නො ගැළැපෙයි. පසු වැ කියන දැ හා පළමු කී[7] දැ හා නො ගැළපෙයි. 'වෙදනා මාගෙ ආත්ම වෙ'යි තො යමක් කීහි ද, 'මාගෙ වෙදනා කුසල් හෙයින් මැ වෙව යි, සුව හෙයින් මැ වෙව යි, අකුසල් හෙයින් නො වෙව යි, දුක් හෙයින් නොවෙ වයි, යන තාගෙ ඉසුරු එ වෙදනායෙහි පවත්ති හො?" යි වදාළහැ. "නො පවත්ති, **ගොයුම්ගොතුව**,"යි කීයැ.

එසෙයින් මැ[8] සංඥා සංස්කාරයනුදු පටිපාටීන් පිළිවිසැ ඔවුනුදු අනිත්‍ය පරිදි කී කල්හි, "**ගිනිවෙස්න**, 'මාගෙ, විඥාන මෙසෙ වෙව යි, මෙසෙ නො වෙව'යි යන තාගෙ ඉසුරු එ විඥානයෙහි පවත්ති හො?"යි[9] වදාළහැ. "නො පවත්ති, **ගොයුම්ගොතුව**," යි කී යැ. "**ගිනිවෙස්න**, සිහි එළවා කියා. තා පළමු කී දැ හා පසු වැ කියන දැ හා නො ගැළැපෙයි. පසු වැ කියන දැ හා පළමු කී දැ හා නොගැළපෙ"යි වදාරා, 'කියග, **ගිනිවෙස්න**, රූප නිත්‍ය හො අනිත්‍ය හො?"යි වදාළහ. "අනිත්‍ය යැ; **ගොයුම්ගොතුව**,"යි කී යැ. "යමෙක් අනිත්‍ය ද, හෙ දුක් වෙයි හො? සුව වෙයි හො?" යි වදාළහ. "දුකැ, **ගොයුම්ගොතුව**,"යි කී යැ. "යමෙක් උපැද නස්නා බැවින් අනිත්‍ය වී ද, උදාවිය දුකින්[10]
පෙළෙන බැවින් දුක් වී ද, හෙ[11] මා ගැත්තෙ යැ,[12] මම හෙ යැ, හෙ මාගෙ ආත්ම යැ'යි මෙසෙ තෘෂ්ණා මාන දෘෂ්ටි විසින් දක්නෙ, යෙදෙ දැ?"යි වදාළහැ. "නො යෙදෙයි. **ගොයුම්ගොතුව**," යි කී යැ.

මෙසෙයින් බුදුහු යම්සෙ නිහුගෙඩියෙක්[13] සප්හු ගෙ සුඹුයෙන්[14] නැඟි විස එ මැ සප්හු ලවා ඬහවා[15] හැරැ-පියා ද, එසෙයින් මැ එ මැ පිරිසැ **සච්චකයා** ලවා[16] එ මැ මුයෙන් "පස්කඳ අනිසැ, දුකැ, අනතැ"යි කියැවූහු[17] බුදුහු "යම්සෙ, **ගිනිවෙස්න**, හර කැමැති හර සොයන හර පිරියෙස්මින්[18] ඇවිදුනා පුරුෂයෙක් කැපෙන පොරොවක් ගෙනැ වනයට වැදැ එහි මහත් ඉදි ළඳ කේල්කඳක් දැකැ මුලැ දි අගැ දි සිඳැපියා අගැ ගෙනැ පත්වටි[19] නඟනඟා[20] බලනුයෙ බොරුදු[21] පවා[22] නො දක්කි. හර[23] මෙ

[1] වාදාවර්තනයෙහි
[2] ලද්දෙහි
[3] දිටිම්
[4] මිසයයි
[5] පුළුවුසුවයි
[6] මගේ මය
[7] කියන
[8] එසේ හෙයින් මැ
[9] පවත්තිහොයි නො පවත්තිහොයි
[10] දුක්
[11] ගෙ
[12] ගන්නේ යැ
[13] නිසිහුගේමඩියෙක්, නිසිහු ගෙඩියෙක්
[14] සුහුඹුයෙන්
[15] බහවා
[16] සච්චකයාගෙ
[17] කියාවැටහු, කියහු
[18] පිරියස්මින්
[19] පත්පටි
[20] හඟහඟා
[21] බොරුද්
[22] පොවා
[23] අර

කොහි දකී ද! එසෙයින් තො, මා විසින් තාගෙ වාද විචාරා බලත් බලත්, සිස් විහි, රික්ත විහි, පරාජිත විහි”යි වදාළො.

හෙ පළමු පූරණාදි සනුවටැජරන්[1] කරා එළබැ පැන පුළුවුස්සි. ඔහු විසජන්නට නොහැකි[2] වෙති. හෙ උනට පිරිස් මැදැ මහත් වියරු බැණැ තමා දුනු පරිදි දන්වා නැඟී යෙයි. “**සම්මාසම්බුදුනුදු** එසෙ මැ වෙහෙසෙමි” යන සිතින් අවුදු, යම්සෙ හිඹුල් එරබුදු[3] ඈ නිසරු රුක් පළමු විදිවිරී එක්තරා සියොතෙක්[4] “කිහිරි රුක ද විද්ද හැක්කැ”යි සිතා එහි පැහැරැ එක පහරින් තුඬු බිඳී ඇස් නික්මැ හිස් පැළුණු කලැ කඳින් ගැළැ[5] බිමැ වැටී හි වොදාන මහත් වැ.[6]

**“අම්හො! කො නාමයං රුක්ඛො**
**සීනපත්තො සකණ්ටකො**
**යත්‍ථ එකප්පහාරෙන**
**උත්තමඞ්ගං විසාටිතං”**[7] යි,

වැලැපී ද, එසෙයින් මැ **සච්චක** ද සවඤ්ඤුණහර පැහැරැ තමා නුවණතුඬු බුන් කලැ සවඤ්ඤුණහර තද බව් දත්.

එකල්හි බුදුහු ඔහු ගෙ මුබර බව ප්‍රකාශ කොටැ නිගන්නාහු. “**ගිනිවෙස්න**, තා ‘මා විසින් වාදයෙන් වාද කොටැ දොස් ගෙනැ වන් කලැ කම්පිත නොවන ප්‍රකම්පිත නොවන වෙවුළා නොයන කක්‍ෂයෙන් සෙවද නොසිලයෙන මහණක්හු හො බමුණක්හු හො නොහොත් ‘රාත්මි, බුදුමී, පිළින කරනුවක්හු හො නො දක්මී. ඉදින් මම් අචෙතන වූ ටඹටද්[8] වාදාරොපණ කෙළෙම් නම් හෙ ද කම්පිත වැ ප්‍රකම්පිත වැ වෙවුළා යෙයි. මිනිසෙක් නම් කිමෙක්දැ?’යි **විසාලා** නුවරැ පිරිසැ බණන ලද්දෙ යැ. දැන් තා නළලින් ගුළු ඇතැම් සෙව ද බිඳුපොද උතුරුසළු විනිවිදැ ගොස් බිමැ හෙයි. මාගෙ ශරීරයෙහි වූ කල සෙව ද දැන් ඇත්තෙ නොවෙ”යි බුදුහු එ පිරිසැ රන්වන් සිරිරු දැක්වූහු. හැම සිරිරු දැක්වූවාහු නොවෙති. බුදුහු ගැට වටු ගන්වා පිළිසන් සිරිරු ඇති වැ පිරිසැ ධම් දෙසති. දෙසන්නාහු, ගලයෙන් සිවුරු සතරඟුලක් පමණ[9] තැනට බැහුහු. බැහු විගස රන්වන් රස් පුඤ්ජ පුඤ්ජ වැ, රන් කෙළින් නික්මුණු රත්රන් ධාරා සෙයින්, රත් වලා ගැබින් නික්මුණු විජුලිය කලබක් සෙයින්, නික්මැ රන් මිහිඟක්[10] බඳු ගලය පැදකුණු කෙරෙමින් අහසැ ඇවැ-ගත්හු. බුදුහු මෙසෙ කුමට කළහ යත්:

මහජනයා හට සැක හරනා සඳහා කොළො, එහි මහජනා හට[11] වනාහි “මහණ ගොයුම් තම හට සෙව ද නැති යෙයි. **සච්චකයා** හට වූ කල යන්ත්‍රාරූඪයක් සෙයින් සෙව ද වැහෙයි. මහණ ගොයුම් ගත දෙපට සිවුරු පෙරෙවැ[12] හුන්නෙ යැ. ඇතුළතැ

---

[1] සනිවටුජරන්, සනිවටුන්, නිවටුජරන්
[2] නො පොහොසත්
[3] එරමුදු, එරබදු
[4] එසියොතෙක්
[5] හැළ, ගැළවී
[6] වෙදනාමත් (වත්) වැ
[7] විසාරිතං-මු.
[8] ටඹටදු
[9] සතරඟුලක් තැන් පමණට
[10] මිහිඟයක්
[11] මහජනයො
[12] පෙරව, පෙරැවැ

සෙව ද ඇති බව් නැති බව් කවුරු දන්ති!" යන සැක[1] උපද්දි. මහජනයා ගෙ සැක පසිඳිනා සඳහා මෙසෙ කොළො.

මෙසෙ වදාළ කලැ **සච්චක** නො බැණැ කර බහා-ගෙනැ ප්‍රතිභාන නැති වැ බිම් සැ පයැ පටැඟිල්ලෙන්[2] කැණැ කැණැ හුන්නෙ යැ. එකල්හි නැමින් **දූර්මුඛ** නම් යහපත් මහත් **ලිච්ඡවි** කුමරෙක් **සච්චකයා** හුන්නහු[3] දැකැ බුදුනට "වහන්සෙ, මට එක් උපමායෙක්[4] වටහ"යි කි යැ. "කියා **දූර්මුඛය,**"යි වදාළහැ. වහන්සෙ, යම් ගමකට හො නියම් ගමකට හො නුදුරු තන්හි පොකුණෙක් වී ද, එහි කකුළුයෙක් වී ද, වහන්සෙ, එහි බොහො දරුවො හො දැරියො හො එ ගැමින් හො නියම් ගැමින් හො නික්මැ එ පොකුණට ගොස් බැසැ එ කකුළුවා දියෙන් නගා ගොඩැ හෙවූ ද,[5] කකුළුවා යම් යම් අළක්[6] නැඟී ද, ඔහු නැඟු නැඟු අළ[7] එ දරුවො හො දැරියො හො දඬුකඬෙකින් හො කබල් කඬෙකින් හො ගෙනැ සිඳැ-පිහු[8] ද, මෙසෙ හැම අළ[9] සුන් කලැ එ කකුළු[10] ගමන් පසුන් බැවින්[11] එ පොකුණට පෙර සෙ බස්නට[12] නොහැක්කැ. එහි මැ කපුටු කොක් ආදිනට බත් වෙයි. එසෙයින් මැ, වහන්සෙ, **සච්චකයා** ගෙ යම් කවර දිට්හයෙක[13] ඇද්ද, හෙ හැම මැ වහන්සෙ[14] විසින් සිඳැබිඳැපියා[15] ලන ලද. වහන්සෙ, **සච්චකයා** වටා ලා භවත්හු කරා එළඹෙන්නට නොනිස්සැ, වාද සඳහා යැ"යි කී.

**දූර්මුඛයා** උපමා කී කලැ සෙසු **ලිච්ඡවී** කුමාරයො සිතහු: "මෙ නුවටහු විසින් අපට ශිල්ප උගන්නා[16] තැනැ[17] බොහො කල් අවමාන කරන ලද. දැන් මෙ අප සතුරා පිටි දක්නට නිසි කලැ. ඇපි දු එකෙකි උපවා ඇරැ අත්පිඬු ගසා කලින් හුණුවක්හු[18] මොහොලින් බහනුවන්[19] සෙයින් වටා ලා පිරිස් මැදැ හිස් නොනැඟිය හෙ ද, එවෙනි දෙයක් උහුට කරම්හ" යි උපමා සිතා-ගෙනැ **දූර්මුඛයා** කථා අවසන් බලා[20] හුන්හු.

**සච්චක**, ඔවුන් ගෙ අභිප්‍රාය දැනැ, "මොහු හැම දෙන මැ කර ඔසොවා කොල පොපි[21] ඇති[22] වැ හුන්නාහ. ඉදින් වෙන වෙන උපමා අළහු නම්, වටා ලා මම් පිරිස් මැදැ හිස් නඟන්නට[23] නොහැකි වෙමි. එසෙ බැවින් මම් **දූර්මුඛයා** වළකා, යම්සෙ අනෙකක් හට අවකාශ නොවෙ ද?[24] එසෙ කථා පසිඳැ මහණ **ගොයුම්හු** පැන පුළුවුස්මී" සිතා-ගෙනැ "**දූර්මුඛය,** දැන් සිට තො මුඛරයෙහි, ඇපි තා හා සැසැඳිලි නො කරම්හ. භවත් **ගොයුම්හු** හා සැසැඳිලි කරම්හ, **ගොයුම්ගොතුව**, අප ද ගෙ සෙස්සනුදු ගෙ කථා තිබි-යෙව යි, හෙ ප්‍රලාපමාත්‍රයෙකැ"යි බැණැ බුදුන් පැන

---

[1] මහජනයන් ගෙ සැක
[2] බිම්පාඇඟිල්ලෙන්-මු,
[3] හුන්නාහු
[4] උපායෙක්
[5] හොවූ ද
[6] අඟක්
[7] දළ
[8] සිදහු, සිදපිහි
[9] නළ
[10] කකුළුවා
[11] පසුන් බැවින් වදින්(න්) ට
[12] බට
[13] දිට්හයෙක්
[14] වහන්සේ ගේ ප්‍රඥා
[15] සිඳබිඳපියන
[16] උගන්වන
[17] කල
[18] හුනුවන් හු, වත්හු
[19] මුවගොනුවන්, මොහුගනුවන්
[20] බලබලා-මු
[21] පොපියා, පොපියුම්-මු
[22] ඇති ඇති වැ
[23] වටන්නට
[24] නොදේ ද

පුළුවුස්නෙ[1] "භවත් ගොයුම්හු ගෙ[2] ශ්‍රාවකයෙක් කිපමණෙකින් සසුන් කරනු නම් වෙ?" යි කී යැ. "ගිනිවෙස්න, මෙ සස්නෙහි මාගෙ ශ්‍රාවකයෙක්:

**"යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, සබ්බං රූපං නෙතං මම. නෙසොහමස්මි. න මෙසො අත්තා"**-

යන මෙ එකොළොස් වැදැරුම් හැම රූප මා නොගැත්තෙ යැ. මම රූපයෙම් නොවෙමි[3] මාගෙ ඉසුරු රූපයෙහි පවත්නෙ නොවෙ"යි යථාභූතය මනා කොටැ නුවණින් දකී ද, එසෙයින් මැ:

**"යා කාචි වෙදනා, යා කාචි සඤ්ඤා, යෙ කෙචි සඞ්ඛාරා, යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං .......න මෙසො අත්තා"**

"යන එකොළොස් වැදැරුම් හැම විඥාන මා නොගැත්තෙ යැ. මම් විඥානයෙම් නොවෙමි. මාගෙ ඉසුරු විඥානයෙහි පවත්නෙ නොවෙයි. මෙසෙ යථා ස්වභාවය මනා කොටැ නුවණින් බලා ද, මෙ පමණෙකින්. ගිනිවෙස්න, මාගෙ ශ්‍රාවක සසුන් කරනු නම් වෙ"යි ශෛක්‍ෂභූමි දැක්වූහු.

එක්බිති අශෛක්‍ෂභූමි[4] පුළුවුස්නෙ, "ගොයුම්ගොතුව, මහණ කිපමණෙකින් රාත් නම් වෙ?"යි කී යැ. "ගිනිවෙස්න, මෙ සස්නෙහි මහණෙක්, **"යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං...... න මෙසො අත්තා"** - යන එකොළොස් වැදැරුම් හැම රූප මා නොගැත්තෙ යැ. මම් රූපයෙම් නොවෙමි. මාගෙ ඉසුරු රූපයෙහි පවත්නෙ නොවෙයි. මෙසෙ යථාභූතය මනා කොටැ නුවණින් දැකැ අනුපාදාවිමොක්‍ෂයෙන් විමුක්ත[5] වී ද, එසෙයින් මැ **"යා කාචි වෙදනා, යා කාචි සඤ්ඤා, යෙ කෙචි සඞ්ඛාරා, යි කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං....... න මසො අත්තා"** - යන එකොළොස් වැදැරුම් හැ විඥාන මා නොගැත්තෙ යැ. මම් විඥානයෙම් නොවෙමි. මාගෙ ඉසුරු විඥානයෙහි පවත්නෙ නොවෙයි. මෙසෙ යථාභූත අර්ථය මනා කොටැ නුවණින් දැකැ අනුපාදාවිමොක්‍ෂයෙන් විමුක්ත වී ද' මහණ, මෙ පමණෙකින් 'රාත්' නම් වෙ"යි.

මෙසෙ ලොවීලොවුත්රා නුවණිනුදු ලොවීලොවුතුරා පිළිවෙතිනුදු ලොවීලොවුතුරා විමුක්තිනුදු සමුපෙත වූ විමුක්ත සිත්[6] ඇති මහණ, තථාගතයා හට මැ සත්කාර ගුරුකාර[7] නමස්කාර කෙරෙයි. "බුද්හු[8] තුමුහු සිව් සස් දැනැ අනුන් දන්වනු සඳහා ධම් දෙසති. තුමුහු ඉන්ද්‍රියදමනයෙන් දැමී අනුන් දමනු සඳහා ධම් දෙසති. තුමුහු කෙලෙසුන් ගෙ ක්‍ෂොභ සන්හිඳුවා අනුන් ගෙ ක්ලෙශක්‍ෂොභ සන්හිඳුවා අනුන් ගෙ ක්ලෙශක්‍ෂොභ සන්හිඳුවනු සඳහා ධම් දෙසති. තුමුහු සසරසයුරු තැරැ අනුන් සසර සයුරෙන් නගනු සඳහා ධම් දෙසති. තුමුහු කෙලෙස් පිරි නිවණින් පිරිනිවී අනුන්ගෙ

[1] පුළුවුත
[2] භවත්හුගෙ
[3] රූපයෙක් නොවෙයි
[4] අශෛක්ෂ
[5] විමොක්‍ෂ
[6] විමුක්තයන් ඇති
[7] ගරුකාර
[8] බුදුහු

කෙලෙස්ගිනි නිවනු සඳහා ධම්දෙසති යි මෙසෙ තථාගතයා හට මැ සත්කාර ගුරුකාර නමස්කාර කෙරෙ"යි වදාළො.

එකල්හි **සච්චක** "**ගොයුම්ගොතුව**, ඇප් 'භවත්හු වාදයෙන් වාද කොටැ ගැටෙම්හ' යි සිතන්නමො නටුවාම්හ.[1] ත්‍රිමදගලිත[2] ඇතක්හු පැහැරැ වැදැ-ගත් පුරුෂයක් හට සෙත් වන්නෙ වෙයි.[3] දිලියෙන ගිනි කඳක් සිපැ-ගත් පුරුෂයක් හට සෙත් වන්නෙ වෙයි[2] සොරවිෂ ඇති ආශීවිෂයක්හු පැහැරැ සිපැ-ගත් පුරුෂයක් හට සෙත් වන්නෙ වෙයි.[2] භවත් **ගොයුම්හු** කෙරෙහි ගැහැටු[4] පුරුෂයක් හට සෙත් නො මැ වෙ"යි කී.

බුදුහු ඇත් ආදීන් සෙයින් කිසිවක්හු දිවියට අන්තරාය[5] කරන්නාහු නොවෙති. නුවට මෙතුන් උපමාවන් බුදුනට[6] උත්කර්ෂ සඳහා අළියෙ නොවෙයි. තම හට මැ උත්කර්ෂ සඳහා අළ. යම්සෙ රජෙක් සතුරක්හු මරා, 'මෙසෙ ශූර වූ මෙවෙනි බැල[7] ඇති පුරුෂ නට'යි සතුරා හුවන්නෙ,[8] තමා මැ හුවාද, එසෙයින් මැ මෙ තුන් උපමායෙන් බුදුන් හුවන්නෙ, "ඇපි මැ ශූරයම්හැ. ඇපි මැ පණ්ඩිතයම්හැ. ඇපි මැ බහුශ්‍රැතයම්හැ. මෙ සෙයින් ත්‍රිමදගලිත ඇතක්හු බඳු, දිලියෙන ගිනිකඳක් බඳු, පැන අළ[9] ආශීවිෂයක්හු බඳු **සම්මාසම්බුදුන්** කරා වාද සඳහා එළබෙන්නාම්හ"යි මෙසෙ තම හට මැ උත්කර්ෂ කොටැ බුදුන් නිමන්ත්‍රණ කරනුයෙ, "**ගොයුම්ගොතුව**, තොපට සත්කාර කරන මට යම් පුණ්‍යයෙක් ප්‍රීතියෙක් උපදී ද, එ සඳහා සඟුන්[10] හා සමඟ සෙට මාගෙන් වළඳන්නට වැඩිය මැනැවැ"යි කී යැ.

බුදුහු ඔව්හට අනුග්‍රහ පිණිස නො බැණැ සිතින් ඉවසූහු. **සච්චක**, බුදුන් ඉවසූ බව් දැනැ ගොස් **ලිච්ඡවි** රජ්ජුරුවනට "මම් සෙට භවත් **ගොයුම්හු** හා සඟුන් නිමන්ත්‍රණ කෙළෙම්. තොප දවස් පතා මට පන්සියක් බත්සැළ දෙන බැවින් එසෙට මහණ **ගොයුම්** හට නිසි වන පරිද්දෙන්[11] දෙව"යි කී. අනෙක් දවස් එ රජ්ජුරුවො උහුට පන්සියක් බත්සැළ[12] දී යවුහ. **සච්චක**, තමාගෙ අරම්හි පිණී කන බොන දැ පිළියෙළ[13] කරවා-තබා යවා කල් දැන්වී යැ. බුදුහු මහ සඟුන් පිරිවරා උහු ගෙ අරමට එළබැ පැන් වූ අස්නෙහි වැඩ හුන්හු. **සච්චක**, බුදුපාමොක් සඟුන් පිණි බොජනෙන් සිය අතින් සතපා[14] එකත්පස් වැ හිඳැ, "භවත් **ගොයුම්ගොතුව**, මෙ දානයෙහි යම් ඵලයෙක් ඇද්ද, හෙ දායකයනට සුවයට වැටෙ"යි[15] කී යැ. "**ගිනිවෙස්න**, තා බඳු[16] අවීතරාගයනට දුන් දන්හි ඵල තට දුන් දායකයනට වෙයි. මාසෙ වූ වීතරාගයන්ට දුන් දන්හි ඵල තට වෙ"යි වදාරා හුනස්නෙන් නැඟී වැඩියො.[17]

---

[1] නටුම්හ, නටුවම්හ
[2] මහාත්‍රිමදගලිත
[3] නොවෙයි-හැම
[4] ගැටුණු
[5] අන්තරායක්
[6] බුදුන්ට
[7] බල
[8] සතරහු වනන්නෙ-මු
[9] කළ-මු
[10] එ සඟුන්
[11] නිසි වන්නේය යි යන පරිද්දෙන්
[12] බත්සැළි
[13] පිළිවෙල
[14] සපයා
[15] වැටෙවයි-මු
[16] පිදූ-හැම
[17] වැඩ

අනෙක් දවසක් බුදුහු විසාලා නුවර වැඩියටි වැ පෙරවරු මුරුත මල්කලබක් බඳු[1] දෙපටසිවුරු[2] හැඳැ විජිලියක්[3] බඳු කහබාන් බැඳැ නුගපල බඳු පහුල්[4] එකස් කොටැ පෙරෙවැ ගඳකිළියෙන්[5] නික්මැ සඟපිරිස් පිරිවරා අග් දෙරියෙහි වැඩැ සිටියො.

එකල්හි සච්චක, "පළමු මම් අපණ්ඩිත වන බැවින් සියලු විසාලා නුවරැ වැස්සන් ගෙනැ මහණ ගොයුම්හු කරා ගොස් පිරිස් මැදැ පරිභූත වීමි. දැන් එසෙ නො කොටැ එකලා වැ ගොස් වාදාරොපණ කෙරෙමි.[6] ඉදින් මහණ ගොයුම්හු පරදවන්නට නිසි වීම් නම්, මාගෙ ලද[7] හුවා ජය[8] කියා එමි. ඉදින් මහණ ගොයුම් හට ජය වී නම්, අඳුරුයෙහි නැටුම් සෙයින් දන්නාහු නැති" සනිට්හන්[9] කොටැ නිද්‍රා[10] පැන නම් පැනයක් ගෙනැ මහවන වෙහෙර ගියෙ.

අනඳ මහතෙරහු උහු දුරින් එන්නහු දැකැ, "බුදුන් මොහොතක් වැඩැ හුන් කලැ බුදුන් දක්නා ලැබෙයි. බණ අසනු ලැබෙයි. හෙ ඔහට[11] බොහො කල් හිතයට සුවයට වැටෙ"යි යන සිතින් "වහන්සෙ, එන්නෙ, සච්චක යැ. මොහොතක් වැඩැ හුන මැනැවැ"යි අයජැ[12] අසුන් පැන්වූහ.

බුදුහු වැඩ හුන්හ. සච්චක, බුදුන් කරා එළඹැ සාමීචි කොටැ එකත්පස් වැ හිඳැ,[13] **"සන්ති හො ගොතම, එකෙ සමණ බ්‍රාහ්මණා කායභාවනානුයුත්තා විහරන්ති"** යනාදි ක්‍රමයෙන් පැන පිළිවිත. **"ඉධ අග්ගිවෙස්සන, අස්සුතවතො පුථුජ්ජනස්ස උප්පජ්ජති සුඛා වෙදනා"** යනාදි ක්‍රමයෙන් පැන විසජුහු. ඔහු පැන පුළුවුත් පරිදිද් බුදුන් නිරවසෙස්නෙන්[14] විජු පරිදිද් මැදුම්සඟියැ මහාසච්චක සුතින් දන්නෙ යැ.

මෙසෙ බුදුන් විසින් මෙ නුවට දරුව හට දෙ වරෙකැ දෙ සුතක් දෙසන ලද. හෙ අධිගම නොද කෙළෙ, පැවිජි නො ද වී යැ, සරණැ නො ද පිහිටි යැ.[15]

ඔව්හට බුදුහු කුමට ධම් දෙසූ හැ යත්:

අනාගතයෙහි උහුට වන වැඩ දැකැ වාසනා සඳහා දෙසුහු. ඔහු බුදුන් පිරිනිවනින්[16] මතුයෙහි දෙසිය සතිස්[17] හවුරුද්දක් ඉකුත් කල්හි, ලක්දිවැ සසුන් පිහිටි කල්හි, දෙව්ලොවින් සැවැ මෙ රට දකිණිගිරි වෙහෙරට[18] නොදුරු තන්හි එක් ඇමැති කුලෙක්හි[19] ඉපැදැ පැවිජි වැ තෙවළාධර වැ විදර්ශනා වඩා පිළිසිඹියා පත් රාත් වැ කළු බුද්ධරක්ඛිත මහතෙරහු නම් වූහු.

---

[1] බඳු වූ
[2] දෙපට අඳනා සිවුර
[3] විදිලියයක්, විදුලියක්
[4] පවුල්, පවුල
[5] ගඳකෙලින්
[6] කෙරෙමින්
[7] ලදු, ලද්
[8] දය, ද
[9] සනිටුහන්
[10] නින්දාපැන, නිදාපැන
[11] ඔහුහට, ඔව්හට
[12] අයජු
[13] හින
[14] විශෙෂයෙන්
[15] පිහිටිව්යැ
[16] පිරිනිවන්
[17] දෙසිය සතලිස්-හැම
[18] දකුණුගිරි වෙහෙරට, දකිණිගිරි වෙහෙරට
[19] ඇමැති කුලයෙක්හි

ඔවුන් සැගිරියැ කළුතිඹිරි රුක්මුල්හි කාලකාරාම සුත දෙසූ දවස් රජු විසින් සියක් යොජුන් ලක්දිවැ රජයෙන් පුදන ලද පරිදි ධර්මප්‍රදීපිකායෙහි කී පරිද්දෙන් දත යුතු.

මෙසෙ බුදුහු තමන් පුරුෂධම්මසාරථී වන බැවින් සච්චක මාණවක නම් නුවට දරුවා ද ආදි ශබ්දයෙන් ගත් සුභ මාණවකාදීනුදු දමා අමාමහ නිවන් පැමිණිවූහු.

**මාණවකදමන නම් නව වන පරිච්ඡේද නිමි.**

## 10. දිගම්බරදමන නම් පරිච්ඡේදය

**පාඨිකපුත්‍ර**[1] නුවටහු දැමූ පරිදි කිසෙ යැ යත්:

**විසාලා** නුවර සුනක්ඛත්ත නම් ලිච්ඡවි රාජපුත්‍රයෙක් බුදුසස්නෙහි පැවිජි වැ බුදුනට මෙහෙ කරනුයෙ, එක් දවසක් බුදුන් කරා එළඹැ, "දිවඇස් ලබන්නට යැ"යි පිළිවෙත් ඇරැ වියැ.[2] ඔහුට බුදුහු පිළිවෙත් වදාළහැ. හෙ වදාළ[3] නියායෙන් පිළිපැදැ දිවඇස් උපයා[4] දෙවියන් ගෙ උයන් විමන් කප්රුක් දැකැ සව්බරණින් සැදි රැ දැක, "මොවුන්ගෙ හඬ මියුරු වුව මැනැවැ,[5] එ කිසෙ අසම් හො!"යි සිතා බුදුන් කරා එළඹැ දිවසොධා උපදනට නිසි පිළිවෙත් ඇරැවි යැ. හෙ අතීතයෙහි සිල්වත් පැවිජි කෙනකුන් කන්සක පැහැරැ බිහිරි කොටැ-පි යැ. එයින් උහුට දිවසොධා නො උපද්දි.[6] බුදුහු එ නොඋපදනාසෙ දැකැ එයට පිළිවෙත් නො වදාළහැ.

හෙ එ පමණෙකින් බුදුන් කෙරෙ වෙර[7] බැඳැ සිතී: "එකාන්තයෙන් මහණ ගොයුම් හට මෙබඳු සිතක් උපන්සෙ යැ.[8] 'මම ද[9] රද[10] දරුයෙමි, මෙයිත් රද[10] දරු යැ. ඉදින් මොහුගෙ නුවණ වැඩියෙ වී නම්, මෙ සර්වඥ වෙ' යන සිතින් ඊර්ෂ්‍යායෙන් මට නො කියයි" සිතා එක් දවසක් බුදුන් කරා එළඹැ "වහන්සෙ පියා[11] යෙමි, නිසා නො වෙසෙමි[12]" කී යැ. එකල්හි බුදුහු, "තො මා නිසා වසා යි මා තට කී දැයෙක් ඇද්ද?"යි වදාළහැ. "නැති, වහන්සෙ,"යි කී යැ. "මම් වහන්සෙ නිසා වෙසෙමි යි තා මට කී දැයෙක් ඇද්ද?"යි වදාළහැ. එයිද් නැතිසෙ කී යැ. මෙසෙ තා මට කී දැ නැත.[13] මා තට කී දැ නැත.[13] මට කුමට කියහී?" වදාළො. "වහන්සෙ මට උතුරු මිනිස් ධැමින් පෙළහර නොදක්වන දැ යැ"යි කී යැ. "තො මා නිසා වසා. මම් තට පෙළහර දක්වමි යි මා තට කී දැයෙක් ඇද්දැ"යි වදාළහැ. "නැති, වහන්සෙ"යි කී යැ. "මම වහන්සෙ නිසා වෙසෙමි, මට පෙළහර දක්වන්නෙ යැයි තා මට කී දැයෙක් ඇද්ද?"යි වදාළහැ. එයිදු නැතිසෙ කී යැ. "මා තට ප්‍රාතිහාර්යය කෙළෙන්[14] කිම? නොකෙළෙන[1] කිම? එයින් තමට කවර ප්‍රයෝජන යැ? එකළ දු නොකළ දු මාගෙ සස්නට[15] වන පිරිහිණි නැති. මම් දෙව්මිනිසුන් අමා මහනිවන් පමුණුවනු සඳහා පැරුම් පිරුයෙමි. ප්‍රාතිහාර්යය කරනු සඳහා පිරුයෙම් නොවෙමි. මා තට කී දැ නැත, තා මට කී දැ නැත, මට කුමට කියහී?" වදාළහැ. "වහන්සෙ, මෙ නම් දැයෙක් ලොකයෙහි අග්‍ර යැයි අග පමණක් මට නොවදාරන දැ යැ"යි කී යැ. "තො මා නිසා වසා, මම් තට අග පමණක් කියමි, මා තට කී දැයෙක් ඇද්දැ"යි වදාළහැ. "නැති, වහන්සෙ,"යි කී යැ. "මම් වහන්සෙ නිසා වෙසමි. මට අග පමණක් කියන්නෙ යැයි තා මට කී දැයෙක් ඇද්ද?"යි වදාළහැැ. "එයිද් නැතී" කී යැ. "**සුනක්ඛත්තය**, ලොකයෙහි මෙ නම් දෙයෙක්[16] අග්‍ර යැයි කීයෙන් කිම? නොකීයෙන් කිම? එයින් නිවන් සැහෙන්න

---

[1] පටික පුත්‍ර-මු
[2] එරවියැ
[3] එනියායෙන්
[4] ලැබැ
[5] මැනැවැයි
[6] උපන
[7] වෛර
[8] උපන්නෙයැ
[9] මමත්, මයිත්
[10] රද (රජ) දරු
[11] වහන්සෙ වහන්සෙ පියා-මු
[12] නොවෙමි
[13] නැති
[14] කෙළෙම්
[15] සස්න
[16] දැයෙක්

නොවෙ"යි වදාළහැ. සුනක්ඛත්ත, "බුදුන් ගෙ ගුණ මකමී" මෙතෙක් විප්‍රලාප බැළැ බුදුන් ගෙ කථා අස අසා පිහිට නොලදින් නොබැණැ සිටියෙ යැ.

"සුනක්ඛත්තයා[1] විසාලා නුවර වැදැ[2] පෙරැ[3] **තුණුරුවන්හි** ගුණ කියන කලැ මුව නො පොහොයි. දැන් එ මැ මීයෙන් අයුණු කියයි. බ්‍රම්සරවස් රක්නට නොපොහොසත් වූයෙ, තමා බාල වන බැවින් **තුණුරුවන්හි** අයුණු කියා ගිහි වැ වෙසෙ"යි,[4] බුදුහු වූ කල සව්නෙ දන්ති, ධම් නියාාණික යැ, සඟහු සුපිළිපන්නාහු යි, **තුණුරුවන්හි** ස්තොත්‍ර කරන මිනිස්හු තාගෙ දොස් දක්වතී වදාළො. මෙසෙ කුමට වදාළහැ? යත්: එ දොස් උපන් කලැ, "සව්නෙ දන්නා[5] බුදුහු මෙ දොස් දැකැ පළමු මට නො වදාළහ"යි නො කියවනු[6] සඳහා වදාළො.

එක් සමයෙක්හි බුදුහු **බුලුජනවු**[7] නම් ජනවියෙක්හි **උතුරු** නම් නියම්ගමක් නිසා වැඩැ වසනුවො පෙරවරු **සුනක්ඛත්ත** ලිච්ඡවිහි හා සමඟ ගමට වැඩියො. එකල්හි **කොරක්ඛත්තිය** නම් නුවටෙක් 'බලුතව' නම් තව කෙරෙයි. දෙ දණ හා දෙ වැලමිට බිමැ ඔබා ඇවිද්දි, බල්ලකු සෙ බිමැ කන බොන ඈ හිඹැ, බලා මීයෙන් මැ කයි. මීයෙන් මැ බොයි. අත් නො පහරවයි, එප්[8] දොරැ හළ පීරා-පියා[9] වැකැටි ගෙනැ[10] හොවී.[11] **සුනක්ඛත්ත**,[12] ඔහු දැකැ, "මෙ රාත් මහණෙකැ, මොහු හා සම අනෙක් මහණෙක් ඇත්තෙ නොවෙයි. මෙ අපිස් බැවින් පිළී නො හඳී, ප්‍රපඤ්චයෙන් භික්‍ෂා භාජන නො ගෙනැ ඇවිද්දි, බිමැ ඔත්තා මැ කයි, මෙ යැ "මහණ" නම් ඇපි කුමයන[13] මහණම්හ!" යි සව්නෙ දක්නා බුදුන් පස් පස්[14] යනුයෙ, මෙ පවිටු සිත් සිතී.

එ සඳැ බුදුහු, "මෙ **සුනක්ඛත්ත** පාපාධ්‍යාශය ඇත්තෙ යැ. මුහු දැකැ කුම්[15] සිති යැ හො!"යි බලන්නාහු, ඔහු ගෙ අදහස් දැනැ "මෙ මොසපුරුෂ මා වැනි සව්නෙ දන්නා බුදු රජක්හු[16] පස් පස් එන්නෙ, නුවටුහ 'රාත්හ' යි සිතයි. මෙ බාලයා දැන් මැ නිගත මැනැවැ"යි සිතා, "තො මෙසෙ හීනාධ්‍යාශය ඇත්තෙහි, 'මම් මහණ ශාක්‍යපුත්‍රයෙමී' කුමට පිළින කෙරෙහී?" වදාළහැ. "වහන්සෙ, මාගෙ කවර වරදක් දැකැ වදාරන ඈ යැ?" යි කීයැ. "මෙ බලුතව කරන නුවටහු 'රාත්හ' යි ගත්හි නො?"යි වදාළහ. "කිම? වහන්සෙ, රාත් බැවැ මසුරු ඈ යැ හො?" යි කී යැ. "මොසපුරුෂය, මම දෙව්මිනිසුන් රාත් වනු කැමැත්තෙමි. එමැ සඳහා යැ, මා පැරුම් පිරුයෙ. 'රාත් බව් මට මිසැ[17] අන්නට නොද වෙව' යි යන සිත් නැත්තෙමි. නොරාතන් 'රාත්හ' යන පවිටි දිට්හ යැ තට උපන්නෙ.[18] එ පියා.[19] බොහො කල්හි තට අහිතයට වැටෙයි. තා 'රාත්හ' යි

---

[1] සුනක්ඛත්ත සුනක්ඛත්තය
[2] විසාලා නුවර වැස්සො-හැම, වැස්සෙ-මු: මොහු-මු:
[3] පෙරෙ
[4] ගිහිව වෙයි, වැටෙයි-මු:
[5] දත්
[6] නො කියවුනු
[7] මුළුජනවූ-හැම
[8] ළිප්, ලුප්, එබ්, ලප්
[9] පිහිරා, හාරාපියා
[10] වකටියෙ ගෙන, වකැටි ගෙන
[11] හෙවී
[12] සුනක්ඛත්ත නම් ලිච්ඡවිහි
[13] කුමන-මු.
[14] පසුපසු
[15] කුමක්
[16] බුදුරජක්, බුදුරජක්සෙ (රජකු)
[17] මටමය
[18] උපන්නෙ යැ
[19] එයයො

ගත් **කොරක්ඛත්තිය** නම් නුවට සත් දවසෙකින් ආලස්‍යයක් ඇති වැ මියැ කාල **කඤ්ජක** නම් අසුර කායෙහි උපද්දි. එහි ප්‍රෙතයන් තුන් ගවු පමණ අත්බව් වෙයි, ලෙ මස් නැති වන බැවින් පරණලා වැන්නහැ,[1] කකුළුවන් ගෙ ඇස් සෙයින් ඇස් නික්මැ[2] මුදුනෙහි සිටී[3] මුව[4] හිදිකටුසිදක් වැනි වැ මුදුනෙහි මැ සිටී, එයින් ගොදුරු ගන්නා කලැ නැඹුරු වැ මිසැ නොගත හෙති, මළ කලැ **බීරණත්ථම්බක**[5] නම් සොහොනට ඇදැ-පයිති. තො කැමැති වීහි නම්, උහු කරා ගොස් පිළිවිසැ දනැ"යි වදාළො.

**සුනක්ඛත්ත** ලිච්ඡවි, බුදුන් එ ගමැ වළඳා වෙහෙර වැඩි කල්හි **කොරක්ඛත්තිය** නුවටහු කරා ගොස් "මහණ **ගොයුම්** 'තා අන් සත් දවසෙකින් ආලස්‍යයක් ඇති වැ මියැ කාල **කඤ්ජක** නම් අසුර කායෙහි උපදිති,[6] මළහු **බීරණත්ථම්භක** නම් සොහොනැ ඇදැ-පියති, කී යැ. තො මඳ මඳ කොටැ කා මඳ මඳ කොටැ බො.[7] මහණ **ගොයුම්හු** මුසවායෙන් නිගන්මහ"යි කී යැ. එ අසා නුවට බල්ලකු සෙ එප් දොරැ හොත්තෙ, හිස ඔසොවා ගෙනැ ඇස වැරැ[8] බලනුයෙ, "කුම් කියහි" මහණ **ගොයුම්** අප සතුරු, උහු[9] උපන් තැන් පටන් ගෙනැ ඇපි හිරු නැගි කලැ[10] කදොපැණියන් වැනි වුම්හ, ඔහු එසෙ කිවමනා[11] මැ යැ, අන් සෙ කිව මනා[11] මැ යැ, සතුරහු[12] බස් නම් සබා වන්නෙ නොවෙයි, තො යා, මම් කළ මනා දැ[13] දන්මි" කියා එහි මැ බැසැ හොතැ.

එකලැ **සුනක්ඛත්තයා** බුදුන් නො හදනා එක් දවසකට තුන් වටෙකැ "එක් දා ගියෙ,[14] දෙ දා ගියෙ'යි ගොස් ගොස් කියයි. නුවට ඔහු ගෙ බස් අසා සත් දවසක් නිරාහාර වී යැ. සත් වන දවස් උහුගෙ එක් උවටායෙක් "අපගෙ මහණු ගෙට නොඑන්නෙ අදින් සද්දා වෙයි. ලෙඩක් ඇතියෙ[15] යැ"යි හුරු මස් පිසවා බත් ගෙනැ[16] ගොස් පෙරට බිමැ බහා තිබී යැ. නුවට බත් දැකැ, "මහණ **ගොයුම්හු**, ගෙ බස් සබා වත්, මැනැවැ.[17] බොරු වත්,[18] මැනැවැ,[1] බත් කා සුවයෙන් මළ තැන් මැනැවැ"යි දෙ අත[19] දෙ දණ බිමැ ඔබා-ගෙනැ කුස් පුරා කෑ යි. ඌ දිරවන්නට නො පොහොසත් වැ ආලස්‍යයෙන් මියැ **කාලකඤ්ජක** නම් අසුර කාලයෙහි උපන්.

එකල්හි තිථයො ඔහු මළ පරිදි අසා දවස් ගැණැ බලා "මෙවූ කල සබා වී යැ, දැන් මොහු අනෙක් තැනකට ඇදැ-පියා මහණ **ගොයුම්හු** බොරුයෙන් නිගන්මහ"යි ගොස් උහු ගෙ ශරීරය[20] වැලින් බැඳැ-ගෙනැ අදනාහු, "මෙ තැනැ පියම්හ, මෙ තැනැ පියම්හ"යි යෙති. ඔවුන් ගිය ගිය තැන් එක් හෙළි වෙයි. ඔහු අදනාහු, **බීරණත්ථම්භක** නම් සොහොනට මැ ඇරැ[21] සොහොන බව් දැනැ, "බැහැරැ ඇරැ-පියම්හ" යි ඇද්දහ.[22]

---

[1] වැන්න
[2] නැක්ම
[3] ඇස, සිටි
[4] මුවය
[5] බීරස්ථම්භ
[6] උපද්දි
[7] බොව
[8] මර, හැර, බැවැර
[9] සතුරහු
[10] දුටු
[11] මැනැමැයැ
[12] සතුරන්ගෙ
[13] වටනා දෑ
[14] ගියෙයි
[15] ඇත්සේ යැයි-මු
[16] හුරුමස් සහිත බස් පිසවාගෙනැ, හුරුමස් පිසවා බත් ගෙනැ, හුරුමස් පිසවා බත් ගෙන්වාගෙනැ
[17] මැනැ
[18] බොරුබවත්
[19] බිම ඔවා (බා) ගෙන දෙඅත
[20] ශරීරයෙහි
[21] ඇදැ
[22] ඇද්දාහු, ඇද්දාහ

එකල්හි වැල් සිඳී ගියෙ. පැසුළු සොල්වන්නට නොනිසි වූහු. එහි මැ සිටැ නැවැත්තාහැ.

එකල්හි **සුනක්ඛත්තයා**, "**කොරක්ඛත්තිය** නම් නුවටහු **බීරණත්‍ථම්භක** නම් සොහොනට ඇදැ-පීහ" යනු අසා "**මහණ ගොයුම්හු** ගෙ බසැ සබව්[1] දෙකක් දුටුම්හ. මළ මිනිස්හු[2] හොත් තැනින් නැඟී අනෙකක්හු හා බණනු නම්, නොවෙයි. එබැවින් ගොස් පිළිවිසැ බලනු මැනැවැයි, ඉදින් බිණුයෙ වී නම්, යෙදෙයි. නොබිණුයෙ වී නම්, මහණ ගොයුම්හු මුසාවායෙන් නිගන්මී"[3] සොහොනට ගොස් උහු පිට අත්ලෙන් පැහැරැ, "**කොරක්ඛත්තිය**, කොහි උපන්හී?"[4] පිළිවිත්. හෙ, "**කාලකඤ්ජක** නම් අසුරා කායෙහි උපන්මී" කියා-ලා එමැ තන්හි උඩු බලා හිනැ. මළ මිනියෙක්[5] නම් නැඟී බණන්නට නිසි නොවෙයි. මෙ කිසෙ කී යැ යත්. බුද්ධානුභාවයෙන් කී යැ. බුදුහු ඔහු අසුර යොනින් ඇරැ ශරීරයෙහි පිළිමුස්වා කියැවූහු. මෙ තැනැ පෙළහර පසෙක් වී.

කිසෙ යැ යත්:

"සත් දවසින් මීයෙ" යි වදාළහැ. හෙ එසෙ මැ මෙළෙ. මෙ පළමු වන පෙළහර යැ. "ආලසායෙකින් මියෙ" යි වදාළහැ. හෙ එසෙ මැ මෙළෙ. මෙ දෙවන පෙළහර යැ. "**කාලකඤ්ජන** අසුරයොන්හි උපද්දී" වදාළහැ. හෙ එහි මැ උපනැ. මෙ තුන් වන පෙළහර යැ. "**බීරණත්‍ථම්භක** නම් සොහොනට ඇදැ-පියති" වදාළහැ. ඔහු එහි මැ ඇරැ දමාපීහ. මෙ සතර වන පෙළහර යැ. "උපන් තැනින් අවුදු **සුනක්ඛත්තයා** හා බෙණෙ"යි වදාළහැ. හෙ එසෙ මැ වි යැ. මෙ පස් වන පෙළහරයි.

මෙතෙක් පෙළහර දුටු **සුනක්ඛත්ත**, බුදුන් කරාගොස් වැඳැ එකත්පස්වැ හුන්නෙ යැ. බුදුහු, ""කියග, **සුනක්ඛත්තය** මා **කොරක්ඛත්තිය** නම් නුවටහු අරහයා කී දැ නිපන් දෑ නානිපන් දැ?" යි වදාළහැ. "නිපනැ වහන්සෙ," යි කී යැ. "මෙසෙ බැවින් උතුරු මිනිස් ධැමින් පෙළහර කරන ලද ද? නොකරන ලද ඇ?" යි වදාළහැ. "කරන ලද[6] වහන්සෙ"යි කි යැ. මා මෙසෙ පෙළහර දක්වන්නහු[7] වහන්සෙ මට උතුරුමිනිස් ධැමින් පෙළහර නොදක්වන දැ යැ'යි යෙහී?" වදාළො.

එක් සමයෙක්හි බුදුහු **විසාලා** නුවර නිසා **මහවනවෙහෙර** වැඩැ වෙසෙති. එකල්හි **විසාලා** නුවරැ[8] **කළාරමට්ඨුක** නම් නුවටෙක් ලාභයෙහි දු යශස්හි දු අග්‍රප්‍රාප්ත යැ.[9] හෙ සත් ව්‍රතපදයක්[10] සමාදන් කොටැ වැටෙයි.

කවර සත් ව්‍රතපද යැ යත්:

---

[1] සබාබව්
[2] මළමිනිස්සු හොත් තැනින් නැඟී අනිකක්හු හා බණන්නෙ නොවෙයි, මිනිසු-මු
[3] නිගන්නි
[4] උපන්නෙහි, උඑන්න හ.
[5] මිනිසෙක්-හැම "මත සරීරං-අටුවා
[6] කරවන ලද
[7] දක්වන්නාහු-හැම, දක්වන්නාහට-මු
[8] එනුවර, නුවර
[9] වෙ
[10] ව්‍රතපදයන්

“දිවි පමණින් පිළි නොහඳිමි” යනු එකෙකැ. “මෙවුන්ධම් නොසෙවෙමි”[1] යනු එකෙකැ. “රහමස්මිසැ, බත්[2] නොකමි” යනු එකෙකැ. පැදුන් දෙසෙන් **විසාලා** නුවරට නුදුරු තන්හි **උදෙන** නම් දෙවාලය ඉක්මැ නොයෙමි” යනු එකෙකැ. “දකුණු දෙසෙන් **ගොතම** නම් දෙවාලය ඉක්මැ නොයෙමි” යනු එකෙකැ. “පැල දෙසෙන් **සතඹ** නම් දෙවාලය ඉක්මැ නොයෙමි” යනු එකෙකැ. “උතුරු දෙසෙන් බහුපුත්‍රක නම් දෙවාලය ඉක්මැ නොයෙමි” යනු එකෙකැ. හෙ මෙසෙ සත් ව්‍රතපද සමාදන් දළ හෙයින් **විසාලා** නුවර වැස්සන් විසින් පුදන ලද.

එකල්හි **සුනක්ඛත්තයා** බුදුනට මෙහෙ කරනුයෙ, කළාරමට්ඨුක නම් නුවටහු කරා ගොස් තුන් ලකුණෙන් යුතු පැනැ පිළිවිතැ. හෙ දුදුළු තන්හි ගමන් යන[3] අන්ධයක්හු සෙයින් එ එ තැනැ[4] පැකිලැ ආදි අන්ත නොදැකැ ඇස් පෙරළා ඔහු බලා, නොහික්මුණු කෙරෙ වුසුයෙහි, අවසර නැති බැව් දැනැ දැනැ පැන පුළුවුස්සී” කියා, “මී නොසිට, නොසිට” යි දැහැවි යැ.[5] එකල්හි **සුනක්ඛත්තයා**, “මෙ වැනි රාත් මහණහු කෙරෙ ගැහැටිණිමි.[6] මට අකුසල් නොවෙව” යි[7] සිතා උළුල්ලෙන් හිඳැ, “වහන්සෙ, මට කමන්නෙ[8] යැ”යි කැමැවි. නුවටුදු, “මෙ තන පටන් ගෙනැ පාන නො පුළුවුස්සි දැ?යි කී යැ. “ඉතා මැනැවැ, නො පුළුවුස්මී[9]” කී යැ. “එසෙ වුව හොත් යා, කමමී”[10] නඟා යවී. **සුනක්ඛත්තයා** බුදුන් කරා එළැඹැ වැඳැ එකත්පස් වැ හුන්නෙ යැ. “කියග, මොසපුරුෂය, ‘ශාක්‍ය පුත්‍රයෙමී’ පිළින කුමට කෙරෙහී?” වදාළහැ. “වහන්සෙ, එ කුමට වදාරන දැ යැ”? යි කී යැ. “තො **කළාරමට්ඨුක** නම් නුවටහු කරා ගොස් පැන පිළිවිසැ ඔහු දහවා, මෙ රාත් මහණහු මා ඇහැවූසෙ නො යෙදෙයි. මට අකුසල් නොවෙව, යි[11] සිතීහී?”[12] වදාළහැ. “මම් නො මසුරෙහි.[13] හෙ තා ගෙ පව්ට්දිට්හ යැ.[14] තට බොහො කලක් දුකට වැටෙයි. එ පියා” යි වදාරා, “තා ‘රාත්හැ’යි[15] ගත් **කළාරමට්ඨුක** නම් නුවට මඳ දවසෙකින් මැ පිළි හැඳැ කලත්‍ර ගෙනැ රහ මස් බත් වළඳ කොටැ හැම දෙවාලය ඉක්මැ ලාභයෙන් යශසින් පිරිහී මීයෙ”යි වදාළහැ. හෙ හැම ව්‍රතපද[16] හෙද කොටැ ලාභයෙන් යශසින් පිරිහී මෙළෙ.

**සුනක්ඛත්ත**, එ පවත් අසා බුදුන් කරා ගියෙ. “කියග, **සුනක්ඛත්ත**, මම් කළාරමුට්ඨක නම් නුවටහු අරභයා යමක් කිම් ද, හෙ නිපන් ද? නොනිපන් දැ?”[17] වදාළහැ. “නිපනැ, වහන්සෙ,” යි කී යැ. ඔහු සත් ව්‍රතපදය ඉක්මැ ගිය බව් සත් පෙළහරයක් වන බැවින් “උතුරුමිනිස් ධැමින් පෙළහර කරන ලද ද? නොකරන ලද දැ”යි වදාළහැ. “කරන ලද, වහන්සෙ”යි කී යැ. “මෙසෙ මා පෙළහර කරන්නහු[18] ‘වහන්සෙ, මට උතුරු මිනිස් ධැමින් පෙළහර නොකරන් දැ යැ’යි කුමට කියහී” වදාළො.

[1] සෙවීම්
[2] රහමස් බත්-හැම
[3] යනුබැරි
[4] තැන්, තන්හි
[5] දැහැසිටිය
[6] ගැහැටිණි, ගැහැටිණීම මට, ‘ඝට්ටියිම්හ’- අටුවා
[7] නො වෙදැයි
[8] කමවන්නෙ යයි
[9] පිළිවුස්මි, පිළිවිස්මි
[10] කමටමි
[11] නොවෙයි, නොම වෙවයි
[12] සිතියැ
[13] මසුරුම්
[14] පව්ටුදිට්යහ
[15] රාතැයි, රාත්නැයි
[16] දනවුපද (පාද)
[17] නිපන්නෙ ද
[18] කරන්නා හට

එක්බිති පාථිකපුත්‍ර නම් නුවටෙක් විසාලා නුවරැ ලාභයෙහි දූ යශස්හි දූ අග්‍රප්‍රාප්ත වැ වසනුයෙ, පිරිසැ මෙසෙ කියයි: "මහණ ගොයුම් නුවණින් මැ වාද කෙරෙයි, මම ද නුවණින් මැ වාද කෙරෙමි. හෙ යොජනක් තැනැ වාස කෙරමින් සිටැ මා හා වාදයට දෙ ගව්වක් තැන් ආයෙ වී නම්, මම ද උහු කරා දෙ ගව්වක් තැන් යෙමි. එක් පියවරකුත් වඩා ගියාක් හට ජය වෙයි. නොගියාක් මට පරාජය වෙයි. දෙ දෙනමො එසෙ උතුරුමිනිස් ධැමින් පෙළහර කරම්හ. මහණ ගොයුම් උතුරුමිනිස් ධැමින් එක් පෙළහරයක් කෙළෙ වී නම්, මම ද පෙළහරයක් කෙරෙමි. හෙද පෙළහරයක් කෙළෙ වී නම්, මම් සතර පෙළහරයක් කෙරෙමි. හෙ සතර පෙළහරයක් කෙළෙ වී නම්, මම් අට පෙළහරයක් කෙරෙමි. මහණ ගොයුම් යම්තාක් පෙළහරක් කරන්නෙ වී නම්, මම් එයින් දියුණු දියුණු[1] කෙරෙමි"යි බුදුන් හා පෙළහර කරන්නට තමා නොනිසි බව් දනුතුදු, "උත්තම පුරුෂයන් හා වාද කොටැ[2] නොනිස්ස හට දු ප්‍රශංසා වෙ"යි යනු දැනැ කී යැ. නුවරවැස්සො එ අසා "තමා නොනිසි වුවහොත්, මෙසෙ ගර්ජනා නො කෙරෙයි. ඒකාන්තයෙන් මෙහිදු රාත් බන්දැ?" යි[3] ඔහට මහත් සත්කාර කොළො.

සුනක්ඛත්ත, තෙමෙහෙ, "පාථිකපුත්‍ර නම් නුවට මෙසෙ කියයි" යනු ඇසී යැ. හීනාධ්‍යාශය ඇති වන බැවින් ඔහට හීනයා දක්නා රිසි උපන්.[4] හෙ බුදුනට වතාවත් කොටැ, බුදුන් ගඳකිළියට වන් කල්හි, පාථිකපුත්‍රයා කරා ගොස්, "තෙපි මෙ නම් දැයක්[5] කියාල?" යි පිළිවිතැ. "සැබැවැ, මා එසෙ කීයෙ යැ"යි කී යැ. "ඉදින් එසෙ වී නම්, තෙපි නොබව.[6] රිසි සෙ පුන පුනා එසෙ මැ කියව. මම් මහණ ගොයුම්හු ගෙ උවටායෙක්මි. උහු ගෙ මාත්‍ර[7] දන්මි. හෙ තොප හා පෙළහර කරන්නට නො නිස්සැ. මම් මහණ ගොයුම් හට කියා භය උපදවා උහු අනෙක් තැනකට ගෙනැයෙමි. තෙප් නොබව"යි උහු අස්වසා බැණැ බුදුන් කරා ගොස්, "වහන්සෙ, පාථිකපුත්‍ර නම් නුවට, 'වහන්සෙ හා උතුරුමිනිස් ධැමින් පෙළහර කෙරෙමී' යෙ"යි කී යැ. බුදුහු, "සුනක්ඛත්ත, හෙ, 'මම් බුදුමි' යන තෙපුල් නොපියා, 'බුදුමි' යන සිත් නොපියා, 'බුදුමි' යන දිට්හ නො විහිදැ මා කරා එන්නට නො නිස්සැ. ඉදින් ආයෙ වී නම්, තුවට්යෙන්[8] වගුළ තල් පකක් සෙයින් ගෙලෙන් හිස හො කැඩී පලා යෙයි. මුදුන හො සත් කඬක් වැ පැළී යෙ"යි වදාළහැ.

එකල්හි සුනක්ඛත්ත, "වහන්සෙ, තෙලෙ බස් රක්නෙ මැනැවැ"යි කී යැ. "එසෙ කුමට කියහී?"[9] වදාළෙන් "පාථිකපුත්‍ර තෙමෙහෙ 'බුදුමි' යන තෙපුල් නොපියා, සිත් නොපියා, දිට්හ[10] නො විහිදැ, සිය වෙසින් පැනී හො, නොපැනී හො, සිහ වග්[11] ඈ වෙසින් හො, වහන්සෙ කරා ආයෙ වී නම්, භගවත්හු ගෙ[12] බස් බොරු වෙයි.

මුසාවායෙන් නිගන්මහ" යි කී යැ. මොව්හු විනා අනෙක්[13] "මුසවායෙන් බුදුන් නිගන්මහ" යි එ පන්සාලිස් හවුරුද්ද මුළුල්ලෙහි කීවාහු නැත්. ඔහු තමන් සසරැ වසන කලැ, "මහරජ, සලගල් සුළඟින් යන්නෙ වී නම්, සඳහිරු[14] දෙ දෙන බිමින් යන්නාහු

---

[1] දියුණු කොට, දියුණු දියුණු කොට
[2] වාසයට, වාදයට-මු
[3] බවදැයි, බඳැයි, වනැයි-මු
[4] උපනු
[5] දෙක්
[6] නොබවට
[7] මාත්‍රා
[8] තුවටුයෙන්, තුවටයෙන්
[9] කියහි (කීහි) දැයි
[10] දිටුහ
[11] සිංහ වක්
[12] භවත් ගොයුම්හු ගෙ භවත්හු ගෙ
[13] අනෙකෙක්
[14] හිරුසඳ හිරුසඳු

වුහු[1] නම්, හැම ගඟ හො උඩුහො බලා[2] යන්නෙ වී නම්, අහස් පැළෙන්නෙ වී නම්, මුහුදු වියළෙන්නෙ වී නම්, පොළො නස්නෙ වී නම්, මෙරගල් සහමුලින් ඉපිරැ යන්නෙ වී නම්, මම බොරු නොකියමි" යනු දක්වමින් කීහ:

**"සචෙ පවාතො ගිරිමාවහෙය්‍ය**
**චන්දෙ ච සුරියො ච ඡමා පතෙය්‍යුං,**
**සබ්බාච නජ්ජො පටිසොතං වජෙය්‍යුං**
**න ත්වෙවහං රාජ මුසා භණෙය්‍යං**
**නභං ඵලෙය්‍ය උදධි විසුස්සෙ**
**සංවට්ටයං භූතධරා වසුන්ධරා,**
**සිලුච්චයො මෙරු සමූලමුබ්බහෙ**
**න ත්වෙවහං රාජ මුසා භණෙය්‍යං"** යි.

මෙසෙ තමන්[3] පැරුම් බිමැ සිටි කලැ පවා මුසවා නොකියනුවො දැන් තමන් සව් කෙලෙස් පහා[4] සව්නෙ දැනැ බුදු වැ සිටි කලැ මුසවා කුමට කියනුවහ! "කිම, වහන්සෙ, **පාථිකපුත්‍රයා** සිත් දැනැ කියන දැ ද? නොහොත් දෙව් කෙනෙක් කීහු දැ" යි කී යැ. "මම් ඔහු සිත දතිම් මැයැ. දෙව් කෙනෙක් මට කීහු මැයැ. **ලිච්ඡවි** රජුන් ගෙ **අජිත** නම් සෙනාපතියෙක්[5] මට උපස්ථාන කොටැ මියා **තව්තිසැ** දෙව්නුවර උපනැ. එ දෙව්පුත් මා කරා අවුදු, "වහන්සෙ, **පාථිකපුත්‍ර** නම් නුවට අලජ්ජි යැ, මුසවා කියයි. මිනිස්හු මා සිරිරු හළුකිස කොටැ **පාථිකපුත්‍රයා** කරා ගොස්, 'අජිත සෙනාපති කොහි උපන්[6] හො?"යි පුළුවුත්හැ. හෙ 'මහා නරකයෙහි[7] උපැද මා කරා අවුදු මම් තොප කීවා නො කොටැ මහණ ගොයුම්හු ගෙ වාදයෙහි සිටැ නිරයැ උපන්මී' වැලැප්පැ, යි කී යැ.[8] නුවර වැස්සනට එසෙ මැ කියයි. "වහන්සෙ, මම් නිරයැ නො උපන්මි.[9] **තව්තිසැ** වැසි දෙවියන් කෙරෙහි උපන්මී. වහන්සෙ, එ නුවට 'බුද්මි'[10] යන තෙපුල් නොපියා, එ සිත් නොපියා, එ දිට්හ නො විහිදැ, භගවත්හු[11] කරා එන්නට නො නිස්සැ. ආයෙ වී නම්, ඔහු මුඳුන් සත් කඩක් වැ පැළෙ"යි කී යැ. මම ද දතිම්[12] මැ යැ. "**සුනක්ඛත්තය, විසාලා** නුවර පිඬු සැරැ පස්බතැ දිවාවිහාර සඳහා **පාථිකපුත්‍රයා** ගෙ අරමට එළඹෙමි. දැන් තට රිසියෙන්නෙ වී නම්, උහුට කියා"යි වදාළො.

බුදුහු[13] "පෙළහර කරන්නට යම්හ"යි නොකියා "දිවා විහාරයට[14] යම්හ" යනු කුමට වදාළහැ[15] යත්: හෙ බුදුන් දක්නෙ නොවෙයි. පෙළහර කොහි කෙරෙයි! එයින් එසෙ නොකියා, "දිවා විහාරයට යම්හ"යි වදාරා, **විසාලා** නුවර වැදැ අහරකිස සාහා දිවාවිහාර සඳහා බුදුහු **පාථිකපුත්‍රයා** ගෙ අරමට වැඩියො එකල්හි **සුනක්ඛත්ත**, වෙළෙව් වැ ගොස් **විසාලා** නුවරට වැදැ ප්‍රධාන **ලිච්ඡවීන්** කරා[16] බමුණු මහසල් කුලන් කරා ගැහැවි මහසල් කුලන් කරා නන් තොටුවන් කරා මහණ බමුණන්[17] කරා

---

[1] යන්නෙ වී නම්
[2] උඩු බලා, උඩුහොය
[3] තමා
[4] පහයා
[5] සෙනාධිපතියෙක්
[6] උපන
[7] මහත් නරකයෙහි
[8] වැලප වැලප කිය, වැලැපැයි කියැ
[9] නො උපන්නෙමි
[10] බුදුමි
[11] භවත්හු
[12] දනිමි
[13] බුදුන්
[14] දිවා විහාර සඳහා
[15] කුමටය යත්
[16] කරා ගොස්
[17] නන් මහණ බමුණන්

ගොස්, "බුදුහු දිවා විහාර සඳහා **පාථිකපුත්‍රයා** ගෙ අරමට එළඹියහ. වහා එයට යව, එ දෙ මහණුන්ගෙ ප්‍රාතිහාර්ය බලන්නට යැ"යි කී යැ. එකල්හි ලිච්ඡවි රජ්ජුරුවො ද බමුණුමහසල් කුලො ද[1] ගැහැවිමහසල් කුලො ද නන් තොට්ටො ද මහණ බමුණො ද **පාථිකාරාමයට** ගියො. එ දවස් එහි අනෙ සුවහස් මිනිස් පිරිසි වි යැ.

එබඳු මහත්[2] පිරිස් රැස් කරන්නට **සුනක්ඛත්තයා** හැර අනෙක් නිසි කෙනෙක්[3] ඇත්තාහු නොවෙති.[4] එයින් බුදුහු එ තාක් කල් උහු ගෙනැ ඇවිද්දො. එකල්හි **පාථිකපුත්‍ර** නම් නුවට එ පවත් අසා සිතීඃ "මම දෙවි මිනිස්නට[5] අග පුගුල් වැ සිට හවත් ගොයුම් හට විරුද්ධ වීමි. මාගෙ සතනැ රාත් බැවෙන් හො පෙළහර කරන්නට නිසි ගුණ දැහැමෙක්[6] හො නැති. මහණ ගොයුම් වනාහි පෙළහර කෙරෙයි. උහු ගෙ පෙළහර දැක මහජනයො 'තො පෙළහර කරන්නට නොපොහොසත් වූයෙහි, තා ගෙ පමණ නො දැනැ[7] ලොකයෙහි අග පුගුල් වැ සිටි බුදුන් හා සමඟ මල්ලයුද්ධ[8] කරන්නක්හු සෙයින් කුමට ගර්ජනා කෙළෙහි?" යි දඬු පහණින් මා සපති"යි.[9] මහජනා රැස් වන බව් දු[10] බුදුන් වඩනා බව් දු[5] අසා බිය පත් වැ, දෙ ගව්වක් තැන් පලා ගොස් **තිඹිරිකණුවිරිවැද්ද** අරමට වැදැ, සිතට සුව නොලබන්නෙ, සැඟවෙන තැන් සොයා වටා[11] වැදැ ඇවිදුනෙ, අරම්පසනැ[12] එක් ගහනයක් දැකැ එයට වැදැ පමණක්[13] මත්තෙ හුන්නෙ යැ.

එකල්හි බුදුහු සිතුහුඃ "ඉදින් මෙ බාල, කිසිවක්හු කියමින ගෙනැ ආයෙ වී නම්, නස්සි. එ බාල නො නසිවයි, හුන් පහණ උහුගෙ ශරීරයෙහි ඇලෙව" යි ඉටුහු ඉටු සිත් හා සමඟ එ පමණ උහු ගෙ ශරීරයෙහි ඇලිණ. මෙ හම අඳු බානෙක්හි[14] මැසුවාක්හු වැනි වී මැ යැ. පා සුන්නාක්හු වැනි වී. එකල්හි පිරිවැස්සො, "**පාථිකපුත්‍ර** කොයට ගියෙ යැ හො!" යි සොයති. උහු පස් පස්[15] ගොස් වැදැ හුන් තැන දැකැ ආ එක්තරා පුරුෂයෙක්, "තෙපි කා සොයව?" යි පිළිවිත. "**පාථිකපුත්‍රයා**, සොයම්හ" යි කීහු. හෙ **තිඹිරිකණු පිරිවැද්ද** අරම්හි හුන්නෙ යැ"යි කී යැ. එ අසා පිරිස් වැස්සෙ සා එක් පුරුෂයක්හු කැඳවා-ගෙනැ තො **තිඹිරිකණු පිරිවැද්ද** අරම්හි ගොස් **පාථිකපුත්‍ර** නම් නුවටහුට කියාඃ "තා ගෙ පෙළහර බලන්නට **ලිච්ඡවි** රජ්ජුරුවො ද බමුණු මහසල් කුලො ද ගැහැවිමහසල් කුලො ද නන් තොට්වො ද මහණ බමුණො ද තාගෙ[16] අරම්හි රැස් වූහ. බුදුහු දු දිවා විහාර කොටැ හුන්නාහ. වහා එන්නෙ යැ"යි, යවූහු.[17] එ පුරුෂ, ගොස් එ පවත් සැළ කොටැ, "එන්නෙ යැ"යි කී යැ.

එකල්හි **පාථිකපුත්‍ර**, "එමි, එමි" යි කියා එහි මැ හැලෙයි. හුනස්නෙන් නො නැංග හෙයි. එ සඳැ පුරුෂ, "තා හිද්ම[18] ඇට දක්වා පහණැ ඇලුණෙ ද? පහණ තා හිද්මෙහි

---

[1] බමුණුමහසල් කුල ද
[2] මහ
[3] කිසි කෙනෙක්
[4] ඇත්තේ නො වෙයි
[5] දෙව්මිනිස්හට
[6] දැහැමෙක්
[7] නො දැකැ
[8] මල්ලවයුද්ධ
[9] සිපති
[10] බව්නුදු
[11] වලට, වට
[12] පසතැ
[13] පහණයක්
[14] අණතෙක්හි, අනෙකෙක්හි, අනනෙක්හි අඳනෙක්-හි "අන්දුබන්ධනබද්ධො විය" අටුවා
[15] පසු පස්
[16] තමාගෙ-හැම
[17] කියා (යි) යවූහු-මු
[18] හිදුම, හිදුමෙහි

ඇලුණෙ ද? 'එම්, එම්, කියා එහි මැ හැලෙයි,[1] අස්නෙන් නොනැංගහෙයි"[2] බැණැ ඔහු නො ගෙනැ යා හී[3] තො නටියෙහි" යි ගොස් එ පවත් පිරිස්වැස්සනට කී යැ. එකල්හි බුදුහු, "හෙ මා දක්නට නො නිස්සැ, ආයෙ වී නම්, උහු මුඳුන් පැළෙ"යි වදාළො.

එකල්හි **ලිච්ඡවි** රජුන් ගෙ එක්තරා මහ ඇමැත්තෙක් හුනස්නෙන් නැඟී පිරිස් වැස්සනට[4] "කුඩා තමක් බලව, මම් උහු මෙ පිරිසට ගෙනැ **එමී**" කියා උහු[5] කරා ගොස් හැම දෙනා රැස් වූ සෙ කියා, "මහණ **ගොයුම්** අවුදු තාගෙ ගමනින් මැ තා දිනුවා[7] කරම්හ. මහණ **ගොයුම්**හු පැරැද්දා කරම්හ"යි බැණැ, නො ගෙනැ යාහී, පිරිසට ගොස් එ පවත් සැළ කෙළෙ, "**පාථිකපුත්‍ර** නටියෙ මැ යැ"යි කී යැ.

එකල්හි **බුදුහු** "හෙ මා දක්නට නො නිස්සැ, ඉදින් ආයෙ වී නම්, හිස සත් කඩක් වැ පැළෙ"යි වදාළහැ. ඉදින් **ලිච්ඡවීහි පාථිකපුත්‍රයා** වර බානෙන් බැඳැ[8] ගොනුන් සියක් වියෙන්[9] හො දසක් වියෙන් හො අදවන්නාහු වුහු නම්,[10] වර හො සිඳෙයි. බඳ තැනින් **පාථිකපුත්‍රයා** හො කැඩෙ"යි වදාළහැ.

එකල්හි **ජාලිය** නම් **දරුපත්තිකයා** අතැවැස්සෙක් සිතී: "දැන් පෙළහර තිබියෙව යි, මහණ **ගොයුම්**, '**පාථිකපුත්‍රයා** අස්නෙනුද් නො නැංග හෙ'යි කී යැ. එසෙ බැවින් මම් ගොස් කිසියම් උපායෙකින් ඔහු අස්නෙන් නඟා-පියමි. මෙ පමණෙකින් මහණ **ගොයුම්** හට පරාජය වෙ"යි සිතා හුනස්නෙන් නැඟී පිරිවැස්සනට

"කුඩා තමක් බලව, මම ගොස් උහු අළියෙම් නම්, මැනැ මැ යැ"යි[11] **පාථිකපුත්‍රයා** කරා ගොස් මහපිරිස් රැස් වූයෙ කියා, බුදුන් එමැ අරම්හි දිවාවිහාර ගත වැ වැඩහුන්සෙ කියා. "ගමනින් මැ තට ජය කරම්හ, මහණ **ගොයුම්** හට පරාජය කරම්හ"යි බැණැ "එම්, එමී" කියා උහු අස්නෙන් නො නැංග හෙනසෙ දැකැ උහු පරිභූත වූ බව් දැනැ මෙ කී යැ.

"**පාථිකපුත්‍රය**, අතීතයෙහි කෙශරසිංහරාජයෙක් හට මෙ වැනි සිතෙක් උපනැ: 'එක්තරා වනළැවකට වැදැ වාස කරන තැනක් තන් කොටැ-ගෙනැ එහි වැසැ සවස් වෙලෙ[12] එයින් නික්මැ වජඹමි,[13] වැජැඹැ හාත්පස්හි සතර දිසා බලමි,[14] සතර දිසා බලා තුන් යලක් සිංහනාද කෙරෙමි.[15] සිංහනාද කොටැ ගොදුරු සඳහා යෙමි, ගොස් උතුම් උතුම්[16] මුවමළු මරා මියුරු මියුරු මස් කා එ මැ වාසයෙහි වෙසෙමි'යි සිතී.[17] එ කල්හි සිංහරාජ එක්තරා වනළැවක් නිසා වාස කෙළෙ. එහි වාස කොටැ සවස් වෙලෙහි එයින් නික්මිණ. නික්මැ වැජැඹැ හාත්පස්හි සතර දිසා බැලී යැ. සතර දිසා බලා තුන් යලක් සිංහනාද කෙළෙ. සිංහනාද කොටැ 'ගොදුරු සඳහා යෙමි' යි ගොස් උතුම් උතුම් මුවමුළු මරා මියුරු මියුරු මස් කා එ මැ වාසයෙහි වෙසෙයි. එක් දවසක්

[1] ගැලෙහි-මු
[2] ගෙහි
[3] නො ගෙනයහී, නො නැංගියහී-මු
[4] පිරිස්නට
[5] මුහු
[6] අරම්හි
[7] දුනුවා
[8] බන්දා
[9] සත්සියයක් වියෙන්
[10] අදවන්නාහු නම්
[11] මැනැවියි
[12] වෙලෙහි
[13] වජඹිමි
[14] බලා, බලමින්
[15] කොට
[16] උතුම් වැ
[17] සිතී යැ

සිංහරාජ, ගොදුරු ගෙනැ නවත්නෙ, තමා බියෙන් බලන බලු කැණහිලකු[1] දැකැ කුළුණු කොටැ 'යහළු නො බා, සිට, තො කිනම්හි?' කී යැ. 'මම ජම්බුක නම්මි,[2] ස්වාමි යැ'යි කී යැ. 'සබඳ, ජම්බුකය, තො මෙ තන පටන්-ගෙනැ මා සැමිවටනට හැක්කෙහි දැ?' යි කී යැ. 'සැමිවටනට නිස්සෙමි, ස්වාමි යැ'යි කී යැ. හෙ එ තැන පටන්-ගෙනැ ඔහු සැමවටී[3] සිංහ, ගොදුරු කා එන්නෙ, මහත් මහත් මස්කඩ ගෙනැ එයි. හෙ මස් කා නොදුරු තන්හි පහණපිටෙකැ වෙසෙයි. හෙ කීප දවසෙකින් මැ තර වි යැ. මහත් කඳට වී එකල්හි සිංහ, ඕව්හට 'යහළු,[4] මා වජඹන කල්හි නුදුරු ත්හි සිටැ, 'හිමි වොරජ, හිමි වොරජ' යි[5] කියන්නට නිස්සෙහි දැ? යි කී. හෙ, උහුට වජඹන කල්හි එසෙ කියයි. එයින් සිංහයාට අහඞ්කාර උපද්දි.

"එක් දවසක් එ ජරසිඟල්, කෙමෙකැ පැන් බොන්නෙ තමාගෙ සෙය දිට.[6] තමාගෙ තර ශරීරයද මහත් කඳට ද දැකැ, 'මම් ජරසිගාලයෙක්මී' නො සිතා තෙමෙ මැ තම හට මෙසෙ කී යැ: 'යහළු ජම්බුක හිමි තා මෙ අත් බැවින අනුන් ඉඳුල් මස් කනු යෙදෙ ද? කිම, තො නොපිරිමියෙක් වී ද?[7] උහු දු සතර පයැ දෙ දළ යැ. දෙ කන යැ. එක් වල්පතෙකැ තට දු මෙ හැම ඇති. හුදෙක් කෙසුරුබර මත්ත නට නැත්තෙ යැ'යි උහු මෙසෙ සිතන්නා හට අහඞ්කාර උපනැ. හෙ, මන් දොසින් 'මම් කවරෙමි? එ මුව රජ කවර? මා නො ද නෑ යැ, නො ද ස්වාමි යැ, මම් ඔහට කුමට හරසර[8] දක්වමි? මම ද එක් වනළැවක් නිසා වාසයක් කොටැ-ගෙනැ වෙසෙමි. එහි වාස කොටැ සවස් වෙලෙ වාසයෙන් නික්මෙමි. වාසයෙන් නික්මැ වජඹමි. වැජැඹැ[9] හාත්පස්හි සතර දිසා බලමි. සතර දිසා බලා තුන් යලක් සිංහනාද කෙරෙමි, සිංහනාද කොටැ ගොදුරු සඳහා යෙමි. ගොස් උතුම් උතුම් මුවමුළු මරා මියුරු මියුරු මස් කා එහි මැ වාස කෙරෙමී, සිතා-ගෙනැ එ ජරසිඟල් එක්තරා වනළැවක්[10] නිසා වාසයක් කොටැ-ගෙනැ විසී යැ. එහි වැසැ සවස් වෙලෙ වාසයෙන් නික්මැ හාත්පස්හි සතර දිසා බැලී යැ. සතර දිසා බලා 'තුන් යලක් සිංහනාද කෙරෙමී' කැණහිල් හඬ හැඩී. එ[11] සෙයින් මැ තො ද නොබුදු වැ 'සීලා දි ගුණයෙන් වැඩැ සිටි[12] බුදුනට දෙම්හ' යි[13] දෙ සතර පසය වළඳා සම්මාසම්බුදුන් හා ගැහැටෙහි.[14] 'කෙසරසීරජහු[15] හා සමයෙමී සිතු ජරසිඟල් හු සෙයිනැ"යි ජාලිය නම් ආරුපත්තිකයා අතැවැසි මෙ උපමා

---

[1] කැළහිලන්
[2] නම්-මු:
[3] සැමිවැටිය
[4] යහළුව
[5] ඔරජ
[6] දුට
[7] නො පිරිමියෙක් ද
[8] හරහසර
[9] වජඹ
[10] ළැහැවක්, ළැහැබක්
[11] ඔහු එසෙයින් මැ
[12] වැඩසිටි, වැඩසිටි
[13] දෙන
[14] ගැහැටෙනහි, ගැහැටෙයි
[15] කෙසුරුසි රජහු

ඇරැ දක්වා ද, **පාථික පුත්‍ර** නම් නුවටහු එ අස්නෙන් සොලවන්නටද් නොපොහොසත් වූයෙ පිරිසට අවුදු, "පාථිකපුත්‍ර පරිභූත වී යැ. 'එමී, එමී' කියා එහි මැ හැලෙයි. හුන් අස්නෙනුදු නැඟෙන්නට නොනිස්සැ"යි කී යැ.

එකල්හි බුදුහු පිරිස්වැස්සනට, "ඉදින් **ලිච්ඡවීහි පාථික පුත්‍රයා** වරබානින් බැඳැ ඇතුන් ලවා අදවන්නාහු වුහු[1] නම්, වරබාන් හො සිඳෙයි. **පාථිකපුත්‍රයා** හො කැඩෙයි. හෙ, එ තෙපුල් නො පියා, එ සිත් නො පියා, එ දිට්හ[2] නො විහිදැ, මා කරා එන්නට නොනිස්සැ. ඉදින් ආ නම්, උහු සිත් සත් කඩක් වැ පැළෙ"යි වදාළො. වදාරා එ පිරිස් වැස්සනට ධම් දෙසූහු. එ ධම්දෙස්නෙන් සුවසුදහසක් දෙනා අධිගම කරවා[3] තෙජො ධාතු සමාපත්ති සමවැදැ සත් තලක් පමණ තැන් අහසට නැඟී අනෙක් සත් තලක් පමණ තැනට රැස් විහිදැ, දිලී,[4] දුමා මහවනවෙහෙර ගොස් වැඩැ සිටියො. **සුනක්ඛත්ත ලිච්ඡවි** වූ කල බුදුන් ගෙ මෙබඳු පෙළහර දැකැ ද තමා පින් නැති වන බැවින් දුලද ගෙනැ සඟමොක් සුව දෙන මෙ සස්නෙන් පහ වී.

මෙ සෙයින් බුදුහු තමන් පුරුෂදම්‍යසාරථී වන බැවින් **පාථිකපුත්‍රයා** ගෙ සමාගමයට රැස් වූ[5] ආදි ශබ්දයෙන් ගත් නුවටනුදු, එවුන් ලද[6] ගත් නොඑක් දහස්නුදු දමා අමාමහ නිවන් පැමිණිවූහු.

**දිගම්බරදමන නම් දහ වන පරිච්ඡේද නිමි.**

## 11. ජටිලදමන නම් පරිච්ඡේදය

**සච්චබද්ධක**[7] නම් ජටිලයා දැමූ පරිදි කිසෙයැ යත්:

**සුනාපරන්ත**[8] නම් ජනවියෙහි එක් වෙණෙඳ ගමෙකැ දෙ බෑ කෙනෙක් වූහු. ඔවුන් කෙරෙහි ඇතැම් කලෙකැ මහලු බෑ පන්සියක් ගැල් ගෙනැ ජනපදාන්තරයට ගොස් බඩු ගෙනැ එයි. ඇතැම් කලෙකැ මල් ගොස් ගෙනැ[9] එයි. එක් සමයෙක්හි මලු ගෙහි හිඳුවා පුණු[10] කෙළෙම් පන්සියක් ගැල් ගෙනැ දනවු සැරිසරමින් ගොස් සැවැත් නුවරට පැමිණැ දෙව්රම් වෙහෙරට නුදුරු තන්හි කඳවුරු බැඳැ පෙරවරු බත් කා (පරිජනයන්) පිරිවරා[11] (එපිරිස්) හා සැප තැනෙක්හි හුන්නෙ යි.

එක්බිති සැවැත් නුවරැ වැස්සො පෙහෙ වැ ගඳ මල් ගෙනැ බුදුන් කෙරෙහි බණ අසන්නට දකුණු දොරින් නික්මැ දෙව්රම් වෙහෙර[12] යෙති. හෙ, ඔවුන් දැකැ, "මොහු කොයට යෙතී?" එක් මිනිසක්හු පිළිවිතැ හෙ, "ලොකයෙහි බුදුරුවන් ධමුරුවන්[13] සඟුරුවන් උපන් පරිදි තෙපි නො දන්නා වන්ව. මොහු බුදුන් කෙරෙ බණ අසන්නට

---

1

2

3

4

5

6

7 සච්චබද්ධ සච්චබන්ධ

8 සුනාපරන්තක

9 බඩු ගෙන

10 පුණුනම්-මු

11 පිරිවරා, පිරිවර හා

12 වෙහෙරට - මු

13 අඹුදරුවන්

යෙති" කී යැ. ඔව්හට 'බුදුහ' යන තෙප්ලෙන්[1] උපන් සොම්නස් සිව්සම් ආදි[2] සිඳැ ඇටමුල්හි සිටියෙ යැ. හෙ, තමා ගෙ පරිජනයන් පිරිවරා එ පිරිස් හා වෙහෙර ගොස් මියුරු සරයෙන්[3] ධම් දෙසන බුදුන් ගෙ පිරිස් අන්තයෙහි සිටැ බණ අසා පැවිජි වියටි වී බුදුන් කල් බලා පිරිස්වැස්සනට සමු දුන් කල්හි බුදුන් කරා එළබැ වැඳැ සෙට දවසට නිමන්ත්‍රණ කොටැ දෙවන දවස් මඬුවක් කරවා අසුන් පන්වා[4] බුදුපාමොක් සඟනට[5] මහදන් දී භාණ්ඩාගාරිකයා කැඳවා, "මෙතෙක් බඩු විකිණී යැ.[6] මෙතෙක් බඩු නො විකිණී යැ.[7] මෙ සම්පත් මා[8] මල් හට දෙ"යි[9] හැම උහුට දක්වා-දී පැවිජි වැ කමටහන් ගෙනැ දවස් යවී.[10]

ඔහු මනස්කාර කරන කලැ කමටහන් මනසට නො වටහයි. එයින් ඔහු, "මෙ ජනපදය මට යොගානුකූල නො වෙයි. සියරට මැ යෙමී" සිතා පෙරවරු නුවරැ වළඳා සවස් වෙලෙහි පිළිසලනෙන්[11] නැඟි බුදුන් කරා එළබැ වැඳැ එකත්පස් වැ හිඳැ, "වහන්සෙ, මට සැකෙවින් අවවාද කරනු මැනැවැ, යම් තැනෙක්හි එකලා වැ වාස කටටියෙමී"යි කීහු. බුදුහු ඔව්නට, **"සන්ති ඛො පුණ්ණ, චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා"** යනාදි විසින් දුක්සස් සමුදසස් විසින් වට මුදුන් පමුණුවා, නිරොවසස් මඟසස් විසින් විවට මුදුන් පමුණුවා, රාත්බැවැ එවැ, ධම් දෙසුහු. මෙහි විස්තර මැදුම්සඟියැ[12] **පුණ්ණොවාද** සුතින් දන්නෙ යැ.

මෙසෙ බුදුහු පුණු මහතෙරනට සැකෙවින් ධම් දෙසා, "දැන් තා ගොස් කොහි වෙනෙහි?" වදාළහැ. වහන්සෙ, **සුනාපරන්ත** නම් ජනවියෙක් ඇති, එහි ගොස් වෙසෙමී" කීහු. "**පුණ, සුනාපරන්ත** ජනපදවාසීහි දරුණු මිනිස්හැ. ඉදින් ඔහු තට ආක්‍රොශ කෙරෙත්නම්, එ තැනැ තට කිමෙක් සිතෙ?" යි වදාළහැ. "මොහු මනා මිනිස් කෙනෙකැ. 'මිටින් මට පහර නොදෙනෙසෙ මැනැවැ'යි සිතමි; වහන්සෙ"යි කීහු. "ඉදින් උහු මිටින් පහර දුන්හු[13] නම්, එ තැනැ තට කිමෙක් සිතෙ?"යි වදාළහැ. "මොහු මනා මිනිස් කනෙකැ. 'කැටින් මට පහර නො දෙනසෙ මැනැවැ'යි සිතමි; වහන්සෙ"යි කීහු. "ඉදින් ඔහු කැටින් පහළනු නම්,[14] එ තැනැ තට කිමෙක් සිතෙ?"යි වදාළහැ. "මොහු මනා මිනිස් කෙනෙකැ. 'දඬියෙන් මට පහර නො දෙනසෙ මැනැවැ'යි සිතමි; වහන්සෙ" යි කීහු. "ඉදින් ඔහු දඬියෙන් පහළනු නම්, එතැනැ තට කිමෙක් සිතෙ?"යි වදාළහැ. "මොහු මනා මිනිස් කෙනෙකැ. 'මට සැතින් පහර නො දෙනසෙ මැනැවැ'යි සිතමි; වහන්සෙ"යි කීහු. "ඉදින් ඔහු සැතින් පහළනු නම්. එ තැනැ තට කිමෙක් සිතෙ?"යි වදාළහැ. "මොහු මනා මිනිස් කෙනෙකැ. 'තිහිණි සැතින් පැහැරැ මා දිවි නොකළවනෙස මැනැවැ'යි සිතමි; වහන්සෙ"යි කීහු. "ඉදින් තිහිණි සැතින් පැහැරැ තා දිවි ගළවත් නම්, එතැනැ තට කිමෙක් සිතෙ?"යි වදාළහැ. "ඉදින්, වහන්සෙ, **සුනාපරන්ත** ජනපදවාසී මිනිස්හු තිහිණි සැතින් පැහැරැ මසා දිවි ගළවත් නම්, ඇතැම් බුදුසවු කෙනෙක්, සිරිරුහි පිළිකුල් ඇති වැ, තමන් මරනුවන්

---

[1] තෙපුලෙන

[2] ආදිය

[3] මියුරුරසයෙන්

[4] පනවා, පණවා

[5] මහසඟනට

[6] වික්කේයැ - හැ විකිණියේය - මු

[7] ම

[8] දෙවයි

[9] විය

[10] යවති-හැම, යවයි-මු.
'කම්මට්ඨානපරායනො අහොසි' - අටුවා

[11] පිළිස ලකුණෙන්

[12] මැදුම්සඟියෙහි

[13] දුන්නාහු නමු

[14] පහළවූහු නම්, පහර ලදහු නම්.

පිරියෙස්ති.[1] මම් එ නො පිරියෙසැ මැ[2] ලදිමි' සිතමි, වහන්සෙ"යි කීහු. එ කල්හි බුදුහු තුන් යලක් සාධුකාර දී, "තො යා. **සුනාපරන්ත**[3] ජනපදයෙහි වසන්නට නිස්සෙහි. කල් දනැ"යි වදාළො.

මෙසෙ පුණු මහතෙරහු බුදුන් පෙර වැ සත් සිංහ නාදයක් කොටැ හුනස්නෙන් නැඟී බුදුන් වැඳැ, පැදකුණු කොටැ, පා සිවුරු ගෙනැ සැරිසරමින්, **සුනාපරන්ත** ජනපදයට ගොස් **අඹටපව්යෙහි**[4] බැසැ වෙණෙඳ ගම සිඟන්නට වැඩියො මල් කෙළෙඹි හැඳිනැ වළඳවා, "වහන්සෙ, බැහැරැ නො ගොස් මෙහි මැ වාස කරව"යි ගිවිස්වා-ගෙනැ එහි මැ වැසැවි[5] එයින් **මුහුදුගිරි** නම් වෙහෙරකට ගියහ. එහි යකත්[6] පහණින් බඳ සක්මනෙන් ඇති. එහි මුහුදුරළ පැහැරැ මහත් ශබ්ද කෙරෙයි. මහතෙරහු, එහි සිටැ කමටහන් මෙනෙහි කරනුවනට සැප වනු සඳහා, "මුහුදු නිශ්ශබ්ද වෙව"යි ඉටා එයින් **මයිලිගිරි** නම් වෙහෙරකට ගියහ. එහි ලිහිණියො බොහොහැ. ඔවුන්ගෙ හඬ රෑදවල් එකාබද්ධයැ. එයින් **මුහුලුඅරම්**[7] නම් වෙහෙරකට ගියහ. වෙණෙඳ ගමට නො ද දුරැ, නො ද වෙතැ, ගමනාගමනසම්පන්න යැ, විවික්ත යැ, නිශ්ශබ්ද යැ, මහතෙරහු. "මෙතන සැප යැ"යි එහි රෑවටන් දිවාවටන් සක්මන් කරවා වස් වුසුහු[8] එහි වෙසෙමින් සිටැ, පිළිසිඹියා[9] පත් රාත් වූහු.

එක් දවසක් එ මැ අතවසැ[10] පන්සියක් වෙණෙඳහු, "පර මුහුදු යම්හ"යි නැවට බඩු නැඟුහු. නැව් නැඟෙන දවස් මහතෙරුන් මල්, මහතෙරුන් වළඳවා, මහතෙරුන් ගෙන් පන්සිල් ගෙනැ, වැඳැ, යන්නෙ, "වහන්සෙ, මහමුහුදු නොහැදහිය[11] හැක්කැ. නොඑක් අන්තරාය ඇත්තෙ යැ. එක බැවින් අප සඳහන් කරන්නෙ යැ"යි කියා නැව් නැංගැ. නැව උතුම් ජවයෙන් යන්නෙ එක් දිවයිනකට සම්ප්‍රාප්ත වි යැ. "මිනිස්හු[12] පෙරවරු මෙහි බත් කැව[13] මැනවැ"යි සිතා දිවයිනට බටහැ. එහි අනෙක් දෙයෙක් ඇත්තෙ නොවෙයි, රත් සඳුන් වනයක් මිසැ යැ[14] එක් මිනිසෙක් රුකක්[15] වැහැයෙන් ඈනැ බලා රත් සඳුන් බව් දැනැ, "ඇපි ලාභ සඳහා මරපුහුදට යම්හ, මෙයට වැඩි ලාභයෙක් නැති, සතරඟුල් පමණ සඳුන් කඬෙක්[16] ලක්‍ෂයක් වටී, හරනට නිසි බඩු හැරැ-පියා සඳනෙත්[17] පුරම්හ"යි කී යැ. "ඉතා මැනැවැ"යි ඔහු සතුටු වැ හළ මනා බඩු හැරැ නැව සඳනෙන් පිරුහැ.

එ සඳුන් වනයෙහි අමනුෂ්‍යයො ඇහැවැ, "මොවුන් විසින් අප ගෙ සඳුන් වනය නසනදල. මොවුන් මරම්හ"යි සිතා "මෙහි මැරු කලැ හැම වන එක්[18] කුණු රැසෙක් වෙයි. මුහුදුමැදැ මොවුන් ගෙ නැව ගලා-පියම්හ"යි කීහු. ඔවුන් නැවට නැඟි මඳක් සැඳින් එහි අමනුෂ්‍යයො මහමුහුදු උපැරළගල[19] කොටැ, තුමූහු දු භයානක රූප දැක්වූහ. බිය පත් මිනිස්හු දු තමන් තමන් ගෙ[20] දෙවියන් වැඳැ අයජති. මහ තෙරුන්

[1] පිරිස්සති
[2] පිරියැස මැ
[3] තො සූනාපරන්ත
[4] අඹැට, අපටපව්යෙහි
[5] වැස්වි
[6] සතන්, සතක්, යකක්
[7] මුළු අරම්
[8] දවස් යවූහු, දවස් වුසුහු
[9] පිළිසැඹියා
[10] ඇතවැස, ඇතවැසි, අතවැස
[11] හැදවිය, හැදවිහිය
[12] එහි (ඒ) මිනිස්සු
[13] කෑ
[14] මිසයැයි හැම
[15] එකක්
[16] කදෙක්
[17] සඳුනෙන්
[18] එක
[19] උප රළගත (රළගළ)
[20] තම තමන්ගෙ

මල් කෙළෙඹි, “ම-බෑණො[1] මට වහල් වෙත්ව”යි මහතෙරුන් සඳහන් කෙරෙමින් සිටියෙ යැ. මහතෙරහු දු එ මැ කෙණෙහි අවජනාහු, ඔවුන් වසන් පත් බව් දැනැ අහසින් එයට ගියහ. අමනුෂ්‍යයො මහතෙරුන් දක්මින් මැ[2] “අප වත්හිමියො පුණ්‍ණ මහතෙරහු වැඩියහ”යි පහ වූහු. උත්පාත[3] සන්හිනැ. මහතෙරහු, “නොබව, නොබව” යි ඔවුන් අස්වසා, “කොයට යාටියා ද?” යි[4] පුළුවුත්හැ. “වහන්සෙ, අපගෙ තැනට මැ යම්හ” යි කීහු. මහතෙරහු නැව් හිසැ ලැ[5] ඇක්මැ, “මොවුන් කැමැති තැනට යෙව”යි ඉටුහ. වෙණෙඳො තමන්ගෙ තැනට ගොස් එපවත් අඹු දරුවනට කියා, “එව, මහතෙරුන් සරණ යම්හ”යි පන්සියො මැ[6] තමන්ගෙ පන්සියක් මාගමුන් හා සමඟ තෙසරණ පිහිටා උපාසක වූහු.

එක්බිති නැවැ බඩු බහා මහතෙරනට කොටසක් තබා “වහන්සෙ, මෙ තොප ගෙ කොටසැ”යි කීහ. මහතෙරහු, “මට වෙන කොටසින් කම් නැති, බුදුන් දුටුවීරුහු දැ?” යි[7] කීහ. නුදුටුවිරුම්හ,[8] වහන්සෙ” යි කීහු. “ඔස, මෙයින් බුදුනට ගඳකිළියක්[9] කරව.[10] එසෙ වන්නා හා බුදුන් දක්ව”යි කීහ. ඔහු, “ඉතා මැනවැ, වහන්සෙ”යි එ කොටසිනිදු තමන්ගෙ කොටසිනිදු ගඳකිළි කරන්නට[11] පටන් ගත්හ. බුදුහු ආරම්භයෙහි පටන්-ගෙනැ පරිභොග කළහැ. රක්නා මිනිස්සු රෑ බුදුරස් දැකැ, “මහානුභාව දෙවි කෙනෙකැ”යි සිතුහු. උපාසක වරහු බුදුන් වසන ගඳකිළිය ද සඟුන් වසන සෙනස්න ද නිමවා දානයසම්භාර සරහා තබා, “වහන්සෙ, ඇපි අප විසින් කළ මනා දැ කළම්හ. බුදුන් වහන්සෙ වඩනට කලැ”යි කීහ. මහතෙරහු සවස් වෙලෙහි ඉදුහයෙන් **සැවැත්** නුවර ගොස්, “වහන්සෙ, වෙණෙඳගම්වැස්සො දැකැ වැන්දැටියහ.[12] ඔවුන් ගෙ මනදොළ පිරෙනු මැනැවැ”යි බුදුන් අයජියහැ. බුදුහු ඉවසූ දැ යැ. මහතෙරහු තමන් වසන තැනට මැ එළඹියහැ. බුදුහු[13] අනඳ මහතෙරුන් කැඳවා, “අනඳ, සෙට **සුනාපරන්ත** ජනපදයෙහි වෙණෙඳගමැ සිඟන්නට යම්හ. තො උනුපන්සියක් සඟනට[14] ලහා දෙ”යි වදාළො. මහතෙරහු. “ඉතා මැනැවැ; වහන්සෙ”යි සඟනට එ පවත් සැල කොටැ,[16] “අහසින් ඇවිදුනත් ලහා ගන්නෙ මැනැවැ”යි කීහැ.

එ දවස් **කුණ්ඩධාන** මහතෙරහු පළමු ලහා ගත්හ. වෙණෙඳගම්වැස්සො ද, “සෙට බුදුහු වඩත් ල”යි ගම මැදැ මඩුවක්[17] කොටැ උඩ විසිතුරු වියන් බැඳැ ගඳදම්[18]මල්දම් රුවන්දැමින් රන්තරු රිදීතරු මිණිතරුයෙන් වියන් සාදා බිම සිව්දැගඬින් පිරිබඩ ගෙනැ[19] මහරහ අසුන් පැන්වූහු. බුදුහු උදය මැ සිරිරු පිළිදැගිලි කොටැ ගඳකිළියට වැදැ පලසමවත් සමවැදැ වැඩහුන්හැ. **සක්** දෙව්රජහු ගෙ පඬු ඇඹුල් සල අස්න හුණු වි යැ. හෙ, “මෙ කිමෙකැ හො!”යි අවජනෙ බුදුන්ගෙ **සුනාපරන්ත** ජනපදයට ගමන්

---

[1] බෑයාණො
[2] දැක්මෙන්ම
[3] උත්පාතය
[4] යටියාදැයි, යායටිදැයි, යාටිහුදැයි-මු:
[5] නැව්හි සැළ, නැව්හි සල, නැව්හි සළා-මු: නැව්හි පල-මු: “නාවං පණෙ (එලෙ) අක්කමිත්‍වා” - අටුවා
[6] පන්සියය මැ
[7] දුටුවාහු දැයි, දුටුහාවිරුහුදැයි, දුටුවාවිරුහුදැයි
[8] නුදුටුවිරුහ
[9] ගදකෙළියක් “මණ්ඩලමාලං” - අභිඅටුවා
[10] කරවට
[11] කරවන්නට
[12] වැදැ සිටියහ.
[13] බුදුන්-මු
[14] රහත් සඟනට
[15] දෙවයි
[16] සැළකළහ
[17] මහ මඩුවක්
[18] ගඳදුම්
[19] කොට

දැකැ **විස්සම්**[1] දෙව්පුත්හු කැඳවා “පුතැ, අද බුදුහු තුන්සියක් යොදුන් තැන් සිඟන්නට වඩති.[2] පන්සියක් කූටාගාර[3], මවා[4] **දෙව්රම්** දොරොටු මුදුනෙහි සරා තබ”යි[5] කී යැ. හෙ අවුදු රුවන්මුවා පන්සියක් කූටාගාර මැවී යැ. බුදුනට කූටාගාර[6] සතරමුණැ.[7] දෙ අගසව්වනට දෙමුණැ. සෙස්සනට[8] එක්මුණැ. මෙ සෙයින් නිර්මිත යැ කූටාගාර.* බුදුහු ගඳකිළියෙන්[9] නික්මැ පටිපාටීන්[10] සිටි කූටාගාරයන් කෙරෙහි ප්‍රධාන කූටාගාරයට වන්හැ. දෙ අගසව්වන් පටන් කොටැ එකුන්[11] පන්සියක් සඟහු දු කූටාගාරගත වුහු. එකෙක්[12] සිස් කූටාගාරයෙක් වි යැ. පන්සියක් කූටාගාරයො අහසින් ගියහැ.

[1] විස්කම්
[2] වඩිති
[3] කූටාගාර ගෙවල්
[4] නිමවා ‘මාපෙත්වා’-අටුවා
[5] තබවයි
[6] කූටාගාරය
[7] සතර මුහුන
[8] සෙස්නට-මු
[9] ගඳකිළින්
[10] පටිපාටියෙන්
[11] එකනු
[12] එකක්, එක්-මු “මෙසෙයින් නිර්මිත කූටාගාරය(ට) -පොත්, අටුවායෙහි නැතියෙන් අධිකයෙකි.

බුදුහු අතරමඟැ සච්චබද්ධ නම් පර්වතයකට පැමිණැ කූටාගාර අහසැ සිටුවා බැසැ, ඒ පර්වතයෙහි මිසදිට්හ[1] ගත් ජටිලයෙක් මහජනා මිසදිට්හ[1] ගන්වා ලාභයෙහි දු යශස්හි දු අග්‍රප්‍රාප්ත වැ වෙසෙයි. ඔහු ළෙහි ඇතුළු සැළැ පහනක් සෙයින් රාත්බවට උපනිඃශ්‍රය දිලියෙයි. ඔහු දැකැ, “මොව්හට ධම් දෙසුව මැනැවැ”යි ගොස් දුලඳු[2] බිඳැ ධම් දෙසුහැ. තවුද් දෙසුන් අවසන්හි රාත් වැ එහි භික්ෂුභාවයෙන්[3] පැවිජි වැ හිස් වැ ආ කූටාගාරයට වනැ.[4]

බුදුහු කූටාගාරගත වූ පන්සියක් රාත් සඟුන් හා සමඟ වෙණෙඳ ගම් ගොස් කූටාගාරයන් අතුරුධන් කොටැ වෙණෙඳ ගම් වන්හැ. වෙණෙඳො මඩුයෙහි පැන් වූ අස්නෙහි බුදුපාමොක් සඟුන් වඩා හිඳුවා මහදන් දී බුදුන් මුහුලු අරම් වැඩුහැ. බුදුන් ගඳකිළියට වැදැ සැතපි වැඩැ හුන් කල්හි මහාජනයො බත් කා පෙහෙ වැ බොහො ගඳ මල් ගෙනැ බණ අසන්නට අරම් ගියො.[5] බුදුහු ධම් දෙසා මහජනා සසරින් මුදුහ.[6] මහත් බුද්ධකොලාහල වි යැ. බුදුහු මහජනා හට වැඩ සඳහා කිහිප දවසක් එහි මැ වුසුහැ. අරුණු වනාහි දෙව්රම් වෙහෙරැ මහ ගඳකිළියැ නැඟුහැ. එහි කිහිප දවසක් වාස කොටැ වෙණෙඳ ගම්හි වළඳා “තො මෙහි මැ වාස කරා”යි පුණු මහතෙරුන් නවතා, අතුරෙහි නර්මදු නම් හොයෙක් ඇති, එ හො-තෙරට වැඩියහැ. මෙය නර්මද[7] නම් නාගරාජ,[8] බුදුන් පෙරමඟට අවුදු නාග භවනයට වඩා ඇරැ තුණුරුවනට මහත් සත්කාර කෙළෙ. බුද්හු ඔහට ධම් දෙසා නාගභවනයෙන් නික්මුණුහු.[9] හෙ “වහන්සෙ, මා පුදන දැයක්[10] දෙන්නෙ යැ”යි අයජි යැ.

බුදුහු කැළණි ගඟැ මිණිඇසි[11] නාරජ හට සෙයින් නර්මදා නදී තීරයෙහි[12] පදලස් දැක්වූහු. හෙ රළ ආ කලැ මුවහ වෙයි. ගය කලැ විවර වෙයි. මහාසත්කාර ප්‍රාප්ත වී යැ. බුද්හු

---

[1] මිසදිටුහ
[2] දුලැඳ, දුලඳ, දුලද්
[3] එහි භික්ඛුභාවයෙන්
[4] වන්හ
[5] ගියහ
[6] මිදුහ
[7] නර්මදා, නිර්මදා
[8] නාරජ
[9] නික්මුණහ
[10] දෙයක්
[11] මිණිඅසි
[12] නර්මදතීරයෙහි

එයින් නික්මැ සච්චබද්ධ පර්වතයට ගොස් සච්චබද්ධ මහ තෙරනට "තා විසින් මහාජනයො අපාය මඟට පමුණුවන ලදහැ. තො මෙහිමැ වාස කොටැ ඔවුන්ගෙ දුලදු විහිද්වා නිවන්මඟැ පිහිට්ව"[1] යි වදාළහැ. ඔහුද් පුදන්නට නිසි දැයක් ඉල්ලුහු. බුදුහු ගන ගල් පිටැ, අලුත් මැටිකඩෙක්හි[2] එබු හසක් සෙයින්, පදලස් පෙන්වුහු. එයින් දෙව්රම් වෙහෙර මැ වැඩියො.

මෙ සෙයින් බුදුහු තමන් පුරුෂදම්‍යසාරථී වන බැවින් සච්චබද්ධ නම් ජටිලයා හා ආදි ශබ්දයෙන් ගත් උරුවෙල් කසුබු ඈ ජටිලයනුදු දමා අමා මහනිවන් පැමිණිවූහු.

**ජටිලදමන නම් එකොළොස් වන පරිච්ඡේද නිමි.**

## 12. තාපසදමන නම් පරිච්ඡේදය

බාවරික[3] නම් මහතවිසා[4] ඇමූ පරිදි කිසෙ යැ යත්:

අතීතයෙහි බරණැස් නුවර වැසි එක් රුක්වඩියෙක්[5] වාස්තු විද්‍යායෙහි[6] ශික්ෂිත වියැ. ඔහු අතැවැස්සො සොළොස් දෙනෙක් වූහු. එකක්[7] එකක්හුගෙ දහස් දහස් අතවැස්සො වූහැ. මෙසෙ ඔව්හු සොළොස් දහස් සතළොස් දෙනෙක් වූහු. ඔහු හැමදෙන බරණැස් නිසා වැටෙන්නාහු, ගල්පාතට ගොස් රුක් කපා දැව සැසැ, එ එ ගෙට නිසි කොටැ වන ළැයෙන්[8] ගෙනැ පසුරු බැඳැ ගඟින් බරණැසට ඇරැ, රජ කැමැති වී නම්, ඔහට එක් බුමු කොටින්[9] හො යාවත් සත් බුමු කොටින්[7] හො, පහා යොදා දක්වා දෙති. රජ නො කැමැති වී නම්, සෙස්සනට විකොට[10] අඹුදරුවන් පුසිත්.[11] මෙසෙ වැටෙමින් සිටැ වල් ගිය කලැ එක් දවසක් ඇදුරු වඩු, "හැම කල් මැ වඩුකම් කොටැ වැටෙන්නට දුකැ. මහලු කලැ නොද කට හැක්කැ"යි සිතා අතැවැස්සනට "දරුයෙනි,[12] මෙ දුඹුල් ඈ හර නැති රුක් ගෙනැ එව" යි කී යැ. ඔහු "මැනැවැ"යි අලහැ. හෙ එහි දඬියෙන් ලිහිණියක්හු කොටැ උහු ගෙ කුසට වැදැ යන්ත්‍ර පිරී යැ. දඬුලිහිණි ගුරුළු රජක්හු සෙයින් අහසට නැඟී වනමුදුනෙහි ඇවිදැ අතවැස්සන් පෙරට බට.

එකල්හි ඇදුරු වඩු "දරුයෙනි,[10] මෙබඳු කාෂ්ඨවාහන කොටැ මුළු දඹදිව රජය ගත හැක්කැ. තෙපි දු[13] මෙසෙ මැ කරව. රජය හැර-ගෙනැ වැටෙම්හ. වඩුකැමින් වැටෙන්නට දුකැ"යි කී යැ. ඔහු එසෙ මැ කොටැ ඇදුරු වඩු හට[14] දැක්වූහැ. "දරුයෙනි,[10] කවර රජය ගන්මහ?"යි කී යැ. "බරණැස් රජය ගන්මහ"යි කීහ. "හෙ මට

---

[1] පිහිටුවයි, පිහිටවායි
[2] මැටිකඩෙහි
[3] බාවාරික, බාවාතික
[4] නම් තවුසා
[5] වැඩියෙක්, වඩුයෙක්
[6] වස්තුවිජ්ජා (විජ්‍යා) යෙහි
[7] එහි එකක්
[8] වනලාසන්, වතලායන්, වතලාසන්, වනලා, වැනලායෙන්-මු:
[9] කොටින්වත්
[10] විකුට
[11] පුසුත්
[12] දරුවෙනි, දැරියෙනි-මු
[13] තෙපි තෙපි දු
[14] වඩුවහට

නො රිසියෙයි. අප එ රජය ගත් කලැ, ‘වඩුරජ, වඩු යුවරජ යන දැ වෙයි. දඹදිව් මහතැ. අනෙක් තැනකට යම්හ”යි අඹු දරුවන් හා සමඟ කාෂ්ඨවාහන[1] නැඟි සරහා ගත් ආයුධ ඇති වැ හිමවු දසට ගොස් හිමවුයෙහි එක්තරා නුවරකට වැදැ රජගෙහි බැසැ සිටියො.[2] ඔහු එහි රජය ගෙනැ ඇදුරුවඩුවා රජ කළහැ. හෙ “කාෂ්ඨවාහන රජ” යි පාළ වි යැ. එ නුවර ද ඔහු විසින් ගත් වන බැවින් කාෂ්ඨවාහන නුවර නම් වි යැ. එ සෙයින් මැ සියලු රට දු කාෂ්ඨවාහන රට නම් වී.

එ රජ ධැමිටි[3] වි යැ. එසෙයින් මැ යුවරජ දු ඇමැති තන්හි තුබූ සොළොස් අතැවැස්සො ද ධැමිටි වූහු. රජු[4] විසින් සතර සඟා[5] වතින් සඟරා කරන ලද[6] එ රජය ඉතා සමෘද්ධ වී යැ. නිරුපද්‍රව වී. නුවර වැස්සො ද රටවැස්සො ද “භද්‍ර රජකු ලදුම්හැ. භද්‍ර රජපිරිසකුදු ලදුම්හ”යි රජු කෙරෙහි දු[7] රජපිරිස් කෙරෙහි දු මමත්ව කොළො.

එක් දවසක් මධ්‍යදෙශයෙහි සිටැ වෙණෙඳො බඩු ගෙනැ කාෂ්ඨවාහන නුවර[8] අවුදු පඬුරු ගෙනැ ගොස් රජු දුටහ.[9] රජ, “කොහි[10] සිටැ ආව?”යි[11] කී යැ. ‘බරණැසැ[12] සිටැ ආම්හ”යි කීහැ. හෙ එහි[13] හැම පවත් පිළිවිසැ “තොප ගෙ රජු හා මා හා මිත්‍රකම් කරව”යි කී යැ. ඔහු “ඉතා මැනැවැ”යි ගිවිස්සහැ. ඔවිනට සඞ්ග්‍රහ කොටැ, බඩු පෙරළා ඔවුන් යන කලැ එසෙ මැ කියා නඟා යවී යැ. ඔහු බරණැස් ගොස් රජ හට සැල කළහ.[14] රජ, ඉතා මැනැවැයි, කාෂ්ඨවාහන රටැ සිටැ ආ වෙණෙඳනට අද පටන්-ගෙනැ සුංවත්[15] හළමී” බෙර පියෙවි කරවා, “කාෂ්ඨවාහන මට මිත්‍ර වැ වැටෙව”යි[16] දෙදෙන නොදැක මිත්‍ර වූහු. කාෂ්ඨවාහන දු “බරණැසැ සිටැ ආ වෙණෙඳන් ගේ[17] සුංවත් හළමී” නුවරැ බෙර පියෙවි කරවි යැ. ඔවිනට සඞ්ග්‍රහ ද කෙළෙ.

එක්බිති බරණැස් මහරජ කාෂ්ඨවාහන රජ හට පත් දෙන්නෙ, “ඉදින් එ දනවියැ දක්නට හො අසන්නට නිසි කිසි ආශ්චර්යයෙක් ඇත් නම්, අප දක්වන්නෙ යැ. අසවන්නෙ යැ”යි[18] කී යැ. කාෂ්ඨවාහන දු බරණැස් රජ හට එසෙ මැ කියා යවී. මොවුන්[19] මෙසෙ ව්‍යවස්ථා කොටැ වැටෙන කල්හි එක් දවසක් කාෂ්ඨවාහනය හට ඉතා සියුම් අනැඟි අට පලසෙක් උපනැ. ළහිරි රස්කලබක් වැනි මැයැ.[20] මුරුතමල් කලබක් වැනි මැයි. රජ එ දැකැ, “මා-සබඳ රජ හට දී යවුව මැනැවැ”යි සුවරුවන් ලවා අට දළ කරඬුවක් ලියවා එකෙකි කරඬියෙහි[21] එකෙකි පලස් තබා, පියන් ගන්වා, පිටතැ ලාවට සෙයින් ලාකම් කරවා, අට ලාවට සුමුගෙකැ[22] තබා, පිළින් වසා,

1. කාෂ්ටවාහනයට-මු
2. රජයගත්හ
3. ධැමිටු
4. රජහු
5. සඞ්ග්‍රහ
6. ලදු, ලද්
7. රජපිරිසිදු
8. නුවරට
9. දුටුහ, දුටුහ
10. කුහි, කොයි
11. අවයි
12. බරණැස් නුවර
13. එහි හෙ
14. මෙ (එ) පවත් සැළකළහ.
15. සුක්වත්, සුන්ගත් සුන්වත්, සුත්වත්, සුවත්
16. මිත්‍රයයි වැටෙයි, මිත්‍ර වේව යි-මු
17. වෙණෙඳන්ගෙන්
18. අස්වන්නේ යයි
19. මොහු
20. වැනිවිය
21. කරඬුයෙහි
22. අට සුමුගෙක-මු

රජමුඳුනෙන්[1] හස් කොටැ, "බරණැස් රජ හට දෙව"යි, "මෙ පඬුරු නුවර මැද ඇමැත්තන් පිරිවරා හිඳැ බලන්නෙ යැ"යි පත් දී යවී.[2] ඔහු ගොස් රජ හට දුන්හු.

හෙ පත්[3] කියවා ඇමැත්තන් රැස් කරවා-ගෙනැ නුවර මැද රාජාඞ්ගනයෙහි හිඳැ හස් හැරැ වසුන් හැරැ සුමුග විවර කොටැ අට ලාවට දැකැ, "ම-සබඳ ලාවටින් කෙළෙනා දරුවනට සෙයින් මට ලාවට දී එවූයෙ යැ"යි රැණිවැ[4] එක් වටක් තමා හුන් අස්නෙහි පහළ. එකෙණෙහි ලා නැඟි ගියෙ. දළකරඬුව විවර වි යැ ඇතුළතැ තුබූ පලස දැකැ, තුබුවා ද විවර කොටැ බලනුයෙ, එමැ සෙමැදිට එකෙකි පලස් දිග සොළොස් හතැ. පළල අට හතැ. පලස් විජහා-පී[5] කලැ සියලු රාජාඞ්ගන ළහිරු රසින් දිලියෙන්නාක් වැනි වි යැ. රජ අක්කැමියන්[6] ගෙන්වාගෙන එකෙකි පලසැ මිල බැලැවි යැ. හැම පලස මැ අමූල්‍ය වී.

එකල්හි රජ, "පසු වැ පඬුරු දෙනුවන් විසින් පෙරට වැ දුන් පඬුරට විගුණ[7] කළ මැනැවැයි ම-සබඳ හට කුමක් දී යවමී!" සිතී. එ සමාහි කසුබු සම්මා සම්බුදු උපදැ බරණැසැ වෙසෙති. එකල්හි රජ, "තුණුරුවනට වැඩි අනෙක් උතුම් රුවනෙක් නම් නැති. තුණුරුවන් උපන් බවම-සබඳ හට කියා යවමී" සිතී. හෙ, "බුදුහු ලොකයෙහි උපන්හැ, හැම සත්නට වැඩ සඳහා යැ. දහම් ලොකයෙහි උපනැ. හැම සත්නට සුව[8] සඳහා යැ. සඟහු ලොකයෙහි උපන්හැ, උතුම් පින්කෙත් වී යැ"යි[9] රන් පතැ දැඟිගුලෙන් ලියවා, සතුරුවන් මුවා සුමුගෙකැ තබා, එ සුමුග මිණිමුවා සුමුගෙකැ තබා, ඒ සුමුග මරාමිණිමුවා සුමුගෙකැ තබා, ඒ සුමුග පියුම්රා මිණිමුවා සුමුගෙකැ තබා, එ සුමුග රන් මුවා සුමුගෙකැ තබා, ඒ සුමුග රිදීමුවා සුමගෙකැ තබා, ඒ සුමුග දළමුවා සුමුගෙකැ තබා, ඒ සුමුග සඳුන්මුවා සුමුගෙකැ තබා, ඒ සුමුග වේවැල්[10]-සුමුගෙකැ තබා, ඒ සුමුග පිළින් වසා, හස් කොටැ, මඟුල් ඇතු සව්බරණින් සදා, ඔහු පිටැ පලග' පන්වා, පලග මත්තෙ සුමුග තබා, සෙ-සත නඟා, ගඳින් මලින් පුදමින්, පසඟතුරු රැවින් පුද කරවමින්, තියුගී කියවමින්, තමාගෙ රාජ්‍ය සීමා දක්වා මඟ සදවා[11], තෙමෙ මැ ගොස් එහි සිටැ, හාත්පසැ රජනට පඬුරු දී, "මෙ නියායෙන් සත්කාර කොටැ මෙ පඬුරු දී යවන්නෙ යැ"යි පත් දිනැ. එ[12] අසුන් අසා රජහු පෙරමඟට අවුදු **කාෂ්ටවාහනයා** ගෙ රාජ්‍යසීමා දක්වා පුදමින් ගෙනැ ගියො.

**කාෂ්ඨවාහන** රජ දු අසා පෙරමඟට අවුදු, එසෙයින් මැ පුදමින් නුවරට ඇරැ, ඇමැත්තනුදු නුවර වැස්සනුදු රැස් කරවා-ගෙනැ, රාජාඞ්ගනයෙහි තබා වැසු[13] පිළී හැරැ සුමුග විවර කොටැ, එහි තුබූ සඳුන් සුමුග විවර කොටැ දළසුමුග දැකැ, ක්‍රමයෙන් හැම සුමුග[14] විවර කොටැ, රන් පත ගෙනැ කියවා, තුණුරුවන් උපන් බව් දැනැ, "ම-සබඳ කප්සුවහස්හිදු දිලිබු[15] බුදුරුවන් පඬුරු දී එවී යැ"යි සතුටුවැ, "මා

[1] මුන්ද්නෙන්-මු
[2] පත් යවී
[3] පවත්
[4] හානි වැ-හැම
[5] විජහාපූ
[6] අරක්කැමියන්
[7] ද්විගුණ කොට
[8] වැඩ
[9] පින් කෙත් ව සිටියේ යයි
[10] වේවැල්මුවා
[11] සදවමින්
[12] හෙ
[13] වැසි
[14] සුමුගු-මු
[15] දිලිබු, දිලුබ්

ගොස් බුදුන් දුට මැනැවැ. බණ ඇසුව[1] මැනැවැ"යි සිතා ඇමැත්තන් කැඳවා-ගෙනැ, "තුණුරුවන් ලොකයෙහි උපනැ,[2]

කුමක් කළ මැනැවැ"යි කී යැ. "මහරජ, තෙපි මෙහි මැ හිඳුව. ඇප් ගොස් අතුරු දහන්මහ"යි සොළොස් දහසක් දෙනා පිරිවරා සොළොස් ඇමැත්තො රජු වැඳැ, "ඉදින් බුදුහු[3] ලොකයෙහි උපන්හු නම්, වටා ලා දැකුම් නැති. නොඋපන්හු නම්, එම්හ"යි නික්මුණුහු.[4] රජු බැනෙක් පසු වැ රජු වැඳැ, "මම දු යෙමි" කී යැ. "තො බුදුන් උපනහොත්, අවුදු මට කියා"යි කී. හෙ "මැනැවැ"යි ගිවිසැ ගෙනැ ගියෙ.

ඔහු හැම දෙ මැ හැම තන්හි එකෙකි රැ වෙසෙමින් බරණැසට පත්හැ. ඔවුන් නොවදනා[5] තුරු මැ බුදුහු පිරිනිවයො. ඔහු, "බුදුහු කොහි යැ? කොයට වැඩියහ?"යි වෙහෙර ඇවිදුනාහු,[6] සඟුන් දැකැ පුළුවුත්හැ. ඔහු බුදුන් පිරිනිවයෙ කීහ. "අහො පිරිහුණම්හ![7] දුරු කතර ගෙවා අවුදු බුදුන් දක්නා පමණකුදු නො ලදුම්හ"යි[8] වැලැපැ වැහැසැ, "කිම, වහන්සෙ බුදුන් දුන් ඔවා යැ?" යි පුළුවුත්හැ. "ඇති, උපාසකයෙනි, තෙසරණැ පිහිටිය යුත්තෙ යැ. පන්සිල් සමාදන් විය යුත්තේ යැ. පෙහෙවස් විසිය යුත්තෙ යැ. දන් දිය යුත්තෙ යැ. පැවිජි විය යුත්තෙ යැ"යි කීහු.

ඔහු එ අසා රජු බැනා[9] මිසැ හැම දෙන පැවිජි වූහු. බැනෙ[10] පරිභොගධාතු ගත. පරිභොගධාතු නම්: මහ බො රුකැ; පාසිවුරු ආදි යැ. මෙ වනාහි බුදුන් ගෙ ඩබරාව දු මහබොපල දු වනදහම්[11] ධරා සිටී. මහතෙරකෙනකුදු ගෙනැ නික්මැ ක්‍රමයෙන් කාෂ්ඨවාහන නුවර ගොස්, "බුදුහු ලොකයෙහි උපන්හැ. පිරිනිවියහ" යි රජ හට කියා බුදුන් දුන් ඔවා[12] කී යැ. රජ මහතෙරුන් කරා එළබැ බණ අසා වෙහෙර[13] කරවා දාගබ්මහබො පිහිට්ටා,[14] තුන් සරණැ දු පන්සිලැ දු පිහිටා පෙහෙවස් වෙසෙමින්, දන් දෙමින් ආ පමණින් සිටැ, දෙව්ලොවැ උපනැ. එ සොළොස් දහසක් පැවිජියො ද පුහුදුන් වැ මියැ එ රජ හට පිරිවර වැ උපන්හු.[15]

හෙ[16] එක් බුදතුරක්[17] දෙව්ලොවැ ගෙවා, අප බුදුන් උපදනා පෙරට දෙව්ලොවින් සැවැ, මහකොසොල් රජුගෙ[18] පෙරෙවි බමුණ හට[19] දරු වැ උපනැ. නැමින් බාවරි[20] නම් වියැ. තුන් මහාපුරුෂ ලක්‍ෂණයෙකින් උපෙත යැ. තුන් වෙදයෙහි පාරයට ගියෙ යැ. පිය බමුණා ඇවෑමෙන් පෙරෙවි තන් පත.

සෙසු සොළොස් දහස්හුදු එ සැවැත් නුවරැ මැ බමුණු කුලෙහි උපන්හැ. ඔවුන් කෙරෙහි සොළොස් දෙට අතැවැස්සො බාවරිහි කෙරෙහි ශිල්ප උගත්හැ. තුබු

---

[1] අසනු
[2] උපන්හ
[3] බුදුන්
[4] නික්මුණහු
[5] ගොස් නොවදනා
[6] ඇවිදුනා
[7] පිරිනිවියෝ
[8] පිරිහුණුහැ, පිරිහිණහ, පිරිහුනුම්හ-මු
[9] නොලදම්හ
[10] බැණො
[11] බණදහම්
[12] බුදුන් ඔවා
[13] වෙහෙරක්-මු
[14] පිහිටුවා
[15] පිරිවර උපන්හු
[16] ඔහු-හැම
[17] බුදුතුරක්
[18] රජ මහ කොසොල් ගෙ, රජ මහකොසොල් රජු ගෙ
[19] බමුණ, බමුණු, බහුණා-මු
[20] බාවාරි, බාවාරික

සොළොස් දහස්හු දූ ඔවුන් කෙරෙහි උගත්හු.[1] මෙසෙ ඔහු හැම දෙන පුන දූ එක් වැ වුසුහු.[2]

**මහකොසොල්** රජ මෙළෙස[3] ඔහු පුතු **පසෙනදි** රජහු රජයෙහි පිහිටිවුහු. **බාවරි** බමුණු උහුටද් පුරොහිත වී. රජ පියා දුන් භොග දූ අනෙක් භොග දූ[4] ඔව්හට දිනි. එ ළදරු කලැ ඔහු කෙරෙහි ශිල්ප උගත්තෙ යි. එක්බිති **බාවරි** බමුණු පැවිජි වියැටි වැ රජ හට කී යැ. ආචාර්යය, තොප සිටි කලැ බපාණො[5] සිටියාහු මැ යැ.[6] පැවිජි නො වව" යි කී යැ. "කුමට ද? මහරජ,[7] පැවිජි වෙමී" කී යැ. රජ වළකන්නට නොහැකි වූයෙ. "රැයිම්මෙහි දූ සවසැ දූ මා දක්නට නිසි තැනැ, රජ උයන්හි, පැවිජි වන්නෙ යැ"යි අයැජි යැ. ආචාර්ය, සොළොස් දහසක් බමුණු දරු පිරිවර ඇති සොළොස් අතැවැස්සන් හා සමඟ තවුස් පැවිජියෙහි[8] පැවිජි වැ රජඋයන්හි විසී යැ. රජ සතර පසයෙන් උපස්ථාන කෙරෙයි. රැයිම්මෙහි දූ සවසැ දූ ගොස් දක්කි.

එක් දවසක් අතවැස්සො, "ආචාර්ය! නුවර වෙතැ වාස මහාපරිරොධ යැ. නිරාකුල තැනකට යම්හ යි; පැවිජියනට ගැඹුරු වල් නිස්සැ"යි කීහැ. ආචාර්යය, "මැනැවැ"යි ගිවිසැ රජ හට කී යැ. රජ තුන් යලක් කියා වළකන්නට නොහැකි වූයෙ, දෙ ඇමැත්තක් හට දෙලක්‍ෂයක් දී, "යම් තැනෙක්හි තව්සො විසියටි වූහු නම්, එහි ආශ්‍රමපදයක් කොටැ දෙව"යි යෙදී. ආචාර්යය, සොළොස් දහසක් ජටිලයන් පිරිවරා පස් පස් යන ඇමැත්තන් ඇති වැ, උතුරු දනව්යෙන් දකුණු දනවු බලා ගොස්, **අස්සක** නම් **මූලක**[9] නම් දෙ රජුන් ගෙ දෙ රට **ගොදවරි** හො-මැදැ තුන් යොදුන් ගිවුළු වනයෙහි **සරභඞගාදීන්** වුසු පියෙස් දැකැ, "මෙ පෙරැ තව්සන් වුසු පියෙසෙක් වනැ. පැවිජියනට නිස්සැ"යි ඇමැත්තන්ට කී යැ. ඇමැත්තො බිම් ගන්නට[10] **අස්සක** රජ හට ලක්‍ෂයක් දුන්හ. **මූලක** රජ හට ලක්‍ෂයක් දුන්හු. උහු එයින් දුන්හැ. දෙරටින් අනෙක් දෙ යොජනක් තැන් දූ දුන්හු. මෙසෙ දෙ රදුන් දුන් දෙරට මැදැ පස් යොජනක් තන් වී.[11] ඇමැත්තො එහි ආශ්‍රමපද කරවා, සැවැත් නුවර යවා යළි දූ ධන ගෙන්වා ගෙනැ ගොදුරුගම් පිහිට්ටා දී ගියො.

තව්සො වනයෙහි කඳුමුලු[12] ඵලයෙන් හා කෙණෙසි අහරින් යපෙති එ ගමැ කෙළෙඹියො බදුකරවුවරින් ලක්‍ෂයක් ධන නඟා-ගෙනැ **අස්සක** රජු කරා ගෙනැ ගියහැ. හෙ, "මම නො ගන්මි. ආචාර්යය හට දෙව' යි කී යැ. ආචාර්යය ද නො ගෙනැ දන් දින්.[13] හෙ මෙසෙ හවුරුදු පතා[14] දන් දෙන්නෙ එක් හවුරුද්දක් මහදන් දී ගැමින් නික්මැ ආශ්‍රම පදයට ගොස් පන්සල්[15] වැදැ දැන් අවජමින්[16] හුන්නෙ යි.

එකල්හි ළදැරු බැමිණියක්, "බමුණ, මම් නිත්තෙන් තාගෙ ගෙසි මෙහෙ නොකටැ[17] හෙමි. එම්බල, **බාවරි** බමුණු හවුරුදු පතා ධන ලක්‍ෂයක් දන් දෙයි. තො ගොස්

[1] උගත්තු
[2] එකක් ම වුහු, එක් ම වුහු
[3] මෙළෙය
[4] භොගයකු දූ, භොගයනු දූ-මු
[5] මපණො, මපාණො
[6] සිටියා හා මය
[7] කුමට ද මහරජ පැවිජි නො වන්නෙ.
[8] තවුස්පැවිද්දෙ (පැවිද්දෙන්-මු)
[9] අළක-සුත්තනිපාත අටුවා හා පෙළ
[10] නඟන්නට
[11] පමණ තන් වී
[12] මුළු, මුල
[13] දිනු
[14] හවුරුදු හවුරුදු පතා
[15] පන්සලට, පස්නල
[16] අවජමෙනි
[17] කොටනොහෙමි

පන්සියක් ඉල්ලා ගෙනැ මට දැසක[1] ගෙනැ එ"යි සැමියා නගා යවු.[2] බමුණු බාවරි මහතව්සා කරා ගොස්, "පන්සියක් දෙ" යි කී යැ. "ඇති දැ හැම දන් දින්මි.[3] මාගෙ පන්සියෙක් ඇත්තෙ නොවෙයි, හදහා"යි කී යැ. බමුණු, "ඉදින් තො[4] කියතු දු ධන නො දෙහි නම්, සත් වන දවස් හා හිස් සත් කඩක් කොටැ පළා-පියෙමී" කියා, එවැනි[5] විධියක් තමා නොදනුතු දු[6] බවා-පියටි වැ[7] ගොම[8] වලමල් කුසතණ ආදි වෙළෙව් වෙළෙව් වැ ගෙනැ ගොස් බාවරි ගෙ පන්සල් දොරට ඇරැ, ගොමයෙන්[9] මඬුල්ලක් කොටැ, එහි මල් හිසැ-ලා තණ අතොට[10] ලා, වම්පස කමඬායෙහි[11] දියෙන් දෙවැ[12] සත් පියවරක් තැනට ගොස්, "බාවරිහි හිස් සත් කඩක් වැ පැළෙව"යි ඇසෙන සෙ කියා ජප කරන වන් වැ තොල් සලසලා හුන්නෙ යැ. මහතවුස්, "සැබැව"යි සිතා බිය පත් වී.

එකල්හි ආශ්‍රම පදයෙහි දෙවතා බාවරි ගෙ දුක් දොම්නස් දැකැ කරුණායෙන් උහු කරා එළබැ, "මහතව්ස, හෙ මුදුන් නො දන්නි. මුදුන් පළන සෙ නොද දන්නි. ධන කැමැති කුහකයෙකැ"යි කිවැ. "තො මුදුනුදු මුදුන් පළන සෙ දු දන්හි?" යි[13] කී යැ. "මම් එ නො දන්මි. එවැනි නුවණෙක් මට නැති" කිවැ. "කවරහැ එ දන්නාහ?" යි කී යැ. බුදුන් එකුන් තිස් හැවිරිදි කල්හි නික්මුණු බාවරි බමුණු ගොදවරි තිරයෙහි වසන අට හවුරුද්දක් ඉකුත් කල්හි ලොකයෙහි[14] බුදුහු උපන්හු. බුදුන් උපන් පරිදි[15] දක්වන දෙව්දු, "ඔකා රජහු මුනුබුරෙ[16] සිද්ධත් කුමර කිඹුල්වත් නුවරින් නික්මැ බුදු වැ ලොකයෙහි ධම්[17] දෙසයි. තො ගොස් උහු පුළුවුස. හෙ තට කියයි, කිවැ. බුදුහු යන බස් අසත් වැ බමුණාට ශොක නැති වි යැ. විපුල ප්‍රීති ඇති වී. හෙ සතුටු සොම්නස් වැ, "බුදුහු කොහි වෙසෙති? කොයට ගොස් දැක්මහ"යි කී යැ. "සැවැත් නුවරැ වෙසෙති"යි කියා අතුරුධන් වුවැ.

එක්බිති එ තවුස් අතැවැස්සන් කැඳවා, "බුදුහු ලොකයෙහි දිලිබුහැ.[18] දැන් බුදු කෙනෙක් උපන්හුල. තෙපි වහා සැවැත් නුවර ගොස් අතුරුදන්ව"යි කී යැ. "ඔවුන් දැකැ 'බුදුහු'[19] යනු කිසෙ දන්මහ?"යි[20] කීහ. "දෙතිස් මහපුරිස් ලකුණු වෙදයෙහි ආයෙ යැ. එ මහපුරිස්ලකුණු යමක් හට ඇද්ද, හෙ ගිහිගෙයි සිටියෙ[21] සක්විති රජ වෙයි. පැවිජි වී නම්, බුදු වෙයි. තෙපි මාගෙ වයසු දු[22] ගොතුදු[6] ලක්ෂණදු[6] උගත් ගතුදු[6] මාගෙ ශිෂ්‍යයනුදු[6] මුදුනුදු[6] මුදුන් පැළුමු දු[6] සිතින් පුළුවුස්ව. ඉදින් හෙ බුදු වී නම්, තොප සිතින් පුළුවුත් පැන තෙපුලෙන්[23] විසජයි. කී යැ. බාවරි මහ තවුසා[24] තෙපුල් අසා සොළොස් බමුණො. කසුබු සම්මා සම්බුදුන් සස්නෙහි පැවිජි වැ සිල් රැකි

[1] දාස
[2] යවි
[3] දිනිමි
[4] තා
[5] එවෙනි
[6] නොදනිතුද්, දනිතුද්
[7] බාවාරියටි ව, බලාපියව්, බාවාරිමාරිය ටිව-මු
[8] හොම, හොබ, හොමයෙන්
[9] හොමයෙන්
[10] අතුට
[11] කමඬලායෙහි
[12] එව-හැම
[13] දක්හි
[14] ඉකුත් ලොකයෙහි
[15] බව
[16] මුනුබුරෙක්-මු
[17] ධම්සක්
[18] දිළුහ, දිලිබ්හ-මු
[19] බුදුහු
[20] දනුම්හයි
[21] සිටිය
[22] ද්, ත්
[23] තෙපලෙන්
[24] මහා තව්සා ගෙ

සොළොස් දහසක් බමුණන් පිරිවරා, ඔහු වැඳැ පැදකුණු කොටැ, දළමඬුලු අඳුන් දිවිසමින් සැරැහී, උතුරුදස බලා නික්මුණුහු. එයින් කීහ:

"**බාවරිස්ස වචො සුත්වා - සිස්සා සොළස බ්‍රාහ්මණා,**
**අජිතො තිස්සමෙත්තෙයො - පුණ්ණකො අථමෙත්තගූ.**

**ධොතකො උපසීවො ච - නන්දො ච අථ හෙමකො,**
**තොදෙය්‍යකප්පාදුභයො - ජතුකණ්ණි ච පණ්ඩිතො.**

**භද්‍රාවුධො උදයො ච - පොසාලො චාපි බ්‍රාහ්මණො,**
**මොඝරාජා ච මෙධාවී - පිඞ්ගියො ච මහාඉසි.**

**පච්චෙකගණිනො සබ්බෙ - සබ්බලොකස්ස විස්සුතා,**
**ඣායී ඣානරතා ධීරා - පුබ්බවාසනවාසිතා.**

**බාවරිං අභිවාදෙත්වා - කත්වා ච නං පදක්ඛිණං,**
**ජටාජිනධරා සබ්බෙ - පක්කාමුමුත්තරාමුඛා"යි**

එයින් මූලක නම් නුවරට ගියහ. එයින් අස්සක නම් නුවරට ගියහ. එයින් මාහිස්සතී[1] උජ්ජයිනී නම්, ගොධිපුර නම්, විදිසා නම්, වල්සැවැත් නම්, කොසඹෑ නම්, නුවරට ගියහ. එයින් සාකෙත පුරයට ගියො. එයට යන්නා හා ඔවුන්ගෙ සයොජුන් පමණ පිරිස් වී. එකල්හි බුදුහු, "බාවරිහි ගෙ ශිෂ්‍යයො මහපිරිස් ගෙනැ එති. තව ඔවුන්ගෙ ඉඳුරො නො පරිපැසුණහැ.[2] මෙ දෙශය ද සැප නොවෙයි. මගධ රට පහණ උනට සැප යැ. එහි හිඳැ මා ධම් දෙසන කලැ බොහො දෙන හට[3] අභිසමය වෙයි. හැම නුවරට මැ වැදැ එන කලැ බොහො දෙනා හා සමඟ එනු වෙති" මහසඟුන් පිරිවරා සැවැත් නුවරින් නික්මැ දනවු සැරිසරමින් රජගහා නුවර වැඩියො. ඔහු හැම දෙනැ ම සැවැත් නුවර අවුදු වෙහෙර වැදැ, "බුදුහු කවරහ? කොහි යැ බුත්හ?" යි[4] සොයන්නාහු[5] ගඳකිළි[6] දොරට ගොස් බුදුන් පදලස් දැකැ සව්නෙ දන්නා බුදුන්[7] පරිදි දත්හු. බුදුහු ක්‍රමයෙන්, සෙතව්‍යා නුවර, කිඹුල්වත් නුවර, කුසිනාරා නුවර, පාවා නුවර, භොග නුවර, විසාලා නුවර, රජගහා නුවර ගොස්, රමණි[8] පාණසෑ වෙහෙර වැඩියො. හෙ, පෙරැ මහත් ගල්පිටෙක්හි වූ දෙවොලකැ. බුදුන් උපන් කලැ වෙහෙර වී යැ. එ මැ නම් වී.

තව්සො ද එ මැ විගස සැවැත් නුවරින් නික්මැ හැම නුවර වැදැ පුළුවුස්මින් වෙළෙවි වැ බුදුන් අනු වැ යන්නාහු. පස්වරු වැඩි මඟ ගෙනැ පෙරවරු යන්නාහු, පෙරවරු වැඩි මඟ ගෙනැ පස්වරු යන්නාහු, පාණසෑ පැමිණැ, "බුදුහු මිහි යැ"[9] යනු අසා සිහිල් පැන් ලදු[10] පිපාසිතයක් හු[11] සෙයින්[12] මහාභොග ලදු[2] වෙණෙඳක්හු සෙයින්

---

[1] මහසිස්තී
[2] නොපිරිමැසුණහ, නො පිරිහුණහ
[3] දෙනාහට-මු
[4] බුදුන්හයි, බුදුහුහොයි-මු'
[5] සොයමින් යන්නාහු
[6] ගඳකෙළි
[7] බුදුහු
[8] රමණීය
[9] මෙහි යැයි
[10] ද්
[11] පිපාසයක්හු-මු
[12] සිහිල් පැන් වළඳා පිපාස සන්හුන්නක්හු සෙයින්, සිහිල් වළඳ (දා) පිපාසයක්හු සෙයින්

ගිමන්හි කළකිරි[1] සිහිල් සෙවණ ලදු[2] මැගියක්හු සෙයින්, සොම්නස් එ ගලට නැගියො. එයින් කීහ.

**"තුසිතොව උදකං සීතං - මහාලාභංව වාණිජො,**
**ඡායං සම්මාහිතත්තො'ව - තුසිතා පබ්බතමාරුහුං"යි.**

එක්ලිහ බුදුහු පාණසෑ තන්හි සක්දෙව් රජහු මැවු රුවන් මඬියෙහි සෙ-සතින් සැදී, රුවන්පලග මතුයෙහි සඟ පිරිස් පිරිවරා සවනක් රස් විහිදුවමින් වැඩැ හිඳැ මියුරු සරයෙන් ධම් දෙසත්. එයින් කීහ:

**"භගවා ච තස්මිං සමයෙ - භික්ඛුසඞ්ඝපුරක්ඛතො,**
**භික්ඛූනං ධම්මං දෙසෙති - සීහො'ව නදතී වනෙ"යි.**

එ සඳ තව්සො ගොස් බුදුන් දැකැ සතුටු වැ පිරිවැරුහ. ඔවුන් අනු වැ එ එ රටින් ආ මිනිස්පිරිස්[2] බුදුනට මැ පිරිවර වී. එදවස් බුදුන් පෙරටද්[3] පිටිපසද්[7] දකුණත්පසත්[7] වමත්පසද්[7] සයොජුන් සයොජුන් පමණ පිරිස් වී යැ. අයම්විතරහි[4] දොළොස් යොජුන් වි යැ. වටි සතිස් යොජුන් වී. එ පිරිස් මැදැ බාවරි මහතව්සා අතැවැසි සොළොස් බමුණන් කෙරෙහි දෙට අතැවැසි අජිත මාණව, බුදුන් විසින් කරන ලද සාමීචි ඇති වැ, තෙමෙ ද බුදුනට පිළිසඵර කොටැ එකත්පස් වැ සිටැ බලනුයෙ, පනුරැසි පොහොදවස්[5] සොළොස් කලායෙන් පිරිහුන්[6] සඳක් සෙයින් බුදුන් දෙතිස් මහපුරිස් ලකුණෙන් පිරිහුන්[10] සෙ දැකැ සතුටු වැ, මනසින් පැන පුළුවුස්නෙ, "අප ආචාර්යයා ගෙ වයස් කියව, ගොත් කියව, ලකුණු කියව, උහු උගත් ගත් කියව, උහු ගෙ ශිෂ්‍යයන් කියව" යි සිතී.

එකලැ බුදුහු, "තාගෙ බමුණු එක්සිය විසි හැවිරිද්දැ, ගොතින් ප්‍රවරයා මුනුබුරු වන බැවින් ප්‍රාවරි යැ. ලොකයො බාවරි යැ යෙති. උහුට තුන් මහාපුරුෂ ලක්‍ෂණයෙක් ඇති. ත්‍රිවෙදයෙහි පාරයට ගියෙ යැ. පියොවින් අලස වූ නුවණ මඳ පන්සියක් දරුවනට වෙද කියයි" වදාළො.

"උහුගෙ තුන් මහාපුරුෂ ලක්‍ෂණයො කවරහ?"[7] යි සිතින් පිළිවිත්. "තමා දිවින් මුහුණ වසයි. නළලැ උණුලොම් ඇති උහුගෙ අඞ්ගජාතය ඇතුළතැ ගොස් සැඟවෙ"යි වදාළො. මෙසෙ ඔහු මනසින් පුළුවුත් පැන වචසින් විසජු කල්හි සතිස් යොජුන් පිරිස්වැසියො අසා, "කවර දෙවියෙක් බඹෙක් මෙසෙ විසජනුයෙක් වී!"[8] යි සාධුකාර දී ගුගුරා මුඳුනෙහි ඇඳිලි බන්හු.[9] මෙසෙ පස් පැනයක් බුදුන් විසජු කල්හි තුබු දෙ පැන පුළුවුස්නෙ, "අපගෙ ආචාර්යය මුඳුනු දූ මුඳුන් පැළුමුදූ පුළුවුස්සි.[10] එ කියව"යි සිතී,

---

[1] ගිමකලකිරි-බොහො, ගිමන්, ගිමින් කලකිරි-මු: ගිමකලැපිරි-මු:
[2] මිනිස් පිරිවරින් (පිරිවරින්)
[3] දු, ද
[4] අයම්විතරින්
[5] පනුරැසි පොහොය
[6] පිරිපුන්-මු:
[7] කවරැයි
[8] විහි-සමහර
[9] බන්හු
[10] මුදුන් පුළුවුස්සි

"අවිජ්ජා සංසාරයා[1] හිස් වන බැවින් මුඳුනැ. රාත් මග නුවණින් ඇය කඩනා[2] බැවින් විද්‍යා මුඳුන් පැළුමැ"යි[3] වදාළො.

එකල්හි අජිත මාණව පැන විසජුන් අසා ප්‍රීතිමත්[4] වැ අඳුන් දිවිසම් එකස් කොටැ ලැ "බාවරි බමුණු සතුටු සොම්නස් වැ ශිෂ්‍යයන් ශිෂ්‍යයන් හා සමඟ භවත්හු පා වඳී" යි ආචාර්යයා වැඳමෙන්[5] බුදුන් පාවිට[6] හිස් තබා වැන්ද. බුදුහු උහු ගෙ ආචාර්යයාට දු උහුට දු ආ වඩන්නාහු:

**"සුඛිතො බාවරි හොතු - සහ සිස්සෙහි බ්‍රාහ්මණො,**
**ත්වඤ්චාපි සුඛිතො හොති - චිරං ජීවාහි මාණව" යි**

වදාළහැ. එක්බිති[7] පැන පුළුවුස්නට අවසර ඉල්ලු කල්හි "බාවරීහි ගෙ වුව මැනෑ මැ යැ,[8] තොප හැම දෙනා ගෙ වුව මැනෑ මැ යැ, යම් සංසයක් පුළුවුස්ට" යි සර්වඥ ප්‍රවාරණායෙන් පැවරුහු.

බුදුන් අවසර දුන් කල්හි අජිත මාණව වැදැ එකත් පස් වැ හිඳැ පැන පිළිවිත්. "**කෙනස්සු නිවුතො ලොකො**" යනාදීන් ඔහු පැන පුළුවුත් පරිදි දු, "**අවිජ්ජාය නිවුතො ලොකො**" යනාදීන් බුදුන් පැන විසජු පරිදි දු, සුත්තනිපාත යෙහි පාරායණ සුතින් දන්නෙ යැ. දෙසුන් අවසන්හි අජිත මාණව තමා අතැවැසි දහසුන්[9] හා සමඟ[10] රාත් වි යැ. සෙසු නොඑක් දහස් මිනිස්සු දු අධිගම කොළො. රාත් වත් මැ. අජිත මාණවයා හා අතැවැස්සන් ගෙ තවුස් පිරිකර අතුරුධන් වි යැ. හැමදෙන මැ ඍද්ධිමය පාත්‍රචීවරධර වැ දෙ අඟුල් පමණ කෙහෙ ඇති වැ එහි භික්ෂුභාවයෙන් පැවිජි වැ බුදුන් වඳිමින් බැඳැඟිලි වැ හුන්හු.

එක්බිති මොඝරාජ පැන පුළුවිස්නට වන.[11] බුදුහු උහු ගෙ ඉඳුරන් පරිපාකයට නොගිය බව් දැනැ, "තො සිට. අනෙකෙක් පැන පුළුවස්සිව"යි[12] වදාළො. එකල්හි තිස්ස මෙත්තෙයා නම් මණෙවු[13] පැන පිළිවිත්.[14] "**කොධ සන්තුසිතො ලොකෙ**" යනාදීන් උහු පැන පුළුවුත් පරිදි දු, බුදුන් "**කාමෙසුබ්‍රහ්මචරියවා**" යනාදීන් පැන විසජු පරිදි දු, එමැ සුතින් දන්නෙ යැ. දෙසුන් අවසන්හි මෙයිදු අතැවැසි දහසුන්[15] හා සමඟ රාත් වි යැ. සෙසු නොඑක් දහස් මිනිස්සු දු අධිගම කොළො. රාත් වෙමින් මැ ඔහු හැම දෙන[16] පළමු නියායෙන් එහි භික්ෂුභාවයෙන් පැවිජි වැ බුදුන් වඳිමින් මැ බැඳැඟිලි වැ[17] හුන්හු.

එක්බිති පුණ්ණක[18] නම් මණෙවු,[5] බුදුන් පෙර සෙ මැ මොඝරාජයා පැන පුළුවුස්නට වන්නහු පිළිබැහු කල්හි, පැන පිළිවිත්. "**අනෙජං මූලදස්සාවිං**" යනාදීන් ඔහු පැන

---

[1] සංසාරයැ-මු:
[2] කැඬෙන
[3] පැළුමැයි
[4] ප්‍රීතින් මත්-මු:
[5] වඳමෙන්, වඳනාමෙන්
[6] පාපිට
[7] වදාළ එක්බිති
[8] මැනැවැ
[9] දහසත්-මු
[10] සැම
[11] වන්හ, වන්
[12] පුළුවුස්සියි, පුළුවුසී, පුළුවුසවයි,
[13] මණවු
[14] පිළිවිත් කෙබඳු ද
[15] දහසදු-මු: දහසුනුදු-මු:
[16] හැමදෙනෙ
[17] බද්ධාඤ්ජලිවැ
[18] පූර්ණක

පුළුවුත් පරිදි ද, "**යෙ කෙචි ඉසයො මනුජා**" යනාදීන් බුදුන් පැන විසජු පරිදි ද, එ මැ සුතින් දන්නෙ යැ. දෙසුන් අවසන්හි මෙයිඳු අතැවැසි දහසුන්[7] හා සමඟ රාත් වි යැ. සෙසු නොඑක් දහස් මිනිස්සු අධිගම කොළො. රාත් වෙමින් මැ ඔහු හැම දෙන පෙර සෙ මැ එහි භික්‍ෂුභාවයෙන් පැවිජි වැ බුදුන් වඳිමින් බදැඳිලි වැ හුන්හු.

මෙ නියායෙන් **මෙත්තගු** නම්, **ධොතක** නම්, **උපසීව** නම්, **නන්ද** නම්, **හෙමක** නම්, **තොදෙය්‍ය** නම්, **කප්ප** නම්, **ජතුකණ්ණි** නම්, **භද්‍රාවුධ** නම්, **උදය** නම්, **පෙසාල** නම් මෙ එකොළොස් දෙන ද පැන පුළුවුත් කල්හි, බුදුහු පැන විසජුහු මොහු තමන් තමන් අතැවැසි දහස් දහස් හා සමඟ රාත් වැ එහි භික්‍ෂුභාවයෙන් පැවිජි වැ බුදුන් වැඳැ බදැඳිලි වැ හුන්හු.

එක්බිති **මොඝරාජ**, "වහන්සෙ, මම් දෙ යලක් පැන පිළිවිස්සැටි වැ අවසර ගෙනැ භවත්හු විසින් ප්‍රතික්ෂිප්ත වීමි. 'මෙන් තුන් වන වර, පුළුවුත් කලැ කියති' යනු **ගොදවරී** තීරයෙහි ලා මැ ඇසිමි. දැන් කලි වදාළ මැනැවැ"යි පැන පිළිවිතැ. බුදුහු උහු ගෙ ඉඳුරන් පිරිපැසුණු බව් දැනැ ගිවිස්සහැ. "**කථා ලොකං අවෙක්ඛන්තං මච්චුරාජා න පස්සති**" යනාදීන් උහු පැන පුළුවුත් පරිදි ද, "**සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු**" යනාදීන් බුදුන් පැන විසජු පරිදි ද, එ මැ සුතින් දන්නෙ යැ. දෙසුන් අවසන් හි මෙයිඳු අතැවැසි[1] දහසුන් හා සමඟ රාත් වි යැ. සෙසු නොඑක් දහස් මිනිස්හු ද අධිගම කළහැ. රාත් වෙමින් මැ ඔහු හැමදෙන[2] පෙර සෙ මැ එහි භික්‍ෂුභාවයෙන් පැවිජි වැ බුදුන් වඳිමින් බදැඳිලි වැ හුන්හු.

එක්බිති එක්සිය විසි හැවිරිදි **පිඞ්ගිය**[3] නම් බමුණුසොළොස් වනු වැ බුදුන් පැන පුළුවුතැ.[4] "**ජිණ්ණො'හමස්මි අබලො විවණ්ණො**" යනාදීන් ඔහු පැන පුළුවුත් පරිදි ද, "**දිස්වාන රූපෙසු විහඤ්ඤමානෙ**" යනාදීන් බුදුන් පැන විසජු පරිදි ද, එ මැ සුතින් දන්නෙ යැ. දෙසුන් අවසන්හි **පිඞ්ගික** බමුණු අනගැමි[5] වි යැ. හෙ අතරතුරෙහි "ම-මයිල් **බාවරී** බමුණු මෙ විසිතුරු ප්‍රශ්න ව්‍යාකරණ අසනු නොලද" යන සෙනෙහෙන් වික්ෂිප්ත වැ රාත් නොවී. ඔහු අතැවැසි දහස්හු වූ කල[6] රාත් වූහු. **පිඞ්ගිය** බමුණා හා ඔහු අතැ වැස්සන්ගෙ තවුස් පිරිකර අතුරුධන් වී. හැම දෙන මැ, ඍද්ධිමය පාත්‍ර[5] චීවරධර වැ දෙ අඟුල් පමණ කෙහෙ ඇති වැ එහි භික්‍ෂුභාවයෙන් පැවිජි වැ බුදුන් පිරිවැරූහු.

මෙසෙ **බුදුන්, මගධ** රට පහණසෑ තන්හි[7] වැඩැහිඳ **බාවරී** මහ තව්සා අතැවැසි දහස් දහස් පිරිවර ඇති සොළොස් මහතව්සන් පුළුවුත් පැන විසජා[8] **පාරායණ** සුත දෙසු දවස්, සොළොස් දහසක් තව්සො රාත් වූහැ. තුදුසු කෙළක් දෙව් මිනිස්හු සොවාන් සෙදැගැමි අනගැමි වූහු. එයින් කීහ:

"**තතො පාසාණකෙ රම්මෙ - පාරායණසමාගමෙ,**
**අමතං පායයී බුද්ධො - චුද්දස පානකොටියො**" යි.

---

[1] දහසත්-මු
[2] දෙන මැ
[3] පිඞ්ගියානි
[4] පිළිවිත
[5] අනාගාමි
[6] දහස වූ කලි-මු:
[7] පහණසතන්හි
[8] විසදා

ධම් දෙසුන් නිමි කලැ, එ එ රටැ සිටැ, තව්සන් අනු වැ ආ මිනිස්හු බුදුන් ගෙ අනුභාවයෙන් තමන් තමන් ගෙ ගම් නියම්ගම් ආදියා[1] පැනැණුහු.[2] බුද්හු සොළොස් දහසුන් හා සමඟ නොඑක් දහස් සඟපිරිස් පිරිවරා සැවැත් නුවර මැ වැඩියො. එහි සිටැ **පිඞ්ගිය** මහතෙරහු බුදුන් වැදැ, "වහන්සෙ, මම් බාවරි මහතව්සා හට[3] බුදුන් 'උපන් පරිදි අවුදු කියමි' යි පිළින කොටැ ආයෙමි" සැල කළහැ. බුදුහු අනුදත්හැ. ඔහු චිත්තගතීන් ගොදවරි තීරයට ගොස් පාදගතීන් ආශ්‍රම පදයට ගියො.

එකල්හි බාවරි පෙරමඟ බලා[4] හුන්නෙ යැ.[5] ඔවුන් දුරැ මැ තවුස්වෙස් හැරැ මහණ වෙසින්[6] එනුවන් දැකැ, බුදුන් ලොකයෙහි උපන් බව් දැනැ, අවුදු වන් කලැ.[7] "කිම, **පිඞ්ගිය**, බුදුහු ලොකයෙහි උපන්හ?" යි පිළිවිතැ. "බුදුහු උපන්හැ, පහණ සෑ තන්හි[8] වැඩැහිඳ අපට දහම්[9] දෙසූහැ. එ දහම් තට දෙසන්නට ආමී" කී යැ. එකල්හි බාවරි බමුණු මහත් සත්කාර කොටැ සහපිරිවරින් ඔවුන් පුදා අසුන් පැන්වී යැ.[10] එහි වැඩැහිඳැ **පිඞ්ගිය** මහතෙරහු, තමන් ගොස් බුදුන් දුටු සොම්නසින් වචසින් මනසින් පැන පුළුවුත් සෙ[11] කියා, තමන්[12] බුදුන් කෙරෙ ඇසූ නියායෙන්, අපාර වූ සංසාරසාගරයාගෙ[13] නිර්වාණ පාරයට පමුණුවන්නෙන් පාරායණ නම් ලදු සුත දෙසූහැ. දෙසා, "යම්සෙ ලිහිණියෙක්[14] කුඩා වනයක් පියා ගොස් මහත් මධුර ඵලහරිත වනයෙක්හි අවුදු වෙසෙ ද, එසෙයින් මැ[15] මම මඳ නුවණ ඇති තා වැන්නන්[16] පියාමහත් උදකරාසි ඇති අනුතත්දහතළ යට පත් හස් රජක්හු සෙයින් සව්නෙ දන්නා බුදුන් කරා ප්‍රාප්ත වීමි. රෑ දාවල් බුදුන් කෙරෙන් මොහොතෙක්හි ද වියො නොවැ ගිය ගිය දසායෙහි ඇසින් දක්නහු[17] සෙයින් සිතින් බුදුන් දැකැ, වැඳැ වෙසෙමී"[18] කීහු.

එසඳ බුදුහු, **පිඞ්ගිය** මහතෙරුන් හා බාවරිහිගෙ ඉඳුරන් පිරිපැසුණු බව් දැනැ, සැවැත් නුවරැ සිටැ රන්වන් රස්කලබක් වුහුටහ.[19] **පිඞ්ගිය** මහතෙරහු බාවරි මහතව්සා හට බුදුගුණ කියමින් හුන්නාහු බුදුරස් දැකැ, "මෙ කිම් හො!"යි බලන්නාහු, බුදුන් තමන් පෙරට සිටියවුන් සෙ පැනෙනුවන් දැකැ, "බුදුහු වැඩියහ"යි කීහු. බමුණු හුනස්නෙන් නැඟී, බැදැඳිලි වැ සිටියෙ යැ. බුදුහු රන් පතුරුවා බමුණු හට තමන් දක්වා, "**යථා අහු වක්කලී මුත්තසද්ධො**" යනාදීන් සිවුපැදි ගයක් වදාළහැ. දෙසුන් අවසන් හි **පිඞ්ගිය** මහතෙරහු රාත් වූහ. බාවරි මහතව්සා අනගැමි වී යැ. ඔහු අතැවැසි පන්සියක් බමුණු දරුවො සොවාන් වූහු.

මෙ සෙයින් බුදුහු තමන් පුරුෂදම්‍යසාරථී වන බැවින් බාවරි මහතව්සා ද ඔහු අතැවැසි සොළොස් දහස් සොළොස් තව්සනුදු බමුණු දරුවන් පන්සියනුදු, 'ආදි' ශබ්දයෙන් ගත් අග්ගදත්තාදි තාපසයනුදු දමා අමාමහනිවනින් පැමිණිවූහු.

---

[1] ආදියට-මු:
[2] පැමුණුනුහු-මු:
[3] තවුසාට, තවුස්නට, තව්සනට.
[4] බලබලා
[5] හුන්නාහු
[6] මහණවෙස් ගෙන
[7] වන්කලැ මැ
[8] පහණසතන්හි
[9] ධම්
[10] පැනවියැ
[11] නියා
[12] තමා
[13] සංසාරයා ගෙ
[14] ලිහිණියක්
[15] එයින්මැ
[16] තවත් තැන්, තැනැත්තන්, ත වැන්නන්
[17] දක්නාහු
[18] වැඳ මෙසෙ කීහු
[19] වුහුටුහ, වුහුට්හ

**තාපසදමන නම් දෙළොස් වන පරිච්ඡේදය නිමි.**

## 13. භික්ෂුදමන නම් පරිච්ඡේදය

ශාක්‍යභික්ෂූන් දැමූ පරිදි කිසෙ යැ යත්:

ශාක්‍ය රජුන් හා කොලිය රජහු කිඹුල්වත් නුවර හා කොලිය නුවර හා දෙ අතුරෙහි රොහිණී නම් ගඟ එක් අවුණෙන්[1] බඳවා බොහො ගොයම් කරවති. පොසොන් මසැ ගොයම් මියන කලැ, දෙනුවර වැස්සන් ගෙ ගොවිහි[2] රැස් වූහ. කොලිය නුවර වැස්සො, මෙ දිය දෙ තනට ගෙනැ යන කලැ තොපට අපට නොසෑහෙයි. අපගෙ ගොයම් එක දියවරින් එයි. දිය අපට දෙව"යි කීහැ. කිඹුල්වත් නුවර වැස්සො ද, "තොප දින්[3] මැඩුන්[4] කොටගෙ පුරා තුබු කලැ. ඇපි රත්රන් නිල්මිණි කහවනු ගෙනැ මල පැස්[5] ගෙනැ තොප ගෙදොර ඇවිදුනට යමො ද! අපගෙ ගොයම් එකදිය වරින් එයි. ඇපි දු නොදෙම්හ"යි කීහැ. ඔහු[6] දු, "ඇපි නොදෙම්හ"යි[7] කීහැ.

මෙසෙ කලහ වැඩි කල්හි, එකෙක් නැඟී එකක් හු පහළ හෙද නැඟී, අනෙක්හු[8] පහළ. මෙසෙ ඔවුනොවුන් පැහැර රජකුලන් ගෙ ජන්ම සටා බිණුහු. කොලිය නුවර වැසි ගොවිහි 'තෙපි කිඹුල්වත් වැසි රජුන් ගෙනැ ගර්ජනා කරව[9] යම් කෙනෙක් බලු සිගල් ආදීන්[10] සෙයින් තමන් තමන්ගෙ[11] කුසැ හොත් අඟනන් හා වාස[12] කොළො ද, ඔවුන්ගෙ ඇත් අස්හු දු එලකායුධයො දු අපට කුම් කෙරෙති!" කීහු. කිඹුල්වත් නුවර වැසි ගොවිහි, "තෙපි කුෂ්ඨීන් දරුවන් ගෙනැ ගර්ජනා කරව. යම් කෙනෙක් නිවහලු වැ තිරිසන් ගතියැ සතුන් සෙයින් බුදුරු රුක්හි[13] වුසුහු ද, ඔවුන්ගෙ ඇත් අස්හු ද එලකායුධයො ද අපට කුම් කෙරෙති!" කීහු.

ඔහු ගොස් එකම්හි[14] යුතු ඇමැත්තනට කීහ. ඇමැත්තො ගොස් රජනට[15] කීහු. එකල්හි සැහැ රජහු "කුසා හොත් අඟනන් හා වාස කළවුන් ගෙ බැල[16] දක්වම්හ"යි යුද්ධයට සැරැහී නික්මුණුහු. කොලිය රජහු දු "බුදුරු රුකැ වුසුවන්ගෙ බැල[3] දක්වම්හ"යි යුද්ධයට සන්නද්ධ වැ නික්මුණුහු. එකල්හි බුදුහු සැවැත් නුවර නිසා දෙව්රම්හි වැඩැ වසනුවො, අලුයම්හි මහකුළුණු සමවතින් නැඟී ලො[17] බලනුවො, මොවුන් යුද්ධයට නික්මෙනෙසෙ[18] දුටුහු. දැකැ, "මා ගිය කලැ, මෙ කලහ සන්සිඳී හොයි! නොසන්හිඳි හො!"යි බලනුවො,[19] "මම එයට ගොස් කලහ සන්හිඳුවනු සඳහා

[1] ගඟෙක් (ගඟක්) එක අවුණක් (අවුණෙක්), ගඟෙක් අවුණෙන්
[2] ගෙවී
[3] ඉදින්, නෙදින්
[4] මැඩුම්, මැඩුවම්
[5] මලුපස්
[6] ඔවු
[7] කීවා නොදෙම්හයි
[8] අනෙකක්හු
[9] කෙරෙති
[10] බලුසිවල් ආදීන්
[11] තමතමා, තමතමන්
[12] වාසය
[13] බුහුරුරුක්හි
[14] එකල්හි
[15] රජහට
[16] බල
[17] මුළුලෝ-මු:
[18] නික්මුණුසෙ
[19] සන්සිඳී හොයි බලනුවො

ධම් දෙසමි. දෙසුන් අසා සමඟ වූ දෙනුවරවැස්සො පන්සියයක්[1] රජකුමරුන්[2] දෙති. මම් ඔවුන්[3] පැවිජි කෙරෙමි. මහත් සමාගම වෙ"යි සනිටුහන් කොටැ, පෙරවරු අහරකිස සාහා[4] පස්වරු ගඳකිළින් නික්මැ, ඔවුන් යුද්ධ සන්නද්ධ වැ නික්මෙන[5] වෙලෙහි, යම් කෙනෙක්නට නොකියා තුමුහු මැ පා සිවුරු ගෙනැ, ගොස් දෙ සෙනඟ මැදැ අහසැ පලක් බැඳැ සවනක් රැස් විහිදුවමින් වැඩැහුන්හු.

**කිඹුල්වත්** නුවරැ වැස්සො බුදුන් දක්මින් මැ, "අප සැහැරජ කුලට[6] සිළිම්ණක්[7] බඳු බුදුහු වැඩියහැ. මෙ කලහ දුටු බන්දහ.[8] දන් වූ කල අප අනුන් වෙරැ සැත් නොපැහැර විය හැක්කැ. **කොලිය** නුවරැ වැස්සන් අප මරත් මැනෑ මැ යැ, පිසත්[9] මැනෑ මැ යැ"යි ආයුධ දමා පියා සිටියො. **කොලිය** නුවරැ වැස්සො ද එසෙ මැ සිතා ගත් ආයුධ හැරැ-පියා සිටියො. එකල්හි බුදුහු අහසින් බැසැ, රමණී **රොහිණී** ගඟැ වැලිපිටු මත්තෙ පැන් වූ අස්නෙහි, නිරුපම බුදුසිරින්[10] වොරජමින් වැඩැහුන්හු. දෙ නුවරැ රජහු දු බුදුන් වැඳැ පිරිවරා හුන්හු. එකල්හි බුදුහු දනුතුදු හොත්, "කුමට ආව? මහරජනි" යි පුළුවුත්හැ.

"වහන්සෙ, ගඟ කෙළෙනට නොද ආම්හ.[11] වන කෙළෙනට ගල් කෙළෙනට නොද ආම්හ,[1] මෙ තැන්හි සඞ්ග්‍රාමයට ආම්හ"යි කීහු. "තොපගෙ කලහ කුමක් සඳහා වූයෙ යැ මහරජනි,"යි වදාළො. "දිය සඳහා වූයෙ යැ; වහන්සෙ," යි කීහු. "දිය කුමක් වටී?" වදාළහැ. "මඳ දෙයක් වටී; වහන්සෙ"යි කීහු. "පොළො කුමක් වටී?" වදාළහැ. "අනර්ඝ යැ; වහන්සෙ,"යි කීහු. "රජහු කුමක් වටති?"[12] වදාළහැ. "උහු දු අනර්ඝයහැ; වහන්සෙ,"යි කීහු. "අල්පාර්ඝ වූ දිය සඳහා අනර්ඝ වූ රජුන් කුමට නසව? මහරජනි, කලහයෙහි අස්වස් ඇත්තෙ නොවෙ"යි පස් දාවක් හා එක් සූතක් දෙසා සමඟ කොළො.

රජහු පැහැද, "ඉඳින් බුදුහු මෙයට නොවැඩියාහු නම්,[13] ඇපි සිය අතින් ඔවුනොවුන් මරා ලෙ-ගඟක් පැවැත්වුම්හ[14] අප මළ පරිදි අප අඹුදරුවනට ගොස් කියනුවො නො ද ඇති වූවාහැ. බුදුන් නිසා දිවි ලද්මහ.[15] ඉඳින් බුදුහු ගිහිගෙ වුසුහු නම්, දෙ දහසක් කොදිව් පිරිවර ලදු[16] සතර මහදිව්හි රජ වූවාහැ. දහසෙකින්[17] වැඩි පුත් වූවාහැ රජ පිරිස් පිරිවරා ඇවිද්දාහැ. එවැනි සක්විති ඉසුරු පියා නික්මැ ගොස් බුදු වූවාහැ. දැනුදු රජපිරිස් පිරිවරා ඇවිදිත්ව"යි දෙ නුවරැ වැස්සො දෙ සිය පනස් දෙසිය පනස් රජ කුමරුන් දුන්හු.

බුදුහු එ පන්සියක් රජ කුමරුන් පැවිජි කොටැ, **මහාවන** නම් **හිමවත** හා එක් වැ සිටි මහත් වනයෙක්හි වසනුවො ඇතැම් දවස්[18] **කිඹුල්වත්** නුවරැ[19] වළඳති. ඇතැම් දවස්,[8]

---

[1] පන්සියයෙකින්
[2] කුමරුන්, කුමරුවන්
[3] උන්
[4] සහා, හාසා
[5] නික්මුණු හැම
[6] සහරජ කුලට
[7] සිළුමිණක්
[8] බදහ
[9] පියත්
[10] බුදුන් සිරින්
[11] ආවම්හ, ආවාම්හ
[12] වටිති
[13] වුහු නම්
[14] පැවැත්වූ වා (ව) මිහ
[15] ලදුම්හ
[16] පිරිවර ඇති
[17] දහසින්
[18] දවසක්, දවසෙක, දවක්
[19] කිඹුල්වත්පුර

කොලිය නුවර වළඳති. දෙ නුවර වැස්සො මහත් සත්කාර කෙරෙත්. එකල්හි මහලු නෑයන් කෙරෙහි හරසරින් නොරිසින් පැවිජි වූ ශාක්‍ය භික්‍ෂූන් පන්සියනට සස්නෙහි උකටලී උපනැ. ඔවුන්ගෙ රජනවරහු[1] ඔව්නට අනභිරති උපදනා නියායෙන්[2] හසුන් දුන්හු.

බුද්හු ආවර්ජනා කරන්නාහු, ඔවුන් සස්නෙහි අභිරති[3] නැති බැව් දැනැ, "මෙ මහණහු මා වැනි බුදුරජක්හු හා සමඟ වසන්නාහු, උකටලීහැ. මොව්නට කවර ධම්දෙසුන් සැප යැ හො!"යි බලන්නාහු, කුණාල ධම්දෙසුන් දුටහැ.[4] දැකැ, "මෙ මහණුන් හිමවතට ඇරැ කුණාල්ද දෙසා මාගමුන් ගෙ දොස් දක්වා අනභිරති හැරැ සොවාන් ඵලයෙහි පිහිට්වුව[5] මැනැවැ"යි සිතා පෙරවරු කිඹුල්වතැ වළඳා මහවන එළඹැ පස්වරු සඟුන් කැඳවා, "මහණෙනි, රමණී හිමව් පියෙස් හා දුටුවිරුහ?"යි[6] වදාළහැ. "නොදුටුවිරුම්හ, වහන්සෙ"යි කීහු. හිමවූ සැරිසරන්නට එව් දැ?"යි වදාළහැ. "වහන්සෙ, අප ඍද්ධි නැති. කිසෙ යම්හ"යි කීහු. "ඉදින් තොප කිසි කෙනෙක් ගෙනැ යෙත් නම්, යව් දැ?"යි[7] වදාළහැ. "යම්හැ වහන්සෙ"යි කීහු. බුද්හු තමන්ගෙ අනුභාවයෙන් ඔවුන් ගෙනැ අහසට නැඟී හිමවතට එළඹැ අහසැ සිට රමණී හිමව් පියෙසැ රුවන් ගල් රුවන් කළු රුවන් ගිරිතලාද් සදත්දහතළාද්[8] පස්මහගඟුද්[6] දියෙහි ගොඩෙහි[9] මලුද්[6] දස කුලෙහි ඇතුනුද්[6] අසුනුද්[6] සිංහයනුද්[6] වගනුද්[6] මුවගණද්[6] කිනිරිගණද්[6] ලිහිණිගණද්[6] දැක්වූහු.

හිමවත් පර්වතය ඉතා මහතැ. උස පන්සියක් යොජනැ. අයම් විතරහි තුන් දහස් තුන් දහස් යොජනැ. උස සිය සිය යොජුන්, සුවසූදහසක් රුවන් කුළින් දිලියෙනු වූයෙ යැ. තන්හි තන්හි රන්ගල් රිදීගල් රක්ගල් හිඟුල්ගල් අඳුන්ගල් සතුරුවන්ගල්[10] ඈ නොඑක් රුවන්ගල් ඇතියෙ[11] යැ. ඉඳුනිල් මිණි වෙරළුමිණි මරාමිණි පියුම්රාමිණි පිළිමිණි ඈ මිණි ගල් ඇතියෙ[9]යැ. තන්හි තන්හි රන්ගිරිතලා රිදීගිරිතලා රක්[12] හිඟුල් අඳුන් ගිරිතලා මිණිගිරිතලා සතුරුවන් ගිරිතලා ඇතියෙ[9] යැ. අයම්විතරහි දු ගැඹුරෙහි දු පනස් පනස් යොජුන්, වට යෙළසිය යොජුන්, මිණිවන් පහන් දිය පිරුණු පස් පියුමෙන් සුසන් සත් දහතළා ඇතියෙ යැ. සපු පුවඟු නා පනා සල් සළල අගරු දෙව්දුරු නඳුන් සඳුන් ඈ නන් විසිතුරු මල්පල්ලෙන් සැදුම් ලදු රුක්රදුන් ඇතියෙ යැ. හාත්පසින් බස්නා පන්සියක් ගඟින් විසිතුරු වූයෙ යැ. මෙතෙක් දැ එදා කිසෙ දැක්වූහැ යත්:

මෙ මතු නොවෙයි. ඒ පර්වතයෙහි ඇති තාක් රමණී බුදුහු තමන්ගෙ ආනුභාවයෙන් එක වට දැක්වූහු. එ පියෙස් දුටු තැන පටන්-ගෙනැ එ සඟනට එ අඟනන් කෙරෙහි ඡන්දරාග ප්‍රහීණ වී. මෙසෙ බුදුහු තමන් පුරුෂදම්‍යසාරථී වන බැවින්, එ සඟුන්[13] ගෙනැ අහසින් කුණාල් දහතළට බැසැ, පැල දෙසෙහි සැට යොජුන් සිලාතලයෙහි පිහිටි සත් යොජුන් කල්පස්ථායී මහසල් රුක් මුලැ තුන් යොජුන් මිණි අතලෙයි[14] එ

---

[1] රජ (ජ) වරහු, රජවරොධ්හු-මු

[2] පිණිස නියායෙන්

[3] අනභිරති

[4] දුටුහු දුට්හු

[5] පිහිටුව

[6] දුටුවිරුදැයි

[7] යා දැ යි,

[8] දු

[9] ගොඩ

[10] සත්රුවන් ගල්

[11] ඇති වූයෙය

[12] රත්

[13] සඟුන් ගෙනැ

[14] මිණිඅතුලෙහි

සඟුන් පිරිවරා සවනක් රස් විහිදුවමින්, යුගඳුරු මුදුනෙහි සරා හිරක් සෙයින් දිලියෙමින් හිඳැ, මියුරු ගැඹුරු හඬින්, සඟුන් කැඳවා, "මහණෙනි, මෙ හිමවියෙහි තොප නුදුටුවිරිදැ දක්ව"යි වදාළො.

එකෙණෙහි චිත්‍රකොකිලයො දෙදෙනෙක් දඬුයෙක්හි දෙ කෙළවර ඩැහැ-ගෙනැ මැදැ කෙව්ලි රජු හිඳුවා ලා ගෙනැ යෙති. අට දෙනෙක් පෙරට යෙති. අට දෙනෙක් පසු වැ යෙති. අට දෙනෙක් දකුණත් පසැ යෙති. අට දෙනෙක් වමත් පසැ යෙති. අට දෙනෙක් යටැ යෙති. අට දෙනෙක් මතු වැ යෙති. අට දෙනෙක් මියුරු එල එළවමින් යෙති. මෙසෙ ඔවුන් චිත්‍රකොකිලයා හට පිරිවර වැ[1] අහසින් යනුවෙන් දැකැ එ සඟහු, "වහන්සෙ, මුහු කිනම් ලිහිණි කෙනෙකැ?" යි පුළු වුත්හු. "මහණෙනි, මෙ ද, මා කුණාල් දහතෙළෙහි[2] චිත්‍ර කොකිල වැ උපන් කලැ, කෙව්ල්ලන් මට කළ පරිචර්යා යැ. අද දක්වා පවත්වමින් ආයෙ යැ. එකල්හි කෙව්ල්ලො, බොහො හැ. තුන් දහස් පන්සියක් දෙන යැ. අනුක්‍රමයෙන් පිරිහී දැන් මෙතෙක් වූ" හයි වදාළො.

එකල්හි සඟහු "එ ලිහිණිගණයන් මෙ වනයෙහි පරිචර්යා කළ පරිදි කිසෙ යැ?" පුළුවුත්හු. "ඇසියටියාව; මහණෙනි" යි වදාළහැ. "එසෙ යැ වහන්සෙ"යි කීහු. "ඔස, අසව"යි තුන් සියක් ගාථායෙන්[3] ප්‍රතිමණ්ඩික වූ කුණාල් ද දෙසූහු. එහි විස්තර ජාතකයෙන් දන්නෙ යැ. දෙසුන් අවසන්හි පන්සියක් සඟහු සොවාන් එලයෙහි පිහිටියාහැ. මඟනුවණ හා සමඟ[4] ඔවුනට සෘද්ධි උපනැ. බුදුහු "දැන් මෙ මහණනට[5] මෙතෙක් පමණැ"යි අහසින් මහවනයට වැඩියහැ. එ සඟහු යන කලැ බුදුන් ගෙ අන්භාවයෙන් ගොස් එන කලැ තමන්ගෙ අනුභාවයෙන් බුදුන් පිරිවරා මහවනයෙහි.[6] බටහු.

බුදුහු පැන් වූ අස්නෙහි වැඩහිඳ, එ සඟනට "මහණෙනි, හිඳුවයි" හිඳුවා-ගෙනැ ඔවුනට රාත් වන කර්මස්ථාන වදාළො. සඟහු, "වහන්සෙ අප ගෙ අදහස් දැනැ දහතළා පියෙස් ඇරැ, අනභිරති හැරැ[7] සොවාන් කොටැ, දැන් රාත් වන්නට කමටහන් වදාළහැ. අප නොපමා වුව මැනැවැ"යි බුදුන් පා වැඳැ හුනස්නෙන් නැඟී ගොස් වෙන වෙන එ එ ගල්බෙයදැ දු රුක්මුල්හි දු වැඩහුන්හු බුදුහු, "මෙ මහණහු රාත් වැ තමන් තමන් පිළිවුදු ගුණ කියම්හයි මා කරා එති. එවුන් ආ කලැ, දස දහස් සක්වළැ දෙවියො රැස් වෙති.[8] මහත් සමාගම වෙයි. එ සමාගමයට නිසි පියෙසක්[9] වුව මැනැවැ"යි රමණී විසල්[10] පියෙසෙක්හි වනදෙවියන්[11] පැන් වූ අස්නෙහි වැඩහුන්හු. හැමදෙන හට පෙරට වැ කමටහන් ගෙනැ ගිය තෙරහු පිළිසිඹියා පත් රාත් වූහැ. ඔවුන් එක්බිති අනෙක් තෙරහු රාත් වූහයි, පන්සියක් සඟහු මැ පියුම් විලෙකැ පිපි පියුම් වනයක් සෙයින් පුබුදුහු.[12] හැම දෙන හට පෙරටු වැ රාත් වූ තෙරහු, "තමන් පිළිවුදු[13] ගුණ[14] බුදුනට කියම්හ"යි පලග විදහා හුනස්නෙන් නැඟී බුදුනට අභිමුඛ

---

[1] පිරිවරා
[2] කුණහල්දහ තෙළෙහි
[3] සියක් ගාථායෙන්
[4] මහනුවණින් හා ස (සැ) ම
[5] මහණහට
[6] වනයට
[7] ඇරැ
[8] එති, සාඑති
[9] පියෙසන්
[10] විසාල, විසල
[11] වසන දවියන්
[12] පුබුදුවූහ-මු
[13] පිළිවුදු පිළිබුදු
[14] බුදුගුණ

වූහ. එ සෙයින් මැ අනෙක් තෙරහු දු අනෙක් තෙරහු දැයි පන්සියො හිමවත[1] බැසැ බොජුන් හල් වදනවුන් සෙයින්[2] පිළිවෙළින් වැඩියො.

පළමු ආ තෙරහු බුදුන් වැඳැ නිසඳුන් සිවුර අතොට[3]ලා එකත් පස් වැ හිදැ තමන් පිළිවුඳු ගුණ කියට් වැ, "කිසි කෙනෙක් නැති හො?"යි.[4] පෙරළි ආ මග බලන්නාහු, අනෙක් තෙරුන් දුටහැ. මෙසෙ හැම දෙන[5] මැ අවුදු එකත් පස් වැ හිඳැ. ඔවුන් ඔවුන් කෙරෙහි ලජ්ජා ඇති වැ නොකීහු. රාත්නට උපදනා සිත් දෙ ආකාරයෙකින් උපද්දි; 'මා පිළිවුඳු[6] ගුණ වහා දෙව්මිනිස්හු ප්‍රතිවෙධ කෙරෙත්'වයි යනු එකෙකැ. පිළිවුඳු ගුණ නිධියක් ලදු පුරුෂයක්හු සෙ අන්නට නො කියට් වනු එකෙකැ. මෙසෙ අරීගණන් මුළු දුන් විගසැ, බුද්ධොත්පාදයෙහි ප්‍රතිමණ්ඩිත ලොකයා රමණී පරිදි දක්වනු සඳහා පැදුන් දෙසෙහි නැඟු රිදීමුවා මහත් කැටපත් මඬලක් බඳු, නොහොත් නිම්වළල්ලෙහි ගෙනැ පෙරළෙන ලද රිදී සකක් බඳු, පුන් සඳ මඬල නැඟී නුඹතලට පිළිපනැ.[7]

එ වෙනෙහි[8] වැඩැහුන් බුදුහු දු, **මහාසම්මත** රජු ගෙ වංශයෙහි උපන්නාහැ. එ පන්සියක් සඟහු දු, **මහාසම්මතයා** ගෙ වංශයෙහි උපන්නාහැ. බුදුහු දු, එ මැ වංශයෙහි රජකුමරියක[9] බඩැ හොත්හැ. ඔහු දු, රජකුමරියන් බඩැ හොත්තාහු බුදුහු දු, රජපැවිජියහැ. ඔහුත්, රජ පැවිජියො. බුදුහු දු, සෙ-සත් පියා අතට පත් සක්විති රජය පියා පැවිජි වූහු. ඔහුත්, සෙ-සත් පියා අතැ තුබු රජය පියා පැවිජි වූවාහු මෙසෙ බුදුහු පිරිසුදු පියෙස්හි පිරිසිදු රාත්‍රි භාගයෙහි තුමූහු පිරිසුදු වූවාහු, පිරිසිදු සඟුන් පිරිවරා, තරු පිරිවර ලදු සරා සඳක් සෙයින්, වොරජමින් වැඩැ හුන්හු.

එකෙණෙහි එ වනයෙහි දෙවියො චලිත වැ, "භවත්නි, භවත්නි, පිරිසිදු බුදුන් සඟුන් දක්නට යම්හ"යි මහානාද කෙරෙමින් ගොස් බුදුනුදු එ විගසැ රාත් වූ සඟුනුදු වැඳැ, එකත් පස් වැ සිටියො. මෙ නියායෙන් ඔවුනොවුන් ගෙ මහානාද අසා, හඬසන් දෙසන්[10] ගවු දෙ ගවු යොජුන් දෙ යොජුන් විසින් තුන් දහසක් යොජුන් හිමවියෙහි දු තෙසැට දහසක් නුවරැ දු නවානුලක්‍ෂයක් ද්‍රොණමුඛයෙහි දු සානු ලක්‍ෂයක්[11] කෙළ පටුනෙහි දු සපනස්[12] රුවන් ආකරයෙහි දු සියලු **දඹදිව්තෙලෙහි දු පූර්ව විදෙහයෙහි** දු **අපරගොයන**[13]යෙහි දු **උතුරුකුරුදිවැ** දු දෙ දහසක් කොදව්හි දු සියලු සක්වළැ දෙවන සක්වළැ යැයි[14] මෙසෙ දස දහසක් සක්වළැ **අරූතල අසඤ්ඤතල** වැසියන් මිසැ, දෙව් බඹහු අවුදු රැස් වූහු. මෙසෙ රැස් වූ කල්හි දෙවියන් විසින් සියලු සක්වළගබ බඹලො දක්වා නිරන්තරයෙන් පරිපූර්ණ වී.

කිළිගෙකක් පමණ පහණක් හැමයෙන් පාතැ බඹලොවැ සිටැ වුහුට, එක් රෑ එක් දවහලෙකින් අට සාලිස් දහසක් යොජුන් තන් ගෙවමින් සාර මසින් පොළොවට බස්සි. මෙසෙ මහත් අවකාශයෙහි දෙවියො පොළොතෙලෙහි පටන්-ගෙනැ බඹලො

---

[1] මාවත, වත, වන
[2] බොජුන් හල් සෙයින්
[3] අතුට-මු
[4] නැති හෙයින්
[5] දෙනෙ
[6] පිළිවුත්, පිළිවුත් දු
[7] පිළිගතැ
[8] වනයෙහි
[9] රජකුමරියක්
[10] හඬපන්සියෙනි-හැම 'සද්දන්තර අඩ්ඪගාවුත්' - අටුවා
[11] දහසක් හැම 'ඡින්නවුතියා පට්ටනකොටිසතසහස්සෙසු' - අටුවා
[12] පනස්, තෙපන සක්-මු
[13] අපරගොදා (ධා) න
[14] දැයි

දක්වා අතුරු නැති වැ සක්වළ ගල් දක්වා පිරී සිටියො. යම්සෙ සක්විති රජහු හුන් තන් හක නොවෙයි; ආ ආ මහෙශාඛ්‍යරජහු[1] හිඳුනට අවකාශ ලැබෙති; සෙසු තැන් හක වෙයි; එසෙයින් මැ බුදුන් වැඩැ හුන් තන් හක නොවෙයි. ආ ආ මහෙශාඛ්‍ය දෙවියො ද බඹහු ද සිටුනට අවකාශ ලදහැ. බුදුන් වැළැතැ පටන් ගෙනැ කෙසගක් පමණ තන්හි දෙවියො දස දෙනෙක් විසි දෙනෙක් තිස් දෙනෙක් සියුම් අත්බව් මවා-ගෙනැ සිටියහැ. හැමයෙන් පිටතැ සැට සැට දෙන බැවින්[2] සිටියො. එකල්හි සුද්ධවාසයෙහි බඹහු සතර දෙනෙක්, සමවත් සමවැදැ, පිරිසුන් වෙලෙහි නැඟී, බඹලොව බලන්නාහු, පස්බතැ බොජුන්හල් ගෙකක් සෙයින් සිස් වැ තුබු බඹ විමන් දැකැ, "බඹහු කොයට[3] ගියහැ හො!යි අවජනාහු. ඔවුන් මහාසමාගමයට ගියබව් දැනැ, "මෙ සමාගමය ඉතා මහතැ. ඇපි පසු වුම්හ. පසු වූවන් සිටුනා අවකාශයෙක් ලැබෙන්නෙ නොවෙයි. එ බැවින් ඇපි බුදුන් සඟුන් ගෙ ගුණ වනා එකෙකි ගාථා[4] බැඳැ-ගෙනැ යම්හ. එ සමාගමයට අප ගිය බව් දන්වම්හ"යි එකෙක පැදුන් සක්වළ මුව විටියෙහි බට. එකෙක් දකුණු සක්වළ මුවවිටියෙහි බට. එකෙක් පැළ සක්වළ මුවවිටියෙහි බට. එකෙක් උතුරු සක්වළ මුවවිටියෙහි බට.

පැදුන්[5] සක්වළ මුවවිටියෙහි බට බඹ, නිලකිසුණුසමවත් සමවැද නිල් රස් විහිදැ, දස දහසක්[6] සක්වළැ දෙව්බඹුන් ඉඳු නිල්මිණි කවජ පොරොවන්නක්හු[7] සෙයින් තමා ආ පරිදි දන්වා, බුද්ධවීථීයැ කිසි කෙනෙකුන් සිටුනට නොපොහොසත් බැවින්, පාළ මහත් බුද්ධ[8] වීථීන් අවුදු බුදුන් වැඳැ එකත් පස් වැ සිටැ "**මහාසමයො පවනස්මිං**" යනාදි ගාථායෙන් බුදුන් සඟුන්[9] ගුණ වනා පැදුන් සක්වළ මුවවිටියෙහි මැ ගොස් සිටියෙ යැ.

දකුණු සක්වළ මුවවිටියෙහි බට බඹ, පීතකිසුණු සමවත්[10] සමවැදැ රන්වන් රස්[11] විහිදැ, දස දහසක් සක්වළැ දෙව්බඹුන් රන්පට පොරොවන්නක්හු සෙයින්, තමා ආ බව් දන්වා බුද්ධවීථීන් අවුදු, බුදුන් වැඳැ එකත් පස්වැ සිටැ, "**තත්‍ර භික්ඛවො සමාදහංසු**" යනාදි ගාථායෙන් බුදුන් සඟුන්[6] ගුණ වනා දකුණු සක්වළ මුවවිටියෙහි මැ ගොස් සිටියෙ යැ.[12]

පැළ සක්වල මුවවිටියෙහි බට බඹ, ලොහිත කිසුණු සමවත් සමවැද රත් රස් විහිදැ දස දහසක් සක්වළ දෙව්බඹුන් උතුම් රත්පලස්පට[13] පොරොවන්නක්හු සෙයින්, තමා ආ බව් දන්වා බුද්ධ වීථීන් අවුදු, බුදුන් වැඳැ එකත් පස් වැ සිටැ "**ඡෙත්වා ඛීලං**" යනාදි ගාථායෙන් බුදුන් සඟන් ගුණ වනා පැළ සක්වළ මුවවිටියෙහි මැ ගොස් සිටියෙ යැ.

උතුරු සක්වළ මුවවිටියෙහි බට[14] බඹ, ඔදාතකිසුණු සමවත් සමවැද සුදු රස් විහිදැ, දස දහසක් සක්වළ දෙව් බඹුන් සමන් මල්පට පොරොවන්නක්හු සෙයින් තමා ආ බව් දන්වා බුද්ධිවීථීන් අවුදු බුදුන් වැඳැ එකත් පස් වැ සිටැ "**යෙ කෙචි බුද්ධං සරණං ගතා**

---

[1] මහෙශාක්‍යදෙව් (යන්)
[2] බැගින්
[3] කොයි, කොය
[4] ගාථාව
[5] පැදුම්
[6] දහසක්
[7] පොරොවන්නක්
[8] මඟක් බඳු බුදු
[9] සඟුන්ගෙ
[10] සමාපත්තියට
[11] රන්වන්
[12] සිටියෙයි
[13] රත්පලස්
[14] සිටි

සෙ" යනාදි ගාථායෙන් බුදුන් සඟුන්[1] ගුණ වනා, උතුරු සක්වළ මුවවිටියෙහි මැ ගොස් සිටියෙ යැ.

බුදුහු බලන්නාහු, පොළොතෙලෙහි පටන් - ගෙනැ සක්වළ මුවවිටි පර්යන්ත[2] කොටැ අකනිටා බඹලො[3] දක්වා සිටි දෙවතාසන්නිපාත දැකැ, "මෙ දෙවතාසමාගමය ඉතා මහතැ. මහණහු, "මෙසෙ මහත් දෙවතාසමාගමයෙකැ" යනු නො දන්ති. ඔව්නට කිව මැනැවැ"යි, "මහණෙනි, දස දහසක් සක්වළ දෙව්බඹහු බුදුන් සඟුන් දක්නට ආවාහැ. අතීතයෙහි වූ තාක් බුදුනට මෙ මැ පමණ[4] දෙවතාසන්නිපාත වී යැ; අනාගතයෙහි වන තාක්[5] බුදුනට මෙ මැ දෙවතාසන්නිපාත වෙයි; යම්සෙ මට දෙවතාසන්නිපාත වී දැ!"යි වදාළහැ. දැන් අනෙක් බුදු කෙනෙකුන් නැත්තෙන් තුන් වන වර නො වදාළො.[6]

එකල්හි බුදුහු "මහණෙනි, තොපට දෙවියන්ගෙ නම් ගොත් කියමි"යි වදාළහ. එ සඳැ දෙව්යො "මෙසෙ මහත් සමාගමයෙහි බුදුහු මහෙශාඛ්‍ය වූ දෙවියන් ගෙ නම් ගොත් කියත් මිසැ,[7] අල්පෙශාඛ්‍ය වූ දෙවියන්ගෙ නම් ගොත් කුම් කියත් දැ!"යි සිතූහු. බුදුහු ඔවුන්ගෙ අදහස් දැනැ, "දස දහසක් සක්වළින් ආවා වූ අල්පෙශාඛ්‍ය මහෙශාඛ්‍ය හැම දෙවියන්ගෙ නම් ගොත් කියමී" සිතූහු. සිතා බුදුහු හැම[8] තන්හි නො පැකිලැ පවත්නා අනාවරණ නුවණ ඇති වන බැවින්, දෙවියන් හැමදෙනා භව්‍ය අභව්‍ය විසින් දෙ කොටසක් කොටැ අභව්‍යයන් හැර භව්‍යයන් ගෙනැ, ඔවුන්ගෙ චර්යානුකූල ධර්ම දෙසුන් ව්‍යවස්ථා[9] කොටැ, "මොහු ආත්මාධ්‍යාශය විසින් දෙසු කලැ දන්ති හො! පරාධ්‍යාශය විසින් දෙසූ කලැ දන්ති හො!" යි බලනුවො, පරාධ්‍යාශය විසින් දෙසු කලැ දන්නා බව් දැකැ, "මෙහි දෙවියන් ගෙ අදහස් දැනැ චර්යානුකූල කොටැ පැනැ පුළුව්ස්නට නිසියෙක් ඇති හො!" යි බලනුවො, පන්සියක් සඟුන් කෙරෙහි එක් කෙනකුදු එයට නොනිසි බව් දැනැ සඟුන් කෙරෙහි එක් කෙනකුදු එයට නොනිසි බව් දැනැ අසූ මහසව්වන් දෙ අගසව්වන් බලා උනුත් නොනිසිසෙ දැකැ, "ඉදින් පසෙබුදු කෙනෙක් ඇත් නම්, ඔහු නිස්සහ හො!"යි බලන්නාහු, උනුත් එයට නොනිසිසෙ දැකැ, "ශක්‍රසුයාමාදි දෙවියන් කෙරෙහි යමෙක් නිසි වී නම්, උහු ලවා පැන විසජවමී"[10] බලනුවො, ඔව්නුදු කෙරෙහි කිසිවක්හු නොහැකිසෙ දැකැ, "මාසෙ මැ බුදු කෙනෙක් වූ කල නිස්සහැ. කිසි තැනෙක්හි බුදු කෙනෙක් ඇති හො!"යි අනන්තාපරිමාණ ලොකධාතුව අනන්ත නුවණ පතුරුවා බලන්නාහු, යම් තැනෙකැ අනෙක් බුදු කෙනෙකුන් නුදුටුහු නො දැකැ, ඉදින් "මම් මැ පිළිව්සැ[11] මම් මැ විසජන්නෙම්[12] වීම් නම්, එසෙ ද කලැ මෙ දෙව්යො අධිගම කරන්නට නොනිස්සැහැ අනෙක් බුදු කෙනකුන් පුළුවුස්නා කලැ, මා විසජන කලැ ප්‍රතිවෙධ කරන්නට නිසි වෙති. එබැවින් නිර්මිත බුදු කෙනෙකුන් මැවුව මැනැවැ"යි අභිඥාපාදකධ්‍යාන සමවැදැ එයින් නැඟී, පාසිවුරු ගැන්මුදු ආලොකන විලොකන දු පර්වයන් ගෙ[13] සංකොචන[14] ප්‍රසාරණ දු

[1] යනාදීන්
[2] පරියන්ත
[3] අකනිටා බඹ
[4] මෙපමණ
[5] වූතාක්
[6] නො වදාළහ
[7] කියන්නට
[8] තමන් හැම
[9] වැවස්ථා
[10] විසජමි
[11] මම් පිළිවිස
[12] විසජනුමෙන්
[13] පර්වතයන්ගෙන් ගෙන, පර්වත (න) යන් නෙගෙ
[14] සංකොටන

මා වැනි වෙව"යි කමවැජැරි සිතින්[1] පිරියම් කොටැ, පැදුන් යුගඳුරු මුදුනෙන් නැඟෙන සඳමඬල[2] බිඳැ නික්මෙන වන් කොටැ රූපාවචර සිතින් ඉටුහු.

දෙවියො එ දැකැ, "අනෙක් සඳෙක් නැඟෙ"යි කීහු. සඳ පියා එත් එත්, "සඳ නොවෙයි; එක් හිරෙක් නැඟෙයි" යි කීහු. වැළි දු ආසන්න වැ එත් එත්, හිරෙක් නොවෙයි; එක් දිව්‍ය විමානයෙකැ"යි කීහු. වැළි දු ආසන්න වැ එත් එත්, 'දිව්‍ය විමානයෙක් නොවෙයි; එක් දිව්‍ය පුත්‍රයෙකැ"යි කීහු. වැළි දු ආසන්න වැ එත් එත්, "දිව්‍ය පුත්‍රයෙක් නොවෙයි. එක් මහබඹෙකැ"යි කීහු. වැළි දු ආසන්න වැ එත් එත්, "මහබඹෙක්[3] නොවෙයි. අනෙක් බුදු කෙනෙකැ"යි කීහු. එහි පුහුදුන්[4] දෙවියො, "එක් බුදු කෙනෙකුන්ගෙ මෙබඳු දෙවතාසන්නිපාත වන කලැ, දෙ බුදු කෙනකුන් ගෙ මැ දෙවතාසන්නිපාත කිසෙ මහත් වෙයි හො!" යි සිතුහු. ආර්‍යය දෙවියො වූ කල, "එක කාලයෙහි දෙ බුදු කෙනෙක් නම් නොවෙති. එකාන්තයෙන් බුදුන් තමන් හා සම අනෙක් බුදු කෙනකුන් මැවුසෙ යැ"යි[5] සිතුහු.

එකල්හි දෙව්පිරිස් දක්නා සෙ මැ නිර්මිත බුදුහු අවුදු, බුදුන් නොවැඳ මැ පෙරට සම සම කොටැ මැවූ අස්නෙහි වැඩැහුන්හු. බුදුනුදු ගෙ[6] දෙතිස් මහපුරිස්ලකුණැ,[7] නිර්මිත බුදුනුගෙ දෙතිස් මහපුරිස්ලකුණැ. බුදුන් සිරිරින් සවනක් රස් නික්මෙයි. නිර්මිත බුදුනුදු[8] සිරිරින් සවනක් රස් නික්මෙයි. බුදුන් ගෙ ශරීරයෙන් රස් නික්මැ නිර්මිත බුදුන් ගෙ ශරීරයෙහි පහරි. නිර්මිත බුදුන් ගෙ ශරීරයෙන් රස් නික්මැ බුදුන් ගෙ ශරීරයෙහි පහරි. දෙ බුදුන් ගෙ ශරීරයෙන් නික්මුණු රස්හු අකනිටා බඹලො දක්වා නැඟි බව අග මැඩැ, සළා දී බැහැ, සක්වළ ගල් මුඳුනෙහි පැහැරැ, පොළො තෙලෙහි ගැසී, දස දිසා පහයමින් වඩිත්. සියලු සක්වළ ගබ රුවන්මුවා වක්ගොවනැස් ඔත් දාගෙකක්[9] සෙයින් දිලියෙ.

දස දහසක්[10] සක්වළැ දෙවියො එක් සක්වළැ[11] රැස් වූවාහු, දෙ බුදුන් ගෙ රශ්මිගර්භ අතුරෙහි වැදැ සිටියො. නිර්මිත බුදුහු වැඩැ හිඳුනාහු මැ, "**පුච්ඡාමි මුනිං මහානුභාවං**" යන ගාථායෙන් බුදුන් බොපලග්හි සව් කෙලෙස් පැහැ[12] පිරිසිදු වූ සෙයට ස්තොත්‍ර කෙරෙමින් වැඩැහුන්හු.

එ සඳ බුදුහු දෙවියනට සොම්නස් ජනවනු සඳහා, "මහණෙනි, දෙවියන් ගෙ නම් ගොත් කියමි. දිව ඇසින් දෙව්පිරිස් බලව"යි වදාළහැ. සඟහු දිව ඇසින් බලන්නාහු, දෙව්පිරිස් දුටිහු.[13] එකලැ බුදුහු, "මහණෙනි, මෙ **කිඹුල්වත්** මහවනයෙහි දස දහසක් සක්වළැ දෙවියො අවුදු බුදුන් සඟුන් වැඳ සතුටු සොම්නස් වැ දිලී[14] සිටියහ"යි වදාරා, එමැ නියායෙන් දස දහසක් සක්වළැ භූමදෙවියන් රුක් දෙවියන් දියෙහි තෙලෙහි ගලැ අහසැ දෙවියන් ගෙ නම් ගොත් වදාළො. එක්බිති "මහණෙනි, දස දහසක් සක්වළැ

[1] කමවැදිරිසිතින්
[2] සඳමඬලක්
[3] මහබඹ
[4] බුදුන්
[5] මැවුයේ යි,
[6] බුදුහුනුදුගෙ
[7] ලකුණු
[8] බුදුසිරිරින්, බුදුන් සිරිරින්
[9] ගෙයක්
[10] දසදහස්-මු:
[11] සක්වළට
[12] සහ, පහයා, පහා, සහය;
[13] දුටිහ, දුටුහු
[14] දිලිහි

දියරට්[1] නම් දස දහසක් වරම් රජහු ඇති. ඔහු හැමදෙන කෙළසුවහස් කෙළසුවහස්[2] ගඳැවි[3] දෙවියන් පිරිවරා අවුදු පැදුන් දෙසෙහි මෙ වනයෙහි පටන්-ගෙනැ සක්වළ ගබ පිරි සිටියහැ. දස දහසක් සක්වළැ විරූළ්හ නම්, විරූපක්ඛ නම්, කුවෙර නම් දස දහස් දස දහස් වරම් මහරජහු ඇති. ඔහු හැම දෙන කෙළසුවහස් කෙළසුවහස් කුම්භාණ්ඩයන් නාගයන් යක්ෂයන් පිරිවරා අවුදු දකුණු දෙසෙහි පැළ දෙසෙහි උතුරු දෙසෙහි මෙ වනයෙහි පටන්-ගෙනැ සක්වළ ගබ පිරි සිටියාහැ. ඔහු හැම දෙන ගල් මුඳුනෙහි දිලියෙන ගිනිකඳ සෙයින් දිලියෙති.

**"චත්තාරො තෙ මහාරාජා**
**සමන්තා චතුරො දිසා,**
**දද්දල්ලමානා අට්ඨංසු**
**වනෙ කාපිලවත්‍ථවෙ"යි**

"මහණෙනි, දස දහසක් සක්වළැ නාගයන් හා සුපර්ණයො අසුරයන් හා දෙවියො, නෑයන් හා මිත්‍රයන් සෙයින්, සිනිඳු සිතින් මියුරු බස් බැණැ අත අල්ලා[4] - ගෙනැ සිපැ - ගෙනැ දසරියෙහි අත් නඟා-තබා සතුටු සොම්නස් වැ බුදුන් සරණ ගියහැ. දස දහසක් සක්වළැ දස දහසක් දෙව්රජහු[5] ද, දස දහසක් සුයාම දෙවරාජයො ද, දස දහසක් සන්තුෂිත[6] දෙවරාජයො ද දස දහසක් සුනිර්මිත[7] දෙවරාජයො ද, දස දහසක් පරනිර්මිත[8] දෙවරාජයො ද, වෙන වෙන අනන්තා පරිමාණ දෙවියන් පිරිවරා අවුදු, මෙ වනයෙහි පටන්-ගෙනැ සක්වළ ගබ පිරි සිටියහැ. එක් ඇඟිල්ලක් නඟා දහසක් සක්වළ, දස ඇඟිල්ලක් නඟා දස දහසක් සක්වළ, පහන් කරන්නට නිසි සනත්කුමාරාදි දහස්[9] බඹහුද්, හාරිතාදි සුවහස්[10] බඹහුද්, අනන්තාපරිමාණ බඹුන් පිරිවරා අවුදු, මෙ වනයෙහි පටන්-ගෙනැ සක්වළගබ පිරි සිටියාහැ. දස දහසක් සක්වළැ ද්‍යුතියජ්ඣන[11] තලවැසි, තතියජ්ඣන[12] තල වැසි, සියුතජ්ඣන්[13] තල වැසි, සුද්ධාවාස වැසි මහබඹහු අනන්තාපරිමාණ බඹුන් පිරිවරා අවුදු මෙ වනයෙහි පටන් ගෙනැ සක්වළ ගබ පිරි සිටියාහැ.

"මහණෙනි, මර දෙව්පිත් අතිමහත් දෙවතාසන්නිපාත දැකැ, ඔව්නට අභිසමයාන්තරාය කටටි වැ, අත්ලෙන් පොළො තෙලෙහි පැහැරැ, මාර ගර්ජනා කොටැ, මර සෙනඟ හා සමඟ අවුදු, අනෙකප්‍රකාර විභීෂිකා දක්වයි. දෙවියො මාගෙ අනුභාවයෙන් උහු ගෙ රූප නොදක්ති. හඬ නො ද අසති"යි වදාළො. බුදුහු, යම් තැනෙකැ අභිසමය නොවෙ නම්, මාර විභීෂිකා නො වළකති. යම් තැනෙකැ අභිසමය වෙ නම්. යම්සෙ පර්ෂද් ඔහුගෙ රූප නො දකිත් ද, ශබ්ද නො අසද් ද, එසෙ ඉටත්. මෙ සමාගමයෙහි වූ කල මහාභිසමය වෙයි. එයින් "දෙවියො මරහු ගෙ රූප නො දකිත්වයි; හඬ නො අසත්ව"යි ඉටුහු. සඟහු එලසමවත් සමවන්හු. එකල්හි මර දෙව්පිත් යම් කෙනෙක්නට දු භය නැතිසෙ දැකැ, සඟුන් අරහයා බුදුනට මෙ ගය කී:

---

[1] දියරට
[2] කෙළසුවහස් කෙළසුවහස්
[3] ගඳවි, ගඳවු
[4] අල්වා
[5] සක්දෙව් රජහු ද
[6] සන්තුසිත
[7] සුනිම්මිත
[8] පරනිම්මිත
[9] දහස් දහස්
[10] සුවහස් සුවහස්
[11] දුතියජ්ඣාන
[12] තතියජ්ඣාන
[13] සිවුතජ්ඣන්, චතුත්‍ථජ්ඣාන

**“සබ්බෙ විජිතසඞ්ගාමා**
**භයාතීතා යසස්සිනො,**
**මොදන්ති සහ භූතෙහි**
**සාවකා තෙ ජනෙසුත”යි**

බුදුන් මෙ **මහසමාම්සුත**[1] දෙසූ කලැ කෙළ ලක්‍ෂයක් දෙවියො බඹහු රාත් වූහු. අසඞ්ඛ්‍යයක් දෙවියො බඹහු සොවාන් සෙදැගැමි අනැගැමි වූහු. මෙ සුත දෙවියනට

[1] මාසමාම්සුත, මහාසමාග (හ) ම් සුත, මහාසමයසුත.

ප්‍රිය යැ. එබැවින් මඟුලෙහි කිය යුතු. දෙවියො, “මෙ සුත අසම්හ”යි කන් රුකොටැ-ගෙනැ* ඇවිදිත්. මෙ සුත දෙවියනට ප්‍රිය පරිදි කිසෙ යැ යත්:

කෙළපවු වෙහෙර නාලෙනදෙර නා රුකැ එක් දෙව් දුවක් වෙසෙයි. එක් ළදරු පැවිජි කෙනෙක් ඇතුළු ලෙනැ හිඳැ මෙ සුත පිරිවහති. දෙව්දු අසා, සමහරයෙහි[1] මහත් කොටැ සාධුකාර දුන. පැවිජ්ජො, “තො[2] කවරහු[3]?” යි කීහු. “වහන්සෙ, මම් දෙව්දුවක්මු[4]”යි කිවැ.[5] “කුමට සාධුකාර දුන්හු?” යි කීහැ. “වහන්සෙ, බුදුන් මහවනයෙහි වැඩැ හිඳැ මෙ සුත දෙසන දවස් ඇසිමි. දැන් අද ඇසිමි. බුදුන් වදාළ නියායෙන් එක් අකුරකු දු නො පිරිහෙළා ගත් දැ යැයි” කිවැ. “තො මෙ සුත බුදුන් දෙසන්නා ඇසුහුදැ?”යි කීහ. “ඇසිමි; වහන්සෙ,”යි කිවැ. “එ කල්හි දෙවතාසන්නිපාත ඉතා මහතැ. තො කො තැනැ සිටැ ඇසුහු?”යි[6] කීහ. “වහන්සෙ, මම් මහවනයෙහි දෙව්දුවක්මු.[7] මහෙශාඛ්‍යදෙවියන් එත් එත්, දඹදිවැ සිටුනා[8] අවකාශ නො ලදිමි. මෙ ලක්දිවට අවුදු, දඹුල් තොටැ සිටැ අසන්නට වන්මි. එහි දු මහෙශාඛ්‍ය දෙවියන් එත් එත්, අනුක්‍රමයෙන් පසු පස්සෙන් බස්මින් අවුදු, රුහුණු දනවියෙහි[9] මහගම් පිටිපසැ ගොළුමුහුදැ[10] ගල පමණ දියට බැසැ, එහි සිටැ ඇසිමි”යි කිවැ. “තී සිටි තැන් දුර බුදුන් දුටුහු දැ?”යි කීහ. “කුමක් කියව? වහන්සෙ, බුදුහු කිඹුල්වත් මහ වනයෙහි වැඩැහිඳැ ධම් දෙසන්නාහු, නිරන්තරයෙන් මා මැ බලතී හඟනෙයිම්[11] විලි ඇති වැ රළ මුවහ වීම්”යි කිවැ. “එ දවස් කෙළ සුවහස් දෙවියො රාත් වූහු. තො ද රාත් වූහු දැ?”යි කීහ. “නැති; වහන්සෙ”යි කිවැ. “අනැගැමි වූහු දැ?”යි කීහ. “නැති; වහන්සෙ” යි කිවැ. “සෙදැගැමි වුහු දැ?යි” කීහ. “නැති; වහන්සෙ”යි කිවැ. “තුන් මඟ තුන් පල පත් දෙවියො ගණනපතාතික්‍රාන්තයහ. ‘තො සොවන්හු,[12] යි සිතුයෙමි”යි කීහ.

දෙව් දූ එ දවස් තමා සොවන් නු වූ සෙයට ලජ්ජා ඇති වැ, “වහන්සෙ, නුපුළුවුත[13] මනා දැයක් පුළුවුස්නා දැ යැ” කිවැ. එකලැ පැවිජ්ජො, “තී දැක්කැටියම්හ” යි කීහ. “වහන්සෙ, සියල් සිරිරු[14] නො දැක්විය හැක්කැ.[15] ඇඟිලි පර්වයක්[16] වහන්සේට දක්වමි”යි කෙසි විදින් ඇඟිල්ල[17] ඇතුළු ලෙනට කළා. සඳ දහස් හිරි දහස් නැඟි කලක් වැනි වි යැ. දෙව් දූ, “නොපමා වන්නෙ යැ, වහන්සෙ”යි ළඳරු පැවිජ්ජන් වැඳැ ගියා මෙසෙ මෙ සුත දෙවියනට ප්‍රිය යැ. මන වඩයි. දෙවියො, “අප ගෙ සුත යැ” යෙත්.

මෙසෙයින් බුදුහු තමන් පුරුෂදම්‍යසාරථී වන බැවින් පන්සියක් ශාක්‍ය භික්‍ෂුනුදු ආදි ශබ්දයෙන් ගත් අනෙසිය දහස් උත්කණ්ඨිත භික්ෂුනුදු දමා අමා මහනිවනින් පැමිණිවූහු.

---

[1] සමහාරයෙහි, සමාහාරයෙහි
[2] තොහො
[3] කවරහ
[4] දෙව් දුවක්මි
[5] යූ, කීහ
[6] ඇසුදැයි, ඇසුවාහුයි
[7] දෙව්දුවකමි
[8] සිටිනා
[9] දනව්වෙහි, දනව්යෙහි
[10] ගොළුමුහුදු
[11] හඟනෙයින් (ඉන්) * කන්කුරු-මු: 89 පිටැ “කන් හුරු කොට ගෙන” යනුදු මෙ ලෙස සළකන්නෙ යැ.
[12] තී සෝවාන් වුහුයි
[13] නො පුළුවුස
[14] සිරුරු
[15] නො දැක්කැ හැක්ක
[16] පර්ව (බ) තයක්
[17] ඇඟිල්ලක්

**භික්‍ෂුදමන නම් තෙලෙස් වන පරිච්ඡේදය නිමි.**

## 14. නාගදමන නම් පරිච්ඡේදය

### නන්දෝපනන්දදමනය

නන්දොප්පනන්ද නම් නාගරාජයා දැමූ පරිදි කිසෙ යැ යත්:

බුදුන් දෙව්රම්හි[1] වැඩැවසන[2] කල්හි, අනෙවඩු මහාසිටාණො බුදුන් කෙරෙ බණ අසා, "වහන්සෙ, සෙට පන්සියක් සඟුන් ගෙනැ මාගෙ ගෙට වඩුත් මැනැවැ"යි නිමන්ත්‍රණ කොටැ ගියහ. බුදුහු අධිවාසනා කොටැ, එ දවසැ සිටි වෙලාව දු රැයි දු[3] ගිය කල්හි, අනුයම්හි දස දහසක් සක්වළ බැලුහු. එකල්හි **නන්දෙපනන්ද** නම් නාගරාජ බුදුන් ගෙ නුවණැස්හි පැනිණ. බුදුහු, "මෙ නාගරාජ අප ගෙ නුවණැසැ[4] පැනෙයි. මුහුට උපනිඃශ්‍රය ඇති හො!"යි ආවර්ජනා කරන්නාහු, "මෙ මිසදිට්හ[5] යෙන් තොර කරන්නට නිස්සෙක් කවරැ හො!" යි[6] අවජනාහු, මහමුගලන් මහතෙරුන් දුටිහැ.[7] එක්බිති පහන් වූ කල්හි සිරිරුකිස කොටැ අනඳ මහතෙරුන් කැඳවූහු. "අනඳ, පන්සියයක් මහණනට කියා 'බුදුහු දෙවචාරිකාවට යෙතී' කියා" යැ.[8]

එ දවස් **නන්දෝපනන්ද**යා ගෙ අවන් බිම්[9] සැදුහැ. හෙ දිව රුවන්මුවා පලග මත්තෙ දිව සෙ-සත් යටැ තුන් වැදැරුම් නළු පිරිස් හා නාපිරිස් පිරිවරා දිව බොජනෙන්[10] එළවු අන්නපානවිධි බලමින් හුන්නෙ යි. එකල්හි බුදුහු, යම්සෙ නාගරාජ දකී ද, එසෙ මැ පැනෙනුවො උහු ගෙ විමන් මුඳුනෙන්[11] මැ පන්සියක් සඟුන් හා සමඟ තව්තිසා දෙව්ලො බලා වඩති.[12] එකල්හි **නන්දෝපනන්ද** නම් නාග රාජයා හට මෙබඳු පව්ටි දට්හයෙක්[13] උපනිඃ "මෙ මුඬු මහණ සියො[14] අපගෙ විමන් මුඳුනෙහි[15] ගෙනැ **තව්තිසැ**[16] වැසි දෙවියන් ගෙ භවනයට වදිත් මැයැ. නික්මෙත් මැ යැ. දැන් මෙතන පටන්-ගෙනැ ඔවුන් අප මුදුනෙහි ගෙනැ පියපස් ඕමින්[17] නොයා දුන මැනැවැ"යි හුනස්නෙන් නැඟී **මෙරගල්** පාතට ගොස්, එ වෙස් හැරැ සිය වෙස් ගෙනැ **මෙරගල්** සත් දරණපටෙකින් වසා, මෙර මුදුනෙහි මහත් පැණයක් කොටැ, **තව්තිසා** දෙව්නුවර කිබිසිනි කළ පැණයෙන් සොයා අදසුන් බවට පැමිණිවි.

---

[1] දෙව්රම් වෙහෙර
[2] වැඩවසනු
[3] රැයින්
[4] නුවණැසට
[5] මිසදිටුහ, මිසදිටු, මිසදිට්
[6] තුණුරුවන්හි ගුණ
[7] දුටුහු, දුට්හු
[8] කියායී, කියායයි
[9] අවම්බිම්, අවසන්බිම්
[10] දිවබජනෙන්-මු
[11] වියන් මුදුනෙන්
[12] වඩිති
[13] පව්ටු දිටුහයෙක්
[14] මහණ-වියො-හැම
[15] මුදුනෙන්
[16] තව්තිසා
[17] ඔවමින්

එකල්හි රටපල් මහතෙරහු, "වහන්සෙ, මම් පෙරැ මෙ පියෙස්මි සිටියෙයිම්[1] මෙරගල් දක්මි.[2] සත් කුලප වූ දක්මි.[3] තව්තිසා දෙව්නුවර දක්මි.[3] විජයත් මහ පහා දක්මි[3]. පහා මුදුනෙහි ලළන දද දහස් දක්මි.[3] වහන්සෙ, කවර හෙතුවින් හො දැන් මෙරගල් නො දක්මි? විජයත් මහ පහා නොදක්මි? පහා මුදුනෙහි දද නොද දක්මි?" යි බුදුනට කීහැ. එ සඟ බුදුහු, "රටපාල, මෙ නන්දෝපනන්ද නම් නාගරාජ තොපට දැහැවී යැ. මෙරගල් සත් දරණින් පිරිබෙව් කොටැ මුදුනෙහි පැණයෙන් පිළිසොයා අඳුරු කොටැ සිටියෙ යැ"යි වදාළහැ. රටපල් මහතෙරහු, "මම් ඔහු දමමි; වහන්සෙ,"යි කී හැ. බුදුහු නො අනුදත්හ. එසෙයින් මැ භද්දිය මහතෙරහු රාල් මහතෙරහු දැ යි අනුක්‍රමයෙන් හැම සඟහු අවුද් බුදුනට සැළ කළහ. බුදුහු නො අනුදත්හ. අවසන්හි මහමුගලන් මහතෙරහු අවුදු, "වහන්සෙ, මම් නාරජහු දමමි" කීහ. "දමා; මුගලනැ"යි බුදුහු අනුදත්හැ.

මහතෙරහු මහණ වෙස් හැරැ, මහත් නා රජ වෙසක් මවා-ගෙනැ, නන්දෝපනන්ද නම් නාගරාජයා ගෙ සත් දරණ පට පිටැ තුදුසු දරණ පටක් එවැ, මොහු ගෙ පැණය මුදුනෙහි තමන්ගෙ පැණය තබා, මෙරගල් හා සමඟ පෙළා-ලූහ.[4] නා රජ දුමයි. මාතෙරහුද්, "තාගෙ සරීරයෙහි මතු දුම් ඇත්තෙ නොවෙයි. මයිදු ගෙ සරීරයෙහි දු දුම් ඇතැ"යි දුමති. නා රජහු ගෙ දුමින් මහතෙරනට බාධා නැති. මහ තෙරුන් දුමින් හා රජ හට බාධා වී යැ.

එක්බිති නා රජ දිලියිණ. මහතෙරහුද් දිලියෙන්නාහු, "තාගෙ ශරීරයෙහි මතු දල ඇත්තෙ නොවෙයි. මයිදු ගෙ සරීරයෙහිද් දල ඇතී" දිලියුණහ. නාගරාජයා ගෙ දලයෙන් මහතෙරනට බාධා නැති මහතෙරුන් ගෙ දල නාගරාජයා හට බාධා කෙරෙයි. නාගරාජ, "මෙ මහණ මා මෙරගල් හා සමඟ පෙළා-ලා දුමයි. දිලියෙ"යි සිතා, "භවත, තො කවරැ?"යි පිළිවිතැ. "නන්දය, මම් මුගලන්මි"යි කීහ. "වහන්සෙ, තොපගෙ මහණ වෙසින් සිටුව"යි කීයැ. මහතෙරහු නා රජ වෙස් හැරැ, මහණ වෙසින් ඔහු දකුණු කනින් නික්මෙති. එ සෙයින් මැ දකුණු නාසා බිලයෙන් වැදැ වම් නාසාබිලයෙන්[4] නික්මෙති. වම් නාසාබිලයෙන්[1] වැදැ දකුනු නාසා බිලයෙන්[1] නික්මෙති.

එක්බිති නා රජ මුව[5] විවර[6] කෙළෙ. මහතෙරහු මියෙන්[7] වැදැ ඇතුළු කුසැ හිස පටන්-ගෙනැ වල්පත් දක්වා,[8] වල්පත පටන්-ගෙනැ හිස දක්වා,[5] සක්මන් කෙරෙති. බුදුහු, "මුගලන, සිහි එළවා. මහත් ඍද්ධි ඇත්තෙ යැ නා රජ"යි වදාළහැ. මහතෙරහු "වහන්සෙ, මා විසින් සතර ඍද්ධි පාදයො භවන ලද්දාහැ. නන්දෝපනන්ද සිටිව යි; මම නන්දෝපනන්දයා වැනි නාරජන් සියතු දු දහසකුදු දහසකුදු දස දමමී" කීහ. නා රජ සිතී: "මහණු කුසට වදනා කලැ නො දිටිමි. නික්මෙන කලැ දැන් දළ අතුරෙහි හොවා මිරිකා කමි"යි සිතා, 'නික්මැ යව; වහන්සෙ, මා ඇතුළු කුසැ ඔබට මොබට සක්මන් කොටැ[9] මා නො පෙළව"යි කී යැ. මහතෙරහු නික්මැ පිටතැ සිටියාහැ.

---

[1] සිටි සෙයින්, සිටියෙම්

[2] දත්මි

[3] පෙරළාලූහ, වෙළාලූහ

[4] නාසා සිදුරෙන්

[5] මුවය

[6] විවෘත

[7] මුයෙන්, මුවයෙන්

[8] දක්වාද්

[9] නො කොට,

නාගරජ මහතෙරුන් දැකැ, "මෙහෙ සෙයැ නො?" යි[1] නාසාවාතයක් විහිට. මහතෙරහු සියුතජ්ඣන් සමවන්හ. ලොම්කුවකුදු ඔහු ගෙ විෂවාත සොල්වන්නට නොපොහොසත් වියැ. "සෙසු සඟහු ආදිය පටන්-ගෙනැ හැම පෙළහර කරන්නට පොහොසත් වූව ද, මෙතනට පැමිණැ. මෙසෙ වහා සමවදනට නොනිස්සහ"යි ඔවුනට බුදුහු නාගරාජයා දමන්නට නො අනුදත්හු.[2]

නාගරාජ, "මම් මෙ මහණහු නාසාවාතයෙන් ලොම්කුවකුදු[3] සොල්වන්නට නොපොහොසත් වීම්. මහණ මහත් සෘද්ධ ඇත්තෙ යැ" සිතී. මහතෙරහු මහණ වෙස් හැරැ ගුරුළුවෙසක් මවා-ගෙනැ, ගුරුළුවාත[4] දක්වා, නා රජහු ලුහුබැන්දාහු[5] නා රජ එ වෙස් පියා, මණෙවුවෙසක් මවා ගෙනැ, "වහන්සෙ, තොප සරණ යෙමි"යි කියනුයෙ, මහ තෙරුන් පා වැන්දැ. මහ තෙරහු "නන්දය බුදුහු වැඩියාහ: එ, බුදුන් කරා යම්හ"යි නා රජහු දමා නිර්විෂ කොටැ ගෙනැ, බුදුන් කරා ගියහැ.[6]

නා රජ බුදුන් වැඳැ "වහන්සෙ, තොප සරණ යෙමි"යි කී යැ. බුදුහු "සුව පත් වා,[7] නා රජ" යි වදාරා ධම් දෙසන්නාහු, "නන්දය, සතුරන් කෙරෙහි ක්‍රොධ නොකට යුත්තෙ යැ. ක්‍රොධ ඇති පුඟුල් වැදු[8] මවට ද, දා පියාට ද, මල්බෑයනට ද, නෑයනට ද, මිතුරනට ද, අප්‍රිය වෙයි. ඩහන්නට ආ සපක්හු සෙයින්, අටවියෙහි[9] නැඟී සොරක්හු සෙයින්, කන්නට ආ යකක්හු සෙයින්, ත්‍රාස උපයනු වෙයි. හැඳැ පැළැඳැ දු සිටියෙ, විවන වෙයි. පුන් සඳක් බඳු මහණෙක් වී නම්, දල පහළ පියුමක් සෙයින්. මල ගත් රන් කැටපතක් සෙයින්, විරූප වෙයි. ක්‍රොධයෙන් තුමූ තමන් ඇනැ මීයෙති. විෂ කා මීයෙති. දිව ඇදැ මියෙති.[10] ප්‍රපාතයෙහි හී මීයෙති. මෙලොවැ අනුන් විසින් ගරහනු ලැබෙති. පරලොවැ නිරය ආදියැ උපැදැ කුරිරු දරුණු දුක් විඳිති. ඉදින් මිනිස් පියක් ලද්දාහු නම්, උපන් තැන පටන් ගෙනැ රොගී වෙති. චක්ඛුරොග සොතරොගාදි රොගයන් කෙරෙහි එක්[11] රොගයෙකින් නැංගො නම්, අනෙක් රොගයෙකැ හෙති. රොගයෙන් නො මිදී, සියලු දුක් පත් වෙති. එබැවින් හැම සතුන් කෙරෙහි මෙත්සිත් ඇති විය යුත්තෙ යැ. හිත සිත් මෙළෙක් සිත් ඇති විය යුත්තෙ යැ"යි අවවාද කොටැ සරණසිලැ පිහිට්ටා, සඟුන් පිරිවරා අනෙවඩු මහසිටාණන් ගෙට වැඩියො. අනෙවඩු මහසිටාණො, "කිම, වහන්සෙ, දව වැ වැඩි දැ නො?" යි
කීහු. "මුගලන්හු හා නන්දොපනන්දයා හා දෙ දෙනාගෙ සඞ්ග්‍රාමයෙන් වී යැ" යි වදාළහැ. "වහන්සෙ, ක හට ජය යැ? ක හට පරාජය යැ?" යි පුළුවුත්හැ. "මුගලන් හට ජය යැ. නන්දයා හට පරාජය යැ"යි වදාළහැ. එකල්හි අනෙවඩු මහාසිටාණො, "වහන්සෙ, අද පටන් ගෙනැ සතියක් දවස් මාගෙ බත් අධිවාසනා කරනු මැනැවැ"යි අයපැ "මහතෙරනට ජයමඟුල් කෙරෙමි" යි සතියක් දවස් බුදු පාමොක් පන්සියක් සඟනට මහත් සත්කාර කොළො.

---

[1] මෙසෙය හොයි, මේ හේ යැ යි-මු
වෙහෙසයහෝයි
[2] අනු නොදත්හු
[3] කුපකුදු
[4] ගුරුළුවාද
[5] ලුහුබඳහු, ලුහුබැඳහු, ලුහුබන් (ඒ) හු-මු;
[6] ගොස්
[7] සුවපත් ව
[8] වැදැ
[9] අඩෙවියෙහි
[10] දිව ඇදැ කා මිතේ
[11] එක්තරා-මු:

## **නාලාගිරිදමනය**

'නාග' ශබ්දයෙන් ඇතුනුදු කියන බැවින් මෙයින් මැ **නාලාගිරි** ඇත්රජහු දු කියු වෙති. කිසෙ යැ යත්:*

**බුදුන් රජගහා නිසා ගිජ්කුළු**[1] පව්යෙහි වැඩැ වසන කල්හි, **දෙව්දත් තෙරුන්** විසින් බුදුන් මරනු[2] සඳහා මෙහෙයු දුනුවාවන්[3] කෙරෙහි පළමු මෙහෙයු දුනුවාවා අවුදු, "මම, වහන්සෙ, මරන්නට නො නිස්සෙමි. බුදුහු මහත් ඉදුහ ඇත්තාහැ, මහත් අනුභාව ඇත්තාහ" යි කී කල්හි, "තා මහණ **ගොයුම්හු** මරන්නට නොනිසි[4] බැවින් මම් මැ මරමී" කියා බුදුන් **ගිජ්කුළු**[1] පව්යෙහි සක්මන් කරන කල්හි **ගිජ්කුළු**[1] පව්වට නැඟී, "මෙ ගල්කුළින් මහණ **ගොයුම්හු** දිවි ගළවමී" යන්ත්‍රවෙගයෙන් මහත් ගල්කුළක් වුහුටහ.[5] දෙ ගල්කුළු කෙනෙක් එක් වැ එ ගල්කුළු පිළිගත්හ. එයින් පපටිකායෙන් නැඟී බුදුන් පයැ හී[6] ලෙස සෙල්වී යැ. බලවත් වෙදනා වී යැ. **ජීවකයො** බුදුන් පස සැතින් පළා දොස්ලෙ හැරැ, බෙහෙත් එවැ. නීරොග කළහ. බුදුහු පෙරැ සෙයින් මා සඟපිරිස් පිරිවරා මහත් බුද්ධ ලීලායෙන් ඇවිදුති.

එකල්හි දෙව්දත් තෙරහු එ දැක සිතුහු: "මහණ **ගොයුම්හු** ගෙ රූපයෙහි[7] අග්පත්[8] සිරිරු දැකැ කිසි මිනිසෙක් උපක්‍රම කරන්නට නො නිස්සැ. රජුගෙ **නලගිරි** නම් ඇති චණ්ඩ යැ. පරුෂ යැ. බුදුරුවන්හි ධමුරුවන්හි සඟුරුව්හි ගුණ නොදන්නි. හෙ ඔහු මරයි"[9] ගොස් රජ හට කී යැ. රජ, "මැනැවැ"යි ගිවිසැ. ඇතැදුරා[10] ගෙන්වා-ගෙනැ "සබඳ, සෙට නලගිරිහි මත් කොටැ පෙරවරු මහණ **ගොයුම්හු** පිළිපන් වීථියැ[11] විහිද"යි කී යැ. **දෙව්දත්** තෙරහු දු, "සෙසු දවස් මෙ ඇත් කෙතෙක් රහබො දැ?යි ඔහු පිළිවිසැ, "අට කළක් රහ බො" යි කීයෙන්, "සෙට සොළොස් කළක්[12] රහ පොවා මහණ **ගොයුම්හු** පිළිපන් වීථියැ විහිද"යි කීහැ. හෙ, "ඉතා මැනැවැ"යි ගිවිස්සැ. රජ, "සෙට **නලගිරිහි**, මත් කොටැ නුවරැ විහිදුති.[13] නුවරැ වැස්සො රැයිම්මෙහි මැ හැම කිස කොටැ අතුරු වෙයට නො බසිත්ව" යි නුවරැ බෙර පියෙව් කැරැවී යැ.[14] **දෙව්දත්** තෙරහු දු රජගෙන් බැසැ ඇත්හලට ගොස් ඇත්ගොව්වන් කැඳවා-ගෙනැ, "ඇපි තොප වවන්නට[15] නිස්සම්හ. තොපට ඉදින් යසයෙන් කම් ඇත් නම්, සෙට පෙරවරු නලගිරිහි තිහිණි[16] රා සොළොස් කළක් පොවා, මහණ **ගොයුම්හු** එන වෙලෙහි තොත්‍ර තොමරයෙන් විදැ විදැ දහවා[17] ඇත්හල් බිඳුවා, මහණ **ගොයුම්හු** පිළිපන් වීථියට මෙහෙයා, ඔහු මරා-පියව"යි කීහැ. ඔහු "ඉතා මැනැවැ"යි ගිවිස්සහැ.

---

[1] ගිජුකුළු  - මු
[2] මරවනු
[3] දුනුවායන්
[4] නො නිස්ස
[5] වුහුට
[6] පයහි පායෙහි මු
[7] රූපයෙන්-මු:
[8] අගපත් *නාග ශබ්දයෙන් ඇතුනුදු කියන බැවින් මෙ සෙයින් මැ නාලාගිරි නම් ඇත් රජහු දැමු පරිදි කියු වෙත්, කිසෙයැ යත්-පොත්
[9] හෙ ඔහු මැරීම්යි, හෙ ඔහු මරම් යි, හෙ ඔහු ලබා මරවම්යි
[10] ඇතාදුර
[11] වීථියට
[12] කළයක්
[13] විහිදති, විහිදුවති
[14] කැරවීයැ
[15] වවන්නටත් නසන්නටත්
[16] තිහුණු
[17] දවා

එ පවත් මුළු නුවරැ පැතිරැ ගියෙ. තුණුරුවන්හි පහන් උපාසකවරහු එ අසා බුදුන් කරා ගොස්, “වහන්සෙ, දෙව්දත් තෙරහු රජු හා එක් වැ සෙට තොප පිළිපත් වෙයට **නලගිරිහි** විහිදූති.[1] සෙට නුවර නොගොස් මිහි වැඩැ හිඳුනෙ යැ. ඇපි වෙහෙරැ මැ වඩාහිඳුවා බුදුපාමොක් සඟනට දන් දෙම්හ”යි කීහැ. බුදුහු “සෙට නුවර සිඟන්නට යම්හ”යි නො වදාරා මැ, “මම් සෙට **නලගිරිහි** දමා පෙළහර කොටැ තිරයන් මැඩ **රජගහ** නුවරැ නො සිඟා මැ බික්සඟන් පිරිවරා නුවරින් නික්මැ **වෙළුවන** මැ එමි” යන සිතින් ඉවසුහු. ඔහු බුදුන් ඉවසූ බව් දැනැ වැඳැ නුවර ගියො.

බුදුහු පෙර යම්හි ධම් දෙසා, මැදිම් යම්හි[2] දෙවියන් පුළුවුත් පැන විසඳා අලුයම්හි පළමු වන භාගයෙහි සිංහශය්‍යා කොටැ දෙවන භාගයෙහි පල සමවතින් දවස් යවා, තුන් වන භාගයෙහි මහකුළුණු සමවත් සමවැදැ, විනෙ ජනන් බලා, **නාලාගිරි** දමනයෙහි[3] සුවාසූදහසක් දෙන හට[4] අභිසමය[5] වනසෙ දැකැ, පහන් වූ කලැ සිරිරු පිළිදැහැ, **අනඳ** මහතෙරුන් කැඳවා ගෙනැ, “අනඳ, අද **රජගහා** නුවර පිරිවරා සිටි අටළොස් වෙහෙරැ හැම මහණුන්[6] හා සමඟ **රජගහා** නුවර වදනට[7] කියා”යි වදාළහැ. මහතෙරහු එසෙ කළහ. හැම සඟහු **වෙළුවන** වෙහෙරැ රැස් වූහු.

බුදුහු මහබික්සඟුන්[8] පිරිවරා **රජගහා** නුවර වන්හු. ඇත්ගොව්වො කී පරිද්දෙන් පිළිපන්හ. මහත් සමාගම වියැ. තුණුරුවන්හි පහන් සැදැහැ ඇති මිනිස්හු, “අද මහානාගයන් දෙදෙනාගෙ සඞ්ගාම වෙයි. නිරුපම වූ බුද්ධ ලීලාවෙන් **නලගිරිහි** දමන සෙ බලම්හ”යි පහා සඳමඩු ගෙසියන්[9] ආදිය නැඟී සිටියහැ සැදැහැ නැත්තාහු,[10] මිසදිට්හ ගත්තාහු, “**නලගිරි**[11] චණ්ඩ යැ, පරුෂ යැ, කිසි කෙනකුන් ගෙ ගුණ නොදන්නි. මෙ අද මහණ ගොයුම්හු ගෙ රන්වන් සිරිරු දූ බිඳැ බිඳැ[12] මරා පියයි. අද අප සතුරා පිටි දක්මහ”යි පහා ආදිය නැඟී සිටියො. ඇතුදු බුදුන් එන්නන් දැකැ, මිනිසුන් උත්‍රාස කරවමින්, ගෙ විදහමින්, ගැල්[13] සුන් කෙරෙමින්, සොඬ මඬිමින් බුදුන් කරා දිවී.[14] ඔහු දැකැ සඟහු බුදුනට “වහන්සෙ, මෙ **නලගිරි** චණ්ඩ යැ, පරුෂ යැ, මිනීමරු යැ. මෙ වෙයට[15] පිළිපන්නෙ යැ.

බුදුන් ආදීන් ගෙ ගුණ නොදන්නි. වහන්සෙ, නවත්නෙ මැනැව, නවත්නෙ මැනැවැ”යි[16] කීහු. “මහණෙනි, නො බව, මම් **නලගිරි** දමන්නට පොහොසත්මි” වදාළො. එකල්හි **සැරැයුත්** මහ තෙරහු “පියනට උපන් කිසියෙක් නම්, දෙට පුත්හු පමණ වෙයි. මම් මැ ඔහු දමමී” කීහැ. බුදුහු, “**සැරැයුත**, බුද්බල[17] තොරැ, සවුබල තොරැ, තො සිට”යි පිළිබැහුහු.[18] මෙ සෙයින් බොහො සෙ අසූ මහසව්වො අයජියහැ. බුදුහු හැම දෙන මැ පිළිබැහුහු.

---

[1] විහිදුවති.
[2] මැදින් යම්හි
[3] දමනායෙහි
[4] සුවාසූ දහසක් හට
[5] අභිසමය සෙ
[6] මහණුන්
[7] රජගහා වදනට
[8] මහභික්සඟුන්
[9] පහාසඳ මඩුළු ගෙසියන්
[10] නැත්තා වූ
[11] නාලාගිරිහි
[12] සිඳ බිඳ, බිඳ සිඳ
[13] හල්-හැම ‘සකටානි’ අටුවා
[14] දිවෙ
[15] මෙයට
[16] නවත්නෙ මැනැවැයි
[17] බුදුහුබලඑ
[18] පිළිබැවුහු

එකල්හි අනඳ මහතෙරහු බුදුන් කෙරෙ බලවත් සෙනෙහයෙන්[1] අධිවාසනා නොකටැ හී, “මෙ ඇත් පළමු මා මරාව”යි බුදුන් සඳහා දිවි පියා බුදුන් පෙරට සිටියො. එ සඳ ‘බුද්හු, අනඳ පහ වැයා, මා පෙරට නොසිට”යි වදාළො. “වහන්සෙ, මෙ ඇත්[2] චණ්ඩ යැ, පරුෂ යැ, මිනීමරු යැ, යුගත් ගිනි වැන්නැ පළමු මා මරා පසු[3] තොප වහන්සෙ කරා යෙව”යි කීහු. බුදුන් තුන් යලක් කියතුදු, එසෙ මැ සිටිය හැ. පහ නොවූහු.[4] එකල්හි බුද්හු ඉදුහ බලයෙන් ඔවුන් පිළිබහා සඟුන් අතුරෙහි සිටුවූහ.[5] එ කෙණෙහි එක් මාගමක් නලගිරිහි දැකැ මරණභයභීත[6] වැ පලායන්නී උකුළින්[7] ත් දරුවකු ඇතු හා බුදුන් හා අතුරෙහි දමා-පියා පලා ගියා. ඇත් ඇය ලුහුබැඳැ-පියා නැවතී දරුවා කරා ගියෙ. දරු මහහඬින්[8] හඬයි. බුදුහු නලගිරිහි උදෙසා මෙත් පතුරුවා ඉතා මියුරු බඹගොස්[9] විහිදැ, [10]“භවත් නාලාගිරිය, තා සොළොස් කළක් රා පොවා මත් කරන්නාහු, අනෙකක්හු ගන්නට කළාහු නොවෙති. මා ගන්නට කළහැ.[11] අකාරණයෙ කකුල් කළකුරුවා නො ඇවිදැ[12] මොබ එ”යි වදාළහැ.

හෙ බුදුන් ගෙ බස් අසා, ඇස් විවර කොටැ බුදුන්ගෙ රූසිරි[13] බලා, පිළිලද සංවෙග ඇති වූයෙ, බුදුන් තෙදින් සිඳී ගිය සුරාමද ඇත්තෙ, අත බහා කන්පත් සලමින් ගොස්, බුදුන් පාවිට[14] බැසැ හොති.

එකල්හි බුදුහු “නලගිරිය, තො තිරිසන්වරණෙහි,[15] මම් බුදුවරණෙමි.[16] මෙ තන පටන්-ගෙනැ චණ්ඩපරුෂ නොවා,[17] මිනීමරු නොවා,[5] මෙත්සිත් පිළිලබ”යි වදාරා දකුණු අත දික් කොටැ කුඹ පිරිමැදැ, “මා කුඤ්ජර නාගමාසදෙ” යනාදීන් ධම් දෙසුහැ.[18] ඔහුගෙ සියල් සිරිරු ප්‍රීතින් නිරන්තර වැ පිරිණ. ඉදින් හෙ තිරිසන් නොවී නම්, සොවන් වූයෙ යැ.

මිනිස්හු එ පෙළහර දැකැ සකොබ[19] මුහුදුහඬ සෙයින් ගුගුළහ. සෙණ හඬ සෙයින් අපොළාපීහ.[20] ඔහු සොම්නස් වැ නන් අබරණ ඉසපීහ. එ අබරණින් ඇතු සිරිරු පිළිසන් වි යැ. එතන පටන්-ගෙනැ නාලාගිරි “ධනපාල” නම් විය.

එ සමාගමයෙහි සුවසූ දහසක් දෙන අධිගම කළහ. බුදුහු ධනපාලයා පන්සිලැ පිහිට්වූහු. හෙ සොඬින් බුදුන් ඇතුන් ඇකුන් තැනැ පස් ගෙනැ, තමා මුදුනෙහි එවැ, පසුපස්සෙන් බස්මින් ගොස්, දසුන් විදහන තැනැ සිටැ බුදුන් වැඳැ, නැවතී ඇත්හල් වන. එතැන පටන්-ගෙනැ කිසිවක්හු නො වෙහෙසී.[21] මෙසෙ කොපොලත්හි පැහැරැ මදදැලි මුසු වැ බමන මත් බමරමඬුලු හඬ මැ බෙර ඇති, කො-ගිනින් දිලියෙන,

---

[1] සෙනෙහසයෙන්,
[2] ඇතු
[3] පසු වැ
[4] නො වූවාහ
[5] සිටි වූ, සිටවූහ
[6] මරණ භයින් භීත.
[7] උකුලෙන්
[8] මරණ භයින්
[9] බඹගොස් හඬ
[10] විහිදුවා
[11] කළාහු වෙති
[12] ඇවිදු-මු:
[13] සිරිරු
[14] පාපිට
[15] වරණයෙහි
[16] වරණයෙමි
[17] නොව
[18] යනාදීන් දෙසු
[19] සබොබ
[20] අත් (ත්) පොළාපීහ
[21] නොවෙහෙ සයී.

යුගත් ගිනි මෙන්[1] යන ධනපලුවා[2] විසින් ඔවුන් අකුසුසියො මඟුල් ලකුණු පිරිවර ලදු, සක් ලකුණෙන් විසිතුරු, දෙ පත්ලෙහි බැසැ හෙවැ වඳනා ලද.

**එයින් කීහ. පාදපඞ්කජස්තවෙයි -**

**"ගණ්ඩස්ථලීලුඨිතදනමසිනිෂෙක**
**භ්‍රාන්තොන්තදද් භ්‍රමණමණ්ඩල ඩිණ්ඩිමෙන,**
**ක්‍රොධාග්නිනාහිදයතා[3] ධනපාලකෙන**
**පාදද්වයෙ ප්‍රණතමාර්ය ධෘතාඞ්කුශෙ තෙ"යි**

බුදුහු නිපන්[4] මනොරථ ඇති වැ, "යම් කෙනකුන් විසින් යම් ධනයෙක් ඉසැ-පියන[5] ලද ද, එ ධන ඔවුන් මැ කරා යෙව"යි ඉටා, "අද මා විසින් මහත් පෙළහරෙක් කරන ලද.[6] මෙ නුවරැසිඟනු[7] සොබනෙ නොවෙ"යි තිථයන් මැඩැ සඟපිරිස් පිරිවරා, දුටු රජක්හු[8] සෙයින්, නුවරින් නික්මැ වෙළුවන වෙහෙර මැ වැඩියො. නුවරැ වැස්සො අපමණ අන්නපාන ගෙනැ වෙහෙර ගොස් මහාදාන පැවැත්වූහු.

මෙ සෙයින් බුදුහු තමන් පුරුෂදම්‍යසාරථී වන බැවින් නන්දෙපනන්ද නම් නාගරාජයා ද, 'නාග ශබ්දයෙන් ඇතුනුදු කියන බැවින් ධනපාල[9] නම් මහානාගයා ද, ආදි ශබ්දයෙන් ගත් අපලාල නම් චුලොදර නම් මහොදර නම් අග්නිශිඛ නම් ධූමශික නම් ආරවාල නම් නාගරාජයනුද්[10] දමා සරණසිලැ පිහිට්වූහු.

**නාගමන නම් තුදුස් වන පරිච්ඡේදය නිමි.**

## 15. යක්‍ෂදමන නම් පරිච්ඡේදය

**ආළවක** නම් යක්‍ෂයා දැමු පරිදි කිසෙ යැ යත්:

අළවු නම් රට අළවු නම් නුවරැ අළවු නම් රජෙක් වි. හෙ නළු පිරිස් පිරිවරා විඳුනා නැටුම් ගඳෙවු[11] පියා, සොරුන් පිළි බහනු සඳහා දු, ව්‍යායාම කරනු සඳහා දු, සත් සත් දවසින් මුවදඩ යනුයෙ, එක් දවසක් බැලයෙහි[12] ඈත්තනට, "යමක්හු සිටි දසායෙන් මුවගොන්[13] පලා ගියෙ වී නම්, උහු මැ භාර යැ"යි කී යැ. එකල්හි රජු සිටි දසායෙන් මැ මුවගොන් පැලැ යැ. ජව ඇති රජ සිටි දසායෙන් මැ මුවගොන් පැලැ යැ. ජව ඇති රජ දුන්න ගෙනැ පයින් තුන් යොජනක් තැන් මුවා ලිහිබැඳැ-ගෙනැ ගියෙ.

[1] ගිනිකඳ (ක්) මෙන්
[2] ධනපාළුවා
[3] ක්‍රොධොබ්‍යවාදගියතා, ක්‍රොධොව්‍යවාද, ක්‍රොධොව්‍යාදහිතා, ක්‍රොධොෂ්මසාහිදයතා- මු: ක්‍රොධොෂ්මණාහිදවතා-මු:
[4] තමන්
[5] ඉසපියසු
[6] ලද්දෙයයි
[7] සිටුනු
[8] රජහු
[9] ධන පාලක
[10] නාග රාජයන්දු
[11] ගඳවි, ගනැවි, ගඳැ
[12] බලයෙහි
[13] මුවා ගොස්

ඉළුමුවො වනාහි තුන් යොජනකට ජව ඇත්තාහැ. හෙ එ කල්හි හී-ගිය[1] ජව ඇති ඉළුමුවා දියට වැදැ සිටියහු මරා දෙ කඩ කොටැ සිඳැ, තම හට මසින් කම් නැත ද, 'මුවා නොගත හිණ' යන අපවාද[2] මුදනු සඳහා කදින් ගෙනැ එන්නෙ, නුවරට නුදුරු තන්හි ගනබහල පත් ඇති මහත් නුගයක් දැකැ, පරිදාහ නිවනු සඳහා එ රුක්මුලට ගියෙ.

ඒ නුගරුකැ අළවු යක් වෙසවුණු රජහු කෙරෙන් භවනය ලදින් හිරිමුදුනෙහි එ රුක්සෙයෙන් පහළ පියෙසට වන් වන් සතුන් කමින් වෙසෙයි. හෙ ඔහු දැකැ කන්නට ළඟ වියැ. රජ ඔව්හට, "මා නොකා, මම තට දවසැ දවසැ මිනිසකු දූ බත්සැළකුදු[3] දී එවමි" කීයැ. යක්, "තො රජ ඉසුරුයෙන් පමා වැ[4] සඳහන්[5] නො කෙරෙයි.[6] මම් වනාහි භවනයට නොවන්නහුදු නොගිවිස්සනුදු කනු නො ලැබෙමි. එබැවින් මම තා නො යා දෙමි"යි කී යැ: රජ, "යම් දවසක් නොදී එවුම්[7] නම්, එ දවස් රජගෙට ගොස් මා කා"යි කී යැ. "ඉතා මැනැවැ"යි යක්ෂයා අවසර දුන් කල්හි නුවර බලා ගියෙ. රජබලය මඟැ කඳවුරට බැඳැ සිටැ, රජු දැකැ, "කිම, මහරජ,[8] අයශස් බා මෙසෙ දුක් වින්හි"[9] කියමින් පෙරමඟ ගොස් රජු පිරිවැරුහු.

රජ එ පවත් නොකියා[10] නුවර වැදැ බත් කා නුවර ලද්දා කැඳවා එ පවත් සැළ කෙළෙ. නුවරලදු[11] "කිම, මහරජ, කල් පිරිසුන්නෙ දැ?"යි කී යැ. රජ "පිරිකැපු දැ නැති" කී යැ. "මහරජ, වැරද වුව.[12] යක්ෂයො පිරිකැපු පමණක් මැ ලැබෙති. නොපිරිකැපු කලැ රටවැස්සනට පීඩා යැ. මැනැවැ, මහරජ, කිසි සෙයෙකින් තෙපි මෙසෙ කළහු[13] නම්, එ තැනැ සිතිවිලි නැති ව.[14] රජසුව අනුභව කරව. මම එයට කළ මනා දැ කෙරෙමී" බිණි යැ. හෙ වෙලා ඇති කලැ මැ[15] නැඟී, දඟගෙදොරැ සිටැ, යම් කෙනෙක් මට හුණුවාහු ද?[16] ඔවුන් සඳහා, "යමෙක් දිවි කැමැත්තෙ ද, හෙ නික්මෙව"යි බෙණෙයි. යමෙක් පළමු නික්මිණි ද, ඔහු ගෙට ඇරැ නහවා බත් කවා, "මෙ බත්සැළ[17]යක් හට දෙ"යි නහා යවයි. ඔහු රුක්මුල[18] වන් විගස මැ, යක් භයානක වෙසින් මුලඅඩකඩක්[19] සෙයින් කයි. යක්ෂානුභාවයෙන් මිනිසුන්ගෙ කෙහෙ පටන් - ගෙනැ සියල් සිරිරු වෙඬරුපිඬක් වැනි වෙයි.[20] යක් හට බත් ගෙන්වා-ගෙනැ ගිය මිනිස්හු උහු දැකැ බිය පත් වැ තමන් තමන් මිත්‍රයනට කීහු.

එතන පටන් ගෙනැ, "රජ සොරුන් ගෙනැ යක් මට දෙ"යි,[21] මිනිස්හු සොරකැමින් දුරු වූහ. එයින් උත්තරයෙහි අයළින්[22] වදනා සොරුන් නැති වන බැවින්, පරණ සොරුන් හීගිය[23] වන බැවින් දඟගෙ සිස් වි යැ. එකල්හි නුවරලදූ රජහට කී යැ. රජ

---

[1] ගිය
[2] අවවාද
[3] බත් සැළියකුදු, බත් තලියකුදු-මු:
[4] ඉසුරු (රැ) පමාව
[5] මා සඳහන්
[6] නො කෙරෙයි නම්
[7] එවීම්
[8] දැකැ මහරජ
[9] විඳුති, විඳිති, වින්ති, වින්දති, වින්දැයි-මු:
[10] එපවත් කියා
[11] නුවරලද්
[12] වැදැරුම් වූ
[13] කළා නම්, කළාහු නම්,
[14] නැතිව කළාහු වෙ, නැතිවැ-මු:
[15] ඇති ව මැ
[16] මරා (රු) හුනුවාහුද, මරනුහුවූවාහු ද
[17] සැළිය
[18] රුක්මුලට
[19] මුළුපලා කලබක්, මුලපලාකඩක් 'මුලකන්‍දං-අටුවා
[20] මෙත් හුණුවෙයි
[21] බලිදෙයි
[22] අයපිළින්
[23] හා කිය, හීගියක හිවර මු:

තමාගෙ ධන නුවරැ මහවෙයැ[1] තබා-පී යැ. 'ලොභයෙන් කිසි කෙනෙක් ගන්නාහු, නම් මැනැ මැ යැ'[2] කියා යැ. එහි පයිනුදු පහරනාහු නැති. හෙ සොරුන් නො ලබන්නෙ, ඇමැත්තනට කී යැ. ඇමැත්තො "කුලපිළිවෙලින් එකෙකි මහලු මිනිසකු[3] ගෙනැ නඟා යවම්හ"යි කීහැ. රජ, "නුවරවැස්සො 'අප පියන් අප මුත්තන් ගන්තී' ගිගිරි කෙරෙති. හෙ මට නො රිස්සි" වැළැකි "ඔස, මහරජ, පිටින් මිසැ නොහොතහෙන[4] දරුවන් දී යවම්හ. ඔව්නට[5] 'අප මවුපියො' යන සනා නැතී" කීහු. රජ අනුදත. ඔහු එසෙ කොළො. නුවරැ දරුවන් මවුහු දූ දරුවන් ගෙනැ, ගැබි[6]ලියො ද පලා ගොස්, පර රට දරුවන් විය පත් කල්හි ගෙනැ එති. එසෙ දොළොස් හවුරුද්දෙක් ගියෙ.

එයින් උත්තරයෙහි එක් දවසක් සියලු නුවර සොයා එක් දරුවකු[7] නොලදින්, "මහරජ, ඇතුළු රජගෙහි ත-පුතු අළවු රජකුමරහු තබා, නුවරැ දරුවො නැතී" කීහැ. "යම් කෙනෙක්හට තමා අත්පෙම් හා සම පෙම් ඇත්තෙ නොවෙයි. යව. ඔහුද් දී යවා මා දිවි රක්නෙ යැ"යි කීයැ. එකල්හි අළවු කුමරහු මවු, පුතු නහවා පහයින් ගන්වා දුහුල්සුඹුළියෙන් ගෙනැ ඔරැ හොවා-ගෙනැ හින්නී යැ. රාජ පුරුෂයො රජු ගෙ යෙදමෙන් අවුදු සොළොස්දහසක් නළුව නුදු වලප්ව වලප්වා කිරීමව[8] හා සමඟ "සෙට දවස් යක් හට බත් වෙ"යි හැරැ-ගෙනැ ගියො.

එ දවස් බුදුහු දෙව්රම් මහ වෙහෙරැ මහ ගඳකිළියැ අලුයම්හි මහකුළුණු සමවත් සමවැද බුදු ඇසින් ලොව බලන්නාහු, අළවු කුමරහු අනැගැම් වන්නට උපනිඃශ්‍රය ඇතිසෙ,[9] යක්‍ෂයා සොවන් වන්නට නිසිසෙ,[8] දෙසුන් අවසන්හි සුවසූදහසක් දෙනා අධිගම කරනසෙ දැකැ, පහන් වූ කලැ පෙරබත්කිස කොටැ පස්බත්කිස[10] නොනිමි වෙලෙහි[9] ගුණු[11] පොහො දවස් හිරු එප්සුණු කලැ හුදෙකලා වැ පාසිවුරු ගෙනැ, පා ගමනින් සැවැත් නුවරින් තිස් යොජුන් ගොස්, එ යක්හු ගෙ භවනයට වන්හු. බුදුහු, යම් නුගයෙක් අළවු යක්හු ගෙ භවන ඇද්ද, එ රුක්මුල්හි වුසුහ, හො! නොහොත් භවනයෙහි මැ වුසුහ, හො! යත්ඃ භවනයෙහි මැ වුසුහු. යම්සෙ යක්හු තමන් ගෙ භවන දකිත් ද, එසෙයින් මැ බුදුහු ද දකිත්. ඔහු එයට ගොස් විමන් දොරැ වැඩැසිටියාහැ. එකල්හි අළවු යක් හිමවියෙහි යක්‍ෂසමාගමයට ගියෙ යැ.

එ සඳ ආළවකයා ගෙ දොර[12] රක්නා ගද්‍රභ නම් යක්, බුදුන් කරා එළබැ, වැඳැ, "කිම, වහන්සෙ, මෙයට විකාලයෙහි වැඩි දැ නො!"යි කී යැ. "ගද්‍රභය, කළ මනා දැයකට ආම්හ. ඉදින් තට නොබර වී නම්, එක් රැයක් ආළවකයාගෙ භවනයෙහි වසම්හ" යි වදාළහැ. "වහන්සෙ, මට නොබරැ[13] අනෙකෙක් මත්න. එ යක් කැකුළැ, පරුෂ යැ, මවුපියනුදු පවා නො වඳී, වහන්සෙට මෙහි වසනු නො රිස්සව[14]"යි කී යැ. "ගද්‍රභය,

---

[1] කොවෙ මහවෙය, කොවේ හහවේහි-මු
[2] ගන්නා කෙනෙක් නම් කිසි (සේ) දැනෙයි
[3] මිනිසුන්
[4] නොගෙන
[5] ඔවුන්ට
[6] ගැබි
[7] සාවකු-මු
[8] කිරිමවු
[9] සෙ දැකැ
[10] පෙරබත් කිස පසුබක්කිස නිමවා, පෙරබක්කිස නිමවා පෙරබත්කිස නිමවා පසුබත්කිස නොනිමි
[11] පුණු, පුහුණු, පුහුණු, කළුවර-මු
[12] ගෙදොර
[13] නො බැරි
[14] වහන්සෙ මෙහි වසන් මට නො රිස්සියි. "මා රුච්චිභගවතො ඉධ වාසො' - අටුවා

හෙ ඔහුගෙ ස්වභාව යැ. මට කිසි අන්තරායයෙක් වන්නෙ නොවෙයි. ඉදින් තට නොබර වී නම්, එක් රැයක් මෙහි වසම්හ"යි වදාළහැ. දෙවන වැට දු ගද්‍රභ, නම් යක් බුදුනට "වහන්සෙ, ආළවක, ගිනින් රත් කළ යකබලක්[1] වැන්නැ. "මොහු මවුපියහැ, මුහු මහණබමුණහැ, මෙ දහමැ[2], යනු නො දන්නි. මෙයට ආවන් සිතට විබෙවු දු කෙරෙයි. හදවතු දු පළයි. පයැ ගෙනැ පර සමුද්‍රයෙහි හො පර සක්වළැ හො දමා-පියා"යි කී යැ. දෙවන වට දු බුදුහු "දන්මි; ගද්‍රභය, ඉදින් තට නොබර වී නම්, එක් රැයක් වසම්හ"යි වදාළහැ. "වහන්සෙ, මට නොබරැ. අනෙකෙක් මත්න.[3] එ යක් 'තම හට නොකියා අනුදත්හ" යි මා මරන්නෙ වනැ.[4] වහන්සෙ, ඔහු කරා ගොස් කියම් දැ?" යි කී යැ. "ගද්‍රභය, රිසිසෙ, ගොස් කියා" යි වදාළහැ. "ඔස, වහන්සෙ, මොබ මැ දන්නෙ යැ"යි බුදුන් වැඳ හිමවු ගියෙ.

භවනයෙහි දොර තෙමෙ මැ බුදුනට විවර වී යැ. බුදුහු ඇතුළු භවනයට වැදැ, යම් අස්නෙක්හි අළවු යක් උතුම් මඟුල් දවස් හිඳැ මහත් සිරි අනුභව කෙරෙ ද, එ මැ දිවරුවන් මුවා පලග මත්තෙ වැඩැ හිඳැ රන්වන් රස් වුහුටුහැ. එ සඳ යක්‍ෂයා ගෙ කන්‍යාවො අවුදු බුදුන් වැඳැ පිරිවරා හුන්හු. බුදුහු ඔවුනට "තෙපි දන් දී සිල් රැකැ පුදන්නට නිස්සන් පුදා මෙ සැපතට පත්ව. දැනුදු එසෙ මැ කරව.[5] ඔවුනොවුන් කෙරෙහි ඊර්ෂ්‍යා නො කරව" යනාදි විසින් ධම් දෙසූහැ. ඔහු බුදුන් ගෙ මියුරු ගැඹුරු හඬ අසා, සාධුකාර දහස් දී, බුදුන් පිරිවරා හුන්හු මැයි.

ගද්‍රභ ද[6] හිමවිවට ගොස් අළවු යක් හට "ස්වාමිය, බුදුහු අවුදු තා ගෙ විමන්හි වැඩැ හුන්නාහ" යි කීහැ. හෙ අභිමානයෙන් ලජ්ජිත වැ, ගද්‍රභය, හට "පිරිස් මැදැ කිසි කෙනෙක් අසනුවහැ.[7] නොබැණැ සිට. ගොස් කළ මනා දැ[8] කෙරෙමි"යි කීයැ.

එකල්හි සාතාගිර නම් හෙමවත් නම් යක්‍ෂසෙනාපතිහි දෙදෙන[9] "බුදුන් දෙව්රම්හි මැ වැඳැ යක්‍ෂ සමාගමයට යම්හ"යි සහපිරිවරින් නන්[10] යානයෙන්[11] අහසින් යෙති. අහසැ යක්නට හැම තන්හි මැ මඟ ඇත්තෙ නොවෙයි. අහසැ සිටි විමන් පීරා වූ මඟතැනින් මැ මඟ වෙයි.

අළවු යකුගෙ විමන් වනාහි බිම වූයෙ යැ, සුරැකි යැ, පවුරෙන් පිරිබෙව් ලද්දෙ ය, සුසංවිහිත වූ දොරොටු අටලු ඇත්තෙ යැ, උඩ අහස්පියෙස් රන්දැලින් ගැවැසී ගත්තෙ යැ, සුමුඟක් වැන්නැ, උසා තුන් යොජනැ. එ විමන් මුදුනෙහි වූ මැගින් ඔහු එ පියෙසට පැමිණැ යන්නට නොපොහොසත් වූහු.

කුමට යැ යත්:

බුදුන් යම් පියෙසෙකැ වැඩහුන,[12] මුදුනෙහි පටන්-ගෙනැ භවඅග් දක්වා යම් කෙනෙකුද් යන්නට නොනිස්සහැ. එයින් මෙ යක් සෙනෙවියා දෙදෙන දු නොයාහී,

---

[1] කබලක්
[2] දැහැම
[3] අනෙකෙක් නොවෙයි
[4] වන්න, වන්හැ
[5] කර-මු:
[6] ගද්‍රභ නම් යක්‍ෂ ද (යක්, යක් ද)
[7] අසනපිරහ
[8] වටිනා දෑ
[9] දෙදෙනා, දෙදෙන
[10] නන් නන්
[11] යානායෙන් යානාවෙන්
[12] පියසෙක ද වැඩහුන. පියසෙක වැඩහුන ද

“මෙ කුමැ!”යි ආවර්ජනා[1] කරන්නාහු, බුදුන් දැකැ අහසැ වුහුටු[2] කැටක් සෙ, බැසැ වැඳැ බණ අසා පැදකුණු කොටැ අවසර ගෙනැ යක්‍ෂසමාගමයට ගියො.

අළවු යක් ඔවුන් දැකැ, “මෙහි හිඳුව” තෙමෙ පහ වැ ඔව්නට අවසර දින. ඔහු අළවු යක් හට, “තට කැරුණෙ, මහත් ලාභ යැ.[3] බුදුහු තාගෙ භවනයෙහි වැඩැ හුන්නාහැ. යා, බුදුනට උපස්ථාන කරා”යි කීහු. එකල්හි අළවු යක් ගිනියෙහි[4] බහා-ලූ ලුණුකැට[5] සෙයින් ක්‍රොධයෙන් තට තටායමාන හෘදය ඇති වැ, “කවර බුදු නම් මාගෙ ගෙට වන්නෙ?” යි කී යැ. ඔහු දෙදෙන “තො නො දන්හි?”[6] අප බුදුන් තුසීපුරයෙහි සිටැ පඤ්චමහාවිලොකනා කොටැ” යනාදීන් ධම්සක් පවතුන් දක්වා කියා, පිළිසිඳ ආදියැ පාළ වූ දෙසිත් පූර්වනිමිත්ත කියා, “මෙ අසිරි පෙළහර නුදුටු විරි දැ?”යි කීහැ.

හෙ දුට ද, ක්‍රොධයෙන් “නො දිටිමි යි” කී යැ. “කියග, ආළවකය, හෙ තා දුට මනා මැ යැ. නුදුට මනා මැ යැ. තා[7] විසින් කිම දැකැ නොදැකැ? තො කුම් කෙරෙහි ද? අප බුදුන් පිණිස තො කියබර උසබ රජක්හු සමීපයෙහි එ දවස් උපන් වස්සක්හු වැන්නෙහි. ත්‍රිමදගලිත[8] මතැන් රජක්හු සමීපයෙහි ඇත්පැටක්හු[9] වැන්නෙහි. දිලියෙන කෙසරු සෙළෙන් හොබනා කඳට ඇති සිංහරාජයෙක් හු සමීපයෙහි මහලු කැණහිලක්හු[10] වැන්නෙහි. යෙළ සියක් යොජුන් ගුරුළු රජක්හු සමීපයෙහි පියා හුන්[11] කපුටුවක්හු වැන්නෙහි.[12] යා, තා කට හැකි දැයක්[13] ඇත. කරා”යි කීහු.

මෙසෙ කී කලැ[14] අළවු යක් දැහැවැ හුනස්නෙන් නැඟී, රක්[15] ගල් මුදුනෙහි වම්පසින් සිටැ “දැන් තොප සථරහුගෙ අනුභාව හො මාගෙ අනුභාව හො බලව” යි දකුණු පයින් සැට යොජුන් පමණ කෙලෙස් ගල්කුළුයෙහි ඇක්මිණ. එ ගල යකුළෙකින් පහළ රත් කළ යපල්ලක් සෙයින් පපටිකා විහිට. හෙ එහි සිටැ, “මම් අළවු යක්මී” හැඬි යැ. එ හඬ මුළු දඹදිව පතුළෙ.[16]

සතර ශබ්ද කෙනෙක් මුළු දඹදිව්හි පතුළහැ. කවර සතර ශබ්දයහ[17] යත්: පුණු යක් ධනඤ්ජය මහරජහු හා[18] දු කෙළැ දනැ[19] අපොළො[20] “මම් දනිමි” යම් හඬක් හැඬී ද, සක් දෙව්රජ කසුබු සම්මා සම්බුදුන් වහන්සෙ ගෙ සස්න නස්නා කලැ විස්කම් දෙව්පුත්හු බලුවෙස් ගන්වා, තෙමෙ වැදිවෙස් ගෙනැ අවුදු, “මම් පවිටි මහණනුදු මෙහෙණනුදු උපාසකනුදු උපාසිකාවනුදු හැම අධර්මවාදීන් කමී” යම් හඬක් හැඬී ද, කුස රජ ප්‍රභාවතිය සඳහා සත් රජක්හු අවුදු, නුවර තිරි කොටැ[21] වටා ගත් කල්හි ප්‍රභාවතිය හා සමඟ ඇත් කඳැ හිඳැ, නුවරින් නික්මැ, සිංහ ස්වරයෙන් “අහංකුසො”යි යම් හඬක් හැඬී ද, අළවු යක් කෙලෙස් ගල් මුදුනෙහි සිටැ, යම් හඬක් හැඬී ද, එ

---

[1] අවජනා-මු
[2] වුහුට
[3] කැරුණෙ මහත් ලාභයහ-මු
[4] ගින්නෙහි
[5] ලුණු කැටි
[6] නො දන්ති
[7] තා දුට මනා මැ ය, තා
[8] තිමද ගලිත
[9] පැටවක්හු, පැටවක්
[10] කැණහිලක්
[11] බුන්
[12] වැන්නෙහිය
[13] කවර දෙයක්
[14] මෙසෙ කල, මෙකී කල
[15] රත්
[16] පතුළෙ
[17] ශබ්ද සතර ද සතර ශබ්ද (හ) ය
[18] ධනඤ්ජය රජු හා
[19] දිනා
[20] අතපොළා
[21] පිරි කොට, පිරිකෙව-මු

හැම හඬ මුළු දඹදිවැ දොරැ දොරැ සිටැ හැඬූ වැනි වි යැ. තුන් දහසක් යොජුන් හිමවත් කම්පිත වී.

“මෙ මහණහු පිඹැ පියමී” අළවු යක් තමාගෙ අනුභාවයෙන් සුළඟක් මැවී යැ. එ සුළඟ සතර දෙසෙන් නැඟී, ගවු දෙ ගවු තුන් ගවු පමණ, යොජුන් දෙ යොජුන් තුන් යොජුන් පමණ ගල්කුළු කඩා-ගෙනැ වල්රුක් මුල දී[1] උදුරා-ගෙනැ, අළවු නුවර පැමිණැ දිරා ගිය ඇත්හල් අස්හල් සුන් කෙරෙමින් සියනැ උළු අහසැ බමවමින් ආ යැ.[2] බුදුහු “කිසිවක් හට කහට නො වෙව”යි[3] ඉටුහැ. ඒ සුළඟහු[4] බුදුන් කරා පැමිණැ සිවුරැ[5] කනකුදු සලන්නට නො පොහොසත් වූහු.

එක්බිති “මෙ මහණහු දියවතුරෙන්[6] ගලා මරා-පිව මැනැවැ”යි මහත් වැස්සක් වැස්වි යැ උහු ගෙ අනුභාවයෙන් මතුමත්තෙහි සියක් පටල දහසක් පටල ඈ භෙද ඇති වලාහකයො නැඟී වටහ[7] වැසි ධාරාවෙගයෙන් පොළොව් සිල්[8] වන්නා වැනි වි යැ. වන රැක් ආදීන් ගෙ මුදුනෙන් මහවතුරු ගලා අවුදු[9] බුදුන්ගෙ සිවුරෙහි පිනිබිඳක් පමණ තැන් තෙමෙන්නට නොනිසි වී. එක්බිති පහණ වැස්සක් වැස්වි යැ. මහත් මහත් ගල්කුළුහු දුමමින් දිළියෙමින් අහසින් අවුදු බුදුන් කරා පැමිණැ දිව මල්ගුළා බවට පැමිණියො. එක්බිති ආයුධ වැස්සක් වැස්වි යැ. එකතොධාරා උභතොධාරා ඇති කඩු අඩයටි පාරා[10] හී ආදීහු දුමමින් දිළියෙමින් අහසින් අවුදු බුදුන් කරා පැමිණැ දිව මල් දම් බවට ගියො. එක්බිති අඟුරු වැස්සක් වැස්වි යැ. කැහැලමල් බඳු[11] අඟුරුහු[12] දුමමින් දිළියෙමින් අහසින් අවුදු බුදුන් පාමුල්හි දිවමල් වැ වගුළො. එක්බිති හළුවැස්සක් වැස්වි යැ. ඉත් හුණු හළු අහසින් අවුදු බුදුන් පාමුල්හි සඳුන්සුණු වැ වගුළෙ[13] ඉක්බිති වැලි වැස්සක් වැස්වි යැ. ඉතා සියුම් වැනි දුමමින් දිළියෙමින් අහසින් අවුදු බුදුන් පාමුල්හි දිවකුසුම්[14] රොන් බවට ගියෙ.[15] එක්බිති කලල්වැස්සක් වැස්වි ය. ඒ කල්ලවැසි දුමමින් දිළියෙමින් අහසින් අවුදු බුදුන් පාමුල්හි ගඳකළල් වැ වගුළෙ.[16] එක්බිති “මෙ මහණහු මුළා කොටැ බවා නෙරැපියමි[17]” යි අඳුරුවක්[18] මැවි යැ. එ අඳුරු සියරඟින් යුත් අඳුරු සෙයින් බුදුන් කරා පැමිණැ හිරිරසින්[19] බුන් අඳුරු සෙයින් බුදුරසින් බිඳී අතුරුධන් වි යැ.

මෙසෙ අළවු යක්, සුළඟින් වැස්සෙන් පහණ වැස්සෙන් ආයුධ වැස්සෙන් අඟුරු වැස්සෙන් හළු වැස්සෙන් වැලි වැස්සෙන් කලල් වැස්සෙන් අඳුරුයෙන්[20] මෙ නව වැස්සෙන්

---

[1] මුල්දී
[2] අය
[3] නොවයි
[4] සුළඟ
[5] සිවුරැ
[6] දියවතුරෙ
[7] බටහ
[8] සෙල්
[9] මහවතුරැ අවුදු
[10] පාර
[11] දියෙන්, බ (බු) දු
[12] අඟුරු
[13] වගුළො - හැම
[14] දිවකොසොම්
[15] ගියො-හැම
[16] වගුළො හැම
[17] නෙරපමි
[18] අඳුරක්
[19] රැසින්
[20] අඳුරු වැස්සෙන්, අඳුරු වැයෙන්, අඳුරු යෙනැයි-මු:

බුදුන් නෙරනට නොපොහොසත් වූයෙ, නන් නන් ආයුධ ගත් ඇත් ඇති, අනෙකප්‍රකාර රූප[1] ඇති, යක්‍ෂ ගණන් විසින් සමාකුල වූ, සියුරඟසෙනඟින් තෙමෙ මැ බුදුන් කරා ගියෙ. ඒ භූතගණයො අනෙකප්‍රකාර විකාර කොටැ, "ගන්ව, තළව"යි බුදුන් හිස්මත්තෙන් එන්නවුන් වැන්නහැ. එතෙකුදු වුවත් ගිනි ගත් ලොහොපිඬුහු[2] මැස්සන් සෙයින් බුදුන් ළඟ වන්නට නොපොහොසත් වූහු. එසෙ ද වුව[3] යම්සෙ බොමඬහි ලා මර දෙව්පිත් ආ වෙලායෙහි මැනැවත් ද, මොහු එසෙ නො නැවතී, රැයින් සමහරක් දක්වා ව්‍යාකුල පහළ[4] කොළො. මෙසෙ අඩ රැයක් පමණ කල්හි නොඑක් ප්‍රකාර භය දක්වා, බුදුන් සොලවන්නට නොපොහොසත් වූහු. අළවු යක් "කිසි කෙනකුනුදු[5] විසින් නොදිය හැකි වෙලායුධ විහිජමී" සිතී. සතර ආයුධ කෙනෙක් ලොකයෙහි උත්තමයොː ශක්‍රයා ගෙ වජ්‍රායුධ යැ. වෙසවුණු[6] මහරජහු ගෙ ගදායුධ යැ. යමයා ගෙ නයනායුධ යැ, ආළවකයා ගෙ වෙලායුධ යි.

ඉදින් ශක්‍ර[7] දැහැවැ වජ්‍රායුධය මෙරමුදුනෙහි පහළියෙ වී නම්, එක් ලක්‍ෂ අට සැට දහසක් යොජුන් මෙර විනිවිදැ පත්ලට යෙයි. වෙසවුණු මහරජහු පුහුදුන් කලැ වුහුට් ගදාව බොහො යක් දහසුන් හිස් සිඳැ නැවැතැ අවුදු අත් පසැහි වැදැ[8] සිටී. යමයා දැහැවැ නයනායුධයෙන් බැලූ කලැ අනෙක කුම්භාණ්ඩ දහස්හු තත් කබලැ ලූ තල සෙයින් පුපුරා නස්ති.[9] අළවු යක් දැහැවැ ඉදින් වෙලායුධය අහසැ වුහුට්යෙ වී නම්, දොළොස් හවුරුද්දක් වැසි නො වස්සි. පොළොවට වුහුට්යෙ වී නම්, හැම රුක්හු හැම තණ ආදිය වියැළී දොළොස් හවුරුද්දක් නො නැඟෙති. මුහුදැ වුහුට්යෙ වී නම්, තත් කබලැ[10] දියබිඳු සෙයින් හැම දිය සිඳී යෙයි. මෙරගල් සුදුසු ගලැ[11] වුහුට්යෙ වී නම්, කඬ කඬ වැ විසිරැ යෙයි.[12] මෙසෙ මහත් අනුභාව ඇති වෙලායුධය උත්තරිය වැ තුබුවා හැරැ-ගති. බොහො සෙ දස දහසක් සක්වළැ වැසි දෙවියෙ වෙළෙව් වැ අවුදු රැස් වූහුː "අද[13] බුදුහු අළවු යකු දමති. එහි බණ අසම්හ"යි. යුද්ධ දැක්කැටි දෙවියො ද, රැස් වූහු මැ යැ. මෙසෙ සියලු අහස දෙවියන් විසින් පිරිණි.

අළවු යක් බුදුන් වැළැතැ උඩ අහසැ ඇවිදැ, වෙලායුධය වුහුට, හෙ සණමඬලක් සෙයින් අහසැ ගොර බිරම් ශබ්ද කෙරෙමින් දුමමින් දිලියෙමින් බුදුන් කරා පැමිණැ, යක්ෂයා ගෙ මන් බිඳුනා සඳහා පා පිස්නා කඬක් සෙයින්, පාමුල්හි හිණ. අළවු යක් එ දැකැ, හඟ බුන් ගොනක්හු සෙයින්, දළ බුන් සපක්හු සෙයින්, තෙජ නැති වැ, මද නැති වැ, මන් නැති වැ, "වෙලායුධයත්[14] මහණු අභිභවන්නට නොනිසි වි යැ. කරුණු කිමැ හො!" පිරික් සනුයෙ, "මෙ මහණ මෛත්‍රී විහාරයෙන් යුක්ත යැ. මොහට රොස් උපදවා, මෛත්‍රීන් තොර කොටැ-පිව මැනැවැ"යි සිතා "මහණ, මා නොඅනුදත් මාගෙ භවනයට[15] වැදැ, ගෙ-හිමියක්හු සෙයින්, අඹුන්මිනිස්පිරිස් මැදැ හුන්නෙහි. මෙ මහණ හට[16] යුක්ත නොවෙයි; අදත්තාදාන පරිභොග හා ස්ත්‍රීසංසර්ග යැ. ඉදින් තො[17]

---

[1] රූ
[2] ලොහොපිඬුහි-මු: "නිද්ධන්ත ලොහපිණ්ඩං විය මක්ඛිකා" - අටුවා
[3] වුවද්
[4] අකුසලපළල්, ආකුල පළල්, අකුල පළල්, ආකුල පාකුල-මු: "උපඬ්ඪරත්තිමත්තං බ්‍යාකුලමකංසු"-අටුවා
[5] කිසි කෙනෙකුන්
[6] වෙසමුණු
[7] ශක්‍රය
[8] අත්පස්හි වැ, අත්පස්හි මැ-මු:
[9] නසති, නසිති
[10] රත්කබල
[11] ගල්
[12] විසිරෙයි
[13] අප
[14] වෙලායුධය
[15] භවන, භවනයෙහි
[16] මහණට මහණනට
[17] තොප, තාපි

මහණදම්හී[1] සිටිහි[2]විහි නම්, නික්මැ යා. මහණැ" යි කී යැ. එකල්හි බුද්හු "යමෙක් තද වී නම්, තද වැ විනය නොකට හැක්කැ. යම්සෙ චණ්ඩ වූ බල්ලක්හු නාසායෙහි පිත් බුන් කලැ ප්‍රචණ්ඩ වෙද, එ සෙයින් මැ තද වන්නා හා[3] මෙයිඳු තද වෙයි. මෙළෙක් වන්නා හි විනෙය වෙ" යි සිතා, "ඉතා මැනැවැ"යි ප්‍රිය තෙපුලෙන් උහු ගෙ තෙපුල් ගිවිසැ ගෙනැ[4] නික්මුණුහු.

එ සඳ අළවු යක් "මෙ මහණ කීකරු යැ.[5] එක තෙපුලෙන් මැ නික්මිණ. මෙසෙ සුවයෙන් නික්මෙන මහණු හා අකාරණයෙහි මම සියලු රෑ යුද්ධ කෙළෙමි"යි මෙළෙක් සිත්

[1] මහණදම්හි

[2] සිටියෙ-මු:

[3] වන්නාහ

[4] ගෙන්-මු:

[5] කිකරියැ

ඇති වැ නැවැත[1] සිතී: "මෙ මහණ සුවචතායෙන්[2] නික්මිණ හො! ක්‍රොධයෙන් නික්මිණ හො! විමසා[3] බැලුව මැනැවැ"යි "එ.[4] මහණැ"යි කී යැ. බුදුහු උහු ගෙ අදහස් දැනැ, "ඉතා මැනැවැ, ඇවැතැ"යි ගොස් වන්හු. එකල්හි අළවු යක් පුන පුනා එ මැ සුවචභාවය විමසනුයෙ, දෙ වන වටද් තුන් වන වටද් "නික්මැ යැ, මහණ, එ[4] මහණැ"යි කී යැ. බුද්හු එසෙ කළහැ. ඉදින් එසෙ නො කළාහු වුහු නම්,[5] පියෙවින් මැ තද සිත් ඇති යක්හු ගෙ[6] සිත ඉතා තද වැ ධම්දෙසුන් ගන්නට නොනිසි විය හෙයි.[7] එබැවින්[8] යම්සෙ මවු වලප්නා පුතක් හට[9] යමක් හෙ කැමැත්තෙ ද, එදී හො, කැමැත්තා කොටින් හො, සන්හිඳුවා ද, එසෙයින් මැ බුදුහු කෙළෙස් වැලැප්මේන වලප්නා යක්හු සන්හිඳුවනු සඳහා යමක් බෙණෙ ද, එ කළහැ. යම්සෙ කිරිමවු කිරි නොබොන දරුවා යම් කවර දැයක් දී නළවා පොවා ද, එසෙයින් මැ බුදුහු යක් බිළිඳිහු ලොව්තුරා දහම් අමාකිරි පෙවියට් වැ උහු කැමැති දැ කිරීමෙන් නළවා මෙසෙ කොළො. යම් පුරුෂයෙක් ලප්පකැ[10] සියුම්සුරු පිරියටි වූයෙ. එහි ඇතුළත සොධා ද, එසෙයින් මැ බුදුහු යක්‍ෂයා ගෙ සිතැ ලොවුතුරා සියුම්යුරු[11] පිරියටි වූවාහු, ඔහුගෙ ඇතුළත ක්‍රොධමල සොධනු සඳහා තුන් යලක් නික්මෙනුදු වැදමුදු කොළො.

එකල්හි අළවු යක් "මෙ මහණ සුව ච යැ. 'නික්මෙ' යි කී කලැ වද්දි. ඔස, මෙ මහණහු සියලු රෑ ඇවිදුවා ලෙඩ කොටැපියා පයැ අත් ලා ගෙනැ[12] ගඟ පරතෙර දමා-පියම්" ය පවිට් සිත් උපයා සතර වන වර[13] "නික්මැ යා; මහණ" යි කීයැ. එ දැනැ බුදුහු "මත්තෙ කළ මනා දැ ඉල්ලනුයෙ[14] මෙ පැන පිළිවිස්සැටි වෙයි. හෙ ධම් දෙස්නට[15] දොරැ"යි දැනැ, "ඇවැත, මම නො නික්මෙමි. යමෙක්[16] තා විසින් කටයුතු ද, එ කරා" යි වදාළො.

එක්බිති ගෙ අළවු යක් අහසින් යන කලැ "මෙ රන්විමනෙකැ හො! රිදී විමනෙකැ හො! මිණි විමනෙකැ හො! එ බලම්හ" යි තමාගෙ විමනට ආ සෘද්ධි ඇති තව්සන් පිරිවැජියන් පැන පිළිවිසැ විසජන්නට නොපොහොසත් වූවන්[17] සිතට විබෙව් කොටැ වෙහෙසයි. එ හෙතුවින්[18] "බුදුනුදු වෙහෙසමී" සිතනුයෙ, "මහණ තා පැන පුළුවුස්මි. ඉදින් පැන නොවිසජිහි[19] නම්, තා සිතට විබෙව් හො කෙරෙමි. හදවත් හො පළා-පියමි. පය අත්ලා[20]-ගෙනැ ගඟ පරතෙරැ හො දමා-පියමි"යි කී.

එ පැන ඔව්හට කා කෙරෙන් ආයෙ යත්:

ඔහු මවුපියො කසුබු සම්මාසම්බුදුන් වහන්සේට උපස්ථාන කොටැ අට පැනයක් විසජුන් හා සමඟ උගත්හැ. ඔහු අළවු යකු ළදරු කල්හි පුහුණු කැරැවූහු. කල් යත් යත් විසජුන් ඔහු නොසඳහන් වී යැ. එක්බිති "පැනයො ද නො නසිත්ව" යි රන් පතැ

---

[1] නැවැතැයි
[2] සුවචයෙන්, සුවචභාවයෙන්-මු:
[3] විමසනු
[4] එව
[5] නො කළාහුනම්
[6] ඇතියහුගෙ
[7] නොනිසි විය
[8] එබවින්
[9] පුතක්හු හට
[10] ලප්පෙක-මු:
[11] සියුම්මියුරු
[12] අතලා ගෙන
[13] වට
[14] ඉල්වන්නාහු-හැම: 'පරියෙසමානො'-අටුවා
[15] දෙසන්නට
[16] යමක්
[17] වූවවුන්, වූවවුම්, වුව, වුබට්
[18] හෙතුයෙන්, හෙතුවෙන්
[19] විසජනුහි විසජහි
[20] පත්ල

දැහිගුලෙන් ලියවා විමන්හි තිබී යැ. ඔහු බුදුනට මැ විෂය පැනයහැ. බුදුහු එ අසා, යම් හෙතුවෙකින් බුදුනට දුන් ලාභයට හො, ජීවිතයට හො, සවඤ්ඤණට හො, බ්‍යාමප්‍රභාවට[1] හො, කිසිවක්හු[2] අන්තරාය නොකට හැකි ද, එ හෙතුවින් ඔව්හට ලොකයෙහි අසාධාරණ වූ බුද්ධානුභාව දක්වන්නාහු,[3] "ඇවැත, මම දෙව්මිනිසුන් සියො බඹුන් සියො මහණ බමුණන් සියො ලොකයෙහි මා සිතට විබෙව් කරන්නහු[4] හො, හදවත් පළන්නහු හො, පයැ ගෙනැ ගඟ පරතෙර පියන්නට නිස්සක්හු[5] හො, නො දක්වමි"යි පැන පුළුවුස්නට උත්සාහ ජනවමින් වදාළහැ. "තට රිසි යෙන දැයක් පුළුවුස. මට පැන විජසුන් නොබරු, හැම[6] තට විසජමි"යි සවුපසෙබුදුන් හා අසාධාරණ වූ සර්වඥ පවරුණෙන්[7] පැවරුහු.

මෙසෙ බුදුහු සර්වඥ පවරුණෙන්[11] පැවරු කල්හි අළවු යක් "**කිංසුධ විත්තං පුරිසස්ස සෙට්ඨං**" යනාදීන් පැන පිළිවිත. බුද්හු විසජුහු. යක්‍ෂයා පැන පුළුවුත් පරිදි දු, බුදුන් පැන විසජු පරිදි දු, **සංයුත්සඟියැ යක්‍ෂසංයුක්තයෙන්** දක්නෙ යැ.

පැන විසජු තැන සිටැ යක් සොවන් වැ බුදුනට ස්තොත්‍ර කරනුයෙ, "බුදුහු මට වැඩ සඳහා අළවු නුවරට වැඩියහැ. යම් තැනෙක්හි දුන් දනැ[8] එල මහත් වෙ ද, මම් එ අද දන්මි.[9] මම් දෙව්ගැමින් දෙව්ගමට දෙව්නුවරින් දෙව්නුවරට 'බුදුහු සව්නෙ ගෙවා දන්ති. දහම් නීයාණික යැ. සඟහු සුපිළිපන්නාහැ' යි ස්ත්‍රොත කෙරෙමින් තුණුරුවන් පුදමින් දහම්ගොසු වැ ඇවිදුමී" කී යැ. එයින් කීහ:

**"අත්ථාය වත මෙ බුද්ධො - වාසායාළවිමාගමා,**
**සොහං අජ්ජ පජානාමි - යත්ථ දින්නං මහප්ඵලං**

**සො අහං විචරිස්සාමි - ගාමා ගාමං පුරා පුරං,**
**නමස්සමානො සම්බුද්ධං - ධම්මස්ස ච සුධම්මතං"** යි.

මෙ ගාථාව සමහර දු,[10] පහන් වනු දු, සාධුකාර ශබ්ද නැගෙනු දු, අළවු කුමරහු යක්‍ෂයා ගෙ භවනයට ගෙනැ යනු දු, එකෙණෙහි මැ[11] වි යැ. රාජපුරුෂයා සාධු කාර ශබ්ද අසා, "මෙබඳු සාධුකාර ශබ්දයෙන් බුදුන් විනා අනෙක් කෙනක්හට නො නැගෙයි. බුදුහු[12] වැඩියහ හො" යි[13] බලන්නාහු බුදුනු ගෙ ශරීරප්‍රභා දැකැ, "බුදුහු වැඩි වන්හ" යි පිටත නො සිටැ නිසැක වැ මැ ඇතුළට වැදැ බුදුන් යක්ෂයා ගෙ භවනයෙහි

[1] ප්‍රභාවයට, ප්‍රභායට
[2] කිසි වත්හු
[3] දක්නාහු
[4] කරන්නාහු
[5] නිස්සක්
[6] නො බරහහැම
[7] පැවරුමෙන්, පැවරුණෙන්
[8] දැන්
[9] දත්මි, දක්මි
[10] ගාථාවෙ සමහර ද
[11] කෙනෙහි
[12] බුදුන්
[13] වැඩියහොයී

වැඩහුන්නන් දුටහැ. යක්‍ෂයා ද මුදුනෙහි ඇඳිලි බැඳැ සිටියහු[1] දැකැ “මහ යක, මෙ රජකුමර[2] තට බිලියම් සඳහා අළියෙ යැ. මොහු කත් මැනෑ මැ යැ.[3] බොත් මැනෑ මැයැ. තට රිසියෙන්නක්[4] කරා” යි ඇරැ දුන්හු. හෙ සොවන් බැවිනු දු බුදුන් පෙරට කීයෙනු දු[5] වෙසෙසින් මැ ලැජ්ජා ඇති වියැ. කුමරහු දොහොඅතින්[6] පිළිගෙනැ “වහන්සෙ, මෙ කුමර මට අළියෙ යැ. දැන් මම මුහු වහන්සේට[7] දෙමි. මුහුට වැඩ සඳහා පිළිගන්නෙ මැනැවැ”යි දිනැ.

බුදුහු දරු[8] පිළිගෙනැ යක් හට ද කුමරු හට ද ආ වඩා, කුමරහු බුද්ධානුභාවයෙන් සරණැ[9] පිහිට්වා, “මොහු වඩා අපට මැ ඇරැ දක්වා දෙව”යි රාජපුරුෂයනට මැ වදාළහැ. මෙ සෙයින් කුමර රාජපුරුෂයන් අතින් යක්‍ෂයා අතට, යක්‍ෂයා අතින් බුදුන් අතට, බුදුන් අතින් රාජපුරුෂයන් අතට, ගිය වන බැවින් **හත්‍ථකආළවක** නම් වි යැ.

ඔහු ගෙනැ නැවැතී[10] එන රාජපුරුෂයන් දැකැ නො එක් කර්මාන්තයට දරට පනට[11] යන මිනිස්හු “කිම, දරු[12] ඉතා ළදරුහැ’යි[13] යක් නො ගිවිසි දැ”යි බියපත් වැ පුළුවුත්හැ. රාජපුරුෂයො “නො බව, බුදුහු හැම දෙන හට සුව කළහ” යි කරුණු[14] තාක් දැ හැම කීහු.

එක්බිති සියලු අළවු නුවර වැස්සො “සාධු සාධු” යි එකකොලාහල වැ යක්‍ෂයා වසන දසට අභිමුඛ වූහු. යක්‍ෂ ද[15] වෙලා[16] බලා බුදුන් ගෙ පා සිවුරු ගෙනැ මඟ සමහරක් දක්වා ගොස් නැවැත්තැ. එකල්හි බුදුහු නුවර වැදැ අහර වළඳා නුවර දොරැ[17] එක්තරා රුක් මුලෙක්හි පැන් වූ අස්නෙහි වැඩහුන්හු. එක්බිති මහජනා හා සමඟ රද දු නුවර වැස්සො දු එක් රැස් වැ බුදුන් කරා එළඹැ වැඳැ පිරිවරා හිඳැ[18] “වහන්සෙ, දරුණු යක්හු කිසෙ දැමු දැ දැ”යි[19] පුළුවුත්හැ. බුද්හු ඔව්නට යුද්ධයෙහි පටන්ගෙනැ “මෙසෙ නවවිධ වැසි[20] වැස්වි යැ. මෙසෙ භය දැක්වි යැ. මෙසෙ පැන පිළිවිතැ. එ පැන මම් මෙසෙ විසජිමි”යි එ මැ අළවු සුත[21] වදාළහැ. දෙසුන් අවසන්හි සුවසූදහසක් දෙන[22] අධිගම කොළො.

එක්බිති රජ දු නුවරවැස්සො ද වෙසවුණු මහ රජහු ගෙ භවන වෙතැ යක්‍ෂ හට[23] භවන කොටැ ගඳින් මලින් පුදා, දවස් පතා බිලිබත් පැවැත්වුහු. අළවු කුමරහු වින්වත් බවට පත් කල්හි, “තො බුදුන් නිසා දිවි ලද්දෙහි, යා,[24] බුදුනට සඟනට මේ කරා”යි නගා යවුහු.[25] හෙ බුදුනට සඟනට මෙහෙ කරන්නෙ, මඳ දවසෙකින් මැ අනැගැමි

[1] සිටියාහු
[2] රජකුමරුවො
[3] කෑමය, කත්මැය
[4] රිසියෙන්
[5] කියනුදු
[6] දොඅතින් දොහොතින්
[7] නුඹ වහන්සේට
[8] දරුවා
[9] සරණ සීල
[10] නැවත නවත
[11] ප.ට, පැනට, වනට
[12] දරුවා, දරුවා
[13] ළදරුහයි
[14] කරුණු
[15] යක්‍ෂයා ද
[16] වෙව්ලා
[17] බුදුහු නුවර දොරැ.....මු
[18] ඉඳු
[19] දැමු දැ යැයි, දැමු දැ යි-මු:
[20] ආයුධවැසි, අධිවැසි
[21] අළවියක් හට අළවුසුත
[22] දෙනෙ
[23] යක්‍ෂයා හට
[24] ලද්දෙහිය
[25] යවු

වැ[1] සියලු බුදුවදන් උගෙනැ[2] පන්සියක් උපාසක පිරිවර ඇති වි යැ. බුදුහු ඔවිනට තනතුරු වදාරන්නාහු, "**එතදග්ගං භික්ඛවෙ මම සාවකානං උපාසකානං චතූහි සඞ්ගහ වත්ථූහි පරිසං සඞ්ගණ්හන්තානං යදිදං හත්ථකො ආළවකො**" සතර සඟාවතින් පිරිසට සඞ්ග්‍රහ කරනුවන්[3] කෙරෙහි අගතන් වදාළො.

මෙසෙ බුදුහු තමන් පුරුෂදම්‍යසාරථී වන බැවින් අලවු යක්‍ෂයා ද, ආදි ශබ්දයෙන් ගත් සුචිරොම ඛරරොම ඈ යක්‍ෂයනුදු දමා, අමාමහ නිවන් පැමිණිවූහු.

**යක්‍ෂදමන නම් පසළොස් වන පරිච්ඡේදය නිමි.**

## 16. අසුරදමන නම් පරිච්ඡේදය

රාහු නම් අසුරා[4] ඇමු පරිදි කිසෙ සැ යත්:

එක් සමයෙක්හි බුදුහු විශාඛාවන් විසින් කරවන[5] ලදු[6] පුවරම් වෙහෙර මුවරමා මහපහයැ[7] වැඩැ වෙසෙති. විසාඛාවො නම් කිසෙ වු[8] කෙනෙකැ යත්:

අතීතයෙහි ලක්‍ෂයක් කැපින් මත්තෙහි පියුමතුරා[9] නම් සම්මා සම්බුදු කෙනෙක් ලෝකයෙහි උපන්හු. ඔහු නොඑක් කප් කෙළ සුවහස්හි[10] පැරුම් පුරා තුසීපුරැ උපැදැ[11] දස දහස් ලොධාහි දෙව්බඹුන් ගෙ අයජමෙන් තුසීපුරෙන් සැවැ, හවුරුදු ලක්‍ෂයකට ආ[12] ඇති කල්හි හංසවතී නම් නුවරැ ආනන්ද නම් රජු පිණිසැ සුජාතා නම් දෙවිය කුසැ පිළිසිඳ ගෙනැ, දස මස් ඇවෑමෙන් හංසවතී නම් උයන්හි මවුකුසින් වලාගැබින්[13] නික්මුණු පුන්සඳක් සෙයින් නික්මැ, හංසවාහන[14] නම් යසොවාහන[15] නම් වසවත්ති[16] නම් තුන් පහයැ එක් ලක්‍ෂවිසි දහස් නළුවන් පිරිවරා දසවා දහසක් වාස කොටැ, වසදත්තා නම් අගමෙහෙස්න උත්තර නම් පුතකු ලද කලැ, සතර නිමිත්ත දැකැ, "මහභිනික්මන් කෙරෙමි" යි සිතුහැ. සිතු විගස මැ වසවත්ති[13] නම් පහය කුඹල් සකක් සෙයින් හමා[17] දෙව්විමන් සෙයින් මැ අහසට නැඟී පුන් සඳක් සෙයින් ගොස් මහබො මධ්‍ය කොටැ බිමට බට.

මහාබොසතාණො[18] පහයින් බැසැ කඩුයෙන් කෙහෙ කපා මහබඹු අළ පාසිවුරු ගෙනැ පැවිජි වූහු. ඔවුන්[19] පැවිජි වූ කලැ, පහය ගොස් සිය තන්හි මැ තුබුයෙ යැ. ඔවුන්[16]

---

[1] අනාගාමි වැ
[2] ඉගෙනැ
[3] තරවනුවන්
[4] අසුරිඳු
[5] කරන
[6] ලත්, ලද්, ලද
[7] මුවරමහමහය, මුවරු මහපායැ-මු: මුවරමාපායැ-මු:
[8] කෙසෙවු
[9] ලොකයෙහි පියුමතුරා
[10] සුවාසූ දහස්හි
[11] ඉපද
[12] ආයු
[13] උයන්හි වලාගබෙකින්
[14] 'නරවාහන'-බුද්ධවංසට්ඨ කථා
[15] වස, 'යසවාහන' - බුද්ධවංසට්ඨකථා
[16] යසවතී, යසවත්තී, වංශවතී, වශවර්ත
[17] හුමා
[18] බොසතාණො
[19] මොවුන්

හා ආ තාක් දෙන,[1] මාගමුන් විනා, හැම පැවිජි වූහු. බොසතාණො ඔවුන් පිරිවරා සතියක් පධන්හි සැරැ වෙසඟ පුනුපොහොයැ **උජ්ජයිනි** නම් නියම් ගම්හි **රුචිනන්ද** නම් සිට්දුව[2] දුන් මීපිඬු[3] වළඳා සල්වෙනෙහි[4] දිවාවිහාර කොටැ, සවස් වෙලෙහි **සුමිත්ත**[5] නම් ආජීවකයන්හු දුන් අට මිටක් තණ ගෙනැ, සළල මහබොයට එළබැ පැදකුණු කොටැ අටතිස් හත් පමණ පලග මත්තෙහි පැදුන් ලොධා[6] බලා වැඩැහිඳැ සියුරඟ වැර ඉටා[7] මාරවිජය කොටැ සව්නදෙනැ උදන් අනා, සතියක් මහබොපලග මතුයෙහි වැඩැහිඳ, දකුණු පය පොළොවට එළවූහු. එ කෙණෙහි පොළොව පැළී අනු හත් පෙති ඇති, තිස්හත්[8] කෙසුරු ඇති, දොළොස් හත් කෙමි[9] ඇති, නව කළක්[10] පමණ මුවරඳ රොන් ඇති, මහ පියුමෙක්[11] නැඟී පය පිළිගත.

බුදුහු උස, අටපනස්හත්තැ,[12] දෙ බාහු අතුරැ අටළොස් හතැ අතුල්පතුල් එකොළොස් හතැ. ඔවුන් ගෙ එකොළොස් හත් පත්ලෙන් දොළොස් හත් පියුම් කෙමියෙහි ඇක්මෙත් මැ.[13] නව කළක්[14] පමණ රන්සුදු බඳු මුවරඳ රොන් සළා අනවලොමුඳුන් දක්වා නැඟී, අටපනස්හත් රන්වන් සිරිරු ලාරස පරිෂෙකයක් සෙයින් වසා-ගෙනැ බස්සි, වම් පය ද පොළොවට එළවූ කලැ එ මැ නියායෙන්[15] පියුමෙක් නැඟී එ පය ද පිළිගතැ. එයිනුදු[16] මුවරඳ රොන් සළා එසෙයින් මැ නැඟී එ සෙයින් මැ බස්සි. එ රොන් අභිභවමින්[17] එ බුදුන් ගෙ ශරීරරශ්මි යතුරුනළින් වුහුට් රන්රස ධාරා සෙයින් නික්මැ හාත්පස්හි දොළොස් යොජනක් තන්හි රැයිත්[18] දෙවෙත්[19] එකලු[20] කොටැ පැතිරැ සිටී. තුන් වන පියවර නඟන කලැ පළමු නැඟී පියුම අතුරුධන් වෙයි. අනෙක් අලුත් පියුමෙක් නැඟි පය පිළිගන්නි. මෙ නියායෙන් එ බුදුන් යම් තැනකට වඩනා කල්හි පියෙහි පියෙහි පියුම් පිපෙයි. එයින් ඔව්නට '**පියුමතුරාසම්මාසම්බුදුහ**' යන නම් වී.

ඔවුන් උපන් දවස්හි දු බුදු වූ දවස්හි දු දස දහස් ලොධා සදා පියුම්වැසි වට මැයි. බුදුහු මහබඹහු ගෙ අයජමෙන් විජෙනනන්[21] බලනුවො, **මියුළුපුර**[22] නම් නුවරැ **දෙවල** නම් **සුජාත**[23] නම් රාජපුත්‍රයන් දෙදෙනා දැකැ, අහසින් ගොස් **මියුළුවන**[24] නම් උයන්හි බැසැ, උයන්පල්ලා අත රජකුමරුන් දෙදෙනා හට තමන් වැඩි පරිදි කියා යවුහු. ඔහු "අප නැන්දණියන් පුතණුවො, බුදුහු වැඩියහැ. ඔවුන් දක්නට යම්හ"යි සහපිරිවරින් ගියො. බුදුහු ඔවුන් පිරිවරා එහි වැඩැහිඳ ධම්සක් පැවැත්වූහු. එ දවස් කෙළ ලක්‍ෂයක් දෙනා හට ධර්මාභිසමය වී.

---

[1] දෙනෙ

[2] සිටුදුව

[3] කිරිපිඬු, 'මධුපායාසං'-බු: අට්ඨකථා

[4] සල්වනයෙහි, සල්වලයෙහි

[5] විද්දෙ සුමිත්ත

[6] පැදුම්දෙස

[7] සිවුරඟ ඉටා

[8] තිස්සත් තිස්දහස්,

[9] 'කණ්ණිකා දසහත්ථා'-බු: අට්ඨකථා

[10] කෙළක්

[11] දඬු පියුමෙක්-මු:

[12] අටපනස්හත්, අටපණස් හත්තැ-මු:

[13] ඇක්මෙත් මැනැව, ඇක්මෙන් වනව

[14] කෙළක්

[15] නිසා

[16] එහි, එහිදු, එයින්,

[17] අභිභවමින් මෙන්-මු:

[18] රැසින්, රුසිරින්

[19] දෙවෙනු, දෙවනු, දෙවෙන්, දෙවෙයිත්-මු:

[20] එක පෑ.

[21] ජනයන්

[22] මියුල (ළ) පුර

[23] සජත

[24] මියුළවන නම්

එක්බිති සරද නම් තාපසයා ගෙ සමාගමයෙහි සැත්තෑ ලක්‍ෂයක් දෙනා හට අභිසමය වී. එකල්හි බුදුන් පිය මහරජ බුදුන් වඩා-ගෙනැ එනු කොටැ ඇමැත්තන් විසි දෙනකු හා සමඟ විසි දහසක් පුරුෂයන් යවී. ඔහු හැම දෙන එහි භික්‍ෂු භාවයෙන් පැවිජි වූහු. ඔවුන් පිරිවරා **හංසවති** නුවර ගොස් **කිඹුල්වත්** නුවර වැඩි[1] අප බුදුන් සෙයින්, රුවන් සක්මන්හි සක්මන් කරනුවො බුද්ධවංශ වදාළහ. එ දවස් පනස් ලක්‍ෂයක් දෙනා හට[2] අභිසහය[3] වි.

එකල්හි තීර්ථකයො නැති වූහු. කිසෙ යැ යත්: ගෙවැසියො[4] උනට අහර නොදෙති. රටින් නෙරති.[5] ඔහු ඔවුන් විසින් අහර නොදී නෙරනා ලද්දාහු. හැමදෙන ගොස් බුදුන් මැ සරණ ගියො. එ බුදුනට **දෙවල** නම් **සුජාත** නම් මහතෙරහු දෙදෙනෙක් අගසවු වූහු. **සුමන** නම් මහතෙර කෙනෙක් අග උවටා වූහැ. **අමිතා** නම් **අසමා** නම් ථෙරීහි[6] දෙ දෙනෙක් අගසැවි වූහු.

මෙසෙ **පියුමතුරා** සම්මා සම්බුදුන් **හංසවතී** නුවර නිසා උයන්හි වැඩැ වසන කල්හි, එ නුවර එක් කුදුවක් නුවර වැස්සන් ගඳ මල් ගෙනැ, බණ අසන්නට යනුවන් දැකැ, ඔවුන් හා වෙහෙර ගොස් බණ අසන්නී,[7] බුදුන් එක් උපාසිකාවක දායිකාවනට අග තන්හි තබනුවන් දැකැ, "මම දු අනාගතයෙහි එක් බුදු කෙනකුන් ගෙ සස්නෙහි දානාභිරත උපාසිකාවනට අගතන් පත්තෙම් වීම්[8] නම්, මැනැවැ"යි සිතා දෙසුන් අවසන්හි එ බුදුන් කරා එළබැ. වැඳැ පවරා ගොස්, පරිජනයන් කැඳවාගෙනැ දන්වැට සරහනු කොටැ යොදා, මඬුවක් කරවා උඩ විසිතුරු වියන් බැඳැ, රන්තරු රිදී තැරම්ණිතරයෙන් හා ගඳදම්[9] මල්දම්[10] රුවන්දමින්[11] සදා, බිම සිවු ඇ ගඳින් පිරිබඩ ගෙනැ[12] මහාරහ අසුන් පනවා, බුදුන් සඟුන් වඩා හිඳුවා සිය අතින් දන් දී, එ නියායෙන් බුදුපාමොක් සඟනට මහදන් දී, සති අවසන්හි සිවුරු පිළි දී, බුදුන් පෙරට බැසැහෙවැ වැඳැ, "වහන්සෙ, මා සත් දවසක් බුදුපාමොක් සඟනට සත්කාර[13] කළ පින්කැමින්[14] අනාගතයෙහි තොප සෙ මැ වු එක් බුදු කෙනකුන් ගෙ සස්නෙහි දානාභිරත උපාසිකාවනට අගතන් පැමිණෙම්වා"යි පැතුව.[15]

එ බුදුහු "අනාගතයෙහි ලක්‍ෂයක් කප් ගිය කලැ ලොකයෙහි **ගෞතම**[16] නම් සම්මා සම්බුදු කෙනෙක් උපදිති, තො **විශාඛා** නම් සිටි දුවක් වැ දායිකාවන් කෙරෙහි අගතන පැමිණෙහී" වදාළො. හො දිවිපමණින් දන් දී සිල් රැකැ පෙහෙ වැ බණ අසා බොහො පින්කම් කොටැ දෙව්ලොව්හි උපදැ,[17] දස පැරුමෙන් නො වියො වැ,[18] දිවි සැපත්[19] මිනිස් සැපත් වළඳා කප් ලක්‍ෂය ගෙවා-පියා, **කසුබු**[20] සම්මා සම්බුදුන් දවසැ **කිකී** නම් **කසී** රජක්හු දුහුන් සත්දෙනා හට සග වැ උපනු.[21] එසත් බිහින්න මැ[22] සඟුන්

---

[1] වැසි
[2] දෙනෙහට, දෙනහට
[3] අධිගමය
[4] ගිහිවැසියො, ගිහිගෙ (හි) යි වැසියො
[5] නෙරව (වි) නි
[6] තෙරහු, තෙරිහි
[7] අසන්නෙ
[8] පත් (පත්තෙ) වීම්
[9] ගඳදුම්
[10] මල්දමින්
[11] ගඳදුම් මල් පහන් අ
[12] කොට
[13] මහදන් දී සත්කාර
[14] පිනින්
[15] පැතුවා
[16] ගොතම
[17] උපද්, උපදැ
[18] වියොනොවැ
[19] දෙව් සැපත්
[20] කසුප්
[21] උපන්හු උපන්නු-මු:
[22] බිහින්නෝ ම-මු:

කෙරෙහි බණ අසා තුණුරුවන්හි පැහැදැ සත් දෙන සත් පිරිවෙනක් කරවා සඟනට මහදන් දී, පතිකුලයට නොගොස් දස සිල් සමාදන් වැ, විසි දහසක් හවුරුදු[1] බඹසර වස් රැකියො. එ බුදුරජයෙහි-

**"සමණී සමණගුත්තා ච භික්ඛුනී භික්ඛුදායිකා**
**ධම්මා චෙව සුධම්මා ච සඞසදසී ච සත්තිමා"**

යන මෙ සත්බිහින්න[2] මෙ බුදුරජයෙහි -

**"ඛෙමා උප්පලවණ්ණා ච පටාචාරා ච ගොතමී**
**ධම්මදින්නා මහාමායා විසාඛා චෙව සත්තිමා"**

යන මෙ සත් දෙන[3] වූහු.

මොවුන් කෙරෙහි සඞසදසී නම් රජකුමරී,[4] එක් බුදු තුරක් දෙව් වැ මිනිස් වැ[5] මහසැපත් වළඳා, මෙ බුදුරජයෙහි අඟු රට භද්දිය නුවර මැඩ මහසිටහු පුතු[6] ධනඤ්ජය සිටහු දුව විසාඛා නම් වැ, සත් හැවිරිදි කුලැ පන්සියයක් කුමරියන් හා සමඟ සියනුවර එන බුදුන් පෙර මඟට ගොස්, පළමු දස්නෙහි මැ සොවන් වැ, පස් කලණ ගුණෙන් පිරිහුන්[7]වැ, විය පත් කල්හි, සැවැත් නුවරැ මුවර[8] සිටහු පුතු පුණ්‍යවර්ධන නම්[9] සිටිදරුවා කෙරෙහි වැසැ, සුහුරු මුවර සිටහු විසින් මවු තන්හි තබන ලදු වන බැවින් මුවරමා[10] නම් වැ දන් ඈ පින්කම් කරන්නී,[11] බුදුන් කෙරෙන් අට වරක්[12] ලදින්, නුබ තෙලෙහි ළසඳ ලෙයක්[13] සෙයින් පැනෙනු වී දුන්[14] පුතුන් විසින් වෘද්ධි[15] ප්‍රාප්ත වූ[16] ඇය පුත්හු දස දෙනෙක් වූහු. දූහු දස දෙනෙක් වූහු. එසෙයින් මැ එකක් එකක්හු දස දස පුත්හු[17] වූහු. දස දස දුහු වුහු. එවුනුදු කෙරෙහි එකක් එකක්හු දස දස පුත්හු වූහු. දස දස දූහු වූහු. මෙසෙයින්[18] ඇය දරු මුණුබුරුහු පරම්පරායෙන් අට දහස් සාරසිය විසි දෙනෙක් වූහු. මොහු හැම නීරොගයහ.[19] නොකල්හි මරණ පත්[20] එකෙක්[21] නැත්. ඇය එක්සිය හැවිරිදි වයස් දක්වා හිසැ කනැ එක් නරයෙකුද් නොවී යැ. හැම කල්හි සොළොස් හැවිරිදි වයස් වැනි වූ[22]

ඇය යන කල්හි දුටු ජනයො "අප හැඹූ මඳක් යෙත්වයි, යන කලැ මැ හොබී"[23] සිතත්. සිටි කල්හි දුටු ජනයො "අප හැඹූ[24] මඳක් සිටිත්ව යි, සිටි කලැ මැ හොබි[5] සිතත් හුන් කල්හි දුටු ජනයො "අප හැඹූ මඳක් හිඳිත්ව යි, හුන් කලැ මැ හොබී[5]"

---

[1] විසිවාදහසක් හවුරුදු
[2] බිහින්නෙ, බිහින්නො-මු:
[3] දෙනහු
[4] රජකුමරිය
[5] දෙව්මිනිස් වැ
[6] පුත්
[7] පිරිපුන්, පිරිහු
[8] මුවරු
[9] පුර්ණවර්ධන නම්
[10] මුවරමාතා
[11] කරණුවී-මු:
[12] වරයක්, අවසරයක්
[13] ළසඳලිය (ය) ක්
[14] නම්දුන්, නමුදු දැන්-මු:
[15] වෘද්ධ
[16] වුහු, වුහැ
[17] දෙනෙ පුත්හු
[18] එසෙයින්-මු:
[19] නීරොගියහ
[20] මරණට (මරණයට) පත්
[21] එක (ද) කෙනෙක් එක් කෙනෙකුදු
[22] වී-හැම
[23] සොබි
[24] ඇඹු

සිතත්. හොත් කල්හි දුටු ජනයො "අප හැඹූ මඳක් හොවිත්ව යි, හොත් කලැ මැ හොබී[5]" සිතත්. මෙසෙ සතර ඉරියවුයෙන් අසුවල් ඉරියව්වෙහි මැ නො හොබීයනු නැත්. පස් ඇතක් හට බල ඇත්තී යැ.[1] අභිමඞ්ගල සම්මත යැ. සත් කෙළක් ජනයන් වසන සැවැත් නුවරැ මඟුලෙහි සැණයෙහි ඇය අයැජා ඇරැ වළඳවත්.

හො සෙනසුන්දනැ ඵල මහත්සෙ අසා, තමාගෙ පිනින් නිපන් නව කෙළක් අගනා මෙහෙල පළඳනා වියදම් කොටැ සෙනස්නක් කැරැවියටි වැ, රථයෙ තබා නුවරැ ඇවිද්වා ගන්නට නිස්සන් නැත්තෙන්, තොමො මැ විකිණි[2] - ගෙනැ සත් විසි කෙළක් ධන විසඳා පුවරම් වෙහෙරැ යෙළ දහසක් පහා පිරිවර ලදු* මුවරමා[3] පහය කරවා, සැට කළක්[4] දිය ගන්නා ගනරන් දැරටියක්[5] කරවා, පාදෙනිය පිහිට්වා, බුදුපාමොක් සඟනට පිළිගැන්වු. එ පහයැ යටි මහලෙ පන්සියක් ගැබි. උඩුමහලෙ[6] පන්සියක් ගැබි. පහාමහන් දවස් දෙ මාලෙ දහසක් ගැබැ දහසක් නිර්මිත බුදුහු සවනක් රසින් දිලිහි දිලිහි වැඩැහුන්හු.

එ දවස් ඇය සබඳ සිට්දුවක් දහසක් වටනා පිළියක් ගෙනැ ඇය කරා ගොස්, "අප හැඹූ, මෙ පිළියය මෙ පහයැ එක් තැනෙකැ බුමුතුරුණු කොටැ අතුරුවා ලව"යි කිවැ. "යෙහෙළි, මම් ඉදින් තිට, 'අතුරන තැනක් නැතැ' කීම් නම්, තී සිතට නොසෙ වද්දි.[7] තො මැ ගොස් බලා මෙයට අඩු පිළියක් ඇත, හැරැ-පියා අතොට[8]ලා"යි කිවැ. හො එ පිළිය ගෙනැ, දෙ මහලැ[9] ගබ් දහසට වැදැ ඇවිදැ බලන්නී, තමාගෙ දහසක් වටනා පිළියට අධම පිළියක් නො දැකැ, "මම මෙ පහයැ පුණ්‍යභාග[10] නො ලදිමි"යි එක් තැනෙකැ වැලැපැ වැලැපැ සිටියා.[11] අනඳ මහතෙරහු[12] දැකැ, "දැරිය, කුමට වලප්පි?"[13] පිළිවිසැ. එ පවත් අසා "තෙකා රැණි නොවා.[14] ති ගෙ පිළිය අතුරන තැනක් දක්මහ.[15] සඟහු පා දෙවැ පළමු තිගෙ පිළියෙ ඇක්මැ සෙනස්නට වදති.[16] තිට මහත් ඵල වෙ"යි අඩසඳ පහණ හා පාදෙනි[17] හා දෙ අතුරෙහි ඇතිරැවූහැ. වෙහෙරමහන් සාරමසින් අවසන් වී.

මාගම් වැ සිටැ **විසාඛාවන්** සෙයින් බුදු සස්නෙහි ධන පරිත්‍යාග කළාහු නැති. පිරිමි වැ සිටැ **අනෙවඩු** මහ සිටාණන් සෙයින් ධන පරිත්‍යාග කළාහු නැත්. සිටාණො සූපනස් කෙළක් ධන විසඳා සැවැත් නුවරට දකුණු දෙසෙහි, අනුර[18] පුරට මහවෙහෙර සුදුසු තන්හි, **දෙව්රම්** මහ වෙහෙර කැරැ වූහු. **විසාඛාවො**, සැවැත් නුවරට පැදුන් දෙසෙහි, අනුරපුරට[19] **උතුම් දෙවීයරම්**[20] සුදුසු තන්හි, පුවරම් වෙහෙර

---

[1] ඇත්තීහ
[2] විකිණ
[3] මුවරු
[4] කළයක්
[5] ගන දැරටියක්
[6] උඩුමහල්ලෙත්-මු:

* "යෙළදහසක් පහා පිරිවරලදු" මෙය 'චුල්ලතණ්හාසංඛයසුත්ත' අටුවායෙන් මෙහි එයි.

[7] නොසේවද්ද
[8] අතුටලා
[9] මෙමහල් දෙමහලේ
[10] පුණ්‍යභාග (භාග්) වනු
[11] සිටියාය සිටිය, සිටියැ
[12] අප අනඳමහතෙරහු
[13] වලප්හියි
[14] නොවායි, නොවෙයි
[15] දක්මයි, දක්නාම්හ
[16] වදිති
[17] "සොපානපාදධොවනන්තරෙ, පියගැට හා පාදෙනි දෙඅතුරෙහි" ධම්පියාටුවාගැටපදයි
[18] නුවර
[19] නුරාපුරට, නුපුරට
[20] උතුම් දෙව්රම්, උතුම් දෙව්අරම්-මු

කැරවූහු. බුදුහු මෙ දෙ කුලවැසියනට අනුකම්පායෙන් එක් ඇතැ වසෙකැ දෙව්රම් හි වෙසෙති. එක් ඇතැ වසෙකැ පුවරම්හි වෙසෙත්. මෙසෙ සැවැත් නුවර නිසා පස් විසි අවුරුද්දක් දවස් මෙ දෙ වෙහෙර වාස කොළො. මෙසෙ[1] විසාඛාවන් විසින් කරවන ලද පුවරම් වෙහෙර මුවරමා පහයැ[2] වැඩවසන කලැ යැ. බුදුන් රාහු නම් අසුරා දැමු සෙ[3] කිසෙ යැ යත්:

රාහු නම් අසුරිඳු උසා[4] සාරදහස් අටසිය යොජනැ. ඔහු බාහු අතුරු එක් දහස් දෙසියක් යොජනැ. බොල සසියක් යොජනැ. හිස නව සියක් යොජනැ. නළල තුන් සියක් යොජනැ. බැම අතුරු පනස් යොජනැ. නැහැ තුන් සියක් යොජනැ. මුව[5] දෙසිය යොජනැ. ගැඹුරු තුන් සියක් යොජනැ. අතුල් පතුල් පළල තෙසියක් යොජනැ.[6] ඇඟිලි පර්ව පනස් යොජනැ. මෙසෙ වූ රාහු අසුර බුදුන් ගෙ මහත් අසා, “ලොකයෙහි මට වඩා මහත් කෙනෙක් නම් ඇද්ද!” යි බුදුන් කරා නො එළඹෙයි. සෙසු අසුරන් බුදුන්ගෙ මහත් කියත් කියත්, “ඔස ඔහුගෙ මහත් හො මාගෙ මහත් හො බැලුව මැනැවැ”යි බුදුන් කරා ගියෙ.

බුදුහු ඔහු එන බව දැනැ, “සතර ඉරියවුවෙන් කුඩා ඉරියවුවෙන් කරව හො!”යි අවජනාහු, හෝනා ඉරියවු[7] කුඩාසෙ දැකැ “හෙවැ ඔහු දැක්කුව මැනැවැ”යි සිතා, “අනඳ, මෙහි හෝනා දැයක් අතොට-ලා” යි වදාළහැ. “මැනැවැ, වහන්සෙ”යි මහතෙරහු හැඳක් ඇර තබා යහන් සැලසුහු. බුදුහු සිංහශය්‍යායෙන් පා මත්තෙ පා තබා-ගෙනැ එහි වැඩැ හොත් හැ. රාහු අසුරිඳු අවුදු, එමැ දවස් උපන් දරුවකු පත්ලක් සෙ මෙළෙක් වූ පියුම්රාණිවන් රස් විහි දුනා අටතුරා සියක් මඟුල් ලකුණු පිරිවර ලද්[8] දැව් දහස් නිම් නැබැ සියො සක් ලකුණෙන් විසිතුරු පතුල් දිටි. එ සඳැ බුදුහු “කුමක් බලයි? අසුර,” යි වදාළහැ. “තොප පත්ලෙහි කෙළවර බලමී” කී යැ. “තො හවඅග් දක්වා නැඟී මා පත්ලෙහි කෙළවර බලහි නම්, දක්නට නො නිස්සෙහි”යි වදාළො. එ බස් අසා රාහු අසුරිඳු වැඩැ හොත් බුදුන් මුහුණ බලනුයෙ, නුබ මුදුනෙහි සිටි[9] පුන් සඳක් බලන මිනිසක්හු සෙයින් බැලී යැ. “මෙ ලොකයෙහි තොප වහන්සෙට වැඩි මහත් කෙනෙක් නම් නැති”යි පැහැදැ වැඳැ සරණ ගියෙ.

මෙසෙයින් බුදුහු තමන් පුරුෂදම්‍යසාරථී වන බැවින් රාහු නම් අසුරා ද ආදි ශබ්දයෙන් ගත් වෙපචිත්ති යැ. සුචිත්ති යැ, පහාරාද යැ,[10] බලිපුත්‍ර යැ[11] යන අසුරනුදු දමා සරණසිලැ පිහිට්වූහු. අසුරභවන වාසීන් හා වශවර්තිභවන වාසීන් හා අච්ඡන්දික අභව්‍ය වන බැවින් ඔව්නට අධිගම නැත්.

**අසුරදමන නම් සොළොස් වන පරිච්ඡේදය නිමි.**

---

[1] මෙහි, මෙ-මු
[2] මුවරමහපහය
[3] දමුසෙය
[4] උස
[5] මුවය
[6] දෙසියයක් යොජන
[7] ඉරියව්ව
[8] පිරිවර ලද
[9] පිහිටි
[10] පහ රාජය
[11] බලිපුත්‍රයහ

# 17. දෙවදමන නම් පරිච්ඡේදය

**සක් දෙව්රජහු දැමූ පරිදි කිසෙ යැ යත්:**

ඔහු ඇසු සුතක්[1] ඉසිරි[2] මදමත් වැ නොසඳහන් කෙළෙන්, ඔව්හට[3] සොම්ස් හය ජනවා, මොහඳුරු විධමා, සඳහන්[4] කැරැ වූයෙන්[5] කියත්.

කිසෙ යැ යත්:

පොළො තෙලෙන් දෙ සාලිස් දහසක් යොජුන් තන්හි යුගඳුරු මුදුන හා සම අහස්හි **සව්මහරජ** දෙව්ලොව්[6] සක්වළ ගල් දක්වා පිහිටියෙ යැ. හෙ අතුරුවෙහෙ පියා පිහිටි රන්රිදීමිණිමුවා දෙව්විමනින් අතුරු නැතියෙ යැ. සතරවරම් මහරජුන් ගෙ සතුරුවන්මුවා දෙව්නුවර යුගඳුරු මුදුනෙහි පිහිටියෙ යැ.[7] එ දෙව්ලොවින් උඩ දෙ සාලිස් දහසක් යොජුන් තන්හි මෙරමුදුන් හා සම අහස්හි **තව්තිසා** දෙව්ලො සක්වළ ගල් දක්වා පිහිටියෙ යැ. මෙරමුදුන මිණිමුවා යැ. එහි පිටිනුවර[8] මිසැ, තව්තිසා[9] දෙව්නුවර නම් ඇතුළු නුවර මතු පැදි දොරින්[10] පැළදොර දක්වා දස දහසක් යොජනැ. දකුණු දොරින් උතුරු දොර දක්වා දස දහසක් යොජනැ. එ නුවර සතුරුවන්මුවා මහවුරෙන්[11] හා දහසක්[12] රුවන් දොරොටියෙන්[13] පිරිබෙව්[14] ලද්දෙ යැ. රන් විමන් රිදී විමන් මිණි විමන් පෙළින්[15] හා උයන් පෙලින් විල් පෙළින් සැදුම් ලද්දෙ යි.

එ නුවරට[16] පැදුන් දෙසෙහි රුවන්මුවා පවුරුදොරොටි පිරිබෙව් ලද දහසක්[17] යොජුන් **නඳුන්වන** නම් උයනෙක් ඇති. උයන හා නුවර හා දෙ අතුරෙහි **නන්දා** නම් **චුල්ලනන්ද** නම් දෙ පොකුරුණියෙක් ඇති. එ දෙ විල්තෙරැ කේල්මුවසම් සෙයින් යහපහස් දෙන **නන්ද** නම් **චුල්ලනන්ද** නම් දෙ රුවන් අතළෙක්[18] ඇති. දකුණු දෙසෙහි එ සෙයින් මැ රුවන්මුවා පවුරුදොරොටි පිරිබෙව් ලදු[19] පන්සියක් යොජුන්[20] **ඵාරුසකවන** නම් උයනෙක් ඇති. උයන හා නුවර හා දෙ අතුරෙහි **භද්‍රා** නම් **සුභද්‍රා** නම් දෙ පොකුරුණියෙක් ඇති. එ දෙ විල්තෙරැ **භද්‍රා** නම් **සුභද්‍රා** නම් දෙ රුවන් අතළෙක්[1] ඇති. පැළ දෙසෙහි එ සෙයින් මැ රුවන්මුවා පවුරුදොරොටි පිරිබෙව් ලදු[2] පන්සියක් යොජුන් **චිත්‍රලතා**[21] නම් උයනෙක් ඇති. උයන හා නුවර හා දෙඅතුරෙහි **චිත්‍රා**[22] නම් **චුල්ලචිත්‍රා** නම් දෙ රුවන් අතළෙක්[1] ඇති. උතුරු දෙසෙහි එ සෙයින් මැ රුවන්මුවා පවුරු දොරොටි පිරිබෙව් ලදු[2] පන්සියක් යොජුන් **මිශ්‍රකවන** නම් උයනෙක්

[1] සුතන්
[2] ඉසුරු
[3] ඔහුහට
[4] සනහන්
[5] කරවුසෙ-මු
[6] ලොව
[7] පිහිටියේයි
[8] පිහිටි පිහිනුවර
[9] තව්තිසැ
[10] පදිදොරින්
[11] මහ පවුරෙන්
[12] දසදහසක්
[13] දොරටුයෙන්
[14] පිරිබෙව්කොට
[15] රන්විමන් මිණිවිමන් පෙළින්
[16] එනුවර
[17] දසදහසක්, සත්-මු
[18] දෙ අතුළෙක්
[19] ලද, ලත්
[20] ‘සත්තයොජනපරිමාණං’ - ජිනාලඞ්කාර වණ්ණනා
[21] චිත්‍රලතාවන
[22] චිත්‍රලතා, චිත්‍ර

ඇති. එ උයන හා නුවර හා දෙ අතුරෙහි **ධර්මා** නම් **චුල්ලධර්මා** නම් දෙ පොකුරුණියෙක් ඇති. එ දෙ විල්තෙරැ **ධර්මා** නම් **චුල්ලධර්මා**[1] නම් දෙ රුවන් අතළෙක්[1] ඇති. පැදුන් උතුරු කන්හි[2] එසෙයින් මැ රුවන්මුවා පවුරුදොරොට් පිරිබෙව් ලදු[2] සත්සියක්[3] යොජුන් **මහාවන** නම් උයනෙක් ඇති. එහි රුවන්මුවා දහසක් කූටාගාර ඇති. **මහාවන නන්දන**[4]වන දෙ අතුරෙහි සියක් යොජුන් **නන්ද**[5] නම් පොකුරුණියෙක් ඇති. නුවර මැදැ තැන් සියක් යොජුන් රුවන් දද පෙළින් දිලියෙන උසා සත්සියක්* යොජුන් **විජයත්පහා** නම් මහත් පහයෙක් ඇති. එ පහය **සක්** දෙව්රජහු මිනිස්පියෙහි වසන කලැ, යන එන ගමනින් වැදැ වසන හලක් කරවා, දුන් පින්කැමින් නිපන්නෙ යි.[6]

එ පහයට පැදුන් දෙසෙහි **එකපුණ්ඩරික** නම් උයනෙක් ඇති. එ උයන්හි වට පසළොස් යොජුන්[7] උසා පනස් යොජුන්[8] කඳ ඇති **පරසතු** නම් දෙව් රුකෙක් ඇති. එ රුකැ සතර දෙසෙහි සතර ශාඛාව ද මධ්‍යයෙහි ශාඛාව ද පනස් පනස් යොජනැ. මුල පටන් ගෙනැ මධ්‍ය ශාඛායෙහි අග්[9] දක්වා සියක් යොජනැ. පැදුන් දෙසෙහි ශාඛා අගින් පැළ දෙසෙහි ශාඛා අග්[2] දක්වා සියක් යොජනැ. දකුණු දෙසෙහි ශාඛා අගින් උතුරු දෙසෙහි ශාඛා අග් දක්වා සියක් යොජනැ. ශාඛා මඬුලු තුන් සියක් යොජනැ.[10] එ රුකැ[11] පුප්නා මලැ පැහැ පනස් යොජනක් තන්හි පැතිරෙයි. ගඳ සියක් යොජනක් තැනට යෙයි. එ රුක **සක්දෙව්** රජහු මිනිස් පියෙහි වසන කලැ යන එන ගමනින් සතප්නට කොබොළල[12] රුකක් පිහිට් වූ පින්කැමින් නිපන්නෙ යි.

එ රුක්මුලැ දිග සැට යොජුන්, පළල පනස් යොජුන්, බොල පසළොස් යොජුන් හුන් කලැ තිලි සෙ[13] නාභිය[14] දක්වා ගැලෙන, නැගි කලැ බෙරතලක්[15]සෙ සම වන, කැමැති සෘතුවක් දෙන, බඳුව ද මල් රැසක් සෙ රත්, **පාණ්ඩුකම්බල** නම් සලඅස්නෙක් ඇති. හැමබුදුහු හිඳැ **විජම්** දෙසත්. එ අස්න **සක්දෙව්රජහු** මිනිස් පියෙහි[16] වසන කලැ යන එන ගමනින්[17] හිඳුනට කොබොළල රුක්පයැ[18] තුබූ වලපහණෙකැ[19] පින්කැමින් නිපන්නෙ යි.

**විජයත්පහයට** උතුරු දෙසෙහි **සුධම්** නම් දෙව්සහයෙක් ඇති. එහි බිම් පිළිම්ණිමුවා යැ.[20] ටම[21] ගන රන්මුවා යැ. කොතුරුපක්[22] රිදීමුවා යැ. වගපෙළ පබළමුවා යැ. හොත් වස්[23] ගොවනැස[24] මුවවිටි සතුරුවන් මුවා යැ. ඇතුළු සියන ඉඳුනිල්මිණිමුවා

---

[1] 'සුධම්මා' - ජී: වණ්ණනා
[2] තන්හි
[3] සත්දහසක්-හැම 'සත්තයොජනසතප්ප මාණං' - ජී: ව:
[4] නන්දා
[5] නන්දනා-ජී: ව:
[6] පැන්නේයි
[7] බොල පසළොස් (සතළොස් සළොස්) යොජුන් වට..... කිසි
* "දහසක් යොදුන් විජයත් මහා ඇති" - ධර්ම ප්‍රදීපිකා
[8] සියක්
[9] අග, හග
[10] "යොජනසතපරිමණ්ඩලො"- ධම්මපදට්ඨකථා
[11] එ රුක්
[12] කොබොලීල, කොබලල
[13] තිළියෙ
[14] නාභිය
[15] තලයක්
[16] මිනිස්වැ
[17] මඟින්
[18] කොබොළීළරුකක්පයැ
[19] වල්පහණෙකැ-හැම. පලුපහණෙකැ-මු:
[20] ඉඳුනිල්මිණිමුවායැ, බිත් (ති) පිළිමිණිමුවායැ
[21] ටැම්, යට
[22] කොතුරුපත්පබළුමුවායැ
[23] ගොත්වත්
[24] ගෝනැස්, ගොනැස්, ගොවැනැස්

යැ. පිටි පියන ගන රන්මුවා යැ. කැරැළි රිදී මුවා යැ. අයම් විතර තුන්සිය තුන්සිය යොජනැ[1] වටා නව නියක් යොජනැ. උසා පන්සියක් යොජනැ දෙ දෙව්ලොවැ එයට වඩා රමණී තැනෙක් නම් නැති දෙශනා ද විනිස ද එහි හිඳැ කෙරෙත්. එ දෙව්සහය හලකට රියනක් පමණ කැළිමඬලක් දුන් **සුධර්මා**[2] නම් මාගම ගෙ පින්කැමින් නිපන්නෙ යැ.

දෙවියො එ දෙව්සහයෙහි රැස් වන කලැ, **පරසතු** මල් සැණට[3] රැස් වෙත් මැ යැ. බණ අසන්නට රැස් වෙත් මැ යැ. විනිසට[4] රැස් වෙත් මැ යැ. සගුන් වසා වසන කලැ[5] රැස් වෙත් මැ යැ. පවරන කලැ රැස් වෙත් මැ යි.

කිසෙ යැ යත්:

**තව්තිසැ**[6] වැසි දෙවියො හවුරුද්දක් දවස් දිව පරසතු රුක ගොස් ගොස් බලන්නාහු. එහි පත් විලිකුන් කලැ, "පත් විලික්සිණ, මඳ දවසෙකින් වැම්හෙ"යි[7] සතුටු වැ සැන මත් වැ සැණ කෙළිති.[8] පත් වැම්හුණු කලැ "මඳ දවසෙකින් අකුරු[9] විහිද්දි"යි සතුටු වැ සැණ කෙළිති.* අකුරු[8]වුහුටු කලැ[10] "මඳ දවසෙකින් පලු විහිද්දි" සතුටු වැ සැණ කෙළිති. පලුපත් වුහුටු[9] කලැ "මඳ දවසෙකින් කැන් ගන්නි"යි සතුටු වැ සැණකෙළිති. කැන් ගත් කලැ "මඳ දවසෙකින් කැකුළු ගන්නි"යි සතුටු වැ සැළකෙළිති. කැකුළු ගත් කලැ "මඳ දවසෙකින් මිණිදැදිරි වර[11]වෙ"යි සතුටු වැ සැණකෙළිති. මිණිදැදිරි වර වූ කලැ "මඳ දවසෙකින් මල් පිපෙ"යි සතුටු වැ සැණකෙළිති. මල් පිපි කලැ මල් බිඳුනා සඳහා රුකට නැඟෙන කිස නො ද ඇති. මල්කතුරු ගෙනැ අතු නමන කිස නො ද ඇති මල් ඕනා[12] සුමුගු එළවන කිස නොද ඇති. එක් සුළඟෙක් නැගී මල් තුවටුයෙන් කඩයි. එක් සුළඟෙක් මල් ගෙනැ සිටී. එක් සුළඟෙක් මල් **සුධම්** දෙව්සහයට[13] ගෙනැ වද්දි. එක් සුළඟෙක් එහි මල්පරඬලා හැමැදැ[14] ගෙනැ යෙයි. එක් සුළඟෙක් එහි පෙති[15] කෙසරුකෙමි රඳවමින් මල් අතුරයි.[16]

මධ්‍යයෙහි[17] ධර්මාසනයෙක් වෙයි. එ අස්නෙහි යොජුන් පමණ රුවන් පලග වෙයි. පලග මුදුනෙහි තුන් යොජුන් පමණ දිව සෙ-සත් වෙයි. එ වැළැතැ **සක්** දෙව්රජ හට අසුන් පනවති. එ එක්බිති දෙතිස් දෙව්පුත්නට[18] අසුන් පන්වති. එ එක්බිති මහානුභාව දෙවියනට අසුන් පන්වති. සෙසු දෙවියනට[19] **පරසතු** මල්කෙමි මැ අසුන් වෙයි. දෙවියො දෙව්සහයට වැදැ හිඳිති. එ මල්මි මුවරද[20] රොන්සළා නැගී කැණිමඬලෙහි

---

[1] එවටා
[2] සුධම්
[3] සැණයට
[4] විනිශ්චය (ට)
[5] වසා වන කල, වතාවන වන කලැ වරු වන කල
[6] තව්තිසා
[7] වැම්හෙයින්
[8] කෙළි
[9] අතුරු අංකුරු
[10] වුහුටුකල
[11] පර
[12] උනා
[13] සභාවට-හැම
[14]
[15] මල්පෙති
[16] අතුරෙයි, අතුරෙහි, *මෙ වැකිය පාළියෙන් අධිකයෙකි.
[17] එහි
[18] පුතුන්ට
[19] දෙවියන්ට
[20] මුරුදු

පැහැරැ බැසැ දෙවියන්ගෙ තුන් ගවු පමණ රන්වන් සිරිරු ලාරස පරිෂෙකයක් සෙයින් තවරයි.[1]

එහි **සනත්කුමාර** නම් මහබඹ[2] හො අවුදු හිඳැ බණ කියයි. බණ දන්නා මහතෙර කෙනෙක් හො හිස් හිඳැ බණ කියති. බණ කියන සෙ දන්නා දෙව්පිතෙක්[3] හො බණ කියති.[4] සක් දෙව්රජ හො, බණ කියා. **සනත්කුමාර**[5] බණ කියන කලැ **පන්සිකා** දෙව්පිත්හු ගෙ[6] වෙසින් හිඳැ බණ කියා.

කුමට යැ යත්:

**පන්සිකා** දෙව්පිත් මිනිස්පියෙහි සිටැ පින්කම් කරන කලැ කෙහෙ පන්සුළ ලු[7] ළදැරි[8] යැ[9] හෙ ගොපලුදරු වනට[10] දෙට වැ සෙසු රදුවන් ගෙනැ ගැමින් පිටත සතර මඟ එක් වූ තැනැ හල්[11] කරවමින් පොකුණු බිඳුවමින් හෙ[12] කරවමින්[13] ඇවිදුනෙ, නව යොව්නෙහි මැ මෙළෙ. ඔව්හට ඒ අත්බව් කල් විය.[14] හෙ මියැ, **සව්මහරජ** දෙව් ලොවැ ගඳෙවු[15] දෙවියන් කෙරෙහි අනූ ලක්‍ෂයකට ආයුෂ ගෙනැ උපන. ඔව්හට තුන් ගව් පමණ කසුන් කඳක් වන් දිලියෙන අත්බව් වියැ. හෙ දහසක් ගැල් පමණ පළඳනා පැළැඳැ නව කුඹක්[16] පමණ ගඳ[17] විලෙවුන් ගෙනැ රත්දිවපිළී[18] හැඳැ රත්රන්කෙමි පැළැදැ පස්සුළක් කොටැ කෙහෙ බැඳැ බහා-ලයි. එයින් **පන්සිකා** දේව නම් වැ ඇවිද්දි. එ දෙව් හැම දෙවියනට මැ ප්‍රිය යැ. එයින් සනත්කුමාර නම් මහබඹ උහුගෙ වෙසින් අවුදු හිඳැ බණ කියා.

දෙවියන් සුධම් දෙව්සහයෙහි රැස් වෙත් මැ, දියරට් නම් ගඳෙවු දෙව්රජ[19] කෙළ සුවහසක් ගඳෙවු දෙවියන් පිරිවරා කෙළ සුවහසක් රන්[20] පලග හා රස්අඩයටි හා ගෙන්වා ගෙනැ පැදුන් දිසායෙහි පැළ දිසා බලා දෙ දෙව්ලොවැ දෙවියන් පෙරට කොටැ අරක් ගෙනැ හිඳී. **විරුළු**[21] නම් වරම් මහරජ කෙළ සුවහස් කුම්භාණ්ඩ දෙවියන්[22] පිරිවරා කෙළ සුවහස් රිදී පලග හා රන් අඩයටි හා ගෙන්වා-ගෙනැ දකුණු දිසායෙහි උතුරු දිසා බලා දෙ දෙව්ලොවැ දෙවියන් පෙරට කොටැ අරක් ගෙනැ හිඳී. **විරූපක්ඛ**[23] නම් වරම් මහරජ කෙළ සුවහසක් නාගභටයන් පිරිවරා කෙළ සුවහසක් මිණිපලග හා රන්අඩයටි හා ගෙන්වා - ගෙනැ පැළ දිසායෙහි පැදුන් දිසා බලා දෙ දෙව් ලොවැ දෙවියන් පෙරට කොටැ අරක් ගෙනැ හිඳී. **වෙසවුණු**[24] නම් වරම් මහරජ කෙළ සුවහසක් යක්ෂයන් පිරිවරා කෙළ සුවහසක් පබළපලග හා රන් අඩයටි හා

---

[1] රවයි, වරයි
[2] 'සනංකුමාරො වා මහාබ්‍රහ්මාවා' - සුමඞ්ගලවිලාසිනි
[3] පුතෙක්
[4] කියති
[5] සනත්කුමාර
[6] පුත්හුගෙ
[7] පන්සුලු, පන්සුලගුළු, පත්සුලගුළු, පත්සුසුකළු, සුළුළ, සලෙළුළ, සුලැලු
[8] ළදරු දැරිය
[9] හො
[10] ගොපල්ලනට
[11] හන්
[12] ගෙ
[13] උදුරවමින්
[14] කෙරෙමින්
[15] ගඳම්, ගඳව.
[16] කුඹක්
[17] සුවඳ
[18] රන්දිවපිළී
[19] දෙව්රම්රජ
[20] රිදී
[21] විරූප
[22] කුම්භාණ්ඩයන්
[23] විරූපාක්‍ෂ
[24] වෙසමුණු

ගෙන්වා-ගෙනැ උතුරු දිසායෙහි දකුණු දිසා බලා දෙ දෙව්ලොවැ දෙවියන් පෙරට කොටැ අරක් ගෙනැ හිඳී.

මෙ සෙයින් ගත් අරක් ඇති දෙවියන්ගෙ පරසතු මල් සැණ සාර මසින් අවසන් වේ.

අටවක් පොහො දවස් **සතරවරම්** මහරජුන් ඇමැත්තො, සයිත්[1] පොහොදවස් **සතරවරම්** මහරජුන් දරුවො, පනුරැසි පොහො දවස් **සතරවරම්** මහරජහු, රන්පත් හා දැහිගුල්[2] හා ගෙනැ නික්මැ ගම් නියම්ගම් නුවර වැද "අසුවල් මාගම් අසුවල් පිරිමි[3] බුදුසරණ ගියෙ යැ[4]: ධම්සරණ ගියෙ යැ[2]; සඟසරණ ගියෙ යැ[2]; පන්සිල් රක්කි[5]; පෙහෙ වෙයි; මවුවටන් පියවටන් ධම්[6] පුරයි; මල් පුදයි; ගඳ පුදයි; පහන් පුදයි; බණ අසයි; බණ දන්නාහට[7] මහත් සත්කාර කොටැ බණ කියවයි; දහගම්[8] මහබො පිළිම පිහිටිවයි; තුන් සුසිරි පින්කම්[9] පුරයි; දස කුසල් කම්පථයෙහි සමාදන් වැ වැටෙයි; රන් පතැ ඇහිඟලෙන් ලියා ඇරැ **පන්සිකා** දෙවියාට දෙති. **පන්සිකා** දෙව්[10] **මාතලි** දෙව්පිත් හට[11] දෙයි.[12] **මාතලි** දෙව්පිත් **සක්** දෙව්රජ හට දෙයි.[10]

යම් කලෙක්හි පින්කම් කරන්නාහු නොබොහොහු ද, එ කල්හි පොත කුඩා වෙයි. එ දැකැ දෙවියො "ජනයො පමා වැ දවස් යවති. සතර අපාය පිරෙයි; සදෙව්ලොව සිස්වෙ"යි රැණි[13] වෙති. ඉදින් පොත මහත් වී නම්, එ දැකැ, "ජනයො නොපමා වැ දවස් යවති; සතර අපාය හිස් වෙයි; සදෙව්ලො පිරෙයි. බුදුසස්නෙහි පින්කම් කොටැ ආ මහපිනැති දෙවියන් ප්‍රධාන කොටැ සැණ කෙළෙනා[14] ලබම්හ"යි[15] සතුටු වෙති. එ පොත ගෙනැ **සක්** දෙව්රජ කියවයි. ඔහු පියවි බසින් කියවන කලැ දොළොස් යොජනක් තැනට ඇසෙයි. මහත් කොටැ කියවන කලැ සියලු දස දහසක් යොජුන් දෙව්නුවර පැතිරැ සිටී.

පොළොව පටන්-ගෙනැ කප්රුක් සඳහා දිවසරන් සඳහා දෙවියන් උනුන් හා කරන සටන් **සක්** දෙව්රජහු කෙරෙ සිඳෙයි.[16] දෙවියන් දුහු දූ පුත්හු දූ උපපාදුක වැ ඇකයෙහි උපදිති. පාදපරිචාරිකාවො යහන්හි උපදිති. ඔවුන් පායින් ගන්වන[17] පළඳනා පළඳවන, දෙවියො යහන්[18] වටා උපදති. මෙහෙ කරන දෙවියො ඇතුළු විමන්හි උපදති. ඔවුන් සඳහා දෙවියන් කරන සටන් නැති.

යම් කෙනෙක් හිම්අතුරෙහි උපන්හු ද, ඔහු "මා ගැත්තහ" යි[19] "තා ගැත්තහ"යි[1] නිශ්චය කරන්නට නොපොහොසත් වූවාහු, උනුන් හා සටන් කෙරෙති. **සක්** දෙව් රජහු කරා ගොස් පුළුවුස්ති. හෙ, යමක්හු ගෙ විමනට ආසන්න වී නම්, "උහු ගැත්තෙ යැ"

---

[1] සයින්, සාදවස් ධර්මප්‍රදීපිකා, සයික්සි-සිබවළඳ විනිස සයිත්සී-මු:
[2] දැහිඟුලෙන්
[3] පිරිමිනි
[4] ගියෝ ය
[5] රක්ති
[6] වටන්ධම්, මවුපියවටන්ධම්-මු:
[7] දන්නාහට, දන්නනට, දන්නන්ට
[8] දාගොබ් (ජ්)
[9] සුසුරුපින්කම්, සිසිරුපින්කම්
[10] දෙව්
[11] දෙව්පුතු (ත්)
[12] දෙති
[13] රැහැනිං
[14] කෙළි. කෙළනට-මු
[15] බලම්හයි-හැම 'ලභිද්දාස'-සු: වි: 'ඡණ කරිස්සාම' - ජී: ව:
[16] දෙයි
[17] ගන්වන ලද
[18] යහන, යහන්ගෙ
[19] ගැත්තාහයි

යෙයි. ඉදින් දෙදෙනා ගෙ සීමා මධ්‍යයෙහි උපැද යමක්හු විමන් බලා සිටියෙ වී නම්, "උහු මැ[1] ගැත්තෙ යැ" යෙයි. එකක්හු දු ගෙ විමන් නොබලා සිටියෙ වී නම්, දෙදෙනා කලහ පසිඳුනා සඳහා සක් දෙව්රජ තමා අයැති කෙරෙයි. මෙ ඇ නො එක් විනිස දු එහි මැ පවත්ති.

සඟුන් පවරන දවස් රැස් වූ දෙවියො, "අද කොයට ගොස් කා කෙරෙහි පවරම්හ හො!" යි බැණැ ගන්ති. ඔවුන් කෙරෙහි සක් දෙව්රජ බොහො සෙ පුවඟු දිවයින් ලක්දිව් හො ගොස් පවරා දහ[2] මහබො වන්දි. සෙසු දෙවියො පරසතු මල් ඈ දිවමල් හා දිව සඳුන් ගෙනැ තමන් තමනට රිසියුණු තැනට ගොස් පවරා දහ[3] මහබො වඳිත්.

සක් දෙව්රජහු[3] දෙවියන් රැස් වනු සඳහා එක්සියවිසි රියන් විජයතුරා[4] සක එක් යලක් පිඹැ-පී[5] කල්හි එ හඬ දස දහසක් යොජුන් තව්තිසැ දෙව්නුවරැ පැතිරැ සාර මසින් නිසන් වෙ.

මෙසෙ[6] විසිතුරු තව්තිසැ දෙව් ලොවැ රජ කරන සක් දෙව්රජහු උයන් කෙළනට යන කල්හි, දියරට් නම් වරම් මහරජ පැදුන් සක්වළ මුවවිටියෙහි තමාගෙ සෙනඟ එවැ, රිදීමුවා අසිපතර ඉසුලු කෙළ සුවහසක් ගඬෙවු දෙව් බලන්ගෙනැ වටා ලු කෙළසුවහසක් රිදී දඬුවැට ඇතියා වැ සුදු බරණින්[7] සැදි[8] සුදු[9] දිවඅස්රජක්හු නැඟී යුගඳුරු ගල් මුදුනෙහි පැදුන් දෙසෙන්[10] අරක් ගන්නි. විරුළු නම් වරම් මහරජ දකුණු සක්වළ මුවවිටියෙහි තමාගෙ සෙනඟ එවැ,
මිණිමුවා අසිපතර ඉසුලු කෙළ සුවහසක් කුම්භාණ්ඩදෙව භටටයන් හා සමඟ කෙළ සුවහසක් මිණිදඬුවැට ඇතියා වැ, මිණිඅබරණින් සැදි සම්වන්[11] දිවඅසක්හු[12] නැඟි යුගඳුරු ගල් මුදුනෙහි දකුණු දෙසෙන්[13] අරක් ගන්නි. විරූපක්ඛ නම් වරම් මහරජ පැළ සක්වළ මුවවිටියෙහි තමන්ගෙ සෙනඟ එවැ, පබළමුවා[14] අසිපතර ඉසුලු කෙළසුවහසක් නාගභටයන් හා සමඟ කෙළ සුවහසක් පබළ දඬුවැට ඇතියා වැ, පබළ බරණින් සැදී පබළවන් දිව අසක්හු නැඟී යුගඳුරු ගල් මුදුනෙහි පැළ දෙසෙන් අරක් ගන්නි. වෙසවුණු නම් වරම් මහරජ උතුරු සක්වළ මුවවිටියෙහි තමා ගෙ සෙනඟ එවැ, රන්මුවා අසිපතර ඉසුලු[15] කෙළ සුවහසක් යක්බළන් හා සමඟ කෙළ සුවහසක් රන් දඬුවැට ඇතියා වැ, රන් අබරණින් සැදි රන්වන් දිව අසකු නැඟී යුගඳුරු ගල් මුදුනෙහි උතුරු දෙසෙන් අරක් ගන්නි.

සුධම් නම් ගඬෙවු දෙව්පිතෙක් සර්වනන්ද[16] නම් බෙරක් අස්හි ලා, අට සැට දහසක් බෙරින් පිරිවරන ලදු වැ, නොඑක් දහස් දෙව්නළන්[17] හා සමඟ අවටහි පනස් යොජනක් පමණ තන්හි මඬුලු බැඳැ, පැදුන් සක්වළගල් මුදුනෙහි නළුගඬෙවු

---

[1] ඔහු මා
[2] දහගබ්
[3] සක්දෙව්රජ
[4] විජයත්
[5] පිඹි
[6] මෙසෙයින්
[7] සුදු බරණින්
[8] සැදු
[9] හුදු
[10] දෙය්නෙන්
[11] සමවන්
[12] අසක්කු, අසකු
[13] දෙසෙහි
[14] පබළු
[15] එළවු
[16] සබ්බනන්දන-ජී:
[17] බළන්

කෙරෙයි. **තිම්බරු**[1] නම් ගඳෙවු දෙව්පිතෙක් **එකපුමුඛ**[2] නම් බෙරක් අස්හි ලා, අට සැට දහසක් බෙරින් පිරිවරන ලදු වැ නොඑක් දහස් දෙව්නළන්[3] හා සමඟ අවටහි පනස් යොජනක් පමණ තන්හි මඬුලු බැඳැ, දකුණු සක්වළ ගල් මුදුනෙහි නළුගඳෙවු කෙරෙයි.[4] **දික්පුමුඛ**[5] නම් ගඳෙවු දෙව්පිතෙක් **මහාභාණ්ඩ** නම් බෙරක් අස්හි ලා, අට සැට දහසක් බෙරින් පිරිවරන ලදු වැ, නො එක් දහස් දෙව්නළන් හා සමඟ අවටහි පනස් යොජනක් පමණ තන්හි මඬුලු බැඳැ, පැළ සක්වළ ගල් මුදුනෙහි නළුගඳෙවු කෙරෙ. **පඤ්චශිඛ** නම් ගඳෙවු දෙව්පිතෙක් **සුස්වර** නම් බෙරක් අස්හි ලා, ඇට සැටදහසක් දිවබෙරින් පිරිවරන ලදු වැ නොඑක් දහස් දෙව්නළන් හා සමඟ අවටහි පනස් යොජනක් පමණ තන්හි පිරිස් බැඳැ[6] උතුරු සක්වළ ගල් මුදුනෙහි නළුගඳෙවු කෙරෙ.

මෙසෙ සිවුපස්හි සතරවරම් මහරජුන් විසින් ගත් ඇරක් ඇතියා වැ හාත්පසින් දක්වන ලද නළුගඳෙවු විඳිමින් සක් දෙව්මහරජ උයන් කෙළෙනට යනුයෙ, ඇතැම් කලෙක්හි **විශ්වකර්මයා** මැවු **නාරිවාහන** ඇති රන්මුවා මණ්ඩපයෙන්[7] යෙයි ඇතැම් කලෙක් දිව අස් දහසුන් යුත් පස් වනක් ධ්වජ පෙළින් ගැවැසී ගත් අහස්කුස් ඇති යෙළ සියක් යොජුන් සත්රුවන්මුවා **විජයත්** නම් රථයෙන්[8] යෙයි. ඇතැම් කලෙක්හි **ඓරාවණ** නම් දිව ඇත්රජක්හු නැඟී යෙයි.

එ ඇත් දිග එක්සියපනස් යොජුන් වැ උසා අනූයොජුන් වැ බොල පනස් යොජුන්වැ තෙතිස් කුඹුපෙළ ඇතිවැ මැවෙයි. එකෙකි කුඹුතෙලෙහි[9] සත් සත් දළ මැවෙයි.[10] එකෙකි දළ පනස් පනස් යොජුන් වෙයි. එකෙකි දළැ සත් සත් පොකුරුණි වෙයි. එකෙකි පොකුරුණියැ සත් සත් නෙලු ඹුලිය වෙයි. එකෙකි ලියෙහි සත් සත් පියුම් වෙයි. එකෙකි පියුමෙහි සත් සත් පෙති වෙයි. එකෙකි පෙත්තෙහි සත් සත් දෙවඟනො නටති. එකෙකි දෙවඟනට සත් සත් දෙව්දුහු පිරිවර වෙත්.

මෙසෙ සැදි ඇත්රජුහු පිටැ දිග පනස් යොජුන් උසා පසළොස් යොජුන් රුවන් මඬියෙක්[11] හො වෙයි. මැදැ දෙතිස් යොජුන් **මහසුදසුන්** කුඹුමතුයෙහි දොළොස් යොජුන් රුවන් මඬියෙක් හො වෙයි. එ මඩුයෙහි සුවසූදහසක් රුවන් ටඹ වෙයි. එකෙකි ටඹ වැළැඳි සත් සත් රුවන් කුසුම්ලිය වෙයි. උඩ සතුරුවන්මුවා මල්දමින් දුන් ලල් දහස් වෙයි. අතරතුරෙහි සතුරුවන්මුවා දද පෙළ වෙයි. තන්හි තන්හි ලඹන මිණිකිකිණි දැල්වෙයි. එ දැල් මඳමරු පහසින් පසඟ තුරු රැවු පරයා හඬයි. වටා මිණිවෙදිකා වෙයි. වෙදිකායෙන් පිටත ආයුධහස්ත වැ අටවිසි යක් සෙනෙවියො සිටිති. වෙදිකායෙන්[12] ඇතුළතැ **සක්** දෙව් රජ හට වල්ලභ මහානුභාව දෙවියො සිටිති. දෙපස්හි දෙතිස් කුඹුතෙළෙහි පිහිටි රුවන් මඬියෙහි දෙතිස් දෙව්රජහු හිඳිති.

මැඳැ තිස්යොජුන් සුදසුන් කුඹැ පිහිටි දොළොස් යොජුන් පමණ රුවන්මඩු මැඳැ යොජුන් පමණ මිණිපලගෙහි තුන් යොජුන් සෙ-සත්යට දිවබරණින් සව්සජ වැ

---

[1] තිම්බරුසක-ජී: ව:
[2] එක පොක්ඛර-ජී: ව:
[3] නළුවන්
[4] කෙරෙමින් සිටි
[5] දීඝමුඛ-ජී: ව:
[6] මැද
[7] මණ්ඩප්පයෙන්
[8] රථයෙකින්
[9] කුඹුපෙළෙහි
[10] වෙයි
[11] මඩුයෙක්
[12] දෙ පස්හි වෙදිකායෙන්

**සක්දෙව් මහ රජ හිඳී. උහුගෙ සුධර්මා** නම් භාර්යා දිවඅබරණින් සව්සජ වැ නොඑක් සුවහස් දෙව්සරන් පිරිවරා පෙරට[1] හිඳී. **සුජාතා** නම් භාර්යා දිවඅබරණින් සව්සජ වැ නොඑක් සුවහස් දෙව්සරන් පිරිවරා දකුණත්පස්හි හිඳී. **නන්ද** නම් භාර්යා දිවබරණින් සව්සජ වැ නොඑක් සුවහස් දෙව්සරන් පිරිවරා වමත්පස්හි හිඳී. **චිත්‍රා** නම් භාර්යා දිවඅබරණින් සව්සජ වැ නොඑක් සුවහස් දෙව්සරන් පිරිවරා පිටිපස්හි හිඳී. වල්ලභ වූ තෙයනූදහසක් දෙව්දුහු සැදී පැහැදී රුවන් කොතුරු ඈ පානියභාජන ගෙනැ හාත් පස්හි හිඳිත්. නොඑක් දහස් සුරවමියො පුන් කලස ගෙනැ මොවුන් පිරිවරා සිටිත්. මොවුන් මැ පිරිවරා හිඳැ නොඑක් දහස් සුරවමියො බිහිරඟහි[2] නටත්.

**අලම්බුසා** ඈ ප්‍රධාන සුරවමියන් කෙරෙහි **ගර්ගරා** නම් අප්සරා **මහාවීණා** නම් වෙණක් වයා. එ සඳැ එ වෙණ පිරිවර[3] සැට දහසක් වෙණ තෙමෙ මැ රැව් දෙ. **සුධමා**[4] නම් දෙව්දු **සුන්දරරාව**[5] නම් වංශයක් පුඹී.[6] එ වංශය පිරිවර[7] සැට දහසක් වංශ තෙමෙ මැ රැව් දෙ. **ආහත්‍යසාරී**[8] නම් දෙව්දු **මධුරස්වර** නම් නකුලවීණාවක් වයා. එ සඳැ එ වෙණැ පිරිවර[4] සැට දහසක්[8] **නකුලවීණා** තෙමෙ මැ රැව් දෙ. **මණිමෙඛලා** නම් දෙව්දු **විජයොත්තර** නම් සකක් පුඹී.[9] එ සක පිරිවර[10] සැට[11] දහසක් සක් තෙමෙ මැ රැව් දෙ. **මනොහරා** නම් දෙව්දු **පෘථුබිම්බ** නම් මිහිඟක්[12] වයා. එ මිහිඟ පිරිවර[2] සැට දහසක්[3] මිහිඟු තෙමෙ මැ රැව් දෙ. **අතිවෘත්තිකා**[13] නම් දෙව්දු **ආනන්දජනක**[14] නම් මිහිඟක් වයා. එ මිහිඟ පිරිවර[2] සැට[3] දහසක් මිහිඟු තෙමෙ මැ රැව් දෙ. **මත්තකී**[15] නම් දෙව්දු **දීර්සමුඛ**[16] නම් එකච්ඡිද්‍ර යක්[17] වයා. එය[18] පිරිවර[2] සැට[3] දහසක් එකච්ඡිද්‍ර තෙමෙ මැ රැව් දෙ. **නන්ද** නම් දෙව්දු **කොලස්වර**[19] නම් වෙණක් වයා. එය[10] පිරිවර[2] සැට[3] දහසක් **කොලස්වර**[11] තෙමෙ මැ රැව් දෙ. **යාමා** නම් දෙව්දු **චිත්‍රපුෂ්කර**[20] නම් පටහයක් වයා. එය[10] පිරිවර[2] සැට[3] දහසක් පටහ තෙමෙ මැ රැව් දෙ. **සොරස්වරා**[21] නම් දෙව්දු **මඤ්ජුස්වර**[22] නම් මණිපර්වයක් වයා එය[10] පිරිවර[2] සැට[3] දහසක් මණි පර්ව තෙමෙ මැ රැව් දෙ. **සර්වාඞ්ගශොභනා**[23] නම් දෙවුදු **දෘඪඝොස**[24] නම් මහබෙරක්[25] වයා. එය[10] පිරිවර[2] සැට[3] දහසක් මහ බෙර තෙමෙ මැ රැව් දෙ.

මෙසෙ නොඑක් දහස් සුවහස් දිව්‍යාඞ්ගනාවො නානා නාමයෙන් විශිෂ්ට වූ **ආතත** යැ **විතත** යැ **ආතතවිතත** යැ **ඝන** යැ **සුසිර** යැ යන වාද්‍ය වයත්. එකෙකි වාද්‍ය පිරිවර සැට[3] දහසක් වාද්‍ය තෙමෙ මැ රැව් දෙ.

---

[1] පෙරට වැ
[2] මිහිරිගෙහි, මිහිරිගෙහි
[3] පිරිවරා
[4] සුයාම, සුයාමා, සුධර්මා-මු
[5] සුන්දරාරාව, සුන්දරාව,
[6] පුම්බී, පිඹී
[7] අටසැට දහසක්
[8] ආහස්තවරියා ආහත්‍යසරියා ආහස්ත්‍යසරියා
[9] පුම්බී, පිඹී,
[10] පිරිවරා
[11] අටසැටදහසක්
[12] මිහිඟයක්
[13] අතිමුත්තකී-ජී: ව:
[14] ආනන්ද ජී: ව:
[15] මුත්තකි ජී: ව:
[16] දිශාමුඛ එකක් බී-ජී: ව:
[17]
[18] එයට
[19] කෞලස්වර
[20] මිත්‍රපුෂ්කර
[21] පෙතස්සරා-ජී: ව:
[22] මධුරස්වර
[23] සන්තඞ්ගසෙනා
[24] ඝොස-ජී: ව:
[25] බෙරයක්

මෙසෙ එක් දවසක් දෙ දෙව්ලො වැසි දෙවියන් විසින් අනුයාත වැ, සිවු ලොපලුන් විසින් අත් අරග් ඇතියා වැ, අටවිසි යක් සෙනෙවියන් විසින් පමුණුවන ලද් දෙව්සෙනඟ හා සමඟ සත්රුවන්[1] කලස ඈ සලිල භාජන ඉසුලූ අඩු තුන් කෙළක් සුරසුන්දරීන්[2] පිරිවර ඇතියා වැ, සූවිසි කෙළක් දෙව්නළන් ගෙ නළුගඳෙවු විඳිමින්, නන්[3] දෙසෙන් වස්නා දිවකුසුම් පරත වීරමින්, නරතුරු[4] වැහෙන දිව කළුවැල් ඈ ගඳරොනින් වැසෙමින්, උයන් කෙළෙනට යන **සක්** දෙව්රජ උයන් දොරට පත් කල්හි "නිවන් අරමුණු කොට රාත් වු දෙව්මිනිස්නට උතුම් මහණහු ගෙ[5] පූර්වභාග පිළිවෙත් කවර හො?" සිතී.

එක්බිති "මෙ පැනය ඉතා සසිරි ය.[6] ඉදින් මම් මෙ නොඋගෙනැ උයන් වනිම් නම්. සක්දොර ඈ සදොරින් අවුදු වදනා රූ ඈ සඅරමුණෙන් මුළා වැ මෙ පැනය සඳහන් නොකරනු වෙමි. දැන් උයන්කෙළි තබා බුදුන් කරා ගොස් මෙ පැනය පිළිවිසැ උගත් පැන ඇතියා වැ, උයන් කෙළිමි"යි ඇත්කඳැ උතුරුඩන් වැ, වක් කළ අතක්[7] දික් නොකරන තුරු, **පුවරම්** මහවෙහෙර **මුවරමාපායැ**[8] බුදුන් පෙරට පහළ වී[9] එ සතර වරම් මහරජහු දු රකවල් ගෙනැ සිටි සෙ මැ සිටියාහැ. පිරිවරා සිටි දෙව්රැස්හු දු නළුවො ද **ඓරාවණ** ඇත්රජ දු එ මැ උයන්දොරැ සිටි සෙ මැ සිටියාහු.

එකල්හි **සක්** දෙව්රජ බුදුන් වැඳැ එකත්පස් වැ සිටැ, විසිතුරු උයන් කෙළෙනට යාටි[10] වූයෙ, වෙළෙවි වැ පැන පුළුවුස්නෙ, "වහන්සේ, නිවන් අරමුණු කොටැ රත් වූ දෙව්මිනිස්නට උතුම් මහණහු ගෙ පූර්වභාග ප්‍රතිපත් සැබෙවින්[11] මට වදාරනු මැනැවැ"යි කී යැ. එ සඳැ බුදුහු "**ඉධ දෙවා නමින් ද, භික්ඛුනො සුතං හොති**" යනාදි විසින් සල්හු කොටැ පැන විසජුහැ. **සක්** දෙව්රජ අසා අනුමො වැ[12] සාධුකාර දී උයන් කෙළෙනට ගියෙ. මෙහි විස්තර **මැඳුම්සඟි** යෙහි **චුල්ල තණ්හාසඞ්ඛය** සුතින්[13] දන්නෙ යැ.

එකල්හි බුදුහු මුවරමාපායැ සතුරුවන්මුවා කුටාගාරයෙහි සිරියහන් ගැබැ වැඩැහුන්නාහු. එයට දකුණු පස්හි[14] සැරැයුත් මහතෙරුන් වසන රුවන්මුවා කුටාගාර යැ.[15] වමත් පන්හි මහමුගලන් මහතෙරුන් වසන රුවන්මුවා කුටාගාර යැ.[1] අතුරෙහි සිදුරු විවර නැති.

එකල්හි මහමුගලන් මහතෙරහු අන්තඃ[16] කූටාගාරයෙහි වැඩැ හුන්නාහු බුදුන් පැන විසජන[17] හඬ[18] නො ඇසුහු. සක් දෙව්රජහු අනුමො වැ සාධුකාර දෙන හඬ ඇසුහ. බුදුන් පැන විසජන[19] හඬ කුමට නො ඇසුහැ යත්: බුදුන් ධම් දෙසන කලැ එකාබද්ධ වැ සක්වළගල් පරියන්ත වැ[5] හුන් පිරිස්නට ඇසෙයි. පිරිස් අන්තය පියා[20] එක්

---

[1] රත්රුවන්
[2] සුරසුන්දරී
[3] නන්නන්.
[4] නිරතුරු
[5] බමුණු ගෙ, බමුණු ගෙ
[6] සසරිය, සරිය-මු
[7] අත
[8] මුවරමහපහය
[9] පැලවි
[10] යායටි. යටි
[11] සබෙවින්
[12] අනුමෝදන් වැ-මු, අනුමෙ වැ-මු
[13] චුලකණ්හසමයසුතින්
[14] පස්සෙහි
[15] කූටාගාරය යැ
[16] අන්තකූටාගාරයෙහි
[17] විසජු
[18] හට
[19] කොට
[20] අන්තසිටියා පියා

අඟලක් තනුදු[1] නො ඇසෙ. කුමට නො ඇසෙ[2] යත්: එබඳු මියුරු තෙපුල් නිරර්ථක වැ නොගිය මැනැවින්[3] නො යෙ.[4]

එබැවින් බුදුන් පැන විසජන හඬ[4] සෙ ඇසුව දැ, **සක්** දෙව්රජහු සාධුකාර දෙන හඬ අසා, "මෙ දෙව්රජ[5] දැනැ අනුමො වියැ.[6] හො! නො දැනැ හිස් සලයි හො!යි, ගොස් පිළිවිසැ බැලුව මැනැවැ"යි දික් කළ අතක් වක් නොකරන තුරු **මුවරමාපායැ** අතුරුධන් වැ **තව්තිසැ** දෙව්නුවරැ[7] පෙනුණුහු. එකල්හි සක් දෙව්රජ **එකපුණ්ඩරීක**[8] නම් උයන්හි තමා පිරිවරා වයන[9] පන්සියක් පසඟ තුරු රැවින් නැටුම් ගඬෙවු විඳිමින් හුන්නෙ, **මහමුගලන්** මහතෙරුන් වඩනවුන්[10] දුරින් දැකැ, යම්සෙ සැදැහැ ඇති රජෙක් එබඳු මහතෙර කෙනකුන් දැකැ "අසුවල් වහන්සෙ වැඩි දැ යැ දැරියෙනි, ගී නොකියව. නො වයව.[11] නො නටව"යි නළුවන් පහර කෙරෙ ද, එ සෙයින් ම **සක්** දෙව් රජ වයමින් සිටි පන්සියක් දිවපසඟතුරු පහ කරවා-පියා මහතෙරුන් කරා එළබැ, සෙසු කලැ මහතෙරුන් දෙවචාරිකාවට වැඩි විරු ද[12] වුව, "අප කරා බොහො කලෙකින් වැඩි දැ යැ"යි ප්‍රිය කථා බැණැ, යොජුන් පමණ මිණිපලඟක් පන්වා[13] මෙ අස්නෙ වැඩැහිඳුනෙ යැ" යි[14] කී යැ. මහතෙරහු එහි වැඩැහුන්හ. **සක්** දෙව්රජ දු මිටි අස්නක් ගෙනැ,[15] එකත්පස් වැ හින්දි.[16] ඔව්හට මහතෙරහු "දෙව්රජ, අප බුදුන් තට වදාළ සුත ඇසියටියම්හ"යි කීහු.

**සක්** දෙව්රජ "වහන්සෙ, ඇප් බොහො කාර්යය ඇත්තම්හ. අපගෙ කාර්යය මඳැ. දෙවියන් ගෙ කාර්යය බෙහෙවැ. අප මනා කොටැ උගත් දෙයකුදු වී නම්, වහා මැ අතුරුධන් වෙයි. අඳුරුයෙහි[17] රූ සෙයින් නො පැනෙයි. එයින් මම වහන්සෙ පුළුවුත් දැ කියන්නට නො නිස්සමි"යි කී යැ.

මහතෙරහු "මෙ දෙව්රජ කවර කාරණයෙන් නොසඳහන් කෙරෙයි[18] හො?" අවජනාහු[19] "දෙවියො නම් මහාමූඪයහැ.[20] සදොර සඅරමුණෙන් මඩනා ලද්දාහු තමන් කැබව් නොකැබව් පූබව් නොපූව් නො දන්ති" යි ඔහු මුළා වැ නොසඳහන් කළ පරිදි දත්හු.

එකල්හි **සක්** දෙව්රජ "වහන්සෙ, පූර්වයෙහි දෙවාසුර සඞ්ග්‍රාම වී යැ.[21] එකල්හි දෙවියො දුනුහැ.[22] අසුරො පරදහැ[23] දෙවියන් දුනු කල්හි **විජයත්**[24] පහා නම් පහයෙන් උපනැ. එ පහයැ සියක් නිර්යූහ යැ.[25] එකෙකි නිර්යූහයෙහි සත්සිය සත්සිය

---

[1] තැනටදු
[2] නො ඇසෙයි. නො ඇසෙද
[3] මැනැවැයි
[4] වෙ
[5] සක්දෙව්රජ නො ඇසුව ද
[6] අනුමෙව් යැ-මු.
[7] නුවරට
[8] පුණ්ඩරික
[9] යන
[10] වඩනාවුන්
[11] නොයව, නො වසව
[12] විරී
[13] පනවා
[14] වැඩහිඳුනෙහිය
[15] තබවා ගෙනා, තබාලා කරතබාගෙනැ
[16] හිඝි-මු
[17] අඳුරුගෙහි,
[18] කෙරෙත්,
[19] අවජනා, අවනාහු
[20] මුඪයහ,
[21] දෙවාසුරසංග්‍රාමය
[22] දිනූහ
[23] පරද්දහ, පැරැද්දාහ, පැරැද්දහ, පරද්හ, පැරැද්හැ-මු:
[24] විජයොත්
[25] නිර්යූහහ,

කුටාගාර යැ. එකෙකි කුටාගාරයෙහි සත් සත් දිවසරහැ. එකෙකි දිවසරට[1] මල් ගොතන, පහයින් ගන්වන පළඳනා[2] පළඳවන, සත් සත දෙව්දුහැ. මෙ සෙයින් රමණිනන් විසිතුරු මිණිරසින් දිලියෙන විජයත්පහා බලනු මැනැවැ"යි කී හැ. මහතෙරහු නො බැණැ ඉවසුහු.

එකල්හි සක් දෙව්රජ දු ඔව්හට වල්ලභ වෙසවුණු රජ දු මහතෙරුන් පෙරට කොටැ විජයත් පහයට ගියො. එ සඳැ සක් දෙව්රජහු ගෙ පාරිචාරිකාවො මහතෙරුන් දැකැ, සුහුරක්හු දුටුව ණියක[3] සෙයින්, විළි ඇති වැ, තමන් තමන්ගෙ අපවරකයට වැදැ දොර අඩවළ[4] කොටැ බලැ[5] සිටියො. එ සඳැ සක් දෙව්රජ හා[6] වෙසවුණු දෙව්රජ හා දෙ දෙන මහතෙරුන් පහයැ සක්මන් කරවමින් ඇවිද්නාහු[7] "වහන්සෙ, මෙ පහය රමණි සෙ දුටු ද? මේ රන්ටඹ බලව, රිදීටඹ බලව, මිනිටඹ බලව, පබළටඹ බලව. මරාටඹ බලව. සතුරුවන්ටඹ බලව. රන්මුවා රිදීමුවා මිණිමුවා පබළමුවා මරාමුවා*සතුරුවන් මුවා කොතුරු පක්[8] බලව. වගවළරු[9] බලව. ටඹමුල් බලව" යනාදි විසින් පහය රමණි පරිදි කියකියා දැක්වූහු.

එ සපුව ඔහු පෙරැ කළ පින්කැමින් ලද[10] පරිදි කියා සිටැ, මහතෙරහු "මෙ දෙව්රජ තුමාගෙ පහයෙන්[11], නළුවන් විසින්, සම්පතින්, යශසින්, ඉතා පමා වැ දවස් යවයි. මොහට සංවෙග ජනවුව මැනැවැ"යි අප්කිසුණු සමවත් සමවැදැ, "පහය පිහිටි අවකාශය දිය වෙව"යි ඉටා, පහය කැරළඅග පාදාඞ්ගුෂ්ඨයෙන් පහළහු. සම්සෙ දියපිට, තුබු පයෙක්, මුවවිට ඇඟිල්ලෙන් පහරන[12] ලද්දෙ, බමා ද,[13] සැලෙ ද, නො සිටී ද, එසෙයින් මැ පහය බමයි[14] සැලෙයි. නො සිටියි. ටඹ වළ[15] සඟළ ගොවනැස් කැණි මඬුලු ආදිහු "කර කර" යන හඬ විහිදුවමින් හෙන්නන් වැනි වූහු. එකල්හි සක් දෙව්රජ දු වෙසවුණු දෙව්රජ දු තව්තිසැ වැසි දෙවියො ද මහතෙරුන් ගෙ ඍද්ධිප්‍රාතිහාර්යය දැකැ, විස්මයප්‍රාප්ත වැ "**අච්ඡරියං වත භො! අබ්භුතං වත භො!**"යි ගුගුළහැ.

එකල්හි මහතෙරහු, සක් දෙව්රජහු උද්විග්ල වැ චලිත වැ කසුන් බිත්හි මිණිනාදැති සෙයින් පිපි ලොමින් ගැවසී ගත් සිරිරු ඇතිසෙ දැකැ, "දෙව්රජ, අප බුදුන් තට වදාළ සුත ඇසියටියම්හ"යි කීහු. එකල්හි සක් දෙව්රජ, මහතෙරුන් තම හට සොම්නස්[16] සංවෙග දනවා මොහඳුරු දුරු කළ කල්හි සුත සඳහන් කොටැ, තමා බුදුන් කරා ගිය සෙ, වැඳැ එකත් පස් වැ සිටැ පැන පුළුවුත් සෙ, බුදුන් විසැජු සෙ, කී යැ.

---

[1] දිවසරනට,
[2] විසිතුරු පළඳනා
[3] දුටුමණියක්-බොහෝ, වර්ණයක් හු-කිසි, මැණියන්, බැනියක-මු: මැනියන්-මු:
[4] අඩවල් (ල)
[5] බල බලා
[6] රජුන් හා, රජු හා - මු:
[7] ඇවිදුනාහු
[8] තොරතුරු පත්, කොතුරු කොතුරුමුවාපක්,
[9] වගුග් වළලු,
[10] කළ,
[11] පහයෙ
[12] පහකරන,
[13] බ්‍රමාද,
[14] බ්‍රමයි,
[15] වළලු, වළරු - මු:

* 'මසාරගල්ලත්ම්හෙ' යනු අටුවායි.

[16] සොම්නසින්,

මහතෙරහු සක් දෙව්රජහු විසින් කියන ලද සුත අසා අනුමො වැ[1] වක් කළ අතක් දික් නොකරන තුරු තව්තිසැ දෙව්ලොවැ අතුරුධන් වැ මුවරමාපහයැ පහළ වූහු. සක් දෙව්රජහු ගෙ පිරිවර සුරවම්යො මහතෙරුන් වැඩි කලැ - "මහරජ, කොයට ගොස් ආහි[2]යි පුළුවුත් කලැ[3] බුදුන් වහන්සෙ කරා ගියෙමි"යි යෙහි.[4] "මුහු තා කියන බුදුහු වෙත් දැ?"යි කීහැ. "මොහු බුදුහු නොවෙති. බුදුන් ගෙ සස්නෙහි මා හා සබඳ එක් සඟ කෙනෙකැ"යි කී යැ.[5]

එකල්හි සුරවම්යො "මහරජ, තො පිනැත්තෙහි. මෙබඳු මහානුභාව සබඳ කෙනකුන් ඇත්තෙහියැ සව්වන්ගෙ ඍද්ධිප්‍රාතිහාර්යය මෙසෙ වත්,[6] බුදුන් ගෙ ඍද්ධිප්‍රාතිහාර්යය කිසෙ යැ හො!" යි බුදුන්ගෙ ඍද්ධිප්‍රාතිහාර්යය දක්නා රිසිවූහු.

මහමුගලන් මහතෙරහු බුදුන් කරා එළඹැ එකත් පස් වැ හිඳැ, "වහන්සෙ, එක්තරා මහෙශාඛ්‍ය දෙවියක් හට නිවන් අරමුණු කොටැ රාත් වූ දෙව්මිනිස්නට උතුම් වූ මහණහු ගෙ පූර්වභාගප්‍රතිපන් වදාළ දැ වෙ දො හො?" යි[7] කීහු. එ සඳැ බුදුහු සක් දෙව්රජහු තමන් කරා අවුදු පැන පුළුවුත් සෙ, තමන් පැන විසැජු සෙ, දක්වමින් එ මැ සුත මහමුගලන් මහතෙරනට[8] වදාළො.

මෙ සෙයින් මහමුගලන් මහතෙරහු සක් දෙව්රජ ඇමුහු. රට සාහන්නට[9] ගිය ඇමැත්තන් කළ දැ රජු මැ කළා ව සෙයින් බුදුහු මැ ඔහු ඇමුවා[10] වෙත්.

මෙ සෙයින් ඇමු[11] ඔහු අමාමහනිවන්[12] පැමිණි වූ පරිදි කිසෙ යැ යත්:

එක් සමයෙක්හි බුදුහු මගධ රට රජගහා නුවරට පැදුන් දෙසෙහි මහත් අඹ වනයක් වෙතැ පිහිටියෙන් අම්බසණ්ඩ නම් ලදු බමුණුගමට උතුරු දෙසෙහි ගල්පාතැ මිණිවළක්[13] බඳු නිල් වනළවෙකින්[14] පිරිබෙව් ලද්දෙන් වෙදියක නම් ලදු පව්යෙහි ලෙන දොරැ ඉඳුසලු රුකෙකින් ඉන්සලුගුහා නම් ලදු පවුරු දොරකවුළු යුත් සුනුවමින් හා මල්කැමින් ලියකැමින් විසිතුරු ලෙනෙහි වැඩැ වෙසෙති. එකල්හි සක් දෙව්රජ හට බුදුන් දක්නට උත්සාහ උපන්. ඔහු බුදුන් එක්වන්[15] දකුත්, උහු නො ආවිරිහි, දෙවියන් ගෙ සන්නිපාතයෙක්[16] නැත, උහු සෙ නොපමා අනෙක් දෙව්පුතක්හු නැත, බුදුන් දක්නට නොගියවිරියක් හට සෙයින් උත්සාහ කෙසෙ උපනැ යත්: මරණ බියෙන් බිය පත් වූයෙන් උත්සාහ උපන්.

කිසෙ යැ යත්:

---

[1] අනුමෙවැ-මු:
[2] අයි,
[3] පුළුවුත්හු-මු:
[4] කිය-මු:
[5] කීහු
[6] පත්,
[7] වේදොයි
[8] තෙරහුට, තෙරුන්ට
[9] සහන්නට,
[10] ඇමුවෝ වෙත්.
[11] මෙසෙයින් දමා-හැම, මෙසෙයින් මැ-මු:
[12] නිවන්හි,
[13] මිණිවළල්ලක්-හැම, 'මණිවෙදිකා සදිසෙන' යනු අටුවායි.
[14] වන ලැහැබෙකින්, වලහෙකින්, ලැබෙකින්,
[15] එක්වුනු:
[16] දෙවසන් නිපාතයෙක්-මු:

ඔහු දේව සැපත් වළඳා මිනිස් ලොවැ හවුරුදුගණිනින් තුන් කෙළ සැට ලක්‍ෂයක් හවුරුදු ගෙවූ කල්හි, හෙතෙම හට උපන් පස් පූර්වනිමිත්ත දැකැ තමාගෙ ආයුෂ හි ගිය බව දති. යම්[1] දෙව්පුත් කෙනෙක්හට මරණ නිමිත්ත[2] පැනිණි ද,[3] ඔවුන් කෙරෙහි මඳ පින්කමෙකින් යම් කෙනෙක් දෙව්ලොවැ උපන්නාහු වුහු ද, ඔහු "දැන් කොහි උපදම්හ හො?"යි බිය පත් වැ වෙවුළති. යම් කෙනෙක් බොහො පින් කොටැ උපන්නාහු ද,[4] ඔහු තමන් දුන් දන්, රැකි සිල්, වැඩූ භාවනා පිණිසැ "මතු මත්තෙ දෙව්ලොවැ සම්පත්[5] වළඳම්හ"යි[6] නො බත්.

සක් දෙව්රජ වනාහි පූර්ව නිමිත්ත දැකැ, දස යොජුන් දහස්[7] දෙව්නුවර ද දහසක් යොජුන් විජයත් මහපහා ද[8] පන්සියක් යොජුන්[9] සුධම් දෙව්සභ ද, සියක් යොජුන් මහ **පරසතු**[10] දු, සැට යොජුන් **පඬුඇඹුල්සල** අස්නුහු, අඩු තුන් කෙළක් නළුවනුදු, දෙ දෙව්ලොවැ දෙව් පිරිසිදු[11] **නඳුන්වන** ඈ උයනුදු, යන දෙව්සැපත් බලා,[12] තමා එ සම්පතින්[13] පිරිහෙනසෙ දැකැ බිය පත් වී.

එක්බිති "කිසි මහණෙක් හො බමුණෙක් හො බඹෙක් හො මාගෙ හෘදයයෙහි ශොක නමැති ශල්‍ය උදුරා-පියා මට මෙ සම්පත් තහවුරු කරන්නට නිස්සෙක් ඇති හො?" යි බලන්නෙ, කිසික්හු නොදැකැ, වැළි දු බලන්නෙ බුදුන් දිට. "මා තබා, මා වැනි සුවහස්නට ද්[14] උපන් ශොකශල්‍ය බුදුහු උදුරා පියන්නට නිස්සහ"යි සිතන්නාට[15] යැ උත්සාහ උපන්නෙ.

එකල්හි **සක් දෙව්රජ** "බුදුහු කවර දනව්යෙහි කවර නුවර නිසා කාගෙ පස පරිභොග කොටැ කහට අමාදහම් දෙසමින් වෙසෙති හෝ?"යි බලනුයෙ, මගධ රට **රජගහා** නුවරට පැදුන් දෙසෙහි **අඹසඬ** නම් බමුණු ගැමින් උතුරු දෙසෙහි **වෙදියක** නම් පව්යෙහි **ඉඳුසලු** ගුහායෙහි වැඩැ වසනුවන් දැකැ, **තව්තිසැ** වැසි දෙවියන් තමා හා එනු සඳහා කැඳවී.

කුමට යැ යත්:

පළමු **සක්** දෙව්රජ බුදුන් සැවැත් නුවර නිසා **දෙව්රම්** වෙහෙරැ **සලලාගාර** නම් ගඳකිළියෙහි වැඩැ වසන කල්හි එකලා වැ දක්නට ගියෙ. බුදුහු උහු ගෙ නුවණ නොපරි පැසුණුසෙ[16] දැකැ[17] "කිහිප දවසක් හැරැ පියා මා **ඉඳුසලු** ගුහායෙහි වසන[18] කල්හි, පස් පූර්ව නිමිත්ත දැකැ මරණ භයභීතවැ දෙ දෙව්ලොවැ දෙවියන් හා සමඟ අවුදු තුදුස්පැනක්[19] පිළිවිසැ විසැජු[20] තැන සිටැ අසූදහසක් දෙවියන් හා සමඟ සොවන් වෙ"යි සිතා අවකාශ නො කොළො.

---

[1] යම් කෙනක්හට, යම් දෙව කෙනක්නට,
[2] මරණ නිමිතියෙක්,
[3] පැමිණි ද
[4] දු
[5] සැපත්
[6] වැළඳම්හයි
[7] දසයොජුන් දසදහස්, යොජුන් දසදහස්
[8] මහපායද, මහ පහය ද,
[9] "තියොජනසතිකං සුධම්මදෙවසභං" අටුවා
[10] පරසතු රුකදු (ද්)
[11] පිරිස් (ස) නුදු
[12] තබාලා. 'ඔලොකෙත්වා'-අටුවා
[13] සම්පත්තියෙන්
[14] දහස් සුවහස්නටද්
[15] සිතන්නාට
[16] නො පිරිපැසුණුසෙවු (ව්)
[17] දැනැ
[18] ගුහායට යන කල්හි
[19] පැනයක්
[20] පැනයක් විසජු

හෙ "මා පෙරැ එකලා වැ ගිය වන බැවින් බුදුහු අවකාශ නො කළහ.[1] එකාන්තයෙන් මට මඟ ඵල පැමිණෙන්නට නිසි උපනිඃශ්‍රය නැති. එකක් හට උපනිඃශ්‍රය ඇති කලැ වනාහි සක්වළැ පිරි සිටි පිරිසැ ද බුදුහු ධම් දෙසත් මැයැ. එකාන්තයෙන් දෙ දෙව්ලොවැ දෙවියන් කෙරෙහි කිසිවක් හට උපනිඃශ්‍රය වෙයි. බුදුහු උහු සඳහා ධම් දෙසති. එ ධම්[2] අසා මාගෙ[3] දොම්නස් සන්හිඳුවම්"යි සිතා තමා හා එනු සඳහා දෙවියන් කැඳවා "බුද්හු ඉඳුසලු ගුහායෙහි වැඩැ වෙසෙති. බුදුන් දක්නට යම්හ"යි කී යැ.[4]

දෙවියො ද "මැනැවැ, මහරජ, තට වැඩ වෙව යි, 'හිම වූ කෙළෙනට ගඟ කෙළෙනට යම්හ යි නොකියා අප බුදුන් කරා ගෙනැ යම්හ' යි සිතූ සෙ යහපත් නො!"යි ඔහුගෙ තෙපුල් මුදුනෙන් පිළිගත්හු.

එකල්හි සක් දෙව්රජ පන්සිකා නම් ගඳෙවු දෙව්පිත්[5] කැඳවා "අප හා එනු මැනැවැ, බුදුන් දක්නට යම්හ"යි කියා දෙවියන් කැඳවව"යි කී යැ. මුහු කුමට කැඳැවී යැ යත්: අවකාශ කරවා දෙනු සඳහා යි.[6]

කිසෙ යැ යත්

දෙ දෙව්ලොවැ දෙවියන් ගෙනැ පියෙහි පියෙහි පහරනාක්හු සෙයින් මා[7] බුදුන් කෙරෙ ගොස් වැදැ සිටුනා තැන් නො යෙදෙයි.[8] "මෙ පන්සිකා දෙව්පිත් බුදුන් කෙරෙ වල්ලභ යැ. කැමැති කැමැති සඳැ ගොස් පැනී පැන පිළිවිසැ බණ අසයි. මුහු පෙරට කොටැ නඟා යවා අවකාශ කරවා ගෙනැ ගොස් පැන පුළුවුස්මි"යි[9] යන සිතින් කැඳැවී. හෙ ද "මැනැවැ[10]: මහරජ, තට වැඩ වෙව"යි උහුගෙ තෙපුල් මුදුනෙන් පිළිගෙනැ බෙලුවපණ්ඩු නම් වෙණ ගෙනැ ගොස් එකත් පස් වැ සිටියෙයි.

කිසෙ යැ යත්:

එ වෙණ පොකුරු රන්මුවා යැ. දඬු ඉඳුනිල් මිණිමුවා යැ. තත් රිදීමුවා යැ. වෙළුම් පබළුමුවා යැ. වෙණපත් ගවි යැ.[11] තත් ගවි යැ.[3] මතුයෙහි දඬුව ගවි යැ.[3] මෙසෙ හෙ තුන් ගවු පමණ වෙණ ගෙනැ. සමපනස් මුසනින් මුසන් කොටැ, නිය ඇඟින් පැහැරැ, මියුරු ගීන් සර[12] විහිදැ, දෙවියනට සක් දෙව්රජහු ගෙ ගමනට කල් දන්වමින් සිටියෙ යැ. මෙසෙ ඔහු කියන වයන හඬින් දෙවියන් රැස් වූ කල්හි, සක් දෙව්රජ දෙවියන් පිරිවරා පන්සිකා නම් දෙව්පුත්හු පෙරට කොටැ, දික් කළ අතක් වක් නොකරන තුරු තව්තිසැ දෙව්නුවරැ අන්තර්හිත වැ[13] වෙදියක නම් පර්වතයෙහි බැසැ සිටියෙ යැ. වෙදියක නම් පර්වතය දු අම්බසණ්ඩි නම් බමුණු ගම දු සෙසු දවස් එක්[14] දෙවියකු

---

[1] නො කළහ
[2] මම්
[3] තමා ගෙ
[4] කීහු
[5] දෙව්පුත්හු
[6] සඳහිය
[7] සෙයින් මැ (ව)
[8] නො දැනෙයි, නොදදෙයි.
[9] පුළුවුසුම්
[10] මැනැවැ මැනැවැ
[11] ගවුයැ
[12] මියුරුසර, ගිසර-මු
[13] අන්තරහිත වැ
[14] සෙස් එක්........ හැම

හො මරකු හො බඹකු හො සිරිරු පැහැයෙන් දිලියෙයි. එ දවස් වනාහි දෙ දෙව්ලොවැ දෙවියන්ගෙ සිරිරු පැහැයෙන් එක් පහන් වි යැ. සඳදහස් හිරිදහස් නැඟි කල්[1] වැනි වී.

එ දවස් සක් දෙව්රජ, මිනිසුන් සවසැ බත් කන වෙලෙ ගම් මැද දරුවන් කෙළෙනා කල්හි, එයට ගියෙ යැ. එයින් හාත්පස්හි හැම මිනිස්හු[2] ඉතා මැ දිලියෙන පර්වතය දැකැ, "බුදුන් කරා දෙවියො මැදියම් යමැ එළඹෙති. දැන් පෙර යම්හි පළමු වන භාගයෙහි මැ ආහැ. කිම හො! අද මහානුභාව දෙවියෙක්[3] හො බඹෙක් හො බුදුන් පැන පුළුවුස්නට[4] ආ වනැ. කිසෙයින් බුදුහු පැන විසජති හො! මෙසෙ දෙවියන්ගෙ කුහුල් හරනා බුදුහු අපට නොදුරු වෙහෙරැ වෙසෙති. හඹුළුවක් බත් කෙණෙස්සක් දුන් කෙනෙක් මො පිනැත්තම්හ"යි සතුටු සොම්නස් වැ පිපී ගිය ලොම් ඇති වැ මුදුනෙහි ඇඳිලි බැඳැ වඳිමින්[5] සිටියො.

එකල්හි සක් දෙව්රජ **පන්සිකා** දෙව්පුත්හු කැඳවා "මම් සාගයෙමි. බුදුහු වීතරාගයහැ. බුදුන් සිත් ගන්නට නො පිළිවන. තො පළමු බුදුන් පහදවා අයැජැ අවකාශ කරවා දෙයි.[6] එකලැ ඇපි ගොස් දක්මහ'යි කී. "මැනැවැ, මහරජ" යි **පන්සිකා** දෙව්පිත් දසරියෙහි එල්වා-ලූ වෙණ බහා වම් අත්ලෙ තබා-ගෙනැ ලෙනට[7] වැදැ බුදුනට නුදුරු නොවෙත් තන්හි සිටැ බුදුන් උදෙසා දහම් උදෙසා රාතන්[8] උදෙසා කාමගුණ උදෙසා පෙරැ තමා ගායනා කළ.[9]

**"වන්දෙ තෙ පිතරං භද්දෙ තිම්බරුං සුරියද්වච්චසෙ,**
**යෙන ජාතාසි කල්‍යාණි ආනන්දජනනී මම"**

යනාදි ගාථායෙන් ගායනා කොටැ වෙණ වයයි. එහි "සොබනා අඟපසඟ ඇත්තිය, මට සොම්නස් දෙනුවිය, පාදාන්තයෙහි පටන්-ගෙනැ කෙශාන්ත දක්වා ළහිරුරස් කලබක් සෙයින් නැඟෙන ශරීරරශ්මීන් **සූරියවච්චසා** නම් ලදු[10] සොඳුර, තී පියා **තිම්බරු**[11] නම් ගඳෙවු දෙව්රජහු වනමි.[12] සොසුළුවනට[13] සුළඟ සෙයින්, පවස් ඇත්තනට පැන් සෙයින්, රාත්නට දහම් සෙයින්, ආතුරයනට බෙහෙත් සෙයින්, සා ඇතියනට බත් සෙයින්, දිලියෙන ගිනි නිවන්නට දිය සෙයින්,* තී විසින් උපන් මාගෙ කාමරාගපරිදාහ[14] නිවා. යම්සෙ මිරිඟු අවල අඟණෙකැ පුල් පියුම් විලකට බට ඇතෙක් පැන් බී අක්සොඬ මතු පැනෙන සෙ දියෙහි ගැලි සුව විඳී ද, එසෙයින් මැ තී තනබඩතුරට මම් කවර දවසෙකැ වැද සුව විඳිමි හො! යම්සෙ මදමත් ඇතෙක් තොත්‍රතොමර අංකුශයෙන් විදුනා ලද්දෙ, අවස්[15] වන බැවින් නිසි කාරණයක් නො දන්නි ද,[16] එසෙයින් මැ මම් උතුම් වන බැවින් විරාගයට නිසි කිසි කාරණයක් නො දන්මි. තී කෙරෙ බඳ සිතින් කිසි කෙනකුන් කීවා නො ගන්මි. මා තී කෙරෙ බඳ සිත,

[1] කල්හි;
[2] මිනිස්හි, මිනිසුන්
[3] දෙවිකෙනෙක්
[4] පිළිවිස්නට
[5] ඇඳිලි බඳිමින්, වඳවමින්
[6] දෙව-මු
[7] ලෙස
[8] රහතුන්,
[9] කළවිරිගාථායෙන්-හැම,
[10] ලද්,
[11] තිබුරු
[12] වඳිමි-මු,
[13] සොසුලුවහට *සොසුළුවනට-යන තැන සිට පාළියට වෙනස් පරිදි පෙළගැස්මෙක් පොත්වලැ එයි
[14] කාමරාග දාහ,
[15] අවුස්
[16] නොදනී ද,

බිලි ගිලූ මසක්හු සෙ.[1] ගළවන්නට නො නිස්සෙමි. යම්සෙ රාත්නට මද දෙයකුදු දුන, නොඑක් එල වෙ ද, එසෙයින් මැ අග්බඹුරු.[2] කෙහෙ ඇත්තිය,.[3] මඬ බැලුම් ඇත්තීය, මට පළමු උපන් එක සිත දැන් නොඑක් සිත් වි යැ. රාතන් කෙරෙහි මා කළ යම් පින්කැමෙක් ඇද්ද, හෙ මට තී හා සමඟ එල දෙවයි. පොළො තෙලෙහි සත්නට මා දුන් යම් දනෙක් ඇද්ද, හෙ මට තී හා සමඟ එල දෙවයි. යම්සෙ **සැහැමහණරජ** පළමු.[4] නිවන් සොයා ඇවිදි දූ එසෙයින් මැ මම් තී සොයා ඇවිදිමි. යම්සෙ බුදුරජ මහබො පලග්ගි වැඩැහිඳැ සව්නෙ දැනැ සොම්නස් වී ද, එසෙයින් මැ මම තී ලද දවස් සොම්නස් වෙමි. සක් දෙව්රජ මට වර.[5] දෙමින් 'දෙදෙව් ලොවැ.[6] රජ.[7] ගන්හි ද? **සූරියවච්චසාව** ගන්හි දැ?'යි කී නම්, දෙදෙව් ලොවැ රජ පියා තී මැ ගන්මි. තී පියාගෙ නුවර දොරැ අලුත්.[8] පිපි සල්රුකෙක් ඇති. හෙ ඉතා මනොහර යැ. එ සල්රුක සෙයින් සිරි බැරි වූ තී පියා ගඳෙවු දෙව්රජහු වැඳැ නමස්කාර කෙරෙමි" යන වස්තු ඇති ගයින් ගඳෙවු කෙරෙයි.

එකල්හි බුදුහු "**පඤ්චසිඛය,** තාගෙ තන්ත්‍රිස්වර.[9] ගීතස්වර.[10] හා සසන්දි..[11] ගීත ස්වර ද තන්ත්‍රිවර හා සසන්දි. තාගෙ තන්ත්‍රිස්වර ගීත ස්වර නො ඉක්මෙයි. ගීත ස්වර තන්ත්‍රිස්වර නො ඉක්මෙ"යි වදාළො.

බුදුහු ගීත ශබ්දයා.[12] හා වීණා ශබ්දයා ගෙ ගුණ කුමට කියති? කිම බුදුනට එහි රාග ඇති ද යත්: නැති. සඇඟින් යුත් උපෙක්‍ෂායෙන් උපෙක්‍ෂක වැ.[13] මෙබඳු තන්හි හුදු.[14] ඉෂ්ටානිෂ්ට දන්ති. එහි නො ඇලෙත්..[15] ඉදින් බුදුහු ගුණ නො වදාළො නම් **පන්සිකා** දෙව්පිත් 'තම හට අවකාශ කළහ' යනු.[16] නොදන්නි. **සක්** දෙව්රජ "**බුදුන් විසින් පන්සිකා** දෙව්පිත් හට අවකාශ නොකරන ලදැ"යි දෙවියන් ගෙනැ එහි මැ සිටැ නැවැතී.[17] යනු වෙයි. එසෙ වන්නා හා.[18] මහපිරිහිණි වෙයි. එහි ගුණ වදාළ කලැ වනාහි "**බුදුන් විසින් පන්සිකා** දෙව්පිත් හට අවකාශ කරන ලදැ"යි වැඳැ පැන පිළිවිසැ විසැඳු කල්හි අසූදහසක් දෙවියන් හා සමඟ සොවන් වෙ"යි යනු දැනැ ගුණ වදාළො.

එක්බිති "**පන්සිඛය,** මෙ ගාථා තුණුරුවන් හා කාම ගුණ උදෙසා තා විසින් කවර කලෙකැ කරන ලදැ?"යි වදාළහැ. "වහන්සෙ, තොප බුදු වූ අට වන සතියැ **අජපල්** නුග මුල්හි වැඩැවසන කල්හි නැමින් **භද්‍රා** නම්, ශරීර සම්පත්තින් **සූරියවච්චසා** නම්, **තිම්බරු** නම් ගඳෙවු දෙව් රජහු දූවක්, සතර **වරම්** මහරජුන් හා සමඟ **සක්** දෙව් රජ හට නැටුම් දක්වන්නට ගියා. එ කෙණෙහි **සක්** දෙව් රජ බුදුන්ගෙ යථාභූත වූ.[19] අට ගුණයක් කී යැ. එ දවස් ගොස් නටන්නී, එ ඇසුව, **සක්** දෙව්රජ **මාතලි** සඞ්ග්‍රාහකයා පිතෙක් **සිඛණ්ඩි** නම්-ඕහට ඇය දියටි වැ සිටී. මම්.[20] නොඑක් සෙ පතා ඇය

---

[1] මසකු සෙයින්,
[2] අගුබබුරු
[3] ඇති
[4] පළමුව,
[5] වරයක්
[6] දෙව්ලොවැ,
[7] රජය, ජය
[8] අලුතැ-මු:
[9] තන්ති ස්වර,
[10] ගීත ස්වරය,
[11] සසඳ,
[12] ගීත ශබ්ද,
[13] උපේක්‍ෂාවෙන්. උපෙක්‍ෂව
[14] උහුදු-හැම 'කෙවලං' - අටුවා
[15] නොගැලෙත් 'න නත්‍ථි රජ්ජති,-අටුවා
[16] බුදුන් විසින් පන්සිකා දෙව්පිත් තම හට අවකාශ කළ,
[17] නැවත
[18] යන්න,
[19] කථා භූත වූ
[20] දියටිවිය, සිටවැටමන්,

නොලදිමි. නොලදින් බෙලුවපණ්ඩි නම් වෙණ ගෙනැ තිම්බරු නම් ගඳෙවු දෙව්රජහු ගෙට ගොස් වෙණ වයනුයෙම්, මෙ ගාථා කීමි. එකලැ හො මට 'මම් බුදුන් වෙතැ නුදුටුවිරිමි. තව්තිසැ වැසි දෙවියන්[1] සුධම් දෙව්සභයෙහි නටන්නෙයිම් ඇසීමි මත්න. යම් හේතුවෙකින් තො එ බුදුන්ගෙ ගුණ කියහි ද, අද අපගෙ සමාගමවෙ'යි කිව. එ දවස් අපගෙ සමාගම වි යැ. එතන පටන්-ගෙනැ ඇය හා සමාගම නො ලැබෙමි"යි කී.

එකල්හි සක් දෙව් රජ "මෙ පන්සිකා දෙව්පිත් මාගෙ කාර්යයට යවුසෙ තමාගෙ කාර්යය බෙණෙයි. එබඳු බුදුන් කෙරෙහි සිටැ කාම ගුණ අරභයා නොනිසි කථා කෙරෙයි.

[1] දෙවියන් යන

නළුවො නම් විළි නැති වෙති. බැණෑ බැණෑ සිටැ නැටුම් දැක්වුයෙ වී නම්, නො යෙදෙයි. එසෙ බැවින් මාගෙ කාරිය දන්වමි"යි සිතා ඔහු කැඳවා-ගෙනැ "පුතැ **පඤ්චසිඛය**, 'වහන්සෙ, සක් දෙව්රජ සහපිරිවරින් භගවත්හු පා වඳී'යි මා වැඳමෙන් බුදුන් පා වඳ"යි කී යැ. "ඉතා මැනවැ, මහරජ" යි **පන්සිකා** දෙව්පිත් බුදුන් කරා එළඹැ වහන්සෙ, සක් දෙව්රජ සහ පිරිවරින් භගවත්හු පා වඳී"යි වැන්ද. "**පඤ්චසිඛය**, සක් දෙව්රජ සහපිරිවරින් සුවපත් වෙව යි; දෙවියො මිනිස්හු අසුරනාගගන්ධර්වයො නොඑක් සත්හු සුව කැමැත්තාහ"යි වදාළහැ.

එකල්හි සක් දෙව්රජ **ඉඳුසලු** ගුහාවට වැදැ බුදුන් වැඳ එකත්පස් වැඳැ සිටියෙ යැ. **තව්තිසැ** වැසි දෙවියො ද **පන්සිකා** දෙව් පුත් ද වැඳ එකත්පස් වැ සිටියාහැ. එකල්හි **ඉඳුසලු** ගුහා මහත් වී යැ. එකාලොක වී.

එකල්හි බුදුහු සක් දෙව්රජ හට "තා අනවසරසෙ[1] බැලු කලැ ආ සෙ වෙසෙසැ"යි[2] වදාළහැ. "මම් බොහො දවසක් වහන්සෙ දක්නට ආටියෙමි[3] පොළො තෙලෙහි පටන්-ගෙනැ දෙ දෙව්ලොවැ දෙවියන්ගෙ කාර්යයෙහි ව්‍යාවට[4]වැ වහන්සෙ දක්නට නොපොහොසත් වීමි. එක්[5] සමයෙක්හි භගවත්හු සැවැත් නුවර නිසා දෙව්රම්හි සලලාගාර නම් ගඳකිළිසැ වැඩැ වසන කල්හි, මම් වහන්සෙ දක්නා සඳහා එයට ගියෙමි. එ සමාහි වහන්සෙ එක්තරා සමවතක් සමවැදැ වැඩහුන් ඇ යැ. එකල්හි **වෙසවුණු** මහ රජහු ගෙ **භුඤ්ජතී**[6] නම් පාදපරිචාරිකාවක් තමා සෙද ගැමියෙන් දෙව් ලොව්හි උකටලී වැ, වහන්සෙ කරා අවුදු මුදුනෙහි ඇඳිලි බැඳැ වඳිමින් සිටි.[7] මා දැකැ 'වහන්සෙ දන්ට අකලැ.[8] එක්තරා සමවතක් සමවන්නො යැ'යි[9] කිව. එකලැ මම් 'වහන්සෙ සමවතින් නැඟී කලැ, මා වැඳමෙන් වඳ'යි[10] කියා ගියෙමි. කිම, හො වහන්සෙ, මා වැඳැමෙන් වැන්දි හො?"යි කී යැ. "හොමා වැන්ද. ඇය කී ඇ සඳහන් ඇති. අනෙකෙක් මත්න, මම් තාගෙ[11] රථයෙහි නිමැ හඬින් මැ සමවතින් නැංගෙමි"යි වදාළො. "නිමැ හඬින් නැංගෙමි" යනු කුමට යැ? නිමැ හඬ මැ තිබියෙව යි; සමවත් සමවන් කලැ කන් මුලා තබා පුඹුනා සක්යුවළෙහි දු සසලන සෙණ දහස්හි දු හඬ නො අසති.

බුදුහු වනාහි එ දවස් "සක් දෙව්රජහු යන තැන් දක්වා අවකාශ නො කෙරෙමි"යි කල් පිරිසිඳැ එලසමවත් සමවන්හැ.[12] සක් දෙව්රජ "දැන් බුදුන් වහන්සෙ අවසර නැතිවන්හැ"යි ගඳකිළි පැදකුණු කොටැ රථය නවතා-ගෙනැ දෙව් ලො බලා යවීයැ.[13] ගඳොළ[14] පිරිවෙන[15] රථ හඬින් වයන ලද පසඟතුරු වැනි වි යැ. බුදුන් පිරිකැපු කල්හි[16] සමවතින් නැංගානට රථ ශබ්දයෙහි මැ පළමු අවජුන් උපනැ. එයින් වදාළහ: මම් තාගෙ රථයෙහි නිමැ[17] හඬින් මැ සමවතින් නැංගෙමි"යි.

---

[1] අනවසරයෙ
[2] වෙසෙසයයි
[3] යටියෙමි, ආයටියෙමි-මු
[4] වැවටවැ
[5] මම් එක්......
[6] හඤ්ජවතී
[7] සිට
[8] ආකල
[9] සමවන්නේ යයි
[10] වඳියි
[11] තමාගේ, තමන්ගේ
[12] සමවන්නහ
[13] යමෙයිය, මෙයියත, මෙහෙයි-මු
[14] ගඳළ, ගඳකිළි
[15] පිරිවරා, පිරිවරින
[16] උහු (උං) බුදුන් පිරිකැපු කල්හි වැනි විය
[17] තාගෙ නිමැ

එකල්හි සක් දෙව්රජ "වහන්සෙ, යම් දෙවි කෙනෙක් අපට පෙරට වැ[1] තව්තිසැ දෙව් ලොවැ උපන්හු ද, ඔවුන් කෙරෙහි මාකන් සපුරා යම් කලෙකැ බුද්හු මෙ ලොකයෙහි උපන්නාහු නම්, එකල්හි දෙව් ලො පිරෙයි. පොළො සිස්වෙ'යි යනු අසනු ලද්දෙ යැ. වහන්සෙ, දැන් මම එ පසක් කොටැ දිටිමි. යම් කලෙකැ පටන් ගෙනැ ලොකයෙහි බුදුහු උපන්හු ද, එතැන පටන්-ගෙනැ දෙව් ලො පිරෙයි. පොළොව සිස් වෙයි. වහන්සෙ, මෙ මැ බුදුරජයෙ කිඹුල්වත් නුවර ගොපිකා නම් සැහැදුවක්[2] තුණුරුවන්හි පැහැදැ, පන්සිල් නොකඬ කොටැ රැකැ, සඟනට දන් දී, මාගම් වැ සිටැ සක්විති රජ නොවියැ හැක්කැ. සක් සැපත් මර සැපත් බඹ සැපත් නො ද වින්ද හැක්කැ, පසෙ බුදු සම්මා සම්බුදු නොද වියැ හැක්කැයි අඹුන්[3] මිනිස් බැවැ විරාග ඇති වැ, පිරිමි බව් උතුම්සෙ දැකැ, 'ඉහි සිටැ එ සපුවට පැමිණිය හැක්කැ'යි පිරිමි බවට පතා කුසල් කොටැ, තව්තිසැ වැසි දෙවියන් කෙරෙහි, මා දරු වැ,[4] ගොපක නම් දෙව්පුතක් වැ උපනැ.

"බුදු සස්නෙහි සඟහු[5] තුන් දෙනෙක් සිල්වත් වැ ධැන්[6] උපයා, පෙර තමන් වුසු තන්හි නිකාන්ති ඇති වැ, සවුමහ රජ දෙව් ලොවැ ගඳෙවු දෙවියන් කෙරෙහි උපැදැ, පස් කම් ගුණෙන් පින පිනා දෙව් සපු වළඳන්නාහු, මට 'නැටුම් ගඳෙවු කරම්හ'යි සුධම් දෙව්සභයට[7] ආහ. එකල්හි ගොපක නම් දෙව් පිත් ඔවුන් දැකැ, 'මෙ දෙව්පිත්හු ඉතා මැ දිලියෙති. පැහැ පත්හැකි නම් පින්කම් කොටැ ආහ හො![8] යි අවජනෙ. ඔවුන් පෙර මහණසෙ දිටැ. 'මහණ වැ සිල් සකස් කොටැ පිරුහැ හො!'යි, නො පිරුහැ හො!යි අවජනෙ, සකස් කොටැ පිරුසෙ දිටැ. සිල් විරුව ද, 'අනෙක් ගුණයෙක් ඇති හො!යි, නැති හො!'යි බලනුයෙ, ධ්‍යාන ලදුසෙ දිටැ. 'ධ්‍යාන ලදින් කොහි වුසුහැ හො!'යි බලනුයෙ, තමා මැගෙ කුලොපග වුසෙ දිටැ. 'පිරිසිදු සිල් ඇත්තාහු නම්, සදෙව්ලොවැ යම් තැනක්[9] කැමැති වූහු නම්, එහි උපදිති. මොහු මත්තෙ දෙව්ලොවැ නොද උපන්හැ. ධ්‍යානලාභීහි නම් බඹලොවැ උපදිති. මොහු බඹ ලොවැ නො උපන්හැ. මම් වනාහි මොවුන් මුවායෙහි සිටැ දෙව් ලොවට ස්වාමි වූ සක් දෙව් රජහු ඇකයෙහි පුත් වැ උපන්මි. මොහු හීන වූ ගඳෙව් දෙවියන් කෙරෙ උපන්හැ. 'මොහු ඇට විදුනා[10] පුගුලො නම්හැ. වඩ වඩා තර කොටැ විද්ද යුතුහැයි සිතා උනට චොදනා කරනුයෙ, 'තෙපි බුදුන් ධම් දෙසන කලැ අනාවිහිත වැ ඇසුව[11] හො? දෙ පිට බල බලා ඇසුව[9] හො? නිද නිදා ඇසුව[9] හො? මම් වනාහි අඹුන් මිනිස් බැවැ විරාග ඇති වැ පිරිමි බවට පතා තව්තිසැ වැසි දෙවියන් කෙරෙහි උපදනෙයිමි[12] සක් දෙව්රජහු පුත් වැ ගොපක නම් දෙව් පුතක් වැ උපන්මි. තෙපි වනාහි බුදු සස්නෙහි පැව්ජි වැ[13] හීන වූ ගඳෙවු දෙවියන් කෙරෙහි උපන්නා ව.[14] එක බුදුන් ගෙ සස්නෙහි

[1] පෙරට වැ සිට
[2] සැදැදුවක්
[3] අඹු
[4] මාරුව, ම ආදර වැ
[5] සඟ
[6] ධ්‍යාන, දැන්
[7] සුදම් දෙව්සභාවට
[8] ආහුයි
[9] යම්තාක්
[10] අවවිදිනා, ඇවිදුනා
[11] ඇසුහු
[12] උපදනෙම්
[13] මහණ ව
[14] උපන්නුව, උපන්ව, උපනුව

එක් වැ.[1] පින්කම් කොටැ හීන වූ ගඳෙවු දෙවියන් කෙරෙහි උපදනුවන් දක්නාමො, නො දුට.[2] මනා කෙනකුන් දුටුම්හ..[3] තෙපි හිරි ඔතප් නැත්තා ව’ යි.[4] කීය.*

මෙසෙ ගොපක නම් දෙව් පුත්හු විසින් චොදනා කරන ලද දෙවියන් තුන්දෙනා කෙරෙහි දෙදෙනෙක් සිතුහු: ‘නැටුම් ගඳෙවු කරනුවන් විසින් බලනුවන් කෙරෙන් සඟරා ලද මැනැවැ. මෙ දෙව් පිත් අප දුටු තැන පටන් - ගෙනැ ගිනියෙහි බහා-ලූ ලුණු පුපරන කල් සෙයින් තටතටායමාන යැ. කිමෙකැ මෙ!”යි අවජනාහු, “තමන් මහණ බව් පිරිසිදු සිල් ඇති බව් ධ්‍යානලාභී බව් උහු මැගෙ.[5] කුලොපග බව් දැකැ ‘පිරිසිදු සිල් ඇත්තාහු නම්, සදෙව් ලොව්හි රිසියුණු තැනෙකැ උපදිති..[6] ධ්‍යානලාභිහි බඹ ලොවැ උපදිති.[8] අපි මත්තෙ දෙව් ලොවැ ද බඹ ලොවැ ද උපදනට නොනිසි වූම්හ අපගෙ ඔවායෙහි සිටැ මෙ ගැහැනි මත්තෙ දෙව් ලොවැ පිරිමි වැ, උපන. ඇපි මහණ වැ බුදුන් කෙරෙහි බඹසර වස් රැකැ හීන වූ, ගඳෙවු දෙවියන් කෙරෙහි උපන්මහැ..[7] එයින් මෙ අප නිගන්නි” යනු දැනැ උහු ගෙ බස් අසා.[8] සිටියාහු මැ පළමු ධ්‍යාන උපයා අනාගාමීඵලපසක් කොටැ, එහි මැ සිටැ සැවැ, **බ්‍රහ්මපුරොහිත** නම් බඹ තෙලෙහි.[9] උපන්හැ.

“එක් දෙව් පිතෙක් සර්වකාම පියන්නට නොපොහොසත් වූයෙ, එහි මැ විසී යැ. වහන්සෙ, එතුන් දෙව් පුතුන් කෙරෙහි දෙ දෙව්පුතෙක් තොප ගෙ දහම් තුබූ පරිදි දැනැ අප.[10] දක්නා සෙමැ තමන් පියපස් දෙවියන් මුදුනෙහි ඕමින්, අහසට නැඟී **බ්‍රහ්මපුරොහිතයට** ගියහැ. ඇපි දු එ මැ දහමට පැමිණෙනු සඳහා තොප වහන්සෙ කරා ආම්හ. වහන්සෙ, අවසර දුන හොත්, පැන පුළුවුස්මහ”යි.[11] කී යැ..[12]

එ සඳ බුදුහු “දෙව්රජ, තා සිතට රිසියුණු යම් දැයක් පුළුවුස. මම විසජමි”.[13] යි වදාළහ. එකල්හි සක් දෙව්රජ “වහන්සෙ, යම් දෙව් කෙනෙක් මිනිස් කෙනෙක් අසුරනාග ගන්ධර්ව කෙනෙක්, බොහො යම්.[14] සත් කෙනෙක්.[15] ඇද්ද, ඔහු වෙර නැති වැ, දඬ නැති වැ, සතුරන් නැති වැ, දොම්නස් නැති වැ, කිසි තැනෙක්හි කො.[16] නො කොටැ ‘අසුරෙන් ගත් දෙයක් දහසක් දෙනා හා සමඟ බෙදා.[17] වළඳ කරමොව’ යි දන් දී පුද කොටැ පතති. එතෙකුදු වුවහොත්, ඔහු වෙර සියො වැ, දඩ සියො වැ, සතුරන් සියො වැ, දොම්නස් සියො වැ, වෙසෙති. ඔහු කවර බන්ධනයෙන් බද්ධයහ.[18]?” යි පළමු වන පැන පිළිවිත.

---

[1] එකක් වැ
[2] දුටු
[3] දුටුම්හ
[4] නැත්තාහයි
[5] උහු මාගේ
[6] උපදිති
[7] උපනුම්හැ
[8] අස අසා
[9] බඹලොතෙලෙහි
[10] අද
* “එකබුදුන් ගෙ සස්නෙහි එකක් වැ පින්කම් කොට හීන වූ ගඳවු දෙවියන් කෙරෙහි උපන්හ. එක බුදුන් ගේ සස්නෙහි එකක් වැ පින්කම් කොට හීන වූ ගඳවු දෙවියන්න කෙරෙහි උපදනවුන් දක්නමෝ නො දුටමනා කෙනෙකුන් දුටුම්හ. තෙපි හිරිඔතප් නැත්තාවයි කී යැ.”
[11] පුළුවසුම්හයි
[12] කීහ
[13] කියමි
[14] කෙනෙක් හෝ ලොහො යම්
[15] සත්වකෙනෙක්
[16] කොව්, කොවු, කොප
[17] දෙයක් බෙදා......
[18] බන්ධ නයහ යි

බුදුහු එ පැන විජසන්නාහු, “දෙව්රජ යම් දෙවි කෙනෙක් මිනිස් කෙනෙක් අසුරනාගගන්ධර්ව කෙනෙක් බොහො යම් සත් කෙනෙක්[5] ඇද්ද, ඔහු වෙර නැති වැ, දඬ නැති වැ, සතුරන් නැති වැ, දොම්නස් නැති වැ, කිසි තැනෙක්හි කො[6] නොකොටැ ‘ඇසුරෙන් ගත් දෙයක් බෙදා වළඳ කරමොව’යි දන් දී පුද[1] කොටැ පතති. එතෙකුදු වුව හොත්, වෙර සියො වැ, දඬ සියො වැ, සතුරන් සියො වැ, දොම්නස් සියො වැ, වෙසෙති. ඔහු ඉස්සාමච්ඡරිය සංයොජනයෙන් බද්ධයහ” යි වදාළො.

එහි ‘ඉස්සා’ නම් අනුන්ගෙ ඉසුරු[2] නො වින්දැ හෙන බව යැ. ‘මච්ඡරිය’ නම් තමාගෙ සම්පත් අනුන් හා සාධාරණ බව නොකමැති බව යැ. මෙහි ‘මච්ඡරිය’ නම්: ‘ආවාස මච්ඡරි යැ, කුලමච්ඡරිය යැ, ලාභමච්ඡරිය යැ, වණ්ණ මච්ඡරිය යැ, ධම්ම මච්ඡරිය’යි පසෙක් වේ. එහි අවසැ මසුරු වූවාහු, යක්‍ෂ වැ හො ප්‍රෙත වැ හො උපැද, එ අවසැ කසළ හිසින් නගා-ගෙනැ ඇවිදිත්. කුලෙහි මසුරු වූවාහු, එ කුලවැස්සන් අන්නට දන් දෙන්නන[3] පුදන්නන් දැකැ, ‘මාගෙ කුල බිනැ’යි[4] සිතනුවන් කටින් හුණු ලෙහෙ හො නැගෙයි. ගිනි[5] හො බිඳෙයි. අතුණු හො කඬ කඬ වැ නික්මෙයි. ලාභයෙහි මසුරු වූයෙ, සඟුන් හො ගණ හො හිමි ලාභයෙහි මසුරු වැ, පුඟුල් පරිභොගයක් සෙයින් වළඳා, යක් වැ හො ප්‍රෙත වැ හො ගරවිල් වැ හො උපද්දි. සිරිරු වැන්මෙහි ගුණ වැන්මෙහි දහම්හි මසුරු වූයෙ. තමාගෙ මැ ගුණ වනයි; අනුන්ගෙ ගුණ “කිනම් ගුණයෙකැ”යි එහි දොස් දක්වනුයෙ ද, දහම් අන්නට නොකියනුයෙ ද, විවන වෙයි. වහතොලු වෙයි. නොහොත් අවසැ මසුරු වූයෙ වී නම්, ලොහොගෙයි උපද්දි. කුලෙහි මසුරු[6] වූයේ වී[7] නම්. අලාභී වෙයි. ලාභයෙහි මසුරු[4] වූයෙ වී නම්,[5] භවයෙහි උපන්නා හට වර්ණ නම් නොවෙයි. දහම්හි ඉසුරු වූයෙ වී නම්[5] හළුනිරයැ උපද්දි. මෙ ඉස්සාමච්ඡරියසංයොජන සොවන් මැඟින් පැහෙයි. එතාක් කල්හි වෙර නැති බව් ආදි පතන්නාහු දු වෙර ආදීන් නො මිදෙත් මැයි. මෙසෙයින් බුදුහු සක් දෙව්රජහු පුළුවුත් ‘ඉස්සාමච්ඡරිය’ නම් පැන විසජුහු එකල්හි සක් දෙව් රජ සතුටු වැ, මෙ නියායෙන් තුදුස් පැනයක් පිළිවිත්.

තුදුස් පැනය නම් කවරැ යත්:

‘**ඉස්සාමච්ඡරියං**’ යනු එක් පැනයෙකැ ‘**පියාප්පියං**’ යනු එකෙකැ ‘**ඡන්දෙ**’ යනු එකෙකැ. ‘**විත්කකො**’ යනු එකෙකැ. ‘**පපඤ්චො**’ යනු එකෙකැ. ‘**සොමනස්සං**’ යනු එකෙකැ. ‘**දෙමනස්සං**’ යනු එකෙකැ. ‘**උපෙක්ඛා**’ යනු එකෙකැ. ‘**කායසමාචාරො**’ යනු එකෙකැ. ‘**වචීසමාචාරො**’ යනු එකෙකැ. ‘**පරියෙසනා**’ යනු එකෙකැ. ‘**ඉන්ද්‍රිය සංවරො**’ යනු එකෙකැ. ‘**අනෙකධාතු**’ යනු එකෙකැ. ‘**අච්චන්තනියා**’ යනු එකෙකැ යි යන මෙ යැ. මෙසෙ තුදුස් පැනය **සක්** දෙව්රජහු පුළුවුත් පරිදි දු, බුදුන් විසැජු පරිදි දු, **දික්සඟියැ සක් පැනසුතින්** දන්නෙ යැ.

මෙහි උපෙඛා පැන විසජුන්හි සිටැ **සක්** දෙව්රජ අසූ දහසක් දෙවියන් හා සමඟ සොවන් වි යැ. බුදුහු වූ කලැ රාත් එල පරියන්ත කොටැ ධම් දෙසුහු. එවැනි ධම් දෙන්නෙහි මෙ කුමට රාත් නොවී යැ යත්: බුදුහු රජක්හු වැන්නාහැ. විනෙජනයො

---

[1] පුදකරමෝවයි
[2] වස්තු ඉසුරු
[3] දෙන්නාහු
[4] බිඳැයි
[5] බඳ
[6] මසුරන්
[7] විමෙන්

රජකුමරුන් වැන්නො. යම්සෙ, රජ, වළඳන කලැ තම හට පමණින් පිඬු වටා රජකුමරුනට[1] එළවයි. ඔහු එයින් තමන් මුව පමණින් මැ ගන්ති. එසෙයින් මැ බුදුහු තමන් අධ්‍යාශය වූ[2] පරිද්දෙන් රාත්ඵල පරියන්ත කොටැ ධම් දෙසති. විනෙ ජනයො තමන්ගෙ උපනිඃශ්‍රය පමණින් සොවන් ඵල හො ගන්ති. සෙදැගැමි අනැගැමි රාත් ඵල හො ගනිත්.

**සක්** දෙව්රජ වනාහි සොවන් වැ බුදුන් පෙරට මැ[3] සිටැ සැවැ ළදරු **සක්** දෙව්රජක් වැ වැළිඳු තුන් කෙළ සැට ලක්‍ෂයකට ආ[4] ඇති වැ උපනි. සැවැ යන දෙවියන්ගෙ අත් බව් ගිය තැන් ආ තැන් නො පැනෙයි. දිලියෙන පහන් යන්නා[5] වැනි වෙයි. එ හෙතුවින් සෙසු දෙවියො නො දත්හැ. **සක්** දෙව්රජ වනාහි තමා සැවැ යන බැවින් ද. බුදුහු තමන් සව්නෙ දන්නා බැවින් දත්හු.

එකල්හි **සක්** දෙව්රජ තමා මියැ උපන්[6] පරිදි බුදුනට සැළ කොටැ, නොඑක් සෙ බුදුන්ගෙ ගුණ වනා[7] සිටැ **පන්සිකා** දෙව් පුත්හු කැඳවා, "තො මට බොහො උපකාරයෙහි. බුදුන් පළමු ප්‍රසාද කැරැව්හි. තා[8] ප්‍රසාද කැරැවූ කැල පැසුළු ඇපි ගොස් බුදුන් දුටුම්හ. තා මට පිය තැනැ තබමි. ගඳෙවු දෙව්රජ කෙරෙමි. **සුරියසච්චසාවත්** දෙමි" යි කියා බුදුන් බැසැ-හෙවැ වැඳැ, "**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**" යි තුන් යලක් බුදුනට නමස්කාර කොටැ, පැදකුණු[9] කොටැ, වක් කළ අතක් දික් නොකරන තුරු තව්තිසැ දෙව්නුවරැ පාළ වී.

**විසාඛාවනට** හා අනෙවඩු මහසිටාණන්ට සෙයින් **සක්** දෙව්රජ හට දු භවරාග බලවති. එසෙයින් මැ **සක්** දෙව්රජ සවරෙකා දඹදිවැ රජසපු වළඳා, සදෙව් ලොවැ ක්‍රමයෙන් උපැදැ[10] දේව සපු වළඳා එහි සිටැ ධ්‍යාන උපදවා, බඹ ලොවැ උපද්දි. එහි දු හැම බඹ තෙලෙහි ක්‍රමයෙන් උපැදැ ප්‍රීතිසුඛ අනුභව කොටැ එහි සිටැ අනගැමි වැ **සුදවස්හි** උපද්දි. එහි උපදනෙ, පළමු වන **අවිහතෙලෙහි** දහසක් කපට ආ ගෙනැ උපැදැ එහිදු ආ පමණින් සිටැ සමවත් සුව අනුභව කොටැ, දෙවන **අතප්තලයෙහි** දෙ දහසක් කපට ආ ගෙනැ උපැදැ, එහි දු ආ පමණින් සිටැ තුන් වන **සුදස් තලයෙහි**[11] සාර දහසක් කපට ආ ගෙනැ උපැදැ, එහිද් ආ පමණින් සිටැ සතර වන **සුදස්සි** තලයෙහි අට දහසක් කපට ආ ගෙනැ උපැදැ, එහි දු ආ පමණින් සිටැ පස් වන **අකනිටා** බඹ තෙලෙහි සොළොස් දහසක් කපට ආ ගෙනා උපැදැ, එහි සිටැ රාත් වැ ආ පමණින් සිටැ සමවත් සුව අනුභව කොටැ අනුපාසෙස් නිවන් ධැයින් පිරිනිවෙයි.

මෙ සෙයින් බුදුහු තමන් **පුරුෂදම්‍යසාරථී** වන බැවින් **සක්** දෙව්රජහු දු. ආදි ශබ්දයෙන් ගත් සූවිසි තැනෙක්හි වැඩැ හිඳැ සූවිසි වරෙකා වදාළ ධම් දෙස්නෙන් කෙළ සුවහසක් කෙළ සුවහසක් බැවින් රාත් වූ, අසඬ්ඛ්‍ය අසඬ්ඛ්‍ය බැවින් සොවන් සෙදගැමි අනැගැමි වූ දෙවියනුදු දමා අමා මහනිවන් පැමිණිවූහු.

---

[1] කුමරුවන්ට
[2] තුබූ
[3] පෙර මැ
[4] ආයු
[5] නිවන්නා, වන්නා පහනක් වැනි
[6] උපන්බැව්හි
[7] වනාහි
[8] මෙහි තා
[9] වැඳ පැදකුණු
[10] උපද උපද
[11] සුදවස් තලයෙහි

**දෙවදමන නම් සතළොස් වන පරිච්ඡේදය නිමි.**

## 18. බ්‍රහ්මදමන නම් පරිච්ඡේදය

බක නමු බඹහු[1] ඇමු පරිදි කිසෙ යැ යත්:

බුදුන්[2] **උක්කට්ඨා** නම් නුවර නිසා **සුභගවනයෙහි**[3] සාලරාජමූලයෙහි වැඩැ වසන කල්හි, බක නම් බඹ හට පවිට්[4] ශාශ්වත දිට්හ[5] උපන්. බුදුහු උහු ගෙ අදහස් දැනැ දික් කළ අතක් වක් නොකරන තුරු ගොස් බඹ ලොවැ පහළ[6] වූහු.

**බක** නම් බඹ බුදුන් තමා කරා එනුවන් දැකැ, "මොබ එ. මෙ නිත්‍ය යැ. ධ්‍රැව යැ. ශාශ්වත යැ. මෙ බඹ ලොවැ මහලු වන්නෙක් හෝ මියන්නෙක් හො නැති, මෙයින් අනෙක් නිසරුණෙක්[7] ඇත්තෙ නොවෙ"යි කී යැ. මෙසෙ කියනුයෙ "මත්තෙහි[8] තුන් ධ්‍යානභූමි දු සතර මඟ සතර ඵල දු[9] නිවනුදු නැති" කීවා වෙ.[10]

එකලැ "මොහයෙන් මුඪය,[11] **බක** බ්‍රහ්මය,[12] අනිත්‍යයට 'නිත්‍ය'[13] යෙහි.[14] අධ්‍රැවයට 'ධ්‍රැව' යෙහි[14] අශාශ්වතයට[15] 'ශාශ්වත'[10] යෙහි.[14] 'මෙහි මහලු වන්නෙක් හො මියන්නෙක් හො නැති' යෙහි[14] 'මෙයින් අනෙක් නිසරුණෙක් ඇත්තෙ නොවෙ' යෙහි[14] අඳුරුවට වන්නක්හු වැන්නැ"යි වදාළො.

එකල්හි මරදෙව්පිත්, "මහණ ගොයුම් කොහි ගියො හො!"යි[17] බලනුයෙ, බඹලො වඩන්නා[18] දැකැ, "මොහු බඹනට බණ කියා මාගෙ විෂය නොඉක්මවන තුරු ධම් දෙසුන් විනාශ කළ මැනැවැ"යි ගොස් බඹුන්[19] අතුරෙහි නොපැනී[20] සිටැ, බුදුන් බක බ්‍රහ්මයා ගර්හා කළ කල්හි, මහා බ්‍රහ්මතලවාසීන් හො බ්‍රහ්මපුරොහිතතලවාසීන් වෙරැ ආවිෂ්ට[21] වන්නට අසමර්ථ වූයෙ, බ්‍රහ්මපාරිෂද්‍යතල වැසි බඹක්හුගෙ ශරීරයෙහි ආවිෂ්ට[21] වැ, "මහණ, මහණ, ඔහට නින්දා නොකරා. එ බඹ[22] මහබඹැ, හැම බඹුන් අභිභවයි. තෙමෙහෙ අනභිභූත යැ, සර්වදර්ශී යැ, හැමදෙනා තමා විසියැ වටයි, ලොකයෙහි ඉසුරැ, ලොකයා මැවුයෙ යැ. පොළොව් හිමගල් මෙරගල් සක්වළගල් මහ මුහුදු හිරි සඳ මුහු විසින්, මවන ලද්දෙ යැ, ලොකයට උත්තම යැ 'තො ක්‍ෂත්‍රිය වා,[23] තො බ්‍රාහ්මණ වා,[2] තො වෛශ්‍ය වා,[2]* තො ශූද්‍රවා, තො ගිහිගෙ ඔට්වා, තො ගොන්වා

---

[1] බඹු
[2] බුදුහු
[3] සුභවනයෙහි
[4] පවිට, පවිටු
[5] සහස්වත දිටහ, දිටුහ
[6] පාළ
[7] නිසරු කෙනෙක් (කෙනෙක්)
[8] මත්තේ
[9] ද්
[10] කීව වෙ
[11] මුඪව, මුඪයව
[12] බකබඹ
[13] නිත්‍යය (යැ)
[14] යෙයි
[15] අසහස්වතයට
[16] සහස්වත (යැ)
[17] කොහියැ හොයි
[18] වඩනන් වඩන්නන්-මු
[19] බඹු
[20] පෙනී
[21] ආවෙශ
[22] එ බඹනම් (ම්)
[23] ව

යි, යෙජි යැ.* උපන් සතුනු දු උපදනා සතුනු දු පියෙ යැ. හැම සත්හු මැ මුහු දරුවහැ.[1] මහණ, තට පෙරට වැ[2] ලොකයෙහි මහණ බමුණො වූහැ. ඔහු තා සෙයින් මැ 'පොළොව අනිත්‍ය යැ. දුඃඛ යැ, ආත්ම යැ'යි ගැරහුහැ,[3] එසෙයින් මැදිය ගරහා, ගිනි ගරහා, බඹුන්[4] ගරහා, මියැ ගොස් සතර අපායෙහි උපන්හ. තා ගැරහුවා සෙ[5] එ නො ගරහා, 'නිත්‍ය යැ, ධ්‍රුව යැ, ශාශ්වත යැ'යි පැසැස්සාහු මියැ ගොස් බඹලොවැ උපන්හැ. මහණ, මා තට කියන දැයෙක් නම් - බඹ යමක් කී ද, උහු කීවා කරන්නෙ යැ. උහුගෙ තෙපුල් නො ඉක්මෙන්නෙ යැ. ඉදින් තො බඹහු ගෙ තෙපුල් ඉක්මිණිහි නම්, ගෙට සිරි වදුත්[6] මොහොල්[7] ගත්තා වෙයි. මහණ, යම් පුරුෂයෙක් සියක් පුරුෂයක් පමණ ගැඹුරු ප්‍රපාතයෙකැ හෙන්නෙ, අතින් ගන්නට නිසි දැයක් හො පයින් ධරන්නට නිසි දැයක් හො නො ලදු වී නම්, ප්‍රපාතයෙහි ගොස් හෙයි. තො බඹහු ගෙ තෙපුල් ඉක්මිණිහි නම්, උහුට වූ දැ තට වෙයි. මහණ, තො මෙහි මුළු දුන් බඹපිරිස් යශසින් හා ශ්‍රීයෙන් හා දිලියෙන සෙ දුටුයෙහි වෙහි ද? ඔහු හැම දෙන බඹහු ගෙ තෙපුල් පිදුවාහැ. තො ද බඹහුගෙ තෙපුල් නො ඉක්මැ උහු කීවා කරන්නෙහි විහි නම්, මොවුන් සෙ මැ යශසින් හා ශ්‍රීයෙන්[8] හා දිලියෙහි" යි කී යැ.

එකල්හි බුදුහු "පවිට, මම තා හඳුනමි.[9] මා තා නො හඳුනති[10] යි නො ගනැ[11] තො මාරයෙහි. මෙහි යම් බඹ පිරිසෙක් ඇද්ද, උහු හැම තා හස්තගතයහැ,[12] තට වශග යහැ. 'මෙ මහා හස්තගත යැ; මෙ මට වශග යැ" යනු දු තට දැනෙයි. මම් වනාහි තා හස්තගතයෙම් නොද වෙමි. තා වශගයම් නො ද වෙමි" වදාළො.

එකල්හි බක නම් බඹ "මම නිත්‍යය මැ[13] නිත්‍ය යැ[14] යෙමි. ධ්‍රුවය මැ[15] ධ්‍රුව යැ යෙමි. ශාශ්වතය[16] මැ ශාශ්වත යැ යෙමි. යම් තැනෙක්හි වූවො මැ මහලු නො වදේද, නො මියෙද්ද, අනෙක් නිසරුණෙක් නැද්ද, එ මැ කියමි. මහණ, තට පෙරට ව මැ ලොකයෙහි මහණ බමුණො වූහැ. ඔහු මහත් තව ඇත්තාහැ, මෙයින් අනෙක් නිසරුණක් නුදුටහැ. තො ද මෙයින් අනෙක් නිසරුණක් නොදක්හි.[17] හුදෙක් තට වෙහෙසයෙක් මත්න[18] තා සිතන්නෙ යැයි. ඉදින් තො පොළොව් ආදීන් තෘෂ්ණාමානදෘෂ්ටීන් තහවුරු කොටැ ගත්තෙහි විහි නම්, මා යන කලැ, වැළත ගෙනැ යනු ලැබෙයි. සිටුනා කලැ වැළැතැ සිටුනා ලැබෙයි. හිඳුනා කලැ, වැළැතැ හිඳුනා ලැබෙයි. හෝනා කලැ, වැළැතැ හෝනා ලැබෙයි. මා කෙරෙහි මට අරක් ගෙනැ සිටුනා ලැබෙයි. මම් තා කැමැත්තෙන් කෙරෙමි. සෙස්සන් හැරැ තා ඇතුළත් කෙරෙමි. නො එසෙ විහි නම්, හිරිහි[19] කොළගසටද් වඩා තා බිමැ ඇපිළි කෙරෙමි"යි කී යැ.

---

[1] දරුවාහ
[2] පෙරට මැ, පෙර මැ
[3] හැරවූහු, ගැරවූහු, ගැරහූය
[4] බඹහු-හැම, බඹපුත්-මු 'පජාපතිගරහකා'- පෙළ 'මාරො පජාපතී'-අටුවා
[5] සේම
[6] වදුවන්
[7] මොළු, මොල්,

* 'තො ගෘහපතිවා' යනුදු පොත්වල එතත් අටුවාහි නැත.
* 'තො ගොත්වා, ගෙන්වා සියැ' - පොත්වල එන සැටියි.

[8] ශ්‍රියායෙන්,
[9] හඳුනෙමි,
[10] නො හඳුනෙතියි,
[11] නො ගණු-මු:
[12] සහස්තගතයහ,
[13] නිත්‍යයට,
[14] නියත,
[15] ධ්‍රුවයට,
[16] ශාශ්වතයට
[17] නො දක්හිදු,
[18] වන් තැනැයි, මතනයෙක්,
[19] ගිරිහි, හිරිඟි.

එකල්හි බුදුහු "මෙ බඹ මානනිඃශ්‍රිත යැ. 'මම් දන්මි' යි ගත්තෙ යැ. තමාගෙ යශසින් මතැ. තමා වෙර පහරනට නිසි කිසිවක්හු නො දක්කි. මුහු නිගත මැනැවැ"යි සිතා "මම් තා ගෙ ගති දු දන්මි. ජුති[1] ද දන්මි. බකබ්‍රහ්ම මෙසෙ මහර්ධික යැ; මහානුභාව යැ; මහෙශාඛ්‍ය යැ යනු දන්මි"යි වදාළො. එ "කිසෙ යැ හො දන්නා පරිදි යැ"යි කී යැ.

බුදුහු "හිරි සඳ දෙදෙනා දස දිසා බබුළුවමින් ඇවිදුනා තාක් තැන් එක් සක්වළෙන් වෙයි. මෙසෙ වු සක්වළ දහසෙකැ[2] තා වසය[3] වැටෙයි. මෙ සක්වළ ඇතුළු වැ සක්වළ දහසැ හීනප්‍රණීත සත්ත්වයන් දන්හි. 'මෙ සරාග යැ, මෙ විරාග[4] යැ' යනු දන්හි උපදනවුන් නස්නවුන් දන්හි. තො වනාහි 'ඉතා මහත්මී' ගත්තෙහි. තො නම් සහස්‍රී බඹෙක්හි. තට වැඩි සිටි ද්විසහස්‍රී ත්‍රිසහස්‍රී චතුස්සහස්‍රී පඤ්චසහස්‍රී දශසහස්‍රී ශතසහස්‍රී බඹුන්ගෙ පමණ නැති. තො සතර රියන් කඩෙකැ[5] පමණ ගන්නට ව්‍යායාමයක් කරනුවක්හු වැන්නෙහි"යි නිගත්හු. නිගෙනැ, "බ්‍රහ්මය, අනෙක් තුන් ධ්‍යානභූමියෙක් ඇති. එයින් තා සැවැ ආ පරිදි තො නොදන්හි. මම දන්මි. මෙසෙ දැන්මෙන් තො මා හා නොසමයෙහි. මම තට වැඩි සිටියෙමි"යි වදාළො.

මොහු තුන් ධ්‍යානභූමියෙන් සැවැ ආ පරිදි කිසෙ යැ යත්:

මෙ බඹ අබුද්ධොත්පාදයෙහි තවුස් පැවිජි වැ[6] කිසුණු භාවනා කොටැ සමවත් උපයා ධ්‍යානයෙන් නො පිරිහී මියැ සතරවන ධ්‍යාන භූමි යැ. **වෙහප්ඵල** නම් බඹතෙලෙහි, පන්සියක් කපට ආ ගෙනැ උපනැ. එහි දු ආ පමණින් සිටැ එයින් පාත උපදනට තුන් වන ධ්‍යාන[7] පිණි කොටැ හවා, **සුභකිණ්ණ** නම් බඹකෙලෙහි සූසැට කපකට ආ ගෙනැ උපන. එහි දු ආ පමණින් සිටැ එයින් පාත උපදනට දෙවන ධ්‍යාන පිණි කොටැ හවා **ආභස්සර** නම් බඹ තෙලෙහි අට කපකට ආ ගෙනැ උපන. එහි දු ආ පමණින් සිටැ එයින් පාත උපදනට පළමු වන ධ්‍යාන පිණි කොටැ හවා **මහාබ්‍රහ්ම**[8] නම් බඹතෙලෙහි කපකට ආ ගෙනැ උපනි. හෙ තමා[9] කළ පින්කමුදු උපන් තැනුදු දති.[10]

කල් යත් යත්, දෙ මැ සඳහන් නොකොටැ සස්සතදිට්ඨි ගත්. එ සඳ බඹ "මහණ ගොයුම් මාගෙ ආයුදු උපන් තැනුදු පෙරැ කළ පින් කමුදු දන්නි. ඔස, මොහු පුළුවුත මැනැවැ"යි සිතා, තමා[11] පෙරැ කළ පින්කම් පිළිවිත. බුදුහු වදාළො.

කිසෙ යැ යත්:

පෙර මෙ බඹ කුලගෙකෙක් හි උපැදැ කාමයෙහි ආදීනව දැකැ 'ජරාමරණින් මිදී ගිය මැනැවැ'යි ගිහිගෙන් නික්මැ ඉසිපැවිජියෙහි පැවිජි වැ ධ්‍යාන උපයා අභිඥලාභී වැ ගඟක් අසැ පන්සලක් කොටැ ගෙනැ දහන්සමවතින් දවස් යවයි. එකල්හි සත්වාවො

[1] චුති,
[2] දහසෙක්,
[3] විසියැ, විෂයැ විසියැටිවෙයි,
[4] වීතරාගය,
[5] කඩ
[6] තවුස්, තවුස් පැවිජියෙහි පැවිජිවැ
[7] පළමු තුන් ධ්‍යාන,
[8] මහා බ්‍රහ්ම තල,
[9] හෙ පළමු තමා-මු
[10] දන්නි, දන්ති
[11] මා

පන්සියයක් ගැලැ[1] බඩු පුරවා මරු කතර පිළිපන්හැ. එවුදු එක්තරා හුණු වැල්ලෙකැ, ආවල් නොඇක්මිය හැක්කෙන්, රැ රැ ගමන් යෙත්. එහි පළමු යන[2] ගැල අග්වියෙහි[3] බඳ ගොන්හු යෙමින් සිටැ ආ මඟ බ ලා නැමුණාහැ. හැම ගැල්හු එ ගැල ගිය නියායෙන්මැ ගියො. හිරු නැගි කලැ ගැල් නැවති බව දත්හු. හෙ ඔවුන් කතර ඉක්මැ යන දවස යැ. දිය දර හැම හී ගියෙ යැ. මිනිස්හු "දැන් කලි අප දිවි නට"යි[4] සිතා ගොනුන් ගැල්සකැ බැඳැ-පියා ගැල්සෙයෙහි වැද හොත්හු.

තවුස් වනාහි පන්සලින් නික්මැ පන්සල් දොරැ හිඳැ ගඟ බලනුයෙ, ගඟ මහත් වතුරෙන් පිරී, වැටෙමින් එන මිණිකඳක් සෙයින්, එන්නා දැකැ, "මෙ ලොව්හි මෙබඳු මියුරු දිය නොලදින් නස්නා සත්හු හා ඇති හො!"යි අවජනෙ, මරුකතරහි සත්වාවන් දැකැ "මෙ සත්හු නො නසිත්ව'යි, මෙයින් මහත් දිය කඳෙක් කැඩී මරුකතරැ සත්වාවන් කරා යෙව"යි ඉටී යැ. එමැ විගස ඇළින් යන දිය සෙයින් දිය එයට ගියෙ. මිනිස්හු දිය දැකැ සතුටු සොම්නස් වැ නහා පැන් බී ගොන් පැන් පොවාගෙනැ සුවයෙන් තමන් කැමති තැනට ගියො.

මෙසෙයින් බුදුහු එ මහබඹහු පූර්වයෙහි ගිමනැ[5] නස්න මිනිස්නට පැන් දුන්සෙ වදාරා, එවුහු මැ ගෙ[6] අනෙක් පින්කමක් ඇක්වූහු.

කිසෙ යැ යත්:

එ බඹ අනෙක් අත් බැවෙකැ එසෙයින් මැ පැවිජි වැ ගඟක් අසැ පන්සලක් කොටැ-ගෙනැ වලැ වු ගමක්[7] නිසා වෙසෙයි. එකල්හි සොරහු ගම් පැහැරැ අත්සරු[8] රුවන් ගෙනැ, ගෙරි ගෙනැ, එහි මිනිසුන් ලවා ගෙන්වා-ගෙනැ, යෙති. ගෙරි දු බල්ලො දු මිනිස්හු දු මහ හඬින් හඬති. තවුස් එ හඬ අසා, "කිම හො!"යි අවජනෙ, මිනිස්නට භය උපන් බව දැකැ, "මා දක්නා සෙමෙ සත්හු නො නසිත්ව"යි දහස් සමවැදැ නැඟී, සොරුන් පෙරමඟැ සිවුරඟ සෙනඟ මැවීයැ. සොරහු බෙරැ අතොවමින්[9] එන සෙනඟ දැකැ, "රජ ආ වනැ"යි තමන් තමන් ගත් වොලො දමා-පියා වැලැහ. තවුස් "යමෙක් යමක්හු ගැත්තෙ ද, හෙ ඔව්හට මැ වෙව"යි ඉටී යැ. හෙ එසෙ මැ වියැ. ගම්වැස්සනට සෙත් වී.

මෙසෙ බුදුහු එ බඹහු පූර්ව ජන්මයෙහි සොරුන් ලුහුබැඳැ පියා ගම්වස්සනට සෙත් කළ පරිදි වදාරා, උහු මැ ගෙ අනෙක් පින්කමක් ඇක්වූහු.

කිසෙ යැ යත්:

එ බඹ අනෙක් ජන්මයෙක්හි එසෙයින් මැ පැවිජි වැ ගඟක් අසැ පන්සලක් කොටැ-ගෙනැ වෙසෙයි. එකල්හි උඩු ගඟැ වැසි එක් කුලෙක් යටි ගඟ වැසි එක් කුලක් හා සමඟ මිත්‍රකම් කොටැ නැව් හගුළු බැඳැ, බොහො කන බොන ඇ දුගඳ මලු දු නැවට

[1] ගැල්
[2] පළමුවන
[3] අගවියෙහි
[4] නටයයි
[5] ගිමැ
[6] මාගෙ
[7] වලගමක්, වලෙව්ගමක්, වල්ගමක්-මු
[8] අත්සර
[9] අන්වමින් අනොවමින්-මු

නඟා-ගෙනැ දියපිටින් එති. මිනිස්හු කමින් බොමින් නටමින් ගයමින්[1] දෙව් විමනෙකින් යනුවන් සෙයින් සොම්නස්හැ. එ ගඟැ වසන නාගරාජ දැකැ දැහැවැ, "මොහු මා ඇති යන සිතු දූ නො කෙරෙති. දැන් මොවුන් මුහුදුබත් කළ මැනැවැ"යි මහත් අත්බවක්[2] මවා, දිය දෙකක් කොටැ පළා-පියා නැඟී, පැණය[3] කොටැ සුස්මමින් සිටියෙ යැ. මිනිස්හු දැකැ බියපත් වැ හඬා නැංග යැ. තවුස් පන්සලැ හුන්නෙ, එ හඬ අසා, "මෙ හු ගයමින් නටමින් සොම්නස් වැ එති. දැන් වනාහි භයරවයෙන්[4] හැඬූහු. "කිම හො!"යි අවජනෙ, නා රජු දැකැ, "මා දක්නා සෙ මෙ සත්හු නො නසිත්ව"යි යන සිතින් සමවත් සමවැජැ නැඟී ගුරුළු වෙසක් මවා-ගෙනැ නා රජහු දැක්වී යැ. නා රජ බියපත් වැ පැණය හකුළුවා-ගෙනැ දියෙහි ගැලී ගියෙ. මිනිස්නට සෙත් වී.

මෙසෙ බුදුහු එ බඹහු පූර්ව ජන්මයෙහි ගුරුළුවෙස් ගෙනැ නාරජහු ලුහුබැඳැ - පියා නැවැ මිනිස්නට සෙත් කළ පරිදි වදාළො.

මෙසෙ බඹහු **බක** ජාතකාදි නොඑක් අත්බැවැ කළ දැ බුදුහු වදාළහ. බුදුන් කියත් කියත්, ඔහු පූර්ව ජන්මයෙහි කළ පින්කම් දහස් දිලියෙන ගෙකෙක්හි රූ සෙ පහළ වී එ සඳ එ බඹ බුදුන් කෙරෙහි පැහැද, "තෙපි මාගෙ වැත්තා මතු දන්නා නොව.[5] තොප නො දන්නා දැ නම් නැති. එයින් මැ තොප දිලියෙන අනුභාව✝ සියලු බඹලො බබුළුවමින් සිටියෙ යැ"යි කී යැ.

එකල්හි බුදුහු බඹහු ගෙ දුලද් බිඳුනට "**පඨවිං ඛො අහං බ්‍රහ්මෙ**" යනාදීන් අසමතා[6] දැක්වූහු. මෙහි විස්තර **මැදුම්සඟියැ බ්‍රහ්මනිමන්තණිය සුතින්** දන්නෙ යැ.

එ බඹ තමා ගත් ගත් ලද[7] බුදුන් විසින් විහිදුවා-පි කල්හි ගන්නට නිසි කිසි දැයක් නො දැකැ, ලළිතකම් කටටි වැ, "ඔස මම් අතුරුධන් වෙමි"යි කී යැ. පොහොසත් විහි නම්, අතුරුධන් වා. තො අතුරුධන් වන්නට නො හැක්කෙහි"යි වදාළහැ. හෙ "සෙස්සනට අවිෂය වූ සියුම්[8] මුල් පිළිසඳට[9] ගොස් අතුරුධන් වෙමි"යි සිතී යැ. බුදුහු "මෙ බඹ මුල් පිළිසඳට නොයෙව"යි ඉටුහු.[10] එයින්[11] හෙ අතුරුධන් වන්නට නො නිසි වියැ. "අතුරුධන් වෙමි"යි[12] සිතා විමන්හි හැලෙයි.[13] කප්රුක්හි හැලෙයි.[9] උළුළයෙන්[14] හිඳී[15] උහු දැකැ බඹහු* "මෙ බක බ්‍රහ්ම විමන්හි හැලෙයි.[9] කප්රුක්හි හැලෙයි.[9] උළුළයෙන් හිඳී. තො 'අතුරුධන් වීම'යි සිතූයෙහි" යි පරිහාස කළහැ. මෙ බඹුන්* විසින් පරිහාස කරන ලද්දේ, දළ බුන් සපක්හු සෙ තොප නැති වී යැ. මන් නැති වී යැ.

---

[1] වයමින්
[2] අත්බැව්
[3] පණය, පැණ
[4] භෛරවයෙන්
[5] නො වච-මු
[6] අසමසමතා
[7] දුලද(ද්)
[8] පියුම්
[9] පිළිසිඳ
[10] සිතූහ
[11] මෙයින්
[12] වීමයි
[13] ගැලෙයි
[14] උත්පලයෙන්, උළුලයෙන්,
[15] හිඳ
* බුදුහු-හැම "බ්‍රහ්මගණො" - අටුවා
✝ 'තොප දිලියෙන අනුභාව ඇත්තෙය'-හැම

එකල්හි බුදුහු එ බඹ හට "මම් අතුරුධන් වෙමි"යි වදාළො. 'පොහොසත් වුව අතුරුධන් වා"යි කී යැ. එ සඳැ බුදුහු "මෙ බඹ ලො වැසියො මා නො දකිත්ව යි; බස් අසත්ව"යි ඉටා හුනස්නෙහි මැ අතුරුධන් වැ වැඩ හිඳ-

**"භවෙ චා'හං භයං දිස්වා භවඤ්ච විභවෙසිනං,**
**භවං නාභිවදිං කිඤ්චි නන්දිඤ්ච න උපාදියිං"**

යන මේ ගාථාව වදාළහැ. අතුරුධන් වැ හිඳැ මෙ ගය කුමට වදාළහ යත්: බඹගණා "මහණ ගොයුම්හු මෙ තැනැ ඇති බව් කවුරු දනිද්ද!"යි කියන්නට අවකාශ නොදෙනු සඳහා වදාළො.

මෙයින් බඹ ලොවැසියො බුදුන් ගෙ ඍද්ධිප්‍රාතිහාර්යය දැකැ, "ඇපි මෙසෙ වූ ඍද්ධිප්‍රාතිහාර්යය කරන මහණ බමුණු[1] කෙනකුන් පෙරැ නොදුටු විරීම්හැ. නොද ඇසූ[2] වීරිම්හ"යි විස්මිත වැ ගුගුළො.

මෙසෙ[3] සිවුසස් දිස්වා බුදුහු ධම් දෙසුහු. දස දහසක් බඹහු* රාත් වූහු. මෙසෙයින් බුදුහු තමන් අනුත්තර වූ 'පුරුෂදම්‍යසාරථී වන බැවින් බක ආදි බ්‍රහ්මයන් දමා අමා මහනිවන් පැමිණිවූහ.

x x x x

මෙ සෙයින් තුන් ලොව්හි සැරිසැරැ[4] **උපාලි** ගහපති ඇ සිටිනුදු, **කූටදන්ත** ඇ බමුණනුදු[5], **අජාසත්** ඇ රජුනුදු, **අඟුල්මල්** ඇ සොරුනුදු[6], **සභිය** ඇ පරිබ්‍රාජකයනුදු, **සච්චක** ඇ නුවරදරුවනුදු, **පාථිකපුත්‍ර** ඇ නුවටනුදු, **සච්චබද්ධක** ඇ ජටිලයනුදු, **බාවරි** ඇ තව්සනුදු, **සාක්‍යභික්ඛු** ඇ මහණනුදු, **නන්දොපනන්ද** ඇ නාගරාජයනුදු, **නාලාගිරි** ඇ මහානාග යනුදු, **ආළවක** ඇ යක්ෂයනුදු, **රාහු** ඇ අසුරනුදු[7] **සක්දෙව් රජහු** ඇ දෙවියනුදු, **බක** ඇ බඹනුදු දමා අමා මහනිවන් පමුණුවමින් තරුපිරිවර ලද පුන්සඳහු[8] සෙයින්, පිරිබද්ධ පවු පිරිවර ලද රුවන්මෙර සෙයින් පත්පෙළ පිරිවර ලද පියුම් කෙමියක් සෙයින් අරීගණ[9] පිරිවරා දෙව්රම් මහ වෙහෙරැ වැඩැ විසූහැ බුදුහු

**"සසී'ව තාරාගණසම්පුරක්ඛතො**
**ගිරී'ව මෙරූ පරිභණ්ඩගන්තරෙ,**
**සරෙ සුවුල්ලම්බුජකණ්ණි කූපමො**
**වසී ජිනො ජෙතවනෙ පභඞ්කරො"**

---

[1] මාණබමුණු
[2] ඇසි
[3] මෙසෙයින්
[4] සැරිසරා, සැරිසර, සැරිසැරු-මු
[5] බමුණුදු
[6] සොරනුදු
* බුදුන් - හැම "බ්‍රහ්මගණෙන උප්පණ්ඩිතො"-අටුවා.
* දහසක් - හැම, "දසමත්තානි බ්‍රහ්මසහස්සානි"-අටුවා.
[7] අසුරයනුදු
[8] පුන්සඳක්, පුන්සඳක් හු
[9] ආරිය ගණයා
* දමනා-යන ආකාරාන්ත රූපය ද ඇතැම් පොත්හි හැම තැනැ මැ යෙදුසෙ සළකන්නෙ යැ

බුදුගුණ අනන්ත වන බැවින් නව ගුණය හැම කියත්, නො පිළිවතින් එහි 'පුරිසධම්මසාරථී' යන පදය ගෙනැ, විස්තර කෙරෙමින් දුර්දාන්තදමන යැ* ස්වසන්තානදමන යැ පරසන්තානදමන යැ ගෘහපතිදමන යැ බ්‍රාහ්මණදමන යැ රාජදමන යැ චොරදමන යැ පරිබ්‍රාජකදමන යැ මාණවක දමන යැ දිගම්බරදමන යැ ජටිලදමන යැ තාපසදමන යැ භික්ෂුදමන යැ නාගදමනය යැ යක්‍ෂදමන යැ අසුරදමන යැ දෙවදමන යැ බ්‍රහ්මදමන යැ යන අටළොස් පරිච්ඡේදයෙකින් පිරිසුන් මෙ ගත් කරන මා විසින් යම් පින්කමෙක් ගගනොපම කොටැ රැස් කරන ලදු ද, එ පින්කම් ගගනොපම හැම සත්ත්වයනට පැමිණෙවා.

යාව තිට්ඨති සෙලින්දෙ - යාව චන්දෙ විරොචතී,
තාව තිට්ඨතුගන්ථො'යං - පසාදෙන්තො මහාජනන්ති.

**ගුරුළුගොමින් විසින් කරන ලද අමාවතුරු නම්**
**'පුරිසදම්මසාරථී' පද වර්ණනා නිමි.**

බුදුගුණ මුත් තෙපුල් - මෙත්බහවුත් මුත් සිත්
නොවෙ වා කෙණෙක්හි දු - පරවැඩ මුත් පියො මා.

## අමාවතුරු - පිටපොත

### ගැටපද

**අක්කැමියන්** - 'අගනාගම මෙතෙකැ'යි කියනුවන්.

**අග්දෙරියෙහි** - අගුදොරැ = නිසවත්තෙහි, ගඳකිළිය ඉදිරියෙහි

**අභාළ මුව** - වළකට, විවෘත මුඛය

**අටමඟලා පෙළ** - පූර්ණකුම්භ යැ, ගදායුද යැ, චක්‍රායුධ යැ, ශ්‍රීවත්ස යැ, අඞ්කුශ යැ, ධ්වජ යැ, සෞවස්තික යැ, ශඞ්ඛ යැ යන අට **අටමඟලා පෙළ** නම්. මෙයට වෙනස් සැටියෙනුදු කියති.

**අටසැටසුවහසක් දිවපසඟතුරු** - අට වර්ගයෙක බෙර යැ, සැට වර්ගයෙක බෙර යැයි, මෙසෙ අටමහබෙර හා සැටමහබෙර හා සියදහස් දිවපසඟතුරු යන අර්ථයි. මෙහි 'සුවහස්' ශබ්දය අනෙකාර්ථ වෙයි. එයින් දෙ මහබෙර මෙතෙකැයි හිම් නැතිසෙ කියූ සැටියි. 'අටසැට දහසක්' යනු පොත් හි එයි. '**අට්ඨසට්ඨිතුරියසතසහස්සානි**" යනු අටුවායි.

**අටළොස් සෙනීභ** - ලොහකාරාදි අටළොස් සෙනිකුලැස්සෝයි. "**සෙනීහි නම් එ එ කම්හි යුත් කුලවැසියො**" යනු **ධම්පියාඅටුවා ගැටපදයි**. 'මනුස්මෘති' යෙහි විස්තර ඇත.

**අඩතෙළෙස් යල් සියක්** - එක් දහස් දෙසිය පනස, අඩෙකින් තෙළෙස් පුරනු 'අඩතෙළෙස්' වෙයි. එයින් වාර සියක් ගත් කලැ එක් දහස් දෙසිය පනසෙක් වෙයි. එයින් මෙහි 'යල්' යනු වාර්තා කොටැ ගත හැකි ය.

**අතවසැ** - වස්කාලය තුළ

**අතුරු දුනැ** - හෙතුව දැනැ. 'පාළිː අන්තර > අතුරු'

**අඳු බානෙක්හි** - අන්දුබන්ධනයෙකැ = හැකිලි බැම්මෙකැ.

**අනත් අපරිසෙ** - අනන්ත අපරියන්ත, 'පාː අපරියන්ත, > අපරිසෙ'යි ආ සැටිය සළකන්නේ යැ.

**අනිෂ්ටප්‍රග්‍රහයහි** - අනිෂ්ටයන් ඇසිරි විසින් තර කොටැ පිළිගැන්මෙහි, "**අනිට්ඨපග්ගහෙ**" යනු මෙහි අටුවායි. පොත්හි එන 'අශිෂ්ටසෙවායෙහි' යනු ලෙඛකදොෂයෙකි.

**අනුපාද විමොක්‍ෂයෙන්** - තෘෂ්ණාමානදෘෂ්ටි විසින් නො ගෙනැ කෙලෙසුන් කෙරෙන් මිදීමෙන්.

**අනුබුයෙහි ද** - සලිලප්‍රායභූමියෙහි = බෙහෙවින් දිය වැදැ සිටුනා බිමෙහි. 'සං: අනූප > අනුබු'

**අනුයොගක්ෂම** - පැන පුළුවුස්නට සැහෙන,

**අබ්බොහාරික කොටැ** - ව්‍යවහාරයට අර්හ නොවූවක් කොටැ = සඳහන් නොලා.

**අබ්ධා** - ජලය. 'පාඃ අපොධාතු > අප්ධා > අබ්ධා' යනු වෙයි.

**අයිණි** - අගුණ. 'පාඃ අගුණ > අයුණු = අයිණි'

**අරා මැ යැ** - එළවා මැ යැ = ගෙනැ දේ මැ යැ.

'අරා' යනු 'අර - එළැවීමෙහි' දයින් නිපන් ක්‍රියාපදයි.

**අලුයෙහි** - පනදා = දෙ වැනි දිනැ.

**අවුධූනන** - කිබීසිනි = යටිකුරු කොටැ ගසා පීම.

**අවිජහිත** - නොහළ, වැකියෙහි සිටුනා 'තැන' යනුවට විශෙෂණයි.

**අවුණුදෙරැ** - කඩ පිළෙහි 'පාඃ ආපණද්වාර > අවුණුදොර'

**අශෛක්ෂ භූමි** - රහත් පලයි.

**අසස් පසස්** - ආශ්වාස ප්‍රශ්වාස

**අළක්** - අඩු = කකුණු ආදීන්ගෙ පා

**ආකර්ෂණ** - මොබට ඇදැ - ලීමයි.

**ආකොටනක්ෂම** - ආකොටනයට = තැළීමට යොග්‍ය,

**ආලම්බන එලකයෙහි** - සක්මන් කෙළවරැ තුබූ වැතිරැ - ගන්නා පුවරුයෙහි

**ආවර්තනිමායායෙන්** - අනුන් ආවර්තන කොටැ - ගන්නා = විසි යැ ලා ගන්නා මායායෙන්

**ඇක්මෙන්නෙ** - ඉදිරි බලා මැඩැගෙනැ යනුයෙ, 'ඇක්ම-ඇක්මීමෙහි' දයින් නිපන් 'ඇක්මෙනු' යන අර්ථ ක්‍රියා ශබ්දයෙහි ප්‍රථමෛකවචන රූපයි.

**ඇතුළු වටන** - "වටා කඩතුරා බඳවා"යි කීයෙන් කඩතුරායෙන් වටා - ගත් උපස්ථාන කරන පෙදෙස 'වටන' නම්. එ 'වටන තුළ' යන අර්ථයි.

**ඇතුළුසළු පහනක්** - සැළිය තුළු දල්වා - ලූ පහනක්.

**ඇතොරනුදු** - අන්තඃපුරස්ත්‍රීනුදු, 'පාඃ අන්තෙපුර > අතවුර = ඇතොර'

**ඇඹුල** -  හාල්පානු ගෙනැ ලුණු ඇඹුල් ඈ යොදා කකියවා - ගන්නා කැඳෙකි.

**ඇසිවසන්** - ආශීවිෂයන් = සර්පයන්, 'පාඃ ආසිවිස > ඇසිවස'

**ඉපැදු** - පිසු = උයන ලද, 'උපද-ඉපැදීමෙහි' ධාතුයි.

**ඉලුප් ද** - උලුපතෘණ කපා, උලුපතාණ නම් කුශතෘණයි, යාගයට එ ද උපකරණයි. මෙහි එන 'දා' යනු පරෙ කිරියෙකි. ජාතකඅටුවා ගැටපද-ධම්පියාටුවා ගැටපද ආදියෙහි දු මේ පෙරකිරිය දක්වා ලැබේ. 'සංඃ උලුප > ඉලුප්'

**උද්ඝටිතඥ** - උද්දෙශය කියා මුව විවර කළ පමණෙකින් අනෙකාකාරයෙන් කරුණු වටහා - ගන්නා පුද්ගලයි.

**උද** - ගිනි දල්වා, උදා යනු 'උද' ධාතුයෙන් පෙර කිරි පදයි. පාඃ 'උජ්ජාලෙත්වා'

**උදුවිය දුකින්** - උදයව්‍යයදුඃඛයෙන්

**උපසම සිරි** - උපශාන්තශ්‍රීය=සන්හුන් සිරිය

**උපෑ රළගල** - උත්පාත සඞ්ඛ්‍යාත තරඞ්ග ගිරි. මතු වන කඳු බඳු රළගෙඩි

**උපුට**-ගළවා. 'පාඃ උප්පාටෙත්‍වා > උපුට' යනු වෙයි. 'උපුර' ධාතුයෙහි අන්තයට ටකාරාදෙශයෙන් හා පෙරකිරියපසින් හා සිදු වනසෙ ද කියැහෙයි.

**උපුරා**-උදුරා. 'උපුර-ඉපිරීමෙහි' දයින් නිපන් පෙරකිරියයි. ධම්පියාටුවා ගැපදයෙහි දු "ගොධික මහතෙරුන්" වත්හි "සමූලං තණ්හං අබ්බුය්හ, සුමුලු තණ්හා උපුරා"යි අර්ථ කීහ.

**උරසක් මල්** - "උරචක්ක නම්, පාෂාණමය වූ හෝ මාණික්‍යමය වූ හෝ කර මුවහත් ඇති වට වූ ගිනි ගෙනැ දිලියෙන, කරැ ලූ කල කැපෙන, මෙයින් සැවැ පරලොව උපන් පාපීසත්‍වයා හට දුඃඛාවහ වූ ආයුධ විශෙෂයෙකි" යනු 'ජාතක අටුවා ගැටපද' වෙයි.

**උවකමු දෙළෙක** - උපක්‍රමයෙන් සන්හිඳැවුව මනා හෙයින් 'උවකමුදොළ' නම් වෙයි. 'උපක්‍රම' නම් ලෙහෙ සෙල්වීමය. 'පාඃ උපක්කම > උවකමු, පාඃ දොහළ > දොළ'

**උළුල්ලෙන්** - උක්කුටිකයෙන්

**එකමාලාමාලිනී** - මල්දම් බෙහෙවු, එසෙ වතු දු, එ හැම එක් මල්දමක් සෙයින් පෙනෙනුයෙන් 'එකමාලාමාලිනි' නමු, නානාමාලාවන් එකමාලාකාරයෙන් සිටැ, එයින් මැ මාලනී" (=මල්දමක් බඳු) වූ සැටියි.

**එහිභික්ඛුභාවයෙන් පැවිජි වැ** - බුදුන් 'මහණ, එ'යි අත් නගා අමතන්නා හා මැ ඉදුහයෙන් එන පැවිජ්වෙස් ලැබැ 'එහිභික්ඛු උපසම්පදා' ලත් මහණක් වැ, "එථ භික්ඛවො යන වචන හා 'හත්ථපසාරණ' එහි භික්ඛු උපසම්පදාවට සහකාරිකාරණ වේ, පුරිම භෙවෙහි සුරු උපසපුව උපාදන් කරුණු වේ. යෙත්. පැවිජ්වෙසට අයුහෙවෙති පැවිජියනට කළතා කෙසමස්සුඔරොපනාදි මේ හා සමණපිරිකර දාන වෙසෙස් කරුණු යෙත්" යනු ධම්පියාටුවා ගැටපදයි.

**ඔවිජු** - සටා = වදන් සැතින් විදැ

**කටුමතිගායෙන්** - කටු ඇති කසවැලින්, "කසාහි, මතිගායෙන්" යි 'කුණ්ඩලකෙසීතෙරින්වත්හි' ද, 'කස්සකයා'වත්හි ද, ධම්පියාටුවා ගැටපද කාරයෝ අර්ථ කියති. 'පිලොකිත මහතෙරුන්' වත්හිදි "කසාය නිවට්ඨො, කටමුතිගායෙන් අතිශයින් පහරන ලදූ"යි අර්ථ කියති. කටු යෙදූ කසවැල 'කටුමතිගා'යි කියත්. කුඹුරු සකස් කිරීමෙහි ලා මඩමතුයෙහි ගානා දඬුවක් 'මති' ශබ්දයෙන් කියන තැන් පාළියෙහි ඇත. සකුවෙහි 'මත්‍ය' කියාත් අර්ධමාගධියෙහි 'මතිකා' කියාත්, දක්නා ලැබේ. තදාකාර ගෙනැ එක්පසැ කටු යොදා කළ, ඇඟැ ගානා කසවෙසෙසක් 'කටුමතිගා'යි කියති යි සිතම්හ. 'මතිගා' යනු 'පාඃ වත්තිකා (සංඃ වර්තිකා) ශබ්දයෙන් බුන්සෙ කෙනෙක් කියති.

**කපුසුවහස්** - කල්පශතසහස්‍රයක්, කල්ප ලක්‍ෂයක් 'පාඃ කප්පසත සහස්ස > කප් සුවහස්' උකාරගාමයෙන් 'කපුසුවහස්' තුන් + රුවන් = තුණුරුවන්' ආදියෙහි සන්ධිවිධි හා සසඳන්නේ යැ.

**කඳල කැකුළු** - කන්දල මකුල = බිම්කෙහෙල් කැකුළු

**කරම්ණි** - (කරපිළි), අටුවායෙහි එන 'විහව' ශබ්දයෙහි අනුවාදයි. නිෂ්පත්ති නොපැහැදිලි යැ. "කැරුම්නි - කැරැම්ණි - කැරුම්නි - තුම්ණි" යන පාඨ ද පොත්හි ඇත. අලුත් පිළී (කරලූ) කියන නිෂ්පන්න ශබ්දයෙහි යි සිතම්හ.

**කරැ අත් ලා ගෙනැ** - ගලය අත් ලා ගෙනැ, මෙහි 'කර' නම් ග්‍රීවායි. "ගීවාය ගහෙත්වා" යනු මෙහි අටුවායි.

**කසළ පිස්සක්හු** - 'පංසුපිසාච' යනු පෙළෙහි එන වහරි, කසළ වැකුණු පිශාචයකු.

**කස්නවුන්** - 'කාකච්ඡන්තියො' යන මෙහි අනුවාදයි. "කස්නවුන් නොහොත් නැහැ හඬවන්නවුන්, නොහොත් තතනන්නවුන්" යනු 'ජාතක අටුවා ගැටපද'යි.

**කළ දහස් බිඳිමින් පලත්** - බිය වැදැ දුවත් මැ, උනුන් වෙර සැටීමෙන් අපමණ කළ බිඳී යනසෙ දැකත්. එය නො සළකා දුවන බව මෙයින් කියත්. මඟතුරෙහි කල ගත් අත්

ඇතියවුන් ඇත ද, උනුදු නො සළකා බිඳැ-ගෙනැ දුවනසෙ කීමෙන් මහත් සේ බිය පත් බව අහවයි.

**කළුවණ** - කාලකණ්ණිය

**කාඩි** - ඔදන හා ධාන්‍යාදිය ගෙනැ තනා - ගන්නා ඇඹුලෙකි. 'කළ කැඳ' යනුදු මෙයට නමෙකි.

**කාමාදි තුන් විතර්කයෙන්** - කාමවිතර්ක යැ, ව්‍යාපාදවිතර්ක යැ, විහිංසවිතර්ක යැ යන තුනින්. නිෂ්කාමතායෙහි ලා කාම විතර්කය සතුරු යැ. මෛත්‍රියෙහි ලා ව්‍යාපාද විතර්කය සතුරු යැ. කරුණායෙහි ලා විහිංසා විතර්කය සතුරුයි.

**කැකුළු කොටැ** - කර්කශ කොටැ = දැඩි කොටැ 'පාඃ කක්ඛළ කැකුළු' "කැකුළු තෙබින්" යන තැනැ වෙසතුරුදාසන්නයෙහි ලා (පිඃ 120) තීව්‍ර-අර්ථයෙහි දු, එහි මැ (පිඃ 42) "කැකුළු කළහ"යි සොරාර්ථයෙහි දු මෙ ශබ්දය ඇත.

**කියග-කිම?** ඇවත. 'ආවුසො' යනු ආමන්ත්‍රණයෙහි නිපාතයෙකි. එහි අනුවාද කරන ගුරුළුගොමීහු එය පිණිසැ 'කියග යනු යොදති. එයින් සියබසෙහි ලා මෙ ද නිපාත විසින් සළකන්නට වටනේ යැ. පාළියෙහි ප්‍රශ්නාර්ථයෙහි වැටෙන 'කිං' නිපාත හා ආමන්ත්‍රණාර්ථයෙහි වැටෙන 'අඞ්ග' නිපාත හා එක් වැ සිටුනා "**කිං+අඞ්ග=කිමඞ්ග**" යි රූපයෙක් ඇත. එය ඇසිරි කොටැ 'කිං+අග=කියග'යි, සියබසට ආසෙ සළකම්හ. එසේ වත් මැ, ප්‍රශ්නාර්ථ ගර්භ කොටැ ඇති ආමන්ත්‍රණ නිපාතයෙකි. 'කියග' යනු සියබසෙහි වැටුණු තැන් විමසත් මැ, අප කියු නිරුක්තිය එහි සටීත වනසෙ පෙනේ.

**කිලැ**- 'කුල්' ධාතුයෙන් නිපන් පෙරකිරිය පදයි. 'නාද කොටැ' යන අර්ථයි.

**කිසිදෙසක්** - කිසි දෙශයක් = ප්‍රදෙශ මාත්‍රයක් = යම්කිසි දැයක්

**කිළිල් සෙයින්** - වංශාඞ්කුර=හු කිළිල් සෙයින්. 'පාඃ කළීර > (සංඃ කරීර) කිළිල්' යනු වේ. හුණ අකුරුයි.

**කුද්කුරු කිරාතාදීහ**-කුබ්ජ-බර්ව-කිරාත ආදීහු යැ. කුදු ඇත්තෝ යැ. මිටි ඇත්තෝ යැ. ව්‍යාධයෝ යැ යන මෙ ආදීහුයි.

**කුබුක් බෙලසුල්** - කුබුක් රුකින් වැහෙන දිහි මෙන් සිනිඳු නිර්යාස. "**නාගබලා පිච්ඡිලාදීනි**" යනු මෙ තැනැ අටුවා යි. 'නාගබලා' නම්, කැලියයි. කුබුක්වෙසෙසෙකියි සිතම්හ.

**කූටව්‍යවහාරයෙහි**-කූට ලෙස කරන වෙළෙඳාමෙහි. බඩු පෙරැළීමෙහි කරන රැවටිලි

**කෙණෙසි අහර** - පිඬු සිඟා වඩනා විට, ඒ ඒ තැනැ හැඳි පමණෙකින් ලැබෙන අහර, 'පාඃ කටච්ඡු > කෙණෙසි'

**කෙලෙස් පඳුරු විදහන තැන** - කෙලෙස් නැමැති මැදිරිය වනසන තැන **“කිලෙසපඤ්ජරවිද්ධංසනට්ඨානං”** යනු මෙහි අටුවා යි. ‘විදහනැස්මෙහි’ දයින් ‘විදහන’ යන ක්‍රියා ශබ්දය සිද්ධ යි.

**කෙලෙස් වාසනා ලවද්** - අනුමාත්‍ර වූ ක්ලෙශවාසනා ද පවා. අපායොත්පත්ති හෙතුභූත අකුශලය රහත්හු දු නැති කරති. කායවාක්ප්‍රයොගහෙතුභූත අකුශලය නැති නො කෙරෙති. අභිධර්මයෙහි “අප්පහාතබ්බ” ගණයට මෙය ඇතුළත් වේ. බුදුන් තුළ ඒ ද නැත. ‘වාසනා’ යනු මෙහි එයට නමෙකි. කෙලෙස් නිසා කා වැදී ගිය පුරුද්ද ‘වාසනා’ වශයෙන් කියැවිණ. කෙලෙසුන් විසින් පිහිටුවන ලද ශක්ති විශෙෂයක් සෙ, ‘විශුද්ධිමාර්ග සන්න’ යෙහි එයි.

**කොතුරුපක්** - සටාකාර පත් පේකඩ

**කොටගෙ** - කොෂ්ඨාගාර = ධාන්‍යාදිය සඟවා තබන කොටු කුසුල්. “දින් මැඩුන් කොටගෙ පුරා” යන වැකියෙහි දී සස්‍යමඤ්ජරීන් හා මැඩැ ගත් වී හා කොටුගුලෙහි පුරා, යන අර්ථයි.

**කොණ්ඩඤ්ඤ නම් බමුණු** - හැම පොතෙකැ එනුයෙ ‘සුදත් නම් බමුණු’ යනුයි. අටුවා බලා අපි “කොණ්ඩඤ්ඤ” යනු යෙදුම්හ. **“රාමො ධජො ලක්ඛණො චා’පි මන්තී, කොණ්ඩඤ්ඤො ච භොජො සුයාමො සුදත්තො”** යන ගාථාර්ධයෙහි එනසෙ බලත් මැ, අගැ සිටුනෙ ‘සුදත්ත’ බමුණු යැ. ඔවුන් ඇම දෙනා හට ළදරු වූයේ ‘සුදත්ත’ යැ යි, කී තැනෙක් ඇද්ද! යනු සොයන්නෙ යැ.

**කොහොන් පිළිවෙත්හි** - තමා තුළ නැති ගුණ පහළ කොටැ ලොව විස්මයට පත් කරන ප්‍රතිපත්තියෙහි ‘පච්චයපටිසෙධන’ යැ, ‘සාමන්තජප්පන’ යැ, ‘ඉරියාපථසණ්ඨාපන’ යැ කියා එ කුහක ප්‍රතිපත්තීහු තුන් දෙනෙකි. මතුයෙහි බොහො දැය අපේක්‍ෂා කොටැ දුන් දැය ප්‍රතික්ෂේප කරනු ‘පච්චයපටිසෙධන’ නම්. වුවමනා දැය ඉඳුරා නොකියා ළං වැ සිටැ ප්‍රකාරාන්තරයෙකින් කීම ‘සාමන්තපජ්ජන’ නම්. රහතුන් සෙයින් ඉරියවු පිහිටුවා-ගෙනැ විස්මය එළැවීම ‘ඉරියාපථ සණ්ඨාපන’ නම්. මේ යැ, කොහොන් පිළිවෙත් නම්. ‘පාඃ කොහඤ්ඤ > කොහොන්’

**කොළන මුගුරෙන්** - පහරන-තළන මුගුරෙන්, ‘කොළන’ යනු ‘කොළ-තැළීමෙහි’ දයින් නිපන් ක්‍රියා ශබ්දයෙකි.

**ගඳ සැළියක්** - ගන්ධචඞ්ගොටයක්=සුවඳ කරඬුවක්. හැම පොතෙකැ ‘ගඳසැළියක්’ යනු ඇතියෙන් පදය යෙදුව ද, ‘ගඳ පැළියක්’ යනු නිසිසෙ සිතම්හ. “පසාධනපෙළිකං, පහයින් පෙළියක්” යනු ‘ධම්පියාටුවාගැටපද’ යෙහි ඇත. ‘පෙළි’ නම් කරණ්ඩයි. ‘පාඃ පෙළික > පෙළි=පැළි’

**ගල් පාතට** - පර්වත පාදයට=වන ගහන ඇති කඳු දොරට

**ගැළියායෙන්**-බද කෑමෙන්=උරිනුරැ පැහැරැ මුළු දී යෑමෙන්.

ගුල්ඵයෙහි-පාද ග්‍රන්ථයෙහි=ගොප් ඇටෙහි.

ගුළන කලැ-ඔප් නගන්නට මාර්ජනය=මැදීම කරන කලැ

ටිකෙකඳු-පොදකුදු, 'ටික්' යන් බින්දුයෙහි වැටෙන ශබ්දයෙකි. 'තලාටික්' ආදි හිලාලිපි බස ද සළකන්නෙ යැ.

තලයක් පමණ තැනට-තාලයක් = තල්ගසක් පමණ තැනට

තලින් හුණුවක්හු - අතුල් පහරින් වැටුණහු

තිලින්-තෙල (=මේ පෙනෙන) තැනින්

තුබුපට-ඊයම් පට=ඊයම් තෝඩු. 'පාඃ තිපුපට්ට > තුබුපට'

තෙවැසි - හැල් කරල් මිටි මිටි කොටැ ගෙනැ සුවඳ කවා තබා තුන් හවුරුද්දක් ගිය තැනැ වළඳ කරන්නට ගනුයෙන් 'තෙවැසි' නම් වෙයි. 'වර්ෂ තුනක් ඉක්මැ සිටි' යන අර්ථයි. 'මැදුම්සඟි' යෙහි 'සටීකාර' සූත්‍රයෙහි අටුවායෙහිත් 'සාරත්ථදීපනි' විනය ටීකායෙහිත්, විස්තර එයි. 'නෙවැසි' යනු පාඨාන්තර යි. 'නොඑක් සුවඳින් වාසිත=සුවඳ කැවුණු' යන අර්ථයි.

තෙවෙර ගෙනැ - තැවැරීම් කොටැ - ගෙනැ

තොට පියලි - තොටුපළ ආදී නන් තැනින් අසුලා ගත් කඩරෙදි මෙහි 'තොට' යනු උපලක්‍ෂණයි. 'සඞ්කාරචොල' යනු මෙහි පාළි යැ.

තොරුසෙකැ - තුඹරාශියෙකැ = ධාන්‍යච්ඡවිරාශියෙකැ = දහසිවියා රුසෙකැ.

තො විදුරුගල් නියෙන් කැණියටියෙහි - තො නිය පහරින් වජ්‍ර බිඳුනට කැමැතියෙහි

තොහො පැරු - බොල් පැහැරු = තළා 'පාඃ ථුස > තොහො'

දකුණු ඇළයෙන් - දක්ෂිණ පාර්ශ්වයෙන්, 'පාඃ පස්ස > වැළ = ඇළ'යි සිය බසට ආ සැටිය වෙයි.

දඬු පියුම් - මතු මතුයෙහි සත් සත් බුමු වැ දණ්ඩාකාර ගත් පියුම් = සත් බුමු මහපියුම්

දදයෙහි අග් - මෙ තැනැ "ධජානං පටාකානං රංසියො" යනු අටුවායි. එයින් ධ්වජයන්ගේ රස් කියති. ජාඃ ගැටපදයෙහි දු, "ධජ අක්" යි කීහු.

දඹුරුක් නො පියා සිටි සෙ දකැ - අහසැ හිරු යන යන සැටියෙන් රුක්හි සෙවණැලි වෙනස් වෙයි. හිරු යද්දි, මෙ දඹරුක්හි සෙවණ මණ්ඩලාකාරයෙන් සිටි වන මැ සිටියැ. 'හිරු ගියහ'යි, සෙවණ නොගොස් මුලැ දී තුබූ සෙයින් මැ තිබියැ. මේ යැ, මෙ

පෙළහර නම්. මෙ කැල සිත්තරු මෙ පෙළහර සිතියම් කරන්නාහු කුමරුන් අහස සිටුනා සෙ දක්වති. ශාසන සමය නො දැනැ කරන වරදෙක් වෙ. 'පා: ඡායා > සිය > සෙ'

**දම්ගෙඩි** - හිස් සිඳුනා දඬු කඬ, 'පා: ධම්මගණ්ඩි > දම්ගෙඩි'

**දල නැති** - අග්නිශිඛා = ගිනිදැල් නැති. 'සං: ජ්වාල > දල

**දහවළු හා පිළී** - විශේෂ වස්ත්‍ර වන අහසවස්ත්‍ර හා තෙසු පිළී, "**අහතවත්ථනිවත්ථො**" යනු මෙහි අටුවායි. 'හන් අහතවස්ත්‍ර ඇතියෙ' යනු අර්ථ යි.

**"ඊෂද්ධෞතං නවං ශ්වෙතං**
**සදශං යන්නධාරිතම්,**
**අහතං තද් විජානීයාත්**
**පාවනං සර්වකර්මසු"**

(යම් වස්ත්‍රයෙක් මඳ කොටැ ධෞත වී ද, අභිනව වී ද, ශ්වෙත වී ද, දහ ඇති වී ද, කලිනුත් නොධරන ලද ද, එ වස්ත්‍රය 'අහත' යැයි දන්නෙ යැ. සර්ව කර්මයෙහි ලා පවිත්‍ර වෙයි)

දහ නොසුන් පිළී 'දහවළු' නම් වෙයි. "දසනවසනයුගලං, දහවළුසඟළක්" යනු 'බොධිවංශගැටපද' යි 'පා: වාස > වළු'

**දහසක් යොදුනෙහි පටන් ගෙනැ** - මෙහි දු "දස දහසක් යොජනෙහි පටන් ගෙනැ" යනු මෙතෙක් පළ කළ පොත්හි එයි "**යොජන සහස්සතො පට්ඨාය**" යනු අටුවා වන හෙයින් ඒ අපපාඨ යි.

**දූහැවිලින්** - කොපයෙන්. 'දහ-කිපුම්හි' දයින් නිපන් භාවනාම යි.

**දූහැවි** - ද්විෂ්ට=ද්වෙෂ කළ.

**දැරගම්ණි රුවනක්** - ජාතිරඞ්ගමාණික්‍යරත්නයක්. ජාතීන් මැ (=උපතින් මැ) රඞ්ගය (=පැහැසටහන්) ඇති මිණිරුවන යි. බැහැරින් ලන ඔප්කම් නැති මිණිවෙසෙසෙකි.

**දිගම්බර**- "**දික් අම්බරං යස්‍ය ස දිගම්බඃ**"යි දිශා වස්ත්‍ර කොටැ ඇතියේ 'දිගම්බර' නමි. ඒ ඒ දිශා උහු ගේ වස්ත්‍ර වත් මුත්, අන් වස්ත්‍රයෙක් නැත. එයින් හේ 'දිගම්බර' වේ. නග්න තාපස යි.

දින්-සස්‍ය-කුඹුරින් ගන්නා ධාන්‍යජාතියි. 'පා: සස්ස > දින්' පාළියෙහි එන 'නමස්ස' ධාතු 'නමද' යි ආ සැටි දු, 'පස්' යනු 'පන්' යි නකාරන්ත වන සැටි දු, සළකත් මැ, 'සස්ස' යන ශබ්දය 'දින් කියා සියබසෙහි සැටියැහෙයි. අක්ෂරයන් ගේ ස්වර්ණභාවය හෙතු යි. ධම්පියාටුවා ගැටපදයෙහි දී සස්‍ය කැපීම "දින් දන" යි කීහ.

**දිවෙල්**-ධම්පියාටුවා ගැටපදයෙහි දී 'දිවෙල්' - යනු ජීවිතවාචී ශබ්දයක් වශයෙන් යෙදූහ. "දුජ්ජීවිතං, ගරහන ලද දිවෙලින්. කුච්ඡිතං ජීවිතං-දුජ්ජීවිතං 'දුජ්ජීවිතා' යනු කිය යුතුයෙහි 'දුජ්ජීවිතං' යි උපයොග වචන කෙළේ" යනු 'කොසොල් රජහු වත්' හි දක්නා ලැබේ. 'දිවෙල්' නම්, ජීවිත කාලයි. ජීවිත කාලය රඳවන්නට වුවමනා බත් වැටුපෙහි අභෙදොපචාරයෙන් මෙ ශබ්දය යෙදෙනසෙ පෙනේ. 'දිවිකල් > දිවි+අල්=දිවෙල්'

**දුදුළුතන්හි**-දුර්ගස්ථානයෙහි, ධම්පියාටුවා ගැටපදයෙහි 'බාවරෙක හත්ථි' කථායෙහිලා "කිලෙසදුග්ගෙ, කෙලෙස් දුදුළෙහි" යි 'දුර්ගය' දුදුළුසෙ කීහ.

**දුනුමුඬාව**-දුනුකොන

**දුමොළොසු**-දුම්කබල්, 'පාඃ ධූමකටච්ඡු > දුමොළොසු'

**දුලදු සැඩසළා කිඹුල් මුවර සියො**-දුර්ලබ්ධි නමැති චණ්ඩස්‍රොතස් හා කුම්භීලයන් හා මකරයන් හා ඇති

**දුහුල් සුඹුළුයෙන්** - දුකූල චුම්බටයෙන්. සිහින් පිළී දරණුයෙන්

**දෙ එක්බිති ගෙහි** - දෙ පසැ අනන්තර (=එකාබද්ධ) ගෘහයෙහි 'උභ' ශබ්දය ද, 'ඥෙ යි හැම තැනැ අනුවාද කළසෙ පෙනේ. "උභොසු පස්සෙසු, දෙ ගඟවැළහි" යි ධඃ ගැටපද පාඨාදියෙහිත් එ සැටි මැ එයි. 'උභතො අනන්තරගෙහවාසිකා' යනු මෙහි අටුවායි.

**දෙණැ** - නිම්නයෙහි=දෙණි කඩෙහි

**දෙතිස් දෙව් කුමරියො**-ශක්‍රයා 'මඝමාණවක' වැ සිටිදා පිරිවර සේ වැටුණු දෙතිස් දෙන ද ශක්‍රයා හා මැ සහභාවයට ගියහ. ඔවුන් ගේ දෙතිස් භාර්යාවෝ යැ.

**දෙවීහි** - දෙවි+හු=දෙවීහි

**දෙස්නෙන්**-දෙශනායෙන්. 'දෙසුන්+එන්=දෙස්නෙන්' ප්‍රාණාක්ෂරයෙන් පටන් ගන්නා ප්‍රත්‍යය හා යොගයෙහි දි, කිසි ශබ්ද කෙකේ හලන්ත වූවාහු නම්, උපධාලොපය (=අගැ හලින් පෙරට සිටුනා ස්වරයාගේ ලොපය) ලබත්. 'රකුස්+අන්=රකුසන්' යනාදිය ද මෙ නයින් සළකන්නේ යැ.

**දෙරොට්යෙහි**-දොරකොටයෙහි, 'පාඃ ද්වාරකොට්ඨ > දොරකොට් = දොරොට්'

**දෙර බියෙළි** - දොරපලු, 'පාඃ බිදළ > බියෙළි'

**දෙළොස් ආකාරයෙකින් බමුණු ගෙ ගුණ කියා** - යශස් ඇතිසෙ (1) අභිජාතසෙ (2) මහත් ධන ඇතිසෙ (3) ත්‍රිවෙදයෙහි පරතෙර දුටුසෙ (4) අභිරූපසෙ (5) සිල්වත්සෙ (6) පියතෙපුල් ඇතිසෙ (7) බොහො දෙන හට ඇදුරුසෙ (8) මහලුසෙ (9) බිම්සර රජු විසින් පිදුසෙ (10) පොක්ඛරසාති බමුණු විසින් පිදුසෙ (11) ඛාණුමත ගමට හිම්සෙ (12)

**දෙළොස් ඇඟින් යුත් පිළිසසුමුපා** - අවිද්‍යා ආදි ද්වාදශාඞ්ගයෙන් යුත් 'ප්‍රතීත්‍යසමුත්පාද ධර්මය. අවිද්‍යා ආදි ප්‍රත්‍යය නිසා සංස්කාරාදීන් පහළ වනසෙ කියන ප්‍රත්‍යයාකාරය

**දෙළොස් නුහුවක්** - "එක් ලක්‍ෂ විසිදහසක් පමණ. නහුතයෙක් නම් දසදහසෙකි." යනු **ජාතක අටුවා ගැටපද** යි. 'පාඃ ද්වාදසනහුත > දොළොස් නුහු'

**නයි නයින් කරා යවූහ** - මෙහි 'යවූහ' යන්නෙහි කර්මය බැහැරින් ලා ගත මනා වෙයි. කර්ම ස්වරූපයෙන් සිටුනෙ, 'දූතවර්ගයි' යි. පාළියෙහි කර්මය ස්වරූපයෙන් නොකියන තැන් ඇත. මෙහි දී එ මග ඇසිරි කළහ.

**නව යොදුන්** - මෙතෙක් පළ කළ පොත්හි මේ අසම්පූර්ණ තැනෙකි. 'නව යොත්න කිනම් දිගෙකිනැ' යනු නොකියන හෙයිනැ. අපි "උසායෙහි නව යොදුන්" යනු ලියුම්හ. "**උච්චං නවයොජනුබ්බෙධා.**" යනු අටුවායි.

**නස** - පහ වැ යැ. 'පාඃ නස්ස > නස'

**නළුවො** - 'නළු' සද සියබසෙහි බෙහෙවින් නාටකස්ත්‍රිය කෙරෙහි වැටෙයි. මෙතැනැ 'නළුවො' නම්, සතලිස් දහසක් නළුවරහු යැ. අන්තඃපුරයි.

**නාරජවස** - නාගරාජයන් ගේ වසවැටිය. 'වස්' ශබ්දය මෙසේ කියයි. වනවළායෙහි 'මෙදවට්ටි' යනු එයි.

**නැව් හිසැ ලා ඇක්මැ** - නෞකාමස්තකයෙහි ආක්‍රමණ කොටැ. "නැව්හි සැළ - නැව්හි සල - නැව්හි සළා" යන නානාපාඨ පොත්හි ඇත. අටුවායෙහි දු "**නාවං පණෙ අක්කමිත්වා-නාවා එලෙ අක්කමිත්වා**" යි නානා පාඨ ඇත. අටුවායෙහි 'අක්කමිත්වා' යන පෙරකිරියට 'නාවං' යනු කර්ම වන හෙයින් අනුවාදයෙහිත් 'නැව්' යනු **කර්ම වුව** මැනැවි. එවිටැ, **ඉතිරි, අකුරු එක් රැස් කොටැ 'හිසැ ලා'** යි අපි යොද-ලුම්හ. අටුවායෙහි **'පණ' යනු අර්ථයක්** ඇතිසෙ නො පෙනේ. 'පුණු' මහතෙරුන් අහසැ සිටැ බුණුසෙ ඇඟෙනුයෙන් නැව් මුදුනෙහි යම් මැ අවයවයක් පයින් පහළසෙ කිය හැකියි. මෙහි ලකාරය (=රුවල) යෙදේ නම්. මෙනොවට සටිත වෙයි.

**නැවියන්** - නහාපිතයන් = කපුවන්, දැළිරවුළු බානවුන් 'පාඃ නහාපිත > නැහැවි > නැවි'

**නිපන්නමො**-සමෘද්ධිය ඇතියමො. පාළියෙහි එන 'නිප්ඵන්න' ශබ්දයෙන් බිඳ-ගත් පදසෙ ගත ද වරද නැති. සියබසෙහි ලා ගත හෙන 'නිපද' දයින් ද්‍රව්‍යය කියැ හෙන සේ 'නිපනු' සද සිද්ධ කොටැ ගත ද වරද නැති.

**නිහුගෙඩියෙක්** - අභිගුණ්ඨික. 'නභිගෙඩි' යනු ස්වර විපර්යාසයෙන් 'නිහුගෙඩි' යනු වෙයි.

**නියම් ගම්** - නදීන් ඇසිරි කොටැ සිටි, තොට ඇති, මහ ගම්. 'සං: නදීග්‍රාම > නිගම' යි පෙරැළිණ. එයින් සියබසට පැමිණි 'නියම්' ශබ්දයෙහි ග්‍රාමාර්ථය නොපැනෙනුයෙන් නැවත ද, 'ගම්' සද යොදා 'නියම්ගම්' යි කියනු ලැබේ. මෙකලැ නිරුක්ති හඳාරන පණ්ඩිතයන් කියන සැටිය මෙහි පැවැසිණ. 'නියම්ගම්' යනු බෙහෙවින් වණික් පථයෙහි රූඪ හෙයින් තෙල මතය පිළිගත මනාසෙ පෙනේ. පැරැණි ඇදුරුහු 'නිගම' ශබ්දයෙහි නිරුක්ති අන් සැටියෙකින් කීහ. ඔවුන් එසේ කීව ද 'නිගම' ශබ්දයෙහි ප්‍රාකෘත ලක්‍ෂණ ඇතිසෙ පෙනේ.

**නීයෙන් සීමන්ත දක්වා** - 'සීමන්ත' නම්, කෙශරචානයෙකි, හිසකේ මැද මාර්ගාකාර සිටුනා සෙ දෙබෙ‍ රා සන්නිවෙශ කිරීමයි. පණා නො ගහා නියෙන් එය කළ අයුරු මෙහි පැවැසිණ.

**නිරීහ යැ** - ඊහා = ක්‍රියා ශක්ති නැතියෙ යැ.

**නිර්ධූනන** - යටිකුරු කොටැ ගසා-පීම.

**නිර්ව්‍යාපාර යැ** - ව්‍යාපාර = ක්‍රියාශක්ති නැතියෙ යැ.

**නිල්පියල්ලක්** - නීලවර්ණ පිලොකිතයක් = නිල්වන් කඩරෙද්දක්

**නිෂ්පොටන** - පුන පුනා ගසා-පීම.

**නිසි**-යොග්‍ය = 'පා: අනුච්ඡවික > නුසි > නිසි'

**නෙසෙ** - අන් සැටියෙකින්. අටුවායෙහි එන දුක්කරීතෙ යන පදයෙහි අර්ථ ගළපා කියන්නට ගුරුළුගොමීහු මේ පදය හෙළුහ. පාළියෙහි එන අඤ්ඤථා යන නිපාතය නෙසෙ යි සියබසෙහි සිටිය හෙයි. "නෙසෙ කී දැයක් ඇත" යන වැකියෙහි ලා 'අන්‍යතාර්ථයෙහි නිපාත යැ' යි කිව, වරද නැත ද, ඒ අර්ථය නොකියන තන්හි දූ 'නෙසෙ' යන නිපාතය යෙදුසෙ 'සසදාවත්' ආදියෙන් පෙනේ.

**නෛර්යාණික** - දුකින් නික්මැ යන්නට හිත වූ

**නො වහස** - නො හඬව, 'වහන-වලප්හි' දයින් නිපන් විධික්‍රියා යි "මා පරිදෙවි" යනු මෙතැනැ අටුවායි.

**නොසොස්** - ශොක නො කරව.

**පක්ෂීහි**-පක්ෂි+හු=පක්ෂීහි

**පඤ්චමහා විලොකනා** - කාල යැ, ද්වීප යැ, දෙශ යැ, කුල යැ, මාතෘ යැ යන පස බුදු වන්නට මිනිස් ලොව එන මහාපුරුෂයා විසින් කැලැ මැ බැලියැ යුතු වන බැවින් "පඤ්චමහාවිලොකනා" නම් වෙයි. එහි 'කුල' ශබ්දයෙන් පියාණන් කියත්. 'මාතෘ' ශබ්දයෙන් මෑණියන් ගෙ ආයු කාලය කියත්.

**පඤ්චායුධ** - ධනු, කණය, මුගුරු, බාහු යනු එක් මතයෙකැ. දුනු, මුගුරු, අඩයටි, පත්කොහාල්, පරාවළලු යනු එක මතයෙකැ. මේ පඤ්චායුධ යි.

**පත්වටි** - පතුරුවැටි.

**පණුරුස් පොහො දවස්** - මැදි පොහොදා

**පමුණු** - ප්‍රවෙණි

**පරිකර්ෂණ** - ඔබට ඇදැලීමයි.

**පරිබ්‍රාජක** - "පරිත්‍යජ්‍ය ස්වකර්මාණි ව්‍රජතී'ති = පරිව්‍රාජකඃ" හැම ගිහිකම් හැරැ-පියා යේ නු යි, 'පරිව්‍රජාක' නම්. ශාසනමයෙන් බැහැරැ සිටුනා පැවිදි කෙනෙකි.

**පරිකථා** - ඉඳුරු නොකියා ඇඟෙන සේ අන් ලෙසෙකින් කරන කථා. 'පාඃ පරියායකථා > පරිකථා'

**පර්යායෙන් පුළුවුස්නෙ - ඉඳුරා නො පිළිවිසැ අන් ලෙසෙකින් ඇඟෙන සේ පුළුවුස්නේ.**

**පලක් අවුළුවා** - පර්යඞ්කය බැඳැ - ගෙනැ. වෙදයෙහි 'පර්යඞ්ක' ශබ්දයෙන් 'යෙ ගෙ පට්ට' ය ද කියත්. ශාසන සමයෙහි ඌරුබද්ධාසනය කියත්. අසරමිණිය ගසා හැඳැ ගැන්නමෙහි ලා දෙපා එකිනෙක අවුළුවන්නෙ යැ.

**පසන්**-ප්‍රත්‍යන්ත = පිටිසර. "පාඃ පච්චන්ත > පසන්' 'පසල්' යන රූපාන්තරය නකාර - ලකාරයන් ගේ උත්පත්තිස්ථානා සම වන හෙයින් එන පෙරැළියෙකි. සියබසෙහි ලා නකාර - ලකාර මාරු වනසෙ "අසන්=අසල්, එල්සාල්=එන්සලා, මුල්සික=මුන්සික" ආදී නිදර්ශනයෙන් පෙනේ.

**පස් අභිඥා** - ඉද්ධිවිධ, දිබ්බසොත, පරචිත්තවිජානන, පුබ්බෙනිවාසානුස්සති, දිබ්බචක්ඛු යන පස යි.

**පස් පියුම්** - නෙළුම්, උපුල්, හෙළ උපුල්, මහනෙල්, හෝලු

**පස් පියුමෙන් සත් රුවන් මුවා පොකුණෙහි** - පස් පියුමෙන් වසා සිටුනා සර්වරත්නමය වූ පුෂ්පකරණියෙහි. 'සත්' යනු 'සත්' යි කිසි පොතෙකැ වරදවා ලියූහ. "පස් පියුමෙන් සුසන් සර්වරත්නමය වූ පුෂ්කරිණී" යනු ධර්ම ප්‍රදීපිකායැ. "පස් පියුමෙන් සැදි සත්රුවන් මුවා පොකුණෙහි" යනු කිසි පොතෙකැ එයි.

**පස් මණදෙළක්** - 'රාජාභිෂෙක ලබම් නම්' මැනැවැ, 1. 'සිය නුවරට බුදුහු වඩනාහු නම්' මැනැවැ, 2. 'තමාට දහම් දෙසත් නම්' මැනැවැ, 3. 'බුදුගේ උපාසක වෙම් නම්' මැනැවැ. 4. 'ධර්මය අවබොධ කෙරෙම් නම්' මැනැවැ. 5. යන පස් මනදොළ යි.

**පස් මහ සිහින** - "මහපොළෝ ශ්‍රී යහන් වී යැ. හිමවත කන්වයින් වී යැ. වමත පූර්ව සාගරයෙහි පිහිටියේ යැ. දකුණත පශ්චිම සාගරයෙහි පිහිටියේ යැ. ශ්‍රීපාදද්වය දකුණු සාගරයෙහි පිහිටියේ යැ. මේ පළ වන ස්වපනයි.

'කිරියා' නම් තෘණ ජාතියෙක් නාභියෙන් නැගී ආකාශයෙහි ගැසී සිටියේ යි. මේ දෙවන ස්වපනයි.

ජාතියෙන් සුදු වූ කළු වූ හිස් ඇති පණු ජාති කෙනෙක් පත්ලෙහි පටන් ගෙන දණ දක්වා නැංගාහ. මේ තුන් වන ස්වප්නයි.

පක්ෂි සතර දෙනෙක් හෝ නන් නන් වර්ණ ඇත්තාහු සතර දෙසෙන් අවුත් පාමුල්හි හෙව සර්වාඞ්ගයෙන් සුදු බවට පැමිණියහ. මේ සතර වන ස්වප්නයි.

බෝධිසත්ත්ව අවස්ථායෙහි මැ සිටියාහු අසුචි පර්වතයක් මතුයෙහි සක්මන් කළහ. මේ පස් වන ස්වපන් යි. මේ පඤ්චමහාස්වප්න නම් වේ. යනු 'ජා' ගැට පද යි.

**පස්වටති** - පරිහරණ කෙරෙති. ධම්පියාටුවාගැටපදයෙහි 'සඤ්ජය පිරිවැජියාවත්' හි "පරිහරියමානො, පස් වටන ලබනුයෙ" යි ද, එහි මැ 'දෙව්දත්තෙරුන්වත්' හි "පරිහරිස්සාමි, පස්වටනෙමි" යි දැයි හරිහරණාර්ථයෙහි 'පස්වට' ධාතු යෙදූහ. 'පස්වටහු' නම්, යම් මැ කෙනකුන් පිළිබඳ කිස කිරීමයි.

**පස්වනක් බමර ගණන් හා** - "කුඹුලු, මහමී, දඬුඑල්බැ, බමර, කණවෙය යන පඤ්චප්‍රකාර මීමැසියො" යනු 'ජාතක ගැටපද්යෙහි කීහු.

**පස් වැදෑරුම් තාදී ගුණයෙහි** - ඉෂ්ට අනිෂ්ට දෙක්හි, ලාභ අලාභ දෙක්හි, සුඛ දුඃඛ දෙක්හි, යශස් අයශෂ් දෙක්හි, නින්දා ප්‍රශංසා දෙක්හි පවත්නා තාදි ගුණ පසයි. 'තාදී' ශබ්දය, 'යාදි' ශබ්දය අපේක්ෂා කෙරේ. ඉෂ්ටයෙහි යාදි (=යම්බඳු) නම්, අනිෂ්ටයෙහි දු තාදී (=එබඳු) යැ. එයින් 'තාදී ගුණ' යැයි කියනු ලැබේ.

**පහණ සලවට** - හිඳුනට නිසි කොටැ ගලින් කළ ඵලකාකාර ගත් අස්න 'සලවට' නමි. එය ගස් මුලෙකැ වේවයි, වැලිමඩෙකැ වේවයි, යම් මැ තැනෙකැ තැබිය හැකි යැ, පාෂාණයෙකැ වුව, 'පහණසලවට'යි කියනු ලැබේ. 'පහණ-සල' යනු එකාර්ථ නු යි, පාෂාණසඞ්ඛ්‍යාත ශිලාප්ට යැයි ගත ද, මැනැවි. පෙළෙහි දු 'වාලිකාපුලින' ආදි විසින් මෙබඳු ශබ්ද ප්‍රයොග ඇත. 'පාඃ පාසාණසිලාපට්ට > පහණලවට'

**පහයින්** - මල්ගඳ විලෙවුන් ඈ. ධම්පියාටුවාගැටපදයෙහි 'විඩූඩයහා වත්' හි "පසාධනක්පපකො, පහයින් කපු"යි 'පසාධන' ශබ්දය 'පහයින්' කියා සියබසෙහි ලා ගත්හ. 'පාඃ පසාධන > පහයින්'

**පහාදෙර** - ප්‍රාසාදද්වරය. 'මහදොර' යනු කිසි පොතෙකැ එයි. "මන්දිරයෙහි දොරකඩ" යි එහි ගැටපද කරනුවෝ ද ඇත.

**පාථෙය** - මාර්ගොපකරණ "පථී හිතං පාථෙයම්" යනු තද්ධිත නිරුක්ති හෙයින් මාර්ගයෙහි ලා භොජනපනාදිය පිණිසැ හිත නුයි 'පාථෙය' නමි.

**පාවිටැ** - පාදතල මතුයෙහි, 'පාඃ පාදපිට්ඨී > පාපිට > පාවිට'

**පාදිදෙරතුරට** - නුවරින් නැගෙනහිර දොර වෙතට. මෙහි 'අතුර' යනු මයර්යාද කියන්නට යෙදිණ. 'පාඃ පාචීනද්වාර > පැදිදොර'

**පැළ පැදුන් දික්** - පූර්ව පශ්චිම දිශා බලා දික් වැ සිටි. "පුරත්ථිම පච්ඡිමතො ආයතෙ" යනු මෙහි අටුවා යි.

**පිරිසින්** - පරිච්ඡින්න=වටා විහිදි සයුරින් වෙන් වැ සිටී.

**පිරිපොකුණු**-දිගුවිල් හා පුෂ්කරිණී. 'පාඃ පරිඛා > පිරි'

**පිරිවෙනට** - පරිවෙණයට. 'පරිවෙණ' යනු හුදු පෙළ වහරෙකි. සකුවෙහි 'පරිවෙණ' ශබ්දයෙක් නැත. පාළියෙහි ලා යොගීන් කාය විවෙකයෙන් එකලා වැ වසන තැන 'පරිවෙණ' යි කියති. නිරුක්ති කියන ඇදුරුහු "වෙණියතො=පෙක්ඛිතබ්බතො පරිවෙණං" යනු කියමින් දර්ශනීභාවයත්, ප්‍රාකාරයෙන් පරික්ෂෙප ඇති බවත්, ගෙනැ 'පරිවෙණ' ශබ්දයෙහි පද සිද්ධි කියති. ඒ නොමැනවි. සකුවෙහි 'වයුන' ශබ්දයෙක් ඇත. පිවිතුරු කම් ඇති, වෙන් වැ සිටුනා 'දෙවොල' එයින් කියත්. දෙවොල ද ධ්‍යාන ස්ථානයෙකි. වෙන් කොටැ ගත් දෙවොලක් වැනි තැන 'පරිවයුණ' නම් වෙයි. එහි පාළි රූපය 'පරිවෙණ' නම් වෙයි. උගන්වන තැන කියන 'පිරුවන්' ශබ්දය අනෙකෙකි. පිරුවහන තැන 'පිරුවන' නම් වෙයි. 'අඳන' ආදි වචන සෙයින් එ ද ශාසනික ව්‍යවහාරයෙකි.

**පිරිවෙස්** - පැවිද්ද පිණිසැ අවසර පතා භික්‍ෂූන් වෙතැ හික්මීමෙන් විසීම යි. 'පාඃ පරිවාස > පිරිවෙස්'

**පිරිහුන් සිරිරු ඇති වැ** - පරිපූර්ණ ශරීර ඇති වැ. "මාගම්ලකුණෙන් පිරිහන් මද්‍රිය" යනු 'වෙසතුරුදා සන්න'යි. එහි දු 'පිරිහුන්' යනු තෙල අර්ථ දෙයි. 'පාඃ පරිපුණ්ණ > පිරිහුන්'

**පිළිගාවන්** - ප්‍රතිග්‍රාහකයන්, 'පාඃ පටිග්ගාහක > පිළිගා'

**පිළිපෙවී** - දක්වා දින, 'රජය ගන්නෙ මැනැවැ'යි පාවාදින. පාළියෙහි 'පටිච්ඡාපෙසි' යන ක්‍රියායෙක් ඇත. යමක ගැනැ කැමැති කරවාලීම එයින් කියයි. ඒ පාළි රූපය ඇසිරු කොටැ සියබසෙහි 'පිළිපොය' ධාතු සිද්ධසෙ සළකන්නේ යැ. එයින් 'පිළිපෙයි > පිළිපෙවී' යි සිද්ධයි. ධම්පියාටුවාගැටපදයෙහි 'දෙව්දත්තෙරුන්' වත්හි "නීයාාදෙථ, පිළිපය" යි එයි.

'**පිළිසලනෙන්** - පටිසල්ලානයෙන් = එකී භාවයෙන්.

**පිළිසිඹියා** - පටිසම්භිදා. අර්ථ යැ, ධර්ම යැ, නිරුක්ති යැ, ප්‍රතිභාන යැ යන මේ සතර නැණයි.

**පුටු**-පොෂණය කළ. 'පුස්' දයින් නිපන් අතීත ක්‍රියා ශබ්ද යි.

**පුන් පැණ** - පුන් පය=පුන්තලි, **කව්සිළුමිණ** කව්හි දු තලිය කියන 'පැණ' ශබ්දය දක්නා ලැබේ. "පුණ්ණපාතියො" යනු මෙහි අටුවායි.

**පුවහන ලද** - දුරු කරන ලද. 'පුවහන' යනු 'පුවහ- දුරු කිරීමෙහි' දයින් නිපන් ක්‍රියානාමයි.

**පුෂ්පධූපගන්ධපරිවාසිත**-පුෂ්පයෙන් හා ධූපයෙන් හා ගන්ධයෙන් හා සුවඳ ගැවුණේ යැ.

**පෙළා බැඳි** - පීඩනය කොටැ (=තද කොටැ) බැඳැ ගත්.

**පොකුරු වැසි** - "පොකුරු පතෙහි වට පොද එහි කිසි තැනක් තෙමයි. කිසිතැනක් නො තෙමයි. එමෙන් තෙමෙනු කැමැතියන් තෙමමින් නොතෙමෙනු කැමැතියන් නො තෙමමින් වස්නා වැසියි" යනු **විමතිවිනොදනියෙහි** කීහ. මේ පෙළහර වැස්සෙකි. පූර්වමෙඝයෙහි ලා "පුෂ්කරාවර්තකාණාම්" යන තැනැ "පුෂ්කර=ආවර්තක' යන විශෙෂවෘෂ්ටි සඳහන් කරති. 'සං: පුෂ්කවර්ෂ > පා: පොක්ඛර වස්ස > පොකුරුවැසි'

**ප්‍රතිභාන** - වැටහීම්

**ප්‍රතිමුක්ත** - "සෘද්ධිමය පාසිවුරු ශරීරයෙහි ප්‍රතිමුක්ත වීයැ" යන මෙහි 'පාසිවුරු සිරුර ගන්වන ලදි' යන අර්ථ යැ. පාළියෙහි 'ඔමුඤ්චන' නම්, මුදාලීමයි. 'පටිමුඤ්චන' නම් ගැන්වීමයි.

ධම්පියාටුවාගැටපදයෙහි "කායෙ පටිමුක්කා, සිරුරු පිළිමුතුවො" යි 'සඤ්ජය පිරිවැජියා වත්හි' දි අර්ථ කීහ. 'පටිමුක්ක' යනු 'ප්‍රතිමුක්ත' යි සකුටව පෙරළා ගෙනැ මෙහි යෙදූහ.

**ප්‍රතිහත වැ** - ද්විෂට වැ. ඔවුන් කෙරෙහි ද්වෙෂයෙන් හැපී

**බඹදෙයෙන්** - බ්‍රහ්ම වශයෙන් = ශ්‍රේෂ්ඨ වශයෙන් දිය යුතු දෙය 'බඹදෙය' නම් 'අග්‍රහාර' යනුදු මෙයට නම්. බ්‍රහ්මදෙය වශයෙන් ලත් විටැ මෙරමා ගෙ බල පැමෙක් නැති.

**බස්කම්** - බසින් කරන ක්‍රියා = වාදකථා මාර්ග.

**බැඳිණිම්**-වඤ්චි වීම්. 'බඤ ධාතු වැළැහීමෙහි වැටේ.

**බැඳූ වැද්දන්** - ව්‍යාජ කළ ව්‍යාධයන් - වඤ්චායෙන් මළ ගැසූ වැද්දන්. "බොහො දවස් මම් බුදුන් ගෙ ගුණානුභාව නො දැනැ බැඳිණිමි" යනු රාජදමනයෙහි එහි 'බැඳූ' යනු 'බඳ-වැළහීමෙහි' යන ධාතුයෙන් නිපන් ක්‍රියා ශබ්දයි.

**බිරි සිතින්** - බිය පත් සිතින්. 'පාඃ භීරු > බිරි'

**බුදු ඇසින්** - "ආසයානුසයඤාණ හා ඉන්ද්‍රියපරාවරතාඤාණ' බුද්ධ චක්ඛු' නම්" ධම්පියාටුවා ගැටපද යි. ආසය හා අනුසය හා දන්නා නුවණ 'ආසයානුසයඤාණ' නම්. ශ්‍රද්ධා ආදි ඉන්ද්‍රියයන් ගේ පරතා හා අවරතා හා දන්නා නුවණ 'ඉන්ද්‍රියපරාවරතාඤාණ' නම්.

**බුදුරූ රුක්හි** - බදරවෘක්‍ෂයෙහි=කළරුක්හි බෙඩරරුක්හි. මෙතෙක් පළ කළ පොත්හි 'බුහුරු'යි එනුයෙ අපපාඨයෙකි. 'පාඃ බදර > බුදුරු'

**බ්‍රහ්ම ප්‍රජාපති** - බ්‍රහ්මයා ගේ ප්‍රියාව. 'පජාපතී' යනු පෙළවහරෙහි ලා භාර්යාවට කෙරෙහි දු වැටෙයි.

**මඟුල් සලවට** - රජු හිඳුනා මඞ්ගල සම්මත ගල් පුවරුවයි. 'පාඃ මඞ්ගලසිලාපට්ට > මඟුල් සලවට.

**මටුලු කස්ස** - 'කස්ස' යනු මෙහි 'කසු' යනු ප්‍රකෘති යි. 'පාඃ කොසක > කසු'

**මණ්ඩල මාලයෙහි** - මණ්ඩලාකාරයෙන් කළ එකකූටයෙන් යුත් ශාලායෙහි.

**මණව්** - පෙළ - සකු දෙක්හි 'මාණව' ශබ්දයෙන් අල්පවයස්කමනුෂ්‍යයා = තරුණයා කියත්, 'මානව' ශබ්දයෙන් මනුෂ්‍යසාමාන්‍යය කියත්. 'පාඃ මාණව > මණව්'

**මඳක් සැඳින්** - මඳ වෙලායෙකින්

**මනස්සත්ත්ව** - මනස්හි බැඳී මළ සත්ත්වයන් උපදනා දෙවනිකායෙකි. නුවටුන් ගේ දර්ශනයෙහි එන දෙවලොකයෙකි.

**මම හො නිස්සෙමි** - ඇතැම් සංස්කරණයෙකැ "මම නො නිස්සෙමි" යනු එයි. "අහං වා හි ගහපති සමණස්ස ගොතමස්ස වාදං ආරොපෙය්‍යං දීඝතපස්සී වා නිගණ්ඨො ත්වං වා" යනු පෙළ යි. මේ පෙළෙහි අනුවාද කරන තැන් වන හෙයින් අපි "මම හො නිස්සෙමි" යි ලියුම්හ. පුස්කොළ පොත්හි දු "මම නො නිස්සෙමි"යි එතුදු, එ අප පාඨයි.

**මලමඬුලු** - මලය මණ්ඩල = මලය පෙදෙස් රැස, කඳුවැටියෙන් නැගී සිටුනා ප්‍රදෙශ යි.

**මල්ලරෙක්** - මාලාකාරයෙක්, 'මල්+කරු=මල්ලරු'

**මල්ලවයන්** - මාතෘ භාෂායෙහි ප්‍රසිද්ධ ‘මල්ල’ ශබ්දය සියබසෙහි ‘මල්ලව’ යි යොදනසෙ ඡේකප්‍රයොගයෙන් පෙනේ. ‘මල්ල’ නම් බාහු යුද්ධයෙහි නිපුණ යි.

**මසු සුලසින්** - මසු ගෙනැ සුලස් වැදැ-ගන්නා සේ අතුරා ලීමෙන්. “මසු හොටින් හොට ගාවා අතුට ඒ ක්‍රමයෙන් අතුළ රන් මුළුල්ල දී” යනු ‘ජා: ගැටපද’යි. ‘සුල් මැ සුලස්’ යනු වෙයි. ‘සුල්’ නම් රනෙහි කෙළ=අගයි.

**මහත් පෙරහරින් මහත් පිරිවරින්** - මෙහි ‘පෙරහර’ නම් සත්කාර යි. ‘පිරිවර’ නම්, සෞභාග්‍යයි. මෙ අර්ථය කියන හැම තැනැ ගුරුළුගොමීහු ‘පෙරහර-පිරිවර’ පද දෙක එක් තැන් කොටැ ලියති.

**මහෙශාඛ්‍ය** - ‘මහෙසක්ඛ’ යනු පාළියෙහි දු අර්ධමාගධියෙහි දු එයි. පාළියෙහි දී ‘මහත් පිරිවර ඇති’ යන අර්ථ යි. ඒ අර්ථය පිණිසැ මහයශස්ක’යි සකුයෙහි තුබුව මනාසෙ පෙනේ. ‘**අප්පරජක්ඛ මහාරජක්ඛ**’ යන පාළි පදයෙහි සංස්කෘත පද නම්: ‘**අල්පරජස්ක මහාරජස්ක**’ යනු යි. එයින් ‘මහායශස්ක’ යනු ‘මහෙසක්ක’ යි පාළි පද වුව මැනැවැ. ඒ පදය මෙහි දී ගුරුළුගොමීහු ‘මහෙශාඛ්‍ය’ යි අනුවාද කළහ. ඔවුන් ගත් අනුවාද පදයෙහි අර්ථ නම්: ‘මහෙශ=අධිපති නැමැති’ යනු යි. අටුවායෙහි වදාළ ‘මහත් පිරිවර ඇති යන අර්ථය එහි නො ලැබේ. “මහන්ත” ශබ්දයා හා ‘සඛ’ ශබ්දයා හා සමාසවිධි යෙකින් ‘මහසෙක්ඛ’ කියා ගත හොත්, ‘මහත් යහළු පිරිවර ඇති’ යන අර්ථ ලැබේ.

**මැඬුන්** - මැඩැ රැස් කළ වී.

**මිණි වහණ** - මණිපාෂාණයෙහි. ‘පා: මණිපාසාණ > මිණිවහණ’ මෙහි ‘මිණි’ නම් පලිඟු.

**මීකඩ සකුරෙන්** - මධු හා ඛණ්ඩශර්කරායෙන්=මී හා හකුරු කැටින්.

**මී පිඬු** - සකුරු, ගිතෙල්, මී යොදා කළ බදහත්. ‘පා: මධුපිණ්ඩික > මී පිඬු’

**මුවසලා** - මුඛය ධාවනය කොටැ=මුව සෝදා. කිසි පොතෙකැ මේ පාඨය නො පැනේ. “මුඛං වික්ඛාලෙත්වා” යනු මේ තැනැ අටුවායි. “මුඛං වික්ඛාලෙසි, මුව විසල්වි” යනු ‘ධ: ගැට පද පදයෙහි ද එයි. ‘සං: ක්ෂල > සල-සේදුම්හි’ දයින් නිපන් පෙර කිරිය යි.

**යකත් පහණින්** - අයස්කාන්ත පාෂාණයෙන් = කාන්දම් ගලින්.

**යන්ත්‍ර පිරී යැ** - හර නැති දියසුන් ඇවයෙන් කළ යන්ත්‍රය වෙග දනවා අහසෙහි නඟා - ලී යැ. ‘**යන්තං පූරෙසි**’ යනු අටුවා යි. ‘**පූරෙසි**’ යනුවෙන් වෙග ගන්වා ලීම පැවැසිණ.

**යහනින් මැ නඟා ගෙනැ** - යහන තිබියැ දී දෙවිය මතු නහා ගෙනැ ගියාහු නොවෙති. ඇය නඟා - ගන්නට යහන කරණ විය. දෙවිය නිදි ගත් යහනින් මැ ගෙන ගියසෙ කියු සැටියි.

**යුතු කොටැ තුබූ** - පිළියෙල කොටැ තුබූ. 'පිළියුතු' යි තුබුව මනා වූව ද, ශබ්දයෙහි ආදිභාගය හැරැ-පියා 'යුතු' යන මෙතෙක් මැ ගුරුළුගොමිහු යොදති 'පටියත්ත > යුතු' යනු වෙයි.

**යූපයට** - යාගස්තම්භයට

**යෙළ සියක්** - එක්සිය පනසක්. 'පාඃ දියඩ්ඪසත යෙළසිය' 'යෙළ' නම් එක හමාරයි.

**රඟ පොවන** - නීලාදි රඤ්ජන = සායම් වද්දන

**රග්ගල් තෙලෙහි** - මනඃශිලාතලයෙහි, "මනොසිලාතලෙ" යනු අටුවා යැ. සකුවෙහි 'රඞ්ක' යන නමක් මනඃශිලායෙහි ලා කියත්. එයින් එන 'රක්' ශබ්දය පරරූපසන්ධියෙන් 'රග්ගල' යි මෙහි සිටුනේ යැ.

**රඞ්ගක්ෂම** - රඞ්ගයට = වර්ණ ගැන්වීමට යොග්‍ය

**රජ බල** - රාජබලය. 'බල' ශබ්දය සෙනායෙහි වැටේ. 'රාජබල' යනු මෙ තැනැ අටුවා යි.

**රන් කොතුරුයෙන්** - රන් කෙණ්ඩියෙන්. "සුවණ්ණ භිඞ්කාරෙන යනු මෙ තැනැ අටුවා යි.

**රන් මාලා** - රන් මුවා තැටිවෙසෙසක්. ධම්පියා අටුවා ගැටපදයෙහි 'සාමාවතියා වත්'හි "සුවණ්ණසරක, රන්මාලාවක්" යි කීහ. මාලාවට පාළියෙහි 'සරක' යනු නම්.

**රසාතෙලෙහි** - රසාතලයෙහි - නාගලොකයෙහි. 'රසාතල' ශබ්දය සියබසට ගෙනැ විබත් ගන්වා ලූ සැටි යි.

**රැයිම්මෙහි** - රැ ඉකුත් වේලෙහි=උදය, "රැ+ඉක්මෙහි" යකාරාගම හා පරරූප හා කෙටැ පදසිද්ධි දන්නෙ යැ. ධම්පියාටුවාගැටපදයෙහි 'සුළුපතු තෙරුන්වත්' හි "පාතො, රැයික්මෙ" යි අර්ථ කී තැන් ගෙනැ පදසිද්ධි විමැසිය හෙන්නේ යැ. 'රැයිම්මැ, රැයිම්' යන රූප ද ඇත. අන්තලොපයෙන් 'රැයිම්' යනු වෙයි.

**රුක්සෙළල්නෙක්හි** - වෘක්ෂච්ඡායාව චලයාකාරයෙන් සිටුනේ යැ. චලයාකාරයෙන් සිටුනා වෘක්ෂච්ඡායායෙකැ=රුක් සෙවෙණෙකැ.

**රුවන් මරවැඩි** - රතනමය පාදුකා. "සුවණ්ණාහි පාදුකාහි, රන්මරවැඩියෙන්" යනු වෙසතුරු දා සන්න යි. 'පාදුකා' නම් පයලන වහන් වෙසෙසෙකි (= ) එයට 'මරවැඩි' යනු දෙමළුයෙන් සියබසට ආසෙ කියත්. තණ, කිතුල් පොතු, පියුම්පත්, පලස් ආදියෙනුදු 'මරවැඩි' තනා ගත හැකිසෙ 'ධම්පියාටුවා' යෙහි 'වැදැරට වැසි මහණුන් වත්' හි එයි.

**ලද දඬුවක්** - "මුහු පෙරට සකුරු තබව, මුහු පෙරට ගිතෙල් ඔව, මිහි ඔව" යි මෙසේ ලස්=ලකුණු තබන දඬුවක්. 'ලසදඬු=ලදදඬු' යනුවෙයි. සකාර-දකාරයන් දෙන්නාගේ ස්වර්ණභාවය ඇතියෙන් සකාරයා දකාර බවට පෙරළෙයි.

**ලද පස්මල්** - "ලජ පස්මා මල් නම්: ලජ, සමන්කැකුළු, හෙළිසිද්දතු, හීතණ. සුදුමල්" යනු ධම්පියාටුවා ගැටපද යි. "විළඳ සාල් හීතණ සිද්දතු සමන්කැකුළු යන මෙ ලදපස්මලින් ගවසන ලදී" යනු **වෙසතුරුද සන්න** යි.

ලහා-සලාක=මහණුන් වෙන් කොටැ ගනු පිණිසැ බෙදා-දෙන ලහපත්. 'ලහ' යනු හුණ පතුරු ආදි හිරටු කියන ශබ්දයෙකි. "හුණපතුකඩ ඈ සලාක නම්" යනු 'ධම්පියාටුවා ගැටපද යි. කිසි විටෙකැ ලහපතෙහි නම් යොදනසෙ ද පෙනේ. "ධම්පියාටුවාගැටපද' යෙහි ලහහඹු ලහායෙහි තුමා නම් හෙළා නිබඳ කොටැ පෙවූ හඹු" යන විවරණය ද මෙහිලා සළකන්නෙ යැ.

**ලොධාඑක් හෙළි වියැ** - ලොකධාතුව එකාඞ්ගණ වීයැ. "එකඞ්ගණානි අහෙසුං" යනු අටුවා යි. එක් මිදුලක් සෙයින් බාධක රහිත වැ, විවෘත වැ දුටුයෙන් එසෙ කියත්, 'එළි' යනු අඞ්ගණය කියන ශබ්දයෙකි. "අතන් අපරිසෙ ලොධාහි එක් හෙළි වියැ" යනු කිසි පොතෙකැ එයි. "අනත් අපරිසේ ලොධාහි-අනන්ත වූ අපරිච්ඡෙද (පරිච්ඡෙදයක් මෙපමණ යැයි ගණන් නැති) වූ ලොකධාතුන්හි, එක් හෙළි-එකාලොක" යනු එයට කළ ගැටපදයි. "**අනෙකානි චක්කවාළසහස්සානි එකඞ්ගණානි අහෙසුං**" මෙ තැනැ අටුවායි.

**ලෙමැ ගෙනැ** - 'ගන්' ධාතු අපේක්ෂා කරන කර්මය අදර විබතින් සිටුනා නැති. "ලොමෙසු ගහෙත්වා" යනු මෙහි පෙළයි.

**වට දෑණි** - වැටු=හෙළු දණ ඇතියෙ වටදැණි' නමි. 'වට-වැටීමෙහි' ධාතුයි.

වට විවට විසින් "**අවිජ්ජාපච්චයා සඞ්ඛාරා** යි කියා මෙසේ කම්වට විවාවට කෙලෙස්වට විසින් ද, **අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධො** යි කියා මෙසේ නිර්වාණ සඞ්ඛ්‍යාත විවට විසින් ද" යනු ජාඃ ගැටපද යි.

**වටා වුහුටු මල් ගුළාවක්** - වට කොටැ - ගෙනැ දමා හළ මල් ගුළියක්.

**වත් හිමියො** - උපාධ්‍යාය ස්වාමීහු. 'උපාධ්‍යාය' නම්, වර්ජ්‍ය අවර්ජ්‍ය දෙක්හි ලා ඔවා දෙනුයේ යැ, 'පාඃ උපජ්ඣාය > වජ > වජ් > වත්'

**වනළැවැ වෙති** - වනගුල්මයෙහි = වනළැහැබ්හි වෙති. මෙහි 'ළැව්' ශබ්දය 'ළැහැබ්' ශබ්දයෙහි විකෘතියෙකි. 'ළැහැබ්=ළැබ්=ළැව්'

**වලපහණෙකැ** - පාෂාණ ඵලකයෙකැ.

**වහනෙ** - අයොසනය = සන යකඩ = වානෙ

**වහල්** - උපකාර. 'පා: උපකාර > වහර් > වහල්'

**වනරෙයින්** - වර්ෂයෙන්=වැස්සෙන්. 'පා: වස්සාරත්ත > වහරෙ, යනු වේ. වර්ෂා ඍතුයෙහි වැටෙන 'වහරෙ' සද වැස්සෙහි දූ රූඪ යි.

**වළ කට ඇතියවුන්** - අයාගත් කට ඇතියවුන්. 'වළ' යනු සිය බසෙහි ලා 'වර' දයින් සිද්ධ ක්‍රියාශබ්ද යැයි ගත ද වටී. 'පා: විවට > වළ'

**වළදෙරින්** - විවර කළ දොරින්. 'වළ' යනු 'වර-විවර කිරීමෙහි' දයින් නිපන් ක්‍රියා ශබ්දයි. කිසි පොතෙකැ 'හළ දොරින්' යනු දූ ඇත. අපි 'වළ' යනු සුපාඨ කොටැ ගනුම්හ. "වළකට ඇතියවුන්" යි අන්තන්හි දූ ගුරුළුගොමීහු මෙ පදය යෙදූහු. 'හළ කට ඇතියවුන්' යනු නොගැළපෙන්නා සේ මැ 'හළදොරින්' යනු දූ නො ගැළපෙයි.

**වායව්‍යා දෙසෙහි** - වයඹ දෙසෙහි. 'වායව්‍ය' ශබ්දය සකුයෙහි දෙවතා තද්ධිත යි.

**වැඳම** - 'වැඳුම්' යන භාවනාමය 'වැඳම' යි ස්වරසමතායෙන් සිටි සැටි වෙයි. 'වැඩම' යනු මෙනි.

**වැලිවෙයැ** - වාලුකා වීථියෙහි = වැලි පිරුණු වීථිමාර්ගයෙහි

**වැසුණු** - වාසිත = සුවඳ කැවුණු

**වැළැතැ** - පාර්ශ්වයෙහි = සමීපයෙහි. 'පා: පස්ස > වැළ' යනු වෙයි. 'වැළ මැ වැළත්' ස්වාර්ථයෙහි 'අත්' පස යි.

**ධම්පියාටුවාගැටපද**' යෙහි 'ගඞ්ගාරොහණ වත්ථු' යෙහි දී "උභොසු පස්සෙසු, දෙ ගඟ වැළහී" යි පද බිඳ-ගත් සැටි දූ, සිඛවළඳ විනිසෙහි "දෙ මහවුළෙහි ණුහුසු නැගුට් ආදි ආකාරයෙන් කළ" යි යෙදූ සැටි දූ, සළකන්නෙ යැ. 'දකුණු ඇළයෙන්' ආදි තන්හි වකාර ලොපයෙන් 'ඇළ' යන රූපය වෙනස් සේ යෙදෙයි. මෙ හැමතැනැ පාර්ශ්වය කියන පාළි 'පස්ස' ශබ්දය සිය බසට ආ සැටිය වෙයි. පෙළෙහි එන 'සකාර' ය සියබසෙහි ලා මූර්ධජ ළකාරය එනුයේ සකාරාශ්‍රය නිසා වෙයි.

**විකත්ථනයෙහි** - වර්ණනා කිරීමෙහි=තමන් හුවා වනා - ගැන්මෙහි 'කත්ථ-ශ්ලාඝායාම්' ධාතුයි.

**විචෙය්‍යදන** - ගුණවතුන් පිරික්සා දියැයුතු දන්. "විචෙය්‍ය, දැකිණියට නිසි පිළිගාවන් ඉලියැ" යනු ධම්පියාටුවාගැටපද යි. 'විශෙෂදාන' යි පොත්හි එතු දූ එ ලෙඛකදොෂයෙකි.

**විමාර්ජනක්ෂම** - විමාර්ජනයට = ගුළන්නට යොග්‍ය.

**විවික්ත වැ** - ගණසඞ්ගනිකායෙන් වෙන් වැ = කළ කායවිවෙක ඇති වැ.

**විලික්සැ ගිය කලැ** - පෙඟී ගිය කලැ. 'විලිකුස් ධාතුයෙහි' පෙර කිරියපදයි.

**විසිතුරු ප්‍රශ්න ව්‍යාකරණ** - විචිත්‍ර වූ ප්‍රශ්න විසැඳීම්. ඇතැම් පොතෙක "ප්‍රසන්න විසිතුරු ව්‍යාකරණ" යනු එයි. 'ප්‍රශ්න' ශබ්දය 'ප්‍රසන්න' යි ලියන්නන් වරදවා ලියූ සැටි යැ.

**විරමින්** - විසිරමින්. 'විසිර-විසිරීමෙහි ධාතු යි. 'විසිර > විහිර > විර' යනු වෙයි. 'මින්' පස යි.

**වෙහෙර මහන්** - විහාර පූජා

**වෙළො ගන්ති** - විලොපනය කොටැ ගනිත්

ව්‍යාවට - පාළි වචනයෙකි. ව්‍යාවෘත = නියැලි. ධම්පියාටුවා ගැටපදයෙහි දී "දානව්‍යාවටා, දන්හි වියවුළු" යන තැනැ 'වියවුළු' යි පද බිඳැ ගත්හ.

**ශෛක්‍ෂ භූමි** - සතරමඟ සතරපල යන අටෙහි රහත්පල තබා ඉතිරි සත ශෛක්ස භූමියි.

**සණදෙවුන්කෙළි** - හණ වැහැරි ශුද්ධ කරන ක්‍රීඩාව

**සතර සභාවතින්** - දාන යැ. ප්‍රියවචන යැ. සමානාත්මතා යැ. අර්ථචර්යා යැ යන සතරින්

**සතසතු මහදන්** - සප්තරත්නමය සමුද්යෙකැ=සත් රුවනින් නිමහම් කළ කරඬුයෙකැ. රන්, රිදී, මුතු, මිණි, වෙරළු, විදුරු, පබලු යන මේ සත්රුවන් නම්.

**සත්දහතළා** - අනවතප්ත යැ, කර්ණමුණ්ඩ යැ, රථකාර යැ, ෂඩ්දන්ත යැ, කුනාලයැ, මන්දාකිනී යැ, සිංහප්‍රපාත යැ යන විල් සත යි. 'සත් දහ' යනු විල් සතෙහි රූඪ හෙයින් 'තළා' යන සාමාන්‍ය නාමය ද මෙහි යෙදිණ.

**සත් වැඩ සාහව** - සත්ත්වයනට වැඩ සිද්ධ කරව. 'සාහ-සිදු කිරීමෙහි' ධාතුයි.

**සන්කිඳුරුද** - සඳකිඳුරුදා 'සඳ' යන තන්හි දකාර ලොපය වත් මැ, වර්ගාන්ත පූරණයෙන් 'සන්' යනු වේ.

**සන් ලදින්** - සංඥා ලදින්

**සුමුඬු වුහු නම්** - සම්මුඛ වුහු නම්

**සම්පරිකර්ෂණ** - ඔබට මොබට ඇදැ - ලීමයි.

**සල් අත්තැ ගතැටී වූහ** = 'ගන්' ධාතු විසින් කියන කර්මය අදර විබත් ගන්නේ, මාතෘභාෂායෙහි බෙහෙවින් එන දහමෙකි. "සාලසාඛායං ගණ්හිතු කාමා' යනු අටුවායි. එහි සප්තමින් කියුසෙ දැකැ ගුරුළුගොමීහු දු 'සල්අත්තැ'යි අදරවිබත් කියූහ. 'අච්ඡෙදක සප්තමී' යනු මෙබඳු තැන් ගැන සකු ඇදුරහු කියති. 'ගත්' දැය වෙන් කොටැ කියන පිණිසැ යොදන සප්තමී'යැ යනු භාවය වෙයි.

**සල්හු වැ** - ලඝුක වැ=වෙළෙවි වැ. ධම්පියාටුවාගැටපදයෙහි දු "මහන්තතාය, මහත් බැවින්-මහජ් ජයක් සල්හු වැ නොනිපන බැවින් යූ සේයි" යන තැනැ 'සල්හු වැ' යනු එයි. 'වහා' යන අර්ථයි.

**සවනක් රසින්** - මෙහි බොධිසත්ත්වයන්ගේ ශරීරයෙන් නික්මුණු ෂඩ්වර්ණ රශ්මීන් සියලු රුක සත් රුවන් රුකක් සෙයින් දිලියුණුසෙ කියත්. ධර්ම විනයෙහි කළ අත් ඇති, පරවාහැර වජිරඥාණ හිමිසීහු මෙය විමසා බැලියැ යුතු තැන් සෙ දකිත්. බොධිසත්ත්වාවස්ථායෙහි ලා සවනක් රස් කියනු නොයෙදෙන හෙයිනැ. "සරීරතො ච'ස්ස නික්ඛන්තාහි පභාහි සකල රුක්ඛං සුවණ්ණ වණ්ණං" යනු අටුවායි. "ශරීරයෙන් නික්මුණු රසින් සියලු රුක් රුවන් රුකක් සෙයින් දිලියෙනසෙ දැකැ" යන සැටියෙන් කීහු නම් අටුවාකථා හා සැසැඳෙයි. මුලැ දී "අජපල් නුගරුක් මුල්හි සවනක් රසින් දිලියෙමින් වැඩැ හුන්හු" යනු දු, කියුයෙන් ගුරුළුගොමීන් බොධිසත්ත්වාවස්ථානයෙහි දු සවනක් රස් වනනසෙ පෙනේ. 'සවනක් රසින්, සුවර්ණ රශ්මීන්' කියා අර්ථගත් කලැ "සුවණ්ණ වණ්ණං" යනු අටුවා වචනයට සරීලයි.

**සව්සුඳ** - හැමසෙ සුදුවන් යැ. පුස්කොළ පොත් හි 'අසුඳ යන පදයෙක් වෙයි. මෙතෙක් 'අමාවතුර' පළ කළ හැම දෙන එ පදය නො සළකා හළහ. අටුවායෙහි "සබ්බසෙතො" යනු එයි. "සව්සුදැ" යනු ලියන්නන් අතින් 'අසුද' යි වෙනස් වැ ගියසෙ අටුවායෙන් පෙනේ.

**සහ පිරිවරින්** - සහචර පරිවරාය හා එක් වැ. 'පිරිවර සහ වූයෙ=සහ පිරිවර' යන 'අනුඅරුත්සමස්' මෙහි නොලැබේ.

**සළාවැටමෙක්හි** - ස්‍රොතස් - ආවර්තයෙකැ=වැහෙන මහවතුරු භ්‍රමණය කරන තැනෙකැ. 'සොත > සළ' යනු වෙයි. ධම්පියාඅටුවා ගැටපදයෙහි 'සූකර පොතිකා වත්' හි "ඡත්තිසංතියා සොතෙහි" යනු ගෙනැ "සතිස් සිළින්" යි අර්ථ කියා, මතුයෙහි "සතිස් සිළක් ඇතියා යි සේයි" කීහු. 'විඩූඩභයා වත්' හි දී, "මහොඝෙන, මහත් දිය සිළින්"යි අර්ථ කියමින් ඔඝය 'සිළ' යි ගත්හ. පෙළෙහි එන 'ආවට්ට' ශබ්දය ඇසිරි කොටැ 'වට' දයින් නිපන් 'වැටුම්' සද හා 'සළ සද හා සමස්ත වැ සිටුන් මැ, පද මධ්‍යයෙහි ආකාරාගමයෙන් 'සළා වැටමෙක්හි' යනු වෙයි.

**සළු පෙරලා පියන** - කොතරම් ස්වෙද වැහිණි ද, යනු කියන්නට යෙදූ වැකියෙකි. හන් සළු පෙරලා අලුත් පිළි හැඳැ ගන්නා පමණට ස්වෙද වැහිණ. පොත්හි 'පෙළා-හෙළා' යන පාඨ ඇත ද, ඒ අපපාඨ යි.

**සාරණීය කථා** - සිහි කරන්නට නිසි කථා. "සංරඤ්ජනීයකථා" යි පදයක් මහායාන පොත්හි දක්නා ලැබේ. "සංරඤ්ජනීය" ශබ්දය පාළියට 'සාරාණීය' යි ආයෙ ගෙනැ

'සිත් අලවන්නට නිසි' යන අර්ථය ද කියති. 'සංරඤ්ජනීය' යනු රූපාදියටත් විශෙෂණ වියැ හෙයි. 'සාරාණීය' යනු ශ්‍රවණ ගොචර කථා ශබ්දය මිසැ, රූපාදියට විශෙෂණ වැ සිටුනා තැනෙක් නැත. එයින් 'සංරඤ්ජනීය' ශබ්දය හා 'සාරාණීය' ශබ්දය හා සම්බන්ධයෙන් නැත. ධම්පියාටුවා ගැටපදයෙහි "සාරාණීයං කතං, කලතුරුහි සිහි කරනුවට නිසි කථා" යි අරුත් කී සැටිය මැ පමණ කරන්නෙ යැ. ඒ යැ අටුවා මග නම්.

**සාහමින්** - සිද්ධ කෙරෙමින්. 'සාහ' ධාතු හා 'මින්' පස යි.

**සැමිවැටියනට** - සමීපස්ථ = අමාත්‍ය වැ සිටුනා කැමැතියනට, 'පාඃ සමීප > සැමිව' එ,ථ ඇටි වූයේ 'සැමිවැටී'

**සිටිදූරියෙක්** - සිටි දරු මැ 'සිටිදැරි' නම්. මෙහි 'දරු' ශබ්දය ආදරාර්ථ දෙයි.

**සිතුරු පිළියක්** - චිත්‍රරූපපටයක් = චිත්‍ර රූපයෙන් හොබනා කරලුවක්. "සුසජ්ජිත චිත්තපටො විය" යනු මෙ තැනැ අටුවා යි. හැම පොත්හි පිළියක් යනු 'මිණියක්' යි එයි.

**සිත් හසර** - "ඔතාරාපෙඛො" යනු මෙහි අටුවායි. "සිඳුරු බලන්නේ" යනු ජාඃ ගැටපදයි. සිත්හි හැසුරුමු=කෙසේ කෙසේ කාමාදියෙහ සිත හැසිරේ දෝහෝ යි හැසිරෙන සැටිය.

**සිමිඳුමින්** - සම්මර්ෂණය කෙරෙමින්. 'පාඃ සම්මස > සිම්ස > සිමිඳු' යනු ධාතු රූපය එන සැටිය වෙයි. 'සිමිඳු-සිමිඳුම්හි' යන දයින් 'මින්' පස ගෙනැ 'සිමිඳුමින්' යනු සිද්ධ වෙයි. 'පාඃ නමස්ස > නමද, පාඃ අතිවසා > ඉවද, පාඃ වුසිත > පොද, පාඃ කච්ඡප > කැසිබු > කිසිබු > හිදිබු' ආදි පස සිද්ධි බලත් මැ, සකාරයා හට දකාරය වැටෙනසෙ පෙනේ. උත්පත්තිය එක් මැ තැනැ වන හෙයිනි.

**සියු මියුරු** - චතුමධුර, කිරි, ගී, මී, පැණි යන සිව් වැදැරුම් මිහිර,

**සිල් පොහො පිසමින්** - සිල් හා පෙහෙවස් හා පරිපාචනය (=මිහිකිරීම) කෙරෙමින් 'භූරිදත්ත' ජාතකාදියෙහි ලා සීලය හා උපොසථය හා දෙක පුහුණු කළසෙ මෙයින් කියත්. 'සිල්පොපියමින්' යි පොත්හි එනුයේ අපපාඨයි.

**සිවිගෙකෙක්හි** - සිවිකාගෙහයෙක (=දෝලායෙක) 'ගෙහ > ගෙක' යි සියබසෙහි සිටුනේ යැ. හකාර ககාරයන් දෙන්නා ගෙ උත්පත්ති සම හෙයින් හකාරස්ථානයෙහි කකාරයා හුණු තැනි.

**සිව්දෑ ගඳින්** - කොකුම්, යොන්පුප්, තුවරලහ, තුරුක්තෙල් යන සතරින්. ජාඃ ගැටපදයෙහි කළු අගිල්, තුවරලහ, කපුරු, සඳුන් යන සතර කියති.

**සිවුරඟවර** - චතුරඞ්වීර්ය, "සිරුරෙහි සම් - 1. ඇට, 2. නහර, 3. ඉතිරි වන සේ මාංස හා රුධිර වියැලි ගිය ද 4. බුදු වැ මිසැ නො නැඟෙමි" යන සතර ඇඟින් යුත් වීර්යය යැ.

**සිවුරඟින් යුත් මහ අඳුරු** - කාලපක්‍ෂයෙහි තුදුස්වකැ, ඝන වනෂණ්ඩ යැ, මෙඝපටල යැ, අර්ධරාත්‍රි යැ යන සතර ඇඟින් යුත් අඳුරු.

**සිවුරු ගැබින් දකුණත් නෙරා** - චීවරගර්භයෙන් දකුණු අත නගා. කිසි ඇදුරු කෙනෙක් 'සිවුරු ගැබින්' යන තැන සිවුරු ඇතුළෙන් යැයි අර්ථ කියති. "සිවුරඟවර ඉටා ගත් බුදුහු ජනසඤ්චාරශූන්‍ය බොධි මූලයෙහි වජ්‍රාසනාරූඪ වූවාහු, වාසොපගත වැ දව රැය දෙක්හි සද්දා මැ දෙවුර වසා-ගෙනැ වැඩැහුන්හ." යනු ඒ ව්‍යාඛ්‍යානයෙන් කීවාහු වෙති. වෘක්ෂමූලය ද සෙනසුනෙකි. ඒ සෙනසුනෙහි බුදුහු වාසොපගත වූහ. පලක් අවුළුවා භාවනාවට හුන්හ. රැයිදු නො නැඟට හුන් වන මැ හුන්හ. ඉදින් 'මෙහි දෙවුර වසා හුන්හ' යනු සැබැවෙක් වේ නම්, වැසිකිළි කැසිකිළියෙහිද් දෙවුර වසා හුන මනා වෙයි. 'උභයාංසවාඳ ගත් මහතෙරවරුන් මත ගෙනැ බැලුවත්, නිල්දලාහෝතෙරැ වන ලැහැබෙකැ වාසොපගත වූවාහු. එකලා වැ සිටැ කුමට දෙවුර වසද්ද බුදුහු! "එකස් කොටැ පෙරෙවැ ගෙනැ හුන්හ" යනු කියැ යුතු වෙයි. දෙවුර වසන මහතෙර වරුන් ඇරැ-පාන නීති-රීති-ව්‍යවස්ථා අනුවැ ඔවුන් විසින් මැ "වාසොපගත බුදුහු බෝධිමූලයෙහි සිවුර එකාංස කොටැ වැඩැ-හුන්හ" යනු පිළිගත මනා වෙයි. මෙහි දී, එකාංස කොටැ පෙරෙවැ-ගෙනැ සිවුරු ගැබින් අත් නැඟූසෙ විශද වැ පෙනෙන හෙයින් 'උභයාසං වාදය' තබන්නට මේ සාධක නොවෙයි.

"චීවර ගබ්භතො හත්ථම්පසාරෙත්වා-සිවුරු ගැබින් නෙරැ අත් පහරයි-දෙ ජන් වසා පොරොව්නා බැවින් සිවුරුගැබ්හි සැඟවුණු අත් එයින් නෙරැස් පහරයි යූසේයි" යනු ධම්පියාටුවා ගැටපද යි. "දෙ දණ වසා ප්‍රාවරණ වන බැවින් චීවර ගර්භයෙහි සඞ්ගොපිත අත ඒ චීවර ගර්භයෙන් නෙරා=පහරා යැයි කියූ පරිදි යැ" යනු අර්ථ යි. බුදුන්ගේ සතර ඉරියවුවෙන් කිනම් ඉරියවු ගෙනැ තෙල ව්‍යාඛ්‍යානය කැරුණෙ යැ? යනු විමසන්නේ යැ. පලක් අවුළුවා හිඳැ-ගත් කලැ යම් තැනෙකැ අත තැබුව මනා වේ ද? තැබුව මනා තැන කො තැනැ යැ? සිවුරුගබ මිසැ නැත. "පටිසාමෙත්වා' ති සඞ්ගොපෙත්වා" යනු 'විනය අටුවා' යෙහි වදාළ බැවින් 'සැඟවුණු' යන්නෙහි අර්ථ නම් 'පටිසාමිත=හකුළා තැන්පත් කොටැ තැබූ යනුයි. ගර්භාකාරයෙන් සිටුනා චීවරය ම තැ තබා-ගත් අත එයින්=ඒ තැබූ තැනින් නගා ගත්සෙ ගැටපදයෙහි කියත්. 'ඇතුළෙන් ගත්හ' යි කියන්නේ, කෙසේ ද? යි අපට නොවටහයි. ගැටපදයෙහි 'එයින්' යන පදයෙන් වුවමනා අර්ථය පහදා කියද්දීත් 'ඇතුළක්, ගෙනැ කියනු පුදුම යැ. මෙහි "දෙ අත්=දෙ අන්" යි පාඨාන්තර දෙකෙක් ඇත දෙ අත පෙනෙන සේ මිසැ, වසා පෙරවුමෙක් ශාසනයෙහි නැත්නු යි, ඒ අපපාඨ යි. හිඳැ-ගත් කලැ ගර්භාකාරයෙන් චීවරය සිටුනේ, දෙ දණ වටා ප්‍රාවරණය වන හෙයිනැ, එය කියන්නට 'දෙ ජන් වසා' යනු දැක්විණ.

'සිවුරුගැබින්' යන මෙතෙකින් දකුණත නො වසා තුබුසෙ න්‍යායානුකූල කොටැ කියැවෙයි. ඉරියවු බෙදා විමසන්නේ යැ. පිළිමගෙහි සමාධි පිළිම හිමිහු ඇත. එකස් කොටැ ඇඟ වසා දකුණත සිවුර මත තබා ගත්සෙ දක්වති. ඒ පිළිමහිමිහු අත් නගන සේක් නම්, සිවුරු ගැබින් නගන සේක. ඒ පිළිමහිමිහු සිටගන්නා සේක් නම්, කොතැනින් අත් නගන සේක් ද? අත එල්බෙයි. තැබූ තැනෙක් නැත. අසුවල් තැනිනැයි නො කියැ හෙයි. අඞ්ගුලිමාල දමන-නාලාගිරිදමන ආදියෙහිත් බුදුහු සිට -ගෙනැ අත් නැඟූහ. එහි 'සිවුරුගැබිනැ'යි නොකියති. 'හිඳැ - ගත් කලැ නගන අත

සිවුරු ගැබිනැ'යි කියන්නටත් සිටැගත් කලැ නගන අත එ ලෙස නො කියන්නටත් හෙතුව කිම? බුදුන් කිසි කලෙකැ දකුණත වසා නො පෙරැවූ බව හෙතු යි.

හිඳැ - ගත් ඉරියව්ව මිසැ යාම් - ඊම්, සිටැගැනීම්, ඉරියවුවෙහි දු 'සිවුරුගැබින් අත් නෙරුසෙ කියන අටුවා පාඨයක් දක්වත් හොත්, ඒකාන්තයෙන් මැ ඒ පාඨය බුදුන් දෙවුර වැසුසෙ කියයි. පාළි - අටුවායෙකින් එ බඳු පාඨයක් නොගත හෙයි. 'චීවරගර්භය' ඊර්යාපථ වශයෙන් යොදා බලත් මැ, දකුණත් නොවැසුසෙයට බලවත් සාධකයෙකි.

**සිවුපිරිසිදුසිල්වතැ** - ප්‍රාතිමොක්‍ෂසංවර ශීල යැ, ඉන්ද්‍රියසංවරශීල යැ, ආජීවපරිශුද්ධි ශීල යැ, ප්‍රත්‍යය සන්නිඃශ්‍රිත ශීල යැ යන සතර සිල් **සිව් පිරිසිදු සිල්** නම්.

**සුගිමොක්** - සුගති හා මොක්‍ෂ. 'පාඃ සුගති > සුගි"

**සුඹුයෙන්** - සුපුයෙන් = සැපීමෙන්

**සුවද** - ස්වාගත. යමකු ආ විටැ, ඔහුගෙ ඊට වටනාසෙ කියා ආශිර්වාද කිරීම.

**සුවරුවන්** - ඇත්දළින් භාණ්ඩ තනන වඩුවන්

**සුංවත්** - සුඞ්ක = සුංකම යි. අය කැරැ-ගත යුතු බද්දයි.

**සෙ-ඇතක්හු**-හේ කළ ඇතා දැනුදු 'හේ-අලි' ආදි වශයෙන් වහරෙහි 'හෙ' සද වැටෙයි. සකුවෙහි එන 'ෂෙක' ශබ්දය ගෙහි වැඩී කීකරු වැ සිටුවා පක්ෂි මෘගාදීන් කියයි. 'සංඃ ෂෙක > සෙ=හෙ'

ඇතැම් පොතෙකැ 'ඇතක්හු' යන මෙතෙක් මැ එයි. පැරැණි පුස්කොළ පොත්හි 'සෙ යනු ඇතියෙන් අපි 'සෙ-ඇතක්හු' යනු ගතුම්හ. ගුත්තිල කාව්‍යාදියෙහි එන 'සේ වටු' ආදි පදත් මේ සැටියෙන් මැ සළකන්නේ යැ.

**සෙමින්** - හාස්‍ය - කෙරෙමින්. 'සෙ-සිනායෙහි' දයින් 'මින්' පස යි.

**සොස්නෙන්** - ශොකයෙන්

**ස්වර්ණශිවිකායෙකැ** - ස්වර්ණමය යාප්‍ය - යානයෙකැ = රන්මුවා - දෝලාවෙකැ

**හකුරු** - කැට - බොරලු, 'පාඃ සක්ඛර > සකුරු=හකුරු'

**හඬසන් දෙ සන්** - හඬසන යැ, හඬසන දෙක යැ, යනාදි ක්‍රමයෙන්. "හඬපන්සියෙනි" යනු අප දුටු හැම පොත්හි ඇත. "හඬසන් පියෙනි" යි ඇති බව 'අමාවතුර' පළ කළ උගත්හු කියති. අටුවා හා සසඳත් මැ අවුල් වැ ගිය තැනක් සේ පෙනේ. අර්ථයක් ගනු පිණිසැ අපි "හඬසන් දෙ සන්" යි ලියුම්හ.

**භාව භාවයෙන්** - 'භාව' නම් ශෘඞ්ගාරාභිප්‍රායෙන් ලළිතකම් දැක්වීමයි. 'භාව' නම් ශෘඞ්ගාරය නිසා සෙව ද වැගීම් ආදීන් දක්වන විකාර යි.

**හැඬුවැ**-හැඬු යැ = හැඬුවැ. මෙහි වාච්‍යය මහා පෘථිවිය වෙයි. ගුරුළුගොමීහු 'මහාපොළො' යි ලියුව ද, මාතෘ භාෂායෙහි ලා එ පදයෙහි එන ස්ත්‍රී ලිංගභාවය ගෙනැ 'හැඬුවැ' යි පද තැබූහ.

**හැඳුවැ ගෙනැ** - "උද්ධරුහි - නිප්පීළෙත්වා" යනු මෙතැනැ අටුවා යි. "කළවයින් පෙළා ගෙනැ = දෙ කළවා හස්සෙන් පෙළා-ගෙන යනුයි" යනු ජාඃ ගැට පදයි. 'කළවේ දෙකින් ඇදැ තද කොටැ ගෙනැ' යන අර්ථයි. 'හඳ-තිර කොටැ ගැන්මෙහි' ධාතුයි.

**හිණිගෙහි** - "පහාතල අරා සිරියන්හි වැඩහොත්හු" යි මුල කියුයෙන් 'ඒ පහාතලට නැගැ-ගන්නා හීණ ළඟැ' යන අර්ථ යි. 'හිණි+අගෙහි=හිණිගෙහි' යි පරස්වර ලොප වෙයි. මෙහි 'අඟ' ශබ්දය 'අඞ්ගුල්‍යග්‍රෙ' යන තන්හි සෙයින් සමීපය කියයි. එයින් හීණෙහි අගවිට ගන්නේ යැ.

**හීදෙළුයෙකින්** - පල්ලැක්කියෙකින්. 'පාටඞ්කියා' (පාවඞ්කියා) යනු මෙහි අටුවායි.

**හිමියාපිත්** - ආර්ය පුත්‍රයා, මෙහි 'පිත්' යනු ආදරාර්ථපදයෙකි. ධම්පියාටුවාගැටපදයෙහි 'සත් තෙරුන් වත්' හී "අය්‍යපුත්තෙන සද්ධිං, හිමියා පුතු හා සැමැඟ"යි අර්ථ කීහ.

කලාපය=හී බහන කොපුව. 'හි+අවුරු'යි පද බිඳැ යකාරාගමයෙන් 'හියවුරු' යනු වෙයි. 'හියොවුරු-හියොර' යන රූපාන්තරයෝ ද සිය බසෙහි ඇත. එ හැම සන්ධිවිධි ඇසිරි කොටැ සිටිසෙ සළකන්නෙ යැ.

**හිරි නොඑප්සෙන තුරු**-හිරු නො බස්නා තුරු=බැසැ යන හිරු නොපැනියන්නට මතුයෙහි. 'ධම්පියාටුවාගැටපද' යෙහි "සුරියත්ථඞ්ගමනකාලෙ, හිරු එප්සෙන කල්හි" යැයි අර්ථ කීහු. 'එප්සෙනු' නම් අස්තඞ්ගමන වෙයි. 'ගහපතිදමන' යෙහි 'හිරු එප්සිණ' යි ක්‍රියා පදයෙක් ද එයි. එයින් මෙහි 'ඔපුස්-එප්සීමෙහි' ධාතු වෙයි.

**හිස්මුල වැම්හ යන පමණ** - මස්තිස්කය ගිළිහී යන පමණ. මෙහි 'මුල' යනු දෙමළුයෙහි එන, 'මුලෙයි' සඳින් සියබසට ආසෙ කියති. 'වැම්හ' යනු 'වම්හ - ගිළිහීමෙහි' යන ධාතුයෙන් නිපන් රූපයෙකි.

**හුණු පත්තෙන්** - වෙණු ප්‍රදරයෙන් = උණ ලී පතුරින්,

**හුදී ජනන්** - සාධුජනන් = සත්පුරුෂයන්. 'ධම්පියාටුවා ගැටපද' යෙහි "සධුනා, හුදියක්හු විසින්" යි අර්ථ කීහු. 'වෙසතුරුදා සන්න' යෙහි "සප්පුරිසො, හුදී පිරිමිනි" යි අර්ථ කීහු. පෙළෙහි සිටුනා 'සාධු' ශබ්දය 'හුදි' යි සියබසෙහි බැසැ-ගත්තෙ එයින් පෙනේ. "**නොවියත් හුදීජනන් සඳහා**" යනු කියුයෙන් නොවියත් සුධීහු නැත්නුයි. 'සුධීජනයන්' යන අර්ථය මෙහි නො යෙදේ.

**හෙටු** - 'පාඃ සුට්ඨු > සෙටු, හෙටු'

**ළදරු** මැඩවුන් - තරුණ මෙණ්ඩකයන් = එළුපැටවුන්

**ළ** දෙ ගත්තාහ - සිත් දෙකක් උපදවා ගත්තාහ.

## පෙළ-සන්නය

### 1 පිටුව

ඉතිපි, මෙකරුණෙනුදු; සො භගවා, ඒ භගවත් තෙමේ; අරහං, (කෙලෙසුන් කෙරෙන් දුරු බැවිනුදු, කෙලෙසුන් නැසූ බැවිනුදු, සංසාරචක්‍රයෙහි අර කැපූ බැවිනුදු, ප්‍රත්‍යාදීනට අර්හ හෙයිනුදු, පව් කිරීමෙහි රහසක් නැති බැවිනුදු, යන මෙතෙක් කාරණයෙන්) රහතැ; සම්මා, මනා කොටැ; සං, තම විසින් මැ; බුද්ධො, සර්වධර්මයන් දත්තේ යැ; විජ්ජාචරණසම්පන්නො, අෂ්ටවිද්‍යායෙන් හා පසළොස් චරණධර්මයෙන් සමන්විත යැ; සුගතො, (ශොභන ගමන් ඇති බැවිනුදු, සුන්දරස්ථානයට ගිය බැවිනුදු, මනා කොටැ ගිය බැවිනුදු, මනා වූ තෙපුල් ඇති බැවිනුදු) සුගත යැ; ලොකවිදූ, (සර්වාකාරයෙන් දන්නා ලද ලොක ඇති හෙයින්) ලොකවිදූ යැ; අනුත්තරො පුරිසදම්මසාරථී, (තම හට වැඩි කෙනකුන් නැති බැවින් ද, පුරුෂ දම්‍යයන් විනයන කරන හෙයින් ද.) අනුත්තරපුරිසදම්මසාරථී යැ; සත්ථා දෙවමනුස්සානං, (දෘෂ්ටධාර්මික සාම්පරායික උභයාර්ථයෙන් යථාර්හයෙන්) දෙව්මිනිස්හට අනුශාසනා කරන හෙයින් ශාස්තෘ යැ; බුද්ධො. (සියලු ඥෙයමණ්ඩලය දත් හෙයින්) බුද්ධ යැ; භගවා භාග්‍යවත්ත්වාදි ගුණයෙන් යුක්ත හෙයින්) භගවතැ.

### 53 පිටුව

භික්ඛවෙ, මහණෙනි; යං, යමෙක්; එවං මහාසාවජ්ජං, මෙසෙ මහාසාවද්‍ය වේද, යථයිදං (-යථා අයං) මිච්ඡා දිට්ඨි, යම් මේ මිථ්‍යාදෘෂ්ටියෙක් ඇද්ද; භික්ඛවෙ, මහණෙනි; අඤ්ඤං එකධම්මං අපි, එබඳු අන් එක ද දහමක්; අහං, මම; නසමනුපස්සාමි, ඤාණසමනුපස්සනා විසින් නො දක්නෙමි; භික්ඛවෙ, මහණෙනි; වජ්ජානි, වරදහු; මිච්ඡාදිට්ඨි පරමානි, මිථ්‍යාදෘෂ්ටිපරමයහ.

### 66 පිටුව

සප්නො, ජනයා සහිත; සට්ඨො, රට සහිත; දණ්ඩකී, දණ්ඩකී නම් කැකුලු රජ; කිසං හි වච්ඡං, කිසවච්ඡ තවුස් පාණන; අවකිරිය, (කෙළ දැහැට්දඬු ආදීන්) මුවහ කොටැ; උච්ඡින්නමූලො, උසුන් මුල් ඇතියෙ; කුක්කුලනාමනිරයම්හි, කුකුල නම් නිරුහි; පච්චති, පැසෙයි; තස්ස, උහුගේ; කායෙ, කයෙහි; ඵුලිඞ්ගානි, ගිනිපුපුරුහු; පතන්ති, හෙති.

### 70 පිටුව

යො, යම් රජෙක්; සඤ්ඤතෙ, පටවන ලද කා විසි හසර ඇති; (-එළවන ලද කායවාක්සංයම ඇති) පබ්බජිතෙ, ගිහිගෙන් නික්මැ ගිය; ධම්මං භණන්තෙ, පබ්බජිතෙ, දහම් බණන, අදූසකෙ, දූෂණක්‍රියා නොකරන; සමණෙ, ශ්‍රමණයෙන්; අවඤ්චයි, වැළැහී ද; තං නාළිකීරං, ඒ නාළිකීර රජු; පරත්ථ, පරලොවැ; සුනඛා, බල්ලො; සංගම්ම, මුළු වැ; විඵන්දමානං, වෙසෙසින් සැලෙන්නාහු; ඛාදන්ති, කති.

### 82 පිටුව

සච්චපරක්කමො, සත්‍යය පරාක්‍රම කොටැ ඇති; මාතඞ්ගො ඉසි, මතඟ තවුස්; ඉදං වත්වාන, ("තො විදුරුගල් නියෙන් කැණියටියෙහි" යනාදි) මෙ තෙපුල් බැණැ; බ්‍රාහ්මණානං, බමුණන්; උදික්ඛතං, බලා සිටියැ දී; අන්තලික්ඛස්මිං, අහසැ; පක්කාමි, නැඟී ගියේ.

## 87 පිටුව

මෙජ්ඣො, මෙධ්‍ය රජ; යසස්සිනෙ, යශස්වී වූ; මාතං ගස්මිං, මතඟ තවුස්පාණන් කෙරෙහි; මනං, සිත්; උපහච්ච, (ද්විෂ්ට වැ) හැනැ ගෙනැ; සපාරිසජ්ජො, පිරිස් සහිත වූයේ; උච්ඡින්නො, (යම් දවසෙකැ,) උසුන් වී ද; තදා, එ දවසැ; මෙජ්ඣාරඤ්ඤං, මෙධ්‍යා රණ්‍ය; අහු, වී.

## 94 පිටුව

අහං, මම; ධීරස්ස, ධීර වූ; විගතමොහස්ස, පැහු මොහ ඇති; පභින්නඛීලස්ස, බිඳුණු කෙලෙස්කණු ඇති; විජිත විජයස්ස, (පස් මරුන් බිඳැ,) දුනු ජය ඇති; අනීඝස්ස, ව්‍යසන නැති; සුසමචිත්තස්ස, මොනොවට සන්හුන් සිත් ඇති; වුද්ධසීලස්ස, වැඩුණු සිත් ඇති; සාධුපඤ්ඤස්ස, භද්‍රප්‍රඥා ඇති; වෙස්සන්තරස්ස, වෙස්ස සංඛ්‍යාත රාගාදි කෙලෙස් කසළ තිණු; විමලස්ස, නිර්මල; තස්ස භගවතො, ඒ භගවත් ගොයුමා ගේ; සාවකො අස්මි, ශ්‍රාවකයෙමි.

## 110 පිටුව

ඉධ, මෙ ලොව්හි; අරහං, අර්හත් වූ; සම්මා, මනා කොටැ; සං, තමා විසින්; බුද්ධො, සිව්සස් දත්; තථාගතො, තථාගත තෙමේ; උප්පජ්ජති, උපදනේ යැ.

## 120 පිටුව

දෙව, දෙවියිනි; අරහං, අර්හත් වූ; සම්මාසම්බුද්ධො, සම්‍යක්සම්බුද්ධ වූ; අයං එ; භගවා; මේ භගවත් තෙමේ; මහතා භික්ඛුසංඝෙන සද්ධිං, ගුණ විසින් මහත් බික්සඟන් හා සමඟ; අඩ්ඪතෙළසෙහි භික්ඛුසතෙහි, ගණන් විසින් අඩ තෙළෙස් යල් සියක් සඟුන් හා සමඟ; අම්භාකං, අප සතු; අම්බවනෙ, අඹවෙනෙහි; විහරති, වෙසේ; තං ඛො පන භගවන්තං ගොතමං අභි, ඒ භගවත් ගොයුම්හු ලකුණු කොටැ ගෙනැ; එවං, මෙසේ; කල්‍යාණො, භද්‍ර වූ; කිත්ති සද්දො, යසගී; උග්ගතො, නැංගේ. ("ඉතිපි සො භගවා" ආදි පාඨයෙහි අර්ථ මුලැ කී පරිද්දෙන් දන්නෙ යැ.) දෙවො, දෙව තෙමේ; තං භගවන්තං, ඒ භගවත් ගොයුම්හු කරා; පයිරුපාසතු, එළඹැ හිඳීවා; භගවන්තං, භගවත් ගොයුම්හු; පයිරුපාසතො, පර්යුපාසන කරන; දෙවස්ස, දෙවයන්ගේ; චිත්තං, සිත්; පසීදෙය්‍ය, පහදනේ නම්; අප්පෙවනාම, මැනැව් නම් නො.

## 126 පිටුව

අම්බං වා, අඹ හෝ; පුට්ඨො, පුළුවුස්නා ලද්දේ; ලබුජං, දෙල්; ව්‍යාකරෙය්‍ය, ප්‍රකාශ කරන්නේ යැ. ("පුළුවුත්තා තබා අනෙක්ක කියන්නේ යැ"යි දක්වනු පිණිසැ අළ උපමායි.)

**142 පිටුව**

එකෙ, කිසි කෙනෙක්; දණ්ඩෙන, දඬියෙන්; දමයන්තී, දමත්; අංකුසෙහි, අකුස්සේන හා; කසාහි ච, කටුමති ගායෙන් හා දමත්; තාදිනා, බුදුන් විසින්; අදණ්ඩෙන, නොදඬියෙන්; අසත්ථෙන, නොසැතින්; අහං, මම; දන්තො අම්හි, දමනු ලද්දෙමි.

**148 පිටුව**

චක්ඛුම, ඇස් ඇතියව; පුරෙ, පෙරැ; මෙ, මාගේ; යා කඞ්ඛා, යම් සැකෙක්; ආසි, වී ද; තං, එ සැක; මෙ, මට; ව්‍යාකාසි, පැවැසුයෙහි; අද්ධා, එකාන්තයෙන්; සම්බුද්ධො, සම්බුද්ධ වූ; මුනි අසි, මුනි වෙහි; තව, තොප ගේ; නිවරණා, නීවරණයෝ; නත්ථී, නැත.

**157 පිටුව**

වාසව, විදුරවිය; මං පඤ්හං පුච්ඡ, මා පැන පුළුවුස; මනසි, සිත්හි ලා; නොහොත් මනසා, සිතින්; යං කිඤ්චි යම් කිසි අර්ථයක්; ඉච්ඡසි, රුස්නෙහි ද; අහං, මම; තෙ, තා ගේ; තස්ස තස්ස එව අත්ථස්ස, ඒ ඒ අර්ථයා ගේ මැ; අන්තං, කෙළ; කරොමි, කෙරෙමි.

**148 පිටුව**

බාවරිස්ස වා, බාවරි තව්සා ගේ වේවයි; තුම්හං වා, තොප ගේ වේවයි; සබ්බෙසං, හැම දෙනාගේ; මනසි, සිත්හි ලා; නොහොත්, මනසා, සිතින්; යං කිංචි, යම් කිසිවක්; ඉච්ඡථ, රුස්වව් ද; සබ්බසංසයං, එ හැම සැක; පුච්ඡව්හො, පුළුවුස්ව; කතාවකාසා, කළ අවකාහ ඇති යහු යැ.

සභිය, සභියපරිබ්‍රාජකය; මනසි, සිත්හි ලා; යං කිංචි ඉච්ඡසි, යම් මැ දැයක් ඉස්නෙහි නම්; මං පඤ්හං පුච්ඡ, මා ඒ පැන පුළුවුස. අහං, මම; තෙ, තා ගේ; තස්ස තස්ස එව පඤ්හස්ස, ඒ ඒ ප්‍රශ්නයා ගේ; අන්තං, කෙළ; කරොමි, කෙරෙමි.

හොන්තො, භවත්නි; කතාවකාසා, කළ අවකාශ ඇති යහු හැ. මනසා, සිතින්; යං කිඤ්චි පඤ්හං, යම් කිසි පැනක්; අභිපත්ථිතං, ඉස්නා ලද නම්; පුච්ඡන්තු, පුළුවුසිත්වා. අහං හි, මම වනාහි; සයං, තෙමේ; ඉමං ලොකං, මෙ ලොව හා; පරඤ්ච, පරලොව හා; ඤත්වා, දැනැ ගෙන; තං තං, ඒ ඒ පැන; වො, තොපට; ව්‍යාකරිස්සං, විසඳා කියමි.

තග්ස, එකාන්තයෙන්; යථාපි කුසලො තථා, යම් පරිදි ඡෙකයෙක් වේ ද, ඒ පරිද්දෙන්; අහං, මම; තෙ, තට; අක්ඛිස්සං, කියමි. යදි, ඉදින්; කාහති වා, කරන්නේ නම් හෝ; නවා, නො කරන්නේ නම් හෝ; තං, එ; රාජා එව, රජ මැ; ජානාති, දනී.

## 165 පිටුව

අම්හො, පින්වත; සීනපත්තො, ක්ෂුද්‍ර පත් ඇති; සකණ්ටකො, කටුසහිත වූ; අයං, මේ; කො නාම, කිනම් ලද; රුක්ඛො, වෘක්ෂයෙක් ද? යත්ථ, යම් රුකෙක්හි; එකප්ප හාරෙන, එක ප්‍රහාරයෙන්; උත්තමඞ්ගං, මස්තකය; විඝාටිතං, බිඳින ලද ද; (එක වට හිස ද තුඩ ද යම් ගසෙකැ ගැසැ බිඳෙන ලද ද, ඒ කිනම් රුකෙක් දැයි? වෙදනායෙන් ගස නම පවා සඳහන් නැති වැ 'කන්දගලකයා', කී සැටියි.)

## 168 පිටුව

අතීතානාගත පච්චුප්පන්නං, අතීත අනාගත ප්‍රත්‍යුත්පන්න වූ; යං කිඤ්චි රූපං, යම් කිසි රූපයෙක් වේ ද; අජ්ඣත්තං වා, ආද්ධ්‍යාත්මික වූ හෝ; බහිද්ධා වා, බාහ්‍ය වූ හෝ; ඔලාරිකං වා, ඖදාරික වූ හෝ; සුඛුමං වා, සූක්ෂම වූ හෝ; හීනං වා, හීන වූ හෝ; පණීතං වා, ප්‍රණීත වූ හෝ; යං කිංචී රූපං, යම් කිසි රූපයෙක් වේ ද; දූරෙ, දුරැ වූ හෝ; සන්තිකෙ වා, ළඟැ වූ හෝ; යං යම් රූපයෙක් වේ ද; එතං සබ්බං රූපං, තෙල හැම (එකොළොස්) රූ; න මම, මා නො ගැත්තේ යැ; අහං, මම; න එසො අස්මි, තෙල රූපයෙම් නො වෙමි; එසො, තෙල; න මෙ අත්තා, මා ගෙ ආත්ම නො වෙයි; යා කාචි වෙදනා; යනාදි පාළියෙහි අර්ථ ද මෙ කිරී පරිදි මැ සලකන්නේ යැ.

## 182 පිටුව

රාජ, මහරජ; පවාතො, පෙයාසුළඟ; ගිරිං, සල්ගල්; සංචෙ ආවහෙය්‍ය, නඟා-ගෙනැ යන්නේ වී නම්; චන්දො ච සුරියො ච, සඳු හා හිරු හා දෙදෙන; ඡමාය, බිමින්; පතෙය්‍යුං යන්නාහු වුහු නම්; සබ්බා එව නජ්ජො, හැම නදීහු (-ගඟ- හෝ) පටිසොතං, උඩු හෝ බලා; වජෙය්‍යුං, යන්නාහු වුහු නම්; අහං, මම; මුසා, බොරු; නතු එව භණෙය්‍යං, නො කියම් මැයි.

නභං, අහස; එලෙය්‍ය, පැළෙන්නේ වී නම්; උදධි, මුහුදු; විසුස්සෙ, වියළෙන්නේ වී නම්; භූතධරා, භූතයන් ධරා සිටුනා; අයං වසුන්ධරා, තෙල මෙදිනී තොමෝ; සංවට්ටෙ, නස්නී වී නම්; මෙරු සිලුච්චයො, මෙරගල; සමූලං, සහමුලින්; උබ්බහෙ, ඉපිරැ යන්නේ වී නම්; අහං, මම; මුසා, මුසවා; නතු එව භණෙය්‍යං, නො කියම් මැයි.

## 205 පිටුව

බාවරිස්ස, බාවරි මහතව්සාගේ; වචො, තෙපුල; සුත්වා, අසා; සිස්සා, ශිෂ්‍ය වූ; සොළස බ්‍රාහ්මණා, සොළොස් බමුණෝ; ඔහු කවරහ යත්; අජිතො, අජිත යැ; තිස්ස මෙත්තෙය්‍යො, තිස්සමෙත්තෙය්‍ය යැ; පුණ්ණකො, පුණ්ණක යැ; අථ, වැලි; මෙත්තගු, මෙත්තකු යැ; ධොතකො, ධොතක යැ; උපසීවො ච, උපසීව යැ; නන්දො ච, නන්ද යැ; අථ, වැලි; හෙමකො, හෙමක යැ; තොදෙය්‍යකප්පා, තොදෙය්‍ය යැ, කප්ප යැ, යන;

දූභයො, දෙදෙන යැ; පණ්ඩිතො, පණ්ඩිත වූ; ජතුකණ්ණී ච, චතුකණ්ණී යැ; භද්‍රාවුධො, භද්‍රාවුධ යැ; උදයො ච, උදය යැ; පොසාලො ච අපි බ්‍රාහ්මණො, වැලි පොසාල නම් බමුණු යැ; මෙධාවී, ප්‍රශස්ත බුද්ධි ඇති; මොඝරාජා ච, මොඝරාජ යැ; මහාඉසි, මහ තවුස් වූ; පිංගියො ච, පිංගිය යැ යි.

## 206 පිටුව

සබ්බෙ, හැම; පච්චෙකගණිනො, වෙන වෙන දහස් දහස් ගණ ඇත්තාහු; සබ්බලොකස්ස, සර්වලොකයා විසින්; විස්සුතා, වෙසෙසින් අසන ලද්දාහු; ඣායී, බහවුන් අරමුණු නරඹන්නාහු; ඣානරතා, ධ්‍යානයෙහි නියැලුණාහු; ධීරා, පැන ඇතියාහු; නොහොත් පැරැකුම් ඇතියාහු; පුබ්බ වාසනවාසිතා, (කසුබු සම්මාසම්බුදුන් දවසැ පිරූ ‘ගතප්‍ර ත්‍යාගත’ වත් නැමැති පිනැයි කියන ලදු) පූර්ව වාසනායෙන් වැසුණාහු; සබ්බෙ, මෙකී හැම සොළොස් බමුණෝ; බාවරිං, ප්‍රාවරි මහ රුසිහු; අභිවාදෙත්වා, ප්‍රකර්ෂයෙන් නැමැඳැ, නං, උහු; පදක්ඛිණං ච කත්වා, පැදකුණු ද කොටැ; ජටාජිනධරා, දළමඬුලු අඳුන් දිවිසම් ධරන්නාහු; උත්තරා මුඛා, උතුරු දෙන බලා ගත්තාහු; පක්කාමුං, නික්මුණුහු.

## 207 පිටුව

සීතං, උදකං, සිහිල් පැන් ලදු; තදිතෙ ඉව, පිපාසිතයක්හු සෙයින්; මහාලාභං, මහාභොග ලදු; වාණිජො ඉව, වෙණෙඳක්හු සෙයින්; ඡායං, සිහිල් සෙවණ ලදු; සම්මාහිතත්තො ඥක්හු සෙයින්; ඡායං, සිහිල් සෙවණ ලදු; සම්මාහිතත්තො ඉව, ගිමන්හි කළකිරි මැඟියක්හු සෙයින්; තුසිතා, සන්තුෂ්ට වූවාහු; පබ්බතං, ගලට; ආරුහුං, නැඟියෝ,

තස්මිං සමයෙ, එ දවසැ; භගවා ච, භාග්‍යවතුන් වහන්සේත්; භික්ඛුසංඝපුරක්ඛතො, බික්සඟුන් විසින් පෙරට කරන ලදසේක්; භික්ඛූනං, මහණුනට; ධම්මං දෙසෙති, දහම් දෙසන සේකැ; වනෙ, මහවෙනෙහි; සීහො ඉව, සිහරදකු සෙයින්; නදති (සදහම් නදින්) නාද කරන සේකැ.

## 208 පිටුව

බාවරි බ්‍රාහ්මණො, ප්‍රාවරිබ්‍රාහ්මණ තෙමේ; සහ සිස්සෙහි, ශිෂ්‍යයන් හා සමග; සුඛිතො හොතු, සුඛිත වේවා; මාණව, මාණවකය; ත්වඤ්ච අපි, තො ද; සුඛිතො හොහි සුඛිත වෙයි; චිරං, චිරරාත්‍රයක්; ජීවාහි, ජීවත් වෙයි.

## 211 පිටුව

තතො, එක්බිති; රම්මෙ, රම්‍ය වූ; පාසාණකෙ, (මගධ රටැ වූ) පහණසැ තන්හි; පාරායණ සමාගමෙ, (අපාර වූ සංසාරසාගරයාගේ නිර්වාණ පාරයට පමුණු වන්නෙන්) පාරායණ නම් වූ සුත දෙසූ මහසමාම්හි; බුද්ධො, සම්බුද්ධ තෙමේ; චුද්දස පාණකොටියො, තුදුස් කෙළක් පණන්; අමතං පායයී, අමා පෙවී.

**226 පිටුව**

සමන්තා, හාත්පස්හි සක්වළිනුදු පැමිණි; තෙ චත්තාරො මහාරාජා, ඒ සතර වරම් මහරජහු; චතුරො දිසා, සතර දික්හි; දද්දල්ලමානා, දිලෙන්නා, කාපිලවත්ථවෙ වනෙ, කිඹුල්වත්මහ වෙනෙහි; අට්ඨංසු, සිටියහ.

**227 පිටුව**

ජනෙසුත, ජනයා කෙරෙහි පතළ තැනැත්තව, (බුදුන් ඇමැතීමයි) තෙ, තොප ගේ; සාවකා, සව්වෝ; සබ්බෙ, හැමදෙනහු; විජිතසංගාමා, දුසු සංග්‍රාම ඇත්තාහු; සහ, භූතෙහි, භූත සංඛ්‍යාත ආර්යයන් ද හා සමඟ; මොදන්ති සොම්නස් වෙති.

**239 පිටුව**

ආර්යය, ආර්යයන් වහන්ස; ගණ්ඩස්ථලී, කොපුල් තෙලෙහි; ලුඨිත, පෙරළුණු; දානමසීනිෂෙක, මදදැලිතවර ඇති; භ්‍රාන්ත, බමන; උන්නදත්, උස් කොටැ නද කරන; භ්‍රමරමණ්ඩල, බමරමඬුලු නැමැති; ඩිණ්ඩිමෙන, බෙර ඇති; ක්‍රොධාග්නිනා, කො ගිනින්; අභිදයතා, නෙත්තියට යන; ධනපාලකෙන, ධනපලුවා විසින්; තෙ, තොප ගේ; ධෘතාංකුශෙ, ධැරූ අකුසුලකුණු ඇති; පාදද්වයෙ, දෙ අත්ලෙහි; ප්‍රණතම්, බැස හෙවැ වැඳම යි.

**252 පිටුව**

බුද්ධො, සම්බුද්ධ තෙමේ; වත, ඒකාන්තයෙන්; මෙ, මට; අත්ථාය, වැඩ සඳහා; වාසාය, වාස කරනු පිණිසැ; ආළවිං, අළවි නුවර කරා; ආගමා, එළැඹියේ යැ; සො අහං, ඒ මම; යත්ථ දින්නං, යම් තැනෙකැ දුන් දන; මහප්ඵලං, ඵල මහත් වේ ද; අජ්ජ, අද; පජානාමී, එ වෙසෙසින් දනිමි.

සො අහං, ඒ මම; සම්බුද්ධං, සම්බුදුන්; නමස්සමානො, නමදමින්; ධම්මස්ස ච, ධර්මයා ගේ ද; සුධම්මතං, (නෛර්යාණිකභාවාදි විසින් පවත්නා) සුධර්මතා ද ගොහමින්; ගාමා ගාමං, දෙව්ගැමින් දෙව්ගමට; පුරා පුරං, දෙව්නුවරින් දෙව්නුවරට; විචරිස්සාමි, ඇවිදුමි.

**239 පිටුව**

සමණි, සමණී යැ; සමණගුත්තා ච, සමණගුත්තා යැ; භික්ඛුනී, භික්ඛුනී යැ; භික්ඛුදායිකා, භික්ඛුදායිකා යැ; ධම්මා ච එව, ධම්මා යැ; සුධම්මා ච, සුධම්මා යැ; සංඝදාසී ච, සංඝදාසී යැ යන; ඉමා සත්ත, මේ සත් බිහින්න; (පිළිවෙලින් මෙ දවසැ) ඛෙමා, ඛෙමා නමු; උප්පලවණ්ණා ච, උප්පලවණ්ණා නමු; පටාචාරා ච, පටාචාරා නමු; ගොතමී, ගොතමී නමු; ධම්මදින්නා, ධම්මදින්නා නමු; මහාමායා, මහාමායා නමු; විසාඛා ච, විසාඛා නමුයි; (මෙසෙ) ඉමා සත්ත, මෙ සත් දෙන වූහු.

**285 පිටුව**

කල්‍යාණී, සොබන අඟපසඟ ඇත්තිය; මම ආනන්දජනනී, මට සොම්නස් දෙනුවියඩසුරියවච්චසෙ, (ළහිරු රස් කලබක් සෙයින් නැගෙන ශරීර රශ්මීන්) සූරියවච්චසා නම් ලදු; හද්දෙ, සොඳුර; යෙන, යමක්හු නිසා; ජාතා අසි, තො උපන්හු ද; තෙ පිතරං, ඒ තී පියා; තිම්බරුං තිම්බරු නම් ගඳෙවුදෙව්රජහු; වන්දෙ, තෙමම් (=ස්තුති කරමි)

**303 පිටුව**

අහං, මම; භවෙ, කාමාදි භවයෙහි; භවං, බිය; දිස්වා එව, දැකැ මැ; ('භවෙ ච' යනු පාඨයි; 'භවයෙහි දු' යනු අර්ථයි.) විභවෙසිනං, විභවය (-නිවන) ඉලියන; භවඤ්ච, සත්ත්ව භවය ද (පුනපුනා කාමාදිභවයෙහි හෙතු) දැකැ; කිංචි භවං, කිසිදු භවයක්; න අභිවදිං, (තෘෂ්ණා දෘෂ්ටි විසින්) නො ගත්මි; නන්දිඤ්ච, භවතෘෂ්ණා ද; න උපාදියිං; නො ගත්මි.

**304 පිටුව**

තාරාගණසම්පුරක්ඛතො, උළුකැන විසින් පෙරට කරන ලද; සසී ඉව, සඳහු සෙයින්; පරිභණ්ඩගන්තරෙ, පිරිබඩ පවුමැදැ; මෙරු ගිරි ඉව, රුවන්මෙර සෙයින්; සරෙ, විලැ; නොහොත්, පියුමැ; සුඵුල්ලම්බුජකණ්ණිකූපමො, සුපිපි පියුම්කෙමි බඳු; පභංකරො, ලොව හෙළි කරන, ජිනො, මරුන් දිනූ තථාගත තෙමෙ; ජෙතවනෙ, දෙව්රම් මහවෙහෙරැ; වසී, (අමාවතුරින් මහදනා කෙලෙස්ගිම් නිවමින්) විසී.

සෙලින්දො, රුවන් මෙර; යාව තිට්ඨති, යම්තාක් දවස් සිටුවේ ද; චන්දො, සඳ; යාව විරොචති, යම් තාක් දවස් බබළවන්නේ වේ ද; තාව, ඒ තාක් දවස්; අයං ගන්ථො, මේ 'අමාවතුරු' නම් ගත්, මහාජනං, මහාදනා; පසාදෙන්තො, පහන් කරවමින්; තිට්ඨතු, පවත්නේවා.

**අමාවතුර - පිටපොත නිමි.**